

# ශික්ෂා සංග්‍රහය

සහ

# ශික්ෂා සංග්‍රහාර්ථ ව්‍යාඛ්‍යානය



පෑලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපතිව වැඩවිසූ

ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය

ම හො පා ධ්‍යා ය ධු ර න්ධ ර

# රත්මලානේ ධර්‍මකීර්ත්ති ශ්‍රී ධර්‍මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ
ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ විසින්

විරචිත

# ශික්ෂා සඞ්ග්‍රහය

සහ

තච්ඡිෂ්‍ය

රත්මලානේ පුරාණ විහාරාධිවාසී

## කිරිගල්පොත්තේ ශ්‍රී ඉන්දජොති

ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින්

ලියනලද

# ශික්ෂා සඞ්ග්‍රහාර්ථ ව්‍යාඛ්‍යානය.

---

පෑලියගොඩ විද්‍යාලඞ්කාර. පරිවෙණාධිපති

ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය

## රත්මලානේ ධර්‍මකීර්ත්ති ශ්‍රී ධර්‍මානන්දාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ
ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

**අවසාන ශුද්ධිපත්‍රාවලොකනයෙන්**
**ප්‍රතිග්‍රාහිතයි.**

---

**නීතිඥ ඇම්. පී. විජේසිංහ**

මහතා විසින්

මහාබොධි යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

---

බු. ව. 2472.

ශ. ව. 1851.

# SIKSHÂSAMGRAHA

COMPILED BY

**THE VEN'BLE RATMALÂNE DHARMAKIRTI**

**SRI DHARMÂRÂMA THERA,**

*(Tripitaka Vâgisvarâcârya)*

*The Late Principal of the Vidyâlamkâra College, Pâliyagoda,*

AND

*Chief High Priest of Colombo and Chilaw Districts*

WITH A COMMENTARY

## SIKSHĀSAMGRAHĀRTHA VYĀKKHYĀNAYA.

BY HIS PUPIL

**THE REV. KIRIGALPOTTE SRI INDAJOTI THERA,**

*Incumbent, Purâna Vihâra.*

*Ratmalâna.*

---

APPROVED BY

**THE REV. RATMALÂNE DHARMAKIRTI**

**SRI DHARMĀNANDA THERA,**

*(Tripitaka Vâgisvarâcârya)*

*Principal of the Vidyâlamkâra College, Pâliyagoda*

AND

*Chief High Priest of Colombo and Chilaw Districts.*

---

PUBLISHED BY

**Mr. M. P. WIJESINGHE**

Proctor S C.

AT THE MAHA-BODHI PRESS.

---

**B. E. 2472.**

**A. D. 1851.**



ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය්‍ය මහොපාධ්‍යාය ධර්මකීර්ත්ති
**ශ්‍රී ධර්මාරාම මාහිමියන් වහන්සේ.**

TO

# The Hon'ble Mr. L. MACRAE, M.A.

## Director of Education.

In Appreciation of the keen interest he has evinced

in the progress of

**ORIENTAL LEARNING IN CEYLON,**

## THIS BOOK IS

RESPECTFULLY DEDICATED.

---

## මේ පුස්තකය

ලංකාධ්‍යාපනාධ්‍යක්‍ෂ

## ගරු ඇල්. මැක්රේ මැතිතුමාණන් වෙත

එතුමන් විසින් ලක්දිව ප්‍රාචීන භාෂාධ්‍යයනයට දෙනලද විශෙෂ ධෛර්‍ය්‍යය

උසස්කොට සැලකීමක් වශයෙන්

සගෞරව පුරස්සරව

## පි ළි ග න් ව න ල දී.



සෝ. ශ්‍රී. ඉඳජෝති ස්වාමීන් වහන්සේ.

# සංඥාපනය.

---

'ශික්ෂාසඞ්ග්‍රහ'නම්වූ මෙම මාහැඟි ග්‍රන්ථය වනාහි පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපතිව වැඩවිසූ පූජ්‍යාචාර්‍ය්‍ය රත්මලානේ ශ්‍රී ධර්‍මාලොකාභිධාන මහා ස්වාමිපාදයන්වහන්සේගේ මෙහෙයීමෙන් තදග්‍රශිෂ්‍යවූ යථොක්ත පරිවෙණාධිපතිව වැඩවිසූ අප ආචාර්‍ය්‍යෝත්තම විද්වජ්ජන ශෙඛරායමාණ වූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය මහොපාධ්‍යාය ධුරන්ධර අතිගරු රත්මලානේ ධර්‍මකීර්ත්ති ශ්‍රී ධර්‍මාරාමාභිධාන කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ විසින් තද්විද්‍යාලයෙහි ශාස්ත්‍රාධ්‍යයනයෙහි නියුක්තවූ සංස්කෘත භාෂාභිලාෂී ශිෂ්‍යයන්ගේ සහ සෙසු දෛවිභාෂා ජිඥාසූන්ගේ ද ප්‍රයොජනය සඳහා සංස්කෘත ශබ්දමාලාධ්‍යයනයට අනතුරුව හදාරවනු පිණිස භාරතවර්‍ෂ ප්‍රචලිත පාඨ්‍ය පුස්තකාන්තරොද්ධෘත සාරාංශයන්ගේ හා ස්වයංකෘත පාඨයන්ගේ ද සංකලනයෙන් රචනා කරන ලද්දේය.

ලක්දිව බොහෝ කලක් මුළුල්ලෙහි ගෘහස්ථ ප්‍රව්‍රජිත සිංහල මහාජනකාය අතර එළු, පාලි, සංස්කෘත යන මේ භාෂාත්‍රය මුල් බැස පවත්නේය. ප්‍රාකෘතාදි අවශෙෂ භාෂා වූ කලි මේ භාෂාත්‍රය පිළිබඳ දැනීමෙන් මතු ෂඩ්භාෂා පරමෙශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල සඞ්ඝරාජ මහා ස්වාමිපාදදී උතුමන් වැනි විශාරද බුද්ධිමතුන්ගේ ඥානයටම ගොචර වනසුලුයෑ. සිංහල භාෂාතොමෝ වනාහි සිංහලයාගේ ජන්මභාෂාවයෑ. පාලිභාෂාව ඔහුගේ ධර්‍මයෑ. එහෙයින් ඕ ද හළ නොහැක. සංස්කෘත භාෂාව ඔහුගේ ශාස්ත්‍රයයි. සිංහලයාගේ ප්‍රාදුර්භාවය සිංහල භාෂාවගේද ප්‍රාදුර්භාවයයි. සංස්කෘතයෙන් ලියවී තිබෙන නොයෙක් ශාස්ත්‍රයන් සිංහලයා හදාරන්ට යාමෙන් සංස්කෘත භාෂාව ඇසුරුකොට සිංහල භාෂාව උද්දීප්තියක් ලබාතිබේ. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩ ත්‍රිපිටක පාලිධර්‍මය දෙශනා කළසේක. ඒ ධර්‍මය පිළිගත් දෙවනපෑතිස් (දෙවානාං ප්‍රියතිෂ්‍ය) මහරජතුමාණන් ඇතුළු ඓහික පාරත්‍රික සුඛාභිලාෂී සිංහලමහාජනකාය තෙම පාලිභාෂාව ධර්‍මාශායෙන් සමමාන පුරස්සරවෑ නිත්‍යාසෙවනය කෙළේය. එහෙයින් ඕද සිංහලභාෂාවගේ උද්දීප්තියට කාරණ විය.

මෙසෙයින් වර්ණනය වූ භාෂාවකින් කීර්තිමත් වූ සිංහලයා අතුරෙහි ධර්මධර භාවය හා ශාස්ත්‍රකාරත්වය ප්‍රාචුර්යයෙන් ප්‍රව්‍රජිත පක්ෂයෙහි විය. කලින්කල මෙහි කිසි තැනෙක මේ මාතෘ භාෂාවන්ගේ ප්‍රධානාප්‍රධානතා දක්නා ලදුවත් ස්වභාෂාවට පාලි භාෂාවම අත්‍යන්ත සමීප විය. එහෙයින් ම ලක්දිව සංස්කෘත අභිව්‍යාප්තිය වනාහි අනුරාධපුර පොළොන්නරු රාජධානි කාලයටත් පූර්වයෙහි යම් කලෙක ජම්බුද්වීපවාසීහු මෙහි ප්‍රාප්තවූවාහු නම් එකල පටන් ම වූයේයි පිළිගත යුතුය. මේ ලක්දිව දෛවිභාෂා ව්‍යාප්තියෙහි ප්‍රථම කාලයයි. ඉන් මොබ ජම්බුද්‍රෝණිපුර, හස්තිශෛලපුර, ජයවර්ධනපුර රාජධානිකාල ද්විතිය කාලයයි සැලකිය හැකිවේ. ඉන් මොබ ලක්දිව සංස්කෘතභාෂා ව්‍යාප්තිය ලුප්තප්‍රාය විය. වර්තමාන කාලයෙහි වනාහි සංස්කෘතභාෂා ව්‍යාප්තියට කාරණවූයේ මෙම ග්‍රන්ථ කාරක මාහිමියන් වහන්සේමය. මුන්වහන්සේගේ සංස්කෘත පාණ්ඩිත්‍යය වනාහි එකල අන්‍ය කිසි පණ්ඩිතයකුටත් විෂය නොවූ මහාකවි කුමාරදාස නරේන්ද්‍රයන් විසින් විරචිත ජානකීහරණ නම් මහාකාව්‍යය ශ්ලෝකබන්ධනයෙන් පුනර්ජීවයට පැමිණවූකල සමස්ත භූමණ්ඩලයෙහි චන්ද්‍රසූර්ය ප්‍රතිභාගයෙන් සුප්‍රකාශ විය. එය ලක්වැසියා පමණක් නොව විදෙශිකයාද ප්‍රත්‍යක්ෂව දත් හෙයින් ප්‍රපඤ්ච කථා නොලියනු ලැබේ. ඒ පණ්ඩිත චක්‍රවර්තිවූ මහා ස්වාමිපාදයන් වහන්සේ විසින් ස්වකීය විද්‍යාලයෙහි ආධුනිකයන්ට සංස්කෘත ශබ්දමාලාධ්‍යයනයට අනතුරුව හැදෑරවිය යුතුවූ සාරස්වත, මුග්ධබෝධ, හිතෝපදේශාදි ගරිෂ්ඨග්‍රන්ථ විනා අන්‍ය ලඝිෂ්ඨ ග්‍රන්ථයක් නො වූයෙන් මෙය රචනා කරන ලද්දේය. මෙද ප්‍රමාණයෙන් ලඝිෂ්ඨ වුවද සාරත්වයෙන් ගරිෂ්ඨ මැයි. ශබ්දමාලාධ්‍යයනයෙන් පදරූපාවගමය කළ ශිෂ්‍යයාගේ සුඛාවබෝධය පිණිස මෙහි පළමුවෙනි අධ්‍යායයෙහි ශබ්දද්වයක්හුගේ අතිසන්නිකර්ෂී ස්වරූප සන්ධි විධිය සාරස්වත කාතන්ත්‍ර, පාණිනීයාදි ව්‍යාකරණානුසාරයෙන් සංක්ෂේපකොට හකුළුවා දක්වන ලද්දේය. සන්ධිවිධිය අවබෝධ කළ ශිෂ්‍යයාට වාක්‍ය රචනාව හඳුන්වනු පිණිස ද්විතීයාධ්‍යායයෙහි ප්‍රථමාදි සර්ව විභක්තීන්ගේ ප්‍රයෝගය දක්වනලද්දේය. මෙසේම තෘතීයාධ්‍යායයෙහි සර්වසමාස ප්‍රයෝගද, චතුර්ථාධ්‍යායයෙහි උපාඛ්‍යානද, පඤ්චමාධ්‍යායයෙහි සංලාපද, ෂෂ්ඨාධ්‍යායයෙහි ප්‍රතිපදෛකන ලාක්ෂණික අව්‍යයෝද, සරල සංස්කෘත භාෂායෙන් හකුළුවා දක්වන ලදහ. මෙසේ සුබන්ත පදය නිමකොට 'භවති' 'පචති' දෙදෙනාගේ දශලකාර සිද්ධ සර්වපද නිරූපණය කොට ධාතුගණ භේද නිදර්ශනයෙන් 'තිඞන්ත' පදයද සැකෙවින් දක්වනලදී.

මේ වනාහි යම් ශිෂ්‍යයකු විසින් ග්‍රන්ථකර්තෘ මාහිමියන් වහන්සේගේ වාචනාමාර්ගයෙන් හදාරන ලද්දේ නම්, ඔහු විසින් අති ශීඝ්‍රවම නිශ්චලවූ ශබ්දශාස්ත්‍රඥතයට බැසගනු නියතමය. එබැවින් ගීර්වාණ භාෂා ශික්ෂණාභිලාෂීන් උදෙසා අප විසින් ඊට මෙම සවිස්තර ව්‍යාඛ්‍යානය නිපදවන ලද්දේය.

මෙය පිරිවෙන් පාසැල් ඈ නෛකවිද්‍යාස්ථානයන්හි සංස්කෘත භාෂාව හදාරනු කැමැති ගෘහස්ථ, ප්‍රව්‍රජිත, යම් ශිෂ්‍යයකු විසින් විධිවූ පරිදි මෙම ව්‍යාඛ්‍යානානුසාරයෙන් හදාරන ලද්දේ නම් සමසක් තුළ නිවැරදිලෙස සංස්කෘත භාෂාව කථාකිරීමට හා නිශ්චලවූ ශබ්දශාස්ත්‍රඥතය ලබාගැනීමට ද ඔහුසමර්ථ වනබව නිසැකමැයි.

මෙහි අපගේ යම් ප්‍රමාදභ්‍රමාදියක් වේනම් හේ පණ්ඩිත ලෝකයා විසින් පරිහර්තව්‍යයි. ශිෂ්‍යයා විසින් වනාහි මෙය ඇසුරුකිරීමෙන් දෛවීභාෂා නෛපුණ්‍යය ලබාගතයුතු බව කෘපාපූර්වකව මෙයින් දන්වමු.

මෙවගට,

ශාස්ත්‍රාභිවෘද්ධි කාමීවූ,

රත්මලානේ පුරාණ විහාරාධිවාසී,

**කිරිගල්පොත්තේ ශ්‍රී ඉන්දජෝති ස්ථවිර.**

**K. Sri Indajoti.**

වර්ෂ 1929 වූ ජූලි මස
19 වෙනි දින
රත්මලානේදීය.

# ශික්ෂාසඞ්ග්‍රහ ව්‍යාඛ්‍යා ප්‍රස්තාවනා.

1. යස්‍යාසීනො බොධිවෘක්ෂස්‍ය මූලෙ
ජිත්වා මාරං බොධිමාපල්ලොකබන්ධුඃ
ජාතො වංශෙ තස්‍ය බොධිද්‍රුමෙන්ද්‍රො
යස්මින්නිත්‍යං භාති නීලාම්බුදභඃ

2. යත්‍රාධීශො'භූච්චිරං පුණ්‍යභූමෞ
ශ්‍රීමාන් විද්‍යාස්වාමි ලොකාර්චිතාඞ්ඝ්‍රිඃ
විද්‍යාලඞ්කාරාඛ්‍ය විද්‍යාලයෙශො
ධර්මාලොකාඛ්‍යො මහා ස්වාමිපාදඃ.

3. යත්‍රෛවාසීදීශ්වරො ලොකමාන්‍ය-
ශ්ඡාත්‍රෙ ෂඩ්ග්‍රන්ථස්‍ය තත්සම්බුද්ධ්‍යයීඃ
පාරං යාතො ධර්මශාස්ත්‍රාම්බුරාශෙර්
විද්වල්ලොකාභ්‍යර්චිතස්වාඞ්ඝ්‍රිපද්මඃ.

4. ජ්‍යෙෂ්ඨස්තස්‍ය ශුභ්‍ර ශ්ලොකශුභ්‍රීකෘතාශො-
වාචාමීශඃ ශාස්ත්‍රවිත්සාර්වභෞමඃ
පූජ්‍යාචාර්‍යශ්‍රී මද්ගුරුධර්මකීර්ති-
ශ්‍ර්‍යාදි ධර්මාරාමසඞ්ඝෙශ්වරශ්ච.

5. ලක්ෂ්මීවාසෙ රත්නමාලාද්‍යරණ්‍ය
ප්‍රද්‍යොතන්තස්මින්නාශ්‍රමෙ සම්ප්‍රතීශඃ
ශිෂ්‍යාණොකතිඥතසංවර්ධිතෙච්ඡුඃ
ශ්‍රීමාන්'ඥජ්‍යොතිර්නාමා යතීන්ද්‍රඃ

6. ශිෂ්‍යාණාං කෘත්‍යබොද්ධෘලොකාර්ථසිද්ධ්‍යෙ
ග්‍රන්ථාන් පර්‍යාලොච්‍ය සම්‍යග්ගරිෂ්ඨාන්.
තෙනාචාර්‍යෙණෛව මෙ නිර්මිතොයො
ග්‍රන්ථඃ ශික්ෂා සඞ්ග්‍රහාඛ්‍යො ලඝිෂ්ඨඃ.

7. ස්මාරං ස්මාරං තං මදාචාර්‍ය වර්‍යං
ජිඥාසූනාං ප්‍රීතයෙ දෛවවාණීම්.
චිත්‍රාං තද්වාඞ්මාර්ගමෙවාවලම්බ්‍ය
ව්‍යාඛ්‍යාං තස්‍යෙමාං තනොති ස්වවාණ්‍යා.

8. ශොධ්‍යං සද්භිර්මේ ප්‍රමාදභ්‍රමාද්වා
යච්චෛවදස්මින් විද්‍යතෙ ශොධනීයම්.
සාක්ෂාජ්ජානන්තීදෘශෙ හි ශ්‍රමං යෙ
තෙ විද්වාංසො සමාභිරාරාධනීයාඃ.

# ශික්ෂාසඞ්ග්‍රහාර්ථ ව්‍යාඛ්‍යානය.

## නමඃ ශාක්‍යසිංහාය.

### ප්‍රථමාධ්‍යායඃ.

### 1. ප්‍රථමඃ පාඨඃ.

**a. ප්‍රණම්‍ය ශ්‍රීඝනං ශික්ෂාසඞ්ග්‍රහෝ'යං ප්‍රණීයතෙ
ගීර්වාණභාරතීශික්ෂාවිවික්ෂ්වනුජිඝෘක්ෂයා.**

**"වර්ණාඃ"**

**b. අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ, කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, යරලව ශෂසහ (අ)ං (අ)ඃ.**

**c. තත්‍ර චතුර්දශාදෞ ස්වරාඃ–දශ සමානාඃ–පූර්වෝ හ්‍රස්වඃ–පරෝ දීර්ඝඃ–හ්‍රස්වෝ ලඝුඃ–දීර්ඝෝ ගුරුඃ–සංයෝගෙ සති හ්‍රස්වෝපි ගුරුඃ.**

---

a. ශ්‍රීඝනං, ශොභාවෙන් ඝනවූ (සර්වඥයන්වහන්සේ); ප්‍රණම්‍ය, වැඳ; ගීර්වාණභාරතීශික්ෂා, සංස්කෘත භාෂෝද්ග්‍රහණයට; විවික්ෂු, ප්‍රවෙශවනු කැමැත්තවුන්ට; අනුජිඝෘක්ෂයා, අනුග්‍රහ කරනු කැමැත්තෙන්; අයං ශික්ෂාසඞ්ග්‍රහඃ, මේ ශික්ෂාසඞ්ග්‍රහයතෙම; ප්‍රණීයතෙ, කරනුලැබේ. හෙවත් ප්‍රකාශියෙන් එළවනුලැබේ

b. **වර්ණාඃ**–වර්ණයෝතුමූ කියනුලැබෙත්; අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම යරලව ශෂසහ අ)ං (අ)ඃ, අ ආ ඉ ඊ—(අ)ං (අ)ඃ යන මොහු වෙත්.

c. තත්‍ර, ඒ වර්ණයන් අතුරෙහි; ආදෞ, ආදියෙහිවූ; චතුර්දශ, තුදුස්දෙන; ස්වරාඃ, ස්වරනම්වෙත්; දශ, ආදියෙහිවූ ස්වරයෝ

## 2. ද්විතීයඃ පාඨඃ.

**a. ස්වරො වර්ණවර්ජො නාමී-එකාරාදීනි සන්ධ්‍යක්ෂරාණි-තෙෂාං හ්‍රස්වා නසන්ති-කාදීනි ව්‍යඤ්ජනානි-තෙ වර්ගාඃ පඤ්ච පඤ්ච පඤ්ච, වර්ගාණාං ප්‍රථම ද්විතීයාඃ ශෂසාශ්චාඝොෂාඃ-කඛ, චඡ, ටඨ, තථ, පඵ, ශෂස-ඝොෂවන්තොන්‍යෙ, ගඝඞ, ජඣඤ, ඩඪණ, දධන, බහම, යරලවහ.**

## 3 තෘතීයඃ පාඨඃ.

**b. අනුනාසිකා ඞඤණනමාඃ-අන්තඃස්ථා යරලවාඃ-ඌෂ්මාණඃ ශෂසහාඃ-අං ඉත්‍යනුස්වාරඃ-අඃ ඉතිවිසර්ජනීයඃ-අකාර ඉහොච්චාරණාර්ථඃ ×ක ඉති ජිහ්වාමූලීයඃ-×ප ඉත්‍යුපධ්මානීයඃ-කපාවුච්චාරණාර්ථෞ.**

---

දසදෙන; සමානාඃ, සමාන නම්වෙත්; පූර්වඃ, පූර්වඅක්ෂරයතෙම; හ්‍රස්වඃ, හ්‍රස්වනම්; පරඃ, පරවූයේ; දීර්ඝඃ, දීර්ඝනම්; හ්‍රස්වඃ, හ්‍රස්වය තෙම; ලඝුඃ, ලඝුනමුදුවේ; දීර්ඝඃ, දීර්ඝයතෙම; ගුරුඃ, ගුරු නමුදුවේ; සංයොගෙ සති, සංයොගයක් ඇතිකල්හි; හ්‍රස්වඃ අපි, හ්‍රස්වයද; ගුරුඃ, ගුරුනම්වේ.

a. අවර්ණවර්ජඃ, අවර්ණවර්ජිතවූ; ස්වරඃ, සෙසු ස්වරතෙම, නාමී, නාමින් නම්වේ; එකාරාදීනි, එකාරාදීහු; සන්ධ්‍යක්ෂරාණි; සන්ධ්‍යක්ෂරනම්වෙත්; තෙෂාං, ඔවුන්ගේ; හ්‍රස්වාඃ, හ්‍රස්වයෝ; නසන්ති, නොවෙත්; කාදීනි, කකාරාදීහු; ව්‍යඤ්ජනානි, ව්‍යඤ්ජන නම්වෙත්; තෙ, ඔහු; පඤ්ච පඤ්ච, පසක් පසක් බැගින්, පඤ්ච වර්ගාඃ, වර්ගපසෙක් වෙත්; වර්ගාණාං, වර්ගයන්ගේ; ප්‍රථම ද්විතීයාඃ, පළමු වන දෙවන අක්ෂරයෝද; ශෂසාශ්ච, ශෂස යන මොහුද; අඝොෂාඃ, අඝොෂාක්ෂරවෙත්; කඛ, චඡ, ටඨ, තථ, පඵ, ශෂස, (ඔව්හු නම්) කඛ, චඡ—ස යන මොහුයි., අන්‍යෙ, සෙස්සෝ; ඝොෂවන්තඃ, ඝොෂනම්වෙත්; ගඝඞ, ජඣඤ, ඩඪණ, දධන, බහම, යරලවහ (ඔව්හුනම්) ගඝඞ—හ යනුයි.

b. ඞඤණනමාඃ; ඞඤණනම යන මොව්හු; අනුනාසිකාඃ, අනුනාසිකනම්වෙත්; යරලවාඃ, යරලව යන මොව්හු; අන්තඃස්ථාඃ, අන්තඃස්ථනම් වෙත්; ශෂසහාඃ, ශෂසහ යන මොහු; ඌෂ්මා

**𑇣. අකුහවිසර්ජනීයානං කණ්ඨඃ-ඉචුයශානං තාලු-ඍටුරෂාණං මූර්ධා-ඏතුලසානං දන්තාඃ-උපූපධ්මානීයානාමොෂ්ඨෞ-ඞඤණනමානං නාසිකාච-එදෛතොඃ කණ්ඨතාලු-ඔදෞතොඃ කණ්ඨොෂ්ඨම්-වකාරස්‍ය දන්තොෂ්ඨම්-ජිහ්වාමූලීයස්‍ය ජිහ්වාමූලම්, නාසිකානුස්වාරස්‍ය-ඉති ස්ථානානි.**

---

ණඃ, ඌෂ්මන් නම්වෙත්, අං ඉති, අං යනු; අනුස්වාරඃ, අනුස්වාර නම්වේ; අඃ ඉති, අඃ යනු; විසර්ජනීයඃ, විසර්ජනීය නම්වේ; ඉහ; මේ අනුස්වාර විසර්ජනීයදෙක්හි; අකාරඃ, අකාරයතෙම; උච්චාරණාර්ථඃ, උසුරුවීම පිණිසයි; ×කඉති, ×කයනු; ජිහ්වාමූලීයඃ, ජිහ්වාමූලීය නම්; ×ප ඉති, ×පයනු; උපධ්මානීයඃ, උපධ්මානීය නම්, කපෞ, ක, ප, යන දෙදෙන; උච්චාරණාර්ථෞ, උච්චාරණය පිණිසවෙත්.

𑇣. අකුහවිසර්ජනීයානාං, අවර්ණ කවර්ග හකාර විසර්ජනීය යන මොවුන්ට; කණ්ඨඃ, බොටුව උත්පත්තිස්ථාන වේ; ඉචුයශානාං, ඉවර්ණ චවර්ග යකාර ශකාර යන මොවුන්ට; තාලු, තල්ල උත්පත්තිස්ථාන වේ; ඍටුරෂාණාං, ඍවර්ණ ටවර්ග රකාර ෂකාර යන මොවුන්ට; මූර්ධා, මුදුන උත්පත්තිස්ථාන වේ; ඏතුලසානාං, ඏවර්ණ තවර්ග ලකාර සකාර යන මොවුන්ට; දන්තාඃ, දන්තයෝ උත්පත්තිස්ථාන වෙත්; උපූපධ්මානීයානාං, උවර්ණ පවර්ග උපධ්මානීය යන මොවුන්ට; ඔෂ්ඨෞ, ඔෂ්ඨයෝ උත්පත්තිස්ථාන වෙත්; ඞඤණනමානාං, ඞඤණනම යන මොවුන්ට; නාසිකාච, ස්වකීය ස්ථාන හා නාසිකාවද උත්පත්තිස්ථාන වේ; එදෛතොඃ, එකාර ඓකාර දෙදෙනාහට; කණ්ඨතාලු, බොටුව හා තල්ල උත්පත්ති ස්ථාන වේ; ඔදෞතොඃ, ඔකාර ඖකාර දෙදෙනට; කණ්ඨොෂ්ඨම්, කණ්ඨය හා ඔෂ්ඨය උත්පත්තිස්ථාන වේ: වකාරස්‍ය, වකාරයහට; දන්තොෂ්ඨම්, දන්තයන් හා ඔෂ්ඨයෝ උත්පත්තිස්ථාන වෙත්; ජිහ්වාමූලීයස්‍ය, ජිහ්වාමූලීයවර්ණයට; ජිහ්වාමූලම්, දිවමුල උත්පත්ති ස්ථාන වේ; අනුස්වාරස්‍ය, අනුස්වාරයට, නාසිකාව උත්පත්තිස්ථාන වේ; ස්ථානානි, වර්ණයන් උපදනා වූ ස්ථානයෝ, ඉති, මෙසේය

BAMBALA

## 4. චතුර්ථඃ පාඨඃ,

### ප්‍රත්‍යාහාරක්‍රමඃ.

**a. අ ඉ උ ඍ ඏ ඒ ඓ ඕ ඖ, හයවරල, ඤණනඞම, ඣඪධඝභ, ජඬදගබ, ඛඵඡඨථ, චටතකප, ශෂස, ආද්‍යන්තාභ්‍යා මෙතෙ වර්ණා ග්‍රාහ්‍යාඃ-හකාරාදිෂ්වකාර උච්චාරණාර්ථඃ.**

## 5. පඤ්චමඃ පාඨඃ,

### ස්වරසන්ධිඃ.

### “සවර්ණේ දීර්ඝඃ සහ”

**b. දණ්ඩ+අග්‍රම්, දණ්ඩාග්‍රම්; ශ්‍රද්ධා+අත්‍ර, ශ්‍රද්ධාත්‍ර; දධි+ඉදම්, දධීදම්; නදී+ඊහතෙ, නදීහතෙ; භානු+උදයඃ, භානූදයඃ; වධූ+ඌඪම්, වධූඪම්; පිතෘ+ඍණම්, පිතෲණම්, කෘ+ඍකාරඃ කෲකාරඃ; කෟ+ඏකාරෙණ, කෟකාරෙණ; හොතෘ+ඏකාරඃ, හොතෲකාරඃ, හොතෟකාරඃ.**

---

a. අ ඉ උ ඍ ඏ ඒ ඓ ඕ ඖ, හයවරල, ඤණනඞම, ඣඪධ ඝභ, ජඬදගබ, ඛඵඡඨථ, චටතකප, ශෂස-යන; එතෙ වර්ණාඃ, මේ වර්ණයෝ; ආද්‍යන්තාභ්‍යාම්, ආදි අන්තදෙකින්; ග්‍රාහ්‍යාඃ, ගතයුත්තාහුය; හකාරාදිෂු, හකාරාදීන්කෙරෙහි; අකාරඃ, අකාරය තෙම; උච්චාරණාර්ථඃ, උසුරුවීම පිණිසයි.

b. “**සවර්ණේ දීර්ඝඃ සහ**” යනු දීර්ඝවිධානසූත්‍රයි; සවර්ණේ යන පදය, දීර්ඝඃ යනපදය, සහ යනුපදයි; සවර්ණේ,සවර්ණයා පරකල්හි; සහ, පූර්වපරදෙක එක්ව; දීර්ඝඃ, දීර්ඝවේ.

දණ්ඩ+අග්‍රම් යනතන්හි, දණ්ඩාග්‍රම් යනුවේ; ශ්‍රද්ධා+අත්‍ර යන තන්හි ශ්‍රද්ධාත්‍ර යනුවේ; දධි+ඉදම් යනතන්හි, දධීදම් යනුවේ; නදී+ඊහතෙ යනතන්හි නදීහතෙ යනුවේ; භානු+උදයඃ යන තන්හි භානූදයඃ යනුවේ; වධූ+ඌඪම් යනතන්හි වධූඪම් යනු වේ; පිතෘ+ඍණම් යනතන්හි, පිතෲණම් යනුවේ; කෘ+ඍකාරඃ යනතන්හි, කෲකාරඃ යනුවේ; කෟ+ඏකාරෙණ යන තන්හි, කෟකාරෙණ යනුවේ; හොතෘ+ඏකාරඃ යන තන්හි, හොතෲකාරඃ, හොතෟකාරඃ යනුවේ.

## 6. ෂෂ්ඨඃ පාඨඃ.

### “අ ඉ එ”

**a. මම+ඉදම්, මමෙදම්; සා+ඉයම්, සෙයම්; තව+ඊහා තවෙහා; රමා+ඊශ්වරඃ, රමෙශ්වරඃ.**

### (අ) “උ ඔ”

**b. ලොක+උක්තිඃ, ලොකොක්තිඃ; ගඞ්ගා+උදකම්, ගඞ්ගොදකම්; ධන+ඌනඃ, ධනොනඃ; ගඞ්ගා+ඌර්මිඃ, ගඞ්ගොර්මිඃ.**

### (අ) “ඍ අ ර්”

**c. දෙව+ඍෂිඃ, දෙවර්ෂිඃ; රාජා+ඍෂිඃ, රාජර්ෂිඃ; තව+ඍකාරඃ, තවර්කාරඃ; සා+ඎකාරෙණ, සර්කාරෙණ.**

---

a. “**අ ඉ එ**” යනු එකාරාදෙශවිධාන සූත්‍රයි; අ යනපදය, ඉ යන පදය, එ යනුපදයි. අ, අවර්ණයතෙම ඉ, ඉවර්ණයාපරකල්හි; එ, දෙක එක්ව එකාරවේ.

මම+ඉදම් යන තන්හි මමෙදම් යනුද, සා+ඉයම් යන තන්හි සෙයම් යනුද, තව+ඊහා යන තන්හි තවෙහා යනුද, රමා+ඊශ්වරඃ යන තන්හි රමෙශ්වරඃ යනුද, උදාහරණයි.

b. (අ)“**උ ඔ**” යනු ඔකාරාදෙශවිධානසූත්‍රයි; උ යනපදය ඔ යනු පදයි; උ, උවර්ණය පරකල්හි; අ, අවර්ණයතෙම; ඔ, දෙකඑක්ව ඔකාරවේ; ලොක+උක්තිඃ යන තන්හි ලොකොක්තිඃ යනුද, ගඞ්ගා+උදකම් යන තන්හි ගඞ්ගොදකම් යනුද, ධන+ඌනඃ යන තන්හි ධනොනඃ යනුද, ගඞ්ගා+ඌර්මිඃ යන තන්හි ගඞ්ගොර්මිඃ යනුද උදාහරණයි.

c. (අ) “**ඍ අර්**” යනු අර් ආදෙශ විධානසූත්‍රයි; ඍ යනපදය, අර් යනුපදයි, අ, අවර්ණයතෙම; ඍ, ඍවර්ණය පරකල්හි; අර්, දෙක එක්ව අර් යන රූපවේ.

දෙව+ඍෂිඃ යන තන්හි දෙවර්ෂිඃ යනුද, රාජා+ඍෂිඃ යන තන්හි රාජර්ෂිඃ යනුද, තව+ඍකාරඃ යන තන්හි තවර්කාරඃ යනුද, **සා+ඎකාරෙණ යන තන්හි සර්කාරෙණ යනුද උදාහරණයි.**

"ක්වචිදාර්" (සමාසෙ)

a. ඍණ+ඍණම්, ඍණාර්ණම්; රොග+ඍතඃ, රොගාර්තඃ.

---

## 7. සප්තමඃ පාඨඃ

---

### (අ) "ඏ අල්"

b. තව+ඏකාරඃ, තවල්කාරඃ; සා+ඏකාරෙණ, සල්කාරෙණ.

### (අ) "එ ඓ ඓ"

c. තව+එෂා, තවෛෂා, මා+එවම්, මෛවම්, තව+ඓශ්වර්‍ය්‍යම්, තවෛශ්වර්‍ය්‍යම්; සා+ඓන්ද්‍රී, සෛන්ද්‍රී.

---

a. "ක්වචිදාර්" (සමාසෙ) යනු ආර් ආදෙශවිධානසූත්‍රයි; ක්වචිත් යන පදය, ආර් යනු පදයි, සමාසෙ, සමාසය ඇතිකල්හි; ක්වචිත්, කිසිතැනෙක්හි; ආර්, ආර් යන රූපවේ

ඍණ+ඍණම් යන තන්හි ඍණාර්ණම් යනුද, රොග+ඍතඃ යන තන්හි රොගාර්තඃ යනුද උදාහරණයි.

b. (අ) "ඏ අල්" යනු අල් ආදෙශවිධානසූත්‍රයි; ඏ යන පදය, අල් යනුපදයි, අ, අවර්ණයතෙම; ඏ, ඏවර්ණය පරකල්හි; අල්, දෙකඑක්ව අල් යන රූපවේ.

තව+ඏකාරඃ යන තන්හි තවල්කාරඃ යනුද, සා+ඏකාරෙණ යන තන්හි සල්කාරෙණ යනුද උදාහරණයි.

c. (අ) "එ ඓ ඓ" යනු ඓකාරාදෙශවිධානසූත්‍රයි; එ යනපදය, ඓ යනපදය, ඓ යනුපදයි. අ, අවර්ණයතෙම; එ, එකාරයද; ඓ, ඓකාරයද පරකල්හි; ඓ, දෙක එක්ව ඓ යන රූප වේ.

තව+එෂා යනතන්හි තවෛෂා යනුද, මා+එවම් යන තන්හි, මෛවම් යනුද, තව+ඓශ්වර්‍ය්‍යම් යන තන්හි තවෛශ්වර්‍ය්‍යම් යනුද, සා+ඓන්ද්‍රී යන තන්හි සෛන්ද්‍රී යනුද, උදාහරණයි.

## (අ) "ඔ ඖ ඖ"

**a. තව+ඔදනම්, තවෞදනම්; තව+ඖනනත්‍යම්, තවෞනනත්‍යම්, සා+ඖපගවි, සෞපගවි.**

---

## 8. අෂ්ටමඃ පාඨඃ.

---

## "ඉයං සවරෙ"

**b. දධි+අත්‍ර, දධ්‍යත්‍ර; දධි+ආනය, දධ්‍යානය; අභි+උදයඃ, අභ්‍යුදයඃ; අති+ඌනම්, අත්‍යූනම්; නාභි+ඍක්ෂම්, නාභ්‍යෘක්ෂම්; අසති+ඎකාරඃ, අසත්‍යෲකාරඃ; ඉති+ඏකාරඃ, ඉත්‍යෟකාරඃ; ඉති+ඐකාරඃ, ඉත්‍යෳකාරඃ; යදි+එවම්, යද්‍යෙවම්; වාරි+ඓක්‍යම්, වාර්‍යෛක්‍යම්; දධි+ඔදනම්, දධ්‍යොදනම්; අති+ඖනනත්‍යම්, අත්‍යෞනනත්‍යම්; එවං නද්‍යම්බු, නද්‍යාදිඃ, වාණ්‍යුක්තිඃ නද්‍යෘද්ධිඃ, නද්‍යෙෂා.**

---

a. (අ)"ඔඖ ඖ" යනු ඖකාරාදෙශවිධානසූත්‍රයි; ඔ යනපදය ඖ යනපදය, ඖ යනුපදයි. අ, අවර්ණයතෙම; ඔ, ඔකාරයද; ඖ, ඖකාරයද පරකල්හි; ඖ, දෙක එක්ව ඖකාරවේ.

තව+ඔදනම් යන තන්හි තවෞදනම් යනුද, තව+ඖනනාත්‍යම් යන තන්හි, තවෞනනාත්‍යම් යනුද, සා+ඖපගවී යන තන්හි, සෞපගවී යනුද උදාහරණයි.

b. "**ඉයං සවරෙ**" යනු යකාරාදෙශවිධානසූත්‍රයි; ඉ යන පදය, යම් යන පදය; සවරෙ, යනුපදයි; සවරෙ, සවරයපරකල්හි; ඉ, ඉවර්ණයතෙම; යම්, යකාරබවට පැමිණේ

දධි+අත්‍ර යනතන්හි දධ්‍යත්‍රයනුවේ, දධි+ආනය යනතන්හි දධ්‍යානය යනුවේ, අභි+උදයඃ යන තන්හි අභ්‍යුදයඃ යනුවේ, අති+ඌනම් යන තන්හි අත්‍යූනම් යනුවේ, නාභි+ඍක්ෂම් යන තන්හි නාභ්‍යෘක්ෂම් යනුවේ, අසති+ඎකාරඃ යනතන්හි අසත්‍යෲකාරඃ යනුවේ, ඉති+ඏකාරඃ යන තන්හි ඉත්‍යෟකාරඃ යනුවේ; යදි+එවම් යන තන්හි යද්‍යෙවම් යනුවේ; වාරි+ඓක්‍යම් යන තන්හි වාර්‍යෛක්‍යම් යනුවේ, දධි+ඔදනම් යන තන්හි දධ්‍යොදනම් යනුවේ, අති+ඖනනාත්‍යම් යන තන්හි අත්‍යෞනනාත්‍යම් යනුවේ, එවං, මෙසේම, නදී+අම්බු යන තන්හි නද්‍යම්බු කියාද, නදී+ආදිඃ යන තන්හි නද්‍යාදිඃ කියාද, වාණී+උක්තිඃ යන තන්හි වාණ්‍යුක්තිඃ කියාද නදී+ඍද්ධිඃ යන තන්හි නද්‍යෘද්ධිඃ කියාද, නදී+එෂා, යනතන්හි නද්‍යෙෂා කියාද වේ.

# 9. නවමඃ පාඨඃ.

## "උ වම්" (සවරෙ)

a. මධු+අත්‍ර, මධ්වත්‍ර; මධු+ආද්‍යඃ, මධ්වාද්‍යඃ; සාධු+ඉදම්, සාධ්විදම්; අනු+ඊක්ෂා, අන්වීක්ෂා; අනු+එෂණා, අන්වෙෂණා; වධූ+අන්තඃ පුරම්, වධ්වන්තඃපුරම්; වධූ+ආසනම්, වධ්වාසනම්.

## "ඍරම්" (සවරෙ)

b. පිතෘ+අර්ථඃ, පිත්‍රර්ථඃ; නප්තෘ+ආදයඃ, නප්ත්‍රාදයඃ.

## "ඏලම්" (සවරෙ)

c. ඏ+අනුබන්ධඃ, ලනුබන්ධඃ; ඏ+ආකෘතිඃ, ලාකෘතිඃ.

## "එ අය්" (සවරෙ)

d. "යෙවො ලෝපශ්වා පදාන්තෙ"

තෙ+ආගතාඃ, තයාගතාඃ; තආගතාඃ.

---

a. "උවම්"(සවරෙ)යනු වකාරාදෙශවිධානසූත්‍රයි; උ යන පදය, වම් යනු පදයි; සවරෙ, සවරයා පරකල්හි; උ, උවර්ණයතෙම; වම්, වකාරබවට පැමිණේ; මධු+අත්‍ර යන තන්හි මධ්වත්‍ර ය... මධු+ආද්‍යඃ යන තන්හි මධ්වාද්‍යඃ යනුද, සාධු+ඉදම් ය... තන්හි සාධ්විදම් යනුද; අනු+ඊක්ෂා යන තන්හි අන්වීක්ෂා යනුද; අනු+එෂණ යන තන්හි අන්වෙෂණා යනුද; වධූ+අන්තඃ පුරම් යන තන්හි වධ්වන්තඃ පුරම් යනුද, වධූ+ආසනම් යන තන්හි, වධ්වාසනම් යනුද උදාහරණයි

b. "ඍරම්" (සවරෙ) යනු රකාරාදෙශවිධානසූත්‍රයි; ඍ යන පදය රම් යනු පදයි; සවරෙ, සවරයා පරකල්හි; ඍ, ඍවර්ණය තෙම; රම්, රකාරබවට පැමිණේ; පිතෘ+අර්ථඃ යන තන්හි පිත්‍රර්ථඃ යනුද, නප්තෘ+ආදයඃ යන තන්හි නප්ත්‍රාදයඃ යනුද උදාහරණයි.

c. "ඏලම්"(සවරෙ)යනු ලකාරාදෙශවිධානසූත්‍රයි,ඏයන පදය, ලම්යනු පදයි; සවරෙ, සවරයා පරකල්හි; ඏ, ඏවර්ණයතෙම; ලම්, ලකාරබවට පැමිණේ; ඏ+අනුබන්ධඃ යන තන්හි ලනුබන්ධඃ යනුද ඏ+ආකෘතිඃ යනතන්හි ලාකෘතිඃ යනුද උදාහරණයි.

d. "එඅය්"(සවරෙ) යනු අය් ආදෙශවිධානසූත්‍රයි; එයනපදය, අය් යනුපදයි; සවරෙ, සවරයාපරකල්හි; එ, එකාරයතෙම; අය්, අය් යන රූපවේ.

"යෙවොලෝපශ්වාපදාන්තෙ" යනු යකාර වකාර ලොපවිධාන සූත්‍රයි; යෙවොඃ යන පදය, ලොපශ් යන පදය, වා යනපදය, පදාන්තෙ යනුපදයි; පදාන්තෙ, පදාන්තයෙහිවූ; යෙවොඃ, යකාර වකාර දෙදෙනහට; වා, විකල්පයෙන්; ලොපශ්, ලොප්වේ. තෙ+ආගතාඃ යන තන්හි තයාගතාඃ යනුද, තආගතාඃ යනුද උදාහරණයි.

"ඓ ආය්" (සවරෙ)

**a. නෛසො+එනත්, නසමායෙනත්, නසමාඑනත්.**

"ඔ අව්" (සවරෙ)

**b. බටො+ඉහ, බටවිහ, බටඉහ.**

"ඖ ආව්" (සවරෙ)

**c. තෞ+ඉමෞ, තාවිමෞ, තාඉමෞ**

"එදෛතො'තඃ" (පදන්තෙලොපඃ)

**d. තෙ+අත්‍ර, තෙත්‍ර.**

---

a. **"ඓ ආය්"**(සවරෙ)යනු ආය් ආදෙශවිධානසූත්‍රයි; ඓ යන පදය, ආය් යනු පදයි; සවරෙ, සවරයා පරකල්හි; ඓ, ඓකාරය තෙම; ආය්, ආය් යන රූපවේ. නසෛ+එතත් යන තන්හි නසමායෙතත් යනුද, නසමාඑතත් යනුද උදාහරණයි.

b. **"ඔ අව්"** (සවරෙ)යනු අව් ආදෙශවිධානසූත්‍රයි; ඔයනපදය, අව් යනුපදයි; සවරෙ, සවරයා පරකල්හි, ඔ, ඔකාරයතෙම; අව්, අව් යනරූපවේ. බටො+ඉහ යන තන්හි බටවිහ, බටඉහ යනු උදාහරණයි.

c. **"ඖ ආව්"**(සවරෙ) යනු ආව් ආදෙශවිධානසූත්‍රයි, ඖ යන පදය, ආව් යනුපදයි; සවරෙ, සවරයා පරකල්හි; ඖ, ඖකාරය තෙම; ආව්, ආව් යන රූපවේ. තෞ+ඉමෞ යන තන්හි තාවිමෞ, තා ඉමෞ යනු උදාහරණයි.

d. **"එදෛතො'තඃ"**(පදන්තෙලොපඃ)යනුඅකාරලොපවිධාන සූත්‍රයි; එදෛතඃ යන පදය, අතඃ යනු පදයි; පදන්තෙ, පදන්ත යෙහිවූ; එදෛතඃ, එකාර ඔකාර දෙදෙනාකෙරෙන් පරවූ; අතඃ, අකාරයහට; ලොපඃ, ලොප්වේ. තෙ+අත්‍ර යන තන්හි තෙත්‍ර යනු උදාහරණයි.

## 10. දශමඃ පාඨඃ.

### ප්‍ර කෘ ති භා වඃ.

### "නාමි"

**a.** අමී+ආදිත්‍යාඃ, අමී+අශ්වාඃ, අමී+එධ ස්‍යාඃ.

### (න) "ඔෟ නිපාතඃ"

**b.** ආ+එවම්, නො+අත්‍රස්ථාතව්‍යම්, අහො+ආශ්චර්‍ය්‍යම්, අථො+එවම්, අ+අපෙහි, ඉ+ඉන්ද්‍රං පශ්‍ය, උ+උත්තිෂ්ඨ.

### (න) "යෙව විභෞ"

**c.** අග්නී+එතෞ, පටූ+ඉමෞ, මාලෙ+ඉමෙ.

### (න) "ප්ලුතඃ"

**d.** දෙවදත්තා3+එහි.

---

a. "නාමි" යනු ප්‍රතිෂෙධසූත්‍රයි; න යන පදය, අමී යනු පදයි; අමී, අදස් ශබ්දයාගේ අමී යන රූපය; න, සන්ධිනොවේ; අමී+ආදිත්‍යාඃ ආදිය ඊට උදාහරණයි.

b. (න) "ඔෟනිපාතඃ" යනු ප්‍රතිෂෙධසූත්‍රයි; ඔෟ, යන පදය, නිපාතඃ යනුපදයි; ඔෟනිපාතඃ, ආකාරනිපාතය හා ඔකාරාන්තනිපාතයද එක ස්වරනිපාතයද; න, සන්ධිනොවේ; ආ+එවම්, නො+අත්‍රස්ථාතව්‍යම් ආදිය ඊට උදාහරණයි.

c. (න) "යෙවවිභෞ" යනු ප්‍රතිෂෙධසූත්‍රයි; යෙව යන පදය, විභෞ යනුපදයි; විභෞ, ද්විවචනයෙහිවූ; යෙව, ඊ ඌ එ යන මොහු; න, සන්ධිනොවෙත්; අග්නී+එතෞ, පටූ+ඉමෞ, මාලෙ+ඉමෙ යනු ඊට උදාහරණයි.

[illegible]ප්ලුතඃ" යනු ප්‍රතිෂෙධසූත්‍රයි; ප්ලුතඃයනු එකපදයි; [illegible], [illegible]යතෙම හෙවත් තුන් මාත්‍රයක් ඇති ස්වරයතෙම; [illegible]වේ; දෙවදත්තා3+එහි යනු ඊට උදාහරණයි.

# 11. එකාදශඃ පාඨඃ.

## ව්‍යංජන සන්ධිඃ.

### “ඣපාං අබෙ ජබාඃ” (පදන්තෙ)

**a. අච්+අනන්තඃ, අජනන්තඃ; ෂට්+අත්‍ර, ෂඩත්‍ර; තත්+එතත්, තදෙතත්; වාක්+ඍෂා, වාගෘෂා; කකුප්+ඓන්ද්‍රී, කකුබෛන්ද්‍රී.**

### (පදන්තෙ ඣපාඃ) “ඤමෙ ඤමා වා”

**b. අච්+මම, අඤ්මම, අජ්මම; ෂට්+මම, ෂණ්මම, ෂඩ්මම තත්+නයනම්, තන්නයනම්, තද්නයනම්; වාක්+මාත්‍රම්, වාඞ්මාත්‍රම්, වාග්මාත්‍රම්; ත්‍රිෂ්ටුප්+මිනොති, ත්‍රිෂ්ටුම්මිනොති, ත්‍රිෂ්ටුබ්මිනොති. “මයටි නිත්‍යං වාච්‍යම්.” වාක්+මයම්, වාඞ්මයම්.**

---

a. “**ඣපා අබෙ ජබාඃ**”(පදන්තෙ) යනු ජබ ප්‍රත්‍යාහාරාදෙශ විධාන සූත්‍රයි. ඣපාං යන පදය, අබෙ යන පදය, ජබාඃ යනු පදයි. අබෙ, අබ ප්‍රත්‍යාහාරය පරකල්හි; පදන්තෙ, පදන්තයෙහිවූ; ඣපාං, ඣප ප්‍රත්‍යාහාරයෝ; ජබාඃ, ජබ ප්‍රත්‍යාහාරයෝ වෙත්.

අච්+අනන්තඃ, අජනන්තඃ; ෂට්+අත්‍ර, ෂඩත්‍ර; පෙ–යනු උදාහරණයි.

b. (පදන්තෙ ඣපාඃ) “**ඤමෙ ඤමාවා**” යනු ඤමා දෙශ විධාන සූත්‍රයි. ඤමෙ යන පදය, ඤමා යන පදය, වා යනු පදයි. ඤමෙ, ඤම ප්‍රත්‍යාහාරය පරකල්හි; පදන්තෙ, පදන්තයෙහිවූ; ඣපාඃ, ඣප ප්‍රත්‍යාහාරයෝ; වා, විකල්පයෙන්; ඤමාඃ, ඤම ප්‍රත්‍යාහාරයෝ වෙත්.

අච්+මම, අඤ්මම, අජ්මම; ෂට්මම, ෂණ්මම, ෂඩ්මම; පෙ–යනු උදාහරණයි. මයටි, මයට් ප්‍රත්‍යය පරකල්හි; නිත්‍යං, අවිකල්පයෙන්; වාච්‍යම්; (ඤමාදෙශ) කියයුතුයි.

## 12. ද්වාදශඃ පාඨඃ.

(පදන්තෙ අබෙවා) "චපාච්ඡඃ ශඃ"

**a. වාක්+ශුරඃ, වාක්ඡුරඃ, වාක්ශුරඃ.**

(චපාත්) "හො ඣ භාඃ"

**b. අච්+හලෞ, අජ්ඣලෞ, අජ්හලෞ; ෂට්+හලානි, ෂඩ්ඪලානි, ෂඩ්හලානි; තත්+හවිඃ, තද්ධවිඃ, තද්හවිඃ; වාක්+හරිඃ, වාග්ඝරිඃ, වාග්හරිඃ; කකුප්+භාසඃ, කකුබ්භාසඃ, කකුබ්හාසඃ.**

"තොර්ලි ලඃ"

**c. තත්+ලුනාති, තල්ලුනාති; භවාන්+ලිඛති, භවාල්ලිඛති.**

**d.** "ඡඃ" (හ්‍රස්වාද්චිඃ, ක්වචිද්දීර්ඝාදපි)

---

a. (පදන්තෙ අබෙවා) "**චපාච් ඡඃ ශඃ**" යනු ඡකාරාදෙශ විධාන සූත්‍රයි; චපාත් යන පදය, ඡඃ යන පදය, ශඃ යනු පදයි. පදන්තෙ, පදාන්තයෙහිවූ; චපාත්, චප ප්‍රත්‍යාහාරයා කෙරෙන් පරවූ; ශඃ, ශකාරයහට; අබෙ, අබ ප්‍රත්‍යාහාරයා පරකල්හි; වා, විකල්පයෙන්; ඡඃ, ඡකාරාදෙශවේ. වාක්+ශුරඃ, වාක්ඡුරඃ, වාක්ශුරඃ යනු ඊට උදාහරණයි.

b. (චපාත්) "**හො ඣ භාඃ**" යනු ඣභා දෙශ විධාන සූත්‍රයි. හඃ යන පදය, ඣභාඃ යනු පදයි; චපාත්, චප ප්‍රත්‍යාහාරයා කෙරෙන් පරවූ; හඃ, හකාරයහට; ඣභාඃ, ඣභ ප්‍රත්‍යාහාරයෝ ආදෙශවෙත්. අච්+හලෞ, අජ්ඣලෞ, අජ්හලෞ; ෂට්+හලානි, ෂඩ්ඪලානි, ෂඩ්හලානි; පෙ–යනු ඊට උදාහරණයි.

c. "**තොර්ලි ලඃ**" යනු ලකාරාදෙශ විධානසූත්‍රයි; තොඃ යන පදය, ලි යන පදය, ලඃ යනු පදයි. ලි, ලකාරය පරකල්හි; තොඃ, තවර්ගයහට; ලඃ, ලකාරාදෙශවේ. තත්+ලුනාති, තල්ලුනාති; භවාන්+ලිඛති, භවාල්ලිඛති යනු ඊට උදාහරණයි.

d. "**ඡඃ**" (හ්‍රස්වාද්චිඃ, ක්වචිද්දීර්ඝාදපි) යනු චිත්ව විධාන සූත්‍රයි. ඡඃ යනු එකපදයි; හ්‍රස්වාත්, හ්‍රස්වයා කෙරෙන් පරවූ; ඡඃ, ඡකාරයතෙම; චිඃ, චිත්වවේ; ක්වචිත්, කිසිතැනෙක්හි; දීර්ඝාත්අපි, දීර්ඝයාකෙරෙන්ද (චිත්ව) වේ.

## "ඛසෙ චපා ඣසානාම්"

**a. තව+ජත්‍රම්; තවච්ඡත්‍රම්; කුටී+ඡායා, කුටීච්ඡායා.**

# 13. ත්‍රයොදශඃ පාඨඃ.

## "සෙතොඃ ශචුභිඃ ශචුඃ"

**b. කස්+චරති, කශ්චරති; කස්+ශූරඃ, කශ්ශූරඃ; තත්+චිත්‍රම්, තච්චිත්‍රම්; තත්+ශාසත්‍රම්, තච්ඡාසත්‍රම්, තච්ශාසත්‍රම්; රාජන්+ජය, රාජඤ්ජය.**

(සෙතොඃ ශචුඃ) "නශාත්"

**c. ප්‍රශනඃ, විශනඃ.**

(සෙතොඃ) "ෂටුභිඃ ෂටුඃ"

**d. කස්+ෂෂඨඃ, කෂ්ෂෂ්ඨඃ; කස්+ටීකතෙ, කෂ්ටීකතෙ; තත්+ටීකතෙ, තට්ටීකතෙ; චක්‍රින්+ඪෞකසෙ, චක්‍රිණ්ඪෞකසෙ.**

---

a. "**ඛසෙ චපා ඣසානාම්**" යනු චපාදෙශවිධාන සූත්‍රයි; ඛසෙ යන පදය, චපා යන පදය, ඣසානාම් යනු පදයි. ඛසෙ, ඛස ප්‍රත්‍යාහාරයා පරකල්හි; ඣසානාම්, ඣස් සංඥයන්ට; චපාඃ, චප ප්‍රත්‍යාහාරයෝ වෙත්. තව+ජත්‍රම්, තවච්ඡත්‍රම්; කුටී+ඡායා, කුටීච්ඡායා යනු ඊට උදාහරණයි.

b. "**සෙතොඃ ශචුභිඃ ශචුඃ**" යනු ශකාර චවර්ගාදෙශ විධාන සූත්‍රයි; සෙතොඃ යන පදය, ශචුභිඃ යන පදය, ශචුඃ යනු පදයි. ශචුභිඃ, ශකාර චවර්ගයන් හා යොගයෙහි; සෙතොඃ, සකාර තවර්ග දෙදෙනාහට; ශචුඃ, ශකාර චවර්ගාදෙශවේ. කස්+චරති, කශ්චරති; කස්+ශූරඃ, කශ්ශූරඃ; පෙ-යනු ඊට උදාහරණයි.

c. (සෙතොඃ ශචුඃ) "**නශාත්**" යනු ප්‍රතිෂෙධ සූත්‍රයි; න යන පදය, ශාත් යනු පදයි. ශාත්, ශකාරයා කෙරෙන් පරවූ; සෙතොඃ, සකාර තවර්ගයන්හට; ශචුඃ න, ශකාර චවර්ග නොවේ. ප්‍රශනඃ, විශනඃ, යනු ඊට උදාහරණයි.

d. (සෙතොඃ) "**ෂටුභිඃ ෂටුඃ**" යනු ෂකාර ටවර්ගාදෙශවිධාන සූත්‍රයි; ෂටුභිඃ යන පදය, ෂටුඃ යනු පදයි. ෂටුභිඃ, ෂකාරටවර්ග යන් හා යොගයෙහි; සෙතොඃ, සකාර තවර්ග දෙදෙනාහට; ෂටුඃ, ෂකාර ටවර්ගාදෙශවේ. කස්+ෂෂ්ඨඃ, කෂ්ෂෂ්ඨඃ; කස්+ටීකතෙ, කෂ්ටීකතෙ; පෙ-යනු ඊට උදාහරණයි.

(තොඃ ෂ්ටුඃ) "න ෂි"

**a. සත්+ෂෂ්ඨඃ; භවාන්+ෂෂ්ඨඃ.**

(ස්තොඃ ෂ්ටුනා) "ටොරන්ත්‍යාත්"

**b. ෂට්තෙ, ෂට්සිදන්ති.**

---

## 14. චතුර්දශඃ පාඨඃ.

---

"මො'නුස්වාරඃ" (හසෙ පදාන්තෙ)

**c. තම්+හසති, තංහසති.**

"නශ්චාපදාන්තෙ ඣසෙ" (මො'නුස්වාරඃ)

**d. යශාන්+සි, යශාංසි; පුම්+භ්‍යාම්, පුංභ්‍යාම්.**

---

a. (තොඃ ෂ්ටුඃ) "**න ෂි**" යනු ප්‍රතිෂෙධසූත්‍රයි; න යන පදය ෂි යනු පදයි. ෂි, ෂකාරයා පරකල්හි; තොඃ, තකාරයහට; ෂ්ටුඃ න, ෂකාර ටවර්ගී නොවේ. සත්+ෂෂ්ඨඃ, භවාන්+ෂෂ්ඨඃ යනු ඊට උදාහරණයි.

b. (ස්තොඃ ෂ්ටුනා) "**ටොරන්ත්‍යාත්**" යනු ප්‍රතිෂෙධ සූත්‍රයි; ටොඃ යන පදය, අන්ත්‍යාත් යනු පදයි. අන්ත්‍යාත්, පදාන්තවූ; ටොඃ; ටවර්ගීයාකෙරෙන් පරවූ; ස්තොඃ, සකාර තවර්ගී දෙදෙනාහට; ෂ්ටුඃ න, ෂකාර ටවර්ගී නොවේ. ෂට්තෙ, ෂට්සීදන්ති යනු ඊට උදාහරණයි.

c. "**මො'නුස්වාරඃ**" (හසෙ පදාන්තෙ) යනු අනුස්වාරාදෙශ විධාන සූත්‍රයි; මඃ යන පදය, අනුස්වාරඃ යනු පදයි. හසෙ, ව්‍යංජනයා පරකල්හි; පදාන්තෙ, පදාන්තයෙහිවූ; මඃ, මකාරය හට; අනුස්වාරඃ, අනුස්වාරවේ. තම්+හසති යන තන්හි තංහසති යනුවේ.

d. "**නශ්චාපදාන්තෙ ඣසෙ**" (මො'නුස්වාරඃ) යනු අනුස්වාර දෙශවිධාන සූත්‍රයි; නශ්ච යන පදය, අපදාන්තෙ යන පදය, ඣසෙ යනු පදයි. ඣසෙ, ඣස ප්‍රත්‍යාහාරය පරකල්හි; අපදාන්තෙ, අපදාන්තවූ හෙවත් පදමධ්‍යයෙහිවූ; මඃ, මකාරයහටද; නශ්ච, නකාරයහටද; අනුස්වාරඃ, අනුස්වාරවේ. යශාන්+සි යන තන්හි යශාංසි යනුවේ; පුම්+භ්‍යාම් යන තන්හි පුංභ්‍යාම් යනුවේ.

"නඃ සක් ඡතෙ" (අවපරෙ)

**a. රජන්+චිත්‍රම්, රජාංශචිත්‍රම්; භවාන්+තනොති, භවාංස්තනොති.**

(නඃ) "ශෙ චක් වා"

**b.** භවාන්+ශූරඃ, {භවාඤ්ච්ඡූරඃ, භවාඤ්ඡූරඃ. / භවාඤ්චශූරඃ, භවාඤ්ශූරඃ.}

"ඞණ්නො හ්‍රස්වාද්ව්ඃ ස්වරෙ"

**c** ප්‍රත්‍යඞ්+ඉදම්, ප්‍රත්‍යඞ්ඞිදම්; සුගණ්+ඉහ, සුගණ්ණිහ; රජන්+ඉහ, රජන්නිහ.

**d.** (පදන්තෙ'නුස්වාරස්‍ය) "යමා යපෙ'ස්‍ය"

---

a. "**නඃ සක් ඡතෙ**" (අවපරෙ) යනු සගාගම විධාන සූත්‍රයි; නඃ යන පදය, සක් යන පදය, ඡතෙ යනු පදයි. අවපරෙ, අව ප්‍රත්‍යාහාරයද, ඡතෙ,ඡත ප්‍රත්‍යාහාරයද පරකල්හි; නඃ, නකාරය හට; සක්, සගාගමවේ. රජන්+චිත්‍රම් යන තන්හි රජංශචිත්‍රම් යනුවේ; භවාන්+තනොති යන තන්හි භවාංස්තනොති යනුවේ.

b. (නඃ) "**ශෙචක්වා**" යනු චගාගම විධාන සූත්‍රයි; ශෙ යන පදය, චක් යන පදය, වා යනු පදයි. ශෙ, ශකාරය පරකල්හි; නඃ, නකාරයහට; වා, විකල්පයෙන්; චක්, චගාගමවේ.

භවාන්+ශූරඃ යන තන්හි {භවාඤ්ච්ඡූරඃ, භවාඤ්ඡූරඃ / භවාඤ්චශූරඃ, භවාඤ්ශූරඃ යනුවේ.}

c. "**ඞණ්නො හ්‍රස්වාද්ව්ඃ ස්වරෙ**" යනු ද්විත්වවිධාන සූත්‍රයි. ඞණ්නඃ යන පදය, හ්‍රස්වාත් යන පදය, ද්විඃ යන පදය, ස්වරෙ යනු පදයි. ස්වරෙ, ස්වරයා පරකල්හි; හ්‍රස්වාත්, හ්‍රස්වයාකෙරෙන් පරවූ; ඞණ්නඃ, ඞ ණ න යන අක්ෂරත්‍රයට; ද්විඃ, ද්විත්වවේ. ප්‍රත්‍යඞ්+ඉදම් යනතන්හි ප්‍රත්‍යඞ්ඞිදම් යනුවේ; සුගණ්+ඉහ, යන තන්හි සුගණ්ණිහ යනුවේ; රජන්+ඉහ යන තන්හි රජන්නිහ යනුවේ.

d. (අපදන්තෙ'නුස්වාරස්‍ය) "**යමා යපෙ'ස්‍ය**" යනු යමාදෙශ විධාන සූත්‍රයි; යමා යන පදය, යපෙ යන පදය, අස්‍ය යනු පදයි. යපෙ, යප ප්‍රත්‍යාහාරයා පරකල්හි; අපදන්තෙ, පදන්ත යෙහිනුවූ; අස්‍ය අනුස්වාරස්‍ය, මේ අනුස්වාරයහට; යමාඃ, යම් සංඥයෝ ආදෙශවෙත්.

"වා පදාන්තස්‍ය"

a. ශාං+තඃ, ශාන්තඃ; තං+කරොති, තඞ්කරොති, තංකරොති; තං+තනොති, තන්තනොති, තංතනොති.

## 15. පඤ්චදශඃ පාඨඃ.

### විසර්ග සන්ධිඃ.

(ඛසෙ) "විසර්ජනීයස්‍ය සඃ ශෂ්සෙවා"

b. කඃ+තනොති, කස්තනොති; කඃ+ශෙතෙ, කශ්ශෙතෙ, කඃශෙතෙ; කඃ+ෂණ්ඩඃ, කෂ්ෂණ්ඩඃ, කඃෂණ්ඩඃ; කඃ+සාධුඃ, කස්සාධුඃ, කඃ සාධුඃ.

(ඛසෙ විසර්ජනීයස්‍ය) "කුප්වොඃ ×කෆපෞවා"

c. කඃ+කරොති, ක×කරොති, කඃකරොති; කඃ+පචති, කෆපචති, කඃ පචති. "වාචස්පත්‍යාදයො නිපාතාත් සිධ්‍යන්ති." වාචඃ+පතිඃ, වාචස්පතිඃ; බෘහත්+පතිඃ, බෘහස්පතිඃ; කාරඃ+කරඃ, කාරස්කරඃ,

---

a. "**වා පදාන්තස්‍ය**" යනු ඞමාදෙශවිධාන සූත්‍රයි; වා යන පදය, පදාන්තස්‍ය යනු පදයි. පදාන්තස්‍ය, පදාන්තයෙහිවූ අනුස්වාරයහට; වා, විකල්පයෙන් (ඞමාදෙශවේ.) ශාං+තඃ යන තන්හි ශාන්තඃ යනුවේ; තං+කරොති යන තන්හි තඞ්කරොති, තංකරොති යනුවේ; තං+තනොති යන තන්හි තන්තනොති, තංතනොති යනුවේ.

b. (ඛසෙ) "**විසර්ජනියස්‍ය සඃ ශෂසෙවා**" යනු සකාරාදෙශ විධාන සූත්‍රයි; විසර්ජනියස්‍ය යන පදය, සඃ යන පදය, ශෂසෙ යන පදය, වා යනු පදයි. ඛසෙ, ඛස ප්‍රත්‍යාහාරයා පරකල්හි; විසර්ජනියස්‍ය, විසර්ගයාහට; සඃ, සකාරාදෙශවේ; ශෂසෙ, ශෂස යන මොවුන් පරකල්හි; වා, විකල්පයෙන්(එකී අක්ෂරයෝ ආදෙශ වෙත්.) කඃ+තනොති, කස්තනොති; පෙ–කඃ+සාධුඃ, කස්සාධුඃ, කඃ සාධුඃ යනු ඊට උදාහරණයි.

c. (ඛසෙ විසර්ජනියස්‍ය) "**කුප්වොඃ ×කෆපෞවා**" යනු ජිහ්වාමූලීය උපධ්මානීයාදෙශවිධාන සූත්‍රයි; කුප්වොඃ යන පදය, ×ක යන පදය, ෆපෞ යන පදය, වා යනු පදයි. විසර්ජනියස්‍ය, විසර්ගයහට; කුප්වොඃ, කවර්ග පවර්ග සම්බන්ධිවූ; ඛසෙ, ඛස ප්‍රත්‍යාහාරයා පරකල්හි; වා, විකල්පයෙන්; ×කෆපෞ, ජිහ්වාමූලීය උපධ්මානීයයෝ ආදෙශවෙත්. කඃ+කරොති, ක×කරොති, කඃකරොති; පෙ–යනු ඊට උදාහරණයි.

වාචස්පත්‍යාදයඃ, වාචස්පත්‍යාදි සංහිතාවෝ; නිපාතාත්, නිපාතනයෙන්; සිධ්‍යන්ති, සිද්ධවෙත්; වාචඃ+පතිඃ, වාචශ්පතිඃ; පෙ-යනු උදාහරණයි.

## 16. ෂෝඩශඃ පාඨඃ.

(විසර්ජනීයස්‍ය) "අහ්නො රො'රාත්‍රිෂු"

**a.** අහඃ+පතිඃ, අහර්පතිඃ; අහඃ+ගණඃ, අහර්ගණඃ.

(විසර්ජනීයස්‍ය) "අතො'ත්‍යුඃ හබෙ"

**b.** කඃ+අර්ථඃ, කො'ර්ථඃ; කඃ+ගතඃ, කොගතඃ; අහඃ+රාත්‍රඃ අහොරාත්‍රඃ.

(විසර්ජනීයස්‍ය)"ආදබෙ ලොපශ්","ස්වරෙයත්වංවා"

**c.** දෙවාඃ+අත්‍ර, දෙවා අත්‍ර, දෙවායත්‍ර; වානාඃ+වානති, වානාවානති.

"භොසඃ"

**d.** භො හරෙ, භගො නමසෙත, අඝොයාහි.

---

a. (විසර්ජනීයස්‍ය) "අහ්නො රො'රාත්‍රිෂු" යනු රේඵාදෙශ විධාන සූත්‍රයි; අහ්නඃ යන පදය, රඃ යන පදය, අරාත්‍රිෂු යනු පදයි. අරාත්‍රිෂු, රාත්‍ර්‍යාදි ගණයෙන් පිටත්වූවන් පරකල්හි; අහ්නඃ, අහන්ශබ්දයාගේ; විසර්ජනීයස්‍ය, විසර්ගයහට; රඃ, රේඵා දෙශවේ. අහඃ+පතිඃ, අහර්පතිඃ; අහඃ+ගණඃ, අහර්ගණඃ යනු උදාහරණයි.

b. (විසර්ජනීයස්‍ය) "අතො'ත්‍යුඃ හබෙ" යනු උකාරාදෙශ විධාන සූත්‍රයි; අතඃ යන පදය, අති යන පදය, උඃ යන පදය, හබෙ යනු පදයි. අති, අකාරයා පරකල්හි; අතඃ, අකාරයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයහට; උඃ, උකාරාදෙශවේ. කඃ+අර්ථඃ, කො'ර්ථඃ; කඃ+ගතඃ, කොගතඃ යනු උදාහරණයි.

c. (විසර්ජනීයස්‍ය) "ආදබෙ ලොපශ්" යනු විසර්ගලොප විධාන සූත්‍රයි; ආත් යනපදය, අබෙ යනපදය, ලොපශ් යනු පදයි. ආත්, අවර්ණයාකෙරෙන් පරවූ හෙවත් අකාරයාකෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයහට; අබෙ, අබප්‍රත්‍යාහාරයා පර කල්හි; ලොපශ්, ලොප්වේ. "ස්වරෙ යත්වං වා" යනු යකාරාදෙශ විධාන සූත්‍රයි; ස්වරෙ යන පදය, යත්වං යන පදය, වායනු පදයි. ස්වරෙ, ස්වරයාපරකල්හි; (අකාරයා කෙරෙන් පරවූ විසර්ගය හට) වා, විකල්පයෙන්; යත්වං, යකාරාදෙශවේ. දෙවාඃ+අත්‍ර, දෙවා අත්‍ර, දෙවායත්‍ර යනු උදාහරණයි.

d. "භොසඃ" යනු විසර්ගලොපවිධාන සූත්‍රයි; භොසඃ යනු එකපදයි. භොස්, භගොස්, අඝොස් යන නිපාතයන් කෙරෙන් පරවූ විසර්ගයට අබ ප්‍රත්‍යාහාරයා පරකල්හි ලොප්වේ. භොහරෙ, භගො නාමයෙත, අඝොයාහි යනු උදාහරණයි.

## 17 සප්තදශඃ පාඨඃ

(විසර්ජනියස්‍ය අබෙ) "නාමිනො රඃ"

**a. අග්නිඃ+අත්‍ර, අග්නිරත්‍ර; පටුඃ+වක්තා, පටුර්වක්තා.**

(විසර්ජනීයස්‍ය) "රෙඵ ප්‍රකෘතිකස්‍ය බපෙ වා"

**b. ගිඃ+පතිඃ, ගිර්පතිඃ, ගිෆපතිඃ, ගිඃපතිඃ.**

(විසර්ජනියස්‍ය රෙඵ ප්‍රකෘති කස්‍ය අබෙ) "රඃ"

**c. ප්‍රාතඃ+අත්‍ර, ප්‍රාතරත්‍ර; අන්තඃ+ගතඃ, අන්තර්ගතඃ.**

(රෙඵස්‍ය) "රි ලොපො දීඝශ්ච"

**d. පුනඃ+රමතෙ, පුනාරමතෙ; හරිඃ+රාජතෙ, හරීරාජතෙ.**

---

a. (විසර්ජනියස්‍ය අබෙ) **"නාමිනො රඃ"** යනු රෙඵාදෙශ විධාන සූත්‍රයි; නාමිනඃ යන පදය, රඃ යනු පදයි. අබෙ, අබ ප්‍රත්‍යාහාරයා පරකල්හි; නාමිනඃ, නාමීහු කෙරෙන් පරවූ; විසර්ජනි යස්‍ය, විසර්ගයහට; රඃ, රෙඵාදෙශවේ. අග්නිඃ+අත්‍ර, අග්නිරත්‍ර; පටුඃ+වක්තා, පටුර්වක්තා යනු ඊට උදාහරණයි.

b. (විසර්ජනියස්‍ය) **"රෙඵ ප්‍රකෘතිකස්‍ය බපෙ වා"** යනු රෙඵාදෙශ විධානසූත්‍රයි; රෙඵප්‍රකෘතිකස්‍ය යනපදය, බපෙ යන පදය, වා යනු පදයි. රෙඵ ප්‍රකෘතිකස්‍ය, රෙඵප්‍රකෘතිකොට ඇති; විසර්ජනියස්‍ය, විසර්ගයහට; බපෙ, බප ප්‍රත්‍යාහාරයා පරකල්හි; වා, විකල්පයෙන් (රෙඵාදෙශ වේ.) ගීඃ+පතිඃ, ගීර්පතිඃ, ගීෆපතිඃ, ගීඃපතිඃ යනු උදාහරණයි.

c. (විසර්ජනියස්‍ය රෙඵ ප්‍රකෘතිකස්‍ය අබෙ) **"රඃ"** යනු රෙඵාදෙශ විධානසූත්‍රයි; රඃ යනු එකපදයි. අබෙ, අබප්‍රත්‍යාහාරයා පරකල්හි; රෙඵ ප්‍රකෘතිකස්‍ය, රෙඵ ප්‍රකෘතිකාවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයහට; රඃ, රෙඵාදෙශවේ. ප්‍රාතඃ+අත්‍ර, ප්‍රාතරත්‍ර; අන්තඃ+ගතඃ යනු ඊට උදාහරණයි.

d. (රෙඵස්‍ය) **"රිලොපො දීඝශ්ච"** යනු රකාර ලොප හා දීඝවිධාන සූත්‍රයි; රි යන පදය, ලොපඃ යන පදය, දීඝඃ යන පදය, ච යනු පදයි. රි, රකාරය පරකල්හි; රෙඵස්‍ය, රෙඵය හට; ලොපඃ, ලොප්වේ; දීඝශ්ච, පූර්වස්වරයහට දීඝද වේ. පුනඃ+රමතෙ, පුනාරමතෙ; හරිඃ+රාජතෙ, හරීරාජතෙ යනු උදාහරණයි.

(විසර්ජනීයස්‍ය ලොපශ්)"සෙෂොඛසෙ"

**a. සඃ+චරති, සචරති; එෂඃ+හසති, එෂහසති.**

---

**විතීයාධ්‍යායඃ.**

---

## 1. ප්‍රථමඃ පාඨඃ

---

**ප්‍රථමා ප්‍රයොගාඃ**

---

**b. මෘගො ධාවති.**
**c. චන්ද්‍රඃ උදෙති.**
**d. බාලඃ පෘච්ඡති.**

---

a. (විසර්ජනීයස්‍ය ලොපශ්) "**සෙෂොඛසෙ**" යනු විසර්ගලොප විධාන සූත්‍රයි; **සෙෂාත්** යන පදය, ඛසෙ යනු පදයි. ඛසෙ, ව්‍යඤ්ජනයා පරකල්හි; සෙෂාත්, ස, එ, ෂ, ශබ්දයන්කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයාට; ලොපශ්, ලොප්වේ. සඃ+චරති, සචරති; එෂඃ+හසති, එෂහසති යනු උදාහරණයි.

b. ප්‍රථමා ප්‍රයොගායාඃ, ප්‍රථමා ප්‍රයොගයෝ කියනුලැබෙත්.

මෘගඃ, මෘගතෙම; ධාවති, දිවෙයි. ධාවති-ලට් කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; මෘගඃ-වුකන කර්තෘ අකාරාන්ත පුංලිඞ්ගා 'මෘග' ශබ්දඃ; මෘගඃ, මෘගෞ, මෘගාඃ; ධාවති, ධාවතඃ, ධාවන්ති. 'සෘ'-ගතෞ ධාවාදෙශඃ, සකර්මකඃ පරස්මෛපදී; අථවා, 'ධාව'-ශීඝ්‍රගතෞ, අකර්මකඃ පරස්මෛපදී.

c. චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; උදෙති, උදාවෙයි. උදෙති-ලට් කර්තෘ කාරකපරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; චන්ද්‍රඃ-වුකන කර්තෘ අකාරාන්ත පුංලිඞ්ගා 'චන්ද්‍ර' ශබ්දඃ; චන්ද්‍රඃ, චන්ද්‍රෞ, චන්ද්‍රාඃ; උදෙති, උදිතඃ, උද්‍යන්ති. 'උත්'පූර්වඃ 'ඉ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

d. බාලඃ, ළදරුතෙම; පෘච්ඡති, විචාරයි. පෘච්ඡති-ලට් කර්තෘ කාරකපරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; බාලඃ-වුකන කර්තෘ අකාරාන්ත පුංලිඞ්ගා 'බාල' ශබ්දඃ; බාලඃ, බාලෞ, බාලාඃ; පෘච්ඡති, පෘච්ඡතඃ, පෘච්ඡන්ති. 'පෘච්ඡ්'-ජිඥාසායාම්, විකර්මකඃපරස්මෛපදී.

**a. සත්‍යං න නශ්‍යති.**
**b. අග්නිර්ජ්වලති.**
**c. ලතාකම්පතෙ.**
**d. වාරිපතති.**
**e. නාරී රොදති,**
**f. ඥානි නාවසීදති.**

---

a. සත්‍යං, සත්‍යතෙම; න නශ්‍යති, නොනසී. නශ්‍යති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; සත්‍යං-උක්තකර්තෘ; න-අව්‍යයම්. අකාරාන්ත ක්ලීවලිඞ්ග 'සත්‍ය' ශබ්දඃ; සත්‍යං, සත්‍යෙ, සත්‍යානි; නශ්‍යති, නශ්‍යතඃ, නශ්‍යන්ති 'නශ'-අදර්ශනෙ, අකර්මකඃ පරස්මෛපදී.

b. අග්නිඃ. වහ්නිතෙම; ජ්වලති, දිලිසෙයි; ජ්වලති-ලට් කර්තෘකාරකපරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; අග්නිඃ-උක්තකර්තෘ. ඉකාරාන්ත පුංලිඞ්ග 'අග්නි' ශබ්දඃ; ජ්වලතිඃ ජ්වලිතඃ, ජ්වලන්ති. 'ජ්වල'-දීප්තෞ, අකර්මකඃ පරස්මෛපදී.

c. ලතා, ලියතොමෝ; කම්පතෙ, කම්පාවන්නීය; කම්පතෙ-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා, ලතා-උක්තකර්තෘ. අකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'ලතා' ශබ්දඃ; ලතා ලතෙ, ලතාඃ. 'කපි'-කිඤ්චිච්චලනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

d. වාරි, ජලයතෙම; පතති, වැටෙයි. පතති-ලට්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; වාරි-උක්තකර්තෘ. ඉකා රාන්ත ක්ලීවලිඞ්ග 'වාරි' ශබ්දඃ; 'පති'-ගතෞ, අකර්මකඃ පරස්මෛපදී.

e. නාරී, ස්ත්‍රීතොමෝ; රොදති, හඬයි. රොදති-ලට් කර්තෘකාරකපරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; නාරී-උක්ත කර්තෘ. රොදති, රුදිතඃ, රුදන්ති; 'රුදිර්'-අශ්‍රුවිමොචනෙ, අකර්මකඃ පරස්මෛපදී. ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'නාරී' ශබ්දඃ.

f. ඥානී, නුවණැති තෙම; න අවසීදති, නොපසුබසී. අව සීදති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචනක්‍රියා; ඥානී-උක්ත කර්තෘ; න-අව්‍යයම්. න්කාරාන්ත පුංලිඞ්ග 'ඥානින්' ශබ්දඃ; 'අව' පූර්වඃ 'සද'-විසරණගත්‍යවසාදනෙෂු; අකර්මකඃ පරස්මෛපදී.

**a. විද්වාන් ක්ෂමතෙ.**
**b. අහඃ ප්‍රකාශතෙ.**
**c. පන්ථා න විද්‍යතෙ.**
**d. වායුර්වාති.**
**e. මධු ක්ෂරති.**
**f. බධූස්තිෂ්ඨති.**
**g. පිතා පාලයති.**

---

a. විද්වාන්, පණ්ඩිතතෙම; ක්ෂමතෙ, ඉවසයි. ක්ෂමතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථමපුරුෂෛකවචනක්‍රියා; විද්වාන්-වුක්තකර්තෘ. සකාරාන්තපුංලිඞ්ගො 'විද්වස්' ශබ්දඃ; 'ක්ෂමූ'-සහනෙ, අකර්මකඃ ආත්මනෙ පදී.

b. අහඃ, දිනයතෙම; ප්‍රකාශතඃ, බබළයි. ප්‍රකාශතෙ-ලට් කර්තෘකාරකආත්මනෙපද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; අහඃ-වුක්තකර්තෘ. නකාරාන්ත ක්ලීවලිඞ්ගො 'අහන්' ශබ්දඃ; ප්‍රපූර්වඃ 'කාශෘ'-දීප්තෞ, අකර්මකඃ ආත්මනෙපදී.

c. පන්ථාඃ, මාර්ගයතෙම; න විද්‍යතෙ, නොවේ. විද්‍යතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛකවචනක්‍රියා; පන්ථාඃ, වුක්තකර්තෘ; න-අව්‍යයම්. නකාරාන්තපුංලිඞ්ගො 'පථින්'ශබ්දඃ; 'විද'-සත්තායාම්, අකර්මකඃ ආත්මනෙ පදී.

d. වායුඃ, වාතයතෙම, වාති, හමයි. වාති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; වායුඃ-වුක්තකර්තෘ. උකාරාන්ත පුංලිඞ්ගො 'වායු' ශබ්දඃ; 'වා'-ගතිගන්ධනයොඃ, සකර්මකඃ පරස්මෛපදී.

e. මධු, මීතෙම; ක්ෂරති, වැගිරෙයි. ක්ෂරති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචනක්‍රියා; උකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'මධු' ශබ්දඃ; 'ක්ෂර'-සංචලනෙ, අකර්මකඃපරස්මෛ පදී.

f. බධූඃ, ස්ත්‍රීතොමෝ; තිෂ්ඨති, සිටී. තිෂ්ඨති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; බධූඃ-වුක්ත කර්තෘ ඌකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'බධූ' ශබ්දඃ; 'ෂ්ඨා'-ගතිනිවෘත්තෞ, අකර්මකඃ පරස්මෛපදී

g. පිතා, පියතෙම; පාලයති, රක්ෂාකෙරෙයි. පාලයති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; පිතා-වුක්ත කර්තෘ; ඍකාරාන්ත පුංලිඞ්ගො 'පිතෘ' ශබ්දඃ. 'පාල'-රක්ෂණෙ, සකර්මකඃ උභය පදී.

**a. මාතා ස්නිහ්‍යති.**
**b. ගෞඃ ශබ්දායතෙ.**
**c. නෞඃ සඤ්චලති.**
**d. මහාන් අනුකම්පතෙ.**
**e. රාජා රක්ෂති.**
**f. දික් ශොභතෙ.**

---

a. මාතා, මවුතොමෝ; ස්නිහ්‍යති, ස්නෙහ කෙරෙයි. ස්නිහ්‍යති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛකවචනක්‍රියා; මාතා-වුක්තකර්තෘ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'මාතෘ' ශබ්දඃ. ස්නිහ-ප්‍රීතෞ, අකර්මකඃ පරස්මෛපදී.

b. ගෞඃ, ගෙරිතෙමඃ; ශබ්දායතෙ, ශබ්ද කෙරෙයි. ශබ්දායතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ගෞඃ-වුක්තකර්තෘ; ඖකාරාන්තපුංලිඞ්ගා 'ගෞ' ශබ්දඃ, ශබ්දායතෙ, ශබ්දයෙතෙ, ශබ්දායනෙන නාමධාතුඃ.

c. නෞඃ, නෞකා තොමෝ; සඤ්චලති, සැලෙයි. සංචලති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; නෞඃ- වුක්තකර්තෘ; ඖකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'නෞ' ශබ්දඃ, 'සං' පූර්වඃ 'චල'-ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

d. මහාන්, මහත්තෙම; අනුකම්පතෙ, අනුකම්පා වේ. අනුකම්පතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; මහාන්-වුක්තකර්තෘ; නකාරාන්ත පුංලිඞ්ගා 'මහත්' ශබ්දඃ. 'අනු' පූර්වඃ 'කපි'-කිංචිච්චලනෙ, අකර්මකඃ ආත්මනෙ පදී.

e. රාජා, රජතෙම; රක්ෂති, රක්ෂා කෙරෙයි. රක්ෂති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; රාජා-වුක්තකර්තෘ; නකාරාන්ත පුංලිඞ්ගා 'රාජන්' ශබ්දඃ, 'රක්ෂ'-පාලනෙ, සකර්මකඃ පරස්මෛ පදී.

f. දික්, දිශාතොමෝ; ශොභතෙ, හොබනීය. ශොභතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; දික්-වුක්තකර්තෘ; ශකාරාන්ත පුංලිඞ්ගා 'දිශ්' ශබ්දඃ. 'ශුභ'-දීප්තෞ, අකර්මකඃ ආත්මනෙ පදී.

a. යශො වර්ධතෙ.
b. ධර්මො විජයතෙ.

## 2. ද්විතීයඃ පාඨඃ.

c. ද්විතීයා ප්‍රයොගායඃ.

මෛත්‍රො ග්‍රාමං ගච්ඡති.
d. ක්‍රූරඃ පරං පීඩයති.
e. චෞරඃ පරධනං මුෂ්ණාති.

---

a. යශඃ, යසතෙම; වර්ධතෙ, වැඩෙයි. වර්ධතෙ-ලට් කර්තෘ කාරක ආත්මනෙපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; යශඃ-වුක්ත කර්තෘ; ශකාරාන්ත ක්ලීවලිඞ්ගා 'යශස්' ශබ්දඃ, 'වෘධු'-වෘද්ධෞ, අකර්මකඃ ආත්මනෙ පදී.

b. ධර්මඃ, ධර්මයතෙම; විජයතෙ, දිනයි. විජයතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ධර්මඃ-වුක්තකර්තෘ; අකාරාන්ත පුංලිඞ්ගා 'ධර්ම' ශබ්දඃ, 'වි' පූර්වඃ 'ජි'-ජයෙ, සකර්මකඃ ආත්මනෙ පදී.

c ද්විතීයා ප්‍රයොගායඃ, ද්විතීයා ප්‍රයොගයෝ කියනුලැබෙත්.

මෛත්‍රඃ, මෛත්‍රතෙම; ග්‍රාමං, ගමට; ගච්ඡති, යෙයි; ගච්ඡති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; මෛත්‍රඃ-වුක්තකර්තෘ; ග්‍රාමං-අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ගා 'මෛත්‍ර' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා, 'ග්‍රාම' ශබ්දඃ, 'ගච්ඡ්'-ගමෞ, ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

b. ක්‍රූරඃ, ක්‍රූරතෙම; පරං, අන්‍යයා; පීඩයති, පෙළයි.. පීඩයති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ක්‍රූරඃ-වුක්තකර්තෘ පරං- අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ගා 'ක්‍රූර' ශබ්දඃ; අකාරාන්තඃ 'පර' ශබ්දඃ; 'පුංසි'-පීඩයති, පීඩබන්ධෙ' සකර්මකඃ උභය පදී.

e. චෞරඃ, සොරතෙම; පරධනං, අන්සතු ධනය; මුෂ්ණාති, පැහැරගනී. මුෂ්ණාති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; චෞරඃ-වුක්තකර්තෘ; පරධනං-අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ගා 'චෞර' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'පරධන' ශබ්දඃ; මුෂ්ණාති, මුෂ්ණීතඃ, මුෂ්ණන්ති; 'මුෂ'-ස්තෙයෙ, විකර්මකඃ පරස්මෛපදී.

a. ශ්‍රමී විද්‍යාං ලභතෙ.
b. සාධුඃ පූජාමර්හති.
c. දුර්බලො නරපතිමාශ්‍රයති.
d. පථිකො වාරි පිවති.
e. දුර්ජනඃ සාධුමවජානාති.

---

a ශ්‍රමී, ශාස්ත්‍රාභ්‍යාස තෙම; විද්‍යාං ශාස්ත්‍රය; ලභතෙ, ලබයි; ලභතෙ– ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ශ්‍රමී–වුක්තකර්තෘ; විද්‍යාං–අනුක්තකර්ම; නකාරාන්ත පුංලිඞ්ග 'ශ්‍රමින්' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'විද්‍යා' ශබ්දඃ; 'ලභ'– ප්‍රාප්තෞ, සකර්මකඃ ආත්මනෙපදී.

b. සාධුඃ, සත්පුරුෂතෙම; පූජාම්, පූජාවට; අර්හති, සුදුසුයි; අර්හති–ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; සාධුඃ–වුක්තකර්තෘ; පූජාම්–අනුක්තකර්ම; උකාරාන්ත පුංලිඞ්ග 'සාධු' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'පූජා' ශබ්දඃ; 'අර්හ'–පූජායාම්, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

c. දුර්බලඃ, දුර්බලතෙම; නරපතිම්, රජ; ආශ්‍රයති, ඇසුරු කෙරෙයි. ආශ්‍රයති–ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; දුර්බලඃ–වුක්තකර්තෘ; නරපතිං–අනුක්තකර්ම; (නරානාං පතිං 'නරපතිඃ' ෂෂ්ඨී තත්පුරුෂඃ); අකාරාන්ත පුංලිඞ්ග 'දුර්බල' ශබ්දඃ; ඉකාරාන්ත පුංලිඞ්ග 'නරපති' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'ශ්‍රිඤ්'–සේවායාම්, භ්වාදි සකර්මකඃ උභයපදී.

d. පථිකඃ මඟීතෙම; වාරි, ජලය; පිවති, පානයකෙරෙයි. පිවති–ලට්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; පථිකඃ–වුක්තකර්තෘ; වාරි–අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ග 'පථික' ශබ්දඃ; ඉකාරාන්ත ක්ලීවලිඞ්ග 'වාරි' ශබ්දඃ; 'පා'–පානෙ, පිවාදෙශඃ, සකර්මකඃ පරස්මෛපදී.

e. දුර්ජනඃ දුර්ජනතෙම; සාධුම්, සත්පුරුෂයාට; අවජානාති, අවමන් කෙරෙයි. අවජානාති–ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; දුර්ජනඃ–වුක්තකර්තෘ; සාධුම්–අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ග 'දුර්ජන' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ග 'සාධු' ශබ්දඃ; 'අව' පූර්වඃ 'ඥා' –අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

**a. බාලකො මධු ප්‍රාර්ථයතෙ.**
**b. ශ්වශ්‍රූර් බධූං රක්ෂති.**
**c. රාජා භුවං භුඞ්ක්තෙ.**
**d. ශිශුර්මාතරං මොදකං යාචතෙ.**
**e. පුත්‍රඃ පිතරං ශාස්ත්‍රං පෘච්ඡති.**

---

a. බාලකඃ, ළදරුතෙම; මධු, මී; ප්‍රාර්ථයතෙ, පතයි; ප්‍රාර්ථයතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; බාලකඃ, උක්තකර්තෘ; මධු-අනුක්තකර්ම; අකාරාන්ත පුංලිඞ්ග 'බාලක' ශබ්දඃ; උකාරාන්ත ක්ලීවලිඞ්ග 'මධු' ශබ්දඃ; 'ප්‍ර' පූර්වඃ 'අර්ථ'-යාචනෙ, චුරාදි ද්විකර්මකඃ ආත්මනෙ පදී.

b. ශ්වශ්‍රූඃ, නැන්දනි තොමෝ; බධූං, යෙහෙළිය; රක්ෂති, රක්ෂා කෙරෙයි. රක්ෂති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ශ්වශ්‍රූඃ-උක්තකර්තෘ; බධූං-අනුක්තකර්ම; ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'ශ්වශ්‍රූ' ශබ්දඃ; ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'බධූ' ශබ්දඃ; 'රක්ෂ'-පාලනෙ, භ්වාදී සකර්මකඃ පරස්මෛපදී.

c. රාජා, රජතෙම; භුවං, ලොකය; භුඞ්ක්තෙ, පරිභොග කෙරේ; භුඞ්ක්තෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; රාජා-උක්තකර්තෘ; භුවං-අනුක්තකර්ම; නකාරාන්ත පුංලිඞ්ග 'රාජන්' ශබ්දඃ; ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'භූ' ශබ්දඃ; 'භුජ්'-අභ්‍යවහරණෙ, සකර්මකඃ ආත්මනෙ පදී.

d. ශිශුඃ, ළදරුතෙම; මාතරං, මව; මොදකං, ආහාරය; යාචතෙ, ඉල්වයි; යාචතෙ-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ශිශුඃ-උක්තකර්තෘ; මොදකං-අනුක්ත මුඛ්‍යකර්ම; මාතරං-අනුක්ත ගෞණ කර්ම; උකාරාන්තපුංලිඞ්ග 'ශිශු' ශබ්දඃ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'මාතෘ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'මොදක' ශබ්දඃ; යාචතෙ, යාචෙතෙ, යාචන්තෙ; 'යාචෘ'-යාඤ්ඤායාම්, භ්වාදි ද්විකර්මකඃ උභය පදී.

e. පුත්‍රඃ, පුත්‍රතෙම; පිතරං, පියා; ශාස්ත්‍රං, ශාස්ත්‍රය; පෘච්ඡති, විචාරයි. පෘච්ඡති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; පුත්‍රඃ-උක්තකර්තෘ; ශාස්ත්‍රං-අනුක්තමුඛ්‍යකර්ම; පිතරං අනුක්තගෞණකර්ම; අකාරාන්ත පුංලිඞ්ග 'පුත්‍ර' ශබ්දඃ; ඍකාරාන්තපුංලිඞ්ග 'පිතෘ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'ශාස්ත්‍ර' ශබ්දඃ; 'ප්‍රච්ඡ්'-ඥීප්සායාම්, තුදාදි ද්විකර්මකඃ පරස්මෛපදී.

**a. ගොපො ගාං දුග්ධං දොග්ධි.**
**b. වණික් නාවං පණ්‍යමුපනයති.**
**c. ගුරුඃ ශිෂ්‍යං ශාස්ත්‍ර මධ්‍යාපයති.**
**d. වෘද්ධඃ ශය්‍යාමධිශෙතෙ.**
**e. තාපසා වනමධිවසන්ති.**

---

a ගොපඃ, ගොපලුතෙම; ගාං, දෙන; දුග්ධං, කිරි; දොග්ධි, දොවයි. දොග්ධි-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ගොපඃ-උක්තකර්තා; ගාං-අනුක්ත ගෞණකර්ම; දුග්ධං අනුක්තමුඛ්‍යකර්ම; අකාරාන්ත පුංලිඞ්ගා 'ගොප' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'දුග්ධ' ශබ්දඃ; දොග්ධි, දුග්ධං, දුහන්ති; 'දුහ' ප්‍රපූරණෙ, අදාදිද්විකර්මකඃ උභයපදී.

b. වණික්, වෙළඳතෙම; නාවං, නැවට; පණ්‍යං, විකිණිය යුතුදෙය; උපනයති, එලවයි; උපනයති-ලට් කර්තෘකාරකප්‍රථම පුරුෂෛකවචනක්‍රියා; වණික්-උක්තකර්තා; පණ්‍යං-අනුක්තමුඛ්‍ය කර්ම; නාවං-අනුක්තගෞණකර්ම; ජකාරාන්තපුංලිඞ්ගා 'වණිජ්' ශබ්දඃ; ඖකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'නෞ' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'පණ්‍ය' ශබ්දඃ; 'උප'පූර්ව'ණීඤ්'-ප්‍රාපණෙ, භ්වාදි ද්විකර්මකඃ උභය පදී.

c. ගුරුඃ, ආචාර්‍ය්‍යතෙම; ශිෂ්‍යං, ශිෂ්‍යයා; ශාස්ත්‍රං, ශාස්ත්‍රය; අධ්‍යාපයති, හදරවයි. අධ්‍යාපයති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචනක්‍රියා; ගුරුඃ උක්තකර්තා; ශාස්ත්‍රං-අනුක්ත මුඛ්‍යකර්ම; ශිෂ්‍යං-අනුක්ත ගෞණකර්ම; උකාරාන්ත පුංලිඞ්ගා 'ගුරු' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'ශිෂ්‍ය' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ශාස්ත්‍ර' ශබ්දඃ; 'අධි' පූර්වඃ 'ඉඞ්'-අධ්‍යයනෙ, අදාදිසකර්මකඃ පරස්මෛ පදී.

d. වෘද්ධඃ, මහලුතෙම; ශය්‍යාම්, ඇඳෙහි; අධිශෙතෙ, හොවී. අධිශෙතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; වෘද්ධඃ-උක්තකර්තා; ශය්‍යාම්-අධිශීඞ්යොගෙ ආධාරස්‍ය කර්මසංඥා; අකාරාන්ත පුංලිඞ්ගා 'වෘද්ධ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ශය්‍යා' ශබ්දඃ, අධිශෙතෙ, අධිශයාතෙ, අධිශෙරතෙ; 'අධි' පූර්වඃ 'ශීඞ්'-ස්වප්නෙ, අකර්මකඃ ආත්මනෙ පදී.

e තාපසාඃ, තාපසයෝ; වනං, වනයෙහි; අධිවසන්ති, වාසය කෙරෙත්; අධිවසන්ති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂ බහු වචනක්‍රියා; තාපසාඃ-උක්තකර්තා; වනං-ආධාරෙ ද්විතීයා; අකාරාන්තපුංලිඞ්ගා 'තාපස' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වන' ශබ්දඃ; 'අධි' පූර්වඃ 'වස'-නිවාසෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛ පදී.

**a. මාණවකඃ සංවත්සරං වෙදමධීතෙ.**
**b. අභිතොධනිනං දරිද්‍රා වර්තන්තෙ.**
**c. ගුරුං ප්‍රති භක්ති රුචිතා.**
**d. ධික් පාපකාරිණම්.**
**e. හාමූර්ඛම්.**

---

a. මාණවකඃ, මාණවකතෙම; සංවත්සරං, අවුරුද්දක් මුලුල් ලෙහි; වෙදං, වෙදය; අධීතෙ, හදාරයි. අධීතෙ-ලට් කර්තෘ කාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; මාණවකඃ-උක්තකර්තෘ; වෙදම්-අනුක්තකර්ම; සංවත්සරං-අත්‍යන්තසංයොගෙ ද්විතීයා; අකාරාන්ත පුංලිඞ්ගා 'මාණවක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගා 'සංවත්සර' ශබ්දඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගා 'වෙද' ශබ්දඃ; අධීතෙ අධීයාතෙ, අධියතෙ; 'අධි' පූර්වඃ 'ඉඞ්'-අධ්‍යයනෙ, අදාදිද්විකර්මකඃ ආත්මනෙ පදී.

b. දරිද්‍රාඃ, දිළින්දෝ; අභිතො ධනිනං, ධනවන්තයා හාත් පසෙහි; වර්තන්තෙ, පවතිත්; වර්තන්තෙ-ලට් කර්තෘකාරක ආත්මනෙ පද ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා; දරිද්‍රාඃ-උක්ත කර්තාරඃ; ධනිනං-අභිතො යොගෙ ද්විතීයා; අභිතඃ-අව්‍යයම්; නකාරාන්ත පුංලිඞ්ගා 'ධනින්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දරිද්‍ර' ශබ්දඃ; 'වෘතු'-වර්තනෙ, භ්වාදි අකර්මකඃ ආත්මනෙ පදී.

c. ගුරුං ප්‍රති, ආචාර්‍ය්‍යයා කෙරෙහි; භක්තිඃ, භක්තිතොමෝ උචිතා, සුදුසුයි. උචිතා-(ස්‍යාත්) උක්තකර්තෘ; උචිතා-කර්තෘ විශෙෂණම්; ගුරුං-කර්ම ප්‍රවචනීය උචියොගෙ සප්තම්‍යර්ථෙ ද්විතීයා; ප්‍රති-අව්‍යයම්; උකාරාන්ත පුංලිඞ්ගා 'ගුරු' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'භක්ති' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'උචිතා' ශබ්දඃ; ස්‍යාත්; ස්‍යාතාම්, ස්‍යුඃ; 'අස'භුවි, අදාදිඅකර්මකඃ පරස්මෛ පදී.

d. පාපකාරිණම්, පව්කරන්නා හට; ධික්, නින්දායි, (ස්‍යාත්) විධිලිඞ්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ධික්-උක්ත කර්තෘ; පාපකාරිණම්-ධික් යොගෙ ද්විතීයා; ධික්-අව්‍යයම්; නකාරාන්ත පුංලිඞ්ගා 'පාපකාරින්' ශබ්දඃ.

e. මූර්ඛම්, මූර්ඛයා හට; හා, ශොක කටයුතුයි. හා-උක්ත කර්තෘ; මූර්ඛම්-හා යොගෙ ද්විතීයා; හා-අව්‍යයම්; අකාරාන්ත පුං ලිඞ්ගා 'මූර්ඛ' ශබ්දඃ.

## 3. තෘතීයඃ පාඨඃ.

### තෘතීයා ප්‍රයොගාඃ.

a. කුලාලො දණ්ඩෙන ඝටං කරොති.
b. තක්ෂා කුඨාරෙන වෘක්ෂං ඡිනත්ති.
c. කෘෂකො ලාඞ්ගලෙන භූමිං කෂති.
d. විද්‍යයා ලොකො ආදරං ලභතෙ.

---

a. තෘතීයා ප්‍රයොගාඃ, තෘතීය ප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

කුලාලඃ, කුඹල් තෙම; දණ්ඩෙන, දණ්ඩකරණකොට ගෙන; ඝටං, කලය; කරොති, කෙරෙයි. කරොති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; කුලාලඃ-උක්ත කර්තා; ඝටං-අනුක්තකර්ම; දණ්ඩෙන-අනුක්තකරණම්; අකාරාන්ත පුංලිඞ්ගා 'කුලාල' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'දණ්ඩ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ඝට' ශබ්දඃ; කරොති, කුරුතඃ, කුර්වන්ති; 'ඩුකෘඤ්'-කරණෙ, තනාදි සකර්මකඃ උභය පදී.

b. තක්ෂා, වඩුතෙම; කුඨාරෙන, කෙටේරියෙන්; වෘක්ෂං, වෘක්ෂය; ඡිනත්ති, සිඳී. ඡිනත්ති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; තක්ෂා-උක්තකර්තා; වෘක්ෂං-අනුක්තකර්ම; කුඨාරෙන, අනුක්තකරණම්; නකාරාන්ත පුංලිඞ්ගා 'තක්ෂන්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කුඨාර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'වෘක්ෂ' ශබ්දඃ; ඡිනත්ති, ඡින්තඃ; ඡින්දන්ති; 'ඡි'-ධිර් වෛධිකරණෙ, සකර්මකඃ උභය පදී.

c. කෘෂකඃ, ගොවිතෙම; ලාඞ්ගලෙන, නගුලෙන්; භූමිං, භූමිය; කෂති, සායි. කෂති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; කෘෂකඃ-උක්තකර්තා; භූමිං-අනුක්තකර්ම; ලාඞ්ගලෙන-අනුක්තකරණම්; අකාරාන්තපුංලිඞ්ගා 'කෘෂක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ලාඞ්ගල' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'භූමි' ශබ්දඃ; 'කෘෂ'-විලෙඛනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. ලොකඃ, ලොවැසිතෙම; විද්‍යයා, විද්‍යාවකරණකොටගෙන; ආදරං, ආදරය; ලභතෙ, ලබයි; ලභතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ලොකඃ-උක්තකර්තා; ආදරං-අනුක්තකර්ම; විද්‍යයා අනුක්ත කරණම්; අකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'විද්‍යා' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'ලොක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ආදර' ශබ්දඃ; 'ලභ'-ප්‍රාපනෙ, සකර්මකඃ ආත්මනෙ පදී.

**a. ජටාභිස්තාපසො ගච්ඡතී.**
**b. හරිණා කංසො නිහතඃ.**
**c. කුමාර්‍යා ශාස්ත්‍රමධීයතෙ.**
**d. ගුරුණා ශිෂ්‍ය උපදිශ්‍යතෙ.**
**e. රාමශ්චරිතෙන ජගත් පූජ්‍යො බභූව.**

---

a. තාපසඃ, තාපසතෙම; ජටාභිඃ, ජටාවෙන් (උපලක්ෂිතව) ගච්ඡති, යෙයි; ගච්ඡති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; තාපසඃ-උක්තකර්තෘ; ජටාභිඃ-උප ලක්ෂණෙ තෘතීයා; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'ජටා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'තාපස'ශබ්දඃ; 'ගම්ඎ'-ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

b. හරිණා, විෂ්ණුහුවිසින්; කංසඃ, එනම් අසුරතෙම; නිහතඃ, නසනලදී. නිහතඃ-කෘදන්ත කර්මකාරකක්‍රියා; කංසඃ-උක්තකර්ම; හරිණා, අනුක්තකර්තෘ; ඉකාරාන්ත පුංලිඞ්ග 'හරි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'කංස' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ග 'නිහත' ශබ්දඃ; නිහතඃ, හනති, හතඃ, හනන්ති; 'නි'පූර්වඃ 'හන'-හිංසා ගත්‍යොඃ, සකර්මකඃ පරස්මෛ පදී.

c. කුමාර්‍යා, කුමාරිය විසින්; ශාස්ත්‍රම්, ශාස්ත්‍රය; අධීයතෙ, හදාරනු ලැබේ;අධීයතෙ-ලට් කර්ම කාරක ආත්මනෙ පද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; ශාස්ත්‍රම්-උක්තකර්ම; කුමාර්‍යා-අනුක්තකර්තෘ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'කුමාරී' ශබ්දඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ග 'ශාස්ත්‍ර'ශබ්දඃ;'අධි' පූර්වං 'ඉඞ්'-අධ්‍යයනෙ, සකර්මකඃ ආත්මනෙපදී.

d. ගුරුණා, ගුරුහු විසින්; ශිෂ්‍යඃ, ශිෂ්‍යතෙම; උපදිශ්‍යතෙ, උගන්වනු ලැබේ. උපදිශ්‍යතෙ-ලට් කර්ම කාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ශිෂ්‍යඃ, වුක්තකර්ම; ගුරුණා-අනුක්තකර්තෘ; උකාරාන්ත පුංලිඞ්ග 'ගුරු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග'ශිෂ්‍ය' ශබ්දඃ;'උප' පූර්වඃ 'දිශ'-උච්චාරණෙ, සකර්මකඃ උභය පදී.

e. රාමඃ, රාමතෙම; චරිතෙන, චරිතය කරණකොටගෙන; ජගත් පූජ්‍යඃ බභූව, ලෝවැස්සා විසින් පුදනු ලබන්නෙක්වී. බභූව-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛකවචනක්‍රියා; රාමඃ-උක්තප්‍රකෘති කර්තෘ; ජගත් පූජ්‍යඃ-උක්ත විකෘති කර්තෘ, චරිතෙන අනුක්තකරණම්; අකාරාන්තපුංලිඞ්ග 'රාම' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'චරිත' ශබ්දඃ;. අකාරාන්ත පුංලිඞ්ග 'ජගත් පූජ්‍ය' ශබ්දඃ; බභූව, බභූවතුඃ, බභූවුඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛ පදී.

**a. පුත්‍රෙණ සහ පිතා සමායාතඃ.**

**b. රජ්ජ්වා ගාං බධ්නාති ගොපඃ.**

**c. පිත්‍රා පුත්‍රො විනීයතෙ.**

**d. අශ්වෙන සෛනිකො ගච්ඡති.**

**e. පථිකඃ සුඛෙන යාති.**

---

a. පුත්‍රෙණසහ, පුත්‍රයා හා සමග; පිතා, පියතෙම; සමායාතඃ, පැමිණියේය සමායාතඃ-කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; පිතා-උක්තකර්තෘ; පුත්‍රෙණ-සහයොගෙ තෘතීයා; සහ-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගා 'පුත්‍ර' ශබ්දඃ; ඍකාරාන්ත පුංලිඞ්ගා 'පිතෘ' ශබ්දඃ; 'සම්', 'ආ' පූර්‍වඃ 'යා'-ප්‍රාපනෙ, සකර්මකඃ පරස්මෛ පදී.

b ගොපඃ, ගොපලුතෙම; රජ්ජ්වා, රැහැණින්; ගාං, දෙන; බධ්නාති, බදී. බධ්නාති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ගොපඃ-උක්තකර්තෘ; ගාං-අනුක්තකර්ම; රජ්ජ්වා-අනුක්තකරණම්; උකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'රජ්ජු' ශබ්දඃ; ඔකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ගො' ශබ්දඃ; බධ්නාති, බධ්නීතඃ, බධ්නන්ති; 'බධ'-බන්ධනෙ, සකර්මකඃ පරස්මෛ පදී.

c. පිත්‍රා, පියාහු විසින්; පුත්‍රඃ, පුත්‍රතෙම; විනීයතෙ; හික්මවනු ලැබේ. විනීයතෙ-ලට් කර්මකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; පුත්‍රඃ-උක්තකර්ම; පිත්‍රා-අනුක්තකර්තෘ; ඍකාරාන්ත පුංලිඞ්ගා 'පිතෘ' ශබ්දඃ අකාරාන්ත පුංලිඞ්ගා 'පුත්‍ර' ශබ්දඃ; 'වි' පූර්‍වඃ 'නීඤ්'-ප්‍රාපනෙ, ද්විකර්මකඃ උභය පදී.

d. සෛනිකඃ, සෙබළතෙම; අශ්වෙන, අසුපිටින්; ගච්ඡති, යෙයි. ගච්ඡති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; සෛනිකඃ-උක්තකර්තෘ; අශ්වෙන, අනුක්තකරණම්; අකාරාන්ත පුංලිඞ්ගා 'අශ්ව' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'සෛනික' ශබ්දඃ; 'ගම්ඍ'-ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

e. පථිකඃ, මගීතෙම; සුඛෙන, සැපසේ; යාති, යෙයි. යාති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; පථිකඃ-උක්තකර්තෘ; සුඛෙන-ක්‍රියාවිශෙෂණෙ තෘතීයා; අකාරාන්ත පුංලිඞ්ගා 'පථික' ශබ්දඃ; අකාරාන්ත කලිවලිඞ්ගා 'සුඛ' ශබ්දඃ; යාති, යාතඃ, යාන්ති; 'යා'-ප්‍රාපනෙ, සකර්මකඃ පරස්මෛ පදී.

a. දරිද්‍රො දුඃඛෙන ජීවති.
b. දුග්ධං ප්‍රකෘත්‍යා මධුරම්.
c. වණික් නාවා තරති සාගරම්.
d. අනලසඃ ප්‍රායෙණ සුඛී භවති.
e. රාජර්ෂි මෛථිලො නාම්නා ජනක ආසීත්.

---

a. දරිද්‍රඃ, දිළිඳුතෙම; දුඃඛෙන, දුකසේ; ජීවති, ජීවත්වෙයි; ජීවති-ලට් කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; දරිද්‍රඃ-උක්තකර්තෘ;දුඃඛෙන-ක්‍රියා විශෙෂණෙ තෘතීයා;අකාරාන්ත පුංලිඞ්ගා 'දරිද්‍ර' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'දුඃඛ' ශබ්දඃ; 'ජීව'-ප්‍රාණ ධාරණෙ, අකර්මකඃ පරස්මෛ පදී.

b. දුග්ධං, කිරයතෙම; ප්‍රකෘත්‍යා, ස්වභාවයෙන්; මධුරම්, මිහිරිවේ. (ස්‍යාත්)-ලිඞ් කර්තෘ කාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; දුග්ධං-වුක්තකර්තෘ; මධුරම්-කර්තෘවිශෙෂණම්; ප්‍රකෘත්‍යා-අනුක්තකරණම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'දුග්ධ' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ප්‍රකෘති' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'මධුර' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛ පදී.

c. වණික්, වෙළඳතෙම; නාවා, නැවින්; සාගරම්, සාගරය; තරති, එතර කෙරෙයි. තරති—ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; වණික්-උක්ත කර්තෘ; සාගරම්-අනුක්තකර්ම; නාවා-අනුක්තකරණම්; ජකාරාන්ත පුංලිඞ්ගා 'වණිජ්' ශබ්දඃ; ඖකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'නෞ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'සාගර' ශබ්දඃ; 'තෲප්ලවන'-තරණයොඃ, සකර්මකඃ පරස්මෛ පදී.

d. අනලසඃ, නොමැලිතෙම; ප්‍රායෙණ,බොහෝසෙයින්;සුඛී භවති, සුවපත්වෙයි. භවති-ලට් කර්තෘකාරක පරස්මෛපදප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; අනලසඃ-උක්ත ප්‍රකෘතිකර්තෘ; ප්‍රායෙණ-අනුක්තකරණම්; සුඛී-උක්ත විකෘති කර්තෘ, අකාරාන්ත පුංලිඞ්ගා 'අනලස' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ප්‍රාය' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'සුඛින්' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, පරස්මෛ පදී.

e. මෛථිලඃ, මිථිලාපුරවාසිවූ; රාජර්ෂිඃ, රාජ ශ්‍රෙෂ්ඨතෙම; නාම්නා, නමින්; ජනකඃ ආසීත්, ජනකනම්වී. ආසීත්-ලුඞ්ක්‍රියා; රාජර්ෂිඃ-උක්තප්‍රකෘති කර්තෘ; මෛථිලඃ-ප්‍රකෘතිකර්තෘ විශෙෂණම්; ජනකඃ-උක්තවිකෘති කර්තෘ;නාම්නා-අනුක්ත කරණම්;ඉකාරාන්ත

a. ඥානෙන විනා ජීවනං නිෂ්ඵලම්.
b. අක්ෂෛඃ දීව්‍යති අක්ෂප්‍රියඃ.
c. අලං විවාදෙන.

---

පුංලිඞ්ගා රාජර්ෂි ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'මෛථිල'ශබ්දඃ; නකාරාන්ත ක්ලීවලිඞ්ගා 'නාමන්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ජනක' ශබ්දඃ; ආසීත්, ආසතාම්, ආසන්; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛ පදී.

a. ඥානෙන විනා, ඥානය හැර; ජීවනං, ජීවත්වීම; නිෂ්ඵලං, නිෂ්ඵලවේ (ස්‍යාත්)-ලිඞ්ක්‍රියා; ජීවනං-උක්තකර්තෘ; නිෂ්ඵලං-කර්තෘවිශෙෂණම්; ඥානෙන-විනා යොගෙ තෘතීයා; විනා- අව්‍යයම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ජීවන' ශබ්දඃ, අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ඥාන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'නිෂ්ඵල' ශබ්දඃ; ස්‍යාත්, ස්‍යාතාම්, ස්‍යුඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛ පදී.

b අක්ෂප්‍රියඃ, ද්‍යූතකෙළියෙහි කැමැත්තේ; අක්ෂෛඃ, පසැටින්; දීව්‍යති, ක්‍රීඩා කෙරෙයි. දීව්‍යති-ලට් කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; අක්ෂ ප්‍රියඃ-උක්ත කර්තෘ; අක්ෂෛඃ-කර්තෘ තෘතීයා, අකාරාන්ත පුංලිඞ්ගා 'අක්ෂ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'අක්ෂ ප්‍රිය' ශබ්දඃ; දීව්‍යති, දීව්‍යතඃ, දීව්‍යන්ති; 'දිවු'-ක්‍රීඩා විජිගීෂා, ව්‍යවහාර, ද්‍යුතිස්තුති, මොදමද, ස්වප්න, කාන්ති, ගතිෂු, ක්‍රීඩාදෞ, අකර්මකඃ පරස්මෛපදී, ව්‍යවහාරාදෞ, සකර්මකඃ පරස්මෛ පදී.

c. විවාදෙන, විවාදයෙන්; අලං, කම්නැත. විවාදෙන-අලං යොගෙ තෘතීයා; අලං-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගා 'විවාද' ශබ්දඃ.

---

# 4. චතුර්ථඃ පාඨඃ.

## චතුර්ථි ප්‍රයොගාඃ.

a. ධනවාන් දරිද්‍රාය අන්නං දදාති.
b. මාතා කන්‍යායෛ වස්ත්‍රං ප්‍රයච්ඡති.
c. ගවෙ තෘණමාහරති ගොපාලඃ.
d. සත්‍යාය ත්‍යජති ප්‍රාණාන් සත්‍යශීලඃ.

---

a. චතුර්ථි ප්‍රයොගාඃ, චතුර්ථි ප්‍රයෝගයෝ කීයනු ලැබෙත්.

ධනවාන්, ධනවත්තෙම; දරිද්‍රාය, දිළින්දුහට; අන්නං, ආහාරය; දදාති, දෙයි. දදාති ලට්කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ධනවාන්-උක්ත කර්තෘ; අන්නං-අනුක්තකර්ම; දරිද්‍රාය, අනුක්ත සම්ප්‍රදානම්; තකාරාන්ත පුංලිඞ්ගා 'ධනවත්' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'දරිද්‍ර' ශබ්දඃ, අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'අන්න'ශබ්දඃ;දදාති; දත්තඃ, දදනාති; 'දා'-දානෙ, සකර්මක උභය පදී.

b. මාතා, මවුතොමෝ; කන්‍යායෛ, බාලස්ත්‍රියට; වස්ත්‍රං, වස්ත්‍රය; ප්‍රයච්ඡති, දෙයි. ප්‍රයච්ඡති-ලට් කර්තෘකාරක පරස්මෛ පද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; මාතා-උක්ත කර්ත්‍රී; වස්ත්‍රං-අනුක්තකර්ම; කන්‍යායෛ-අනුක්ත සම්ප්‍රදානම්. ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'මාතෘ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'කන්‍යා' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වස්ත්‍ර' ශබ්දඃ, ප්‍රයච්ඡති, ප්‍රයච්ඡතඃ, ප්‍රයච්ඡන්ති; 'ප්‍ර'පූර්වඃ 'දාණ්'-දානෙ, යච්ඡාදෙශඃ, සකර්මකඃ පරස්මෛ පදී.

c. ගොපාලඃ, ගොපලුතෙම; ගවෙ, ගෙරිහට; තෘණං, තණ; ආහරති, එලවයි. ආහරති-ලට්කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ගොපාලඃ-උක්ත කර්තෘ; තෘණම්-අනුක්තකර්ම; ගවෙ-අනුක්ත සම්ප්‍රදානම්; ඕකාරාන්ත පුංලිඞ්ගා 'ගො' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගස්තෘණ ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'ගොපාල' ශබ්දඃ; ආහරති, ආහරතඃ, ආහරන්ති; 'ආ' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, ද්විකර්මක උභය පදී.

d. සත්‍යශීලඃ, සැබෑ කියන පුරුෂතෙම; සත්‍යාය, සත්‍යය පිණිස; ප්‍රාණාන්, දිවි; ත්‍යජති, හරී. ත්‍යජති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; සත්‍යශීලඃ-උක්ත කර්තෘ; ප්‍රාණාන්-අනුක්ත කර්ම; සත්‍යාය-අනුක්ත සම්ප්‍රදානම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'සත්‍යශීල' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ප්‍රාණ ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'සත්‍ය ශබ්දඃ, ත්‍යජති, ත්‍යජතඃ, ත්‍යජන්ති; 'ත්‍යජ' හානෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. මුක්තයෙ ලොකස්තථාගතං භජතෙ.
b. අධ්‍යයනං ඥානාය කල්පතෙ.
c. ශ්‍රමඃ සුඛාය ජායතෙ.
d. රාඥෙ රොචතෙ මානඃ.
e. සාධවෙ රොචතෙ සත්‍යම්.
f. සත්පුත්‍රඃ පිත්‍රෙ නාපරාධ්‍යති.

---

a. ලොකඃ, ලෝවැසි තෙම; මුක්තයෙ, මුක්තිය පිණිස; තථාගතං, තථාගතයන් වහන්සේ; භජතෙ, සෙව්නේය. භජතෙ-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ලොකඃ, උක්තකර්තෘ; තථාගතං-අනුක්තකර්ම්; මුක්තයෙ-තාදර්ථ්‍ය චතුර්ථී, ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'මුක්ති' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ලොක' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගස්තථාගත ශබ්දඃ. 'භජ'-සෙවායාම්, භ්වාදි සකර්මක උභය පදී.

b අධ්‍යයනං, හැදෑරීම; ඥානාය, දැනීම පිණිස; කල්පතෙ, සමර්ථවේ. කල්පතෙ-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; අධ්‍යයනං-උක්තකර්තෘ; ඥානාය-තාදර්ථ්‍ය චතුර්ථී; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'අධ්‍යයන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ඥාන' ශබ්දඃ. 'කෘපූ'-සාමර්ථ්‍ය, භ්වාදි අකර්මක ආත්මනෙපදී.

c. ශ්‍රමඃ, වෙහෙසතෙම සුඛාය, සැප පිණිස; ජායතෙ, වෙයි; ජායතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ශ්‍රමඃ-උක්තකර්තෘ; සුඛාය-තාදර්ථ්‍යචතුර්ථී; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශ්‍රම' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'සුඛ' ශබ්දඃ. 'ජනී'-ප්‍රාදුර්භාවෙ, දිවාදි අකර්මකඃ ආත්මනෙ පදී.

d. රාඥෙ, රජහට; මානඃ, මානයතෙම; රොචතෙ, රුචි වේ. රොචතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථමපුරුෂෛක වචන ක්‍රියා; මානඃ-උක්තකර්තෘ; රාඥෙ-අනුක්ත සම්ප්‍රදානම්; නකාරාන්ත පුංලිඞ්ගා 'රාජන්' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'මාන' ශබ්දඃ. 'රුච'-ප්‍රීතෞ අකර්මකඃ ආත්මනෙ පදී.

e සාධවෙ, සත්පුරුෂයාහට; සත්‍යම්, සත්‍යය; රොචතෙ, රුචිවේ. රොචතෙ-ලට් කර්තෘකාරක ක්‍රියා; සත්‍යම්-උක්තකර්තෘ; සාධවෙ-අනුක්ත සම්ප්‍රදානම්. උකාරාන්ත පුංලිඞ්ගඃ 'සාධු' ශබ්දඃ. 'රුච'-ප්‍රීතෞ, ප්‍රකාසෙච, දිවාදි අකර්මක ආත්මනෙ පදී.

f. සත්පුත්‍රඃ, යහපත් පුත්‍රතෙම; පිත්‍රෙ, පියාහට; න අපරාධ්‍යති, අපරාධ නොකෙරෙයි (හෙවත් වරද නොකෙරෙයි.) අපරාධ්‍යති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; සත්පුත්‍රඃ-උක්තකර්තෘ; පිත්‍රෙ-අනුක්තසම්ප්‍රදානම්; න-අව්‍යයම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'සත්පුත්‍ර' ශබ්දඃ; ඍකාරාන්ත පුංලිඞ්ගඃ 'පිතෘ' ශබ්දඃ. අපරාධ්‍යති, අපරාධ්‍යතඃ, අපරාධ්‍යන්ති. 'අප' පූර්වඃ 'රාධ'-සංසිද්ධෞ, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

a. ගුරුඃ ශිෂ්‍යාය ක්‍රුධ්‍යති.
b. බන්ධවෙ ද්‍රුහ්‍යති ඛලඃ.
c. ගුණවතෙ අසූයති කාපුරුෂඃ.
d. සර්වඥාය භක්තිං ධාරයති ලොකඃ,
e. පිතා පුත්‍රෙභ්‍යඃ ස්පෘහයති.

---

a. ගුරුඃ, ආචාර්‍ය්‍යතෙම; ශිෂ්‍යාය, ශිෂ්‍යයාහට; ක්‍රුධ්‍යති, කිපෙයි. ක්‍රුධ්‍යති-ලට්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ගුරුඃ-උක්තකර්තෘ; ශිෂ්‍යාය-අනුක්ත සම්ප්‍රදානම්. උකාරාන්ත පුංලිඞ්ගා 'ගුරු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිෂ්‍ය'ශබ්දඃ. 'කෘධ'-කොපෙ, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

b. ඛලඃ, දුර්ජනතෙම; බන්ධවෙ, නෑහට; ද්‍රුහ්‍යති, ද්‍රොහ කෙරෙයි. ක්‍රුධ්‍යති-ලට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛකවචනක්‍රියා; ඛලඃ-උක්තකර්තෘ; බන්ධවෙ-අනුක්ත සම්ප්‍රදානම්. උකාරාන්ත පුංලිඞ්ගා 'බන්ධු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා; 'ඛල' ශබ්දඃ, ද්‍රුහ්‍යති, ද්‍රුහ්‍යතඃ, ද්‍රුහ්‍යන්ති; 'ද්‍රුහ'-ජිඝාංසායාම්, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

c. කාපුරුෂඃ, නින්දිත පුරුෂතෙම; ගුණවතෙ, ගුණවත්හට; අසූයති, දෙෂ පහළ කෙරෙයි. අසූයති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; කාපුරුෂඃ-උක්තකර්තෘ; ගුණවතෙ-අනුක්ත සම්ප්‍රදානම්. තකාරාන්ත පුංලිඞ්ගා 'ගුණවත්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කාපුරුෂ' ශබ්දඃ. අසූයති, අසූයතඃ, අසූයන්ති. 'අසූඞ්'-උපතාපෙ, දිවාදි අකර්මක උභය පදී.

d. ලොකඃ, ලෝවැසිතෙම; සර්වඥාය, සර්වඥයාහට; භක්තිං, භක්තිය; ධාරයති, ධරයි. ධාරයති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ලොකඃ-උක්තකර්තෘ; භක්තිං-අනුක්තකර්ම; සර්වඥාය-අනුක්ත සම්ප්‍රදානම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'සර්වඥ' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'භක්ති' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ලොක' ශබ්දඃ. ධාරයති, ධාරයතඃ, ධාරයන්ති. 'ධෘඤ්' ධාරණෙ, තුදාදි අකර්මකඃ පරස්මෛපදී.

e. පිතා, පියතෙම; පුත්‍රෙභ්‍යඃ, පුත්‍රයන්ට; ස්පෘහයති, කැමති වෙයි. ස්පෘහයති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; පිතා-උක්තකර්තෘ; පුත්‍රෙභ්‍යඃ-අනුක්ත සම්ප්‍රදානම්. ඍකාරාන්ත පුංලිඞ්ගඃ 'පිතෘ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පුත්‍ර' ශබ්දඃ. ස්පෘහයති, ස්පෘහයතඃ, ස්පෘහයන්ති. 'ස්පෘහ'-ඉච්ඡායාම්, චුරාදි අකර්මක උභයපදී.

a. ගුරවෙ ප්‍රතිශෘණොති දක්ෂිණාං ශිෂ්‍යඃ.
b. ඵලෙභ්‍යො යාති බාලකඃ.
c. ශිශවෙ ක්‍රීඩනකං දර්ශයති මාතා.
d. යාගාය යාති යාඥිකඃ.
e. ස්නානාය ගච්ඡති බ්‍රාහ්මණඃ.

---

a. ශිෂ්‍යඃ, ශිෂ්‍යතෙම; ගුරවෙ, ආචාර්ය්‍යයාහට; දක්ෂිණාං, දක්ෂිණාව; (හෙවත්) සත්කාර දනය; ප්‍රතිශෘණොති, ගිවිසී. ප්‍රතිශෘණොති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ශිෂ්‍යඃ-උක්තකර්තෘ; දක්ෂිණාම්-අනුක්තකර්ම; ගුරවෙ-අනුක්ත සම්ප්‍රදනම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිෂ්‍ය' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'දක්ෂිණා' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගො 'ගුරු' ශබ්දඃ; ප්‍රතිශෘණොති,ප්‍රතිශෘණුතඃ,ප්‍රතිශෘණ්වන්ති. 'ප්‍රති'පූර්වඃ'ශෘඤ්'-ශ්‍රවණෙ, සකර්මක උභයපදී.

b. බාලකඃ, ළදරුතෙම; ඵලෙභ්‍යඃ, ඵලපිණිස (හෙවත් ඵල යන් අවුලන පිණිස;) යාති, යෙයි. යාති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; බාලකඃ-උක්තකර්තෘ; ඵලෙභ්‍යඃ-අනුක්ත සම්ප්‍රදනම්. අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ඵල' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බාලක' ශබ්දඃ. යාති, යාතඃ, යාන්ති, 'යා'-ප්‍රාපණෙ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

c. මාතා, මවුතොමෝ; ශිශවෙ, ළදරුවාහට; ක්‍රීඩනකං, කෙළිබඩු; දර්ශයති, දක්වයි. දර්ශයති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; මාතා-උක්තකර්ත්‍රී, ක්‍රීඩනකං-අනුක්තකර්ම; ශිශවේ-අනුක්ත සම්ප්‍රදනම් උකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිශු' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'ක්‍රීඩනක' ශබ්දඃ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මාතෘ' ශබ්දඃ. දර්ශයති, දර්ශයතඃ, දර්ශයන්ති; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

d. යාඥිකඃ, යාගකර්තෘතෙම; යාගාය, යාගය පිණිස; යාති, යෙයි. යාති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; යාඥිකඃ-උක්තකර්තෘ; යාගාය අනුක්ත සම්ප්‍රදනම්. අකාරාන්ත පුංලිඞ්ගො 'යාග' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'යාඥික' ශබ්දඃ. 'යා'-ප්‍රාපණෙ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

e. බ්‍රාහ්මණඃ, බමුණුතෙම; ස්නානාය, ස්නානය පිණිස; ගච්ඡති, යෙයි. ගච්ඡති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; බ්‍රාහ්මණඃ-උක්තකර්තෘ; ස්නානාය-අනුක්තසම්ප්‍රදනම්. අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'ස්නාන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බ්‍රාහ්මණ' ශබ්දඃ, 'ගම්ඏ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. ඡාත්‍රාය හිතො ගුරූපදෙශඃ
b. පණ්ඩිතාය සුඛො'යං ප්‍රබන්ධඃ.
c. පාපශීලො ධාර්මිකං තෘණාය මන්‍යතෙ.
d. මාත්‍රෙ නමඃ.
e. සාධුභ්‍යඃ ස්වස්ති භූයාත්.

---

a. ගුරූපදෙශඃ, ගුරුහුගේ උපදෙශයතෙම; ඡාත්‍රාය, ශිෂ්‍යයා හට; හිතඃ (ස්‍යාත්), හිතවේ. (ස්‍යාත්-) ලිඞ්ක්‍රියා; ගුරූපදෙශඃ-උක්තකර්තෘ; හිතඃ-කර්තෘවිශෙෂණම්; ඡාත්‍රාය-අනුක්ත සම්ප්‍රදානම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'ඡාත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'හිත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ගුරූපදෙශ' ශබ්දඃ. 'අස'-භුවි අදාදි අකර්මකඃ පරස්මෛපදී.

b. අයංප්‍රබන්ධඃ, මේ ප්‍රබන්ධයතෙම; පණ්ඩිතාය, පණ්ඩිතයා හට; සුඛඃ, සැපවේ. (ස්‍යාත්-) ලිඞ්ක්‍රියා; ප්‍රබන්ධඃ-උක්තකර්තෘ; අයං-කර්තෘවිශෙෂණම්; සුඛඃ-කර්තෘවිශෙෂණම්; පණ්ඩිතාය-අනුක්ත සම්ප්‍රදානම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'පණ්ඩිත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සුඛ' ශබ්දඃ; මකාරාන්ත 'ඉදම්' ශබ්දඃ; 'පුංසි', අයං, ඉමෞ, ඉමෙ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ප්‍රබන්ධ' ශබ්දඃ.

c. පාපශීලඃ, පවිටු ස්වභාව ඇත්තේ; ධාර්මිකං, ධාර්මිකයා; තෘණාය, තණපතක්කොට; මන්‍යතෙ, සිතයි. මන්‍යතෙ-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; පාපශීලඃ-උක්තකර්තෘ; ධාර්මිකං-අනුක්තකර්ම; තෘණාය-අනාදරාර්ථෙ චතුර්ථී; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පාපශීල' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ධාර්මික' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'තෘණ' ශබ්දඃ. 'මන'-ඥානෙ, තුදාදි සකර්මක ආත්මනෙපදී.

d. මාත්‍රෙ, මවට; නමඃ (අස්තු), නමස්කාර වේවා. (අස්තු-) ලොට් ක්‍රියා; නමඃ-උක්තකර්තෘ; මාත්‍රෙ-අනුක්ත සම්ප්‍රදානම්. ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මාතෘ' ශබ්දඃ. නමඃ-අව්‍යයම්; 'අස'-භුවි, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

e. සාධුභ්‍යඃ, සත්පුරුෂයන්ට; ස්වස්තිභූයාත්, සැපවේවා. භූයාත්-ආශීර්ලිඞ්ක්‍රියා; ස්වස්ති-උක්තකර්තෘ; සාධුභ්‍යඃ-අනුක්ත සම්ප්‍රදානම්. උකාරාන්ත පුංලිඞ්ගඃ 'සාධු' ශබ්දඃ; ස්වස්ති-අව්‍යයම්. භූයාත්, භූයාස්තාම්, භූයාසුඃ; 'භූ'-සත්තායාම්; අදාදි අකර්මකඃ පරස්මෛපදී.

**a. ඉදමෙවාන්නං තෘප්තයෙ අලම්.**
**b. හිත කාරිණෙ ලොකානාං චිරජීවිතං භූයාත්.**

## 5 පඤ්චමඃ පාඨඃ.

### පඤ්චමී ප්‍රයොගාඃ.

**c. වෘක්ෂාත් පත්‍රං පතති.**
**d. රාමො ගච්ඡතො රථාත් ප්‍රභ්‍රෂ්ටඃ**
**e. විද්‍යයා විනයො ජායතෙ.**

---

a. ඉදං අන්නං එව, මේ ආහාරයම; තෘප්තයෙ, තෘප්තිය පිණිස; අලං, සමර්ථයි. අලං-අව්‍යයම්; අන්නං-උක්තකර්තෘ; ඉදම්-කර්තෘවිශෙෂණම්; එව-අව්‍යයම්; තෘප්තයෙ-අනුක්ත සම්ප්‍රදානම්. අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'අන්න' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගඃ 'තෘප්ති' ශබ්දඃ.

b ලොකානාං, ලෝවැස්සන්ට; හිතකාරිණෙ, අභිවෘද්ධි කරන්නාහට; චිරජීවිතං, දීර්ඝජීවිතයක්; භූයාත්, වේවා. භූයාත්-ආශීර්ලිඞ් ක්‍රියා; චිරජීවිතං-උක්තකර්තෘ; ලොකානාං-අනුක්ත සම්ප්‍රදානම්; හිතකාරිණෙ-අනුක්තසම්ප්‍රදානම්. අකාරාන්ත පුංලිඞ්ගො 'ලොක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'චිරජීවිත' ශබ්දඃ, භූයාත්, භූයාස්තාම්, භූයාසුඃ; 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

c. පඤ්චමී ප්‍රයොගාඃ, පඤ්චමී ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

වෘක්ෂාත්, වෘක්ෂයෙන්; පත්‍රං, පත්‍රය; පතති, වැටෙයි. පතති-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; පත්‍රං-උක්ත කර්තෘ; වෘක්ෂාත්-අනුක්තාපාදානම්. අකාරාන්ත පුංලිඞ්ගො 'වෘක්ෂ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'පත්‍ර' ශබ්දඃ. පතති, පතතඃ, පතන්ති; 'පත'-ගතෞ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

d. රාමඃ, රාමතෙම; ගච්ඡතඃ, යන්නාවූ; රථාත්, රථයෙන්; ප්‍රභ්‍රෂ්ටඃ, ගිලිහුණේය ප්‍රභ්‍රෂ්ටඃ-කෘදන්ත කර්තෘකාරකක්‍රියා; රාමඃ-උක්තකර්තෘ; රථාත්-අනුක්තාපාදානම්; ගච්ඡතඃ-අපාදාන විශෙෂණම්. අකාරාන්ත පුංලිඞ්ගො 'රාම' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'ගච්ඡත්' ශබ්දඃ.

e. විද්‍යයා, විද්‍යාව හෙතුකොට ගෙන; විනයඃ, විනයතෙම; ජායතෙ, උපදී. ජායතෙ-ලට් කර්තෘකාරක ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; විනයඃ-උක්තකර්තෘ; විද්‍යයා-අනුක්තාපාදානම්. ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'විද්‍යා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'විනය' ශබ්දඃ; 'ජන'-ජනනෙ, දිවාදි අකර්මක ආත්මනෙපදී.

**a. හරේඃ ප්‍රද්‍යුම්නඃ සමජායත.**
**b. මානවකො ගුරො ර්වේදමධීතෙ.**
**c. අනෘතාද් බිභෙති සාධුඃ.**
**d. මාතුඃ ශඞ්කතෙ ශිශුඃ.**
**e. නෘපතිශ්චෞරාත් ප්‍රජා රක්ෂති.**

---

a. හරේඃ, විෂ්ණුහු කෙරෙන්; ප්‍රද්‍යුම්නඃ, අනඞ්ගතෙම; සමජායත, උපනී. සමජායත - ලඞ්ක්‍රියා; ප්‍රද්‍යුම්නඃ - උක්තකර්තා; හරේඃ-අනුක්තාපාදානම්. ඉකාරාන්ත පුංලිඞ්ගො 'හරි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රද්‍යුම්න' ශබ්දඃ. 'සම්' පූර්වඃ 'ජන'-ජනනෙ, දිවාදිකඃ ආත්මනෙපදී.

b. මානවකඃ, තරුණතෙම; ගුරොඃ, ගුරුහු කෙරෙන්; වේදම්, වේදය; අධීතෙ, හදුරයි. අධීතෙ-ලට් කර්තෘකාරක ක්‍රියා; මානවකඃ-උක්තකර්තා; වේදම්-අනුක්තකර්ම; ගුරොඃ-අනුක්තාපාදානම්. අකාරාන්ත පුංලිඞ්ගො 'මාණවක' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගො 'ගුරු' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'වේද' ශබ්දඃ, 'අධි' පූර්වඃ 'ඉඞ්'-අධ්‍යයනෙ, අදාදි අකර්මක ආත්මනෙපදී.

c. සාධුඃ, සත්පුරුෂතෙම; අනෘතාත්, අසත්‍යයෙන්; බිභෙති, භයවේ. බිභෙති-ලට් කර්තෘකාරක ක්‍රියා; සාධුඃ-උක්තකර්තා; අනෘතාත්, අනුක්තාපාදානම්. උකාරාන්ත පුංලිඞ්ගඃ 'සාධු' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'අනෘත' ශබ්දඃ. 'භී'-භයෙ, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

d. ශිශුඃ, ළදරුතෙම; මාතුඃ, මවකෙරෙන්; ශඞ්කතේ, සැකවේ. ශඞ්කතෙ-ලට් කර්තෘකාරක ක්‍රියා; ශිශුඃ-උක්තකර්තා; මාතුඃ-අනුක්තාපාදානම්. උකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිශු' ශබ්දඃ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මාතෘ' ශබ්දඃ. 'ශකි'-සංකායාම්, භවාදි අකර්මක ආත්මනෙපදී.

e. නෘපතිඃ, රජතෙම; චෞරාත්, සොරහු කෙරෙන්; ප්‍රජාඃ, සත්වයන්; රක්ෂති, රකී. රක්ෂති-ලට් කර්තෘකාරක ක්‍රියා; නෘපතිඃ-උක්තකර්තා; ප්‍රජාඃ-අනුක්තකර්ම; චෞරාත්-අනුක්තාපාදානම්. ඉකාරාන්ත පුංලිඞ්ගො 'නෘපති' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'චෞර' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'ප්‍රජා' ශබ්දඃ. 'රක්ෂ'-පාලනෙ, භවාදි සකර්මකඃ පරස්මෛපදී.

a. පුත්‍රඃ පිතරං විපදස්ත්‍රායතෙ.
b. පුත්‍රඃ පිතුර්නිලීයතෙ.
c. ගොඃ ක්ෂරති දුග්ධම්.
d. නාවො වාරි නිඃසරති.
e. පාපාද් විරමති සජ්ජනඃ.
f. අධ්‍යයනාත් පරාජයතෙ ජඩබුද්ධිඃ.

---

a. පුත්‍රඃ, පුත්‍රතෙම; පිතරං, පියහු; විපදඃ, විපතින්; ත්‍රායතෙ, රකී. ත්‍රායතෙ-ලට් කර්තෘකාරකක්‍රියා; පුත්‍රඃ-උක්තකර්තෘ; පිතරං-අනුක්තකර්ම; විපදඃ-අනුක්තාපාදනම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'පුත්‍ර' ශබ්දඃ; ඍකාරාන්ත පුංලිඞ්ගඃ 'පිතෘ' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'විපත්' ශබ්දඃ. 'ත්‍රෛඞ්'-පාලනෙ, භ්වාදි සකර්මක ආත්මනෙපදී.

b. පුත්‍රඃ, පුත්‍රතෙම; පිතුඃ, පියහු කෙරෙන්; නිලීයතෙ, සැඟවේ. නිලීයතෙ-ලට් කර්තෘකාරකක්‍රියා; පුත්‍රඃ-උක්තකර්තෘ; පිතුඃ-අනුක්තාපාදනම්. අකාරාන්ත පුංලිඞ්ගඃ 'පුත්‍ර' ශබ්දඃ; ඍකාරාන්ත පුංලිඞ්ගඃ 'පිතෘ' ශබ්දඃ. 'නි' පූර්වඃ 'ලී'-ශ්ලෙෂණෙ, දිවාදි අකර්මක ආත්මනෙපදී.

c. ගොඃ, දෙනගෙන්; දුග්ධම්, කිරි; ක්ෂරති, වැගිරෙයි. ක්ෂරති-ලට් කර්තෘකාරකක්‍රියා; දුග්ධං-උක්තකර්තෘ; ගොඃ-අනුක්තා පාදනම්. ඔකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ගො' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'දුග්ධ' ශබ්දඃ. 'ක්ෂර'-සංචලනෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

d. නාවඃ, නැවින්; වාරි, ජලය; නිඃසරති, නික්මෙයි. නිඃසරති-ලට් කර්තෘකාරකක්‍රියා; වාරි-උක්තකර්තෘ; නාවඃ-අනුක්තා පාදනම්. ඖකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'නෞ' ශබ්දඃ; ඉකාරාන්ත ක්ලීවලිඞ්ගො 'වාරි' ශබ්දඃ. 'නිඃ' පූර්වඃ 'සෘ'-ගතෞ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

e. සජ්ජනඃ, සත්පුරුෂතෙම; පාපාත්, පාපයෙන්; විරමති, වළකී. විරමති ලට් කර්තෘකාරකක්‍රියා; සජ්ජනඃ-උක්තකර්තෘ; පාපාත්-අනුක්තාපාදනම්. අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'පාප' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'සජ්ජන' ශබ්දඃ. 'වි' පූර්වඃ 'රමු'-ක්‍රීඩායාම්, භ්වාදි අකර්මකආත්මනෙපදී; 'වි' පූර්වකතෙව උභයපදී.

f. ජඩබුද්ධිඃ, නුවණමඳ තැනැත්තේ; අධ්‍යයනාත්, හැදෑරීමෙන්; පරා:යතෙ, පරදී. පරාජයතෙ-ලට් කර්තෘකාරකක්‍රියා; ජඩබුද්ධිඃ-උක්තකර්තෘ; අධ්‍යයනාත්-අනුක්තාපාදනම්. අකාරාන්ත ක්ලීවලිඞ්ග 'අධ්‍යයන' ශබ්දඃ; ඉකාරාන්ත පුංලිඞ්ගො 'ජඩබුද්ධි' ශබ්දඃ; 'පරා' පූර්වඃ 'ජී'-ජයෙ, භ්වාදි විකර්මකඃ පරස්මෛපදී.

a. යවෙභ්‍යො ගාං වාරයති කර්ෂකඃ.
b. හිමවතො ගඞ්ගා ප්‍රභවති.
c. රාමාදන්‍යඃ කො'ධිකං රක්ෂයිතුං සමර්ථඃ ප්‍රජාඃ.
d. චෛත්‍රාත් පූර්වො'යං ඵාල්ගුනො මාසඃ.

---

a. කර්ෂකඃ, ගොවිතෙම; යවෙභ්‍යඃ, යවගොයමින්; ගාං, ගෙරිහු; වාරයති, වළක්වයි. වාරයති-ලට් කර්තෘ කාරක ක්‍රියා; කර්ෂකඃ-උක්තකර්තෘ; ගාං-අනුක්තකර්ම; යවෙභ්‍යඃ-අනුක්තාපාදානම්, අකාරාන්ත පුංලිඞ්ගා 'යව' ශබ්දඃ; ඔකාරාන්ත පුංලිඞ්ගා 'ගො' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ කර්ෂක' ශබ්දඃ. 'වෘඤ්' ආවරණෙ සකර්මකඃ, උභය පදී.

b. හිමවතඃ, හිමවතින්; ගඞ්ගා, එනම් නදී තොමෝ; ප්‍රභවති, පහළවෙයි. ප්‍රභවති-ලට්කර්තෘකාරක ක්‍රියා; ගඞ්ගා-උක්තකර්තෘ; හිමවතඃ-අනුක්තාපාදානම්; තකාරාන්ත පුංලිඞ්ගා 'හිමවත්' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ගඞ්ගා' ශබ්දඃ; 'ප්‍ර' පූර්ව 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. රාමාත්, රාමයා කෙරෙන්; අන්‍යඃ, අන්‍යවූ; කඃ, කවරෙක් තෙම; අධිකං, අත්‍යර්ථයෙන්; ප්‍රජාඃ, ප්‍රජාවන්; රක්ෂයිතුං, රක්ෂා කරන්ට; සමර්ථඃ, පොහොසත්වේද? (භවති-) ලට්කර්තෘ කාරකක්‍රියා; කඃ-උක්තකර්තෘ; අන්‍යඃ-කර්තෘවිශෙෂණම්; සමර්ථඃ-කර්තෘවිශෙෂණම්; ප්‍රජාඃ-අනුක්තකර්ම; රාමාත්-අනුක්තාපාදානම්; අධිකං-ක්‍රියාවිශෙෂණම්; රක්ෂයිතුං-ක්‍රියාවාචී 'තුං' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගා 'රාම' ශබ්දඃ; අකාරාන්තඃ 'අන්‍ය' ශබ්දඃ; පුංසි, අන්‍යඃ, අන්‍යෞ, අන්‍යෙ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'අධික' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සමර්ථ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගඃ 'ප්‍රජා' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

d. අයං ඵාල්ගුනොමාසඃ, මේ මැදින්මස; චෛත්‍රාත්, බක් මසින්; පූර්වඃ, පූර්වවේ. (ස්‍යාත්-) ලිඞ්ක්‍රියා; මාසඃ-උක්තකර්තෘ; ඵාල්ගුනඃ-කර්තෘවිශෙෂණම්; අයං-කර්තෘවිශෙෂණම්; පූර්වඃ-කර්තෘ විශෙෂණම්; චෛත්‍රාත්-අනුක්තාපාදානම්. අකාරාන්ත පුංලිඞ්ගා 'චෛත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පූර්ව' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ඵාල්ගුන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'මාස' ශබ්දඃ; 'අස-' භුවි, අකර්මකඃ පරස්මෛපදී.

a. ආරාද් වනාද් නගරං දෘශ්‍යතෙ.
b. වෘෂ්ටෙඃ ප්‍රාක් ඝනගර්ජිත මාසීත්.
c. ඍතෙ කෘෂ්ණාත් න සුඛං ලභතෙ නන්දඃ.
d. බාල්‍යාත් ප්‍රභෘති ඥානමර්ජනීයම්.
e. ආ සමුද්‍රාත් ක්ෂිතීශා රඝුවංශ්‍යා අභූවන්.

---

a. වනාත් අරාත්, වනයෙන් දුරෙහි; නගරං, නුවර; දෘශ්‍යතෙ, දක්නාලැබේ. දෘශ්‍යතෙ-ලට් කර්මකාරක ක්‍රියා; නගරං-උක්තකර්ම; වනාත්-අනුක්තාපාදානම්; ආරාත්-අව්‍යයම්; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'වන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'නගර' ශබ්දඃ; 'දෘශිර්-' ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. වෘෂ්ටෙඃ ප්‍රාක්, වැස්සෙන් පළමු; ඝනගර්ජිතම්, මේඝ ගර්ජනාවක්; ආසීත්, වී. ආසීත්-ලුඞ් ක්‍රියා; ඝනගර්ජිතම්-උක්තකර්තෘ; ප්‍රාක්-අව්‍යයම්; වෘෂ්ටෙඃ-අනුක්තාපදානම්; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'වෘෂ්ටි' ශබ්දඃ; චකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ප්‍රාච්' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ඝනගර්ජිත,ශබ්දඃ. 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී

c. නන්දඃ, නන්දතෙම; කෘෂ්ණාත් ඍතෙ, විෂ්ණුහු හැර; සුඛංනලභතෙ, සැප නොලබයි. ලභතෙ ලට් කර්තෘකාරක ක්‍රියා; නන්දඃ-උක්තකර්තා; සුඛං-අනුක්ත කර්ම; න-අව්‍යයම්; කෘෂ්ණාත්-අනුක්තාපාදානම්; ඍතෙ-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කෘෂ්ණ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'සුඛ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'නන්ද' ශබ්දඃ; 'ලභ'-ප්‍රාප්තෞ, සකර්මක ආත්මනෙපදී.

d. බාල්‍යාත් ප්‍රභෘති, බාලඅවස්ථාවෙහි පටන්; ඥානම්, ඥානය; අර්ජනීයම්, රැස්කටයුතුයි. අර්ජනීයම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා, ඥානම් උක්තකර්ම; බාල්‍යාත්-අනුක්තාපාදානම්; ප්‍රභෘති-අව්‍යයම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'බාල්‍ය' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ඥාන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'අර්ජනීය' ශබ්දඃ; 'අර්ජ'-උපාර්ජනෙ, සකර්මකඃ උභයපදී.

e. රඝුවංශ්‍යාඃ, රඝුවංශිකයෝ; ආසමුද්‍රාත්, සමුද්‍රය හිම් කොට; ක්ෂිතීශාඃ අභූවන්, පෘථිවීශ්වර වූවාහුය. අභූවන්-ලුඞ්ක්‍රියා; රඝුවංශ්‍යාඃ-උක්ත ප්‍රකෘතිකර්තා; ක්ෂිතීශාඃ-උක්ත විකෘති කර්තා; සමුද්‍රාත්- අනුක්තාපාදානම්; ආ-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සමුද්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ක්ෂිතීශ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'රඝුවංශ්‍ය' ශබ්දඃ; 'භූ-' සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

a. ආකෞමාරාත් බ්‍රහ්මචාරිණස්තාපසා භවන්ති
b. ආලස්‍යාත් දුඃඛං භජතෙ ලොකඃ.
c ශොකාත් බුද්ධිර්නශ්‍යති නරාණාම්.
d. ආසනා දභිනයං පශ්‍යති රාජා.

---

a. තාපසාඃ, තාපසයෝ; ආකෞමාරාත්, කුමාරවස්ථාවෙහි පටන්; බ්‍රහ්මචාරිණඃ භවන්ති, බ්‍රහ්මචාරීහුවෙත්. භවන්ති-ලට් කර්තෘකාරක ක්‍රියා; තාපසාඃ-උක්තකර්තෘ; බ්‍රහ්මචාරිණඃ-කර්තෘ විශෙෂණම්; කෞමාරාත්-අනුක්තාපාදානම්; ආ-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කෞමාර' ශබ්දඃ;නකාරාන්ත පුංලිඞ්ගො 'බ්‍රහ්මචාරින්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'තාපස' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

b. ලොකඃ, ලෝවැසිතෙම; ආලස්‍යාත්,අලස බැවින්; දුඃඛං භජතෙ, දුක් සෙවනය කෙරෙයි. භජතෙ-ලට්කර්තෘකාරක ක්‍රියා; ලොකඃ-උක්තකර්තෘ; දුඃඛං-අනුක්තකර්ම;ආලස්‍යාත්-අනුක්තාපාදානම්, අකාරාන්ත කලීවලිඞ්ග 'ආලස්‍ය' ශබ්දඃ; අකාරාන්ත කලීව ලිඞ්ගො 'දුඃඛ' ශබ්දඃ; 'භජ-' සෙවායාම්, සකර්මක ආත්මනෙපදී.

c. ශොකාත්, ශොකය හෙතුකොටගෙන; නරාණාම්, මිනිසුන්ගේ; බුද්ධිඃ, බුද්ධිතොමෝ; නශ්‍යති, නසී. නශ්‍යති-ලට්කර්තෘකාරක ක්‍රියා; බුද්ධිඃ-උක්තකර්තෘ; නරාණාම්-අනුක්ත සම්බන්ධඃ; ශොකාත්-අනුක්තාපාදානම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශොක' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'බුද්ධි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නර' ශබ්දඃ; 'නශ-' අදර්ශනෙ, අකර්මකඃ පරස්මෛපදී.

d රාජා, රජතෙම; ආසනාත්, ආසනයෙහි හිඳ; අභිනයම් සරම; පශ්‍යති, බලයි. පශ්‍යති-ලට්කර්තෘකාරක ක්‍රියා; රාජා-උක්තකර්තෘ; අභිනයං-අනුක්තකර්ම; ආසනාත්-අනුක්තාපාදානම්; අකාරාන්ත කලීව ලිඞ්ග 'ආසන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'අභිනය' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගො 'රාජන්' ශබ්දඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. ප්‍රාසාදාදවලොකයන්ති ගඞ්ගාං නාර්‍ය්‍යඃ.
b. ශ්වශුරාත් ජිහ්‍රෙති ජාමාතා.
c. අයොධ්‍යායාඃ ක්‍රොශෙ මෙ ගෘහමස්ති.
d. ග්‍රාමාත් වහිස්තාලිවනං දෘශ්‍යතෙ.
e. ලක්ෂ්මණො රාමාත් පෘථක් නාභූත්.

---

a. නාර්‍ය්‍යඃ, ස්ත්‍රීහු; ප්‍රාසාදාත්, ප්‍රාසාදයට නැගී; ගඞ්ගාම්, එනම් නදිය; අවලොකයන්ති, බලත්. අවලොකයන්ති-ලට් කර්තෘකාරක ක්‍රියා; නාර්‍ය්‍යඃ-උක්ත කර්තෘ; ගඞ්ගාං-අනුක්ත කර්ම; ප්‍රාසාදාත්-ල්‍යබ්ලොපෙ පඤ්චමී; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ප්‍රාසාද' ශබ්දඃ; අකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ගඞ්ගා' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'නාරී' ශබ්දඃ; 'අව' පූර්වඃ 'ලොක'-දර්ශනෙ, සකර්මකඃ උභයපදී.

b. ජාමාතා, බෑනණුතෙම හෙවත් දුවගේ සැමිතෙම; ශ්වශුරාත්, මයිලණුවන් කෙරෙන්; ජිහ්‍රෙති, ලජ්ජාවෙයි. ජිහ්‍රෙති—ලට්කර්තෘකාරක ක්‍රියා; ජාමාතා—උක්තකර්තෘ; ශ්වශුරාත්—අනුක්තාපාදානම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශ්වශුර' ශබ්දඃ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ජාමාතෘ' ශබ්දඃ; 'හ්‍රී'—ලජ්ජායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. අයොධ්‍යායාඃ, අයොධ්‍යාවෙන්; ක්‍රොශෙ, හඬසැතෙක්හි; මෙ ගෘහම්, මාගේ ගෘහය; අස්ති, ඇති; අස්ති—ලට්කර්තෘකාරක ක්‍රියා; ගෘහං—උක්තකර්තෘ; මෙ—අනුක්තසම්බන්ධඃ; ක්‍රොශෙ—අනුක්තාධාරඃ; අයොධ්‍යායාඃ—අනුක්තපාදානම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'අයොධ්‍යා' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගඃ 'ක්‍රොශ' ශබ්දඃ; මෙ—තකාරාන්ත අස්මත් ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ගෘහ' ශබ්දඃ; 'අස'—භුවි, අකර්මකඃ පරස්මෛපදී.

d. ග්‍රාමාත්වහිඃ, ගමින් පිටත; තාලීවනං, තල්වනයතෙම; දෘශ්‍යතෙ, දක්නාලැබේ. දෘශ්‍යතෙ—ලට්කර්මකාරකක්‍රියා; තාලීවනං—උක්තකර්ම; වහිඃ—අව්‍යයම්; ග්‍රාමාත්—වහිර්යොගෙපංචමී; අකාරාන්තපුංලිඞ්ගා 'ග්‍රාම' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'තාලීවන' ශබ්දඃ; 'දෘශිර්'—ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

e. ලක්ෂ්මණඃ, ලක්ෂ්මණතෙම; රාමාත්, රාමයාකෙරෙන්; පෘථක්නාභූත්, වෙන්නොවී. අභූත්—ලුඞ්කර්තෘකාරක ක්‍රියා; ලක්ෂ්මණඃ—උක්තකර්තෘ; රාමාත්—අනුක්තාපාදානම්; පෘථක්—අව්‍යයම්; න—අව්‍යයම් අකාරාන්තපුංලිඞ්ගා 'ලක්ෂ්මණ' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'රාම' ශබ්දඃ; 'භූ'—සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

**a. සේනාකාත් ස විමුක්ත ආසීත් මෘත්‍යුමුඛාත්.**
**b. මාථුරාඃ පාටලිපුත්‍රේභ්‍යඃ ආඪ්‍යතරාඃ.**

## 6. ෂෂ්ඨඃ පාඨඃ.

### ෂෂ්ඨී ප්‍රයෝගාඃ.

**c. පුරුෂස්‍ය ඥානමේව ධනම්.**
**d. ගඞ්ගායා බලවාන් ප්‍රවාහඃ.**

---

a. සඃ, හෙතෙම; සේනාකාත්, මදකින්; මෘත්‍යුමුඛාත්, මරුමුවෙන්; විමුක්තඃ ආසීත්, මිදුනේවි. ආසීත්—ලඞ්ක්‍රියා; සඃ—උක්තකර්තෘ; විමුක්තඃ—කර්තෘවිශේෂණම්; මෘත්‍යුමුඛාත්—අනුක්තාපාදානම්; සේනාකාත්—අනුක්තාපාදානම්; අකාරාන්තපුංලිඞ්ගඃ 'සේනාක' ශබ්දඃ; දකාරාන්ත 'තත්' ශබ්දඃ; පුංසි, අකාරාන්ත පුංලිඞ්ග 'විමුක්ත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'මෘත්‍යුමුඛ' ශබ්දඃ. 'අස'—භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. මාථුරාඃ, මථුරාපුරවාසිහු; පාටලිපුත්‍රේභ්‍යඃ, පැළලුම්නුවර වාසීන්ට වඩා; ආඪ්‍යතරාඃ, අතිශයින් ආඪ්‍යවෙත්. (ස්‍යුඃ·) ලිඞ් ක්‍රියා; මාථුරාඃ—උක්තකර්තෘ; ආඪ්‍යතරාඃ—කර්තෘවිශේෂණම්; පාටලිපුත්‍රේභ්‍යඃ—අනුක්තාපාදානම්; අකාරාන්ත පුංලිඞ්ග 'මාථුර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'පාටලිපුත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ආඪ්‍යතර' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

c. පුරෂස්‍ය, පුරුෂයාහට; ඥානං එව, ඥානයම; ධනම්, ධනයවේ. (ස්‍යාත්-) ලිඞ්ක්‍රියා; ඥානම්—කර්තෘවිශේෂණම්; එව—අව්‍යයම්; පුරුෂස්‍ය—අනුක්ත සම්බන්ධඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පුරුෂ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'ඥාන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග 'ධන' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

d. ගඞ්ගායාඃ, ගඞ්ගාවගේ; ප්‍රවාහඃ, ප්‍රවාහයතෙම; බලවාන්, බලවත්වේ. ප්‍රවාහඃ-උක්තකර්තෘ; බලවාන්—කර්තෘවිශේෂණම්; ගඞ්ගායාඃ-අනුක්ත සම්බන්ධඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'ගඞ්ගා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ප්‍රවාහ' ශබ්දඃ.

a. කො ජානාති විශ්වපතෙර්මහිමානං සම්‍යක්.

b. තරොඃ ශාඛා කම්පතෙ.

c. මාතුඃ ස්මරති ශිශුඃ.

d. භජතෙ පිතුශ්චරණයොඃ පුත්‍රඃ.

e. ඵලානාං තෘප්තඃ පථිකඃ.

---

a. විශ්වපතෙඃ, ලොකස්වාමිහුගේ; මහිමානං, මහිමය; සම්‍යක්, මනාකොට; කඃ, කවරෙක්තෙම; ජානාති, දනීද ජානාති—ලට්කර්තෘකාරකක්‍රියා; කඃ—උක්තකර්තෘ ; මහිමානං—අනුක්තකර්ම; විශ්වපතෙඃ—අනුක්තසම්බන්ධඃ; සම්‍යක්—අව්‍යයම් ; මකාරාන්ත 'කිං' ශබ්දඃ පුංසි; ඉකාරාන්ත පුංලිඞ්ගා 'විශ්වපති' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගා 'මහිමත්' ශබ්දඃ; 'ඥා'-අවබොධනෙ සකර්මකඃ පරස්මෛපදී.

b. තරොඃ, වෘක්ෂයාගේ; ශාඛා, ශාඛාතොමෝ; කම්පතෙ, කම්පාවෙයි (හෙවත් සැලෙයි.) කම්පතෙ-ලට්කර්තෘකාරක ක්‍රියා; ශාඛා-උක්තකර්තෘ; තරොඃ-අනුක්තසම්බන්ධඃ; උකාරාන්ත පුංලිඞ්ගඃ 'තරු' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'ශාඛා' ශබ්දඃ; 'කපි' කිඤ්චිච්චලනෙ අකර්මකඃ ආත්මනෙපදී.

c. ශිශුඃ, ළදරුතෙම; මාතුඃ, මව; ස්මරති, සිහිකෙරේ; ස්මරති-ලට්කර්තෘකාරක ක්‍රියා; ශිශුඃ-උක්තකර්තෘ; මාතුඃ-කර්මණි ෂෂ්ඨී; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'මාතෘ' ශබ්දඃ; 'ස්මෘ' චින්තායාම්, සකර්මකඃ පරස්මෛපදී.

d. පුත්‍රඃ, පුත්‍රතෙම; පිතුඃ, පියහුගේ; චරණයොඃ, දෙපා; භජතෙ, භජනයකෙරෙයි. භජතෙ-ලට්කර්තෘකාරක ක්‍රියා; පුත්‍රඃ-උක්තකර්තෘ; චරණයොඃ-කර්මණිෂෂ්ඨී; පිතුඃ-අනුක්තසම්බන්ධඃ; ඍකාරාන්ත පුංලිඞ්ගා 'පිතෘ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'චරණ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පුත්‍ර' ශබ්දඃ; 'භජ'-සෙවායාම්, සකර්මක ආත්මනෙපදී.

e. පථිකඃ, මඟීතෙම; ඵලානාං, ඵලයන් සම්බන්ධව; තෘප්තඃ, පිණාගියේවේ. තෘප්තඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; පථිකඃ-උක්ත කර්තෘ; ඵලානාං-අනුක්තසම්බන්ධඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ඵල' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'තෘප්ත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පථික' ශබ්දඃ; 'තෘප' ප්‍රීණනෙ, අකර්මකඃ පරස්මෛපදී.

a. ග්‍රාමස්‍ය දක්ෂිණේන ගොදාවරී ප්‍රසරති.
b. අග්නො බහුධාකෘත්වා භෝජනං බාලානාමුචිතමෙව.
c. කාලිදාසස්‍ය කෘතිඃ කුමාර සම්භවම්.
d. සර්වේෂාං සෙව්‍යස්තථාගතඃ.
e. රාඥං මතො නීතිඥඃ.
f. සතාං සම්මතාඃ සාධව එව.
g. රුදතඃ පුත්‍රස්‍ය ප්‍රාව්‍රාජීත් රඝුරාජඃ.

---

a. ග්‍රාමස්‍ය, ගමට; දක්ෂිණේන, දකුණෙන්; ගොදාවරී, එනම් නදීතොමෝ; ප්‍රසරති, බැසයෙයි. ප්‍රසරති-ලට්කර්තෘකාරක ක්‍රියා; ගොදාවරී-උක්තකර්තෘ; ග්‍රාමස්‍ය-අනුක්තසම්බන්ධඃ;

b. අග්නෞ, දිනයසම්බන්ධව; බහුධාකෘත්වා, බොහෝවර; භොජනම්, වැළඳීම; බාලානාම්, බාලයන්ට; උචිතම්එව, සුදුසුමය; (ස්‍යාත්) ලිඞ්ක්‍රියා; භොජනම්-උක්තකර්තෘ; අග්නෞ-අනුක්තසම්බන්ධඃ; බහුධාකෘත්වා අව්‍යයම්; බාලානාම්-අනුක්තසම්බන්ධඃ; උචිතම්-කර්තෘවිශෙෂණම්; එව-අව්‍යයම්; නකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'අහන්' ශබ්දඃ; අකාරාන්ත නපුංසකලිඞ්ගො 'භොජන' ශබ්දඃ; අකාරාන්ත නපුංසකලිඞ්ගො 'උචිත' ශබ්දඃ; උචිතම්, උචිතෙ උචිතානි.

c. කුමාරසම්භවම්, කුමාරසම්භවය; කාලිදාසස්‍ය, කාලිදාසයාගේ; කෘතිඃ, කෘතියවේ; (ස්‍යාත්) ලිඞ්ක්‍රියා; කුමාරසම්භවම්-උක්තකර්තෘ; කෘතිඃ—කර්තෘවිශෙෂණම්; කාලිදාසස්‍ය—අනුක්තසම්බන්ධඃ; ඉකාරාන්තස්ත්‍රීලිඞ්ගඃ 'කෘති' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

d. සර්වේෂාම්, සියල්ලන්විසින්; තථාගතඃ, තථාගතතෙම; සෙව්‍යඃ, සෙවනයකටයුතුයි; සෙව්‍යඃ-කෘදන්ත කර්මකාරකක්‍රියා; තථාගතඃ-උක්තකර්ම; සර්වේෂාම්-අනුක්තකර්තෘරිෂෂ්ඨී; අකාරාන්ත 'සර්ව' ශබ්දඃ පුංසි; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සෙව්‍ය' ශබ්දඃ;

e. රාඥම්, රජහුවිසින්; නීතිඥඃ, නීතිඥතෙම; මතඃ, දන්නාලැබේ; මතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; නීතිඥඃ-උක්තකර්ම; රාඥං-අනුක්තකර්තෘරිෂෂ්ඨී; අකාරාන්ත පුංලිඞ්ගො 'මත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නීතිඥ' ශබ්දඃ.

f. සතාම්, සත්පුරුෂයන්විසින්; සාධවඃ, සත්පුරුෂයෝ; සම්මතාඃ එව, මැනවැයි දන්නා ලැබෙත්. සම්මතඃ-කෘදන්තකර්මකාරකක්‍රියා; සාධවඃ-උක්තකර්ම; සතාම්-අනුක්තකර්තෘරිෂෂ්ඨී; එව-අව්‍යයම්; තකාරාන්ත පුංලිඞ්ගඃ 'සත්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සම්මත' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගඃ 'සාධු' ශබ්දඃ;

g. රඝුරාජඃ, රඝුරජතෙම; පුත්‍රස්‍ය, පුත්‍රයා; රුදතඃ, හඬමින් සිටියදී; ප්‍රාව්‍රාජීත්, පැවිදිවී; ප්‍රාව්‍රාජීත්-ලුඞ්ක්‍රියා; රඝුරාජඃ-උක්තකර්තෘ; පුත්‍රස්‍ය-අනාදරෙෂෂ්ඨී; රුදතඃ-තද්විශෙෂණම්; තකාරාන්ත පුංලිඞ්ගො 'රුදත්' ශබ්දඃ; රුදත්, රුදන්තෞ, රුදන්තඃ, රුදතඃ; රුදතොඃ රුදතාම්.

**a.** **පශ්‍යතො ගෘහිණො ධනං හරන්ති චෞරාඃ.**
**b.** **ඉදං වනං තාපසානාමධ්‍යුෂිතම්.**
**c.** **සාධූනාං කුශලං භූයාත්**
**d.** **බන්ධූනාං නිරාමයං භූයාත්**
**e.** **ජීවානාං මානවඃ ශ්‍රෙෂ්ඨඃ.**
**f.** **මානවානාං ධාර්මික එව ආදරණීයඃ.**
**g.** **උපමා භගවතො නාස්ති.**
**h.** **ශ්‍රීඝනස්‍ය තුලා නවිද්‍යතෙ.**

---

a. චෞරාඃ, චෞරයෝ; ගෘහිණඃ, ගෙහිමියා; පශ්‍යතඃ, බලා සිටියදී; ධනම්, ධනය; හරන්ති, පැහැරගනිත්. හරන්ති-ලට්ක්‍රියා චෞරාඃ-උක්තකර්තා; ධනම් අනුක්තකර්ම; ගෘහිණඃ-අනාදරෙ ෂෂ්ඨී; පශ්‍යතඃ-තද්විශෙෂණම්; තකාරාන්ත පුංලිඞ්ගා 'පශ්‍යත්' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'ගෘහින්' ශබ්දඃ.

b ඉදංවනං, මේ වනය; තාපසානාම්, තවුසන් විසින්ද අධ්‍යුෂිතම්, විසිමයි; අධ්‍යුෂිතම්-කෘදන්තභාවකාරක ක්‍රියා; තාපසානාම්-අනුක්තකර්තරි ෂෂ්ඨී; වනං-උක්තකර්ම; ඉදං-තද්විශෙෂණම්; මකාරාන්ත 'ඉදම්' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග අධ්‍යුෂිත ශබ්දඃ.

c. සාධූනාම්, සත්පුරුෂයන්ට; කුශලංභූයාත්, ආරොග්‍යය වේවා; භූයාත්,-විධිලිඞ්ක්‍රියා; කුශලම් උක්තකර්තෘ සාධූනාම්-අනුක්තසම්බන්ධඃ.

d. බන්ධූනාම්, නෑයන්ට; නිරාමයංභූයාත්, නිරොගිවේවා; භූයාත්-විධිලිඞ්ක්‍රියා; නිරාමයං-උක්තකර්තා; බන්ධූනාං-අනුක්ත සම්බන්ධඃ; අකාරාන්තපුංලිඞ්ගා 'නිරාමය' ශබ්දඃ.

e. ජීවානාම්, සත්වයන් අතුරෙහි; මානවඃ, මනුෂ්‍යතෙම; ශ්‍රෙෂ්ඨඃ, උතුම් වේ; ස්‍යාත්, අධ්‍යාහාරක්‍රියා, මානවඃ, උක්තකර්තා; ශ්‍රෙෂ්ඨඃ-කර්තෘවිශෙෂණම්; ජීවානාම්-නිර්ධාරණෙෂෂ්ඨී, අකාරාන්ත පුංලිඞ්ගා 'ජීව' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'ශ්‍රෙෂ්ඨ' ශබ්දඃ.

f මානවානාං, මිනුෂ්‍යයන් අතුරෙන්; ධාර්මිකඃඑව, දැහැමි තෙමේම; ආදරණීයඃ, ආදරකටයුතුවේ; ස්‍යාත්-ලිඞ්ක්‍රියා;. ධාර්මිකඃ-උක්තකර්තෘ; ආදරණීයඃ=කර්තෘවිශෙෂණම්; එව-අව්‍යයම්; මානවානාම්-නිර්ධාරණෙෂෂ්ඨී; අකාරාන්තපුංලිඞ්ග 'ආදරණීය' ශබ්දඃ

g. භගවතඃ, භගවත්හට; උපමා, උපමාවෙක්; නාස්ති, නැත; නාස්ති-ලට්කර්තෘකාරකක්‍රියා; උපමා-උක්තකර්තා; භගවතඃ-අනුක්තසම්බන්ධඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'උපමා' ශබ්දඃ; තකාරාන්තපුංලිඞ්ගා 'භගවත්' ශබ්දඃ.

h. ශ්‍රීඝනස්‍ය, ශ්‍රීඝනවූ සර්වඥයන්වහන්සේට; තුලා, තුලාවෙක්; නවිද්‍යතෙ, නොමැත්තේය. විද්‍යතෙ-ලට්කර්තෘකාරකක්‍රියා; තුලා-උක්තකර්තා; ශ්‍රීඝනස්‍ය-අනුක්තසම්බන්ධඃ; න-අව්‍යයම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'තුලා' ශබ්දඃ.

# 7. සප්තමඃ පාඨඃ.

## සප්තමිප්‍රයොගාඃ

a. ශිශුඃ ශය්‍යායාං ශෙතෙ.
b. ලතායාං පුෂ්පං දෘශ්‍යතෙ.
c. කෘෂෞ කස්‍යාභිරුචිර්නොචිතා.
d. ස්ථාල්‍යාං පචති පාචිකා.
e. තරෞ කුලායාන් නිර්මිමතෙ පක්ෂිණඃ.

---

සප්තමි ප්‍රයොගාඃ, සප්තමි ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

a. ශිශුඃ, ළදරුතෙම; ශය්‍යායාං, ඇඳෙහි; ශෙතෙ, සයනය කෙරෙයි ශෙතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද ක්‍රියා; ශිශුඃ-උක්තකර්තා; ශය්‍යායාං-අනුක්තාධාරඃ; උකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිශු' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'ශය්‍යා' ශබ්දඃ.

b. ලතායාම්, ලියෙහි; පුෂ්පං, පුෂ්පයක්; දෘශ්‍යතෙ, දක්නා ලැබෙයි. දෘශ්‍යතෙ-ලට්කර්මකාරක ආත්මනෙපදක්‍රියා; පුෂ්පං-උක්තකර්ම; ලතායාම්-අනුක්තාධාරඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ලතා' ශබ්දඃ, අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'පුෂ්ප' ශබ්දඃ.

c. කෘෂෞ, සී සෑමෙහි; කස්‍ය, කවරක්හට; අභිරුචිඃ, කැමැත්ත; නොචිතා, සුදුසුනොවේද? (ස්‍යාත්- ක්‍රියා); අභිරුචිඃ-උක්තකර්තා; උචිතා-කර්තෘ විශෙෂණම්; න-අව්‍යයම්; කස්‍ය-අනුක්තසම්බන්ධඃ; කෘෂෞ-අනුක්තාධාරඃ; ඉකාරාන්ත පුංලිඞ්ගඃ 'කෘෂි' ශබ්දඃ, මකාරාන්ත 'කිම්' ශබ්දඃ පුංසි, ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'අභිරුචි' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'උචිතා' ශබ්දඃ.

d. පාචිකා, පිසන්නී තොමෝ; ස්ථාල්‍යාං, සැලෙහි; පචති, පිසයි. පචති-ක්‍රියා; පාචිකා-උක්තකර්තා; ස්ථාල්‍යාං-අනුක්තාධාරඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ස්ථාලී' ශබ්දඃ, ස්ථාලී, ස්ථාල්‍යෞ, ස්ථාල්‍යඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'පාචිකා' ශබ්දඃ.

e. පක්ෂිණඃ, පක්ෂිහු තුමූ; තරෞ, වෘක්ෂයෙහි; කුලායාන්, කැදලි; නිර්මිමතෙ, මවත්. නිර්මිමතෙ-ක්‍රියා; පක්ෂිණඃ-උක්තකර්තා; කුලායාන්-අනුක්තකර්ම; තරෞ-අනුක්තාධාරඃ; උකාරාන්ත පුංලිඞ්ගඃ 'තරු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කුලාය' ශබ්දඃ, නකාරාන්ත පුංලිඞ්ගඃ 'පක්ෂින්' ශබ්දඃ.

a. ගෘහෙ නිවසන්ති බාලාඃ.
b. අයොධ්‍යායා දූරෙ දණ්ඩකාරණ්‍යං වර්තතෙ.
c. සාධුර්මාතරි සජ්ජනඃ.
d. අසාධුර්බන්ධුෂු දුර්ජනඃ.
e. චර්මිණි ද්වීපිනං දන්තයොශ්ච කුඤ්ජරං ඝ්නන්ති ව්‍යාධාඃ.
f. කෙශෙෂු ගෘහීත්වා චෞරං තාඩයති ගෘහී.

---

a. ගෘහෙ, ගෙහි; බාලාඃ, ළදරුවෝ; නිවසන්ති, වෙසෙත්. නිවසන්ති-ක්‍රියා; බාලාඃ-උක්තකර්තෘ; ගෘහෙ-අනුක්තාධාරඃ; අකාරාන්තනපුංසකලිඞ්ගා 'ගෘහ' ශබ්දඃ.

b. අයොධ්‍යායාඃ, අයොධ්‍යාපුරයෙන්; දූරෙ, දුරෙහි; දණ්ඩකාරණ්‍යම්, දණ්ඩකාරණ්‍යය; වර්තතෙ, පවතී. වර්තතෙ-ක්‍රියා; දණ්ඩකාරණ්‍යම්-උක්තකර්තෘ; දූරෙ- අනුක්තාධාරඃ; අයොධ්‍යායාඃ- අනුක්තාපාදානම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'අයොධ්‍යා' ශබ්දඃ, අකාරාන්තනපුංසකලිඞ්ගා 'දූර' ශබ්දඃ, අකාරාන්තනපුංසකලිඞ්ගා 'දණ්ඩකාරණ්‍ය' ශබ්දඃ.

c. සජ්ජනඃ, සත්පුරුෂතෙම; මාතරි, මව කෙරෙහි; සාධුඃ, මැනවි; (ස්‍යාත්-ක්‍රියා); සජ්ජනඃ-උක්තකර්තෘ; සාධුඃ-කර්තෘවිශෙෂණම්; මාතරි-අනුක්තාධාරඃ.

d. දුර්ජනඃ, දුර්ජනතෙම; බන්ධුෂු, නෑයන්කෙරෙහි; අසාධුඃ, නොමැනවි. දුර්ජනඃ-උක්තකර්තෘ; අසාධුඃ-කර්තෘවිශෙෂණම්; බන්ධුෂු-අනුක්තාධාරඃ.

e. ව්‍යාධාඃ, වැද්දෝ; චර්මිණි, සම නිමිත්තකොට; ද්වීපිනං, දිවියාද; දන්තයොඃ, දෙදළ නිමිත්තකොට; කුඤ්ජරංච, ඇතුද; ඝ්නන්ති, නසත්. ඝ්නන්ති-ලට්ක්‍රියා; ව්‍යාධාඃ-උක්තකර්තෘ; ද්වීපිනං-අනුක්තකර්ම; චර්මිණි-නිමිත්තාර්ථෙ සප්තමී; ච-අව්‍යයම්; කුඤ්ජරං-අනුක්තකර්ම; නකාරාන්තනපුංසකලිඞ්ග "චර්මින්" ශබ්දඃ, චර්මී, චර්මිණී, චර්මීණි; නකාරාන්ත පුංලිඞ්ගා 'ද්වීපින්' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'දන්ත' ශබ්දඃ.

f. ගෘහී, ගෙහිමිතෙම; කෙශෙෂු ගෘහීත්වා, හිසකේ ගෙන; චෞරං, සොරාට; තාඩයති, තළයි. තාඩයති-ක්‍රියා, ගෘහී-උක්තකර්තෘ; චෞරං-අනුක්තකර්ම; ගෘහීත්වා-ක්‍රියාවාචී 'ත්වා' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; කෙශෙෂු-අනුක්තකර්මණි සප්තමී; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කෙශ' ශබ්දඃ, නකාරාන්ත පුංලිඞ්ගා 'ගෘහින්' ශබ්දඃ.

a. ගතෙෂු බන්ධුෂු රාමො ගෘහමාගතඃ.
b. ගොෂු දුහ්‍යමානාසු වත්සඃ උදිතඃ.
c. පශුෂු සිංහඃ ශ්‍රෙෂ්ඨඃ.
d. ගොෂු කෘෂ්ණා බහුක්ෂීරා.
e. රුදති ශිශෞ මොදක මශ්නාති ජාල්මඃ.
f. උපපරාර්ධෙ සන්ති මුනීශ්වරස්‍ය ගුණාඃ.

---

a. බන්ධුෂු, නෑයන්; ගතෙෂු, ගියකල්හි; රාමඃ, රාමතෙම; ගෘහම්, ගෙට; ආගතඃ, ආයේය. ආගතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; රාමඃ-උක්තකර්තෘ, ගෘහම්-අනුක්තකර්ම; ගතෙෂු-භාවසප්තමී; බන්ධුෂු-තද්විශෙෂණම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ගෘහ' ශබ්දඃ.

b. ගොෂු, දෙනුන්; දුහ්‍යමානාසු, දොවනකල්හි; වත්සඃ, වත්ස තෙම; උදිතඃ, උදුවූයේය. උදිතඃ-කෘදන්තකර්තෘකාරකක්‍රියා; වත්සඃ-උක්තකර්තෘ; දුහ්‍යමානාසු-භාවසප්තමී; ගොෂු-තද්විශෙෂණම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'දුහ්‍යමානා' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ග 'උදිත' ශබ්දඃ.

c. පශුෂු, සිව්පාවුන් අතරෙහි; සිංහඃ, සිංහතෙම; ශ්‍රෙෂ්ඨඃ, උතුම්. (ස්‍යාත්-ක්‍රියා); සිංහඃ-උක්තකර්තෘ; ශ්‍රෙෂ්ඨඃ-කර්තෘවිශෙෂණම්; පශුෂු-නිර්ධාරණාර්ථෙ සප්තමී; උකාරාන්ත පුංලිඞ්ගඃ 'පශු' ශබ්දඃ.

d. ගොෂු, දෙනුන් අතුරෙහි; කෘෂ්ණා, කැලිදෙන්තොමෝ; බහුක්ෂීරා, බොහෝ කිරිඇත්තීය. (ස්‍යාත්-ක්‍රියා); කෘෂ්ණා-උක්තකර්තෘ; බහුක්ෂීරා-කර්තෘවිශෙෂණම්; ගොෂු-නිර්ධාරණෙසප්තමී; අකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'කෘෂ්ණ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'බහුක්ෂීරා' ශබ්දඃ.

e. ශිශෞ, ළදරුවා; රුදති, හඬනකල්හි; ජල්මඃ, අඥාන තෙම; මොදකම්, හත්වට; අශ්නාති, වළඳයි. අශ්නාති-ක්‍රියා; ජල්මඃ-උක්තකර්තෘ; මොදකම්-අනුක්තකර්ම; රුදති-අනාදරෙ සප්තමී; ශිශෞ-තද්විශෙෂණම්; තකාරාන්ත පුංලිඞ්ගො 'රුදත්' ශබ්දඃ.

f. මුනීශ්වරස්‍ය, මුනීශ්වරයාගේ; ගුණාඃ, ගුණයෝ; උප පරාර්ධෙ, පරාර්ධයෙන් මත්තෙහි; සන්ති, වෙත්. සන්ති-ක්‍රියා; ගුණාඃ-උක්තකර්තෘ; මුනීශ්වරස්‍ය-අනුක්තසම්බන්ධඃ; උප-අව්‍යයම්; පරාර්ධෙ-අනුක්තාධාරඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'පරාර්ධ' ශබ්දඃ, අකාරාන්තපුංලිඞ්ගො 'මුනීශ්වර' ශබ්දඃ, අකාරාන්තපුංලිඞ්ගො 'ගුණ' ශබ්දඃ.

# අෂ්ටමඃ පාඨඃ.

**a. සප්තවිභක්ති ප්‍රයොගාඃ.**

**b. බුද්ධො බුද්ධිදයාම්බුධිර්විජයතෙ බුද්ධං භජන්තෙ බුධා**
**බුද්ධෙනාධිගතා විමුක්තිපදවී බුද්ධාය තස්මෛ නමඃ**
**බුද්ධාත්සම්ප්‍රභවන්ත්‍යලෞකිකගුණා බුද්ධස්‍යවාඞ්නිර්මලා**
**බුද්ධෙ'නුස්මෘතිරස්තු මෙ'නවරතං මාංපාහි බුද්ධ!ප්‍රභො!**

---

a. සප්තවිභක්ති ප්‍රයොගාඃ, සප්තවිභක්තිප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

b. බුද්ධිදයාම්බුධිඃ, ඥාණදයා දෙකට සමුද්‍රය වැනිවූ; බුද්ධඃ, සර්වඥතෙම; විජයතෙ, ජයගති; බුධාඃ, පණ්ඩිතයෝ; බුද්ධං, සර්වඥයා; භජන්තෙ, සෙවනයකෙරෙත්; බුද්ධෙන, සර්වඥයාවිසින්; විමුක්තිපදවී, නිර්වාණපදවිතොමෝ; අධිගතා, පැමිණෙනලද්දීය; හෙවත් ලබනලද්දීය; තස්මෛ බුද්ධාය, ඒ සර්වඥයාහට; නමඃ, නමස්කාරවේවා; බුද්ධාත්, සර්වඥයා කෙරෙන්; අලෞකිකගුණාඃ, ලොකොත්තර ගුණයෝ; ප්‍රභවන්තිසම, පහළවූවාහුය; බුද්ධස්‍ය, සර්වඥයාගේ; වාඞ්, වාක්තොමෝ; නිර්මලා, නිර්මලවන්නීය; බුද්ධෙ, සර්වඥයාකෙරෙහි; මෙ, මාගේ; අනුස්මෘතිඃ, සිහිකිරීම; අනවරතං, නිරන්තරයෙන්; අස්තු, වේවා; ප්‍රභො! බුද්ධ!, ස්වාමිවූ සර්වඥයන්වහන්ස; මාං, මා; පාහි, රක්ෂාකළමැනවි.

විජයතෙ-ලට්ක්‍රියා; බුද්ධඃ-උක්තකර්තෘ; බුද්ධිඃ-කර්තෘවිශෙෂණම්; භජන්තෙ-ක්‍රියා; බුධාඃ-උක්තකර්තෘ; බුද්ධම්-අනුක්තකර්ම;අධිගතා-කෘදන්තකර්මකාරකක්‍රියා; විමුක්තිපදවී-උක්තකර්ම; බුද්ධෙන-අනුක්තකර්තෘ, අස්තු-ලොට්ආඛ්‍යාතක්‍රියා; නමඃ-උක්තකර්තෘ; බුද්ධාය-අනුක්තසම්ප්‍රදානම්;ප්‍රභවන්ති-ලට්ක්‍රියා;අලෞකිකගුණාඃ-උක්තකර්තෘ; බුද්ධාත්-අනුක්තාපාදානම්; සම-අව්‍යයම්; ස්‍යාත්-ලිඞ්ක්‍රියා; වාං-උක්තකර්තෘ; නිර්මලා-කර්තෘවිශෙෂණම්; බුද්ධස්‍ය-අනුක්තසම්බන්ධඃ; අස්තු-ලොට්ක්‍රියා; අනුස්මෘතිඃ-උක්තකර්තෘ; බුද්ධෙ-අනුක්තාධාරඃ; මෙ-අනුක්තසම්බන්ධඃ; අනවරතං-ක්‍රියාවිශෙෂණම්; පාහි-ලොට්ක්‍රියා; (ත්වම්-ආධ්‍යාහෘත උක්තකර්තෘ); මාං-අනුක්තකර්ම; බුද්ධ!-අනුක්ත සම්බොධනම්; ප්‍රභො-තද්විශෙෂණම්; අකාරාන්තපුංලිඞ්ගා 'බුද්ධ' ශබ්දඃ, ඉකාරාන්ත පුංලිඞ්ගා 'බුද්ධි' ශබ්දඃ, ආකාරාන්තස්ත්‍රීලිඞ්ග 'අධිගතා' ශබ්දඃ, ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'විමුක්තිපදවී' ශබ්දඃ, දකාරන්තඃ ත්‍යච්ඡබ්දඃ පුංසි, අකා

**a. වෘක්ෂස්තිෂ්ඨති කානනෙ කුසුමිතෙ වෘක්ෂං ලතාසංශ්‍රිතා**
**වෘක්ෂෙණාභිහතො ගජෝ නිපතිතො වෘක්ෂාය දෙයං ජලම්**
**වෘක්ෂාදානය මඤ්ජරිං කුසුමිතාං වෘක්ෂස්‍ය ශාඛොන්නතා**
**වෘක්ෂෙ නීඩමිදං කෘතං ශකුනිනා හෙ වෘක්ෂ! කිංපශ්‍යසි.**

---

රාන්තපුංලිඞ්ග 'අලෞකිකගුණ' ශබ්දඃ, චකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'වාච්' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'නිර්මලා' ශබ්දඃ, ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'අනුස්මෘති' ශබ්දඃ, (මෙ) දකාරාන්තඃ 'අස්මද්' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගඃ 'අනවරත' ශබ්දඃ, උකාරාන්ත පුංලිඞ්ගඃ 'ප්‍රභු' ශබ්දඃ.

a. කුසුමිතෙ, පිපියාවූ; කානනෙ, වනයෙහි; වෘක්ෂඃ, වෘක්ෂයෙක්; තිෂ්ඨති, සිටී; ලතා, ලියතොමෝ; වෘක්ෂං, වෘක්ෂය; සංශ්‍රිතා, ඇසුරුකළාය; වෘක්ෂෙණ, වෘක්ෂයවිසින්; අභිහතඃ, නසනලද; ගජඃ, හස්තිතෙම; නිපතිතඃ, වැටුණේය; වෘක්ෂාය, වෘක්ෂයට ජලම්, ජලය; දෙයම්, දියයුතුයි; වෘක්ෂාත්, වෘක්ෂයෙන්; කුසුමිතාං, පිපියාවූ; මඤ්ජරිං, කැණක්; ආනය, ගෙනෙව; වෘක්ෂස්‍ය, වෘක්ෂයාගේ; ශාඛා, ශාඛාතොමෝ; උන්නතා, උස්වූවාය; වෘක්ෂෙ, වෘක්ෂයෙහි; ශකුනිනා, ලිහිණියකුවිසින්; ඉදම්නීඩම්, මේ කැදැල්ල; කෘතං, කරනලදී; හෙ වෘක්ෂ!, පින්වත් වෘක්ෂය; කිං, කුමක්; පශ්‍යසි, බලන්නෙහිද?

තිෂ්ඨති-ලට්ක්‍රියා; වෘක්ෂඃ-උක්තකර්තෘ; කානනෙ-අනුක්තාධාරඃ; කුසුමිතෙ-තද්විශෙෂණම්; සංශ්‍රිතා-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; ලතා-උක්තකර්තෘ; වෘක්ෂං-අනුක්තකර්ම; නිපතිතඃ-කෘදන්ත කර්තෘකාරකක්‍රියා; ගජඃ-උක්තකර්තෘ; අභිහතඃ-කර්තෘවිශෙෂණම්; වෘක්ෂෙණ-අභිහත ක්‍රියායාඃ අනුක්තකර්තෘ; දෙයම්-කෘදන්ත කර්ම කාරක ක්‍රියා; ජලං-උක්තකර්ම; වෘක්ෂාය-අනුක්ත සම්ප්‍රදානම්; ආනය-ලොට්ක්‍රියා: ත්වම්-ආධ්‍යාහෘත උක්තකර්තෘ; මඤ්ජරිං-අනුක්තකර්ම; කුසුමිතාං-තද්විශෙෂණම්; වෘක්ෂාත්-අනුක්තාපාදානම්; ශාඛා-උක්තකර්තෘ; උන්නතා තද්විශෙෂණම්; වෘක්ෂස්‍ය-අනුක්තසම්බන්ධඃ; කෘතං-කෘදන්ත කර්මකාරකක්‍රියා; නීඩම්-උක්ත කර්ම; ඉදම්-කර්මවිශෙෂණම්; ශකුනිනා-අනුක්තකර්තෘ; වෘක්ෂෙ-අනුක්තාධාරඃ; පශ්‍යසි-ලට්ක්‍රියා; ත්වම්-ආධ්‍යාහෘත උක්තකර්තෘ; කිම්-අනුක්තකර්ම; වෘක්ෂ-අනුක්ත සම්බොධනම්; හෙ-අව්‍යයම්.

a. ශිෂ්‍යඃ කුරුතෙ පූජාං
බහුනා විනයෙන තත්ත්වබොධය
ආගත්‍ය නිජස්ථානා—
ධර්මාචාර්‍ය්‍යස්‍ය පාදාන්තෙ.

---

## 9. නවමඃ පාඨඃ.

---

### b අසම්බද්ධ ප්‍රයොගාඃ.

---

අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'කාන්ත' ශබ්දඃ, අකාරාන්තක්ලීව ලිඞ්ගඃ 'කුසුමිත' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'සංශ්‍රිතා' ශබ්දඃ, අකාරාන්තපුංලිංගඃ 'අභිගත' ශබ්දඃ, අකාරාන්තපුංලිඞ්ගො 'නිප තිත' ශබ්දඃ, අකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'දෙය' ශබ්දඃ, අකාරාන්තක්ලීව ලිඞ්ගො 'ජල' ශබ්දඃ, ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මඤ්ජරී' ශබ්දඃ, ආකා රාන්ත ස්ත්‍රීලිංගඃ 'ශාඛා' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'උන්නතා' ශබ්දඃ, අකාරාන්තක්ලීවලිඞ්ගො 'නීඩ' ශබ්දඃ, මකාරාන්ත 'ඉදම්' ශබ්දඃක්ලීවෙ, අකාරාන්තක්ලීවලිඞ්ගඃ 'කෘත' ශබ්දඃ, ඉකාරාන්ත පුංලිංගඃ 'ශකුනි' ශබ්දඃ.

a. ශිෂ්‍යඃ, ශිෂ්‍යතෙම; නිජස්ථානාත්, ස්වකීය ස්ථානයෙන්; ආගත්‍ය, අවුත්; ධර්මාචාර්‍ය්‍යස්‍ය, ධර්මාචාර්‍ය්‍යයාගේ; පාදාන්තෙ, පාද මූලයෙහි; බහුනාවිනයෙන, බොහෝ හික්මීමෙන්; තත්ත්වබොධාය, තත්ත්ව දැනගැනීම පිණිස; පූජාංකුරුතෙ, පූජාකෙරෙයි. කුරුතෙ ලට් ආත්මනෙපද ක්‍රියා; ශිෂ්‍යඃ-උක්තකර්තෘ; පූජාං-අනුක්තකර්ම; විනයෙන-අනුක්ත කරණම්; බහුනා-තද්විශෙෂණම්; තත්ත්වබොධාය තාදර්ථ්‍යචතුර්ථී; ආගත්‍ය-පූර්වක්‍රියාවාචී අව්‍යයම්; නිජස්ථානාත්-අනුක්තාපාදනම්; ධර්මාචාර්‍ය්‍යස්‍ය-අනුක්ත සම්බන්ධඃ; පාදාන්තෙ-අනුක්තාධාරඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශිෂ්‍ය' ශබ්දඃ, ආකාරාන්තස්ත්‍රීලිඞ්ගඃ 'පූජා' ශබ්දඃ, උකාරාන්තපුංලිඞ්ගො 'බහු' ශබ්දඃ, අකාරාන්තපුංලිඞ්ගො 'විනය' ශබ්දඃ, අකාරාන්තපුං ලිඞ්ගඃ 'තත්ත්වබොධ' ශබ්දඃ, අකාරාන්තක්ලීවලිඞ්ගො 'නිජස්ථාන' ශබ්දඃ, අකාරාන්තපුංලිඞ්ගො 'ධර්මාචාර්‍ය්‍ය' ශබ්දඃ, අකාරාන්තපුං ලිඞ්ගඃ 'පාදාන්ත' ශබ්දඃ.

b අසම්බද්ධප්‍රයොගාඃ, අසම්බන්ධ ශබ්ද ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

a. අහං චන්ද්‍රං පශ්‍යාමි.
b. ආවාං ගෘහං ගච්ඡාවඃ.
c. වයං න භවන්තමුපදිශාමඃ.
d. මාං වෘථා පෘච්ඡසි ත්වම්.
e. ආවාං තාඩයිතුං නයුජ්‍යෙථෙ යුවාම්
f. අස්මාන් ප්‍රති වෘථා කුප්‍යථ යූයම්.
g. මයා න ඥායතෙ කිඤ්චිත්.
h. ආවාභ්‍යාං කිං කෘතං භවතඃ.

---

a. අහං, මම; චන්ද්‍රං, චන්ද්‍රයා; පශ්‍යාමි, බලමි. පශ්‍යාමි-ලට් කර්තෘකාරක උත්තම පුරුෂෛකවචනක්‍රියා; අහං-උක්තකර්තෘ; චන්ද්‍රං-අනුක්තකර්ම; දකාරාන්ත අසම්වජ්බිදඃ.

b. ආවාම්, අපිදෙදෙන; ගෘහං, ගෙට; ගච්ඡාවඃ, යෙමු. ගච්ඡාවඃ-ක්‍රියා; ආවාං-උක්තකර්තෘ; ගෘහං-අනුක්තකර්ම

c. වයං, අපි; භවන්තං, තට; නඋපදිශ්‍යාමඃ, උපදෙස් නො කියමු. උපදිශ්‍යාමඃ-ක්‍රියා; වයං-උක්තකර්තෘ-භවන්තං-අනුක්ත කර්ම; න-අව්‍යයම්.

d. ත්වම්, තෝ; මාං, මා; වෘථා, නිකරුණෙහි; පෘච්ඡසි, විචාරහි. පෘච්ඡසි-ක්‍රියා; ත්වම්-උක්තකර්තෘ; මාං,-අනුක්තකර්ම; වෘථා-අව්‍යයම්.

e. යුවාම්, තෙපිදෙදෙන; ආවාම්, අපදෙදෙනාට; තාඩයිතුං, තළන්ට; නයුජ්‍යෙථෙ, යොග්‍ය නොවෙත්. යුජ්‍යෙථෙ-ක්‍රියා; යුවාම්-උක්තකර්තෘ; ආවාම්-අනුක්තකර්ම; න-අව්‍යයම්, තාඩයිතුං-තුං ප්‍රත්‍යාන්තමව්‍යයම්.

f. යූයම්, තෙපි; අස්මාන්ප්‍රති, අපකෙරෙහි; වෘථා, නිකරුණෙහි; කුප්‍යථ, කිපෙහු. කුප්‍යථ-ක්‍රියා; යූයම්-උක්තකර්තෘ; වෘථා-අව්‍යයම්; ප්‍රති-අව්‍යයම්; අස්මාන්-ප්‍රතියොගෙ විතීයා.

g. මයා, මාවිසින්; කිඤ්චිත්, කිසිවක්; නඥායතෙ, නොදන්නා ලැබේ. ඥායතෙ-ලට් කර්මකාරක ආත්මනෙපදක්‍රියා; කිඤ්චිත්-උක්තකර්ම; මයා-අනුක්තකර්තෘ; න-අව්‍යයම්; කිඤ්චිත්-අව්‍යයම්.

h. භවතඃ, පින්වත්හට; ආවාභ්‍යාං, අපදෙදෙනාවිසින්; කිං කෘතං, කුමක් කරන ලද්දේද? කෘතං ක්‍රියා; කිං-උක්තකර්ම; ආවාභ්‍යාං-අනුක්තකර්තෘ; භවතඃ-අනුක්තසම්බන්ධඃ.

a. අස්මාභිඃ සහ පරිහාසො නොචිතඃ.
b. මහ්‍යං නරොචතෙ ශාඨ්‍යම්.
c. ආවාභ්‍යාං වස්ත්‍රං ප්‍රයච්ඡති.
d. අස්මභ්‍යං හිතමිදං පුස්තකම්
e. මත්කො'පි න බිභෙති.
f. ආවාභ්‍යාං නජායතෙ ශාත්‍රවම්.
g. අස්මත් න කො'පි පීඩාං ලභතෙ.
h. මම නාස්ති ධනම්.

---

a. අස්මාභිඃ සහ, අපහා සමග; පරිහාසඃ, ක්‍රීඩාව; නොචිතඃ, සුදුසු නොවේ. (ස්‍යාත්-ක්‍රියා); පරිහාසඃ-උක්තකර්තෘ; උචිතඃ-කර්තෘ විශෙෂණනාම්; න-අව්‍යයම්; සහ-අව්‍යයම්; අස්මාභිඃ-සහ යොගෙතෘතීයා; දකාරාන්ත අස්මච්ඡබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ග 'පරිහාස' ශබ්දඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'උචිතා' ශබ්දඃ.

b. මහ්‍යම්, මට; ශාඨ්‍යම්, ශඨබව; නරොචතෙ, රුචිනොවේ; රොචතෙ-ක්‍රියා; ශාඨ්‍යම් උක්තකර්තෘ; මහ්‍යම්-අනුක්තසම්ප්‍රදානම්; න-අව්‍යයම්.

c. ආවාභ්‍යාං, අපදෙදෙනාහට; වස්ත්‍රං, වස්ත්‍රය; ප්‍රයච්ඡ, දෙව. ප්‍රයච්ඡ-ලට්ක්‍රියා; (ත්වං-ආධ්‍යාහෘත උක්තකර්තෘ); වස්ත්‍රම්-අනුක්තකර්ම; ආවාභ්‍යාම්-අනුක්තසම්ප්‍රදානම්; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'වස්ත්‍ර' ශබ්දඃ.

d. ඉදම්පුස්තකම්, මේ පොත; අස්මභ්‍යං, අපට; හිතම්, හිතවේ; (ස්‍යාත්-ලිඞ්ක්‍රියා); පුස්තකම්-උක්තකර්තෘ; ඉදම්-කර්තෘ විශෙෂණම්; අස්මභ්‍යම්-අනුක්තසම්ප්‍රදානම්

e. මත්, මාකෙරෙන්; කඃඅපි, කවරෙකුත්; න බිභෙති, බිය නොවේ; බිභෙති-ක්‍රියා; කඃ-උක්තකර්තෘ; මත්-අනුක්තාපාදානම්; අපි-අව්‍යයම්.

f. ආවාභ්‍යාම්, අපදෙදෙනා කෙරෙන්; ශාත්‍රවම්, සතුරුබවක්; නජායතෙ, නුපදී. ජායතෙ-ක්‍රියා; ශාත්‍රවම්-උක්තකර්තෘ; ආවාභ්‍යාම්-අනුක්තසම්ප්‍රදානම්; න-අව්‍යයම්.

g. අස්මත්, අපකෙරෙන්; කඃඅපි, කිසිවෙකුත්; පීඩාම්, පීඩාවෙක්; නලභතෙ, නොලබයි. නලභතෙ-ක්‍රියා; කඃ-උක්තකර්තෘ; පීඩාම්.-අනුක්තකර්ම; අස්මත්-අනුක්තාපාදානම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'පීඩා' ශබ්දඃ.

h. මම, මට; ධනම්, ධනයක්; නාස්ති, නැත. ධනම්-උක්තකර්තෘ; මම අනුක්තසම්බන්ධඃ.

a. ආචාර්යයෝර්නාස්ති සුඛලේශඃ.
b. අස්මාකං සම්මතං නදුර්ව්‍යවසිතම්
c. මයි කා නාම අභ්‍යර්ථනා.
d. ආචාර්යයෝඃ කිං ගෞරවම්.
e. අස්මාසු වත්සලා ගුරවඃ.

## 10. දශමඃ පාඨඃ.

f. යුෂ්මච්ඡබ්ද ප්‍රයෝගාඃ.

g. ත්වං ශාස්ත්‍ර මධිගච්ඡ.
h. යුවාං සත්‍යම් භාෂේථාම්.

---

a. ආචාර්යයෝඃ, අපදෙදෙනාහට; සුඛලේශඃ, ලේශමාත්‍රසැපය කුදු; නාස්ති, නැත. අස්ති- ක්‍රියා; සුඛලේශඃ-උක්තකර්තෘ; ආචාර්යයෝඃ-අනුක්ත සම්බන්ධඃ.

b. අස්මාකම්, අප විසින්; දුර්ව්‍යවසිතම්, නපුරැක්‍රියාව; නසම්මතම්, මැනවැයි නොදන්නාලැබේ සම්මතං-කෘදන්තකර්ම කාරක ක්‍රියා; දුර්ව්‍යවසිතම්-උක්තකර්ම; අස්මාකම්-අනුක්තකර්තරි ෂෂ්ඨී; න-අව්‍යයම්; අකාරාන්ත නපුංසකලිඞ්ග 'දුර්ව්‍යවසිත' ශබ්දඃ.

c. මයි, මා කෙරෙහි; කානාමඅභ්‍යර්ථනා, කවරනම් ප්‍රාර්ථනාවක්ද? ස්‍යාත්-ලිඞ්ක්‍රියා; අභ්‍යර්ථනා-උක්තකර්තෘ; කා-තද්විශේෂණම්; නාම-අව්‍යයම්; මයි-අනුක්තාධාරඃ; අකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'අභ්‍යර්ථනා' ශබ්දඃ.

d. ආචාර්යයෝඃ, අපදෙදෙනා කෙරෙහි; කිංගෞරවම්, කවර ගෞරවයෙක්ද? ස්‍යාත්-ක්‍රියා, ගෞරවම්-උක්තකර්තෘ; කිං-තද්විශේෂණම්; ආචාර්යයෝඃ-අනුක්තාධාරඃ.

e. ගුරවඃ, ආචාර්යයෝ; අස්මාසු, අප කෙරෙහි; වත්සලාඃ, ප්‍රේමවෙත්. ස්‍යුඃ-ක්‍රියා; ගුරවඃ-උක්තකර්තෘ, වත්සලාඃ-කර්තෘ විශේෂණම්, අස්මාසු-අනුක්තාධාරඃ; අකාරාන්තපුංලිඞ්ග 'වත්සල'ශබ්දඃ.

f. යුෂ්මච්ඡබ්දප්‍රයෝගාඃ, යුෂ්මත්ශබ්දප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

g. ත්වම්, තෝ; ශාස්ත්‍රම්, ශාස්ත්‍රය; අධිගච්ඡ, හදාරව; අධිගච්ඡ-ලෝට්ක්‍රියා; ත්වම්-උක්තකර්තෘ; ශාස්ත්‍රම්-අනුක්තකර්ම.

h. යුවාම්, තෙපිදෙදෙන; සත්‍යං, සබවස; භාෂේථාම්, කියව්. භාෂේථාම්-ක්‍රියා; යුවාං-උක්තකර්තෘ, සත්‍යං-අනුක්තකර්ම.

**a. යූයං කමපි නොපහසත.**
**b. ත්වාං ගුරුර්නාභිනන්දති.**
**c. යුවාං නින්දති ලොකඃ.**
**d. යුෂ්මානභි භවති ක්‍රොධඃ.**
**e. ත්වයා කිමධීයතෙ.**
**f. යුවාභ්‍යාං කතමත් ශාස්ත්‍රං පඨ්‍යතෙ**
**g. යුෂ්මාභිර්න බහුමන්‍යතෙ සදුපදෙශඃ.**
**h. තුභ්‍යංනා සූයති ලොකඃ.**

---

a. යූයම්, තෙපි; කමපි, කිසිවකුටත්; නොපහසත, උපහාස නොකරව්. උපහසත-ක්‍රියා; යූයම්–උක්තකර්තෘ; කම්-අනුක්තකර්ම.

b. ගුරුඃ, ආචාර්‍ය්‍යතෙම; ත්වාං, තට; නාභිනන්දති, සතුටු නොවෙයි. අභිනන්දති- ක්‍රියා; ගුරුඃ-උක්තකර්තෘ; ත්වං–අනුක්ත කර්ම.

c. ලොකඃ, ලෝවැසිතෙම; යුවාං, තොපදෙදෙනාහට; නින්දති, නින්දාකෙරෙයි. නින්දති–ක්‍රියා; ලොකඃ–උක්තකර්තෘ; යුවාං–අනුක්තකර්ම.

d. ක්‍රොධඃ, කොපයතෙම; යුෂ්මාන්, තොප; අභිභවති, මැඬ පියයි අභිභවති-ක්‍රියා; ක්‍රොධඃ-උක්තකර්තෘ; යුෂ්මාන්–අනුක්ත කර්ම.

e. ත්වයා, තාවිසින්; කිං, කුමක්; අධීයතෙ, හදාරනු ලැබේද? අධීයතෙ–ලබ්කර්මකාරක ආත්මනෙපදක්‍රියා; කිං–උක්තකර්ම; ත්වයා–අනුක්තකර්තෘ.

f. යුවාභ්‍යාම්, තොපදෙදෙනාවිසින්; කතමත් ශාස්ත්‍රං, කවර ශාස්ත්‍රයක්; පඨ්‍යතෙ, හදාරනුලැබේද? පඨ්‍යතෙ-ලබ් ක්‍රියා; ශාස්ත්‍රම්–උක්තකර්ම; කතමං–තද්විශෙෂණම්; යුවාභ්‍යාම්–අනුක්ත කර්තෘ; අකාරාන්තක්ලීවලිඞ්ගඃ, 'කතම' ශබ්දඃ; අකාරන්තක්ලීව ලිඞ්ගඃ 'ශාස්ත්‍ර' ශබ්දඃ.

g. යුෂ්මාභිඃ, තොපවිසින්; සදුපදෙශඃ, යහපත් උපදෙශය තෙම; නබහුමන්‍යතෙ, බුහුමන් නොකරනුලැබේ. බහුමන්‍යතෙ–ලබ්කර්මකාරක ආත්මනෙපදක්‍රියා; සදුපදෙශඃ–උක්තකර්ම; යුෂ්මා, භිඃ–අනුක්තකර්තෘ; අකාරාන්තපුංලිඞ්ගඃ 'සදුපදෙශ'ශබ්දඃ.

h. ලොකඃ, ලෝවැසිතෙම; තුභ්‍යං, තට; නාසූයති, දොස් පහළනොකෙරෙයි. නාසූයති–ක්‍රියා; තුභ්‍යං–අනුක්ත සම්ප්‍රදාන.

a. යුවාභ්‍යාං ප්‍රති ශෘණෝමි රාමායණම්.
b. යුෂ්මභ්‍යං කිම්දෙයමස්ති.
c. හෙ! භගවන්! ත්වත්ප්‍රභවති ජගත්සර්වම්.
d. යුවාභ්‍යාං න නිඃසරති කපර්දිකොපි.
e. යුෂ්මත් නානිෂ්ටං ජායතෙ කිඤ්චිත්.
f. තව ස්මරති ගුරුජනඃ.

---

a. යුවාභ්‍යාම්, තොපදෙදෙනාහට; රාමායණම්, රාමායණය; ප්‍රතිශෘණෝමි, ගිවිස්නෙමි. ප්‍රතිශෘණෝමි-ලට් උත්තමපුරුෂ ක්‍රියා; අහම්-අධ්‍යාහෘත උක්තකර්තෘ; රාමායණම්-අනුක්තකර්ම; යුවාභ්‍යාං-අනුක්ත සම්ප්‍රදානම්; අකාරාන්ත පුංලිඞ්ගා 'රාමායණ' ශබ්දඃ.

b. යුෂ්මභ්‍යම්, තොපට; දෙයම්, දියයුතුවූ; කිම්, කුමක්; අස්ති, ඇද්ද? අස්ති-ක්‍රියා; කිං-උක්තකර්තෘ; දෙයම්-තද්විශෙෂණම්; යුෂ්මභ්‍යං-අනුක්තසම්ප්‍රදානම්; කිං-අව්‍යයම්; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'දෙය' ශබ්දඃ.

c. හෙ! භගවන්!, පින්වත් සර්වඥය!; සර්වංජගත්, සියලුලොව; ත්වත්, තාකෙරෙන්; ප්‍රභවති, පහළකෙරෙයි; ප්‍රභවති-ක්‍රියා; ජගත්-උක්තකර්තෘ; සර්වම්-තද්විශෙෂණම්; ත්වත්-අනුක්තාපාදානම්; භගවන්-අනුක්තසම්බොධනම්; හෙ-අව්‍යයම්; තකාරාන්ත පුංලිඞ්ගා 'භගවත්' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'සර්ව' ශබ්දඃ.

d. යුවාභ්‍යාම්, තොප දෙදෙනාකෙරෙන්; කපර්දිකඃඅපි, බෝල් ලකුදු; නනිඃසරති, නිකුත්නොවෙයි; නිඃසරති-ක්‍රියා; කපර්දිකඃ-උක්තකර්තෘ; යුවාභ්‍යාම්-අනුක්තාපාදානම්; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කපර්දික' ශබ්දඃ.

e. යුෂ්මත්, තොපකෙරෙන්; කිඤ්චිත්අනිෂ්ටම්, කිසියම් නපුරක්; නජායතෙ, නොවේ. ජායතෙ-ක්‍රියා; අනිෂ්ටම්-උක්ත කර්තෘ; යුෂ්මත්-අනුක්තාපාදානම්; කිංචිත්-අව්‍යයම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'අනිෂ්ට' ශබ්දඃ.

f. ගුරුජනඃ, ආචාර්‍ය්‍යජනතෙම; තව, තා; ස්මරති, සිහි කෙරෙයි. ස්මරති-ක්‍රියා; ගුරුජනඃ-උක්තකර්තෘ; තව-කර්මති ෂෂ්ඨී.

a. යුවයෝර්න විදිතං කිඤ්චිදපි.
b. යුෂ්මාකං සම්පත් පරහිතාය කල්පතෙ.
c. ත්වයි මෙ විපුලා ප්‍රීතිරස්ති.
d. යුවයෝරධිකඃ ස්නෙහො ගුරූණාම්.
e. යුෂ්මාසු න කස්‍ය ජායතෙ ප්‍රීතිඃ.

---

## තෘතීයාධ්‍යායඃ.

---

## 1. ප්‍රථමඃ පාඨඃ.

---

### f. අව්‍යයීභාව ප්‍රයොගාඃ.

---

a. යුවයොඃ, තොපදෙදෙනාවිසින්; කිඤ්චිත්අපි, කිසිවකුත්; නවිදිතම්, නොදන්නාලදී. විදිතම්-කෘදන්ත කර්මකාරකක්‍රියා; කිඤ්චිත්-උක්තකර්මති අව්‍යයම්; යුවයොඃ-අනුක්තකර්තෘවිශෙෂණ; අකාරාන්තනපුංසකලිඞ්ගයා 'විදිත' ශබ්දඃ.

b. යුෂ්මාකම්, තොපගේ; සම්පත්, සම්පත්තොමෝ; පර හිතාය, අනුන්ට සැපපිණිස; කල්පතෙ, සමර්ථවේ. කල්පතෙ-ක්‍රියා; සම්පත්-උක්තකර්තෘ; පරහිතාය;-අනුක්ත සම්ප්‍රදානම්; යුෂ්මාකං-අනුක්තසම්බන්ධඃ.

c. ත්වයි, තාකෙරෙහි; මෙ, මාගේ; විපුලා, මහත්වූ; ප්‍රීතිඃ, ප්‍රීතියක්; අස්ති, ඇති; අස්ති-ක්‍රියා; ප්‍රීතිඃ-උක්තකර්තෘ; විපුලා-කර්තෘවිශෙෂණම්; මම-අනුක්තසම්බන්ධඃ; ත්වයි-අනුක්තාධාරඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගයා 'විපුලා' ශබ්දඃ, ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'ප්‍රීති' ශබ්දඃ.

d. යුවයොඃ, තොපදෙදෙනාකෙරෙහි; ගුරූණාම්, ආචාර්ය්‍ය යන්ගේ; අධිකඃ ස්නෙහඃ, අධිකවූ ස්නෙහය (අස්ති, ඇති;) ස්නෙහඃ-උක්තකර්තෘ; අධිකඃ-කර්තෘ විශෙෂණම්; යුවයොඃ-අනුක්තාධාරඃ; ගුරූණාම්-අනුක්තසම්බන්ධඃ; අකාරාන්තපුංලිඞ්ග 'අධික'ශබ්දඃ. අකාරාන්තපුංලිඞ්ගඃ 'ස්නෙහ' ශබ්දඃ.

e. යුෂ්මාසු, තොපකෙරෙහී; කස්‍ය, කවරෙක්හට; ප්‍රීතිඃ, ප්‍රීතියක්; නජායතෙ, නොවේද? ජායතෙ-ක්‍රියා; ප්‍රීතිඃ-උක්ත කර්තෘ; යුෂ්මාසු-අනුක්තාධාරඃ; කස්‍ය-අනුක්තසම්බන්ධඃ.

---

f. අව්‍යයීභාවප්‍රයොගාඃ, අව්‍යයීභාවප්‍රයොගයෝ කියනු ලැබෙත්.

**a. අධිපුත්‍රං ස්වාභාවිකී මාතුඃ ස්නේහප්‍රවෘත්තිඃ.**
**b. අධිපුරං නිවසන්ති පෞරාඃ**
**c. අධිහරි භක්තිමන්තෝ වෛෂ්ණවාඃ**
**d. නිර්වින්ධ්‍යඃ නිඃසරති නර්මදා.**

---

a. අධිපුත්‍රම්, පුත්‍රයාකෙරෙහි; මාතුඃ, මවගේ; ස්නේහ ප්‍රවෘත්තිඃ, ස්නේහපැවැත්ම; ස්වාභාවිකී, ස්වභාවයෙන් සිද්ධවේ. ස්‍යාත්-ක්‍රියා; ස්නේහප්‍රවෘත්තිඃ-උක්තකර්තා; ස්වාභාවිකී-කර්තෘවිශෙෂණම්; අධිපුත්‍රං-අව්‍යයීභාවඃ; පුත්‍රම්අධිකෘත්‍ය 'අධිපුත්‍රම්' (පුත්‍රං, පුත්‍රයා; අධිකෘත්‍ය, ආධාරකොට යන අර්ථයෙහි 'අධිපුත්‍රම්, යනුවේ.) ස්නේහස්‍ය ප්‍රවෘත්තිඃ 'ස්නේහප්‍රවෘත්තිඃ,' (ස්නේහස්‍ය, ස්නේහයාගේ; ප්‍රවෘත්තිඃ, පැවැත්ම යනඅර්ථයෙහි 'ස්නේහප්‍රවෘත්ති' නම්වේ,)-ෂෂ්ඨීතත්පුරුෂඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ'ස්වාභාවිකී' ශබ්දඃ.

b. පෞරාඃ, පුරවැස්සෝ; අධිපුරං, පුරයෙහි; නිවසන්ති, වෙසෙත්. නිවසන්ති-ක්‍රියා; පෞරාඃ-උක්තකර්තා; අධිපුරං-ආධාරාර්ථෙව්‍යයීභාවඃ; පුරං අධිකෘත්‍ය 'අධිපුරං'; (පුරං, නගරය; අධිකෘත්‍ය, ආධාරකොට යන අර්ථයෙහි 'අධිපුරං' යනුවේ.) පුරෙභවාඃ 'පෞරාඃ;' (පුරෙ, පුරයෙහි; භවාඃ, උපන්නෝ; පෞරාඃ, 'පෞර' නම්වෙත්;) තද්ධිතාන්තඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'පෞර' ශබ්දඃ. 'නි'පූර්ව 'වස'-නිවාසෙ;

c. වෛෂ්ණවාඃ, විෂ්ණුභක්තිකයෝ; අධිහරි, විෂ්ණුහු කෙරෙහි; භක්තිමන්තඃ, භක්තිඇත්තාහුය; ස්‍යුඃ-ක්‍රියා; වෛෂ්ණවාඃ-උක්තකර්තා; භක්තිමන්තඃ-කර්තෘවිශෙෂණම්; අධිහරි-ආධාරෙ අව්‍යයීභාවඃ; හරිං අධිකෘත්‍ය 'අධිහරි' (හරිං, විෂ්ණුහු; කෘත්‍යඅධි, ආධාරකොට යන අර්ථයෙහි 'අධිහරි' යනුවේ ) විෂ්ණුඃ එෂාම් දෙවතා ඉති 'වෛෂ්ණවාඃ,' (විෂ්ණුඃ, විෂ්ණුතෙම; එෂාම්, මොවුන්ට; දෙවතාඉති, දෙවතානුයි; වෛෂ්ණවාඃ, 'වෛෂ්ණව' නම්වෙත්.) අකාරාන්තපුංලිඞ්ගො 'වෛෂ්ණව' ශබ්දඃ; තකාරාන්තපුංලිඞ්ගො 'භක්තිමත්' ශබ්දඃ.

d. නර්මදා, නර්මදානම් නදීතොමෝ; නිර්වින්ධ්‍යං, වින්ධ්‍යපර්වතයෙන් නික්ම; නිඃසරති, බැසයේ. නිඃසරති-ක්‍රියා; නර්මදා-උක්තකර්තා; නිර්වින්ධ්‍යං-අව්‍යයීභාවඃ; වින්ධ්‍යාත් නිෂ්ක්‍රාන්තා'නිර්වින්ධ්‍යම්' (වින්ධ්‍යා, වින්ධ්‍යාපර්වතයෙන්; නිෂ්ක්‍රාන්තා, නිකුත්වූවා; නිර්වින්ධ්‍යං, 'නිර්වින්ධ්‍ය' නම්වේ.) ආකාරාන්තස්ත්‍රීලිඞ්ගො 'නර්මදා' ශබ්දඃ. 'නි'පූර්ව'සෘ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී; 'නි'පූර්වකො **අකර්මකඃ;**

a. උපනදං වාරාණසිවත්තෙ.
b. උපනදි ග්‍රාමාඃ ශොභන්තෙ.
c. උපරාජං විනයෙන වර්ත්තිතව්‍යම්.
d. අනාමයං පෘච්ඡති බන්ධුමාගතං සුභාග්
e. නිර්හිමං නශොභතෙ හෙමන්තෙ.

---

e. වාරාණසී, බරණැස; උපනදං, නදීසමීපයෙහි; වත්තෙ, පවතී. වත්තෙ-ක්‍රියා; වාරාණසී-උක්තකර්තෘ; උපනදං-අධාරෙ අව්‍යයීභාවඃ, නද්‍යාඃ සමීපං 'උපනදං' (නද්‍යාඃ, නදියගේ; සමීපං, සමීපයතෙම; උපනදං, 'උපනද' නම්වේ;) 'වෘතු'- වත්තෙ, අකර්මකඃ ආත්මනෙපදී.

a. උපනදී, ගඟසමීපයෙහි; ග්‍රාමාඃ, ග්‍රාමයෝ; ශොභන්තෙ, හොබිත්. ශොභන්තෙ-ක්‍රියා; ග්‍රාමාඃ-උක්තකර්තෘ; උපනදී-අනුක්තාධාරෙඅව්‍යයීභාවඃ; නද්‍යාඃසමීපං 'උපනදී' (නද්‍යාඃ, නදියගේ; සමීපං,සමීපය; උපනදී, 'උපනදී'නම්වේ;) 'ශුභ'-දීප්තෞ, අකර්මකඃ ආත්මනෙපදී.

c. උපරාජං, රජසමීපයෙහි; විනයෙන, විනයෙන් යුක්තව; වර්ත්තිතව්‍යම්, පැවැත්ත යුතුයි. වර්ත්තිතව්‍යම්-කෘදන්තභාවකාරක ක්‍රියා; විනයෙන-උපලක්ෂණෙ තෘතීයා; උපරාජං-අව්‍යයීභාවඃ; රාඥඃ සමීපං 'උපරාජං,' (රාඥඃ, රජහුගේ; සමීපං, සමීපයතෙම; උපරාජං, 'උපරාජ' නම්වේ;) අකාරාන්තපුංලිඞ්ගා 'විනය' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගා 'වර්ත්තිතව්‍ය' ශබ්දඃ.

d සුභෘත්, මනාසිත්ඇත්තේ; ආගතංබන්ධුං, ආවාවූනෑයා; අනාමයං, ආරොග්‍යය; පෘච්ඡති, විචාරයි. පෘච්ඡති -ක්‍රියා; සුභෘත්-උක්තකර්තෘ; අනාමයං-අනුක්තප්‍රධානකර්ම; බන්ධුම්-අනුක්තගෞනකර්ම; ආගතම්-ගෞනකර්මවිශෙෂණම්; ආමයස්‍ය අභාවඃ 'අනාමයං.' (ආමයස්‍ය, රොගයාගේ; අභාවඃ, නොවීම; අනාමයං, එනම්වේ;) 'පෘච්ඡ'-ඥීප්සායාම්, විකර්මකඃ පරස්මෙපදී.

e. නිර්හිමං, හිමවැල්ලක්ම; හෙමන්තෙ, හෙමන්තසෘතුයෙහි; නශොභතෙ, නොහොබී. ශොභතෙ-ක්‍රියා; නිර්හිමං-උක්තකර්තෘ; හෙමන්තෙ-අනුක්තාධාරඃ; හිමස්‍ය අභාවඃ 'නිර්හිමම්.' (හිමස්‍ය, හිමයාගේ; අභාවඃ, නොවීම; නිර්හිමම්, 'නිර්හිම' නම්වේ;) 'ශුභ'-දීප්තෞ, අකර්මකඃ ආත්මනෙපදී.

a. අනුරූපං කර්ම ප්‍රශස්‍යතෙනරාණාම්.
b. අනුජ්‍යෙෂ්ඨං ලොකෙපූජාප්‍රදීයතෙ.
c. ප්‍රතිදිනං සමතීව්‍යඃ සුගතඃ.
d. යථාශක්ති පරහිතං විදධීත.
e. සතෘණං දග්ධං වනං දවාග්නිනා.

---

a. නරාණාම්, මිනිසුන්ට; අනුරූපං, සුදුසුවූ; කර්මං, කර්මය තෙම; ප්‍රශස්‍යතෙ, පසස්නාලැබේ. ප්‍රශස්‍යතෙ-ක්‍රියා; කර්ම-උක්ත කර්ම; අනුරූපං-කර්මවිශෙෂණම්; නරාණාම්-අනුක්තසම්බන්ධඃ; අනුරූපං-අව්‍යයීභාවඃ; රූපස්‍යයොග්‍යං 'අනුරූපං' (රූපස්‍ය) රූපයට; යොග්‍යං, යොග්‍යවූයේ; අනුරූපං, 'අනුරූප'නම්.) 'ප්‍ර'පූර්‍වඃ 'ශංස'-කථනෙ,ස්තුතෞච, සකර්මකඃ පරස්මෛපදී.

b. අනුජ්‍යෙෂ්ඨම්, මහලු පිළිවෙළින්; ලොකෙ, ලොකයෙහි; පූජා, පූජාතොමෝ; ප්‍රදීයතෙ, දෙනුලැබේ. ප්‍රදීයතෙ-ක්‍රියා; පූජා-උක්තකර්ම; ලොකෙ-අනුක්තාධාරඃ; අනුජ්‍යෙෂ්ඨම්-ක්‍රියා විශෙෂණම්, අව්‍යයීභාවඃ; ජ්‍යෙෂ්ඨස්‍ය අනුපූර්‍වෙනෙත්‍යනු ජ්‍යෙෂ්ඨම්, (මහලුපිළිවෙළින් යන අර්‍ථයෙහි 'අනුජ්‍යෙෂ්ඨ' නම්.) 'ප්‍ර'පූර්‍වඃ 'දා'-දානෙ, සකර්මකඃ උභයපදී.

c. ප්‍රතිදිනං, දිනක්පාසා; සුගතඃ, සුගතතෙම; සමතීතව්‍යඃ, සිහිකටයුතුයි. සමතීතව්‍යඃ-කෘදන්තකර්මකාරකක්‍රියා; සුගතඃ-උක්තකර්ම; ප්‍රතිදිනං-අව්‍යයීභාවඃ; දිනෙදිනෙ 'ප්‍රතිදිනම්' (දවසෙහි දවසෙහි යන අර්‍ථයෙහි 'ප්‍රතිදිනං' යනුවේ.)

d. යථාශක්ති, ශක්තිපරිද්දෙන්; පරහිතං, පරාර්‍ථය; විදධීත, කරන්නේය-විදධීත-විධිලිඞ්ක්‍රියා; පරහිතං-අනුක්තකර්ම; යථාශක්ති-ක්‍රියාවිශෙෂණම්, අව්‍යයීභාවඃ; ශක්තිමනතික්‍රම්‍ය 'යථාශක්ති' (ශක්තියනොයික්මවා යන අර්‍ථයෙහි 'යථාශක්ති' යනුවේ;) පරෙෂාංහිතම් 'පරහිතම්'-ෂෂ්ඨීතත්පුරුෂඃ; 'වි' පූර්‍වඃ 'ධා'-ධාරණෙ, සකර්මකඃ උභයපදී.

e. දවාග්නිනා, ලැව්ගින්නවිසින්; සතෘණං, තණපතකුදු නොහැර; වනං, වනය; දග්ධං, දවනලදී. දග්ධං-කෘදන්තකර්ම කාරක ක්‍රියා; දවාග්නිනා-අනුක්තකර්තෘ; වනං-උක්තකර්ම; සතෘණං-කර්මවිශෙෂණෙ අව්‍යයීභාවඃ; තෘණමප්‍යපරිත්‍යජ්‍ය 'සතෘණං' (තණපතකුදු නොහැරයන අර්‍ථයෙහි 'සතෘණං' යනුවේ,) දවස්‍යාග්නිඃ 'දවාග්නිඃ' (වනයාගේ අග්නියතෙම 'දවාග්නි'නම් වේ;)-ෂෂ්ඨීතත්පුරුෂඃ.

**a.** ආමුක්ති ජනන මරණං ප්‍රවර්තතෙ ප්‍රජානාම්,
**b.** ආ ඥානොදයං ගුරුභක්ති රුචිතා.
**c.** අභ්‍යනලං ශලභාඃ පතන්ති.
**d.** සමක්ෂං කුපථචාරිණං සුතං කඃ සහතෙ
**e.** පරොක්ෂං ද්‍රොහමාචරති ඛලඃ.

---

a. ආමුක්ති, මුක්තිය දක්වා; ප්‍රජානාම්, සත්වයන්ගේ; ජනනමරණම්, උත්පත්ති මරණදෙක; ප්‍රවර්තතෙ, පවතී; ප්‍රවර්තතෙ-ක්‍රියා; ජනනමරණම්-උක්තකර්තෘ; ප්‍රජානාම්-අනුක්තසම්බන්ධඃ; ආමුක්ති-අව්‍යයීභාවඃ; මුක්තිමර්‍ය්‍යාදීකෘත්‍ය 'ආමුක්තිඃ' (මොක්ෂය මර්‍ය්‍යාදකොටගත අර්ථයෙහි 'ආමුක්ති' නම්.) ජනනංච මරණංච 'ජනනමරණම්'-සමාහාරද්වන්ද්වසමාසඃ, එකවචනාන්තඃ.

b. ආඥානොදයම්, නුවණවැඩිමදක්වා; ගුරුභක්තිඃ, ගුරුන් කෙරෙහි භක්තිය; උචිතා, සුදුසුයි; ස්‍යාත්-ක්‍රියා; ගුරුභක්තිඃ-උක්තකර්තෘ; ආඥානොදයං-අව්‍යයීභාවඃ, අභිව්‍යාප්‍යෙත්‍යා 'ඥානොදයං' (නුවණවැඩිම අභිව්‍යාපනයකොට හෙවත් ගතයුතු සීමාව කොට යන අර්ථයෙහි 'අඥානොදය' නම්.) ගුරෞභක්තිඃ 'ගුරුභක්තිඃ' (ගුරුහු කෙරෙහි භක්තිතොමෝ 'ගුරුභක්ති' නම්,) -සප්තමී තත්පුරුෂඃ.

c. ශලභාඃ,පළහැටියෝ; අභ්‍යනලං, ගිනිමතුයෙහි; පතන්ති, පතිත්; පතන්ති-ක්‍රියා; අභ්‍යනලං-අව්‍යයීභාවඃ; අනලං අභි 'අභ්‍යනලං,' (වහ්නියට මතුයෙහි 'අභ්‍යනල' නම්වේ.)

d. සමක්ෂං, ඉදිරියෙහි; කුපථචාරිණං, නොමගහැසිරෙන්නාවූ; සුතං, පුත්‍රයා; කඃ, කවරෙක්තෙම; සහතෙ, ක්ෂමාකෙරේද? හෙවත් ඉවසාද? සහතෙ-ක්‍රියා; කඃ-උක්තකර්තෘ; සුතං-අනුක්තකර්ම; කුපථචාරිණං-කර්මවිශෙෂණම්; සමක්ෂං-අව්‍යයීභාවඃ; අක්ෂ්ණඃයොග්‍යං 'සමක්ෂං' (ඇසට යොග්‍යවූයේ 'සමක්ෂ'නම්.) 'සහ'-ක්ෂමායාම්, සකර්මකඃ ආත්මනෙපදී.

e. ඛලඃ, දුර්ජනතෙම; පරොක්ෂං, අනභිමුඛයෙහි; ද්‍රොහම් ආචරති, ද්‍රොහකෙරෙයි. ආචරති-ක්‍රියා; ඛලඃ-උක්තකර්තෘ, ද්‍රොහම්-අනුක්තකර්ම; පරොක්ෂං-අව්‍යයීභාවඃ; අක්ෂ්ණඃ පරං 'පරොක්ෂං' (ඇසට අනභිමුඛවූයේ 'පරොක්ෂ' නම්.) 'ආ' පූර්වඃ 'චර'-ගතිභක්ෂණයොඃ, සකර්මකඃ පරස්මෛපදී.

# 2. ද්විතීයඃ පාඨඃ.

a. ද්විතීයා තත්පුරුෂ ප්‍රයොගාඃ.
b ධර්‍මශ්‍රිතොනාත්ම ග්ලානි මනුභවති.
c. දුඃඛාතීතඃ සුඛං භජතෙ.
d. දාරිද්‍ර්‍ය පතිතොනාදරං ලභතෙ.
e. ආපද්ගතොහෘදය මුපස්නෙහයති සුජනානාම්.

---

a. ද්විතීයා තත්පුරුෂ ප්‍රයොගාඃ, ද්විතීයා තත්පුරුෂ ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

b. ධර්‍මශ්‍රිතඃ, ධර්‍මය ඇසුරුකෙළේ; ආත්මග්ලානිං, ආත්ම දුඃඛය; න අනුභවති, නොවිඳී. අනුභවති–ක්‍රියා, ධර්‍මශ්‍රිතඃ-උක්ත කර්‍තෘ; ආත්මග්ලානිං– අනුක්ත කර්‍ම; ධර්‍මං ශ්‍රිතඃ, ‘ධර්‍මශ්‍රිතඃ’–ද්විතීයා තත්පුරුෂඃ;ආත්මනඃ ග්ලානිඃ ‘ආත්මග්ලානිඃ’–ෂෂ්ඨී තත්පුරුෂඃ (තමන්ගේ ගිලන්බව ‘ආත්මග්ලානි’ නම්);‘අනු’ පූර්‍වඃ ‘භූ’–සත්තායාම්, අකර්‍මකඃ පරස්මෛපදී.

c. දුඃඛාතීතඃ, දුක ඉක්මවූයේ; සුඛංභජතෙ, සැපසෙව්නේය, භජතෙ–ක්‍රියා; දුඃඛාතීතඃ–උක්තකර්‍තෘ; සුඛං–අනුක්තකර්‍ම; දුඃඛම් අතීතඃ ‘දුඃඛාතීතඃ’–ද්විතීයා තත්පුරුෂඃ, (දුක ඉක්මවූයේ ‘දුඃඛාතීත’ නම්), ‘භජ’–සෙවායාම්, සකර්‍මකඃ ආත්මනෙපදී.

d. දාරිද්‍ර්‍ය පතිතඃ, දිළිඳුබවට පැමිණියේ; ආදරං, ආදරය; නලභතෙ, නොලබයි; ලභතෙ–ක්‍රියා; දාරිද්‍ර්‍ය පතිතඃ–උක්තකර්‍තෘ; ආදරං–අනුක්තකර්‍ම;න–අව්‍යයම්; දාරිද්‍ර්‍යං පතිතඃ ‘දාරිද්‍ර්‍යපතිතඃ’–ද්විතීයා තත්පුරුෂඃ, (දිළිඳුබවට පැමිණියේ ‘දාරිද්‍ර්‍යපතිත’ නම්). ‘ලභ’–ප්‍රාප්තෞ, සකර්‍මකඃ ආත්මනෙපදී.

e. ආපද්ගතඃ, විපතට පැමිණියේ; සුජනානාම්, සත්පුරුෂයන්ගේ; හෘදයම්, ළය; උපස්නෙහයති, සිතිඳුකෙරෙයි. උපස්නෙහයති–ක්‍රියා; ආපද්ගතඃ–උක්තකර්‍තෘ; හෘදයං–අනුක්තකර්‍ම; සුජනානාම්–අනුක්ත සම්බන්ධඃ; ආපදංගතඃ ‘ආපද්ගතඃ’– ද්විතීයා තත්පුරුෂඃ; (ආපදාවට පැමිණියේ ‘ආපද්ගත’ නම්). අකාරාන්ත පුංලිඞ්ග ‘ආපද්ගත’ ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ග ‘හෘදය’ ශබ්දඃ; ශොභනශ්චාසෞජනශ්චෙති, ‘සුජනඃ’ (ශොභනවූයේත් මේ තෙමේයි ජනවූයේත් මේ තෙමේනුයි ‘සුජන’ නම්), ‘උප’ පූර්‍වඃ ‘ස්නිහ’– ප්‍රීතෞ, නිජන්තඃ, අකර්‍මකඃ පරස්මෛපදී.

**a. කෂ්ටප්‍රාප්තො බන්ධුජන මාශ්‍රයති.**
**b මරණාපන්නඃ කර්ම කර්මනිමිත්තං ගතිනිමිත්තං වාවලම්බතෙ.**
**c. අන්නබුභුක්ෂුඃ පයසා නතෘප්‍යති.**
**d. ඛට්වාරූඪො මූර්ඛඃ ස්පර්ධතෙ.**

---

a. කෂ්ටප්‍රාප්තඃ, දුකට පැමිණියේ; බන්ධුජනම්, බන්ධුජනයා; ආශ්‍රයති, ආශ්‍රය කෙරෙයි. ආශ්‍රයති–ක්‍රියා; කෂ්ටප්‍රාප්තඃ–උක්ත කර්තෘ; බන්ධුජනම්–අනුක්තකර්ම; කෂ්ටං ප්‍රාප්තඃ 'කෂ්ටප්‍රාප්තඃ' (දුකට පැමිණියේ 'කෂ්ටප්‍රාප්ත' නම්;)– ද්විතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'කෂ්ටප්‍රාප්ත' ශබ්දඃ; බන්ධුශ්චාසෞජන ශ්චෙති 'බන්ධුජනඃ'–(බන්ධුවූයේත් මේ තෙමේයි ජනවූයේත් මේ තෙමේනුයි 'බන්ධුජන' නම්); අකාරාන්ත පුංලිඞ්ගො 'ජන' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'ශ්‍රිඤ්'– සේවායාම්, සකර්මකඃ පරස්මෛපදී.

b. මරණාපන්නඃ, මරණයට ළංවූයේ; කර්ම, කර්මය හෝ; කර්ම නිමිත්තං, කර්මනිමිත්තය හෝ; ගතිනිමිත්තං වා, ගතිනිමිත්තය හෝ; අවලම්බතෙ, ඇසුරුකෙරේ. අවලම්බතෙ–ලට්ක්‍රියා; මරණාපන්නඃ–උක්තකර්තෘ; කර්ම–අනුක්තකර්ම; කර්මනිමිත්තං, ගතිනිමිත්තං යනුද–අනුක්ත කර්මයි; වා–විකල්පාර්ථේ අව්‍යයම්; මරණං ආපන්නඃ, 'මරණාපන්නඃ'–ද්විතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'මරණාපන්න' ශබ්දඃ; කර්මනඃ නිමිත්තං 'කර්මනිමිත්තං'–ෂෂ්ඨීතත්පුරුෂඃ; නකාරාන්ත පුංලිඞ්ගඃ 'කර්මන්' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගඃ 'කර්මනිමිත්ත' ශබ්දඃ; ගත්‍යාඃ නිමිත්තං 'ගතිනිමිත්තං'–ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'ගතිනිමිත්ත' ශබ්දඃ; 'අව' පූර්වඃ 'ලබි'– අවශ්‍රංසනෙ, සකර්මකඃ ආත්මනෙපදී.

c. අන්නබුභුක්ෂුඃ, ආහාර වලඳනු කැමැත්තේ; පයසා, කිරෙන්; නතෘප්‍යති, තෘප්ත නොවේ. තෘප්‍යති–ලට්ක්‍රියා; අන්නබුභුක්ෂුඃ–උක්තකර්තෘ; පයසා–අනුක්තකරණම්; අන්නං බුභුක්ෂුඃ, 'අන්නබුභුක්ෂුඃ'–ද්විතීයා තත්පුරුෂඃ; උකාරාන්තපුංලිඞ්ගො 'අන්නබුභුක්ෂු' ශබ්දඃ; සකාරාන්ත පුංලිඞ්ගඃ 'පයස්' ශබ්දඃ; 'තෘප්'–ප්‍රීණනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. ඛට්වාරූඪඃ, ඇඳට ආරූඪවූ; මූර්ඛඃ, මූර්ඛතෙම; ස්පර්ධතෙ, ස්පර්ධාකෙරෙයි; ස්පර්ධතෙ–ලට්ක්‍රියා; මූර්ඛඃ–උක්තකර්තෘ; ඛට්වාරූඪඃ–කර්තෘවිශෙෂණම්; ඛට්වාම් ආරූඪඃ 'ඛට්වාරූඪඃ'–ද්විතීයාතත්පුරුෂඃ; 'ස්පර්ධි'– සංඝර්ෂේ, අකර්මකඃ ආත්මනෙපදී.

a. මාසකාතඃ ශ්‍රමො ව්‍යර්ථො ජාතඃ.
b. මුහූර්ත සුඛමපි දුර්ලභං දෛවවිඩම්බිතානාම්.
c. ශ්‍රුතපූර්ව්‍යොයං කථාප්‍රසඞ්ගඃ.
d. භුක්තපූර්ව්‍යොයං ද්‍රාක්‍ෂාරසඃ.

## 3. තෘතීයඃ පාඨඃ.

e. තෘතීයා තත්පුරුෂ ප්‍රයොගාඃ.
f. රාජපාලිතඃ සුඛංජීවති.

---

a. මාසකෘතඃ, මස්ක් මුළුල්ලෙහි කරනලද; ශ්‍රමඃ, වෙහෙස; ව්‍යර්ථඃ ජාතඃ, නිෂ්ඵලවී, ජාතඃ–කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; ශ්‍රමඃ–උක්තප්‍රකෘති කර්තෘ; මාසකෘතඃ–නවිශෙෂණම්; ව්‍යර්ථඃ–උක්ත විකෘතිකර්තෘ; මාසං කෘතඃ 'මාසකෘතඃ'–විතීයා තත්පුරුෂඃ,(මසක් මුළුල්ලේ කරනලද්දේ 'මාසකෘත' නම්).

b. දෛවවිඩම්බිතානාම්, භාග්‍යයෙන් පිරිහුනවුන්ට; මුහූර්ත සුඛම් අපි, මොහොතක් සැපයකුදු; දුර්ලභම්, දුර්ලභවේ. ස්‍යාත්–ක්‍රියා; මුහූර්තසුඛම්–උක්තකර්තෘ; දුර්ලභම්–කර්තෘ විශෙෂණම්; දෛව විඩම්බිතානාම්–අනුක්ත. සම්බන්ධඃ; මුහූර්තං සුඛම් 'මුහූර්තසුඛම්'–විතීයා තත්පුරුෂඃ; දෛවෙන විඩම්බිතාඃ, 'දෛවවිඩම්බිතාඃ'–තෘතීයා තත්පුරුෂඃ; 'අස'–භූවි, අකර්මකඃ පරස්මෛපදී.

c. අයං කථාප්‍රසඞ්ගඃ, මේ කථා ප්‍රවෘත්තිය; ශ්‍රුතපූර්වඃ, පෙර අසනලද්දේවේ. ස්‍යාත්–ක්‍රියා; කථාප්‍රසඞ්ගඃ–උක්තකර්තෘ; අයං–නවිශෙෂණම්; ශ්‍රුතපූර්වඃ-කර්තෘවිශෙෂණම්; පූර්වම් ශ්‍රුතඃ, 'ශ්‍රුත පූර්වඃ'–විතීයා තත්පුරුෂඃ; කථායාඃ ප්‍රසඞ්ගඃ 'කථාප්‍රසඞ්ගඃ'–ෂෂ්ඨී තත්පුරුෂඃ;.'අස'– භූවි, අකර්මකඃ පරස්මෛපදී.

d. අයං ද්‍රාක්‍ෂාරසඃ, මේ මිදිරසය, භුක්තපූර්වඃ, පෙරවළඳන ලද්දේය; ස්‍යාත්–ක්‍රියා; ද්‍රාක්‍ෂාරසඃ–උක්තකර්තෘ; අයං–කර්තෘ විශෙෂණම්; භුක්තපූර්වඃ–කර්තෘවිශෙෂණම්; පූර්වං භුක්තඃ, 'භුක්තපූර්වඃ'–විතීයා තත්පුරුෂඃ; ද්‍රාක්‍ෂායාඃ රසඃ 'ද්‍රාක්‍ෂාරසඃ'– ෂෂ්ඨීතත් පුරුෂඃ.

e. තෘතීයා තත්පුරුෂ ප්‍රයොගාඃ, තෘතීයා තත්පුරුෂ ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

f. රාජපාලිතඃ, රජහු විසින් රක්නා ලද්දේ; සුඛං, සැපසේ; ජීවති, ජීවත්වේ. ජීවති–ක්‍රියා; රාජපාලිතඃ-උක්තකර්තෘ; රාජපාලි

a. **පිතෘරක්ෂිතො නාපදමව ගච්ජති.**
b. **වාතාහතස්තරුඃ කම්පතෙ.**
c. **පරශුච්ජින්නඃ සහකාරො දෘශ්‍යතෙ.**
d. **අග්නිදග්ධංගෘහංවර්තතෙ.**
e. **මාසපූජෝ'යං චූතොමාධවී ලතායාඃ**

---

තඃ, 'රාජපාලිතඃ'–තෘතියා තත්පුරුෂඃ; (රජහු විසින් රක්නා ලද්දේ 'රාජපාලිත' නම්). 'ජීව'–ප්‍රාණ ධාරණෙ, අකර්මකඃ පර සෛමපදි.

a. පිතෘරක්ෂිතඃ, පියහු විසින් රක්නාලද්දේ; ආපදම්, විපත්තිය; න අවගච්ජති, නොදනී. අවගච්ජති–ක්‍රියා; පිතෘරක්ෂිතඃ–උක්තකර්තෘ;ආපදම්–අනුක්තකර්ම; පිත්‍රාරක්ෂිතඃ 'පිතෘරක්ෂිතඃ' –තෘතියා තත්පුරුෂඃ; (පියා විසින් රක්නාලද්දේ 'පිතෘරක්ෂිත' නම්) 'අව' පූර්වඃ 'ගමෛ'–ගතෞ, සකර්මකඃ පරසෛමපදී.

b. වාතාහතඃ, සුළඟින් පහරණලද; තරුඃ, වෘක්ෂයතෙම; කම්පතෙ, සැලෙයි. කම්පතෙ–ලට්ක්‍රියා; තරුඃ–උක්තකර්තෘ; වාතාහතඃ–කර්තෘ විශෙෂණම්; වාතෙන ආහතඃ, 'වාතාහතඃ'–තෘතීයා තත්පුරුෂඃ; (වාතයෙන් පහරණලද්දේ 'වාතාහත' නම්) අකාරාන්ත පුංලිඞ්ගා 'වාතාහත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'තරු' ශබ්දඃ, 'කපි'–කිඤ්චිච්චලනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

c. පරශුච්ජින්නඃ, පොරවෙන් සිඳිනලද; සහකාරඃ, මීඅඹ ගස; දෘශ්‍යතෙ, දක්නාලැබේ. දෘශ්‍යතෙ–කර්මකාරකක්‍රියා; සහකාරඃ–උක්තකර්ම; පරශුච්ජින්නං–කර්මවිශෙෂණම්; පරශුනාඡින්නඃ 'පරශුච්ජින්නඃ'–තෘතීයා තත්පුරුෂඃ; (පොරවෙන් සිඳිනාලද්දේ 'පරශුච්ජින්න' නම්); 'දෘශිර්'–ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ ආත්මනෙපදී.

d. අග්නිදග්ධං, ගින්නෙන් දවනලද; ගෘහං, ගෙය; වර්තතෙ පවතී. වර්තතෙ–ක්‍රියා; ගෘහං-උක්තකර්තෘ; අග්නිදග්ධං–කර්තෘ විශෙෂණම්; අග්නිනාදග්ධං 'අග්නිදග්ධං'–තෘතීයා තත්පුරුෂඃ; (ගින්නෙන් දවනලද්දේ 'අග්නිදග්ධ' නම්) 'වෘතු'–වර්තනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

e. අයංචූතඃ, මේ මීඅඹගස; මාධවීලතායාඃ, යොහොඹු ලියට වඩා; මාසපූජඃ, මසකින් පූජිවේ. ස්‍යාත්–ක්‍රියා; චූතඃ–උක්තකර්තෘ; මාසපූජඃ–කර්තෘ විශෙෂණම්; මාධවීලතායාඃ-අනුක්තාපාදානම්; මාසෙනපූජඃ, 'මාසපූජඃ'–තෘතීයා තත්පුරුෂඃ;(මසකින් පූජිවූයේ 'මාසපූජ' නම්); මාධවිචා සෞලතාචෙති, 'මාධවීලතා'–කර්මධාරයඃ; 'අස'– භුවි, අකර්මකඃ පරසෛමපදී.

a. මාතෘසදෘශො ගුරුර්නාස්ති.
b. පිතෘ සමො බන්ධුර් න විද්‍යතෙ.
c. ඥානහීනො න ජානාති හිතාහිතම්.
d. එකොනං ශතං බ්‍රාහ්මණා නාමාහූතම්.
e. ආචාරනිපුණො ලොකෙ ප්‍රශස්‍යතෙ.

---

a. මාතෘසදෘශඃ, මව හා සමානවූ; ගුරුඃ, ආචාර්‍ය්‍යයෙක්; නාස්ති, නැති; අස්ති–ක්‍රියා; අර්ථ නාස්ති–අව්‍යයම්; ගුරුඃ–උක්ත කර්තෘ; මාතෘසදෘශඃ–කර්තෘවිශෙෂණම්; මාත්‍රාසදෘශඃ 'මාතෘසදෘශඃ'–තෘතීයා තත්පුරුෂඃ; (මවුසමානවූයේ 'මාතෘසදෘශ'නම්), 'අස'–භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. පිතෘසමඃ, පියා හා සමානවූ; බන්ධුඃ, නෑයෙක්; නවිද්‍යතෙ, නොවේ. විද්‍යතෙ–ලට්ක්‍රියා; බන්ධුඃ–උක්තකර්තෘ; පිතෘසමඃ–කර්තෘවිශෙෂණම්; න–අව්‍යයම්; පිත්‍රාසමඃ 'පිතෘසමඃ'–තෘතීයා තත්පුරුෂඃ; (පියා හා සමානවූයේ 'පිතෘසම'නම්.) 'විද'–සත්තායාම්, අකර්මකඃ ආත්මනෙපදී.

c. ඥානහීනඃ, නුවණින් තොරවූයේ; හිතාහිතම්, හිතඅහිත දෙක; නජානාති, නොදනී. ජානාති–ක්‍රියා; ඥානහීනඃ–උක්තකර්තෘ, හිතාහිතම්–අනුක්තකර්ම; ඥානෙනහීනඃ, 'ඥානහීනඃ'–තෘතීයා තත් පුරුෂඃ; (ඥානයෙන් හීනවූයේ 'ඥානහීන'නම්) 'ඥා'–අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. බ්‍රාහ්මණානාම්, බමුණන් සම්බන්ධිවූ; එකොනශතං, එකුන් සියයක්; ආහූතම්, කැඳවනලදී. ආහුතම්–කෘදන්තකර්මකාරක ක්‍රියා; ශතම්–උක්තකර්ම; එකොනං–කර්මවිශෙෂණම්; බ්‍රාහ්මණා නාම්–අනුක්තසම්බන්ධඃ; එකෙන ඌනං 'එකොනං'–තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'එකොන' ශබ්දඃ; අකා රාන්ත පුංලිඞ්ගා 'බ්‍රාහ්මණ' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'හෙව ඤ්'–පාහවානෙ, ශබ්දෙ, සකර්මකඃ උභයපදී. 'ආ' පූර්වතෝ,අකර්මකඃ ආත්මනෙ පදී.

e. ආචාරනිපුණඃ, ආචාරයෙහි දක්ෂතානැත්තේ; ලොකෙ, ලොකයෙහි; ප්‍රශස්‍යතෙ, පසස්නාලැබේ. ප්‍රශස්‍යතෙ–ලට්කර්ම කාරකක්‍රියා; ආචාරනිපුණඃ– උක්තකර්ම; ලොකෙ–අනුක්තාධාරඃ; ආචාරෙන නිපුණඃ 'ආචාරනිපුණඃ'–තෘතීයා තත්පුරුෂඃ;(ආචාර යෙන් නිපුණවූයේ 'ආචාරනිපුණ'නම්) 'ප්‍ර' පූර්වඃ 'සංස'–කථනෙ, ස්තුතෞච, සකර්මකඃ පරස්මෛපදී.

a. **වාතවේගද්‍රුතාත් තෘණාදපි යාචකො ලඝුතරඃ.**
b. **වාක්කලහො දෞර්බල්‍යලක්ෂණම්.**
c. **ඝෘතෞදනං මිෂ්ටමශ්නාති ධනවාන්.**
d. **ගුඩාන්නං භක්ෂයති ග්‍රාම්‍යජනඃ**

---

a. වාතවේගද්‍රුතාත්, සුළඟින් සින්දගැකිවූ; තෘණාත්අපි, තණපතට ද වඩා; යාචකඃ, යාචකතෙම; ලඝුතරඃ, ඉතාසැහැල්ලු වේ; ස්‍යාත්-ක්‍රියා; යාචකඃ-උක්තකර්තෘ; ලඝුතරඃ- කර්තෘවිශෙෂණම්; තෘණාත්-අපාදානම්; වාතවේගද්‍රුතාත්-අපාදාන විශෙෂණම්; අපි-අව්‍යයම්; වාතවේගෙන ද්‍රුතං 'වාතවේගද්‍රුතං'-තෘතීයාතත්පුරුෂඃ, අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'වාතවේගද්‍රුත' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'තෘණ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'යාචක' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගො 'ලඝුතර' ශබ්දඃ; අයමනයො රතිශයෙන ලඝුඃ,'ලඝුතරඃ' (මේතෙම මොවුන් දෙදෙනා අතුරෙන් අතිශයින් සැහැල්ලුනුයි 'ලඝුතර' නම්)

b වාක්කලහඃ,වචනයෙන්වන ඩබරයතෙම;දෞර්බල්‍යලක්ෂණම්, දුබලබැව්හි ලක්ෂණයක්වේ. ස්‍යාත්-ක්‍රියා; වාක්කලහඃ-උක්තකර්තෘ; දෞර්බල්‍යලක්ෂණම්-කර්තෘ විශෙෂණම්; වාචාකලහඃ 'වාක්කලහඃ'-තෘතීයා තත්පුරුෂඃ, (වචසින්වූ ඩබරයතෙම 'වාක්කලහ' නම්); දෞර්බල්‍යස්‍ය ලක්ෂණම් 'දෞර්බල්‍ය ලක්ෂණම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ; (දුබලභාවයාගේ ලක්ෂණයතෙම 'දෞර්බල්‍ය ලක්ෂණ' නම්) අකාරාන්තපුංලිඞ්ගො 'වාක්කලහ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දෞර්බල්‍ය ලක්ෂණ' ශබ්දඃ.

c. ධනවාන්, ධනවත්තෙම; මිෂ්ටම්, මධුරවූ; ගුඩාන්නං, ගිතෙලින් හැනුබත; අශ්නාති, වළඳයි. අශ්නාති-ලට්ක්‍රියා; ධනවාන්-උක්තකර්තෘ; ඝෘතෞදනං-අනුක්තකර්ම; මිෂ්ටම්-කර්මවිශෙෂණම්; ඝෘතෙන උපසික්තං ඔදනං 'ඝෘතෞදනං'-තෘතීයා තත් පුරුෂඃ; 'අස'-භොජනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. ග්‍රාම්‍යජනඃ, ගම්වැසිජනතෙම; ගුඩාන්නං, උක්සකුරෙන් මුසුබත; භක්ෂයති-වලඳයි. භක්ෂයති-ක්‍රියා; ග්‍රාම්‍යජනඃ-උක්ත කර්තෘ; ගුඩාන්නං-අනුක්තකර්ම; ගුඩෙන අන්නං 'ගුඩාන්නං'-තෘතීයා තත්පුරුෂඃ, ග්‍රාම්‍යශ්චාසෞජනශ්චෙති 'ග්‍රාම්‍යජනඃ'-කර්මධාරයඃ, (ග්‍රාම්‍යවූයේත් මේ තෙමේනුයි 'ග්‍රාම්‍යජන' නම්.) 'භක්ෂ'-භක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

# 4. චතුර්ථඃ පාඨඃ

---

**a.** **චතුර්ථී තත්පුරුෂප්‍රයෝගාඃ.**
**b.** **කඞ්කණ සුවර්ණං ක්‍රීණාති සුවර්ණකාරඃ.**
**c.** **ඝටමෘත්තිකාං ඛනති කුම්භකාරඃ.**
**d.** **ශකටදාරු ඡිනත්ති තක්ෂා.**
**e.** **පුත්‍රාර්ථං දුග්ධමාහරති ගෘහී.**

---

a. චතුර්ථී තත්පුරුෂ ප්‍රයෝගාඃ, චතුර්ථී තත්පුරුෂප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

b. සුවර්ණකාරඃ, රන්කරුතෙම; කඞ්කණසුවර්ණං, වළලු පිණිස රන්; ක්‍රීණාති, මිලදීගනී. ක්‍රීණාති-ක්‍රියා; සුවර්ණකාරඃ-උක්තකර්තෘ; කඞ්කණ සුවර්ණං-අනුක්තකර්ම; කඞ්කණාය සුවර්ණං 'කඞ්කණසුවර්ණං'-චතුර්ථී තත්පුරුෂඃ; (වළලුපිණිසරන් 'කඞ්කණ සුවර්ණ' නම්) 'ඩුක්‍රීඤ්'-ද්‍රව්‍යවිනිමයෙ, සකර්මකඃ උභයපදී.

c. කුම්භකාරඃ, කුඹල්තෙම; ඝටමෘත්තිකාං, කළපිණිසමැටි; ඛනති, කනී; ඛනති-ක්‍රියා; කුම්භකාරඃ-උක්තකර්තෘ; ඝටමෘත්තිකාං-අනුක්තකර්ම; ඝටාය මෘත්තිකා 'ඝටමෘත්තිකා'-චතුර්ථීතත්පුරුෂඃ, (කළපිණිස මැටි 'ඝටමෘත්තිකා' නම්;) ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ඝටමෘත්තිකා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කුම්භකාර' ශබ්දඃ; 'ඛනු'-අවදාරණෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. තක්ෂා, වඩුතෙම; ශකටදාරු, ගැල්පිණිසදඬු; ඡිනත්ති, සිඳී; ඡිනත්ති-ලට්ක්‍රියා; තක්ෂා-උක්තකර්තෘ; ශකටදාරු-අනුක්ත කර්ම; ශකටාය දාරු 'ශකටදාරු'-චතුර්ථී තත්පුරුෂඃ; (ගැල්පිණිස දඬු 'ශකටදාරු' නම්);උකාරාන්තක්ලීවලිඞ්ගා 'ශකටදාරු' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'තක්ෂන්' ශබ්දඃ; 'ඡිදිර්'-ද්වෛධීකරණෙ, සකර්මකඃ පරස්මෛපදී.

e. ගෘහී, ගෙහිවැසි පුරුෂතෙම; පුත්‍රාර්ථම්, දරුවන් පිණිස; දුග්ධං, කිරි; ආහරති, ගෙනඑයි. ආහරති-ලට්ක්‍රියා; ගෘහී-උක්ත කර්තෘ; දුග්ධං-අනුක්තකර්ම; පුත්‍රාර්ථම්-කර්මවිශෙෂණම්; පුත්‍රාය ඉදම් 'පුත්‍රාර්ථම්'-චතුර්ථී තත්පුරුෂඃ; (පුත්‍රයා පිණිස මේ 'පුත්‍රාර්ථ' නම්.) අකාරාන්තක්ලීව ලිඞ්ගා 'දුග්ධ' ශබ්දඃ; නකාරාන්ත පුං ලිඞ්ගා 'ගෘහින්' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, සකර්මකඃ උභය පදී.

a. බ්‍රාහමණාර්‍ථා දක්ෂිණාදියතෙ.
b. රක්ෂාර්ථං ප්‍රජනාං කරමාදදතිරාජ.
c. භූතබලිර්දීයතෙ ගෘහිණ්‍යා.
d. පරහිතං වචනං ප්‍රයුඤ්ජිත.
e. බන්ධුසුඛං කායකිං කරෙනි බන්ධුප්‍රියඃ.

---

a. බ්‍රාහමණාර්‍ථා,බමුණන් පිණිස;දක්ෂිණා,දක්ෂිණා තොමෝ; දීයතෙ, දෙනුලැබේ. දීයතෙ–ක්‍රියා; දක්ෂිණා–උක්තකර්ම; බ්‍රාහමණාර්‍ථා–කර්මවිශෙෂණම්; බ්‍රාහමණාය ඉයම් 'බ්‍රාහමණාර්‍ථා'–චතුර්ථි තත්පුරුෂඃ; (බ්‍රාහමණයා පිණිස මෝතොමෝ 'බ්‍රාහමණාර්ථ'නම්) ආකාරාන්ත ස්ත්‍රිලිඞ්ගා 'බ්‍රාහමණාර්ථා' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රිලිඞ්ගා 'දක්ෂිණා' ශබ්දඃ; 'දා'–දානෙ, සකර්මකඃ උභයපදී.

b. රාජා, රජතෙම; ප්‍රජානාම්, ජනයන්ගේ; රක්ෂාර්ථං, රැකීම පිණිස; කරම්, සුංකම්; ආදදාති, ගනී; ආදදාති–ලට්ක්‍රියා; රාජා–උක්තකර්තෘ; කරම්–අනුක්තකර්ම; රක්ෂාර්ථම්–කර්මවිශෙෂණම්; ප්‍රජානාම්–අනුක්ත සම්බන්ධඃ; රක්ෂායෛ අයම් 'රක්ෂාර්ථම්'–චතුර්ථි තත්පුරුෂඃ, (රැකීමපිණිස මේ 'රක්ෂාර්ථ' නම්;) අකාරාන්ත පුංලිඞ්ගා 'රක්ෂාර්ථ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රිලිඞ්ගා 'ප්‍රජා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කර' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'රාජන්' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'දා'–දානෙ, සකර්මකඃ උභයපදී.

c. ගෘහිණ්‍යා, ගෙහිමියා විසින්; භූතබලිඃ, භූතබලිතෙමේ; දීයතෙ, දෙනුලැබේ. දීයතෙ–ලට්ක්‍රියා; භූතබලිඃ–උක්තකර්ම; ගෘහිණ්‍යා–අනුක්තකර්තෘ; භූතෙභ්‍යෝබලිඃ 'භූතබලිඃ'–චතුර්ථි තත්පුරුෂඃ; (භූතයන් පිණිස බලි 'භූතබලි' නම්); ඉකාරාන්ත පුංලිඞ්ගා 'භූතබලි' ශබ්දඃ.

d. පරහිතං, අනුන්ට හිතවූ; වචනං, වචනය; ප්‍රයුඤ්ජීත, යොදන්නේය. ප්‍රයුඤ්ජීත–විධිලිඞ්ක්‍රියා; වචනං–අනුක්තකර්ම; පරහිතම්–කර්මවිශෙෂණම්; පරස්මෛහිතං 'පරහිතං'–චතුර්ථි තත්පුරුෂඃ, අකාරාන්තක්ලීවලිඞ්ගඃ,'පරහිත' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වචන' ශබ්දඃ; ප්‍රයුඤ්ජීත, ප්‍රයුඤ්ජියාතාම්, ප්‍රයුඤ්ජිරන්; 'ප්‍ර' පූර්වං 'යුජිර්'–යොගෙ, සකර්මකඃ උභයපදී. 'ප්‍ර' පූර්වත්වෙ, ආත්මනෙපදී.

e. බන්ධුප්‍රියඃ,නෑයන්ට ප්‍රියනෑනත්තේ;බන්ධුසුඛං,නෑයන්ට සැපවූ; කායකිං, කායිකය; කරෙනි; කෙරෙයි. කරෙනි–ලට්ක්‍රියා බන්ධුප්‍රියඃ–උක්තකර්තෘ; කායකිං–අනුක්තකර්ම; බන්ධුසුඛම්–කර්මවිශෙ

a. ගොරක්‍ඛිතං තෘණරාශිං දදහ වග්නිඃ.

## 5. පඤ්චමඃ පාඨඃ.

b. පඤ්චමීතත්පුරුෂ ප්‍රයොගාඃ.
c. චෞරභයං නවිද්‍යතෙ රාජන්වති දෙශෙ.
d. ව්‍යාඝ්‍රභීතා ගෞඃපලායතෙ.

---

ණම්; බන්‍ධුභ්‍යඃ සුඛං 'බන්‍ධුසුඛම්'–චතුර්ථී තත්පුරුෂඃ; (නෑයන්ට සැපවූ 'බන්‍ධුසුඛ' නමි.) බන්‍ධූනාම් ප්‍රියඃ 'බන්‍ධුප්‍රියඃ'–ෂෂ්ඨීතත්පුරුෂඃ. අකාරාන්තක්ලීව ලිඞ්ගා 'බන්‍ධු සුඛ' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'කායථී' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'බන්‍ධුප්‍රිය' ශබ්දඃ; 'ඩුකෘඤ්'–කරණෙ, සකර්‍මකඃ උභයපදී;

a. වග්නිඃ, වග්නිතෙම; ගොරක්‍ෂිතං, ගෙරින් පිණිස රක් නාලද; තෘණරාශිං, තණරැස;දදහ, දැවී; දදහ–ලිට්ක්‍රියා; වග්නිඃ–උක්තකර්‍තා; තෘණරාශිං–අනුක්තකර්‍ම; ගොරක්‍ෂිතං–කර්‍මවිශෙෂණම්; ගොභ්‍යඃරක්‍ෂිතඃ 'ගොරක්‍ෂිතඃ'–චතුර්ථීතත්පුරුෂඃ; තෘණානාම් රාශිඃ 'තෘණරාශිඃ'–ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ගොරක්‍ෂිත' ශබ්දඃ; ඉකාරාන්තපුංලිඞ්ගා 'තෘණරාශි' ශබ්දඃ; ඉකාරාන්ත පුංලිඞ්ගා 'වග්නි' ශබ්දඃ; දදහ, දෙහතුඃ, දහුඃ; 'දහ'–භස්මීකරණෙ, සකර්‍මකඃ පරස්මෛපදී.

b. පඤ්චමී තත්පුරුෂ ප්‍රයොගාඃ, පඤ්චමී තත්පුරුෂ ප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

c රාජන්වති, රජකු ඇති; දෙශෙ, දෙශයෙහි; චෞරභයං, සොරබිය; නවිද්‍යතෙ, නොවේ; විද්‍යතෙ–ක්‍රියා; චෞරභයං–උක්තකර්‍තා; න–අව්‍යයම්; දෙශෙ–අනුක්තාධාරඃ; රාජන්වති–ආධාර විශෙෂණම්; චෞරාත්භයං 'චෞරභයං'–පඤ්චමී තත්පුරුෂඃ; (සොරුන් ගෙන් බිය'චෞරබිය'නම්;) ප්‍රශස්තොරාජා අස්‍යාස්තීති 'රාජන්වාන්'–තද්ධිත වතුප්‍රත්‍යයඃ; (යහපත් රජෙක් මෝහට ඇත් නුයි 'රාජන්වත්' නම්;) අකාරාන්තක්ලීව ලිඞ්ගා 'චෞරභය'ශබ්දඃ තකාරාන්ත පුංලිඞ්ගා 'රාජන්වත්' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'දෙශ' ශබ්දඃ, 'විද'–සත්තායාම්, දිවාදි අකර්‍මක ආත්මනෙපදී.

d. ව්‍යාඝ්‍රභීතා, ව්‍යාඝ්‍රයා කෙරෙන් භයවූ; ගෞඃ, දෙන් නොමෝ; පලායතෙ, පලාශේ; පලායතෙ–ලට්ක්‍රියා; ගෞඃ–උක්ත කර්‍තා, ව්‍යාඝ්‍රභීතා කර්‍තෘවිශෙෂණම්; ව්‍යාඝ්‍රාත්භීතා 'ව්‍යාඝ්‍රභීතා'–

a. සුඛාපෙතොජනඃ ස්වල්පමපි දුඃඛං බහුතරං මන්‍යතෙ
b. ධර්මභ්‍රෂ්ටොන සුඛං ලභතෙ.
c. ආරෝග්‍යච්‍යුතාඃ සතතංක්ලෙශ මනුභවන්ති.
d. ස්වර්ගපතිතොපි ත්‍රිශඞ්කුර්මුනිතෙජසානභූමිංපස්පර්ශ.

---

පඤ්චමී තත්පුරුෂඃ, (ව්‍යාඝ්‍රයා කෙරෙන් භයවූවා 'ව්‍යාඝ්‍රභීතා' නම්;) ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගවූ 'ව්‍යාඝ්‍රභීතා' ශබ්දඃ; ඕකාරාන්ත ස්ත්‍රීලිඞ්ගවූ 'ගො' ශබ්දඃ; 'පරා'-පූර්වඃ 'අය'-ගතෞ, භ්වාදිසකර්මකඃ ආත්මනෙපදී 'පරා' පූර්වවූ අකර්මකඃ ආත්මනෙපදී.

a. සුඛාපෙතඃ, සැපයෙන් පහවූ; ජනඃ, ජනතෙම; ස්වල්පං දුඃඛං අපි, ස්වල්පවූ දුකද; බහුතරං, ඉතා බොහෝකොට; මන්‍යතෙ, සිතයි; මන්‍යතෙ-ලවික්‍රියා; ජනඃ-උක්තකර්තෘ; සුඛාපෙතඃ-කර්තෘවිශෙෂණයි; දුඃඛං-අනුක්තකර්ම; ස්වල්පම්-කර්මවිශෙෂණයි; අපි-අව්‍යයයි; බහුතරං විකෘතිකර්ම; සුඛාත් අපෙතඃ 'සුඛාපෙතඃ' පඤ්චමීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගවූ 'සුඛාපෙත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගවූ 'ජන' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගවූ 'ස්වල්ප' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගවූ 'දුඃඛ' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගවූ 'බහුතර' ශබ්දඃ; 'මන'-ඥානෙ, දිවාදිසකර්මකඃ ආත්මනෙපදී.

b. ධර්මභ්‍රෂ්ටඃ, ධර්මයෙන් පිරිහුණු තැනැත්තේ; සුඛං, සැපය නලභතෙ, නොලබයි; ලභතෙ-ලවික්‍රියා; ධර්මභ්‍රෂ්ටඃ-උක්තකර්තෘ; සුඛං-අනුක්තකර්ම; න-අව්‍යයයි; ධර්මාත්භ්‍රෂ්ටඃ 'ධර්මභ්‍රෂ්ටඃ'-පංචමී තත්පුරුෂඃ; ධර්මයෙන් පිරිහුණේ 'ධර්මභ්‍රෂ්ට' නම්) අකාරාන්ත පුංලිඞ්ගවූ 'ධර්මභ්‍රෂ්ට' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගවූ 'සුඛ' ශබ්දඃ 'ලභ' ප්‍රාප්තෞ, භ්වාදි සකර්මක ආත්මනෙපදී.

c. ආරෝග්‍යච්‍යුතාඃ, ආරෝග්‍යයෙන් පිරිහුණු තැනැත්තෝ; සෙවත් පහවූ තැනැත්තෝ; සතතං, නිරන්තරයෙන්; ක්ලෙශම්, දුක අනුභවන්ති, අනුභව කෙරෙති. අනුභවන්ති-ලවික්‍රියා; ආරෝග්‍යච්‍යුතාඃ-උක්තකර්තෘ; ක්ලෙශම්-අනුක්තකර්ම; සතතං-ක්‍රියාවිශෙෂණයි; ආරෝග්‍යාත්ච්‍යුතාඃ 'ආරෝග්‍යච්‍යුතාඃ'-පඤ්චමී තත්පුරුෂඃ; (ආරෝග්‍යයෙන් පිරිහුණේ 'ආරෝග්‍යච්‍යුත' නම්;) අකාරාන්ත පුංලිඞ්ගවූ ආරෝග්‍යච්‍යුත' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගවූ 'සතත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගවූ 'ක්ලෙශ' ශබ්දඃ; 'අනු' පූර්වඃ 'භූ' සත්තායාම් අකර්මකඃ පරස්මෛපදී; 'අනු' පූර්වවූ සකර්මකඃ.

d. ත්‍රිශඞ්කුඃ, ත්‍රිශඞ්කුරජතෙම; ස්වර්ගපතිතඃ අපි, ස්වර්ගයෙන් පිරිහුණේ නමුදු; මුනිතෙජසා, මුනිහුගේ තෙජසින්; භූමිං භූමිය; නපස්පර්ශ, වැළඳනොගත්තේය. පස්පර්ශ-ලවික්‍රියා; ත්‍රිශඞ්කුඃ-

**a. දූරාදගතඃ පථිකස්තරුච්ඡායායාං ශෙතෙ.**
**b. අල්පාද්විමුක්ත ආසීත් සනිමජ්ජනාත්.**

---

## 6. ෂෂ්ඨඃ පාඨඃ.

---

**c. ෂෂ්ඨී තත්පුරුෂ ප්‍රයොගාඃ.**
**d. රාජපදං දුඃඛලභ්‍යං ඛෙදකරංච.**

---

උක්තකර්තෘ; ස්වර්ගපතිතඃ-කර්තෘවිශෙෂණම්; මුනිතෙජසා-අනුක්ත කරණම්; භූමිඃ-අනුක්තකර්ම; න-අව්‍යයම්; අපි-අව්‍යයම්; ස්වර්ගාත් පතිතඃ 'ස්වර්ගපතිතඃ'-පංචමී තත්පුරුෂඃ; මුනෙඃ තෙජඃ 'මුනිතෙජඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ස්වර්ගපතිතශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගඃ 'ත්‍රිශඞ්කු' ශබ්දඃ; සකාරාන්තක්ලීවලිඞ්ගො 'මුනිතෙජස්' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'භූමි' ශබ්දඃ; 'ස්පෘශ'ශ-ස්පර්ශේ, තුදාදි සකර්මකඃ පරස්මෛපදී.

a. දූරාත් ආගතඃ, දුරසිට ආවාවූ; පථිකඃ, මඟීතෙම; තරුච්ඡායායාං, රුක්සෙවණෙහි; ශෙතෙ, හොවී. ශෙතෙ-ලට්ක්‍රියා; පථිකඃ-උක්තකර්තෘ; දූරාදගතඃ-කර්තෘ විශෙෂණම්; තරුච්ඡායායාං අනුක්තාධාරඃ; දූරාත් ආගතඃ දූරාදගතඃ, පංචමී තත්පුරුෂඃ, අකාරාන්ත පුංලිඞ්ගො 'දූරාදගත' ශබ්දඃ, තරොඃ ඡායා 'තරුච්ඡායා'-ෂෂ්ඨීතත්පුරුෂඃ, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'තරුච්ඡායා' ශබ්දඃ අකාරාන්ත පුංලිඞ්ගඃ 'පථික' ශබ්දඃ; ශෙතෙ. ශයාතෙ, ශෙරතෙ; 'ශීඞ්' ස්වප්නෙ, අදාදි අකර්මක ආත්මනෙපදී.

b. සඃ, හෙතෙම; අල්පාත්, මදකින්; නිමජ්ජනාත්, ගැලීමෙන්; විමුක්තඃ ආසීත්, මිදුණේවී. ආසීත්-ලඞ්ක්‍රියා; සඃ-උක්ත කර්තෘ; අල්පාද්විමුක්තඃ-කර්තෘවිශෙෂණම්; නිමජ්ජනාත්-අනුක්තා පාදානම්; අල්පාත් විමුක්තඃ 'අල්පාද්විමුක්තඃ' අලුක් පඤ්චමී තත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'අල්පාද්විමුක්ත' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'නිමජ්ජන' ශබ්දඃ 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී

c. ෂෂ්ඨී තත්පුරුෂ ප්‍රයොගාඃ, ෂෂ්ඨීතත්පුරුෂ ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

d. රාජපදං, රාජපදවිය; දුඃඛලභ්‍යං, දුකසේ ලැබියයුතුවේ; ඛෙදකරංච, දුක්කරන්නේදවේ; ස්‍යාත්, ලිඞ්ක්‍රියා, රාජපදං-උක්තකර්තෘ; දුඃඛලභ්‍යං-කර්තෘවිශෙෂණම්; ඛෙදකරං-කර්තෘ විශෙ

a. දෙවගෘහමනති ක්‍රමණීයං.
b. ගුරුදරා මාතෘ තුල්‍යාඃ.
c. දෙව පූජකඃ සම්මානාහීඃ.
d. ශුද්‍රයාජකඃ සර්වත්‍ර නාදරණීයඃ.

---

ෂණම්; ච–අව්‍යයම්, රාඥඃපදං රාජපදං, ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'රාජපද' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'දුඃඛලභ්‍ය' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'ඛෙදකර' ශබ්දඃ; දුඃඛෙනලභ්‍යං 'දුඃඛලභ්‍යං'–තෘතීයා තත්පුරුෂඃ; ඛෙදං කරොතීති ඛෙදකරඃ උපපද සමාසඃ; 'අස'–භුවි' අකර්මකඃ පරස්මෛපදී.

a. දෙවගෘහම්, දෙවාලයතෙම; අනතික්‍රමණීයම්, නොඉක්ම වියයුතුයි. ස්‍යාත්–විධිලිඞ්ක්‍රියා; දෙවගෘහං උක්තකර්තෘ; දෙවස්‍ය ගෘහම් 'දෙවගෘහම්'–ෂෂ්ඨීතත්පුරුෂඃ; න අති ක්‍රමණීයම් 'අනති ක්‍රමණීයම්'–නඤ් තත්පුරුෂඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'දෙව ගෘහ' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ග 'අනති ක්‍රමණීය' ශබ්දඃ; 'අති' පූර්වඃ 'ක්‍රමු'–පදවික්ෂෙපෙ, සකර්මකඃ පරස්මෛපදී; අතිපූර්ව තෙ උභයපදී.

b. ගුරුදරාඃ, ආචාර්ය භාර්යාතොමෝ; මාතෘතුල්‍යාඃ, මව වැන්නාහුය; සන්තු විධිලිඞ්ක්‍රියා, ගුරුදරාඃ–උක්තකර්තෘ; මාතෘ තුල්‍යාඃ–කර්තෘ විශෙෂණම්; ගුරොඃදරාඃ 'ගුරුදරාඃ'–ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ගුරුදර' ශබ්දඃ, (නිත්‍යං බහුවචනාන්තඃ); අකාරාන්ත පුංලිඞ්ගො 'මාතෘතුල්‍ය' ශබ්දඃ; මාත්‍රාතුල්‍යාඃ 'මාතෘතුල්‍යාඃ'–තෘතීයා තත්පුරුෂඃ; 'අස'–භුවි, අකර්මකඃ පරස්මෛපදී.

c. දෙවපූජකඃ, දෙවපූජකතෙම; සම්මානාහීඃ, සම්මානයට සුදුසුවේ; ස්‍යාත්–ක්‍රියා; දෙවපූජකඃ–උක්තකර්තෘ; සම්මානාහීඃ–කර්තෘවිශෙෂණම්; දෙවස්‍යපූජකඃ දෙවපූජකඃ, ෂෂ්ඨී තත්පුරුෂඃ; සම්මානාය අහීඃ 'සම්මානාහීඃ'–චතුර්ථී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දෙවපූජක' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සම්මානාහී ශබ්දඃ; 'අස'–භුවි, අකර්මකඃ පරස්මෛපදී.

d. ශුද්‍රයාජකඃ,ශුද්‍රයන්ගේ යාගකර්තෘතෙම;සර්වත්‍ර,හැමතන්හි; නාදරණීයඃ, ආදරකටයුතු නොවේ. ආදරණීයඃ–කෘදන්ත කර්ම කාරකක්‍රියා; ශුද්‍රයාජකඃ–උක්තකර්ම; ආදරණීයඃ–කර්මවිශෙෂණම් සර්වත්‍ර–ත්‍රල්ප්‍රත්‍යයාන්තමෙඃව්‍යයම්; න–අව්‍යයම්; ශුද්‍රානාම් යාජ

a. සර්වඥඃ ලොකභර්තා.
b. පරධනං නාපහරණීයම්.
c. පූර්වකායඃ ශරාහතඃ.
d. අර්ධනදී නෞපූර්ණා.
e. මධ්‍යරාත්‍රඃ ශයන සමයඃ.

---

කඃ 'ශුද්‍රයාජකඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ශුද්‍රයාජක' ශබ්දඃ; 'ආඞ්' පූර්ව 'දෘ'-ආදරෙ, සකර්මක ආත්මනෙපදී.

a. සර්වඥඃ-සර්වඥතෙම; ලොකභර්තා, ලොකස්වාමිනම්වෙයි. ස්‍යාත්-ක්‍රියා; සර්වඥඃ-උක්තකර්තා; ලොකභර්තා-කර්තෘවිශෙෂණම්; සර්වං ජානාතීති සර්වඥඃ, කෘදන්ත උපපද සමාසඃ; ලොකස්‍යභර්තා 'ලොකභර්තා'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සර්වඥ' ශබ්දඃ; ඍකාරාන්ත පුංලිඞ්ගො 'ලොකභර්තෘ' ශබ්දඃ, 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. පරධනං-අන්සතු ධනය; න අපහරණීයම්, පැහැර නොගත යුතුයි. අපහරණීයම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; පර ධනං-උක්තකර්ම; පරෙෂාම් ධනං 'පරධනං'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'පරධන' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'අපහරණීය' ශබ්දඃ; 'අප' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, විකර්මකඃ උභයපදී.

c. පූර්වකායඃ, පූර්වශරීරය තෙම හෙවත් ශරීරයාගේ පූර්ව භාගය තෙම; ශරාහතඃ, ශරයෙන්නසන ලද්දේවි; ආසීත්-ලුඞ්ක්‍රියා පූර්වකායඃ-උක්තකර්තා; ශරාහතඃ-කර්තෘවිශෙෂණම්; පූර්වම්කායස්‍ය 'පූර්වකායඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පූර්වකාය' ශබ්දඃ; ශරෙණ ආහතඃ 'ශරාහතඃ'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශරාහත' ශබ්දඃ.

d. අර්ධනදී, නදියගේ අර්ධයක්; නෞපූර්ණා, නැවින්පිරුණිය; ස්‍යාත්-විධිලිඞ්ක්‍රියා; අර්ධනදී-උක්තකර්තා; නෞපූර්ණා-කර්තෘවිශෙෂණම්; අර්ධං නද්‍යාඃ 'අර්ධනදී'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො අර්ධනදී ශබ්දඃ; නාවාපූර්ණා 'නෞපූර්ණා'-තෘතීයා තත්පුරුෂඃ ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'නෞපූර්ණා' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

e. මධ්‍යරාත්‍රඃ, රාත්‍රියගේ මධ්‍යය; ශයනසමයඃ, නිදනකාලය වේ. ස්‍යාත්-ලිඞ්ක්‍රියා; මධ්‍යරාත්‍රඃ-උක්තකර්තා; ශයනසමයඃ-කර්තෘ

a පූර්වාහ්ණෙ ධ්‍යයනකාලඃ.
b. මධ්‍යාහ්නෙ භොජනවෙලා.

## 7. සප්තමඃ පාඨඃ.

c. සප්තමී තත්පුරුෂ ප්‍රයොගාඃ.
d. පුරුෂොත්තමො හරිර්ගීයතෙ පුරවිද්භිඃ.

---

විශෙෂණම්; මධ්‍යං රාත්‍රෙර් 'මධ්‍යරාත්‍රඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'මධ්‍යරාත්‍ර' ශබ්දඃ; ශයනස්‍ය සමයඃ 'ශයනසමයඃ ෂෂ්ඨීතත්පුරුෂඃ, අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශයනසමය' ශබ්දඃ; 'අස'- භුවි, අකර්මකඃ පරස්මෛපදී.

a) පූර්වාහ්ණඃ, පෙරවරුතෙම; අධ්‍යයනකාලඃ, හදාරණ කාලයවේ. ස්‍යාත්-ක්‍රියා; පූර්වාහ්ණඃ-උක්තකර්තෘ; අධ්‍යයනකාලඃ-කර්තෘ විශෙෂණම්; පූර්වඃ අහ්ණඃ 'පූර්වාහ්ණඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පූර්වාහ්ණ' ශබ්දඃ; අධ්‍යයනාය කාලඃ 'අධ්‍යයන කාලඃ'-චතුර්ථී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග, අධ්‍යයනකාල' ශබ්දඃ.

b. මධ්‍යාහ්නඃ, මධ්‍යාහ්නය තෙම; භොජනවෙලා, භොජනවේලාවවේ. ස්‍යාත්-ක්‍රියා; මධ්‍යාහ්නඃ-උක්තකර්තෘ; භොජනවෙලා-කර්තෘවිශෙෂණම්; මධ්‍යං අහ්නඃ 'මධ්‍යාහ්නඃ'-ෂෂ්ඨීතත් පුරුෂඃ; භොජනස්‍යවෙලා 'භොජනවෙලා'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මධ්‍යාග්නවෙලා' ශබ්දඃ.

c. සප්තමී තත්පුරුෂ ප්‍රයොගාඃ, සප්තමී තත්පුරුෂ ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

d. පුරවිද්භිඃ, පුරාතන පණ්ඩිතයන් විසින්; හරිඃ, විෂ්ණු තෙම; පුරුෂොත්තමඃ, පුරුෂොත්තමයයි; ගීයතෙ, කියනුලැබේ. ගීයතෙ-ලට්ක්‍රියා; හරිඃ-උක්තකර්ම; පුරුෂොත්තමඃ-කර්මවිශෙෂණම්; පුරවිද්භිඃ-අනුක්තකර්තෘඃ, පුරුෂෙෂු උත්තමඃ 'පුරුෂොත්තමඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පුරුෂොත්තම' ශබ්දඃ; ඉකාරාන්ත පුංලිඞ්ගො 'හරි' ශබ්දඃ; දකාරාන්ත පුංලිඞ්ගො 'පුරවිද්' ශබ්දඃ; ගීයතෙ, ගීයෙතෙ, ගීයන්තෙ. 'ගෛ'-ශබ්දෙ; සකර්මකඃ පරස්මෛපදී.

a. **ගෘහස්ථිතො නජානාති ලොකව්‍යවහාරම්.**
b. **ලොකවිශ්‍රුතො රාමඃ ස්වගුණ ග්‍රාමෙණ**
c. **අක්ෂකිතවඃ ශකුනිරක්ෂෛර් යුධිෂ්ඨිරං පරාජිතවාන්.**
d. **ඊශ්වරාධීනො නාන්‍යත්‍ර ප්‍රභුත්ව මඞ්ගීකරෙති.**

---

a. ගෘහස්ථිතඃ, ගෙහි සිටින තැනැත්තේ; ලොකව්‍යවහාරම් ලොකව්‍යවහාරය; නජානාති, නොදනී. ජානාති-ලට් ක්‍රියා; ගෘහස්ථිතඃ-උක්තකර්තෘ; ලොකව්‍යවහාරම්-අනුක්තකර්ම ගෘහෙස්ථිතඃ 'ගෘහස්ථිතඃ'-සප්තමී තත්පුරුෂඃ. අකාරාන්ත පුංලිඞ්ග 'ගෘහස්ථිත' ශබ්දඃ; ලොකස්‍ය ව්‍යවහාරඃ 'ලොකව්‍යවහාරඃ'-ෂෂ්ඨීතත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ලොකව්‍යවහාර' ශබ්දඃ; 'ඥා'-අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. රාමඃ, රාමරජතෙම; ස්වගුණග්‍රාමෙණ, ස්වකීය ගුණ සමූහය හේතුකොටගෙන; ලොකවිශ්‍රුතඃ, ලොකයෙහි ප්‍රසිද්ධවී; අභූත්-ලුඞ්ක්‍රියා; රාමඃ-උක්තකර්තෘ; ලොකවිශ්‍රුතඃ-කර්තෘවිශෙෂණම්; ස්වගුණ ග්‍රාමෙණ-අනුක්තකරණම්; ලොකෙවිශ්‍රුතඃ 'ලොකවිශ්‍රුතඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ලොකවිශ්‍රුත' ශබ්දඃ; ස්වස්‍යගුණඃ 'ස්වගුණඃ' ස්වගුණානාම් ග්‍රාමඃ 'ස්වගුණග්‍රාමඃ' තෙනස්වගුණ ග්‍රාමෙණ-තත්පුරුෂ ගර්භතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ස්වගුණග්‍රාම' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. අක්ෂකිතවඃ, ද්‍යූතකෙළියෙහි ලොල්වූ; ශකුනිඃ, ශකුනි නම් රජතෙම; අක්ෂෛඃ, ද්‍යූතකෙළියෙන්; යුධිෂ්ඨිරං, යුධිෂ්ඨිර රජු; පරාජිතවාන්, පැරදවී; පරාජිතවාන්-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; ශකුනිඃ-උක්තකර්තෘ; අක්ෂකිතවඃ-කර්තෘවිශෙෂණම්; යුධිෂ්ඨිරං-අනුක්තකර්ම; අක්ෂෛඃ-අනුක්තකරණම්; අක්ෂෙෂු කිතවඃ 'අක්ෂකිතවඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'අක්ෂකිතව' ශබ්දඃ; ඉකාරාන්ත පුංලිඞ්ගඃ 'ශකුනි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'අක්ෂ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'යුධිෂ්ඨිර' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ග 'පරාජිතවත්' ශබ්දඃ; පරාජයතෙ,පරාජයෙතෙ, පරාජයන්තෙ; 'පරා' පූර්වඃ 'ජි'-ජයෙ; සකර්මකඃ පරස්මෛපදී; 'පරා' පූර්වතො සකර්මකඃ ආත්මනෙපදී.

d. ඊශ්වරාධීනඃ, ඊශ්වරයා අයිති තැනැත්තේ; අන්‍යත්‍ර, අනිකෙකු කෙරෙහි; ප්‍රභුත්වම්, ස්වාමිබව; න අඞ්ගීකරෙති, නොපිළිගනී; අඞ්ගීකරෙති-ලට්ක්‍රියා; ඊශ්වරාධීනඃ-උක්තකර්තෘ; ප්‍රභු

**a. අග්නිසිඩමන්නං මානවානාං භොජ්‍යම්.**
**b. ආතපශුෂ්කං ඵලං ස්වාදරහිතං භවති.**
**c. ස්ථාලීපක්වංපායසං සුඛං භුඞ්ක්තෙ ගෘහී.**

---

ත්වම්-අනුක්තකර්ම; අන්‍යත්‍ර-ත්‍රල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; ඊශ්වරෙ අධීනඃ 'ඊශ්වරාධීනඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ඊශ්වරාධීන' ශබ්දඃ; අන්‍යස්මිං 'අන්‍යත්‍ර'-අනුක්තාධාරෙ සප්තමී; ප්‍රභොර්භාවඃ, ප්‍රභුත්වම්-භාවතද්ධිතඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගඃ 'ප්‍රභුත්ව' ශබ්දඃ; අඞ්ගීකරෙති, අඞ්ගීකුරුතඃ, අඞ්ගීකුර්වන්ති; 'අඞ්ගී' පූර්ව 'ඩුකෘඤ්'-කරණෙ, සකර්මක උභයපදී.

a. අග්නිසිඩම්, ගින්නෙහි සිඩවූ හෙවත් ගින්නෙහි පිසන ලද; අන්නං, ආහාරයතෙම; මානවානාම්, මිනිසුන් විසින්; භො ජ්‍යම්, වැලඳිය යුතුයි. භොජ්‍යම්, කෘදන්තකර්මකාරක ක්‍රියා; අන්නං-උක්තකර්ම; අග්නිසිඩම්-කර්මවිශෙෂණම්; මානවානාම්-අනුක්තකර්තරි ෂෂ්ඨී; අග්නෞසිඩම් 'අග්නිසිඩම්'-සප්තමී තත් පුරුෂඃ; අකාරාන්තක්ලීව ලිඞ්ග 'අග්නිසිඩ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'අන්න' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'මානව' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'භොජන' ශබ්දඃ; 'භුජ'-පාලන භ්‍යවහරණයොඃ, සකර්මක ආත්මනෙපදී.

b. ආතපශුෂ්කං, අව්වෙහි වියලුනාවූ; ඵලං, පලයතෙම; ස්වාදරහිතං භවති, ආශ්වාද නැත්තේවේ; හෙවත් රසනැතිවේ. භවති-ලට්ක්‍රියා; පලං-උක්තප්‍රකෘති කර්තෘ; ස්වාදරහිතං-උක්ත විකෘතිකර්තෘ; ආතපශුෂ්කං-ප්‍රකෘතිකර්තෘ විශෙෂණම්; ආතපෙ ශුෂ්කං 'ආතපශුෂ්කම්'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්තක්ලීව ලිඞ්ග 'ආතපශුෂ්ක' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගො 'පල' ශබ්දඃ; ස්වාදත්රහිතං'ස්වාදරහිතං-පංචමීතත්පුරුෂඃ;අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'ස්වාදරහිත' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. ගෘහී, ගිහිතෙම; ස්ථාලීපක්වං, සැලෙහි පිසනලද; පාය සං, කිරිබත; සුඛං, සැපසේ; භුඞ්ක්ත, වලඳයි; භුඞ්ක්ත-ලට් කර්තෘ කාරක ආත්මනෙපදක්‍රියා; ගෘහී-උක්තකර්තෘ; පායසං-අනුක්තකර්ම; ස්ථාලීපක්වං-කර්මවිශෙෂණම්; සුඛං-ක්‍රියාවිශෙෂණම් ස්ථාල්‍යාං පක්වං 'ස්ථාලීපක්වං'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ස්ථාලීපක්ව' ශබ්දඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගඃ 'පායස' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගො 'ගෘහින්' ශබ්දඃ; 'භුජ'-පාලනභ්‍යව හරණයොඃ, සකර්මකඃ, ආත්මනෙපදී.

**a. ධනිනාං ගෘහද්වාරි තීර්ථකාක ඉව යාචකස්තිෂ්ඨති.**
**b. මාසදෙයමෘණං වෘද්ධිං නාර්හති.**
**c. පූර්වාහණකෘතං කර්ම අපරාහෙණනාධිකුරෙති මිථ්‍යාපරඃ**
**d. අපරාත්‍රභුක්තමන්නං දුර්ජරං භවති.**

---

a. ධනිනාම්, ධනවතුන්ගේ; ගෘහද්වාරි, ගෙදෙරෙහි; යාචකඃ, යාචක තෙම; තීර්ථකාකඃ ඉව, තොට නිසුතු කවුඩෙක් මෙන්; තිෂ්ඨති සිටී. තිෂ්ඨති-ලට්ක්‍රියා; යාචකඃ-උක්තකර්තෘ; තීර්ථකාකඃ-උපමාකර්තෘ විශෙෂණම්; ඉව-උපමාර්ථෙ අව්‍යයම්; ගෘහද්වාරි-අනුක්තාධාරඃ; ධනිනාං-අනුක්ත සම්බන්ධඃ; ගෘහස්‍ය ද්වාරඃ 'ගෘහද්වාරඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; රේඵාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ගෘහද්වාර්' ශබ්දඃ; තීර්ථෙ කාකඃ 'තීර්ථකාකඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගා 'තීර්ථකාක' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගා 'යාචක' ශබ්දඃ; නකාරාන්තපුංලිඞ්ගා 'ධනින්' ශබ්දඃ; 'ෂ්ඨා'-ගතිනිවෘත්තෞ, අකර්මකඃ පරස්මෛපදී.

b. මාසදෙයම්, මසෙක්හි දියයුතුවූ; ඍණං, ණය; වෘද්ධිං, පොලියට; න අර්හති, නුසුදුසුයි. අර්හති-ක්‍රියා; ඍණම්-උක්තකර්තෘ; මාසදෙයම්-කර්තෘවිශෙෂණම්; වෘද්ධිං-අනුක්තකර්ම; මාසෙ දෙයං 'මාසදෙයං'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගා 'මාසදෙය' ශබ්දඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගා 'ඍණ' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'වෘද්ධි' ශබ්දඃ; 'අර්හ'-පූජායාම්, සකර්මකඃ පරස්මෛපදී, -යොග්‍යත්වායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. මිථ්‍යාපරඃ, බොරුයෙහි තත්පරවූයේ; පූර්වාහණකෘතං, පෙරවරුයෙහි කරනලද; කර්ම, කර්මය; අපරාහෙණ, පස්වරුයෙහි; න අධිකරෙති, නොපිළිගණී. අධිකරෙති-ලට්ක්‍රියා; මිථ්‍යාපරඃ-උක්තකර්තෘ, කර්ම-අනුක්තකර්ම; පූර්වාහණකෘතම්,-කර්මවිශෙෂණම්; අපරාහෙණ-අනුක්තාධාරඃ කාලසප්තමී; පූර්වම් අහ්ණඃ 'පූර්වාහ්ණඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; පූර්වාහෙණකෘතං 'පූර්වාහණකෘතං'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගා 'පූර්වාහණ' ශබ්දඃ; අපරං අහ්ණඃ 'අපරාහ්ණඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; මිථ්‍යායාම් පරඃ 'මිථ්‍යාපරඃ'-සප්තමීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'මිථ්‍යාපර' ශබ්දඃ; 'අධි' පූර්වඃ 'ඩුකෘඤ්'-කරණෙ, සකර්මකඃ උභයපදී.

d. අපරාත්‍රභුක්තං, රාත්‍රිය හැර වළඳනලද; අන්නං, ආහාරය තෙම; දුර්ජරං භවති, දිරියනොහැකිවේ. භවති-ලට්ක්‍රියා; අන්නං-උක්ත ප්‍රකෘති කර්තෘ; අපරාත්‍රභුක්තං-ප්‍රකෘතිකර්තෘ විශෙෂණම්;

**a. පාත්‍රසමේතාඃ කාර්‍යකාලෙ පලායන්තෙ.**
**b. ගෘහෙ ශූරෙ වෘථා ගර්ජිමාවහති.**
**c. කූප මණ්ඩූකඃ සූර්‍ය කිරණ මව ජානාති.**

---

## 8. අෂ්ටමඃ පාඨඃ.

---

**d. කර්මධාරය ප්‍රයොගාඃ-**

---

දූජිරං—උක්ත විකෘති කර්තෘ; රාත්‍රිං වර්ජයිත්වෙති 'අපරාත්‍රං'-අව්‍යයී භාවඃ; අපරාත්‍රෙභුක්තං 'අපරාත්‍රභුක්තං'-සප්තමීතත්පුරුෂඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'අපරාත්‍රභුක්ත' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'දූජිර' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

a. පාත්‍රසමේතාඃ, භොජනපාත්‍රයෙහි රැස්වූවාහු; කාර්‍ය කාලෙ, කටයුතුකාලයෙහි; පලායන්තෙ, පලායෙත්. පලායන්තෙ -ලට්ආත්ක්‍රියා; පාත්‍රසමේතාඃ-උක්තකර්තාරඃ; කාර්‍යකාලෙ- අනුක්තාධාරඃ කාලසප්තමී; පාත්‍රසමේතාඃ 'පාත්‍රසමේතාඃ'- අලුක්සප්තමී තත්පුරුෂඃ; කාර්‍යස්‍යකාලඃ 'කාර්‍යකාලඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'පරා' පූර්වඃ 'අය'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී, 'පරා' පූර්වතො අකර්මකඃ ආත්මනෙපදී.

b. ගෘහෙශූරඃ, ගෙහිශූර තැනැත්තේ; වෘථා, නිකරුණෙහි හෙවත් නිෂ්ඵලයෙහි; ගර්ජිම්, ගර්ජිය; ආවහති, උසුලයි ආවහති- ලට්ක්‍රියා; ගෘහෙශූරඃ-උක්තකර්තෘ; ගර්ජිම්-අනුක්තකර්ම; වෘථා- අව්‍යයම්; ගෘහෙශූරඃ 'ගෘහෙශූරඃ'-අලුක් සප්තමී තත්පුරුෂඃ; 'ආ' පූර්වඃ 'වහ'-ප්‍රාපනෙ, විකර්මකඃ උභයපදී.

c. කූපමණ්ඩූකඃ, ළිංමැඩිතෙම; සූර්‍යකිරණම්, සූර්‍යරශ්මි යට; අවජානාති, අවමන්කෙරෙයි. අවජානාති-ලට්ක්‍රියා; කූප මණ්ඩූකඃ-උක්තකර්තෘ; සූර්‍යකිරණම්-අනුක්තකර්ම; කූපෙමණ්ඩූකඃ 'කූපමණ්ඩූකඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගො 'කූපමණ්ඩූක' ශබ්දඃ; සූර්‍යස්‍යකිරණම් 'සූර්‍යකිරණම්'-ෂෂ්ඨීතත් පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගො 'සූර්‍යකිරණ' ශබ්දඃ; 'අව' පූර්වඃ 'ඥා'-අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. කර්මධාරය ප්‍රයොගාඃ, කර්මධාරය සමාස ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

**a. නීලොත්පලං කුසුමශ්‍රෙෂ්ඨම්.**
**b. මුකුලිතසහකාරශ්චිත්තමාහරති සෞරභෙණ.**
**c. පුෂ්පිතාශොකඃ ශොභයති වනම්.**
**d. මහා පුරුෂො න කම්පි ජනමවජානාති.**

---

a. නීලොත්පලං, නිලුපුලතෙම; කුසුම ශ්‍රෙෂ්ඨම්, මල්අතුරෙහි උතුම්. ස්‍යාත්-විධිලිඞ් ක්‍රියා; නීලොත්පලං-උක්තකර්තෘ; කුසුමශ්‍රෙෂ්ඨම්-කර්තෘවිශෙෂණම්; නීලංච තදුත්පලංචෙති 'නීලොත්පලං'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ;(නිල්වූයේත් මේ තෙමේය උපුල්වූයේත් මේ තෙමේනුයි 'නීලොත්පල' නම්.) අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'නීලොත්පල' ශබ්දඃ; කුසුමෙෂු ශ්‍රෙෂ්ඨම් 'කුසුම ශ්‍රෙෂ්ඨම්'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'කුසුම ශ්‍රෙෂ්ඨ' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. මුකුලිත සහකාරඃ, පිපියාවූ මී අඹගස; සෞරභෙණ සුවඳින්; චිත්තං ආහරති, සිතගනී. ආහරති-ලට් ක්‍රියා; මුකුලිත සහකාරඃ-උක්තකර්තෘ; චිත්තං-අනුක්තකර්ම; සෞරභෙණ-අනුක්තකරණම්; මුකුලිතශ්චාසෞ සහකාරශ්චෙති 'මුකුලිතසහකාරඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ (පිපියේත් මේ තෙමේය සහකාර වූයේත් මේ තෙමේනුයි 'මුකුලිත සහකාර' නම්) අකාරාන්ත පුංලිඞ්ගො 'මුකුලිත සහකාර' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'චිත්ත' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'සෞරභ' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, සකර්මකඃ උභයපදී.

c. පුෂ්පිතාශොකඃ, පිපියාවූ හෝපලුගස; වනම්, වනය; ශොභයති, හොබවයි. ශොභයති-ලට් ක්‍රියා; පුෂ්පිතාශොකඃ-උක්තකර්තෘ; වනම්-අනුක්තකර්ම; පුෂ්පිතශ්චාසෞඅශොකශ්චෙති 'පුෂ්පිතාශොකඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ (පිපියේත් මේ තෙමේය හෝපලුවූයේත් මේ තෙමේනුයි 'පුෂ්පිතාශොක' නම්.) අකාරාන්ත පුංලිඞ්ගො 'පුෂ්පිතාශොක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'වන' ශබ්දඃ; 'ශුභ'-දීප්තෞ, අකර්මකඃ ආත්මනෙපදී, අනිමිස කර්මකඃ උභයපදී.

d. මහාපුරුෂඃ, උත්තම පුරුෂ තෙම; කම් ජනම් අපි, කිසි ජනයෙකුටත්; න අවජානාති, අවමන් නොකෙරෙයි. අවජානාති-ලට් ක්‍රියා; මහාපුරුෂඃ-උක්තකර්තෘ; ජනම්-අනුක්තකර්ම; කම්-කර්ම විශෙෂණම්; න, අපි-අව්‍යයෝ; මහාංශ්චාසෞ පුරුෂශ්චෙති 'මහාපුරුෂඃ'-විශෙෂණ පූර්වපදකර්මධාරයඃ;(මහත්වූයේත් මේ තෙමේය

a. ආපන්න ශත්‍රුරපි දයාභිඃ.
b. ඥානිජනඃ සර්වලොක පූජ්‍යඃ.
c. බහුධනං ඛෙදකරං පරභොග්‍යඤ්ච.

---

පුරුෂවූයේත් මේ තෙමේනුයි 'මහාපුරුෂ' නම්.) අකාරාන්ත පුං ලිඞ්ගා 'මහාපුරුෂ' ශබ්දඃ; මකාරාන්ත 'කිං' ශබ්දඃ, පුංසි; අකාරාන්ත පුංලිඞ්ගා 'ජන' ශබ්දඃ; 'අව' පූර්වඃ 'ඥ'-අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. ආපන්න ශත්‍රුඃ අපි; විපතට පැමිණි සතුරු නමුත්; දයාභිඃ, දයාවට සුදුසුයි. ස්‍යාත්-ක්‍රියා; ආපන්න ශත්‍රුඃ-උක්ත කර්තෘ; දයාභිඃ-කර්තෘ විශෙෂණම්; ආපන්නශ්චා සෞ ශත්‍රුශ්චෙති 'ආපන්න ශත්‍රුඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ (විපතට පැමිණි යේත් මේ තෙමේය සතුරුවූයේත් මේ තෙමේනුයි 'ආපන්න ශත්‍රු' නම්.) උකාරාන්ත පුංලිඞ්ගා 'ආපන්නශත්‍රු' ශබ්දඃ; දයාම් අර්හතීති 'දයාභිඃ'-උපපද සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දයාභි' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. ඥානිජනඃ, නුවණැති ජනතෙම; සර්වලොකපූජ්‍යඃ, සියලු ලොකයා විසින් පිදිය යුතුවේ. ස්‍යාත්-ලිඞ්ක්‍රියා; ඥානිජනඃ-උක්තකර්තෘ; සර්වලොක පූජ්‍යඃ-කර්තෘ විශෙෂණම්;ඥානමස්‍යාස්තීති 'ඥානි'-තද්ධිත 'ඉන්' ප්‍රත්‍යයඃ; (ඥානය තෙම මෝහට ඇත්නුයි 'ඥානින්' නම්.) ඥානිශ්චා සෞ ජනශ්චෙති 'ඥානිජනඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (ඥානිවූයේත් මේ තෙමේය ජනවූයේත් මේ තෙමේනුයි 'ඥානිජන' නම්.) සර්ව ශ්චා සෞ. ලොකශ්චෙති 'සර්ව ලොකඃ'; සර්වලොකෙනපූජ්‍යඃ 'සර්වලොකපූජ්‍යඃ'-කර්මධාරය ගර්භ තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා'ඥානිජන'ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ගා 'සර්වලොකපූජ්‍ය' ශබ්දඃ;'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

c. බහුධනං, බොහෝවූ ධනය තෙම; ඛෙදකරං, ඛෙදය කෙරෙයි; පරභොග්‍යඤ්ච, අන්‍යයාවිසින් බුදියයුතුද වේ. ස්‍යාත්-ක්‍රියා; බහුධනං-උක්තකර්තෘ; ඛෙදකරං-කර්තෘ විශෙෂණම්; පර භොග්‍යං-කර්තෘ විශෙෂණම්; ච-අව්‍යයම්; බහුංච තත් ධනඤ්චෙති 'බහුධනං'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (බොහෝවූයේත් ඒ තෙමේය ධනවූයේත් එමනුයි 'බහුධන' නම්.) ඛෙදංකරෙතීති 'ඛෙදකරං'-උපපදසමාසඃ; පරංභොග්‍යං 'පරභොග්‍යං'-තෘතීයා තත්පුරුෂඃ; (අන්‍යයා විසින් බුදියයුත්තෝ 'පරභොග්‍ය' නම්.) අකාරාන්ත නපුංසකලිඞ්ගා 'පරභොග්‍ය' ශබ්දඃ,

**a. සත්පුරුෂඃ සුඛසෙව්‍යඃ.**
**b. ඥානධනං සර්වථාර්ජනීයම්.**
**c. දරිද්‍රො'පි විචජ්ජන ආදරණීයඃ.**
**d. ජරන්නෛයායිකාඃ කාව්‍යරසං නජානන්ති.**

---

a. සත්පුරුෂඃ, සත්පුරුෂතෙම; සුඛසෙව්‍යඃ, සුවසේ සෙවිය හැකිවේ. ස්‍යාත්-ක්‍රියා; සත්පුරුෂඃ-උක්තකර්තෘ; සුඛසෙව්‍යඃ-කර්තෘ විශෙෂණම්; සංශ්චාසෞ පුරුෂශ්චෙති 'සත්පුරුෂඃ'-පූර්ව පද කර්මධාරයඃ (යහපත්වූයේත් මේ තෙමේය පුරුෂවූයේත් මේ තෙමේතුයි 'සත්පුරුෂ' නම්.) සුඛෙන සෙව්‍යඃ 'සුඛසෙව්‍යඃ' (සුව සේ සෙවිය යුත්තේ 'සුඛසෙව්‍ය' නම්.) 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b ඥානධනං, ඥාන නැමැති ධනය; සර්වථා, හැමපරිද්දෙන්; අර්ජනීයම්, රැස්කටයුතුයි. අර්ජනීයම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; ඥානධනං-උක්තකර්ම; සර්වථා-ථාල්ප්‍රත්‍යයාන්තමව්‍යයම්; ඥාන මෙව ධනං 'ඥානධනං'-අවධාරණ පූර්වපද කර්මධාරයඃ;(ඥාන යම ධනවූයේ 'ඥානධන' නම්.) අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ඥාන ධන' ශබ්දඃ; සර්වෙන ප්‍රකාරෙන 'සර්වථා' (හැමපරිද්දෙන් යන අර්ථයෙහි 'සර්වථා' යනුවේ.) අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'අර්ජනීය' ශබ්දඃ.

c. විචජ්ජනඃ, පණ්ඩිතතෙම; දරිද්‍රඃඅපි, දිළිඳුනමුදු; ආදර ණීයඃ, ආදරකටයුතුයි. ආදරණීයඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; විචජ්ජනඃ-උක්තකර්ම; දරිද්‍රඃ-කර්මවිශෙෂණම්; අපි-අව්‍යයම්; විචාං ශ්චාසෞජනශ්චෙති 'විචජ්ජනඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (නුවණැත්තේත් මේ තෙමේය ජනවූයේත් මේ තෙමේතුයි 'විචජ්ජන' නම්.) අකාරාන්ත පුංලිඞ්ගො 'විචජ්ජන' ශබ්දඃ; අකා රාන්ත පුංලිඞ්ගො 'ආදරණීය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දරිද්‍ර' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'දෘ'-ආදරෙ, සකර්මකඃ ආත්මනෙපදී.

d. ජරන්නෛයායිකාඃ, පුරාතන න්‍යාය ශාස්ත්‍රඥයෝ; කාව්‍ය රසං, කාව්‍යරසය; නජානන්ති, නොදනිත්. ජානන්ති-ක්‍රියා; ජරන්නෛයායිකාඃ-උක්තකර්තාරඃ; කාව්‍යරසං-අනුක්තකර්ම; ජරන්තශ්චතෙ නෛයායිකාශ්චෙති 'ජරන්නෛයායිකාඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (ජීර්ණවූවාහුත් ඔහුමය න්‍යායශාස්ත්‍රඥයෝත් ඔහුමතුයි 'ජරන්නෛයායික' නම්.)කාව්‍යානාං රසඃ 'කාව්‍යරසඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'ඥා'-අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

**a. කෙවලවෛයාකරණාඃ ශබ්දමෙව සුඛසාධනත්වෙන මන්‍යන්තෙ.**

**b. පාවක ස්ත්‍රී නානුභවති කෙලශං රඞ්ගතෙ.**

**c. කුනෘපතිඃ පීඩයති ප්‍රජාඃ.**

**d. කෘෂ්ණ සර්පඃ ප්‍රායෙණ විෂතීක්ෂ්ණො ජායතෙ.**

---

a. කෙවලවෛයාකරණාඃ හුදක්වියරණඋගත්තාහු; ශබ්දං එව, ශබ්දයම; සුඛසාධනත්වෙන, සැපයට හේතුබැවින්; මන්‍යන්තෙ, සිතත්. මන්‍යන්තෙ-ලට්ක්‍රියා; කෙවලවෛයාකරණාඃ-උක්ත කර්තාරඃ; ශබ්දං-අනුක්තකර්ම; එව-අවධාරණෙ අව්‍යයම්; සුඛසාධනත්වෙන-අනුක්තකරණම්; ව්‍යාකරණං වෙත්ති අධිතෙ ඉතිවා 'වෛයාකරණාඃ'-තද්ධිත 'අණ්' ප්‍රත්‍යයඃ: (වියරණ දනීනුයි හෝ හදරණනුයි හෝ 'වෛයාකරණ' නම්.) කෙවලශ්චතෙ වෛයාකරණශ්චෙති 'කෙවලවෛයාකරණාඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (හුදකලාවූවාහුත් ඔහුමය වෛයාකරණයෝත් ඔහුම නුයි 'කෙවලවෛයාකරණ' නම් වේ.) සුඛස්‍ය සාධනං 'සුඛසාධනං'-ෂෂ්ඨී තත්පුරුෂඃ; සුඛසාධනස්‍ය භාවඃ 'සුඛසාධනත්වං'-තද්ධිත 'ත්වත්' ප්‍රත්‍යයඃ; අකාරාන්ත කලිවලිඞ්ගා 'සුඛසාධනත්ව' ශබ්දඃ; 'මන'-ඥානෙ, සකර්මකඃ ආත්මනෙපදී.

b පාවක ස්ත්‍රී, පිසන ස්ත්‍රී තොමෝ; කෙලශම්, දුකක්; න අනුභවති, නොවිඳී අනුභවති-ක්‍රියා; පාවක ස්ත්‍රී-උක්ත කර්ත්‍රී; කෙලශම්-අනුක්තකර්ම; රඞ්ගතෙන-අනුක්ත කරණම්; පාවිකා සෞ ස්ත්‍රීචෙති 'පාවකස්ත්‍රී'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; (පිසන් නීත් මෝ තොමෝය ස්ත්‍රී වූත් මෝ තොමෝනුයි 'පාවක ස්ත්‍රී' නම්) ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'පාවක ස්ත්‍රී' ශබ්දඃ; න-අව්‍යයම්, අකාරාන්ත පුංලිඞ්ගා 'කෙලශ' ශබ්දඃ; අකාරාන්ත කලිවලිඞ්ගා 'රඞ්ගත' ශබ්දඃ; 'අනු' පූර්වඃ 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

c. කුනෘපතිඃ, අයහපත්රජතෙම; ප්‍රජාඃ, ප්‍රජාවන්; පීඩයති, පෙළයි. පීඩයති-ක්‍රියා; කුනෘපතිඃ-උක්තකර්තා; ප්‍රජාඃ-අනුක්ත කර්ම; කුත්සිතඃ නෘපතිඃ 'කුනෘපතිඃ'-අව්‍යයපූර්වපදකර්මධාරයඃ; ඉකාරාන්ත පුංලිඞ්ගා 'කුනෘපති' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ප්‍රජා'' ශබ්දඃ; 'පීඩ'-පීඩනෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. කෘෂ්ණසර්පඃ, කෘෂ්ණසර්පතෙම; ප්‍රායෙණ, බොහෝ සෙයින්; විෂ තීක්ෂ්ණඃ, විෂයෙන් තියුණුවූයේ; ජායතෙ, වෙයි; ජායතෙ-ලට්ක්‍රියා; කෘෂ්ණසර්පඃ-උක්තකර්තා; විෂ තීක්ෂ්ණඃ-කර්තෘ

## 9. නවමඃ පාඨඃ.

**a. කර්‍මධාරය ප්‍රයොගාඃ.**

**b. පුරුෂ ව්‍යාඝ්‍රො දශරථඃ පුත්‍රශොකෙන මමාර.**

**c. නෘසොමො රාමචන්‍ද්‍රො ලොකවිරාගභයෙන ප්‍රියාංජායාංතත්‍යාජ.**

---

විශෙෂණම්; ප්‍රායෙණ-අනුක්තකරණම්; නෘෂණවාසෞ සඞ්ගෙචෙති 'නෘෂණසඞ්ඃ'-විශෙෂණ පූර්‍වපද කර්‍මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නෘෂණසඞ්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රාය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'විෂතීක්‍ෂණ' ශබ්දඃ; 'ජනී'-ප්‍රාදුර්භාවෙ, අකර්‍මකඃ ආත්මනෙපදී.

a. කර්‍මධාරය ප්‍රයොගාඃ, කර්‍මධාරය සමාස ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

b. පුරුෂ ව්‍යාඝ්‍රඃ, පුරුෂ ශ්‍රෙෂ්ඨවූ; දශරථඃ, දශරථ රජ තෙම; පුත්‍රශොකෙන, පුත්‍රශොකයෙන්; මමාර, මෙළේය. මමාර-ලිට්ක්‍රියා; දශරථඃ-උක්තකර්තෘ; පුරුෂව්‍යාඝ්‍රඃ කර්තෘවිශෙෂණම්; පුත්‍රශොකෙන-අනුක්තකරණම්; පුරුෂො ව්‍යාඝ්‍ර ඉව 'උපමානොත්තරපද කර්‍මධාරයඃ; (පුරුෂවූයේත් මේ තෙමේය ව්‍යාඝ්‍රයෙකු බඳුවූයේත් මේ තෙමේනුයි 'පුරුෂව්‍යාඝ්‍ර' නම්.) පුත්‍රාත් ශොකඃ 'පුත්‍රශොකඃ'-පංචමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග පුරුෂව්‍යාඝ්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දශරථ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පුත්‍රශොක' ශබ්දඃ; 'මෘඞ්'-ප්‍රාණත්‍යාගෙ, අකර්‍මකඃ ආත්මනෙපදී.

c. නෘසොමඃ, මනුෂ්‍යොත්තමවූ; රාමචන්‍ද්‍රඃ, රාමචන්‍ද්‍රතෙම; ලොකවිරාගභයෙන, ලොවිරාගභයින්; ප්‍රියාංජායාං, ප්‍රියභාර්‍යාව; තත්‍යාජ,. හළේය තත්‍යාජ-ලිට්ක්‍රියා; රාමචන්‍ද්‍රඃ-උක්තකර්තෘ; නෘසොමඃ-කර්තෘවිශෙෂණම්; ජායාං-අනුක්තකර්‍ම; ප්‍රියාං-කර්‍මවිශෙෂණම්; ලොකවිරාගභයෙන-අනුක්තකරණම්; නෘසොම ඉව 'නෘසොමඃ'-උපමානොත්තරපද කර්‍මධාරයඃ; (නෘ, මනුෂ්‍යවූයේත් මේ තෙමේය; සොමඉව, චන්‍ද්‍රයා වැනිවූයේත් මේ තෙමේනුයි 'නෘසොම' නම්.) ලොකස්‍ය විරාගඃ 'ලොකවිරාගඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ, ලොකවිරාගාත්භයං 'ලොකවිරාගභයං'-පංචමී තත්පුරුෂඃ; අකාරාන්ත නපුංසකලිඞ්ගො 'ලොකවිරාගභය' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ප්‍රියා' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'ජායා' ශබ්දඃ; 'ත්‍යජ'-හානෞ, සකර්‍මකඃ පරස්මෛපදී.

**a. මුඛපද්මං සුතශොකෙන ම්ලානතාං ජගාම.**
**b. කරකිසලයශ්ච කම්පෙ.**
**c. රාජශාර්දූලොරඝුඃ සමස්තාං පෘථිවීං ස්වවශාං චකාර.**
**d. රාජර්ෂිර් දිලීපඃ ශතං ක්‍රතූනාමාජහාර.**
**e. කවිපුඞ්ගවඃ කුමාරදාසො ජානකීහරණං ප්‍රණිනාය.**

---

a. මුඛපද්මං, මුඛනැමැතිපද්මය; සුතශොකෙන, පුත්‍රශොකය කාරණකොටගෙන; ම්ලානතාං, මලානිකබවට; ජගාම, ගියේය. ජගාම-ලිට් ක්‍රියා; මුඛපද්මං-උක්තකර්තෘ; ම්ලානතාම්-අනුක්තකර්ම; සුතශොකෙන-හෙත්වර්ථ තෘතියා; මුඛමෙවපද්මං 'මුඛපද්මං'-අවධාරණපූර්වපද කර්මධාරයඃ; සුතාත්ශොකඃ, 'සුතශොකඃ'-පංචමී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'මුඛපද්ම' ශබ්දඃ; 'ගම්ලෘ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

b. කරකිසලයඃ, හස්තනැමැති පල්ලවයතෙම; චකම්පෙ කම්පාවිය. චකම්පෙ-ලිට් ක්‍රියා; කරකිසලයඃ-උක්තකර්තෘ; කරමෙව කිසලයඃ 'කරකිසලයඃ'-අවධාරණ පූර්වපද කර්මධාරයඃ; 'කපි'-කිඤ්චිච්චලනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

c. රාජශාර්දූලඃ, රාජශ්‍රෙෂ්ඨවූ; රඝුඃ, රඝුරජතෙම; සමස්තාං පෘථිවීං, මුළුපොළොව; ස්වවශාංචකාර, තමා වසඟකෙළේය. චකාර-ලිට් ක්‍රියා; රඝුඃ-උක්තකර්තෘ; රාජ ශාර්දූලඃ-කර්තෘවිශෙෂණම්; පෘථිවීං-අනුක්තකර්ම; සමස්තාං-කර්මවිශෙෂණම්; ස්වවශාං-කර්මවිශෙෂණම්; රාජ ශාර්දූල ඉව 'රාජශාර්දූලඃ'-උපමා කර්මධාරයඃ, 'ඩුකෘඤ්'-කරණෙ, සකර්මකඃ උභයපදී.

d. රාජර්ෂිඃ, රාජශ්‍රෙෂ්ඨවූ; දිලීපඃ, දිලීපරජතෙම; ක්‍රතූනාං, යාගයන්සම්බන්ධිවූ; ශතං, සියයක්; ආජහාර, යාගකෙළේය ආජහාර-ක්‍රියා; දිලීපඃ-උක්තකර්තෘ; රාජර්ෂිඃ-කර්තෘවිශෙෂණම්; ශතං-අනුක්තකර්ම; ක්‍රතූනාං-අනුක්තසම්බන්ධඃ; රාජා ඍෂි ඉව 'රාජර්ෂි'-උපමානොත්තරපදකර්මධාරයඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ශත' ශබ්දඃ, එකවචනාන්තඃ; 'ආ' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, විකර්මකඃ උභයපදී.

e. කවිපුඞ්ගවඃ, කාව්‍යශ්‍රෙෂ්ඨවූ; කුමාරදාසඃ, කුමාරදාසතෙම ජානකීහරණම්, එනම් කාව්‍යය; ප්‍රණිනාය, කෙළේය; ප්‍රණිනාය-ක්‍රියා; කුමාරදාසඃ-උක්තකර්තෘ; කවිපුඞ්ගවඃ කර්තෘ විශෙෂණම්; ජානකීහරණම්-අනුක්තකර්ම; කවිපුඞ්ගවඃ ඉව 'කවිපුඞ්ගවඃ'-උපමා කර්මධාරයඃ; කුමාරස්‍යදාසඃ 'කුමාරදාසඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ;

a. **පුරුෂසිංහො යයාතිඃ ශුක්‍රශාපෙන ජරාමවාප.**
b. **නරකුඤ්ජරඃ පාර්ථඃ එකාඑව සමස්තං කුරුබලං නිජඝාන.**

---

## 10. දශමඃ පාඨඃ.

---

c. **කර්මධාරය ප්‍රයොගාඃ.**
d. **සාගර ගම්භීරෙ ධීරාණාං ස්වභාවඃ.**
e. **අචලස්ථිරා විචක්ෂණා භවන්ති.**

---

ජනතායාඃ හරණං 'ජනතාහරණම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'ප්‍ර' පූර්වඃ 'නීඤ්'-ප්‍රාපණෙ, විකර්මකඃ උභයපදී.

a. පුරුෂසිංහඃ, පුරුෂ ශ්‍රෙෂ්ඨවූ; යයාතිඃ යයාති රජතෙම; ශුක්‍රශාපෙන, ශුක්‍ර ඍෂිහුගේ ශාපයෙන්; ජරාම්, ජරාවට; අවාප, පැමිණියේය. අවාප-ලිට්ක්‍රියා; යයාතිඃ-උක්තකර්තෘ; පුරුෂසිංහඃ-කර්තෘවිශෙෂණම්; ශුක්‍රශාපෙන-අනුක්ත කරණම්; ජරාම්-අනුක්ත කර්ම; පුරුෂ සෘෂභඉව 'පුරුෂසිංහඃ'-උපමා කර්මධාරයඃ; ශුක්‍රස්‍ය ශාපඃ 'ශුක්‍රශාපඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'අව' පූර්වඃ 'ආප'-ප්‍රාප්තෞ-සකර්මකඃ පරස්මෛපදී.

b. නරකුඤ්ජරඃ, නරශ්‍රෙෂ්ඨවූ; පාර්ථඃ, පාර්ථරජතෙම; එකඑව, එකලාවම;සමස්තං කුරුබලං, සියලුකුරු සෙනග; නිජඝාන,නැසී නිජඝාන-ලිට්ක්‍රියා; පාර්ථඃ-උක්තකර්තෘ; නරකුංජරඃ-කර්තෘ විශෙෂණම්;එකඃ-කර්තෘවිශෙෂණම්;එව-අව්‍යයම්;කුරුබලං-අනුක්තකර්ම; සමස්තං-කර්මවිශෙෂණම්; නරඃ කුඤ්ජරඉව 'නරකුඤ්ජරඃ' උපමානොත්තරපද කර්මධාරයඃ; කුරූනාංබලං 'කුරුබලං'-ෂෂ්ඨීතත්පුරුෂඃ, 'නිඤ්' පූර්වඃ 'හන'-හිංසාගත්‍යොඃ, සකර්මකඃ පරස්මෛපදී.

c. කර්මධාරය ප්‍රයොගාඃ, කර්මධාරය සමාස ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

d. ධීරාණං, ප්‍රාඥයන්ගේ; ස්වභාවඃ, ස්වභාවය තෙම;සාගර ගම්භීරඃ, සාගරයසේ ගැඹුරුවේ. ස්‍යාත්-ලිඞ්ක්‍රියා; ස්වභාවඃ-උක්ත කර්තෘ; සාගර ගම්භීරඃ-කර්තෘවිශෙෂණම්; ධීරාණාං-අනුක්ත සම්බන්ධඃ සාගරඉවගම්භීර 'සාගරගම්භීරඃ'-උපමාන පූර්වපද කර්මධාරයඃ;'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

e. විචක්ෂණාඃ, පණ්ඩිතයෝ; අචලස්ථිරා භවන්ති, පර්වතසේ ස්ථිරවෙත්. භවන්ති-ලට්ක්‍රියා; විචක්ෂණාඃ-උක්තකර්තෘරඃ, අචල ස්ථිරාඃ-කර්තෘවිශෙෂණම්; අචලාඉව ස්ථිරාඃ 'අචලස්ථිරාඃ'-උපමාන පූර්වපද කර්මධාරයඃ; 'භූ'-සත්තායාම්; අකර්මකඃ පරස්මෛපදී.

a. සිංහවික්‍රාන්තආසින් මධ්‍යම පාණ්ඩවඃ.
b. කුසුමකොමලංසාධූනාං හෘදයම්.
c. පාෂාණකඨිනං දුර්ජනානාං මනඃ.
d. ජ්‍යොත්ස්නා ධවලං පුණ්‍යවතාං යශඃ.
e. අමෘතමධුරං පණ්ඩිතානාං වචනම්.
f. කුඨාරතීක්ෂ්ණා දුර්මුඛානාං වචනවින්‍යාසඃ.

---

a. මධ්‍යමපාණ්ඩවඃ,මධ්‍යම පාණ්ඩව රජතෙම;සිංහවික්‍රාන්ත ආසීත්, සිංහයෙකුට බඳු වික්‍රම ඇතිවී. ආසීත්-ලුඞ්ක්‍රියා; මධ්‍යම පාණ්ඩවඃ-උක්තකර්තෘ; සිංහවික්‍රාන්තඃ-කර්තෘවිශෙෂණම්; සිංහඉව වික්‍රාන්තඃ 'සිංහවික්‍රාන්තඃ'-උපමාන පූර්වපද කර්මධාරයඃ; මධ්‍යම ශ්වා සෞ පාණ්ඩවශ්චෙති 'මධ්‍යම පාණ්ඩවඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

b. සාධූනාං, සත්පුරුෂයන්ගේ; හෘදයම්, ළය; කුසුමකොමලං, මලක්සේ මොලොක්වේ. ස්‍යාත්-ක්‍රියා; හෘදයම්-උක්ත කර්තෘ; කුසුමකොමලං- කර්තෘවිශෙෂණම්; සාධූනාං-අනුක්ත සම්බන්ධඃ; කුසුමම්ව කොමලං 'කුසුමකොමලං'-උපමාන පූර්වපද කර්මධාරයඃ.

c. දුර්ජනානාං, දුර්ජනයන්ගේ; මනඃ. සිත; පාෂාණකඨිනං, ගලක්සේ රළුවේ. ස්‍යාත්-ක්‍රියා; මනඃ-උක්තකර්තෘ; පාෂාණ කඨිනං-කර්තෘ විශෙෂණම්; දුර්ජනානාං-අනුක්ත සම්බන්ධඃ; පාෂාණඉව කඨිනං 'පාෂාණ කඨිනං'-උපමාන පූර්වපද කර්මධාරයඃ; 'අස'-භුවි අකර්මකඃ පරස්මෛපදී.

d. පුණ්‍යවතාං, පින්වතුන්ගේ; යශඃ, යසස; ජ්‍යොත්ස්නා ධවලං, සඳරැස්සේ ධවලවේ. ස්‍යාත්-ක්‍රියා; යශඃ-උක්තකර්තෘ; ජ්‍යොත්ස්නාධවලං- කර්තෘවිශෙෂණම්; පුණ්‍යවතාම්- අනුක්ත සම්බන්ධඃ; ජ්‍යොත්ස්නෙව ධවලං 'ජ්‍යොත්ස්නාධවලං'- උපමාන පූර්වපද කර්මධාරයඃ.

e. පණ්ඩිතානාං, පණ්ඩිතයන්ගේ; වචනම්, වචනය; අමෘත මධුරං, අමාවක්සේ මිහිරිවේ. ස්‍යාත්-ක්‍රියා; වචනම්- උක්තකර්තෘ අමෘතමධුරං-කර්තෘවිශෙෂණම්.

f. දුර්මුඛානාං, අයහපත් මුඛ ඇත්තවුන්ගේ; වචන වින්‍යාසඃ, වචනප්‍රයොගය; කුඨාර තීක්ෂ්ණඃ, කෙටේරියසේ තියුණුවේ. ස්‍යාත්-ක්‍රියා; වචන වින්‍යාසඃ-උක්තකර්තෘ; කුඨාරතීක්ෂ්ණඃ කර්තෘවිශෙෂණම්; කුඨාර ඉව තීක්ෂ්ණඃ 'කුඨාරතීක්ෂ්ණඃ'-උප

# 11. ඒකාදශඃ පාඨඃ.

a. නඤ් තත්පුරුෂාදි ප්‍රයොගාඃ,
b. අශුභං භජතෙ ලොකඃ ප්‍රායෙණාත්මද්වෙෂාත්.
c. අනධිගතං වස්තු බහුමන්‍යතෙ ජනඃ.
d. සුපුරුෂො දෘෂ්ටිමාත්‍රෙණොප ස්නෙහයති හෘදයම්

---

මාන පූර්වපද කර්මධාරයඃ; දුෂ්ටං මුඛං යෙෂාංතෙන 'දුර්මුඛං'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; වචනානං වින්‍යාසඃ 'වචනවින්‍යාසඃ'- ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'වචනවින්‍යාස' ශබ්දඃ.

a. නඤ් තත්පුරුෂාදි ප්‍රයොගාඃ, නඤ් තත්පුරුෂාදි ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

b. ලොකඃ, ලෝවැසිතෙම; ප්‍රායෙණ, බොහෝ සෙයින්; ආත්මද්වෙෂාත්, තමාගේ ද්වෙෂය හෙතුකොටගෙන; අශුභං භජතෙ, පාපය සෙවනය කෙරෙයි. භජතෙ-ක්‍රියා; ලොකඃ-උක්තකර්තෘ; අශුභං- අනුක්තකර්ම; ආත්මද්වෙෂාත්- අනුක්තාපාදානම්; න ශුභං 'අශුභං'-නඤ් තත්පුරුෂසමාසඃ; ආත්මනඃ ද්වෙෂඃ 'ආත්මද්වෙෂඃ'- ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගා 'ප්‍රාය' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගා 'අශුභ' ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ගා, 'ආත්මද්වෙෂ' ශබ්දඃ, 'භජ'-සෙවායාම්, සකර්මකඃ ආත්මනෙපදී.

c. ජනඃ, ජනතෙම; අනධිගතං, නොලබනලද; වස්තු, වස්තුව; බහුමන්‍යතෙ, බුහුමන් කෙරෙයි. බහුමන්‍යතෙ-ලට් කර්තෘ කාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ජනඃ- උක්ත කර්තෘ, වස්තු-අනුක්තකර්ම; අනධිගතං-කර්ම විශෙෂණම්; න අධිගතං 'අනධිගතං'-නඤ් තත්පුරුෂඃ; අකාරාන්තක්ලීවලිඞ්ගා 'අනධිගත' ශබ්දඃ; උකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වස්තු' ශබ්දඃ; 'බහු' පූර්වඃ 'මන'-ඥානෙ, සකර්මකඃ ආත්මනෙපදී.

d. සුපුරුෂඃ, මනාපුරුෂතෙම; දෘෂ්ටිමාත්‍රෙණ, දැකුම් පමණින්; හෘදයම්, ළය; උපස්නෙහයති, සිතිඳු කෙරෙයි. උපස්නෙහයති-ලට්ක්‍රියා; සුපුරුෂඃ-උක්තකර්තෘ; හෘදයම්-අනුක්තකර්ම; දෘෂ්ටිමාත්‍රෙණ- අනුක්තකරණම්; සුෂ්ඨුපුරුෂඃ 'සුපුරුෂඃ'-කර්මධාරෙ ප්‍රාදිසමාසඃ; දෘෂ්ටෙඃ මාත්‍රම් 'දෘෂ්ටමාත්‍රම්'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'සුපුරුෂ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'දෘෂ්ටිමාත්‍ර' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'හෘදය' ශබ්දඃ; 'උප' පූර්වඃ 'ස්නිහ'-ප්‍රීතෞ, ණිජන්තඃ, අකර්මකඃ පරස්මෛපදී.

a. අතිරාජඃ ප්‍රභාවොහි තෙජස්විනාම්.

b. නිර්හිමාලයඃ පුරුෂො වාරාණසී මනුප්‍රාප්තඃ.

c. අශ්නීත පිවතා ක්‍රියා නිරන්තරං ප්‍රාවර්තත
යුධිෂ්ඨිරස්‍ය රාජසූයෙ.

---

a. තෙජස්විනාම්, තේජස් ඇත්තවුන්ගේ; ප්‍රභාවඃහි, ප්‍රභාවයවනාහි; අතිරාජඃ, රජුන් ඉක්මවන්නේය. ස්‍යාත්-ලිඞ්ක්‍රියා; ප්‍රභාවඃ-උක්තකර්තෘ; අතිරාජඃ-කර්තෘ විශෙෂණම්; හි-අව්‍යයම්; තෙජස්විනාම්-අනුක්ත සම්බන්ධඃ; අතික්‍රාන්තොරාජානඃ 'අතිරාජඃ'-කර්මධාරෙ ප්‍රාදිසමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'අතිරාජ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රභාව' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගො 'තෙජස්වින්' ශබ්දඃ.

b. නිර්හිමාලයඃ, හිමාලයෙන් නික්මුනාවූ; පුරුෂඃ, පුරුෂ තෙම; වාරාණසීම්, බරණැසට; අනුප්‍රාප්තඃ, පැමිණියේය. අනුප්‍රාප්තඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; පුරුෂඃ-උක්තකර්තෘ; නිර්හිමාලයඃ-කර්තෘ විශෙෂණම්; වාරාණසීම්-අනුක්තකර්ම; හිමාලයඃ නිෂ්ක්‍රාන්තඃ 'නිර්හිමාලයඃ-කර්මධාරෙ ප්‍රාදිසමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නිර්හිමාලය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පුරුෂ' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'වාරාණසී' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'අනුප්‍රාප්ත' ශබ්දඃ; 'අනු' පූර්වඃ 'ප්‍රා'-ප්‍රාප්තෞ, සකර්මකඃ පරස්මෛපදී; [ලට්] ප්‍රාප්නොති, ප්‍රාප්නුතඃ, ප්‍රාප්නුවන්ති.

c. යුධිෂ්ඨිරස්‍ය, යුධිෂ්ඨිර රජහුගේ; රාජසූයෙ, එනම් යාගයෙහි; අශ්නීතපිවතා, කවපොව යන; ක්‍රියා, ක්‍රියා තොමෝ; නිරන්තරං, නිරතුරුව; ප්‍රාවර්තත, පැවැත්තේය; ප්‍රාවර්තත-ලඞ්කර්තෘකාරක ආත්මනෙපද ක්‍රියා; ක්‍රියා-උක්තකර්තෘ; අශ්නීතපිවතා-කර්තෘවිශෙෂණම්; නිරන්තරං-ක්‍රියා විශෙෂණම්; රාජසූයෙ-අනුක්තාධාරඃ; යුධිෂ්ඨිරස්‍ය-අනුක්ත සම්බන්ධඃ; අශ්නීතපිවතෙ ත්‍යෙවං සතතං යත්‍රාභිධියතෙසා 'අශ්නීතපිවතා'-ප්‍රාදිසමාසඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'අශ්නීත පිවතා' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ක්‍රියා' ශබ්දඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'නිරන්තර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'රාජසූය' ශබ්දඃ; 'ප්‍ර' පූර්වඃ 'වෘතු'-වර්තතෙ, අකර්මකඃ ආත්මනෙපදී. [ලඞ්] ප්‍රාවර්තත, ප්‍රාවර්තතාම්; ප්‍රාවර්තන්ත.

a. **උච්චාවචානනං තත්‍ර උපායුඞ්ක්ත ලොකඃ.**
b. **ජන්මාන්තරං නලභතෙ විමුක්තඃ.**
c. **අකුතොභයාඃ සඤ්චරන්ති වීරාඃ.**
d. **ඊෂත් සමාපන්නං කාය්‍යීමසාපන්නමෙව.**

---

a. තත්‍ර, එහි; ලොකඃ, ලෝවැසිතෙම; උච්චාවචාන්නං, නානාවිධ ආහාරය; උපායුඞ්ක්ත, වැළඳී; උපායුඞ්ක්ත-ලට්කතෘ කාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; ලොකඃ-උක්ත කතෘ; උච්චාවචාන්නං-අනුක්තකර්ම; තත්‍ර-අනුක්තාධාරඃ; උදක්ච ආවාක්ච 'උච්චාවචං'-ප්‍රාදිසමාසඃ; උච්චාවචංච තත් අන්නං චෙති 'උච්චාවචාන්නං'- කර්මධාරයඃ; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'උච්චාවචාන්න' ශබ්දඃ; තත්‍ර-තල ප්‍රත්‍යයාන්තමව්‍යයම්; 'උප' පූර්වඃ 'යුජිර්'-යොගෙ, සකර්මකඃ උභයපදී; 'උප' පූර්වකෙ ආත්මනෙපදී; [ලට්] උපායුඞ්ක්ත, උපායුජෙතාම්, උපායුජන්ත.

b. විමුක්තඃ, මිදුණු තැනැත්තේ; ජන්මාන්තරං, අනික්ජන්ම යක්; නලභතෙ, නොලබයි. ලභතෙ-ලට්කතෘකාරක ආත්මනෙපද ක්‍රියා; විමුක්තඃ-උක්තකතෘ; ජන්මාන්තරං-අනුක්තකර්ම; න-අව්‍ය යම්; අන්‍යත්ජන්ම 'ජන්මාන්තරං'-ප්‍රාදිසමාසඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ජන්මාන්තර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'විමුක්ත' ශබ්දඃ; 'ලභ'-ප්‍රාප්තෞ, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

c. වීරාඃ, වීරපුරුෂයෝ; අකුතොභයාඃ, නිර්භයවූවාහු; සඤ්චරන්ති, හැසිරෙති. සඤ්චරති-ලට් කතෘ කාරක පදක්‍රියා; වීරාඃ-උක්තකතෘරඃ; අකුතොභයාඃ-කතෘ විශෙෂණම්; න කුතො භයාඃ 'අකුතොභයාඃ'- නඤ් තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'අකුතොභය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'වීර' ශබ්දඃ; 'සං' පූර්වඃ 'චර'-චරනෙත්‍ය, සකර්මකඃ පරස්මෛපදී.

d. ඊෂත් සමාපන්නං, මදකින් නිමියාවූ; කාය්‍යීං, කාය්‍යීය; අසමාපන්නං එව, නොනිමියේමය. ස්‍යාත්-ආධ්‍යාහාර ලිඞ්ක්‍රියාඃ; කාය්‍යීං-උක්ත ප්‍රකෘති කතෘ; ඊෂත් සමාපන්නං-ප්‍රකෘති කතෘ විශෙ ෂණම්; අසමාපන්නං-විකෘති කතෘ; එව-අවධාරණෙ අව්‍යයම්; ඊෂත් සවලෙපන සමාපන්නං 'ඊෂත් සමාපන්නං'- ප්‍රාදිසමාසඃ; අකා රාන්ත ක්ලීව ලිඞ්ගා 'ඊෂත් සමාපන්න' ශබ්දඃ; න සමාපන්නඃ 'අස මාපන්නඃ'-නඤ් තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'අසමාපන්න' ශබ්දඃ.

# 12. ද්වාදශඃ පාඨඃ.

---

a. බහුව්‍රීහි ප්‍රයෝගාඃ.
b. ආරූඪනෘපං ප්‍රාසාදං පශ්‍යතු භවාන්.
c. ඌඪරථං වාහං විශ්‍රාමයතාං සූතෞ.
d. දත්තධනං විප්‍රමාහ්වයන්තු භවන්තඃ.

---

a. බහුව්‍රීහි ප්‍රයෝගාඃ, බහුව්‍රීහි සමාස ප්‍රයෝගයෝ කියනු ලැබෙත්.

b. භවාන්, පින්වත්තෙම; ආරූඪනෘපං, නැංගාවූ රජඇති; ප්‍රාසාදං, ප්‍රාසාදය; පශ්‍යතු, බලාවා; පශ්‍යතු–ලොට් ක්‍රියා; භවාන් –උක්ත කර්තෘ; ප්‍රාසාදං–අනුක්ත කර්ම; ආරූඪනෘපං–කර්ම විශෙෂණම්; ආරූඪො නෘපොයඃ ස 'ආරූඪනෘපඃ' [ප්‍රාසාදඃ] –ද්විතීයා බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ආරූඪනෘප' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රාසාද' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'භවත්' ශබ්දඃ; 'දෘශිර්'–ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

c. සූතෞ, රථාවාහයෝ දෙදෙන; ඌඪරථං, උසුලනලද රථ ඇති; වාහං, අශ්වයා; විශ්‍රාමයතාං, සතපත්වා. විශ්‍රාමයතාං–ලොට් කර්තෘකාරකක්‍රියා; සූතෞ–උක්ත කර්තාරෞ; වාහං–අනුක්ත කර්ම; ඌඪරථං–කර්ම විශෙෂණම්; ඌඪොරථොයෙන සඃ 'ඌඪරථඃ' [වාහඃ]– තෘතීයා බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ඌඪරථ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'වාහ' ශබ්දඃ; විශ්‍රාමයතු, විශ්‍රාමයතාම්, විශ්‍රාමයන්තු; 'වි' පූර්වඃ 'ශ්‍ර'–මුතසිඛෙදෙච, අකර්මකඃ පරස්මෛපදී.

d. භවන්තඃ, පින්වත්හු; දත්තධනං, දෙනලද ධනඇති; විප්‍රම්, බමුණහු; ආහ්වයන්තු, කැඳවත්වා. ආහ්වයන්තු–ලොට් කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා; භවන්තඃ– උක්ත කර්තාරඃ; විප්‍රම්–අනුක්ත කර්ම; දත්තධනම්-කර්මවිශෙෂණම්; දත්තං ධනං යස්මෛ ස 'දත්තධනං' [විප්‍රං]–චතුර්ථී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දත්තධන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'විප්‍ර' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'භවත්' ශබ්දඃ; ආහ්වයතු, ආහ්වයතාම්, ආහ්වයන්තු; 'ආ' පූර්වඃ 'හෙව්ඤ්'–ස්පර්ධායාම්, ශබ්දෙච, සකර්මකඃ උභයපදී.

**a. උද්ධෘතාන්නං භාජනමුපානය ත්වම්.**
**b. බහුඥානං පුරුෂමාශ්‍රයතං යුවාම්.**
**c. බහුලෝකං ගෘහමිදං ප්‍රවිශත යූයම්.**
**d. කිමත්‍ර කරවාණ්‍යහං මන්දභාග්‍යඃ.**

---

a. ත්වං, තෝ; උද්ධෘතාන්නං, උපුටාගත් ආහාරඇති; භාජනං, භාජනය; උපානය, ගෙනෙව; උපානය–ලෝට් කර්තෘකාරක මධ්‍යම පුරුෂෛක වචනක්‍රියා; ත්වං–උක්ත කර්තෘ; භාජනං–අනුක්ත කර්ම; උද්ධෘතාන්නං–කර්මවිශේෂණම්; උද්ධෘතං අන්නං යස්මාත් තත් 'උද්ධෘතාන්නං' [භාජනං]–පඤ්චමී බහුව්‍රීහිඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'උද්ධෘතාන්න'–ශබ්දඃ, අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'භාජන' ශබ්දඃ; දකාරාන්ත 'යුෂ්මද්' ශබ්දඃ; උපානයතු, උපානයතාම්, උපානයන්තු; 'උප', 'ආ' පූර්වඃ 'නීඤ්'–ප්‍රාපණේ, භ්වාදි ද්විකර්මකඃ උභයපදී.

b. යුවාම්, තෙපි දෙදෙන; බහුඥානං, බොහෝ නුවණැති පුරුෂං, පුරුෂයකු; ආශ්‍රයතං, ආශ්‍රය කරහු. ආශ්‍රයතාම්–ලෝට් ක්‍රියා; යුවාම්–උක්තකර්තෘ; පුරුෂං–අනුක්තකර්ම; බහුඥානං–කර්මවිශේෂණම්; බහූනි ඥානානි යස්‍යසඃ 'බහුඥානඃ' [පුරුෂඃ]–ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'බහුඥාන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'පුරුෂ' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'ශ්‍රිඤ්'–සේවායාම්, භ්වාදි සකර්මකඃ උභයපදී.

c. යූයම්, තෙපි; බහුලෝකං, බොහෝ ජනයා ඇති; ඉදං ගෘහං, මේගෙට; ප්‍රවිශත, ප්‍රවේශවව්. ප්‍රවිශත–ලෝට් ක්‍රියා; යූයං–උක්තකර්තාරඃ; ගෘහං– අනුක්තකර්ම; බහුලෝකං–කර්තෘවිශේෂණම් බහවො ලෝකාඃ යස්මින් තත් 'බහුලෝකඃ' [ගෘහං]–සප්තමී බහුව්‍රීහිඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'බහුලෝක' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'ගෘහ' ශබ්දඃ; මකාරාන්ත 'ඉදම්' ශබ්දඃ; 'ප්‍ර' පූර්වඃ 'විශ'–ප්‍රවේශනෙ, තුදාදි සකර්මකඃ පරස්මෛපදී.

d. මන්දභාග්‍යඃ, පින්මදවූ; අහං, මම; අත්‍ර, මෙහි; කිංකරවාණි, කුමක්කෙරෙම්ද? කරවාණි–ලෝට් කර්තෘකාරක ක්‍රියා; අහං–උක්තකර්තෘ; මන්දභාග්‍යඃ–කර්තෘවිශේෂණම්; කිං–අනුක්තකර්ම අත්‍ර–ත්‍රල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; මන්දං භාග්‍යං යස්‍යාසෞ 'මන්දභාග්‍යඃ'(නරඃ)–ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'මන්දභාග්‍ය' ශබ්දඃ; මකාරාන්ත 'කිම්' ශබ්දඃ; කරෝතු, කුරුතාම්, කුර්වන්තු; කුරු, කුරුතම්, කුරුත; කරවාණි, කරවාව, කරවාම්; 'ඩුකෘඤ්'–කරණේ, සකර්මකඃ උභයපදී.

**a. හෘත සර්ව්ස්වාවාවාං කථං ප්‍රතිකරවාව.**
**b. මන්දභාග්‍යාවයං කථං ප්‍රභවාම ප්‍රතිඥාං ලබ්ධුම්**
**c. බහු භාර්‍ය්‍යො දුඃඛං ජීවති.**
**d. ලබ්ධඥො න ඛිද්‍යතෙ කදාචිත්.**
**e. අපුත්‍රො වංශලොපාත් ශඞ්කතෙ.**

---

a. හෘතසර්ව්ස්වෞ, පැහැරගන්නාලද සියලු අයිති දෑ ඇති; ආවාම්, අපි දෙදෙන; කථං, කෙසේ; ප්‍රතිකරවාව, ප්‍රතික්‍රියාකරමුද? ප්‍රතිකරවාව-ලොට් ක්‍රියා; කථං-ථං ප්‍රත්‍යයාන්තමව්‍යයම්; හෘතං සර්ව්ස්වං යයොස්තෞ 'හෘත සර්ව්ස්වං' (නරෞ)-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'හෘතසර්ව්ස්ව' ශබ්දඃ; දකාරාන්ත 'අස්මද්' ශබ්දඃ; 'ප්‍රති' පූර්ව්ඃ 'ඩුකෘඤ්'-කරණෙ, සකර්ම්කඃ උභයපදී.

b. මන්දභාග්‍යාඃ, මඳපින් ඇති; වයං, අපි; ප්‍රතිඥාං, පිහිටක් ලබ්ධුම්, ලබන්ට; කථං, කෙසේ; ප්‍රභවාම, පොහොසත් වෙමුද? ප්‍රභවාම-ලොට්ක්‍රියා; වයං-උක්තකර්තෘඃ; මන්දභාග්‍යාඃ-කර්තෘ විශෙෂණම්; කථං-ථමු ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; ලබ්ධුම්-ක්‍රියා ප්‍රතිරූපක තුමන්ත මව්‍යයම්; ප්‍රතිඥාම්-අනුක්තකර්ම්; මන්දං භාග්‍යං යෙෂාන්තෙ 'මන්ද භාග්‍යාඃ' (නරාඃ)-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'මන්දභාග්‍ය' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ප්‍රතිඥා' ශබ්දඃ; 'ප්‍ර' පූර්ව්ඃ 'භූ'-සත්තායාම්, අකර්ම්කඃ පරස්මෛපදී.

c. බහුභාර්‍ය්‍යඃ, බොහෝ භාර්‍ය්‍යාවන් ඇත්තේ; දුඃඛං, දුකසේ; ජීවති, ජීවත්වේ. ජීවති-ලට්ක්‍රියා; බහුභාර්‍ය්‍යඃ- උක්තකර්තෘ; දුඃඛං-ක්‍රියා විශෙෂණම්; බහව්‍යඃ භාර්‍ය්‍යාඃ යස්‍ය සෞ 'බහු භාර්‍ය්‍යඃ' (නරඃ)-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බහු භාර්‍ය්‍ය' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'දුඃඛ' ශබ්දඃ; 'ජීව'-ප්‍රාණ ධාරණෙ, අකර්මකඃ පරස්මෛපදි.

d. ලබ්ධඥනඃ, ලබනලද නුවණ ඇත්තේ; කදාචිත්, කිසි කලෙකත්; නඛිද්‍යතෙ, ඛෙදයට නොපැමිණේ ඛිද්‍යතෙ-ලට් ක්‍රියා; ලබ්ධඥනඃ-උක්තකර්තෘ; න-අව්‍යයම්; කදාචිත්-කාලාර්ථ අව්‍යයම්; ලබ්ධඥනං යස්‍යසඃ 'ලබ්ධඥනඃ' (පුරුෂඃ)- ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ලබ්ධඥන' ශබ්දඃ; 'ඛිද'-දෛන්‍යෙ, දිවාදි අකර්ම්කඃ ආත්මනෙපදී.

e. අපුත්‍රඃ, දරුවන් නැත්තේ; වංශලොපාත්, වංශවිනාශයෙන්; ශඞ්කතෙ, සැකවේ. ශඞ්කතෙ-ලට්ක්‍රියා; අපුත්‍රඃ-උක්තකර්තෘ; වංශලොපාත්-අනුක්තාපාදනම්; නාස්ති පුත්‍රොයස්‍යසඃ

a. ප්‍රබලො නාර්හති දුර්බලං පීඩයිතුම්.
b. නිර්ධනො දුඃඛං පුෂ්ණාති පරිජනම්.
c. අතිමර්‍යාදඃ කං ජනං නාවජානාති.
d. ශස්ත්‍රපාණිඃ පුරුෂො භීෂයතෙ බාලම්,

---

'අපුත්‍රඃ' [නරඃ]-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ග 'අපුත්‍ර' ශබ්දඃ; වංශස්‍ය ලොපඃ 'වංශලොපඃ'-ෂෂ්ඨීතත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'වංශලොප' ශබ්දඃ; 'ශකි'-ශඞ්කායාම්, අකර්මකඃ ආත්මනෙපදී.

a. ප්‍රබලඃ, ශක්තිමත් තැනැත්තේ; දුර්බලං, දුර්වලයා; පීඩයිතුං, පෙළන්ට; න අර්හති, නුසුදුසුයි. අර්හති - ලට්ක්‍රියා; ප්‍රබලඃ-උක්තකර්තෘ; පීඩයිතුම්-ක්‍රියාවාචීතුමන්තමව්‍යයම්; දුර්බලං-අනුක්තකර්ම; ප්‍රකෘෂ්ටං බලං යස්‍යසෞ 'ප්‍රබලඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රබල' ශබ්දඃ; දුෂ්ටං බලං යස්‍යසඃ 'දුර්බලඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දුර්බල' ශබ්දඃ; අර්හති, අර්හතඃ; අර්හන්ති; 'අර්හ' පූජායාම්; සකර්මකඃ පරස්මෛපදී.

b නිර්ධනඃ, නිර්ධන තැනැත්තේ; දුඃඛං, දුකසේ; පරිජනම්, පිරිවරජනයා; පුෂ්ණාති, පොෂණය කෙරෙයි. පුෂ්ණාති-ලට්ක්‍රියා; නිර්ධනඃ-උක්තකර්තෘ; පරිජනම්-අනුක්තකර්ම; දුඃඛං-ක්‍රියාවිශෙෂණම්; නිර්ගතං ධනං යස්මාත්සඃ 'නිර්ධනඃ'-පඤ්චමී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නිර්ධන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීබලිඞ්ගො 'දුඃඛ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පරිජන' ශබ්දඃ, පුෂ්ණාති, පුෂ්ණීතඃ, පුෂ්ණන්ති; 'පුෂ'-පුෂ්ටෞ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

c. අතිමර්‍යාදඃ, සීමා ඉක්මවූ තැනැත්තේ හෙවත් තුලා ඉක්මවූ තැනැත්තේ; කං ජනං, කවර ජනයකුට; න අවජානාති, අවමන් නො කෙරේද? අවජානාති-ලට්ක්‍රියා; අතිමර්‍යාදඃ-උක්තකර්තෘ; ජනම්-අනුක්තකර්ම; කං-කර්මවිශෙෂණම්; න-අව්‍යයම්; අතික්‍රාන්තාමර්‍යාදායෙන සඃ 'අතිමර්‍යාදඃ'-තෘතීයා බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ග 'අතිමර්‍යාද' ශබ්දඃ; මකාරාන්ත 'කිම්' ශබ්දඃ; පුංසිද්විතීයා; අවජානාති, අවජානීතඃ, අවජානන්ති; 'අව' පූර්වඃ 'ඥා' අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

d. ශස්ත්‍රපාණිඃ, අවිගත් අත්ඇති; පුරුෂඃ, පුරුෂතෙම; බාලම්, බාලයා; භීෂයතෙ, බියගන්වයි. භීෂයතෙ-ලට්ක්‍රියා; පුරුෂඃ-උක්තකර්තෘ; ශස්ත්‍රපාණිඃ-කර්තෘ විශෙෂණම්; බාලම්-

**a. දෘෂ්ට දෙශා ජනා රඤ්ජයන්ති ලොකං විවිධෙන කථාප්‍රසඞ්ගෙන.**

**b. සපුත්‍රෙ මෛත්‍රො ගෘහමාගතඃ.**

**c. කොෂධනඃ පථි ක්ලෙශමනුභවති.**

---

අනුක්තකර්ම; ශස්ත්‍රං පාණෞ යස්‍ය සඃ 'ශස්ත්‍රපාණිඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; ඉකාරාන්ත පුංලිඞ්ගො 'ශස්ත්‍රපාණි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පුරුෂ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බාල' ශබ්දඃ; භීෂයතෙ, භීෂයෙතෙ, භීෂයන්තෙ; 'භී'-භයෙ, ජුහොත්‍යාදි අකර්මකඃ පරස්මෛපදී; ණිජන්තඃ අනිට්; බිභෙති, බිභිතඃ, බිභ්‍යති;'භී'-භයෙ, අකර්මකඃ පරස්මෛපදී.

a. දෘෂ්ටදෙශඃ, දක්නාලද දෙශඇති; ජනඃ, ජනතෙම; විවිධෙන, නානාවිධවූ; කථාප්‍රසඞ්ගෙන, කථා ප්‍රවෘත්තියෙන්;ලොකං, ලෝවැස්සා; රඤ්ජයන්ති, රඳවයි හෙවත් සිත්අලවයි. රඤ්ජයන්ති-ලට්ක්‍රියා; ජනඃ-උක්තකර්තෘ; දෘෂ්ටදෙශඃ-කර්තෘ විශෙෂණම්; ලොකං-අනුක්තකර්ම; කථා ප්‍රසඞ්ගෙන- අනුක්තකරණම්; විවිධෙන-කරණ විශෙෂණම්; දෘෂ්ටඃ දෙශඃ යෙනාසෞ 'දෘෂ්ටදෙශඃ'-තෘතීයාබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'දෘෂ්ටදෙශ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'විවිධ' ශබ්දඃ; කථායාඃ ප්‍රසඞ්ගඃ 'කථාප්‍රසඞ්ගඃ-තෙන ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගො 'කථාප්‍රසඞ්ග' ශබ්දඃ; රඤ්ජයති, රඤ්ජයතඃ, රඤ්ජයන්ති; 'රඤ්ජ'-රාගෙ, දිවාදි අකර්මකඃ උභයපදී; ණිජන්තඃ අනිට්; රඤ්ජයති, රඤ්ජයතඃ, රඤ්ජයන්ති.

b. සපුත්‍රඃ, පුත්‍රයන් සහිතවූ; මෛත්‍රඃ, මෛත්‍රතෙම; ගෘහං, ගෙට; ආගතඃ, ආයේය, ආගතඃ-කෘදන්තකර්තෘකාරකක්‍රියා; මෛත්‍රඃ-උක්තකර්තෘ; සපුත්‍රඃ-කර්තෘ විශෙෂණම්,ගෘහං-අනුක්තකර්ම;සහ පුත්‍රෙණවර්තත ඉති 'සපුත්‍රඃ'-සහපූර්වපදබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'සපුත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'මෛත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ආගත' ශබ්දඃ; ආගතඃ, ආගතෞ, ආගතාඃ; 'ආ' පූර්වඃ 'ගමෟ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

c. කොෂධනඃ, කොෂයෙහි ධන ඇත්තේ හෙවත් භාණ්ඩාගාරයෙහි ධන ඇත්තේ; පථි, මාර්ගයෙහි; ක්ලෙශම් අනුභවති, දුක්විඳී. අනුභවති-ලට්ක්‍රියා; කොෂධනඃ-උක්තකර්තෘ; ක්ලෙශම්-අනුක්තකර්ම; පථි-අනුක්තාධාරඃ; කොෂෙධනං යස්‍ය සඃ 'කොෂධනඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්තපුංලිඞ්ගො 'කොෂධන' ශබ්දඃ;

. තුරඞ්ගවදනාඃ කින්නරා භවන්ති.
b. චිත්‍රාණි දිනානි තත්‍ර උවාස මෛත්‍රඃ.
c. දණ්ඩාදණ්ඩි යුද්ධමභවත්.
d. දීර්ඝාක්ෂඃ පුරුෂ ආයාති.

---

නකාරාන්තපුංලිඞ්ගෝ 'පපින්' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගෝ 'කෙලශ' ශබ්දඃ; 'අනු' පූර්වඃ 'භූ' සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී; 'අනු' පූර්වතො සකර්මකඃ පරස්මෛපදී.

a. කින්නරාඃ, කිඳුරෝ හෙවත් කිම්පුරුෂයෝ; තුරඞ්ගවදනාඃ භවන්ති, අශ්වයන්ට බඳු මුහුනු ඇතිවෙත්. භවන්ති–ලට් ක්‍රියා; කින්නරාඃ–උක්තකර්තෘ; තුරඞ්ගවදනාඃ–කර්තෘ විශෙෂණම්; තුරඞ්ගස්‍යවදනමිව වදනංයෙෂාංතෙ 'තුරඞ්ගවදනාඃ'–ෂෂ්ඨීබහුව්‍රීහිඃ, අකාරාන්තපුංලිඞ්ගෝ 'තුරඞ්ගවදන' ශබ්දඃ; අකාරාන්තපුංලිඞ්ගෝ 'කින්නර' ශබ්දඃ; 'භූ'–සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

b. මෛත්‍රඃ, මෛත්‍රතෙම; තත්‍ර, එහි; චිත්‍රාණිදිනානි, දෙතුන් දිනක්; උවාස, විසී. උවාස–ලිට්ක්‍රියා; මෛත්‍රඃ–උක්තකර්තෘ; දිනානි–අත්‍යන්ත සංයොග ද්විතීයා; චිත්‍රාණි–තත්විශෙෂණම්, තත්‍ර–අනුක්තාධාරඃ. ද්වෙවා ත්‍රීණිවා 'චිත්‍රාණි'–සංඛ්‍යාතබහුව්‍රීහිඃ; අකාරාන්ත නපුංසකලිඞ්ගෝ 'චිත්‍ර' ශබ්දඃ; බහුවචනාන්තඃ; අකාරාන්ත නපුංසකලිඞ්ගෝ 'දින' ශබ්දඃ; තස්මින්නිති 'තත්‍ර'–ත්‍රල්ප්‍රත්‍යයාන්තමව්‍යයම්; උවාස, ඌෂතුඃ, ඌෂුඃ; 'වස'–නිවාසෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

c. දණ්ඩාදණ්ඩි, දණ්ඩෙන් දණ්ඩ පැහැර පවත්නාවූ; යුද්ධම්, යුද්ධයක්; අභවත්, වී; අභවත්–ලඞ්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචන ක්‍රියා; යුද්ධම්–උක්තකර්තෘ; දණ්ඩාදණ්ඩි–කර්තෘ විශෙෂණම්; දණ්ඩෛශ්ච දණ්ඩෛශ්ච ප්‍රහෘත්‍යෙදං යුද්ධං ප්‍රවෘත්තමිති 'දණ්ඩාදණ්ඩි'–ව්‍යතිහාර ලක්ෂණ බහුව්‍රීහිඃ; ඉකාරාන්ත නපුංසකලිඞ්ගෝ 'දණ්ඩාදණ්ඩි' ශබ්දඃ; අකාරාන්ත නපුංසක ලිඞ්ගෝ 'යුද්ධ' ශබ්දඃ; අභවත්, අභවතාම්, අභවන්; 'භූ'–සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

d. දීර්ඝාක්ෂඃ, දිගු ඇස්ඇති; පුරුෂඃ, පුරුෂතෙම; ආයාති, එයි. ආයාති–ලට්ක්‍රියා; පුරුෂඃ–උක්තකර්තෘ; දීර්ඝාක්ෂඃ–කර්තෘ විශෙෂණම්; දීර්ඝේ අක්ෂිණී යස්‍යසෞ 'දීර්ඝාක්ෂඃ'–ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'දීර්ඝාක්ෂ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'පුරුෂ' ශබ්දඃ; ආයාති, ආයාතඃ, ආයාන්ති; 'ආ' පූර්වඃ 'යා'–ප්‍රාපණෙ, සකර්මකඃ පරස්මෛපදී.

**a. බහුධර්මා පුරුෂො'වගීයතෙ.**
**b. බහුප්‍රජා දරිද්‍රඃ ක්ලෙශෙන ක්ෂිපති කාලම්.**
**c. ශාස්ත්‍රාර්ථං ධාරයත් සුමෙධාඃ.**
**d. බහුජනිර් බ්‍රාහ්මණො නජානාති දම්පත්‍ය සුඛම්.**

---

a. බහුධර්මා, බොහෝ ධර්ම ඇති; පුරුෂඃ, පුරුෂතෙම; අව ගීයතෙ, අවමන් කරනු ලැබේ අවගීයතෙ-ලට් කර්මකාරක ආත්මනෙපද ක්‍රියා; පුරුෂඃ-උක්තකර්ම; බහුධර්මා-කර්ම විශෙෂණම්; බහුධර්මොයස්‍යසඃ 'බහුධර්මඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'බහුධර්මින්' ශබ්දඃ; ගායති, ගායතඃ, ගායන්ති; කර්මණි-ගීයතෙ, ගීයෙතෙ, ගීයන්තෙ; 'ගෛ'-ශබ්දඃ, භවාදි සකර්මකඃ පරස්මෛපදී.

b. බහුප්‍රජඃ, බොහෝ දරුවන් ඇති; දරිද්‍රඃ, දිළිඳුතෙම; ක්ලෙශෙන, දුකසේ; කාලම්, කාලය; ක්ෂිපති-ලට්ක්‍රියා; දරිද්‍රඃ-උක්තකර්තෘ;ක්ලෙශෙන-ක්‍රියාවිශෙෂණෙ තෘතියා; බහුප්‍රජඃ-කර්තෘ විශෙෂණම්; කාලම්-අනුක්තකර්ම; බහවඃ ප්‍රජඃ යස්‍යසඃ 'බහු ප්‍රජඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; සකාරාන්ත පුංලිඞ්ගා 'බහුප්‍රජස්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දරිද්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ක්ලෙශ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කාල' ශබ්දඃ; ක්ෂිපති, ක්ෂිපතඃ, ක්ෂිපන්ති; 'ක්ෂිප'-ප්‍රෙරණෙ, තුදාදි සකර්මකඃ උභය පදී.

c. සුමෙධාඃ, මහානුවණැත්තේ; ශාස්ත්‍රාර්ථං, ශාස්ත්‍රාර්ථය; ධාරයති, ධරයි. ධාරයති-ලට්ක්‍රියා; සුමෙධඃ-උක්තකර්තෘ; ශාස්ත්‍රාර්ථං-අනුක්තකර්ම; ශාස්ත්‍රස්‍ය අර්ථඃ 'ශාස්ත්‍රාර්ථඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'ශාස්ත්‍රාර්ථ' ශබ්දඃ; සොභනා මෙධා යස්‍යසඃ 'සුමෙධාඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; සකාරාන්ත පුංලිඞ්ගා 'සුමෙධස්'ශබ්දඃ; ධාරයති, ධාරයතඃ, ධාරයන්ති; 'ධෘඤ්'-ධාරණෙ; තුදාදි අකර්මකඃ ආත්මනෙපදී.

d. බහුජනිඃ, බොහෝ භාර්‍යාවන් ඇති; බ්‍රාහ්මණඃ, බමුණු තෙම; දම්පත්‍ය සුඛම්, අඹුසැමි සැපය; නජානාති, නොදනී. ජානාති-ලට්ක්‍රියා; බ්‍රාහ්මණඃ-උක්තකර්තෘ; බහුජනිඃ-කර්තෘ විශෙෂණම්; දම්පත්‍ය සුඛම්-අනුක්තකර්ම; න-අව්‍යයම්; බහ්වො ජායා යස්‍යාසෞ 'බහුජනිඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; ඉකාරාන්ත පුංලිඞ්ගා 'බහු ජනි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'බ්‍රාහ්මණ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'දම්පත්‍ය සුඛ' ශබ්දඃ; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

a. ව්‍යූඪෝරස්කඃ පුරුෂො බලවාන් භවති.
b. නදීමාතෘකෙ දෙශෙ කෘෂිජීවිනඃ සුඛං නිවසන්ති.

## 13 ත්‍රයොදශඃ පාඨඃ.

c. චන්ව ප්‍රයොගාඃ.
d. රාමලක්‍ෂ්මණෞ ගච්ඡතඃ.
e. බ්‍රාහ්මණ ක්‍ෂත්‍ර වෛශ්‍යශූද්‍රාඃ සමාහූතා රාජසභායාම්.

---

a. ව්‍යූඪෝරස්කඃ, පළල්වූ ළය ඇති; පුරුෂඃ, පුරුෂතෙම; බලවාන් භවති, ශක්තිමත් වේ. භවති-ලටික්‍රියා; පුරුෂඃ-උක්ත කර්තෘ; ව්‍යූඪෝරස්කඃ-කර්තෘ විශෙෂණම්; බලවාන්-කර්තෘ විශෙෂණම්; ව්‍යූඪඃ උරඃ යස්‍යසඃ 'ව්‍යූඪෝරස්කඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'ව්‍යූඪෝරස්ක' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගා 'බලවත්' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

b. නදීමාතෘකඃ, නදීජලයෙන් උපදනා ශස්‍යඇති; දෙශෙ, දෙශයෙහි; කෘෂිජීවිනඃ, ගොවිකමින් ජීවත්වන්නාහු; සුඛං,සැප සේ; නිවසන්ති, වෙසෙත්. නිවසන්ති-ලට්ක්‍රියා, කෘෂිජීවිනඃ-උක්තකර්තෘ; දෙශෙ-අනුක්තාධාරඃ; නදීමාතෘකෙ-ආධාරවිශෙෂණම්; සුඛං-ක්‍රියා විශෙෂණම්; නදීමාතා යස්‍යාසෞ 'නදීමාතෘකඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'නදීමාතෘක' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දෙශ' ශබ්දඃ; නකාරාන්තපුංලිඞ්ගා 'කෘෂිජීවින්' ශබ්දඃ, නිවසති, නිවසතඃ, නිවසන්ති; 'නි' පූර්ව 'වස'-නිවාසෙ, භවාදි අකර්මකඃ පරස්මෛපදී.

c. චන්ව ප්‍රයොගාඃ, ද්වන්ද්ව සමාස ප්‍රයොගයෝ කියනු ලැබෙත්.

d. රාමලක්‍ෂ්මණෞ, රාමලක්‍ෂ්මණ දෙදෙන; ගච්ඡතඃ, යෙත්. ගච්ඡතඃ-ලට්ක්‍රියා; රාමලක්‍ෂ්මණෞ-උක්තකර්තාරෞ; (ග්‍රාමම්-අනුක්ත අධ්‍යාහෘත කර්ම); රාමශ්ච ලක්‍ෂ්මණශ්ච 'රාමලක්‍ෂ්මණෞ'-ඉතරෙතර යොග චන්ව සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'රාමලක්‍ෂ්මණ' ද්විවචනාන්තඃ ශබ්දඃ; 'ගම්ෲ'-ගතෞ, භවාදි සකර්මකඃ පරස්මෛපදී.

e. රාජසභායාම්, රාජසභායෙහි; බ්‍රාහ්මණ ක්‍ෂත්‍ර වෛශ්‍ය ශූද්‍රාඃ, බ්‍රාහ්මණ ක්‍ෂත්‍රිය වෛශ්‍ය ශුද්‍ර යන චතුර්වර්ණයෝ; සමාහූතාඃ, කැඳවනලදහ. සමාහූතාඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා;

**a. ශ්‍රුතිනෙත්‍රං සුඛයති අමෘත භාෂිත ශිශුමුඛම්.**
**b. හස්තපාදං න ප්‍රසරති මෙ හිමජඩම්.**
**c. හස්ත්‍යශ්ව රථ පදාතං සමස්තං ප්‍රණෂ්ටම්.**

---

බ්‍රාහ්මණ ක්‍ෂත්‍ර වෛශ්‍ය ශුද්‍රාඃ–උක්තකර්ම; රාජසභායාම්–අනුක්තාධාරඃ; බ්‍රාහ්මණශ්ච ක්‍ෂත්‍රියශ්ච වෛශ්‍යශ්ච ශුද්‍රශ්ච 'බ්‍රාහ්මණ ක්‍ෂත්‍ර වෛශ්‍ය ශුද්‍රාඃ'–ඉතරෙතර යොග ද්වන්ද්ව සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බ්‍රාහ්මණ ක්‍ෂත්‍ර වෛශ්‍ය ශුද්‍ර' ශබ්දඃ, බහුවචනාන්තඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'රාජසභා' ශබ්දඃ; රාඥඃ සභා 'රාජසභා'–ෂෂ්ඨී තත්පුරුෂඃ, 'සම්', 'ආ' පූර්වඃ 'ශෙවස්ද්'–සපඞ්ක්ත්‍යාම්, ශබ්දෙච, සකර්මකඃ උභය පදී.

a. අමෘතභාෂිත ශිශුමුඛං, අමාවැනි තෙපුල්ඇති ළදරු මුඛය තෙම; ශ්‍රැතිනෙත්‍රං, කන්නෙත්; සුඛයති සුවපත් කෙරෙයි. සුඛයති–ලට් ක්‍රියා; අමෘතභාෂිතශිශුමුඛං–උක්තකර්තා; ශ්‍රැති නෙත්‍ර–අනුක්තකර්ම; අමෘතමිව භාෂිතං යස්‍ය තත් 'අමෘතභාෂිතම්', ශිශොර්මුඛං 'ශිශුමුඛං', අමෘතභාෂිතඤ්ච තත් ශිශුමුඛඤ්ච 'අමෘතභාෂිත ශිශුමුඛං'–බහුව්‍රීහි තත්පුරුෂගර්භ කර්මධාරය සමාසඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'අමෘතභාෂිත ශිශුමුඛ' ශබ්දඃ, ශ්‍රැතිශ්ච නෙත්‍රශ්ච 'ශ්‍රැතිනෙත්‍රං'-සමාහාර ද්වන්ද්ව සමාසඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගඃ 'ශ්‍රැතිනෙත්‍ර' ශබ්දඃ, ද්විතීයාන්තඃ; සුඛයති, සුඛයතඃ, සුඛයන්ති-නාමධාතුඃ, සකර්මකඃ පරස්මෛ පදී.

b. මෙ, මාගේ; හිමජඩම්, හිමයෙන් සිහිල්වූ; හස්තපාදං, අත්පා; නප්‍රසරති, දිගු නොවේ. ප්‍රසරති–ලට්ක්‍රියා; හස්තපාදං–උක්තකර්තා; හිමජඩම්–කර්තෘ විශෙෂණම්; මෙ–අනුක්ත සම්බන්ධම්; න–අව්‍යයම්; හස්තෞච පාදෞච 'හස්තපාදං'–සමාහාර ද්වන්ද්ව සමාසඃ, එකවචනාන්තඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'හස්තපාද'ශබ්දඃ; හිමෙනජඩම් 'හිමජඩම්'–තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'හිමජඩ'ශබ්දඃ; ප්‍රසරති, ප්‍රසරතඃ, ප්‍රසරන්ති; 'ප්‍ර'පූර්ව 'සෘ'–ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

c. සමස්තං, සියලු; හස්ත්‍යශ්ව රථ පදාතං, ඇත් අස් රිය පාබල යන සිව්රඟ සෙනඟ; ප්‍රණෂ්ටම්, නටුයේය. ප්‍රණෂ්ටම්–කෘදන්ත කර්මකාරකක්‍රියා; හස්ත්‍යශ්වරථපදාතං–උක්තකර්තා; සමස්තං–කර්තෘ විශෙෂණම්; හස්තිනශ්ච අශ්වාශ්ච රථාශ්ච පාදතාශ්ච 'හස්ත්‍යශ්වරථපදාතං'–සමාහාර ද්වන්ද්ව සමාසඃ, එකවචනාන්තඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'හස්ත්‍යශ්ව රථපදාත' ශබ්දඃ; අකාරාන්ත

**a. ගඞ්ගා ශෝණං න මයා දෘෂ්ටම්.**
**b. දංශමශකං ජන්තූනාං නිද්‍රාවිඝාතකම්.**
**c. අහිනකුලං පරස්පරං නිත්‍යවිරුද්ධම්.**
**d. කුශකාශං ශෝභතෙ.**

---

ක්ලීව ලිඞ්ග 'සමස්ත' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'ප්‍රණෂ්ට' ශබ්දඃ; 'ප්‍ර' පූර්වඃ 'නශ'-අදර්ශනෙ, අකර්මකඃ පරස්මෛපදී, [ලට්] ප්‍රණශ්‍යති, ප්‍රණශ්‍යතඃ, ප්‍රණශ්‍යන්ති.

a. මයා, මාවිසින්; ගඞ්ගාශෝණං, ගඞ්ගානදිය හා ශෝණ නම් හොය; නදෘෂ්ටම්, නොදක්නා ලද්දේය. දෘෂ්ටම්-කෘදන්තකර්ම කාරකක්‍රියා; ගඞ්ගාශෝණං-උක්තකර්ම; මයා-අනුක්තකර්තෘ; න-අව්‍යයම්; ගඞ්ගාච ශෝණශ්ච 'ගඞ්ගාශෝණං'-සමාහාර ද්වන්ද්ව සමාසඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'ගඞ්ගාශෝණ' ශබ්දඃ, එකවචනාන්තඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'දෘෂ්ට' ශබ්දඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී; [ලට්] පශ්‍යති, පශ්‍යතඃ, පශ්‍යන්ති.

b. දංශමශකං, මැසිමදුරුතෙම; ජන්තූනාං, සත්වයන්ගේ; නිද්‍රාවිඝාතකම්, නිදි නසන්නේවේ. ස්‍යාත්-අධ්‍යාහාර ලිඞ්ක්‍රියා; දංශමශකං-උක්තකර්තෘ; නිද්‍රාවිඝාතකම්-කර්තෘ විශෙෂණම්; ජන්තූනාං-අනුක්ත සම්බන්ධඃ; දංශාශ්ච මශකාශ්ච 'දංශමශකං'-සමාහාර ද්වන්ද්ව සමාසඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'දංශමශක' ශබ්දඃ, එකවචනාන්තඃ; උකාරාන්ත පුංලිඞ්ගෝ 'ජන්තු' ශබ්දඃ; නිද්‍රායාඃ විඝාතකම් 'නිද්‍රාවිඝාතකම්'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'නිද්‍රාවිඝාතක' ශබ්දඃ;

c. අහිනකුලං, සපු හා මුගටිතෙම; පරස්පරං, ඔවුනොවුන්ට; නිත්‍ය විරොධම්, නිත්‍යයෙන් විරුද්ධයි; ස්‍යාත්-අධ්‍යාහාර ලිඞ්ක්‍රියා; අහිනකුලං-උක්තකර්තෘ; නිත්‍යවිරුද්ධම්-කර්තෘ විශෙෂණම්; පරස්පරං-ක්‍රියාවිශෙෂණම්; අහිශ්චනකුලශ්ච 'අහිනකුලං'-සමාහාර ද්වන්ද්ව සමාසඃ, එකවචනාන්තඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'අහිනකුල' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'පරස්පර' ශබ්දඃ; නිත්‍යං විරුද්ධං 'නිත්‍යවිරුද්ධං'-ද්විතීයා තත්පුරුෂඃ

d කුශකාශං, කුශතණ හා වැලුක්; ශෝභතෙ, හොබී. ශෝභතෙ-ලට්ක්‍රියා; කුශකාශං-උක්තකර්තෘ; කුශාශ්චකාශාශ්ච 'කුශකාශං'-සමාහාර ද්වන්ද්ව සමාසඃ; එකවචනාන්තඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'කුශකාශ' ශබ්දඃ; 'ශුභ'-දීප්තෞ, හවාදි අකර්මකඃ ආත්මනෙපදී.

**a. ශිශිර වසන්තෞ පර්‍ය්‍යායෙන ප්‍රවර්‍තෙතෙ.**

**b. පිතරෞ න සෙවන්තෙ කුපුත්‍රාඃ.**

**c. මාතාපිතරෞ ප්‍රණමන්ති පුත්‍රාඃ.**

**d. සූර්‍ය්‍ය චන්ද්‍රමසෞ පර්‍ය්‍යායෙණ පශ්‍යන්ති ලොකාඃ.**

---

a. ශිශිරවසන්තෞ, ශිශිර වසන්ත ඍතු දෙදෙන; පර්‍ය්‍යායෙන, ක්‍රමයෙන්; ප්‍රවර්‍තෙතෙ, පවතිත්. ප්‍රවර්‍තෙතෙ-ලට්ක්‍රියා; ශිශිරවසන්තෞ-උක්තකර්‍තාරෞ; පර්‍ය්‍යායෙන-අනුක්තකරණම්; ශිශිරශ්ච වසන්තශ්ච 'ශිශිරවසන්තෞ'-ඉතරෙතර යොග ද්වන්ද්ව සමාසඃ, ද්විවචනාන්තඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ශිශිරවසන්ත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පර්‍ය්‍යාය' ශබ්දඃ; 'ප්‍ර' පූර්‍ව 'වෘතු'-වර්‍තනෙ, භ්වාදි අකර්‍මක ආත්මනෙ පදී.

b. කුපුත්‍රාඃ, නින්දිත පුත්‍රයෝ; පිතරෞ, මව්පිය දෙදෙනා; න සෙවන්තෙ, සේවනය නො කෙරෙත්. සෙවන්තෙ-ලට්ක්‍රියා; කුපුත්‍රාඃ-උක්තකර්‍තාරඃ; පිතරෞ-අනුක්තකර්‍ම; න-අව්‍යයම්; තා ච පිතා ච 'පිතරෞ'-එකශෙෂ ද්වන්ද්ව සමාසඃ, ද්විවචනාන්තඃ; ඍකාරාන්ත පුංලිඞ්ගා 'පිතෘ' ශබ්දඃ; කුත්සිතාඃ පුත්‍රාඃ 'කුපුත්‍රාඃ'-කර්‍මධාරය ප්‍රාදි සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කුපුත්‍ර' ශබ්දඃ; 'සෙවෘ'-සෙවායාම්, භ්වාදි අකර්‍මක ආත්මනෙ පදී.

c. පුත්‍රාඃ, දූදරුවෝ; මාතාපිතරෞ, මව්පිය දෙදෙනට; ප්‍රණමන්ති, නමස්කාර කෙරෙත්. ප්‍රණමන්ති-ලට්ක්‍රියා; පුත්‍රාඃ-උක්තකර්‍තාරඃ; මාතාපිතරෞ-අනුක්තකර්‍ම; මාතා ච පිතා ච 'මාතාපිතරෞ'-ඉතරෙතරයොග ද්වන්ද්ව සමාසඃ, ද්විවචනාන්තඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පුත්‍ර' ශබ්දඃ; 'ප්‍ර' පූර්‍වඃ 'ණමු'-ප්‍රහ්වත්වෙ, භ්වාදි අකර්‍මකඃ පරස්මෛපදී.

d. ලොකාඃ, ලෝවැස්සෝ; සූර්‍ය්‍ය චන්ද්‍රමසෞ, හිර සඳ දෙදෙන; පර්‍ය්‍යායෙණ, ක්‍රමයෙන්; පශ්‍යන්ති, දකිත්. පශ්‍යන්ති-ලට්ක්‍රියා; ලොකාඃ-උක්තකර්‍තාරඃ; සූර්‍ය්‍යචන්ද්‍රමසෞ-අනුක්තකර්‍ම; පර්‍ය්‍යායෙන-අනුක්තකරණම්; සූර්‍ය්‍යශ්ච චන්ද්‍රමශ්ච 'සූර්‍ය්‍යචන්ද්‍රමසෞ'-ඉතරෙතර යොග ද්වන්ද්ව සමාසඃ, ද්විවචනාන්තඃ; සකාරාන්ත පුංලිඞ්ගා 'සූර්‍ය්‍යචන්ද්‍රමස්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පර්‍ය්‍යාය' ශබ්දඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්‍මකා පරස්මෛපදී, පශ්‍යාදෙශඃ.

a. බ්‍රාහමණ දම්පති ගෘහාත් නිඃ සරතඃ,
b. නක්තන්දිවං සුපිති ශ්‍රමකාතරඃ.

## චතුර්ථාධ්‍යායඃ

### 1. ප්‍රථමඃ පාදඃ.

c. රාත්‍රිඃ ප්‍රභාතා.
d. පක්ෂිරවඃ ශ්‍රූයතෙ.

a. බ්‍රාහමණදම්පතී, බමුණු අඹුසැමි දෙදෙන; ගෘහාත්, ගෙයින්; නිඃ සරතඃ, නික්මෙත්. නිඃ සරතඃ-ලට්ක්‍රියා; බ්‍රාහමණ දම්පතී-උක්තකර්තෘරෙන; ගෘහාත්-අනුක්ත අපාදානම්; ජායාච පතීච 'ජායාපතී'[දම්පතී]බ්‍රාහමණානාම් දම්පතී 'බ්‍රාහමණ දම්පතී'-ඉතරෙතර යොග ගර්භිතතත්පුරුෂ සමාසඃ, ද්විවචනාන්තඃ; ඉකාරාන්ත පුංලිඞ්ගා 'බ්‍රාහමණ දම්පති' ශබ්දඃ; නිඃසරති, නිඃ සරතඃ, නිඃසරන්ති; 'නිස්' පූර්වඃ 'සෘ'ගතෞ,'නි' පූර්වකො අකර්මකඃ.

b ශ්‍රමකාතරඃ, විඩාවෙන් බැගෑවූයේ; නක්තන්දිවං, රෑදවල් දෙක්හි; සුපිති, නිදයි. සුපිති-ලට්ක්‍රියා; ශ්‍රමකාතරඃ-උක්ත කර්තෘ; නක්තංදිවං-අත්‍යන්ත සංයොගෙ විතියා; නක්තංච දිවාච 'නක්තන්දිවං'-නිපාතනාත් සමාහාර චන්ව සමාසඃ, එකවච නාන්තඃ; අකාරාන්ත කලීව ලිඞ්ගා 'නක්තන්දිව' ශබ්දඃ; අකා රාන්ත පුංලිඞ්ගා 'ශ්‍රමකාතර' ශබ්දඃ; සුපති, සුපතඃ, සුපන්ති; 'ෂ්විප්' සුපසයෙ, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

c. රාත්‍රිඃ, රාත්‍රිතොමෝ; ප්‍රභාතා, පහන්වූවාය; ප්‍රභාතා, (අභූත්) ලුඞ්ක්‍රියා; රාත්‍රිඃ-උක්ත කර්ත්‍රී; ප්‍රභාතා,-කර්තෘවිශෙෂණම්; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'රාත්‍රි' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ප්‍රභාතා' ශබ්දඃ; 'භූ' සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

d. පක්ෂිරවඃ, පක්ෂි ශබ්දය තෙම; ශ්‍රූයතෙ, අසනුලැබේ; ශ්‍රූයතෙ-ලට් ක්‍රියා; පක්ෂිරවඃ-උක්ත කර්ම; පක්ෂිණාං රවඃ 'පක්ෂි රවඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පක්ෂිරව' ශබ්දඃ; ශ්‍රූයතෙ, ශ්‍රූයෙතෙ, ශ්‍රූයන්තෙ; 'ශ්‍රු'-ශ්‍රවණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. සූර්‍යඃ උදයොන්මුඛො ජායතෙ.

b. අධුනා වයං ප්‍රභාතොචිතං මුඛක්ෂාලනාදිකං
සමාප්‍ය පාඨගෘහං ගච්ඡාමඃ.

c. විලම්බ කෘතෙ ගුරුණා තිරස්කෘතා භවිෂ්‍යාමඃ.

b. අධ්‍යයනස්‍යච හානිර්භවිෂ්‍යති.

---

a. සූර්‍යඃ, සූර්‍යතෙම; උදයොන්මුඛඃ ජායතෙ, උදයට අභිමුඛවේ. ජායතෙ-ලට් ක්‍රියා; සූර්‍යඃ-උක්තකර්තෘ; උදයොන්මුඛඃ-කර්තෘවිශෙෂණම්; උදයස්‍යඋන්මුඛඃ 'උදයොන්මුඛඃ'-ෂෂ්ඨී තත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'සූර්‍ය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'උදයොන්මුඛ' ශබ්දඃ; 'ජනී'-ප්‍රාදුර්භාවෙ, අකර්මකඃ ආත්මනෙපදී.

b. අධුනා, දැන්; වයං, අපි; ප්‍රභාතොචිතම්, අලුයමට සුදුසු වූ; මුඛක්ෂාලනාදිකං, මුවදෙවීම් ආදිය; සමාප්‍ය, නිමවා; පාඨගෘහං, පාඨශාලාවට; ගච්ඡාමඃ, යමු. ගච්ඡාමඃ-ලට් ක්‍රියා; වයම්-උක්තකර්තාරඃ; පාඨගෘහං-අනුක්තකර්ම; සමාප්‍ය-පූර්වක්‍රියාවාචී ල්‍යප් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; මුඛක්ෂලනාදිකං-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; ප්‍රභාතොචිතම්-කර්මවිශෙෂණම්; අධුනා-කාලාර්ථේ අව්‍යයම්; ප්‍රභාතස්‍ය උචිතඃ 'ප්‍රභාතොචිතඃ'-ෂෂ්ඨී තත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ප්‍රභාතොචිත' ශබ්දඃ; මුඛස්‍ය ක්ෂාලනම් 'මුඛක්ෂාලනම්'-ෂෂ්ඨී තත් පුරුෂඃ; මුඛක්ෂාලනං ආදි යස්‍ය සඃ 'මුඛක්ෂාලනාදිකඃ'- තත්පුරුෂ ගර්භ බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ග 'මුඛක්ෂාලනාදික' ශබ්දඃ; පාඨාර්ථං ගෘහං 'පාඨගෘහං'-චතුර්ථී තත් පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'පාඨගෘහ' ශබ්දඃ; 'ගම්ඍ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී; සමාප්‍ය-'සං' පූර්වාත් 'ආප' ප්‍රාප්තෞ, ඉත්‍ය ස්මාත් ධාතොර් ල්‍යප්.

c. විලම්බකෘතෙ, පමාකළකල්හි; ගුරුණා, ගුරුහු විසින්; තිරස්කෘතා භවිෂ්‍යාමඃ, නින්දාකරනලද්දෝවන්නෙමු. භවිෂ්‍යාමඃ-ලෘට් ක්‍රියා; තිරස්කෘතාඃ-කර්තෘ විශෙෂණම්; ගුරුණා-අනුක්තකර්තෘ; විලම්බකෘතෙ-භාවසප්තමී; අකාරාන්ත පුංලිඞ්ග 'කෘත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'විලම්බ' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ග 'ගුරු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'තිරස්කෘත' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

d. අධ්‍යයනස්‍යච, හැදෑරීමටද; හානිඃ භවිෂ්‍යති, පිරිහීම වන්නේය. භවිෂ්‍යති-ලෘට් ක්‍රියා; හානිඃ-උක්තකර්තෘ, අධ්‍යයනස්‍ය-අනුක්ත සම්බන්ධඃ; ච-අව්‍යයම්, අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'අධ්‍යයන' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග 'හානි' ශබ්දඃ;

## 2. ද්විතීයඃ පාඨඃ

**a. රාමො ගෘහෙ නාස්ති.**
**b. සහි සරොවරෙ ස්නාතුං නිර්ගතඃ.**
**c. යදි ප්‍රයොජනමස්ති ක්ෂණං තිෂ්ඨ.**
**d. සාම්ප්‍රතමෙව ස ආගමිෂ්‍යති-අථවා ගම්‍යතාම්.**
**e. අහමෙව තස්මෛ නිවෙදයිෂ්‍යාමි භවත ඉහා ගමනම්.**

---

a. රාමඃ, රාමතෙම; ගෘහෙ, ගෙහි; නාස්ති, නැත. නාස්ති-අව්‍යයම්; අථවා, අස්ති-ලට් ක්‍රියා, න-අව්‍යයම්; රාමඃ-උක්තකර්තෘ; ගෘහෙ-අනුක්තාධාරඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'රාම' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ගෘහ' හබ්දඃ;

b. සඃ හි, හෙතෙම වනාහි; සරොවරෙ, විලෙහි; ස්නාතුං, ස්නානය පිණිස; නිර්ගතඃ, නික්මුණේය. නිර්ගතඃ-කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; සඃ-උක්තකර්තෘ; ස්නාතුං-ක්‍රියාවාචී තුමන්ත මව්‍යයම්; සරොවරෙ-අනුක්තාධාරඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'සරොවරෙ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නිර්ගත' ශබ්ද; 'නිඃ' පූර්වඃ 'ගම්ඍ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී; 'නිර්' පූර්වතො අකර්මකඃ.

c. යදි, ඉදින්; ප්‍රයොජනම් අස්ති, ප්‍රයොජනයක් ඇත හොත්; ක්ෂණං, ඇසිල්ලක්; තිෂ්ඨ, සිටු. තිෂ්ඨ-ලොට් ක්‍රියා; (ත්වම්)-උක්තකර්තෘ; ක්ෂණං-අත්‍යන්ත සංයොගෙ ද්විතීයා; අස්ති-ලට් ක්‍රියා, අථවා ක්‍රියා ප්‍රතිරූප මව්‍යයම්; ප්‍රයොජනම්-උක්තකර්තෘ; යදි-අව්‍යයම්; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'ප්‍රයොජන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ක්ෂණ' ශබ්දඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී; 'ෂ්ඨා'-ගති නිවෘත්තෞ, අකර්මකඃ පරස්මෛපදී.

d. සාම්ප්‍රතම්එව, දැන් ම; සඃ, හෙතෙම; ආගමිෂ්‍යති, එන්නේය. ආගමිෂ්‍යති-ලෘට් ක්‍රියා; සඃ-උක්ත කර්තෘ; එව-අව්‍යයම්; සාම්ප්‍රතම්-අව්‍යයම්; 'ආ' පූර්වඃ 'ගම්ඍ'-හතෞ, සකර්මකඃ පරස්මෛපදී. අථවා, නොහොත්; ගම්‍යතාම්, ගනුලැබේවා; ගම්‍යතාම් - ලොට්ක්‍රියා; අථවා-අව්‍යයම්; (ගෘහං) - අධ්‍යාහෘත අනුක්තකර්ම; ගම්‍යතාම්-සකර්මකඃ පරස්මෛපදී.

e. අහං එව, මමම; භවතඃ, පින්වත්හුගේ; ඉහ, මෙහි; ආගමනං, ඊම; තස්මෛ, ඕහට; නිවෙදයිෂ්‍යාමි, දන්වන්නෙමි. නිවෙදයිෂ්‍යාමි-ලෘට් ක්‍රියා; අහං-උක්ත කර්තෘ; ආගමනං-අනුක්ත කර්ම; භවතඃ-අනුක්ත සම්බන්ධඃ; තස්මෛ-අනුක්ත සම්ප්‍රදානම්;

## 3. තෘතීයඃ පාඨඃ.

a. අයං සන්ධ්‍යා සමයඃ සමාගතඃ.
b. පක්ෂිණෝ නීඩානුද්දිශ්‍ය ගච්ඡන්ති.
c. ගාවශ්ච ප්‍රචාරස්ථානාත්නිවර්තන්තෙ.
d. වයමපි ගෘහං ගච්ඡාමඃ.
e. අන්‍යථා මාතා චින්තාකුලා භවිෂ්‍යති.

---

එව-අව්‍යයම්; ඉහ-'හ' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'ආගමන' ශබ්දඃ; 'නිඃ' පූර්වඃ 'විද්'-විඥානෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. අයං සන්ධ්‍යාසමයඃ, මේ සන්ධ්‍යාකාලයතෙම; සමාගතඃ, පැමිණියේය. සමාගතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; සන්ධ්‍යා සමයඃ-උක්ත කර්තා; අයං-කර්තෘ විශෙෂණම්; සන්ධ්‍යා එව සමයඃ 'සන්ධ්‍යා සමයඃ'-අවධාරණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්ත පුං ලිඞ්ග 'සන්ධ්‍යා සමය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ග 'සමාගත' ශබ්දඃ; 'සම්' 'ආ' පූර්ව 'ගමෟ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

b. පක්ෂිණඃ, පක්ෂීහු; නීඩානුද්දිශ්‍ය, කැදලි උදෙසා; ගච්ඡන්ති, යෙත්; ගච්ඡන්ති-ලට් ක්‍රියා; පක්ෂිණඃ-උක්ත කර්තාරඃ; උද්දිශ්‍ය-ක්‍රියාවාචී 'ල්‍යප්' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; නීඩාන්-අනුක්ත කර්ම; නකාරාන්ත පුංලිඞ්ග 'පක්ෂින්' ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ග 'නීඩ' ශබ්දඃ; 'උත්' පූර්වඃ 'දිශ'-අතිසර්ජන ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; 'ගමෟ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

c. ගාවශ්ච, ගෙරිහුද; ප්‍රචාරස්ථානාත්, ගොචරස්ථානයෙන්; නිවර්තන්තෙ, නවතිත්. නිවර්තන්තෙ-ලට් ක්‍රියා; ගාවඃ-උක්ත කර්තාරඃ; ප්‍රචාරස්ථානාත්-අනුක්තාපාදානම්; ච-අව්‍යයම්; ප්‍රචරස්‍ය ස්ථානං, 'ප්‍රචරස්ථානං'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'ප්‍රචරස්ථාන' ශබ්දඃ; ඔකාරාන්ත පුංලිඞ්ග 'ගො' ශබ්දඃ; 'නි' පූර්වඃ 'වෘතු'-වර්තනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

d. වයමපි, අපිදු; ගෘහං, ගෙට; ගච්ඡාමඃ, යෙමු; ගච්ඡාමඃ-ලට් ක්‍රියා; වයම්-උක්ත කර්තාරඃ; ගෘහං-අනුක්ත කර්ම; අපි-අව්‍යයම්; 'ගමෟ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

e. අන්‍යථා, අන්‍යපරිද්දක් වුවවොත්; මාතා, මව්තොමෝ; චින්තා කුලා භවිෂ්‍යති, සිතුවිල්ලෙන් ආකුලවන්නීය. භවිෂ්‍යති-ලෘට්ක්‍රියා; මාතා-උක්ත කර්ත්‍රි; චින්තාකුලා-කර්තෘ විශෙෂණම්;

a. පිතා'පි අස්මාකමන්වේෂණාය නිර්යාස්‍යති.
b. වයඤ්ච තිමිරාවෘතෙ පථි ප්‍රභූතං ක්‍රොශං ගමිෂ්‍යාමඃ.

---

## 4. චතුර්ථඃ පාඨඃ.

---

c. නාහං තත්‍ර ගමිෂ්‍යාමි.
d. මාතා මෙ නිෂිධ්‍යති.

---

අන්‍යථා-'ථාල්' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; චින්තායා ආකුලා 'චින්තාකුලා'-තෘතීයා තත්පුරුෂඃ; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'චින්තාකුලා' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

a. පිතාපි, පියතෙමේද; අස්මාකම්, අපගේ; අන්වේෂණාය, සෙවීම පිණිස; නිර්යාස්‍යති, නික්ම යන්නේය. නිර්යාස්‍යති-ලෘට් ක්‍රිය; පිතා-උක්ත කර්තා; අපි-අව්‍යයම්; අස්මාකං-අනුක්ත සම්බන්ධඃ; අන්වේෂණාය-තාදර්ථ්‍යෙ චතුර්ථී; ඍකාරාන්ත පුංලිඞ්ගො 'පිතෘ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'අන්වේෂණ' ශබ්දඃ; 'නිඃ' පූර්ව 'යා'-ප්‍රාපණෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. වයං ච, අපිදු; තිමිරාවෘතෙ, අඳුරෙන් වළඳනාලද; පථි මාර්ගයෙහි; ප්‍රභූතං, බොහෝවූ; ක්‍රොශම්, දුකට; ගමිෂ්‍යාමඃ, යන්නෙමු. ගමිෂ්‍යාමඃ-ලෘට් ක්‍රියා; වයම්-උක්ත කර්තා; ක්‍රොශම්-අනුක්ත කර්ම; ප්‍රභූතං-කර්ම විශෙෂණම්; පථි-අනුක්තාධාරඃ; තිමිරාවෘතෙ-තත් විශෙෂණම්; ච-අව්‍යයම්; තිමිරෙණ ආවෘතඃ 'තිමිරාවෘතඃ'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'තිමිරාවෘත' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගො 'පථින්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රභූත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ක්‍රොශ' ශබ්දඃ;

c. අහං, මම; අත්‍ර, එහි; නගමිෂ්‍යාමි, නොයන්නෙමි; ගමිෂ්‍යාමි-ලෘට් ක්‍රියා; අහං-උක්ත කර්තා; තත්‍ර-'ත්‍රල්' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්.

d. මෙ, මාගේ; මාතා, මව්තොමෝ; නිෂිධ්‍යති, වළක්වයි. නිෂිධ්‍යති-ලට් ක්‍රියා; මාතා-උක්ත කර්ත්‍රී; මෙ-අනුක්තසම්බන්ධඃ; ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මාතෘ' ශබ්දඃ; 'නි' පූර්වඃ 'ෂිධ'-සිද්ධෞ, අකර්මකඃ පරස්මෛපදී.

**a. චලබුද්ධිර් මිථ්‍යා වදති.**
**b. භ්‍රාතෘභිඃ සහ සතතං කලහං කුරුතෙ.**
**c. ගුරූණාඤ්ච පුරත උද්ධතං වර්තතෙ.**
**d. තෙන සහ මෛත්‍රී නකරණීයා.**
**e. අසාධුසඞ්ගාද්ධි නියතමනර්ථමුත්පාදයති.**

---

a. චලබුද්ධිඃ, චංචලවූ බුද්ධිඇත්තේ; මිථ්‍යාවදති, බොරු කියයි. වදති-ලට් ක්‍රියා; චලබුද්ධිඃ-උක්ත කර්තෘ; මිථ්‍යා-අනුක්ත කර්මණාව්‍යයම්; චලාබුද්ධිඃ යස්‍ය සෞ 'චලබුද්ධිඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; ඉකාරාන්ත පුංලිඞ්ගා 'චලබුද්ධි' ශබ්දඃ; 'වද'-ව්‍යක්තායාම් වාචි, සකර්මකඃ පරස්මෛපදී.

b. භ්‍රාතෘභිඃ සහ, බෑයන් හා සමග; සතතං, නිතර; කලහං කුරුතෙ, ඩබර කෙරෙයි. කුරුතෙ-ලට් ක්‍රියා; (චලබුද්ධිඃ)-අධ්‍යාහාර උක්ත කර්තෘ; කලහං-අනුක්ත කර්ම; සතතං-ක්‍රියාවිශෙෂණම්; සහ-අව්‍යයම්; භ්‍රාතෘභිඃ-සහයොගෙ තෘතීයා; ඍකාරාන්ත පුංලිඞ්ගා 'භ්‍රාතෘ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'සතත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කලහ' ශබ්දඃ; 'ඩුකෘඤ්'-කරණෙ, සකර්මකඃ උභයපදී

c. ගුරූණඤ්ච, ගුරුන්ගේද; පුරතඃ, ඉදිරියෙහි; උද්ධතම්, උද්ධතව; වර්තතෙ, පවතී. වර්තතෙ-ලට් ක්‍රියා; (චලබුද්ධිඃ)-අධ්‍යාහාර උක්ත කර්තෘ; උද්ධතම්-ක්‍රියා විශෙෂණම්; පුරතඃ-අනුක්තාධාරඃ, 'තසිල්' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; ගුරූණාං-අනුක්ත සම්බන්ධඃ; ච-අව්‍යයම්; උකාරාන්ත පුංලිඞ්ගා 'ගුරු' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'උද්ධත' ශබ්දඃ; 'වෘතු'-වර්තනෙ, අකර්මකඃ ආත්මනෙපදී.

d. තෙන සහ, ඔහු හා සමග; මෛත්‍රී, මෛත්‍රී තොමෝ; නකරණීයා, නොකටයුත්තීය. කරණීයා-කෘදන්ත කර්මකාරක ක්‍රියා; මෛත්‍රී-උක්තකර්ම; සහ-අව්‍යයම්; තෙන-සහයොගෙ තෘතීයා; ඊකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'මෛත්‍රී' ශබ්දඃ;

e. අසාධුසඞ්ගඃ හි, අසත්පුරුෂ සංසර්ගය වනාහි; නියතං, නිශ්චයෙන්; අනර්ථං, අවැඩක්; උත්පාදයති, උපදවයි. උත්පාදයති-ලට් ක්‍රියා; අසාධු සඞ්ගඃ-උක්ත කර්තෘ; අනර්ථං-අනුක්ත කර්ම; නියතං-ක්‍රියා විශෙෂණම්; හි-අව්‍යයම්; අසාධූනාං සඞ්ගඃ 'අසාධු සඞ්ගඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'අසාධුසඞ්ග' ශබ්දඃ; න අර්ථං 'අනර්ථං'-නඤ් තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'අනර්ථ' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'නියත' ශබ්දඃ; 'උත්' පූර්ව 'පද'-ගතෞ, සකර්මකඃ ආත්මනෙපදී.

# 5. පඤ්චමඃ පාඨඃ.

---

a. අද්‍ය මෙ භ්‍රාතා චිරාත් ගෘහමාගතඃ.
b. තෙන බහවො දෙශා දෘෂ්ටාඃ.
c. ස ච මයි ස්නිහ්‍යති.
d. විවිධෛන කථාප්‍රසඞ්ගෛන ච මාං රඤ්ජයති.
e. පිතරෞ චාවයොඃ පරස්පරානුරාගං නිරීක්ෂ්‍ය ප්‍රීතිමනුභවතඃ.

---

a. අද්‍ය, අද; මෙ, මාගේ; භ්‍රාතා, බෑ තෙම; චිරාත්, කලකින්; ගෘහං, ගෙට; ආගතං, ආයේය. ආගතඃ–කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; භ්‍රාතා–උක්ත කර්තෘ; ගෘහම්–අනුක්තකර්ම; චිරාත්–අව්‍යයම්; අද්‍ය–'ද්‍ය' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; ඍකාරාන්ත පුංලිඞ්ගා 'භ්‍රාතෘ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ආගත' ශබ්දඃ; 'ආ' පූර්වඃ 'ගම්ලෘ'-ගතෞ' සකර්මකඃ පරස්මෛපදී.

b. තෙන, ඔහු විසින්; බහවඃ දෙශාඃ; බොහෝ; දෙශයෝ; දෘෂ්ටාඃ, දක්නාලදහ. දෘෂ්ටාඃ–කෘදන්ත කර්මකාරක ක්‍රියා; දෙශාඃ–උක්ත කර්ම; බහවඃ–කර්ම විශෙෂණම්; තෙන–අනුක්ත කර්තෘ; උකාරාන්ත පුංලිඞ්ගා 'බහු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දෙශ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දෘෂ්ට' ශබ්දඃ; 'දෘශිර්'–ප්‍රෙක්ෂණෙ' සකර්මකඃ පරස්මෛපදී.

c. සච, හෙතෙමේද; මයි, මා කෙරෙහි; ස්නිහ්‍යති, සෙනහ කෙරෙයි. ස්නිහ්‍යති–ලට් ක්‍රියා; සඃ–උක්තකර්තෘ; මයි–අනුක්තාධාරඃ; ච–අව්‍යයම්, 'ස්නිහ' ප්‍රීතෞ, අකර්මකඃ පරස්මෛපදී.

d. විවිධෛන, නානාප්‍රකාරවූ; කථාප්‍රසඞ්ගෛන, කථාප්‍රවෘත්තියෙන්; මාං, මා; රඤ්ජයති, සිත් අලවයි. රඤ්ජයති–ලට් ක්‍රියා; (සඃ)–උක්තකර්තෘ; මාං–අනුක්තකර්ම; කථාප්‍රසඞ්ගෛන–අනුක්ත කරණම්; විවිධෛන–තත් විශෙෂණම්; ච–අව්‍යයම්; කථායාඃ ප්‍රසඞ්ගඃ 'කථා ප්‍රසඞ්ගඃ'–ෂෂ්ඨී තත් පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කථා ප්‍රසඞ්ග' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'විවිධ' ශබ්දඃ; 'රඤ්ජ්'–රාගෙ, අකර්මකඃ උභයපදී.

e. පිතරෞච, මවුපිය දෙදෙනාද; ආවයොඃ, අප දෙදෙනාගේ; පරස්පරානුරාගං, ඔවුනොවුන් කෙරෙහිවූ ඇල්ම; නිරීක්ෂ්‍ය, බලා; ප්‍රීතිං, ප්‍රීතිය; අනුභවතඃ, විඳිත්. අනුභවතඃ–ලට්ක්‍රියා; පිතරෞ–උක්ත කර්තාරෞ; . ප්‍රීතිම්–අනුක්ත කර්ම;

a. එවං සර්වේ වයං සුඛෙන කාලං නයාමඃ.

b. සෞභ්‍රාත්‍රං හි පිතුර්මාතුශ්ච ප්‍රීතිකරම්.

c. භ්‍රාතෲණාංච සුඛාවහං භවති.

---

නිරීක්ෂ්‍ය-පූර්වක්‍රියාවාචි ල්‍යප් ප්‍රත්‍යාන්ත මව්‍යයම්; පරස්පරානුරාගං-අනුක්තකර්ම; ආවයොඃ-අනුක්ත සම්බන්ධඃ මාතාච පිතාච, 'පිතරෞ'-එකශෙෂවත්ව සමාසඃ, ද්විවචනාන්තඃ; පරස්පරං අනුරාගඃ 'පරස්පරානුරාගඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුං ලිඞ්ගො 'පරස්පරානුරාග' ශබ්දඃ. 'නිර්' පූර්වාත් 'ඊක්ෂ'-දර්ශනෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; ඉකාරාන්තස්ත්‍රී ලිඞ්ගො 'ප්‍රීති' ශබ්දඃ; 'අනු' පූර්වඃ 'භූ'-සත්තායාම්, අකර්මකඃපරස්මෛපදී, 'අනු' පූර්වත්වෙ සකර්මකඃ.

a. එවං, මෙසේ; වයං සර්වේ, අපි හැමදෙන; සුඛෙන, සැපසේ; කාලංනයාමඃ; කල්යවමු. නයාමඃ-ලට් ක්‍රියා; වයං-උක්තකර්තෘ; සර්වේ-කර්තෘ විශෙෂණම්; කාලං-අනුක්තකර්ම; සුඛෙන-ක්‍රියාවිශෙෂණෙ තෘතීයා; එව-අව්‍යයම්; අකාරාන්ත කලීව ලිඞ්ගො 'සුඛ'ශබ්ද;.'නීඤ්'-ප්‍රාපනෙ, ද්විකර්මකඃ උභයපදී.

b. සෞභ්‍රාත්‍රං හි, මනා සහොදරත්වය වනාහි; පිතුඃ, පියහටද; මාතුශ්ච, මවහටද; ප්‍රීතිකරම්, ප්‍රියකරන්නේ වේ. ප්‍රීතිකරම් (ස්‍යාත්)-ලිඞ් ක්‍රියා; සෞභ්‍රාත්‍රං-උක්ත කර්තා; ප්‍රීතිකරම්-කර්තෘ විශෙෂණම්; පිතුඃ-අනුක්ත සම්බන්ධඃ; මාතුඃ-අනුක්ත සම්බන්ධඃ; හි, ච-අව්‍යයෙ; අකාරාන්ත කලීවලිඞ්ගො 'ප්‍රීතිකර' ශබ්දඃ; ශොභනො භ්‍රාතා 'සුභ්‍රාතා'-කර්මධාරයෙ ප්‍රාදි සමාසඃ; සුභ්‍රාතුර්භාවඃ සෞභ්‍රාත්‍රම් තද්ධිතඃ ප්‍රීතිං කරොතීති 'ප්‍රීතිකරම්'-කෘදන්ත උපපදසමාසඃ.

c. භ්‍රාතෲණාඤ්ච, බෑයන්ටද; සුඛාවහං භවති, සැපඑලවන්නේවේ. භවති-ලට් ක්‍රියා; (සෞභ්‍රාත්‍රං)-උක්තකර්තා; සුඛාවහං-කර්තෘවිශෙෂණම්; භ්‍රාතෲණාම්-අනුක්තසම්බන්ධඃ; ච-අව්‍යයම්; ඍකාරාන්ත පුංලිඞ්ගො 'භ්‍රාතෲ' ශබ්දඃ; සුඛං ආවහතීති 'සුඛාවහං'-කෘදන්ත උපපදසමාසඃ; අකාරාන්තකලීව ලිඞ්ගො 'සුඛාවහ' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

## 6 ෂෂ්ඨඃ පාඨඃ

---

**a. සුබුද්ධිර්බාලකො විනය නම්‍රො භවති.**

**b. න කෙනාපි කලහං කුරුතෙ.**

**c. මාතරං ප්‍රණමති.**

**d. පිතුරුපදෙශඤ්ච ධාරයති,**

**e. ස සදා ගුරෞ භක්තිමාන් භවති.**

---

a. සුබුද්ධිඃ, මනා බුද්ධිඇති; බාලකඃ, ළදරුතෙම; විනයනම්‍රඃ භවති, විනයට අවනත වේ. භවති-ලට් ක්‍රියා; බාලකඃ-උක්තකර්තා; විනයනම්‍රඃ-කර්තෘ විශෙෂණම්; සුබුද්ධිඃ-කර්තෘ විශෙෂණම්; ශොභනා බුද්ධිර්යස්‍යාසෞ 'සුබුද්ධිඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; ඉකාරාන්ත පුංලිඞ්ගො 'සුබුද්ධි' ශබ්දඃ; විනයාය නම්‍රඃ 'විනයනම්‍රඃ'-චතුර්ථී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'විනයනම්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'බාලක' ශබ්දඃ;

b. කෙන අපි, කිසිවකුහාත්; කලහං, ඩබරයක්; නකුරුතෙ, නොකෙරෙයි. කුරුතෙ-ලට් ක්‍රියා; (බාලකඃ)-උක්ත කර්තා; කලහං-අනුක්තකර්ම; කෙන-සහාර්ථෙ තෘතීයා; න, අපි-අව්‍යයෙ; අකාරාන්ත පුංලිඞ්ගො 'කලහ' ශබ්දඃ; 'ඩුකෘඤ්'-කරණෙ, සකර්මකඃ උභයපදී.

c. මාතරං, මවට; ප්‍රණමති, වඳී; ප්‍රණමති-ලට් ක්‍රියා; (බාලකඃ)-උක්ත කර්තා; මාතරම්-අනුක්තකර්ම; 'ප්‍ර' පූර්වඃ 'ණමු'-ප්‍රහ්වත්වෙ ශබ්දෙච, සකර්මකඃ පරස්මෛපදී.

d. පිතුඃ, පියාගේ; උපදෙශංච, උපදෙශයද; ධාරයති, දරයි. ධාරයති-ලට් ක්‍රියා; (බාලකඃ)-උක්ත කර්තා; උපදෙශං-අනුක්තකර්ම; පිතුඃ-අනුක්ත සම්බන්ධඃ; ච-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගො 'උපදෙශ' ශබ්දඃ; 'ධෘඤ්'-ධාරණෙ, අකර්මකඃ ආත්මනෙපදී.

e. සඃ, හෙතෙම; සදා, හැමකල්හි; ගුරෞ, ගුරුහු කෙරෙහි; භක්තිමාන් භවති, භක්තිමත්වේ. භවති-ලට් ක්‍රියා; සඃ-උක්ත කර්තා; භක්තිමාන්-කර්තෘවිශෙෂණම්; ගුරෞ-අනුක්තාධාරඃ; සදා-දාප්‍රත්‍යයාන්තමව්‍යයම්; උකාරාන්ත පුංලිඞ්ගො 'ගුරු' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'භක්තිමත්' ශබ්දඃ.

**භ්‍රාතරං භගිනීඤ්ච සනිගඩං පශ්‍යති.**
**b. දාසං දාසීඤ්ච න පරුෂං භාෂතෙ.**
**c. එවංහි සර්ව ලොක ප්‍රියො භවති.**

---

## 7. සප්තමඃ පාඨඃ.

---

**b. කස් ත්වම්?**
**e. ඡාත්‍රො'හම්.**

---

a. භ්‍රාතරං, බෑයාද; භගිනීඤ්ච, නැගණියද; සනිගඩං, සිනිඳුසේ; පශ්‍යති, බලයි. පශ්‍යති-ලට් ක්‍රියා; (සඃ)-උක්ත කර්තෘ; භ්‍රාතරං-අනුක්තකර්ම; භගිනීං-අනුක්තකර්ම; ච-අව්‍යයම්; සනිගඩම්-ක්‍රියාවිශෙෂණම්; ඍකාරාන්ත පුංලිඞ්ගා 'භ්‍රාතෘ' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'භගිනී' ශබ්දඃ; අකාරාන්තකලීව ලිඞ්ගා 'සනිගඩ' ශබ්දඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. දාසං, දාසයාටද; දාසීඤ්ච, දාසියටද; පරුෂං, රළුතෙපුල්; නභාෂතෙ, නොකියයි; භාෂතෙ-ලට්ක්‍රියා; (සඃ)-උක්ත කර්තෘ; පරුෂං-අමුඛ්‍යකර්ම; දාසං-අනුක්ත ගෞණ කර්ම; ච, න-අව්‍යයෙ; අකාරාන්ත පුංලිඞ්ගා 'දාස' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'දාසී' ශබ්දඃ; අකාරාන්ත කලීවලිඞ්ගා 'පරුෂ' ශබ්දඃ; 'භාෂ'-ව්‍යක්තායාම් වාචි විකර්මකඃ ආත්මනෙපදී.

c. එවං හි, මෙසේහෙයින් වනාහි; සර්වලොක ප්‍රියඃ භවති, සියලු ලොකයාහට ප්‍රියවේ. භවති-ලට්ක්‍රියා; (සඃ)-උක්ත කර්තෘ; සර්වලොකප්‍රියඃ-කර්තෘ විශෙෂණම්; එවංහි-අව්‍යයෙ; සර්වේ ච තෙ ලොකාශ්චෙති 'සර්ව ලොකඃ', සර්වලොකානාම් ප්‍රියඃ 'සර්වලොක ප්‍රියඃ'-කර්මධාරයගර්භ තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'සර්ව ලොක ප්‍රිය' ශබ්දඃ; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

d. ත්වං, තෝ; කඃ (අසි), කවරෙහිද? අසි-ලට්ක්‍රියා; ත්වම්-උක්තකර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

e. අහං-මම; ඡාත්‍රඃ (ස්මි), ශිෂ්‍යයෙක්මි. (අස්මි)-ලට්ක්‍රියා; අහං-උක්ත කර්තෘ; ඡාත්‍රඃ-කර්තෘ විශෙෂණම්; අකාරාන්ත පුංලිඞ්ගා 'ඡාත්‍ර' ශබ්දඃ;

a. කිමර්ථ මාගතො'සි ?
b. පඨනාර්ථ මාගතො'ස්මි.
c. කස්මාත් ස්ථානාදාගතො'සි?
d. වඞ්ගදෙශාත්.
e. කො'සෞ? කාවෙතෞ?
f. ඉමෙ කෙ? ක එතෙ? අමීකෙ?

---

a. කිං අර්ථං, කුමක් පිණිස; ආගතඃ අසි, ආයෙහිද? අසි-ලට්ක්‍රියා; (ත්වං)-උක්තකර්තෘ; ආගතඃ-කර්තෘ විශෙෂණම්; කිමර්ථං-අනුක්ත කර්ම; කඃ අර්ථඃ 'කිමර්ථඃ' කර්මධාරය සමාසඃ; අකාරාන්ත පුං ලිඞ්ගා ආගත' ශබ්දඃ,

b. පඨනාර්ථං, හදුරණු පිණිස; ආගතඃඅස්මි, ආයෙමි. අස්මි-ලට්ක්‍රියා; (අහං)-උක්ත කර්තෘ; ආගතඃ-කර්තෘ විශෙෂණම්; පඨනාර්ථං-අනුක්ත කර්ම; පඨනමෙව අර්ථඃ 'පඨනාර්ථඃ'-අවධාරණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්ත පුං ලිඞ්ගා 'පඨනාර්ථ' ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ගා 'ආගත' ශබ්දඃ.

c. කස්මාත් ස්ථානාත්, කවර තැනෙකින්; ආගතඃ'සි? ආයෙහිද? අසි-ලට් ක්‍රියා; (ත්වම්)-උක්ත කර්තෘ; ආගතඃ-කර්තෘ විශෙෂණම්; ස්ථානාත්-අනුක්තාපාදානම්; කස්මාත්-අනුක්තාපාදානම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'ස්ථාන' ශබ්දඃ.

d. වඞ්ග දෙශාත්, වඞ්ග දෙශයෙනි. (අස්මි)- ලට් ක්‍රියා; (අහං)-උක්තකර්තෘ; .(ආගතඃ)=කර්තෘ විශෙෂණම්; වඞ්ගදෙශාත්-අනුක්තාපාදානම්; වඞ්ගශ්වා සෞ දෙශශ්චෙති 'වඞ්ගදෙශඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'වඞ්ග දෙශ' ශබ්දඃ.

e. අසෞ, මේ තෙම; කඃ, කවරෙක්ද? (ස්‍යාත්)-ලිඞ් ක්‍රියා; අසෞ-උක්ත කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; සකාරාන්තො 'දස්' ශබ්දඃ; එතෞ, මොහු දෙදෙන; කෞ කවරහු වෙද්ද; (ස්‍යාතාම්)-විධි ලිඞ්ක්‍රියා; එතෞ-උක්ත කර්තාරෞ; කෞ-කර්තෘ විශෙෂණම්; දකාරාන්ත 'එතද්' ශබ්දඃ.

f. ඉමෙ, මොහු; කෙස්‍යුඃ, කවරහුවෙද්ද? (ස්‍යුඃ) විධි ලිඞ් ක්‍රියා; ඉමෙ-උක්ත කර්තාරඃ; කෙ-කර්තෘ විශෙෂණම්; එතෙ, මොහු; කඃ, කවරහුද? (ස්‍යුඃ) විධි ලිඞ් ක්‍රියා; එතෙ-උක්ත කර්තෘ; කෙ-කර්තෘ විශෂණම්; අමී, මේ දුරසිටියාහු හෙවත් තෙල පෙනෙන්නාහු; කෙ, කවරහුද? (ස්‍යුඃ) විධි ලිඞ්ක්‍රියා; අමී-උක්ත කර්තෘ; කෙ-කර්තෘ විශෙෂණම්.

**a. එවං භවතු, ඉත්ථං කුරු, ඉත්ථං වද, එවං කථය.**
**b. කිමිදම් ?**
**c. කස්සෙදම් ? කොයම් ?**
**d. යුවාං කස්මාත් සමායාතෞ?**
**e. ගෘහාදාවාං සමායාතෞ.**
**f. කෙ යූයම් ?, වයං සර්වේ විද්‍යාර්ථිනඃ.**

---

a එවං භවතු, එසේවේවා; භවතු-ලොට් ක්‍රියා; එවං-ප්‍රකාරාර්ථෙව්‍යයම්; (ත්වම්)-අධ්‍යාහෘත උක්තකර්තෘ. ඉත්ථං කුරු, මෙසේකර; කුරු-ලොට් ක්‍රියා; ඉත්ථං-ක්‍රියා විශෙෂණෙව්‍යයම්; (ත්වම්)-උක්ත කර්තෘ. ඉත්ථං වද, මෙසේ කියව. වද-ලොට් ක්‍රියා; ඉත්ථං-ක්‍රියා විශෙෂණෙව්‍යයම්; (ත්වම්)-උක්ත කර්තෘ; 'වද'-ව්‍යක්තායාංවාචි, සකර්මකඃ පරස්මෛපදී. එවං කථය, මෙසේ කියව. කථය-ලොට්ක්‍රියා; එවං-ක්‍රියාවිශෙෂණෙව්‍යයම්; (ත්වං)-උක්තකර්තෘ; 'කථ'-වාක්‍ය ප්‍රබන්ධෙ, චුරාදි සකර්මකඃ උභයපදී.

b. ඉදම්, මෙය; කිම්, කුමක්ද? (භවති) ලට්ක්‍රියා; ඉදම්-උක්ත කර්තෘ; කිම්-කර්තෘ විශෙෂණම්; මකාරාන්ත 'ඉදම්' ශබ්දඃ, ක්ලිබෙ; මකාරාන්ත 'කිම්' ශබ්දඃ, ක්ලීබෙ.

c. ඉදම්, මෙය; කස්‍ය, කවරස්හුගේද? (භවති)-ලට් ක්‍රියා; ඉදම්- උක්තකර්තෘ; කස්‍ය-අනුක්ත සම්බන්ධඃ අයම්, මේ තෙම; කඃ, කවරෙක්ද? (භවති)-ලට් ක්‍රියා; අයම්-උක්ත කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්.

d. යුවාම්, තොපිදෙදෙන; කස්මාත්, කවරතැනකින්; සමායාතෞ, ආවාහුද? (ස්ථඃ)-ලට්ක්‍රියා; යුවාම්-උක්තකර්තාරෞ; සමායාතෞ-කර්තෘවිශෙෂණම්; කස්මාත්-අනුක්තාපාදානම්; අකාරාන්ත පුංලිඞ්ගා 'සමායාත' ශබ්දඃ;

e. ආවාම්, අපි දෙදෙන; ගෘහාත්, ගෙහි සිට; සමයාතෞ ආයෙමු. (ස්වඃ)-ලට් ක්‍රියා; ආවාම්-උක්ත කර්තාරෞ; සමයාතෞ-කර්තෘ විශෙෂණම්; ගෘහාත්-අනුක්තාපාදානම්; අකාරාන්ත ක්ලිව ලිඞ්ගා 'ගෘහ' ශබ්දඃ.

f. යූයම්, තෙපි; කෙ, කවරහුද? (භවත)-ලට් ක්‍රියා; යූයම්-උක්ත කර්තාරඃ; කෙ-කර්තෘ විශෙෂණම්. වයම් සර්වේ, අපි හැම දෙන; විද්‍යාර්ථිනඃ, ශිෂ්‍යයෝවමු. (භවාමඃ)-ලට් ක්‍රියා; වයම්-උක්ත කර්තාරඃ; සර්වේ-කර්තෘ විශෙෂණම්; විද්‍යාර්ථිනඃ-කර්තෘ විශෙෂණම්; නකාරාන්ත පුංලිඞ්ගා 'විද්‍යාර්ථින්' ශබ්දඃ.

**a. කුත ඉහායාතාඃ?, ස්වාලයෙභ්‍ය ඉහායාතාඃ.**
**b. ක්වාශ්‍රමාඃ?**
**c. කාන්‍යකුබ්ජෙ නඃ සමිතිඃ.**
**d. කිං නිමිත්තමිහාගතාඃ?**
**e. විද්‍යාධ්‍යයන හෙතවෙ.**

---

a. ඉහ, මෙහි; කුතඃ, කොහිසිට; ආයාතාඃ, ආවහුද? ආයාතඃ, කෘදන්තකර්තෘකාරක ක්‍රියා; (යූයම්)-අධ්‍යාහෘත උක්ත කර්තෘ; කුතඃ අනුක්තාපාදානම් ඉහ-'අනුක්තාධාරඃ' කුතඃ-'තසිල්' ප්‍රත්‍යයාන්තමව්‍යයම්. ඉහ, මෙහි; ස්වාලයෙභ්‍යඃ, ස්වකීය ගෘහයන්හි සිට; ආයාතාඃ, ආයෙමු. (සමඃ)-ලව්ක්‍රියා; වයම්-උක්තකර්තෘ; ආයාතාඃ-කර්තෘ විශෙෂණම්; ඉහ-'හ' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; ස්වාලයෙභ්‍යඃ අනුක්තාපාදානම්; ස්වස්‍ය ආලයාඃ ස්වාලයාඃ තෙභ්‍යඃ 'ස්වාලයෙභ්‍යඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ අකාරාන්ත පුංලිඞ්ගා 'ස්වාලය' ශබ්දඃ.

b. ආශ්‍රමාඃ, ආශ්‍රමයෝ හෙවත් තවත්නාතැන්; ක්ව, කොහි ඇත්තාහුද? (භවන්ති)-ලව්ක්‍රියා; ආශ්‍රමාඃ-උක්ත කර්තෘ; ක්ව-අනුක්තාධාරඃ (වප්‍රත්‍යයාන්තමව්‍යම්;) අකාරාන්ත පුංලිඞ්ගා 'ආශ්‍රම' ශබ්දඃ.

c. නඃ, අපගේ; සමිතිඃ, විසීම; කාන්‍ය කුබ්ජේ, කාන්‍ය කුබ්ජ නම් දෙශයෙහිය (භවති)-ලව්ක්‍රියා; සමිතිඃ-උක්තකර්තා; නඃ-අනුක්තසම්බන්ධඃ; කාන්‍යකුබ්ජේ-අනුක්තාධාරඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'කාන්‍ය කුබ්ජ' ශබ්දඃ; ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'සමිති' ශබ්දඃ.

d. කිං නිමිත්තං, කුමක් හෙතුකොටගෙන; ඉහ, මෙහි ආගතාඃ, ආවාහුද? (ස්ථ)-ලව්ක්‍රියා; යූයම්- උක්ත කර්තෘඃ; ආගතාඃ-කර්තෘවිශෙෂණම්; නිමිත්තං-හෙත්වර්ථෙ විතීයා; කිං-තත්විශෙෂණම්; ඉහ-'හ' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; අකාරාන්තක්ලීව ලිඞ්ගා 'නිමිත්ත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ආගත' ශබ්දඃ.

e. විද්‍යාධ්‍යයන හෙතවෙ, ශාස්ත්‍ර හැදෑරීම හෙතුකොටගෙන ආයෙමු (සමඃ)-ලව්ක්‍රියා; (වයං)-උක්තකර්තෘඃ; (ආගතාඃ)-කර්තෘ විශෙෂණම්; විද්‍යාධ්‍යයන හෙතවෙ-අනුක්ත සම්ප්‍රදානම්; විද්‍යායා අධ්‍යයනං; 'විද්‍යාධ්‍යයනං'-ෂෂ්ඨී තත්පුරුෂඃ; විද්‍යාධ්‍යයනමෙව හෙතුඃ 'විද්‍යාධ්‍යයන හෙතුඃ'-තත් පුරුෂගර්භ කර්මධාරයඃ; උකාරාන්ත පුං ලිඞ්ගා 'විද්‍යාධ්‍යයනහෙතු' ශබ්දඃ.

## 8. අෂ්ටමඃ පාඨඃ

**a. අස්ති භාරතෙ වර්ෂේ කාශිනාම නගරී.**
**b. ආසීත් තස්‍යාං චන්දනදාසො නාම වණික්.**
**c. අථ කදාචිත් තස්‍ය ගෘහෙ චින්තාමණි නාමෛකො බන්ධුඃ සමායයෞ.**
**d. අසෞ තං පප්‍රච්ඡ කුශලී භොඃ චන්දනදාස ?**

---

a. භාරතෙවර්ෂේ, භාරත වර්ෂයෙහි; කාශීනාම නගරී, කාශිනම් පුරියක්; අස්ති, ඇති. අස්ති-ක්‍රියාප්‍රතිරූපමව්‍යයම්, අථවා, අස්ති-ලට්ක්‍රියා; නගරී-උක්ත කර්තෘ; කාශී-කර්තෘ විශෙෂණම්; නාම-අව්‍යයම්; වර්ෂේ-අනුක්තාධාරඃ; භාරතෙ-අනුක්තාධාර විශෙෂණම්; අකාරාන්ත ක්ලීවලිඞ්ගා 'වර්ෂ' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රිලිඞ්ගා 'කාශි' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'නගරී' ශබ්දඃ.

b. තස්‍යාං, ඒ නුවරෙහි; චන්දනදාසඃ නාම, චන්දන දාස නම්වූ; වණික්, වෙළෙන්දෙක්; ආසීත්, වී. ආසීත්-ලුඞ්ක්‍රියා; වණික් උක්ත කර්තෘ; චන්දනදාසඃ-කර්තෘ විශෙෂණම්; නාම, ප්‍රකාශව්‍යයම්; තස්‍යාං-අනුක්තාධාරඃ; දකාරාන්ත 'තද්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'චන්දනදාස' ශබ්දඃ; ජකාරාන්ත පුංලිඞ්ගා 'වණිජ්' ශබ්දඃ. ආසීත්, අස'භුවි-අකර්මකඃ පරස්මෛපදී.

c. අථ, ඉක්බිති; කදාචිත්, කිසිකලෙක්හි; තස්‍ය ගෘහෙ, ඔහුගේ ගෘහයෙහි; චින්තාමණි නාම, චින්තාමණි නම්වූ; එකඃ බන්ධුඃ, එක් නෑයෙක්; සමායයෞ, ආයේය. සමායයෞ-ලිට්ක්‍රියා; බන්ධුඃ-උක්තකර්තෘ; එකඃ-කර්තෘවිශෙෂණම්: චින්තාමණි නාම-කර්තෘ විශෙෂණම්; ගෘහෙ-අනුක්තාධාරඃ; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; අථ, කදාචිත්-අව්‍යයෙ; චින්තාමණිනාමායස්‍යාසෞ 'චින්තාමණිනාමා'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'චින්තාමණින්' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගා 'බන්ධු' ශබ්දඃ; 'සම්' 'ආ' පූර්වඃ 'යා'-ප්‍රාපණෙ, සකර්මකඃ පරස්මෛපදී.

d. අසෞ, මේ තෙම; තං, ඔහු; භොඃ චන්දනදාස, පින්වත් චන්දනදාසය; කුශලී, ආරෝග්‍ය ඇත්තෙහිදැයි; පප්‍රච්ඡ, විචාළේය. පප්‍රච්ඡ-ලිට්ක්‍රියා; අසෞ-උක්තකර්තෘ; තං-අනුක්ත ගෞණ කර්ම; කුශලී භොඃ චන්දනදාස-ඉති වාක්‍යාර්ථෝ මුඛ්‍යකර්ම; [භොඃ චන්දන

c. සො'බ්‍රවීත් භද්‍රකුතො මෙ මන්දභාග්‍යස්‍ය කුශලම්?
මම පුත්‍රො විද්‍යාභ්‍යාසං නකරොති, දුෂ්ටබාලකෛඃ සහ සදාක්‍රීඩයති.
d. තදුක්තම්.

---

දස තවම් කුශලී අසි, අසි-ලට් ක්‍රියා; ත්වම්-උක්ත කර්තා; චන්දන දස-සම්බොධනං; භොඃ-සම්බොධනෙව්‍යයම්; කුශලී-කර්තෘ විශෙෂණම්] සකාරාන්ත 'අදස්' ශබ්දඃ, පුංසි; දකාරාන්ත 'තද්' ශබ්දඃ පුංසි; නකාරාන්ත පුංලිඞ්ගා 'කුසලින්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'චන්දනදස' ශබ්දඃ; ප්‍රපූර්වඃ 'ශ්‍රී'-පසායාම්, සකර්මකඃ පරස්මෛපදී.

c. සඃ, හෙතෙම; අබ්‍රවීත්, මෙසේ කී. භද්‍ර, යහළුව; මන්දභාග්‍යස්‍ය, පින්මදවූ; මෙ, මට; කුශලම්, කුසලයෙක්; කුතඃ, කොයින්ද? මමපුත්‍රඃ, මාගේ පුත්‍රතෙම; විද්‍යාභ්‍යාසං, ශාස්ත්‍රාභ්‍යාසය; න කරොති, නොකෙරෙයි; දුෂ්ටබාලකෛඃ සහ, දුෂ්ටවූ බාලයන් හා සමග; සදා, හැමකල්හි; ක්‍රීඩයති, ක්‍රීඩාකෙරෙයි. අබ්‍රවීත්-ලුඞ් ක්‍රියා; සඃ-උක්ත කර්තා; [තං]-අනුක්තගෞන කර්ම; භද්‍ර කුතො මෙ මන්දභාග්‍යස්‍ය කුශලම්? මම පුත්‍රො විද්‍යාභ්‍යාසං න කරොති, දුෂ්ට බාලකෛඃ සහ සදා ක්‍රීඩති, ඉති වාක්‍යාර්ථං මුඛ්‍යකර්ම; (අස්ති)-ලට්ක්‍රියා; කුශලම්-උක්තකර්තා; මෙ-අනුක්ත සම්බන්ධඃ; මන්දභාග්‍යස්‍ය-සම්බන්ධවිශෙෂණම්; කුතඃ-'තසිල්' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; භද්‍ර-සම්බොධනං, කරොති-ලට්ක්‍රියා; පුත්‍රඃ-උක්තකර්තා; න-අව්‍යයම්; විද්‍යාභ්‍යාසම්-අනුක්ත කර්ම; මම-අනුක්තසම්බන්ධඃ. ක්‍රීඩයති-ලට්ක්‍රියා; (සඃ)-උක්ත කර්තා; සහ-අව්‍යයම්; දුෂ්ට බාලකෛඃ-සහයොගෙ තෘතීයා; සදා-'දා' ප්‍රත්‍යයාන්තමව්‍යයම්. [අබ්‍රවීත්] 'බෲඤ්'-ව්‍යක්තායාම්වාචි, විකර්මකඃ උභයපදී. අකාරාන්ත පුංලිඞ්ගා 'භද්‍ර' ශබ්දඃ; මන්දභාග්‍යං යස්‍යාසෞ 'මන්දභාග්‍යං'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'මන්දභාග්‍ය' ශබ්දඃ; අකාරාන්ත කලීව ලිඞ්ගා 'කුශල' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පුත්‍ර' ශබ්දඃ; විද්‍යායාඃ අභ්‍යාසඃ 'විද්‍යාභ්‍යාසඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'විද්‍යාභ්‍යාස' ශබ්දඃ; [කරොති] 'ඩුකෘඤ්' කරණෙ, සකර්මකඃ උභයපදී. දුෂ්ටශ්චාසෞ බාලකශ්චෙති 'දුෂ්ටබාලකඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දුෂ්ටබාලක' ශබ්දඃ; [ක්‍රීඩයති] 'ඩුකෘඤ්'-කරණෙ, අකර්මකඃ පරස්මෛපදී.

d. තත්, එය; උක්තම්, කියනලදී; උක්තම්-කෘදන්තකර්මකාරක ක්‍රියා; තත්-උක්තකර්ම; (නීතිවෛද්‍යෛඃ)-අධ්‍යාහෘත අනුක්ත කර්තා; දකාරාන්ත'තද්' ශබ්දඃ කලීවෙ; අකාරාන්ත කලීවලිඞ්ගා 'උක්ත' ශබ්දඃ.

a. “කො'ර්ථඃ පුත්‍රෙණජාතෙන-යො නවිද්වාං න ධාර්මිකඃ
කාණෙන චක්‍ෂුෂා කිංවා-චක්‍ෂුඃ පීඩෛව කෙවලම්.”

---

## 9 නවමඃ පාඨඃ.

---

**b. අසිදුජ්ජයින්‍යාං සත්‍ය ප්‍රියො නාම කො'පි බ්‍රාහ්මණඃ.**

---

a. යඃ, යම් පුත්‍රයෙක් තෙම; න විද්වාන්, පණ්ඩිත නොවේද? න ධාර්මිකඃ, ධාර්මික නොවේද? ජාතෙන, උපන්නාවූ; තෙන පුත්‍රෙන, ඒ පුත්‍රයා කරණකොටගෙන; කඃ අර්ථඃ, කවර ප්‍රයොජනද? කාණෙන, කණවූ; චක්‍ෂුසා, ඇසින්; කිංවා, කවර ප්‍රයොජනද? කෙවලම්, හුදක්; චක්‍ෂුඃ පීඩා එව, ඇසට පීඩා පමණෙක්මය. (ස්‍යාත්)-ලිඞ්ක්‍රියා; (සඃ)-උක්තප්‍රකෘති කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; පුත්‍රෙණ-අනුක්තකරණම්; ජාතෙන-තත් විශෙෂණම්; යඃ-උක්තප්‍රකෘති කර්තෘ; විද්වාන්-උක්ත විකෘති කර්තෘ; න-අව්‍යයම්; (යඃ)-උක්ත ප්‍රකෘති කර්තෘ; ධාර්මිකඃ-උක්ත විකෘති කර්තෘ; න-අව්‍යයම්; (ස්‍යාත්)-ලිඞ් ක්‍රියා; කිං-උක්තකර්තෘ; වා-අව්‍යයම්; චක්‍ෂුෂා-අනුක්තකරණම්; කාණෙන-තත් විශෙෂණම්; (ස්‍යාත්)-ලිඞ් ක්‍රියා; චක්‍ෂුඃ පීඩා-උක්ත කර්තෘ; එව-අව්‍යයම්; කෙවලම්-ක්‍රියාවිශෙෂණම්. මකාරාන්ත ‘කිම්’ ශබ්දඃ පුංසි; අකාරාන්ත පුංලිඞ්ගා ‘අර්ථ’ ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා ‘පුත්‍ර’ ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා ‘ජාත’ ශබ්දඃ; දකාරාන්ත ‘යද්’ ශබ්දඃ පුංසි; සකාරාන්ත පුංලිඞ්ගා ‘විද්වස්’ ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා ‘ධාර්මික’ ශබ්දඃ; අකාරාන්ත කලීව ලිඞ්ගා ‘කාණ’ ශබ්දඃ; සකාරාන්තකලීව ලිඞ්ගා ‘චක්‍ෂුස්’ ශබ්දඃ; චක්‍ෂුසඃ පීඩා ‘චක්‍ෂුඃ පීඩා’-ෂෂ්ඨිතත්පුරුෂඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා ‘චක්‍ෂුඃ පීඩා’ ශබ්දඃ; අකාරාන්ත කලීව ලිඞ්ගා ‘කෙවල’ ශබ්ද.

b. උජ්ජයින්‍යාං, උදෙනි පුරියෙහි; සත්‍ය ප්‍රියඃ නාම, සත්‍ය ප්‍රිය නම්වූ; කඃ අපි බ්‍රාහ්මණඃ, කිසියම් බමුණෙක්; ආසීත්; වී. ආසීත්-ලුඞ් ක්‍රියා; බ්‍රාහ්මණඃ-උක්ත කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; නාම-අව්‍යයම්; සත්‍යඃ ප්‍රියඃ-කර්තෘ විශෙෂණම්; උජ්ජයින්‍යාම්-අනුක්තාධාරඃ-‘අස’-භුවි, අකර්මකඃ පරස්මෛපදී. ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා ‘උජ්ජයිනී’ ශබ්දඃ; සත්‍යං ප්‍රියං යස්‍යා සෞ ‘සත්‍ය ප්‍රියඃ’-ෂෂ්ඨී බහු ව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගා ‘සත්‍ය ප්‍රිය’ ශබ්දඃ; මකාරාන්ත ‘කිම්’ ශබ්දඃ පුංසි; අකාරාන්ත පුංලිඞ්ගා ‘බ්‍රාහ්මණ’ ශබ්දඃ;

**a. ස ච පුත්‍රමෙකං පත්නීඤ්ච රක්ෂිත්වා මෘතඃ.**
**b. සො'පි විජපුත්‍රඃ පාලිතො මාත්‍රා ප්‍රතිදිනං ව්‍යවර්ධත.**
**c. අථ ගච්ඡති කාලෙ යදා යදා'සෞ බාල සුලභෙන කුතූහලෙන 'ඉදං කිං, කිමස්‍ය නාම, කො වා අස්‍ය ගුණඃ, අනෙන කිංවා ක්‍රියත ඉත්‍යාදිකං' මාතරමපෘච්ඡත්.**

---

a. සඃ ච, හෙතෙම වනාහි; එකං පුත්‍රං, එක් පුතෙකුද; පත්නීඤ්ච, භාර්‍ය්‍යාවකද; රක්ෂිත්වා, රැක; මෘතඃ, මෙළේය; මෘතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; සඃ-උක්ත කර්තා; ච-අව්‍යයම්; රක්ෂිත්වා-පූර්වක්‍රියාවාචි 'ත්වා' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; පත්නීං-රක්ෂණ ක්‍රියායාඃ අනුක්ත කර්ම; පුත්‍රං-අනුක්තකර්ම; එකං-තත් විශෙෂණම්; ච-අව්‍යයම්; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'පත්නී' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'මෘත' ශබ්දඃ; 'මෘඤ්'- ප්‍රාණත්‍යාගෙ; අකර්මකඃ ආත්මනෙපදී, ක්වචිත් පරස්මෛපදී.

b. සඃ අපි විජපුත්‍රඃ, ඒ බමුණු දරුතෙමේද; මාත්‍රා, මව විසින්; පාලිතඃ, රක්නාලද්දේ; ප්‍රතිදිනං, දිනක් පාසා; ව්‍යවර්ධත, වැඩුනේය. ව්‍යවර්ධත-ලඞ්ක්‍රියා; විජපුත්‍රඃ-උක්ත කර්තා; සඃ-කර්තෘ විශෙෂණම්; අපි-අව්‍යයම්; පාලිතඃ-කර්තෘ විශෙෂණම්; මාත්‍රා-පාලන ක්‍රියායාඃ අනුක්ත කර්තා; දිනෙ දිනෙ 'ප්‍රතිදිනං'-අව්‍යයීභාවඃ; විජස්‍ය පුත්‍රඃ 'විජපුත්‍රඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'විජපුත්‍ර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'පාලිත' ශබ්දඃ; දිනෙදිනෙ ප්‍රතිදිනං වීප්සාර්ථෙ අව්‍යයම්; 'වි' පූර්ඃ 'වෘධු'-වෘද්ධෞ, භ්වාදි අකර්මකඃ ආත්මනෙපදී.

c. අථ, ඉක්බිති; කාලෙගච්ඡති, කල්යනකල්හි; යදා යදා, යම්යම් කලෙක්හි; අසෞ, මේ තෙම; බාලසුලභෙන, බාලයන්ට සුලභවූ; කුතූහලෙන, කුහුල්සිතින්; ඉදං කිම්, මේ කිමෙක්ද? අස්‍ය නාම කිං, මොහුගේ නම කිමෙක්ද? අස්‍ය, මොහුගේ; ගුණඃ, ගුණය; කඃ වා, කවරෙක්ද? අනෙන, මෙයින්; කිංවා, කුමක් නම්; ක්‍රියත, කරනුලැබේද? ඉත්‍යාදිකං, මේ ආදිය; මාතරං, මව; අපෘච්ඡත්, විචාළේය. අපෘච්ඡත්-ලඞ්ක්‍රියා; අසෞ-උක්ත කර්තා; 'ඉදං කිම්, කිමස්‍ය නාම, කොවා අස්‍ය ගුණඃ, අනෙන කිංවා ක්‍රියත ඉත්‍යාදිකං' වාක්‍යාර්ථඃ අනුක්ත මුඛ්‍යකර්ම; මාතරං-අනුක්ත ගෞණකර්ම; කුතූහලෙන-අනුක්තකරණම්; බාලසුලභෙන-තත්විශෙෂණම්; යදා යදා-'දා' ප්‍රත්‍යයාන්තමව්‍යයෙ; කාලෙ-කාලසප්තමී; ගච්ඡති-තත්විශෙෂණම්; අථ-අව්‍යයම්; තකාරාන්ත පුංලිඞ්ගා 'ගච්ඡත්' ශබ්දඃ; අකාරාන්තපුං

**a. තද මාත්‍රා 'ත්වං පඨ, පඨනෙන ඥාස්‍යසි'ත්‍යභිහිතඃ.**

**b. එවං වර්ධිතඥාන තෘෂ්ණස්තු ස විප්‍රදරකඃ ස්වල්පෙ නෙව කාලෙන බහුතරං විෂයං ජඥෞ.**

---

ලිඞ්ගො 'කාල' ශබ්දඃ; බාලානාං සුලභඃ 'බාලසුලභඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත කලිවලිඞ්ගො 'බාලසුලභ' ශබ්දඃ; අකාරාන්ත කලිව ලිඞ්ගො 'කුතුහල' ශබ්දඃ; අකාරාන්ත කලිව ලිඞ්ගො 'ආදික' ශබ්දඃ; 'පෘච්ඡ්'-ජිඥසායාම්, තුදාදි ද්විකර්මකඃ; පරස්මෛපදී. (ස්‍යාත්)-ලිඞ්ක්‍රියා; නාම-උක්ත කර්තෘ; කිං-කර්තෘ විශෙෂණම්; අස්‍ය-අනුක්ත සම්බන්ධඃ, (ස්‍යාත්)-ලිඞ්ක්‍රියා; ගුණඃ-උක්ත කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; අස්‍ය-අනුක්ත සම්බන්ධඃ; වා-අව්‍යයම්, ක්‍රියතෙ-ලට්ක්‍රියා; කිං-උක්තකර්ම; අනෙන-අනුක්තකරණම්; වා-අව්‍යයම්; 'ඩුකෘඤ්'-කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

a. තදා, එකල්හි; මාත්‍රා, මව විසින්; ත්වං, තෝ; පඨ, හදාරව; පඨනෙන, හැදෑරීමෙන්; ඥාස්‍යසි ඉති, දන්නෙහි යයි; අභිහිතඃ, කියනලදී. අභිහිතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; (සඃ)-උක්ත ගෞණ කර්ම; 'ත්වං පඨ, පඨනෙන ඥාස්‍යසි' ඉති වාක්‍යාර්ථඃ උක්තමුඛ්‍යකර්ම; මාත්‍රා-අනුක්ත කර්තෘ; තදා-'දා' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; අකරාන්ත පුංලිඞ්ගො 'අභිහිත' ශබ්දඃ; 'අභි' පූර්වඃ 'හි'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී, පඨ-ලොට් ක්‍රියා; ත්වම්-උක්ත කර්තෘ; පඨ-ව්‍යක්තායාම් වාචි භ්වාදි සකර්මකඃ පරස්මෛපදී. ඥාස්‍යසි-ලෘට් ක්‍රියා; (ත්වං)-උක්ත කර්තෘ; පඨනෙන-අනුක්ත කරණම්; අකාරාන්ත කලීව ලිඞ්ගො 'පඨන' ශබ්දඃ; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

b. එවං, මෙසේ; වර්ධිත ඥාන තෘෂ්ණඃ, වැඩුනාවූ හැදෑරීමෙහි ආසාඇති; සඃ විප්‍රකාරඃතු, ඒ බමුණු දරුතෙම වනාහි; ස්වල්පෙනෛවකාලෙන, මදකලකින්ම; බහුතරං, ඉතා බොහෝවූ; විෂයං, කරුණු; ජඥෞ, දැනගත්තේය. ජඥෞ-ලිට්ක්‍රියා; විප්‍රදරකඃ-උක්ත කර්තෘ; සඃ-කර්තෘ විශෙෂණම්; වර්ධිතඥාන තෘෂ්ණඃ-කර්තෘ විශෙෂණම්; එවං, එව-අව්‍යයෙ; තු-අව්‍යයම්, විෂයං-අනුක්තකර්ම; බහුතරං-කර්ම විශෙෂණම්; කාලෙන-අනුක්ත කරණම්; ස්වල්පෙන-තත්විශෙෂණම්; ඥානෙ තෘෂ්ණා 'ඥානතෘෂ්ණා,' වර්ධිතඥාන තෘෂ්ණා යස්‍යා සෞ' වර්ධිතඥාන තෘෂ්ණඃ'-තත්පුරුෂ ගර්භ බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගො, 'වර්ධිතඥාන තෘෂ්ණ' ශබ්දඃ; විප්‍රස්‍ය දරකඃ 'විප්‍රදරකඃ'-ෂෂ්ඨී

**a. මුමුදෙ ච මාතා පශ්‍යන්ති පුත්‍රස්‍ය ඥානොපචයම්.**

---

## 10. දශමඃ පාඨඃ.

---

**b. විපන්න බන්ධුර්නාම කො'පි බාලඃ පාඨශාලායා ගෘහං ප්‍රතිනිවර්තමානඃ පථි ක්ෂුධාතුර මන්ධපුරුෂමපශ්‍යත්.**

---

තත්පුරුෂඃ; අකාරාන්තපුංලිඞ්ගා 'විප්‍රදූරක' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා; 'ස්වල්ප' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කාල' ශබ්දඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'බහුතර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'විෂය' ශබ්දඃ; 'ඥා'-අවබොධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. පුත්‍රස්‍ය, පුත්‍රයාගේ; ඥානොපචයම්, ඥානාභිවෘද්ධිය; පශ්‍යන්ති; දක්නාවූ; මාතාච, මව්තොමෝද; මුමුදෙ, සතුටුවූවාය. මුමුදෙ-ලිට්ක්‍රියා; මාතා-උක්ත කර්තෘ; පශ්‍යන්ති-කර්තෘ විශෙෂණම්; ඥානොපචයම්-දර්ශන ක්‍රියායාඃ අනුක්ත කර්ම; පුත්‍රස්‍ය-අනුක්තසම්බන්ධඃ; ච-අව්‍යයම්; ඊකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'පශ්‍යන්ති' ශබ්දඃ; ඥානස්‍ය උපචයඃ 'ඥානොපචයඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ඥානොපචය' ශබ්දඃ; 'මුද'-හර්ෂෙ, අකර්මකඃ ආත්මනෙපදී.

b. විපන්න බන්ධුඃ නාම, විපන්න බන්ධු නම්වූ; කඃ අපි බාලකඃ, කිසියම් ළදරුවෙක් තෙම; පාඨශාලායාඃ, පාඨශාලාවේ සිට, හෙවත් පාඨශාලාවෙන්; ගෘහම්, ගෙට; ප්‍රති නිවර්තමානඃ, පෙරළා එන්නේ; පථි, මාර්ගයෙහි; ක්ෂුධාතුරම්, ක්ෂුධාවෙන් පීඩිතවූ; අන්ධපුරුෂම්, අන්ධපුරුෂයකු; අපශ්‍යත්, දිටී. අපශ්‍යත්-ලිඞ් ක්‍රියා; බාලඃ-උක්තකර්තෘ; විපන්නබන්ධුඃ-කර්තෘ විශෙෂණම්; ප්‍රතිනිවර්තමානඃ-කර්තෘ විශෙෂණම්; ගෘහං-ප්‍රතිනිවර්තමාන ක්‍රියායාඃ අනුක්ත කර්ම; පාඨශාලායාඃ-අනුක්තාපාදානම්; අන්ධපුරුෂං-දර්ශන ක්‍රියායාඃ අනුක්තකර්ම; ක්ෂුධාතුරම්-කර්මවිශෙෂණම්; පථි-අනුක්තාධාරඃ; විපන්නාඃ බන්ධවාඃ යස්‍යා සො 'විපන්න බන්ධුඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; උකාරාන්ත පුංලිඞ්ගා 'විපන්න බන්ධු' ශබ්දඃ; නාම-ප්‍රකාශෙව්‍යයම්; පාඨස්‍ය ශාලා 'පාඨශාලා'-ෂෂ්ඨී තත්පුරුෂඃ;

**a. අථාසෞ ස්වගෘහමාසාද්‍ය මාතරමඤ්චලෙ ගෘහීත්වා වාච.**

**b. මාතඃ! අද්‍ය ගෘහමාගච්ඡතා මයා ශිශුනා පුත්‍රෙණ නීයමානඃ කශ්චිත් පුරුෂො දෘෂ්ටඃ.**

---

ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'පාඨශාලා' ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ගා 'ප්‍රතිනිවර්තමාන' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගා 'පථින්' ශබ්දඃ; ක්ෂුධාඃ ආතුරඃ 'ක්ෂුධාතුරඃ'-තෘතීයාතත්පුරුෂඃ, අන්ධශ්චාසෞ පුරුෂශ්චෙති 'අන්ධපුරුෂඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; අපශ්‍යත්, අපශ්‍යතාම්, අපශ්‍යන්; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. අථ, ඉක්බිත්තෙන්; අසෞ, මේ තෙම; ස්වගෘහම්, තමාගේ ගෙට; ආසාද්‍ය, පැමිණ; මාතරං, මව; අඤ්චලෙ, රෙදි කෙළවර; ගෘහීත්වා, අල්වාගෙන; උවාච, මෙසේ කී. උවාච-ලිට් ක්‍රියා; අසෞ-උක්ත කර්තෘ; මාතරම්-අනුක්ත කර්ම; ගෘහීත්වා-පූර්ව ක්‍රියාවාචි 'ත්වා' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; අඤ්චලෙ-කර්මනි සප්තමී; ආසාද්‍ය-පූර්ව ක්‍රියාවාචි ල්‍යබන්තමව්‍යයම්; ස්වගෘහම්-අනුක්තකර්ම; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; ස්වස්‍ය ගෘහම් 'ස්වගෘහම්'-ෂෂ්ඨීතත් පුරුෂඃ; ස්වඤ්ච තත්ගෘහඤ්චෙති 'ස්වගෘහම්'-කර්මධාරයඃ; අකාරාන්ත නැලිව ලිඞ්ගා 'ස්වගෘහ' ශබ්දඃ; ආසාද්‍ය-'ආ' පූර්වඃ 'සද්'-විසරණ ගත්‍යවසාදනෙෂු, ඉත්‍යස්මාත් ධාතොල්‍යප්; අකාරාන්ත නැලිව ලිඞ්ගා 'අඤ්චල' ශබ්දඃ; ගෘහීත්වා-'ග්‍රහ'-උපාදානෙ, ඉත්‍යස්මාත් ධාතොඃ ත්වාම්; 'වච'-ව්‍යක්තායාම් වාචි අදාදි විකර්මකඃ පරස්මෛපදී.

b. මාතඃ, මෑණියෙනි; අද්‍ය, අද; ගෘහම් ආගච්ඡතා, ගෙට එන්නාවූ; මයා, මාවිසින්; ශිශුනා, ළදරුවූ; පුත්‍රෙණ, පුතකු විසින්; නීයමානඃ, ගෙනයනු ලබන්නාවූ; කශ්චිත් පුරුෂඃ, කිසියම් පුරුෂයෙක් තෙම; දෘෂ්ටඃ, දක්නාලද්දේය. දෘෂ්ටඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; පුරුෂඃ උක්තකර්ම; කශ්චිත්-කර්ම විශෙෂණම්; නීයමානඃ-කර්ම විශෙෂණම්; පුත්‍රෙණ-අනුක්ත කර්තෘ; ආගච්ඡතා-කර්තෘවිශෙෂණම්; ශිශුනා-තත් විශෙෂණම්; මයා-දර්ශන ක්‍රියායාඃ අනුක්ත කර්තෘ; ගෘහම්-ආගමන ක්‍රියා යාඃ අනුක්ත කර්ම; මාතඃ-සම්බොධනෙ ප්‍රථමා; තකාරාන්ත පුංලිඞ්ගා 'ගච්ඡත්'

a. ස හි චක්ඛුර් විහීනො න කිඤ්චිදපි පශ්‍යති.
b. අනශනෙන ශරීරං තස්‍ය ශීර්ණතාං ගතම්.
c. ගාත්‍රෙච වස්ත්‍රමාත්‍රමපි නාස්ති,
d. න ජානෙ කථං ස ජීවති’ති.

---

ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගා 'ශිශු' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'නීයමාන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දෘෂ්ට' ශබ්දඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. සඃහි, හෙතෙම වනාහි; චක්ෂුර්විහීනඃ, ඇස්නැත්තේ; කිඤ්චිත් අපි, කිසිවකුත්; නපශ්‍යති, නොදකී. පශ්‍යති-ලට් ක්‍රියා; සඃ-උක්තකර්තෘ; චක්ෂුර් විහීනඃ-කර්තෘ විශෙෂණම්; න,අපි-අව්‍යයානි; කිඤ්චිත්-අනුක්තකර්ම; චක්ෂුසා විහීනඃ 'චක්ෂුර් විහීනඃ'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'චක්ෂුර් විහීන' ශබ්දඃ; දෘශිර්-ප්‍රෙක්ෂණෙ, භවාදි සකර්මකඃ පරස්මෛපදී, දෘශෙඃ පශ්‍යාදෙශඃ.

b. අනශනෙන, නොකෑමෙන්; තස්‍ය, ඔහුගේ; ශරීරං, ශරීරය; ශීර්ණතාම්, වැරැණුබවට; ගතම්, ගියේය. ගතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; ශරීරම්-උක්ත කර්තෘ; ශීර්ණතාම්-අනුක්තකර්ම; තස්‍ය-අනුක්තසම්බන්ධඃ; අනශනෙන-අනුක්ත කරණම්; න අශනම් 'අනශනම්'-නඤ් තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'අශන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ශරීර' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ශීර්ණතා' ශබ්දඃ; ශීර්ණස්‍ය භාවං 'ශීර්ණතා'-අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ගත' ශබ්දඃ; 'ගමෙෘ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

c. ගාත්‍රෙච, හස්තපාදයෙහිද; වස්ත්‍ර මාත්‍රම් අපි, වස්ත්‍ර පමණකුත්; නාස්ති, නැති. නාස්ති-අව්‍යයම්, අථවා න-අව්‍යයම්; අස්ති-ලට්ක්‍රියා; වස්ත්‍රමාත්‍රම්-උක්තකර්තෘ; අපි, ච-අව්‍යයෙ; ගාත්‍රෙ-අනුක්තාධාරඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ගාත්‍ර' ශබ්දඃ; වස්ත්‍රස්‍ය මාත්‍රම් 'වස්ත්‍රමාත්‍රම්'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'වස්ත්‍ර මාත්‍ර' ශබ්දඃ;

d. සඃ, හෙතෙම; කථම්, කෙසේ; ජීවතිඉති, ජීවත්වේදැයි; නජානෙ, නොදනිමි. ජානෙ-ලට් කර්තෘ කාරක ක්‍රියා; අහං-අධ්‍යාහෘත උක්තකර්තෘ; 'කථං සජීවති' ඉති වාක්‍යාර්ථඃ අනුක්ත කර්ම; කථං-ක්‍රියාවිශෙෂණෙව්‍යයම්; 'ජීව'-ප්‍රාණධාරණෙ, භවාදි අකර්මකඃ පරස්මෛපදී; 'ඥා'-අවබොධනෙ, ක්‍රයාදි සකර්මකඃ උභයපදී.

**a. මාත්‍රාච පුත්‍රවචනං නිශම්‍ය කෘපයා පුරාතනං වසන මේකං මුද්‍රා චෛකා තදර්ථං පුත්‍රහස්තෙ සමර්පිතා.**

**b. අථ විපන්නබන්ධුඃ ප්‍රමුදිතො ගෘහාන්නිෂ්ක්‍රම්‍ය අබ්ධි මාහූය තත්සර්වං තස්මෛ ප්‍රදදෞ.**

---

a. මාත්‍රාච, මවවිසින්ද; පුත්‍රවචනං, පුත්‍රයාගේ වචනය; නිශම්‍ය,අසා; කෘපයා, කරුණාවෙන්; පුරාතනං, පුරාණවූ; එකං වසනං, එක්වස්ත්‍රයක්ද; එකාමුද්‍රාච, එක්මුද්‍රාවක්ද; තදර්ථං, ඔහු පිණිස;පුත්‍රහස්තෙන පුත්‍රයා අතෙහි; සමර්පිතා, තබනලද්දීය. සමර්පිතා-කෘදන්තකර්මකාරක ක්‍රියා; මුද්‍රා, උක්තකර්ම; පුරාතනං-කර්මවිශෙෂණම්;එකං-කර්මවිශෙෂණම්; ච-අව්‍යයම්; පුත්‍රහස්තෙ-අනුක්තාධාරඃ; මාත්‍රා-අනුක්ත කර්තෘ; තදර්ථං-කර්මවිශෙෂණම්; නිශම්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; පුත්‍රවචනං-පූර්වක්‍රියායාඃ අනුක්ත කර්ම; පුත්‍රස්‍යවචනං 'පුත්‍රවචනං'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'පුත්‍රවචන' ශබ්දඃ; නිශම්‍යෙති-'නි' පූර්වාත් 'ශම්'-උපශමෙ, ඉත්‍යස්මාත් ධාතොඃල්‍යප්; කෘපයා-අනුක්ත කරණම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'කෘපා' ශබ්දඃ; පුරාභවම් 'පුරාතනම්'-තද්ධිත 'තන' ප්‍රත්‍යයඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො 'පුරාතන' ශබ්දඃ; අකාරාන්ත ක්ලීවලිඞ්ගො'වසන' ශබ්දඃ; අකාරාන්ත 'එක' ශබ්දඃ, ක්ලීවෙ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මුද්‍රා' ශබ්දඃ; ආකාරාන්ත 'එකා' ශබ්දඃ, ස්ත්‍රියම්; තස්මෛ ඉදං 'තදර්ථං' (තස්‍ය අර්ථඃ-'තදර්ථඃ')-අර්ථෙන නිත්‍ය සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'තදර්ථ' ශබ්දඃ; පුත්‍රස්‍ය හස්ත 'පුත්‍ර හස්ත'-ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පුත්‍රහස්ත' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'සමර්පිතා' ශබ්දඃ; 'සම්' පූර්වඃ 'ඍ'-ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

b. අථ, ඉක්බිති; විපන්නබන්ධුඃ, විපන්න බන්ධු තෙම; ප්‍රමුදිතඃ, සතුටුවූයේ; ගෘහාත්, ගෘහයෙන්; නිෂ්ක්‍රම්‍ය, නික්ම; අබ්ධිං ආහූය, අබ්ධියාකැඳවා; තත්සර්වම්, ඒ සියල්ල; තස්මෛ, ඕහට; ප්‍රදදෞ, දුන්නේය. ප්‍රදදෞ-ලිට්ක්‍රියා; විපන්න බන්ධුඃ-උක්ත කර්තෘ; ප්‍රමුදිතඃ-කර්තෘ විශෙෂණම්; තස්මෛ-අනුක්තසම්ප්‍රදානම්; සර්වං-අනුක්තකර්ම; තත්-කර්මවිශෙෂණම්; ආහූය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; අබ්ධිඃ-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; නිෂ්ක්‍රම්‍ය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; ගෘහාත්-අනුක්තාපාදානම්; අථ-අනන්තරාර්ථෙ'ව්‍යයම්;

**a. අම්බස්තු වස්ත්‍රං මුද්‍රාඤ්ච ප්‍රාප්‍ය බාහු උද්‍යම්‍ය විපන්න බන්ධවෙ බහුවිධා ආශිෂඃ ප්‍රයුජ්‍ය ගෘහං ප්‍රස්ථිතඃ.**

**b. මාතා ච ප්‍රතිනිවෘත්තං පුත්‍රං ශිරස්‍යාඝ්‍රාය උවාච, වත්ස! ජානාසි දයාං කර්තුමපි, අහො මෙ සුදිවස ඉති.**

---

විපන්නබන්ධවඃ යස්‍යාසෞ 'විපන්නබන්ධුඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; නිෂ්ක්‍රම්‍යෙති-'නිෂ්' පූර්වාත් 'ක්‍රමු'-පදවික්ෂෙපෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; ආහූය-'ආ' පූර්වාත් 'හ්වෙඤ්'-ස්පර්ධායාම්, ශබ්දෙච, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; තත් ච තත්සර්වඤ්චෙති 'තත් සර්වං'-කර්මධාරයඃ; අකාරාන්ත ක්ලීබ ලිඞ්ගො 'තත්සර්ව' ශබ්දඃ; 'ප්‍ර' පූර්වඃ 'දා'-දානෙ, ජුහොත්‍යාදි සකර්මකඃ උභයපදී.

a. අම්බස්තු, අම්බතෙම වනාහි; වස්ත්‍රං, වස්ත්‍රයද; මුද්‍රාඤ්ච, මිළද; ප්‍රාප්‍ය, ලැබ; බාහු, දෙඅත්; උද්‍යම්‍ය, ඔසවා; විපන්න බන්ධවෙ, විපන්නබන්ධුහු කෙරෙහි; බහුවිධා, බොහෝ ප්‍රකාරවූ; ආශිෂඃ, ආශිර්වචනයන්; ප්‍රයුජ්‍ය, යොදා; ගෘහං, ගෙට; ප්‍රස්ථිතඃ, ගියේය. ප්‍රස්ථිතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; අම්බඃ-උක්ත කර්තෘ; තු-අව්‍යයම්; ගෘහම්-අනුක්තකර්ම; ප්‍රයුජ්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; ආශිෂඃ-ල්‍යබන්තස්‍ය අනුක්තකර්ම; බහුවිධාඃ-කර්මවිශෙෂණම්; විපන්න බන්ධවෙ-අනුක්තාධාරඃ; උද්‍යම්‍ය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; බාහු-ල්‍යබන්තස්‍ය අනුක්ත කර්ම; ප්‍රාප්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; වස්ත්‍රම්-ල්‍යබන්තස්‍ය අනුක්තකර්ම; මුද්‍රා-ල්‍යබන්තස්‍ය අනුක්තකර්ම; ච-කර්මසමුච්චයෙ අව්‍යයම්; අකාරාන්තපුංලිඞ්ගො 'අම්බ' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'මුද්‍රා' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගො 'විපන්නබන්ධු' ශබ්දඃ; විපන්නබන්ධවඃ යස්‍යාසෞ 'විපන්නබන්ධුඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; ආකාරාන්ත; ස්ත්‍රීලිඞ්ගො 'බහුවිධා' ශබ්දඃ; සකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ආශිස්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රස්ථිත' ශබ්දඃ; ප්‍රාප්‍යෙති-'ප්‍ර' පූර්වාත් 'අප'-ප්‍රාප්තෞ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; ප්‍රයුජ්‍යෙති-'ප්‍ර' පූර්වාත් 'යුජ'-යොගෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; ප්‍රස්ථිතඃ-'ප්‍ර' පූර්වඃ 'ෂ්ඨා'-ගති නිවෘත්තෞ, උපසර්ග වශාත් ගත්‍යර්ථඃ.

b. මාතා ච, මව්තොමෝද; ප්‍රතිනිවෘත්තං, පෙරලා නැවැත් තාවූ හෙවත් ආපසු ආවාවූ; පුත්‍රං, පුත්‍රයාට; ශිරසි, මස්තකය; ආඝ්‍රාය, සිඹ; උවාච, මෙසේ කීව; වත්ස!, දරුව; දයාකර්තුම් අපි, කරුණා කරන්ටද; ජානාසි, දන්නෙහි; අහො, අනේ; මෙ, මට; සුදිවසඃ ඉති, මනාදිවසෙක් වියයුතුයි. උවාච-ලිට් ක්‍රියා; මාතා-

# 11. එකාදශඃ පාඨඃ

**a. කදාචිත් ග්‍රීෂ්ම සමයෙ සරලානාම කාචිත් කන්‍යකා නර්මදාතීරෙ භ්‍රමන්ති ස්‍රොතසි නිමග්නොන්මග්නං කුක්කුර ශාවමපශ්‍යත්.**

---

උක්තකර්ත්‍රී; පුත්‍රම්-අනුක්ත ගෞණ කර්ම; 'වත්ස ජානාසි දයාං කර්තුමපි, අහො මෙ සුදිවස ඉති' වාක්‍යාර්ථඃ-අනුක්ත මුඛ්‍යකර්ම; ප්‍රතිනිවෘත්තම්-අනුක්ත ගෞණ කර්ම විශෙෂණම්; ආඝ්‍රාය-ල්‍යබන්ත පූර්වක්‍රියා; ශිරසි-ල්‍යබන්තස්‍ය කර්මනි සප්තමී; ජානාසි-ලට්ක්‍රියා; (ත්වං)-උක්තකර්තා; වත්ස-සම්බොධනෙ ප්‍රථමා; කර්තුං-ක්‍රියාවාචි තුමන්තමව්‍යයම්; දයාං-තුමන්තස්‍ය අනුක්ත කර්ම; අහො-විස්මයාර්ථෙ අව්‍යයම්;(ආශිත්)-ලුඞ් ක්‍රියා;සුදිවසඃ-උක්තකර්තා; මෙ-අනුක්ත සම්බන්ධඃ; ශොභනො දිවසඃ 'සුදිවසඃ'-ප්‍රාදි කර්මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රතිනිවෘත්ත' ශබ්දඃ; සකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'ශිරස්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'වත්ස' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'දයා' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'සුදිවස' ශබ්දඃ; ආඝ්‍රාය-'ආ' පූර්වාත් 'ඝ්‍රා'-ගන්ධොපාදානෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; උවාච-'වච'-ව්‍යක්තායාං වාචි අදාදි ද්විකර්මකඃ පරස්මෛපදී; ජානාසි-'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදිසකර්මකඃ පරස්මෛපදී; කර්තුම්-'ඩුකෘඤ්'-කරණෙ, ඉත්‍යස්මාත් ධාතොඃ තුමන්තමව්‍යයම්; ඉති-වාක්‍ය පරිසමාප්ත්‍යර්ථෙ අව්‍යයම්.

a. කදාචිත්, කිසිකලෙක්හි; ග්‍රීෂ්ම සමයෙ, ග්‍රීෂ්මකාලයෙහි; සරලානාම, සරලානම්වූ; කාචිත් කන්‍යකා, කිසියම් කන්‍යාවක් තොමෝ; නර්මදාතීරෙ, නර්මදානම් ගංතෙර; භ්‍රමන්ති, ඇවිදින්නී; ස්‍රොතසි, ජලවෙගයෙහි හෙවත් සැඩ පාරෙහි; නිමග්නොන්මග්නම්, ගිලිගිලී සිටිනාවූ; කුක්කුරශාවම්, බලුපැටවකු; අපශ්‍යත්, දිටී. අපශ්‍යත්-ලුඞ් ක්‍රියා; කන්‍යකා-උක්තකර්ත්‍රී; කුක්කුර ශාවම්-අනුක්ත කර්ම; සරලා-කර්තෘ විශෙෂණම්; කාචිත්-කර්තෘ විශෙෂණම්; නර්මදාතීරෙ-අනුක්තාධාරඃ; කදාචිත්-කාලාර්ථෙ අව්‍යයම්; ග්‍රීෂ්ම සමයෙ-කාලසප්තමී; නිමග්නොන්මග්නම්-කර්මවිශෙෂණම්; ස්‍රොතසි-අනුක්තාධාරඃ; නාම-ප්‍රකාශෙව්‍යයම්; කශ්චිත් කාලෙ 'කදා'-'දා' ප්‍රත්‍යයාන්තමව්‍යයම්; (කදාචිත්-'චිත්' ප්‍රත්‍යයාන්තමව්‍යයම්); ග්‍රීෂ්මශ්චාසෞ සමයශ්චෙති 'ග්‍රීෂ්මසමයඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ;අකාරාන්ත පුංලිඞ්ගො 'ග්‍රීෂ්මසමය' ශබ්දඃ; ආකාරාන්ත

**a. උදහරච්ච තං කෘපයා නදී ප්‍රවාහාත්.**

**b. අථ සා මෘතප්‍රායං තං කුක්කුර ශාවකං ගෘහං නීත්වා බහුතරේණ යත්නේන ජීවයාමාස.**

---

ස්ත්‍රී ලිඞ්ගො 'සරලා' ශබ්දඃ; කාචිත්-ප්‍රථමාන්තාත් 'චිත්' ප්‍රත්‍යයාන්තමෞව්‍යයම්; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'කන්‍යකා' ශබ්දඃ; නර්මදායාඃ තීරං 'නර්මදාතීරං'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'නර්මදාතීර' ශබ්දඃ; ඊකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගො 'භ්‍රමන්තී' ශබ්දඃ; සකාරාන්ත ක්ලීවලිඞ්ගො 'ස්‍රොතස්' ශබ්දඃ; පූර්වං නිමග්න ශ්චාත් දුන්මග්නශ්චෙති 'නිමග්නොන්මග්නං'-විශෙෂණොභය පද කර්මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නිමග්නොන්මග්න' ශබ්දඃ; කුක්කුරශ්චාසෞ ශාවශ්චෙති 'කුක්කුර ශාවඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කුක්කුරශාව' ශබ්දඃ; අපශ්‍යත්, අපශ්‍යතාම්, අපශ්‍යන්; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. තං, ඔහු; කෘපයා, කරුණාවෙන්; නදී ප්‍රවාහාත්, ගඞ්ගා ප්‍රවාහයෙන් හෙවත් ගඟවතුරෙන්; උදහරච්ච, ගොඩලූවාය. උදහරච්ච-ලඞ් ක්‍රියා; (කන්‍යකා-උක්තකර්ත්‍රී); තං-අනුක්ත කර්ම; නදී ප්‍රවාහාත්-අනුක්තාපාදානම්; කෘපයා-අනුක්ත කරණම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'කෘපයා' ශබ්දඃ; නද්‍යාඃ ප්‍රවාහඃ 'නදී ප්‍රවාහඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'නදීප්‍රවාහ' ශබ්දඃ; 'උත්' පූර්වඃ 'හෘඤ්'-හරණෙ, භ්වාදි චිකර්මකඃ උභයපදී; 'උත්' පූර්වත්වෙ සකර්මකඃ.

b. අථ, ඉක්බිත්තෙන්; සා, ඕතොමෝ; මෘතප්‍රායම්, මළාක් වැනිවූ; තං කුක්කුර ශාවකම්, ඒ බලුපැටවා; ගෘහං, ගෙට; නීත්වා, ගෙනගොස්; බහුතරෙන යත්නෙන, ඉතා බොහෝවූ උත්සාහයෙන්; ජීවයාමාස, ජීවත් කර වී. ජීවයා මාස-ලිට් ක්‍රියා; සා-උක්ත කර්ත්‍රී; කුක්කුර ශාවකම්-අනුක්ත කර්ම; තං-කර්මවිශෙෂණම්; මෘතප්‍රායම්-කර්මවිශෙෂණම්; නීත්වා-පූර්ව ක්‍රියාවාචකත්වාච් ප්‍රත්‍යයාන්තමෞව්‍යයම්; ගෘහම්-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; යත්නෙන- අනුක්තකරණම්; බහුතරෙණ-කරණ විශෙෂණම්; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; මෘත ඉව 'මෘතප්‍රායඃ'-තද්ධිතාන්තඃ; කුක්කුරශ්චාසෞ ශාවකශ්චෙති 'කුක්කුරශාවකඃ'-කර්මධාරයඃ; අකාරාන්තපුං ලිඞ්ගො 'කුක්කුරශාවක' ශබ්දඃ; අකාරාන්ත පුං

**a. චකාරක්ඛ නාම තස්ස ජලාහර ඉති.**

**b. ස ච සාරමෙය ශිශුඃ සයත්න පාලිතස්තස්‍යාං නිතරාමනුරක්තො බභූව.**

---

ලිඞ්ගෝ 'මාතප්‍රාය' ශබ්දඃ; අතිශයෙන බහුඃ 'බහුතරඃ' -තද්ධිතාන්තඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'බහුතර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'යත්න' ශබ්දඃ; නිසෙවති-'නිසද්'-ප්‍රාපනෙ, ඉත්‍යස්මාත් ධාතොඃ කත්වාච්; ජීවයාමාස, ජීවයාමාසතුඃ, ජීවයාමාසුඃ; 'ජීව'-ප්‍රාණධාරණෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

a. තස්‍ය, ඔහට; ජලාහරඃ ඉති, ජලාහර යයි; නාමක්ඛව, නමක්ද; චකාර, කොළේය; චකාර-ලිට්ක්‍රියා; (සා-අධ්‍යාහෘත උක්තකර්ත්‍රි); නාම-අනුක්ත කර්ම; ජලාහරඃ-කර්ම විශෙෂණම්; ඉති-අව්‍යයම්; ඉති ශබ්දෙන උක්තත්වාත් 'ජලාහර' ඉත්‍යත්‍ර උක්තාර්ථෙ ප්‍රථමා; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; නකාරාන්ත ක්ලීව ලිඞ්ගෝ 'නාමන්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'ජලාහර' ශබ්දඃ, චකාර, චක්‍රතුඃ, චක්‍රුඃ; 'ඩුකෘඤ්'-කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

b. සඃ සාරමෙය ශිශුඃ ච, ඒ සුනක පොතක තෙමේද; සයත්නපාලිතඃ, උත්සාහ සහිතව රක්නා ලද්දේ; තස්‍යාම්, ඇය කෙරෙහි; නිතරාම්, අතිශයින්; අනුරක්තඃ බභූව, ඇළුණේ වී. බභූව-ලිට්ක්‍රියා; සාරමෙය ශිශුඃ-උක්ත ප්‍රකෘති කර්තා; සඃ-ප්‍රකෘති කර්තෘ විශෙෂණම්; අනුරක්තඃ-උක්ත විකෘති කර්තා; සයත්න පාලිතඃ-ප්‍රකෘති කර්තෘ විශෙෂණම්; තස්‍යාම්-අනුක්තාධාරඃ; නිත රාම්-'ආම්' ප්‍රත්‍යයාන්ත අව්‍යයම්; සාරමෙයස්‍ය ශිශුඃ 'සාරමෙය ශිශුඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ, අථවා, සාරමෙයශ්චාසෞ ශිශුශ්චෙති 'සාර මෙය ශිශුඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; උකාරාන්ත පුංලිඞ්ගෝ සාරමෙය ශිශු' ශබ්දඃ; යත්නෙන සහ වර්තතෙ ඉති 'සයත්නං'-සහ පූර්වපද බහුව්‍රීහිඃ; සයත්නං පාලිතඃ 'සයත්න පාලිතඃ'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගෝ 'සයත්න පාලිත' ශබ්දඃ; නිතරාම්-අතිශයාර්ථෙ 'ආම්' ප්‍රත්‍යයාන්ත අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගෝ 'අනුරක්ත' ශබ්දඃ; බභූව, බභූවතුඃ, බභූවුඃ; 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

**a. නමුමොච ක්‍ෂණමපි ස්නෙහාත් තත්සඞ්ගම්.**

**b. එවං ගච්ඡති කාලෙ එකදා රාත්‍රෞ සරලා සායාහ්නිකං කායස්ථජාතං සමාප්‍ය ශයනීයං භෙජෙ.**

**c. ජලාහරශ්ච පල්‍යඞ්කස්‍ය අධස්තාත් ප්‍රවිවෙශ.**

---

a. ස්නෙහාත්, ස්නෙහය හෙතුකොටගෙන, තත් සඞ්ගං ඇය කෙරෙහි ආලය; ක්‍ෂණං අපි, ඇසිල්ලකුත්; නමුමොච, නොහලේය. මුමොච-ලිට් ක්‍රියා; (සඃ-අධ්‍යාහාර උක්ත කර්තෘ); තත්සඞ්ගම්-අනුක්තකර්ම; ක්‍ෂණම්-අත්‍යන්ත සංයොගෙ ද්විතීයා; ස්නෙහාත්-අනුක්තාපාදානම්; අපි-අව්‍යයම්; තස්‍යාම් සඞ්ගඃ 'තත් සඞ්ගඃ'-සප්තමී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'තත් සඞ්ග' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ක්‍ෂණ' ශබ්දඃ; අකාරාන්ත පුං ලිඞ්ගා 'ස්නෙහ' ශබ්දඃ; මුමොච, මුමොචතුඃ, මුමොචුඃ; 'මුච'-මොචනෙ, තුදාදි සකර්මකඃ උභයපදී.

b. එවං, මෙසේ; කාලෙගච්ඡති, කල්යනකල්හි; එකදා, එක්දිනෙක්හි; රාත්‍රෞ, රාත්‍රියෙහි; සරලා, සරලාතොමෝ; සායාහ්නිකම්, සවසට සුදුසුවූ; කායස්ථ ජාතං, කායස්ථ සමූහය; සමාප්‍ය, නිමවා; ශයනීයම්, ඇඳ; භෙජෙ, භජනයකළාය. භෙජෙ-ලිට් ක්‍රියා; සරලා-උක්ත කර්තෘ; ශයනීයම්-අනුක්තකර්ම; සමාප්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; කායස්ථජාතම්-ල්‍යබන්තස්‍ය අනුක්තකර්ම; සායාහ්නිකම්, කර්මවිශෙෂණම්; රාත්‍රෞ-කාලසප්තමී; එකදා-කාලාර්ථ අව්‍යයම්; ගච්ඡති-භාවසප්තමී; කාලෙ-භාවසප්තමී විශෙෂණම්; එවං-නිදර්ශනෙ අව්‍යයම්; තකාරාන්ත පුංලිඞ්ගා 'ගච්ඡත්' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'කාල' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'සරලා' ශබ්දඃ; එකස්මින් කාලෙ 'එකදා'-දා ප්‍රත්‍යයාන්තමව්‍යයම්; ඉකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'රාත්‍රි' ශබ්දඃ; සායාහ්නෙ භවං 'සායාහ්නිකං'-තද්ධිතාන්තඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'සායාහ්නික' ශබ්දඃ; කායස්ථානාම් ජාතඃ 'කායස්ථජාතඃ'-ෂෂ්ඨීතත් පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'කායස්ථජාත' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'ශයනීය' ශබ්දඃ; සමාප්‍යෙති-'සම්' පූර්වාත් 'අප'-ව්‍යාප්තෞ, ඉත්‍යස්මාත් ල්‍යප්; 'භජ'-සෙවායාම්, භ්වාදි සකර්මකඃ උභයපදී.

c. ජලාහරශ්ච, ජලාහර තෙමේද; පල්‍යඞ්කස්‍ය අධස්තාත්, ඇඳ යටට; ප්‍රවිවෙශ, වනී. ප්‍රවිවෙශ-ලිට් ක්‍රියා; ජලාහරඃ-උක්ත කර්තෘඃ; අධස්තාත්-අනුක්තකර්ම; පල්‍යඞ්කස්‍ය-අනුක්ත සම්බන්ධඃ,

**a. අථාධිරාත්‍ර සමයෙ ජලාහරඃ ශබ්දං කර්තුමාරෙභෙ.**

**b. බුබුධෙච කන්‍යකා.**

**c. ප්‍රබුද්ධා ච සා කථං ජලාහරඃ ශබ්දයත ඉති ජිඥාසුරධස්තාත් චක්‍ෂුෂී නිධාය ඡුරිකා පාණිමුපවිෂ්ටං දස්‍යුමපශ්‍යත්.**

---

ච-අව්‍යයම්; අධස්තාත්-අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගො 'ජලාහර' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'පල්‍යඞ්ක' ශබ්දඃ; ප්‍රවිවෙශ, ප්‍රවිවෙශතුඃ, ප්‍රවිවිශුඃ; 'ප්‍ර' පූර්වඃ 'විශ'-ප්‍රවෙශනෙ, අකර්මකඃ පරස්මෛපදී; 'ප්‍ර' පූර්වො සකර්මකඃ.

a. අථ, ඉක්බිත්තෙන්; අධිරාත්‍රසමයෙ, අධිරාත්‍රි කාලයෙහි; ජලාහරඃ, ජලාහර තෙම; ශබ්දං කර්තුම්, ශබ්දකරන්ට; ආරෙභෙ, පටන්ගති. ආරෙභෙ-ලිට් ක්‍රියා; ජලාහරඃ-උක්තකර්තා; කර්තුම්-ක්‍රියාවාචී තුමන්ත අව්‍යයම්; ශබ්දං-තුමන්තස්‍ය අනුක්ත කර්ම; අධිරාත්‍ර සමයෙ-අනුක්තාධාරඃ; අථ-අව්‍යයම්; රාත්‍රෙඃ අර්ධං 'අධිරාත්‍රම්', අධිරාත්‍රස්‍ය සමයඃ 'අධිරාත්‍ර සමයඃ'– කර්මධාරය ගර්භ තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'අධිරාත්‍ර සමය' ශබ්දඃ; කර්තුම්-'ඩුකෘඤ්'-කරණෙ, ඉත්‍යස්මාත් ධාතොඃ තුමුං; ආරෙභෙ-'ආ' පූර්වඃ 'රභ'-ආරම්භෙ, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

b. කන්‍යකාව, ළදරී තොමෝද; බුබුධෙ, පිබිදුනීය. බුබුධෙ-ලිට් ක්‍රියා; කන්‍යකා-උක්තකර්ත්‍රී; අඥාතා කන්‍යා 'කන්‍යකා'; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'කන්‍යකා' ශබ්දඃ; බුබුධෙ, බුබුධාතෙ, බුබුධිරෙ; 'බුධ'-ඥානෙ, දිවාදි සකර්මකඃ ආත්මනෙපදී.

c. ප්‍රබුද්ධාව, පිබිදුනාවූද; සා, ඕතොමෝ; කථං, කුමක් හෙයින්; ජලාහරඃ, ජලාහරතෙම; ශබ්දයත ඉති, ශබ්දකරන්නේ යයිද; ජිඥාසුඃ, දනුකැමැත්තී; චක්‍ෂුෂී, දෙඇස; අධස්තාත්, යටට; නිධාය, හෙළා; ඡුරිකාපාණිං, සිරියක් ගත් අත් ඇතිව; උපවිෂ්ටං, උන්නාවූ; දස්‍යුං, සොරහු; අපශ්‍යත්, දිටි. අපශ්‍යත්-ලඞ් ක්‍රියා; සා-උක්ත කර්ත්‍රී; දස්‍යුම්-අනුක්ත කර්ම; උපවිෂ්ටං-කර්ම විශෙෂණම්; ඡුරිකාපාණිම්-කර්ම විශෙෂණම්; නිධාය-පූර්ව ක්‍රියාවාචී ල්‍යබන්ත මව්‍යයම්; චක්‍ෂුෂී-පූර්ව ක්‍රියායාඃ අනුක්තකර්ම; අධස්තාත්-අනුක්තාධාරඃ; ජිඥාසුඃ-කර්තෘවිශෙෂණම්; ප්‍රබුද්ධා-කර්තෘ විශෙෂණම්; ඉති-හෙත්වාර්ථෙ අව්‍යයම්.

**a. දෘෂ්ට මාත්‍ර එව තස්මින් සා භයෙන කම්පමානා තුමුලෙ නාර්ත රවෙණ සමස්තං ගෘහං පූරයාමාස.**

---

ශබ්දයතෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද නාමධාතු ක්‍රියා; ජලාහරඃ-උක්ත කර්තෘ; කථං-ථමු ප්‍රත්‍යයාන්ත අව්‍යයම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'ප්‍රබුඩා' ශබ්දඃ; ශබ්දයතෙ, ශබ්දයෙතෙ, ශබ්දයන්තෙ; ශබ්දය ඉති නාමධාතුඃ, අකර්මකඃ ආත්මනෙපදී.

උකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'ජිඥාසු' ශබ්දඃ; සකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'චක්ෂුස්' ශබ්දඃ; ජුරිකා පාණෞ යස්‍යා සෞ 'ජුරිකා පාණිඃ'- භින්නාධි කරණ ෂෂ්ඨී බහුව්‍රීහිඃ (සිරියක් අතෙහි යමක් හුගේද මේ තෙම 'ජුරිකා පාණි' නම්); ඉකාරාන්ත පුංලිඞ්ගා 'ජුරිකා පාණි' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'උපවිෂ්ට' ශබ්දඃ; උකාරාන්ත පුංලිඞ්ගා 'දස්‍යු' ශබ්දඃ; නිධායෙති-'නි' පූර්වාත් 'ධා'-ධාරණෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; අපශ්‍යත්, අපශ්‍යතාම්, අපශ්‍යන්; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී, පශ්‍යාදෙශඃ.

a. තස්මින්, ඒ සොරහු; දෘෂ්ටමාත්‍ර එව, දුටු පමණෙහිම; සා, ඕතොමෝ; භයෙන, බියෙන්; කම්පමානා, වෙවුලන්නී; තුමුලෙන, මහත්වූ; ආර්තරවෙණ, පීඩිතස්වරයෙන්; සමස්තං ගෘහං, මුලුගෙය; පූරයාමාස, පිරවී. පූරයාමාස-ලිට් ක්‍රියා; සා-උක්ත කර්ත්‍රී; ගෘහම්-අනුක්ත කර්ම; සමස්තං-කර්ම විශෙෂණම්; ආර්තරවෙණ-අනුක්ත කරණම්; තුමුලෙන-කරණ විශෙෂණම්; දෘෂ්ටමාත්‍රෙ-භාවසප්තමී; එව-අව්‍යයම්; තස්මින්-භාවසප්තමී විශෙෂණම්; කම්පමානා-කර්තෘ විශෙෂණම්; භයෙන-අනුක්ත කරණම්; දෘෂ්ටං මාත්‍රං යස්‍යා සෞ 'දෘෂ්ට මාත්‍රඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'දෘෂ්ට මාත්‍ර' ශබ්දඃ; එව-අවධාරණෙ අව්‍යයම්; අකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'කම්පමාන' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'තුමුල' ශබ්දඃ; ආර්තස්‍යරවඃ 'ආර්තරවඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ග 'ආර්තරව' ශබ්දඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ග 'සමස්ත' ශබ්දඃ; පූරයාමාස, පූරයාමාසතුඃ, පූරයාමාසුඃ; 'පූර'-පූරණෙ, සකර්මකඃ ආත්මනෙපදී, ඉත්‍යස්මාත් අහෙතරනු ප්‍රයොගාඃ,

**a. අථ තද්ගෘහවාසිනඃ සර්වේ කිං කිමිති බ්‍රුවාණාස්තත්‍ර සමාගතා ඝොරං පුරුෂං දදෘශුඃ.**

**b. දෘෂ්ට්වා ච තෙ හන්තුකාමං තං ඝොරං හස්තයොඃ පාදයොශ්ච බද්ධ්වා රක්ෂිපුරුෂෙෂු නික්ෂිප්තවන්තඃ.**

---

a. අථ, ඉක්බිත්තෙන්; තත්ගෘහවාසිනඃ, ඒ ගෘහයෙහි වසන්නාවූ; සර්වේ, හැමදෙන; කිම් කිම් ඉති, කිමෙක්ද කිමෙක් දැයි; බ්‍රුවාණඃ, කියන්නාහු; තත්‍ර, එහි; සමාගතාඃ, පැමිණියාවූ; ඝොරං, දරුණුවූ; පුරුෂම්, පුරුෂයා; දදෘශුඃ, දුටුවාහුය. දදෘශුඃ-ලිට්ක්‍රියා; සර්වේ-උක්තකර්තෘ; තද්ගෘහවාසිනඃ-කර්තෘ විශෙෂණම්; බ්‍රුවාණඃ-කර්තෘ විශෙෂණම්; කිං කිමිති-බ්‍රුවතෙඃ අනුක්ත කර්ම; සමාගතඃ-කර්තෘ විශෙෂණම්; තත්‍ර-අනුක්තාධාරඃ; පුරුෂං-අනුක්තකර්ම; ඝොරං-කර්මවිශෙෂණම්; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; තත් ච තත් ගෘහං චෙති 'තත්ගෘහං', තත් ගෘහෙවාසිනඃ 'තත්ගෘහවාසිනඃ'-කර්මධාරය ගර්භ තත්පුරුෂඃ, නකාරාන්ත පුංලිඞ්ග 'තත්ගෘහවාසින්' ශබ්දඃ, අකාරාන්ත 'සර්ව' ශබ්දඃ; පුංසි, කිම් කිම් ඉති අව්‍යයානි; අකාරාන්ත පුංලිඞ්ගො 'බ්‍රුවාණ' ශබ්දඃ; තත්‍ර ඉති-සප්තම්‍යර්ථෙ 'ත්‍රල්' ප්‍රත්‍යයඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'සමාගත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ඝොර' ශබ්දඃ; දද්‍රෘශ, දද්‍රෘශතුං, දද්‍රෘශුඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. තෙ, ඔහුතුමූ; දෘෂ්ට්වාච, දැකද; හන්තුකාමං, නසනු කැමතිවූ; තං ඝොරං, ඒ සොරහු; හස්තයොඃ, දෙඅත්හිද; පාදයොශ්ච, දෙපාහිද; බද්ධ්වා, බැඳ; රක්ෂි පුරුෂෙෂු, ආරක්ෂක පුරුෂයන් කෙරෙහි; නික්ෂිප්තවන්තඃ, තැබුවාහුය. නික්ෂිප්තවන්තඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; තෙ-උක්තකර්තෘ; ඝොරං-අනුක්ත කර්ම; තං-කර්මවිශෙෂණම්; හන්තුකාමං-කර්ම විශෙෂණම්; දෘෂ්ට්වා-පූර්වක්‍රියා; බද්ධ්වා-පූර්වක්‍රියා; හස්තයොඃ-අනුක්තාධාරඃ; පාදයොඃ-අනුක්තාධාරඃ; රක්ෂි පුරුෂෙෂු-අනුක්තාධාරඃ; හන්තුකාමයතීති 'හන්තුකාමඃ', අකාරාන්ත පුංලිඞ්ගො 'හන්තුකාම' ශබ්දඃ; රක්ෂිණශ්චතෙ පුරුෂාශ්චෙති 'රක්ෂි පුරුෂාඃ'-කර්මධාරයඃ; දෘෂ්ට්වා-'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; බද්ධ්වා-'බඞ'-බන්ධනෙ, ඉත්‍යස්මාත්ක්ත්වාච්; නික්ෂිප්තවන්තඃ-'නි' පූර්වඃ 'ක්ෂිප'-ප්‍රෙරණෙ, සකර්මකඃ උභයපදී.

**a. සරලාතු දෛවවශාත් ලබ්ධප්‍රාණා තත්ක්ෂණමිත්ථ මුවාච.**

**b. අයං කුක්කුර ශාවො මයා මෘත්‍යුමුඛාත් රක්ෂිතඃ.**

**c. අහමප්‍යනෙන කාලහස්තාදිව දස්‍යුහස්තාත් පරිත්‍රාතා'ස්මි.**

---

a. සරලාතු, සරලා තොමෝ වනාහි; දෛව වශාත්, භාග්‍ය වශයෙන්; ලබ්ධප්‍රාණා, ලබනලද දිවිඇත්තී; තත්ක්ෂණම්, එකෙනෙහි; ඉත්ථං, මෙසේ; උවාච, කීව. උවාච-ලිට් ක්‍රියා; සරලා-උක්ත කර්ත්‍රි; ලබ්ධප්‍රාණා-කර්තෘවිශෙෂණම්; දෛවවශාත්-හෙත්වර්ථෙ පංචමී, තත්ක්ෂණම්-සප්තම්‍යර්ථෙ විතීයා; ඉත්ථං-(ථමු ප්‍රත්‍යයාන්ත මව්‍යයම්;) වචන ක්‍රියායාඃ මුඛ්‍යකර්ම; දෛවස්‍ය වශඃ 'දෛව වශඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ලබ්ධාඃ ප්‍රාණාඃ යස්‍යා සෞ 'ලබ්ධ ප්‍රාණාඃ'-ෂෂ්ඨී බහුව්‍රිහිඃ; තශ්චා සෞ ක්ෂණශ්චෙති 'තත් ක්ෂණඃ'-කර්මධාරයඃ; 'වච'- ව්‍යක්තායාම් වාචි, අදාදි විකර්මකඃ පරස්මෛපදී.

b. අයං කුක්කුර ශාවඃ, මේ සුනඛ පොතක තෙම; මයා, මා විසින්; මෘත්‍යු මුඛාත්, මරුමුවෙන්; රක්ෂිතඃ, රක්නාලද්දේය. රක්ෂිතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; කුක්කුර ශාවඃ-උක්ත කර්ම; අයං-කර්මවිශෙෂණම්;මයා-අනුක්ත කර්තෘ; මෘත්‍යුමුඛාත්-අනුක්තාපාදානම්; කුක්කුරස්‍ය ශාවඃ 'කුක්කුර ශාවඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කුක්කුර ශාව' ශබ්දඃ; මෘත්‍යොඃ මුඛඃ 'මෘත්‍යුමුඛඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'මෘත්‍යුමුඛ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'රක්ෂිත' ශබ්දඃ; 'රක්ෂ'-පාලනෙ, සකර්මකඃ පරස්මෛපදී.

c. අහං අපි, මමද; අනෙන, මොහු විසින්; කාලහස්තාත් ඉව, මාරහස්තයබඳු නොහොත් මරුවා අතින් මෙන්; දස්‍යු හස්තාත්, සොරුඅතින්; පරිත්‍රාතාඅස්මි, රක්නා ලද්දෙමි. අස්මි-ලට් කර්තෘකාරක උත්තම පුරුෂෛක වචන ක්‍රියා; අහම්-උක්ත කර්තෘ; පරිත්‍රාතා-කර්මවිශෙෂණම්; අනෙන-පරිත්‍රාණ ක්‍රියායාඃ අනුක්ත කර්තෘ; අපි-අව්‍යයම්; දස්‍යුහස්තාත්-අනුක්තාපාදානම්; කාලහස්තාත්-උපමා අපාදාන විශෙෂණම්; ඉව-උපමාවේ අව්‍යයම්; කාලස්‍ය හස්තඃ 'කාලහස්තඃ'- ෂෂ්ඨීතත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කාලහස්ත' ශබ්දඃ; දස්‍යොඃ හස්තඃ 'දස්‍යුහස්තඃ'-ෂෂ්ඨී

**a. ප්‍රජා හිතො ද්‍යොගොහි ශ්‍රෙයඃ කීර්ත්ති සුඛාවහ ඉති.**

---

## 12 වාදශඃ පාඨඃ

**b. ආසිත් මථුරායං සත්‍යසන්ධානාම කො'පිමණිකාරඃ.**

**c. ස කදාචිත් භ්‍රමන් පථි ධූලිගුණ්ඨිතං ශයානං බාලම පශ්‍යත්.**

---

තත්පුරුෂඃ, අකාරාන්ත පුංලිඞ්ගා 'දස්‍යුහන්ත' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'පරිත්‍රාතා' ශබ්දඃ;

a. ප්‍රජාහිතොද්‍යොගඃ හි,ජනහිතය සඳහා උත්සාහය වනාහි; ශ්‍රෙයඃ, උතුම්. කිර්ත්ති සුඛාවහඃ ඉති, කීර්ත්ති සැප එළවන්නේයි. ස්‍යාත්)-විධිලිඞ් ක්‍රියා; ප්‍රජාහිතොද්‍යොගඃ-උක්තකර්තෘ; ශ්‍රෙයඃ-කර්තෘ විශෙෂණම්; කිර්ත්තිසුඛාවහඃ-කර්තෘ විශෙෂණම්; ප්‍රජායාඃ හිතම් 'ප්‍රජාහිතම්', ප්‍රජාහිතාය උද්‍යොගඃ 'ප්‍රජාහිතොද්‍යොගඃ'-තත් පුරුෂ ගර්භ තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'ප්‍රජාහිතොද්‍යොග' ශබ්දඃ; සකාරාන්ත පුංලිඞ්ගා 'ශ්‍රෙයස්' ශබ්දඃ; කීර්ත්තිශ්ච සුඛංච 'කිත්ති සුඛෙ', කීර්ත්ති සුඛෙ ආවහතීති, 'කීර්ත්ති සුඛාවහඃ'-ආකාරාන්ත පුංලිඞ්ගා 'කීර්ත්ති සුඛාවහ' ශබ්දඃ.

b. මථුරායං, මථුරාපුරයෙහි; සත්‍යසන්ධඃ නාම, සත්‍යසන්ධ යයි ප්‍රසිද්ධවූ; කොපිමණිකාරඃ, කිසියම් මණිකාරයෙක් තෙම; ආසිත්, වී. ආසිත්-ලුඞ් ක්‍රියා; මණිකාරඃ-උක්ත කර්තෘ; සත්‍ය සන්ධඃ-කර්තෘ විශෙෂණම්; නාම-අව්‍යයම්; මථුරායාං-අනුක්තාධාරඃ; කඃ-කර්තෘ විශෙෂණම්; අපි-අව්‍යයම්; ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගා 'මාථුරා' ශබ්දඃ; සත්‍ය සන්ධා යස්‍ය සො 'සත්‍ය සන්ධඃ' -ෂෂ්ඨී බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'සත්‍යසන්ධ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'මණිකාර' ශබ්දඃ.

c. සඃ, හෙතෙම; කදාචිත්, කිසිකලෙක්හි; පථි, මාර්ගයෙහි; භ්‍රමන්, ඇවිදිනේ; ධූලි ගුණ්ඨිතඃ, ධූලියෙන් ගැවසුනාවූ; ශයානං, හෝනාවූ; බාලං, බාලයෙකු; පශ්‍යත්, දිටි. අපශ්‍යත්-ලුඞ් ක්‍රියා; සඃ-උක්තකර්තෘ; භ්‍රමන්-කර්තෘ විශෙෂණම්; බාලං-අනුක්තකර්ම; ශයනං-කර්මවිශෙෂණම්; ධූලි ගුණ්ඨිතං-කර්මවිශෙෂණම්; කදාචිත්-කාලාර්ථෙ අව්‍යයම්;පථි-අනුක්තාධාරඃ;දකාරාන්ත'තද්'ශබ්දඃ;පුංසි,

**a. දෘෂ්ට්වා ච තං තදවස්ථ මුපජාත ස්නෙහඃ ස තදන්තික මුපසෘත්‍ය උවාච, වත්ස! කස්ත්වං? කථඤ්ච ත්වමෙවං පතිතස්තිෂ්ඨසි.**

**b. ස ච බාලකො වණිජා සදයමෙවමභිහිතඃ ප්‍රත්‍යුවාච.**

---

නකාරාන්ත පුංලිඞ්ගඃ 'පථින්' ශබ්දඃ, ධූල්‍යාගුණ්ඨිතඃ 'ධූලිගුණ්ඨිතඃ'-තෘතීයා තත් පුරුෂඃ, අකාරාන්ත පුංලිඞ්ගො 'ධූලිගුණ්ඨිත' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ශයාන' ශබ්දඃ; අපශ්‍යත්, අපශ්‍යතාම්, අපශ්‍යන්; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී, පශ්‍යාදෙශඃ.

a. තදවස්ථං, එබඳු අවස්ථා ඇති; තං, ඔහු; දෘෂ්ට්වා ච, දැක ද, උපජාතස්නෙහඃ, හටගත් ස්නෙහ ඇති; සඃ, හෙතෙම; තදන්තිකම්, ඔහුගේ සමීපයට; උපසෘත්‍ය, එළඹ; උවාච, මෙසේ කී; වත්ස, දරුව; ත්වම්, තෝ; කඃ, කවරෙහිද? ත්වම්, තෝ; එවං; මෙසේ; පතිතඃ, වැටුනේ; කථංච, කුමක් හෙයින්; තිෂ්ඨසිඉති, සිටින්නෙහිද යනුයි. උවාච-ලිට් ක්‍රියා; සඃ-උක්තකර්තෘ; උපජාත ස්නෙහඃ-කර්තෘ විශෙෂණම්; තං-අනුක්ත කර්ම; තදවස්ථම්-කර්ම විශෙෂණම්; දෘෂ්ට්වා-පූර්ව ක්‍රියා; උපසෘත්‍ය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; තදන්තිකම්-අනුක්තකර්ම; වත්සෙත්‍යාදි වාක්‍යද්වයං මුඛ්‍යකර්ම; තං-ගෞණකර්ම; සා අවස්ථා යස්‍ය සෞ 'තදවස්ථඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ, අකාරාන්ත පුංලිඞ්ගො 'තදවස්ථ' ශබ්දඃ; උපජාත ස්නෙහො යස්‍යාසෞ 'උපජාත ස්නෙහඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ, අකාරාන්ත පුංලිඞ්ගො 'උපජාතස්නෙහ' ශබ්දඃ; තස්‍ය අන්තිකං 'තදන්තිකං'-ෂෂ්ඨී තත්පුරුෂඃ, අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'තදන්තික' ශබ්දඃ; උපසෘත්‍යෙති 'උප' පූර්වාත් 'සෘ'-ගතෞ, ඉත්‍යස්මාත් ල්‍යප්; උවාච 'වච'-ව්‍යක්තායාම් වාචි, අදාදි ද්විකර්මකඃ පරස්මෛපදී.

ත්වං-උක්ත කර්තෘ; කඃ-කර්තෘ විශෙෂණම්; අසි-ලට් කර්තෘ කාරක මධ්‍යමපුරුෂ අධ්‍යාහාර ක්‍රියා; ත්වං-උක්ත කර්තෘ; පතිතඃ-කර්තෘ විශෙෂණම්; එවං-නිදර්ශනෙ අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගො 'පතිත' ශබ්දඃ; තිෂ්ඨසි-ලට් කර්තෘ කාරක මධ්‍යම පුරුෂ ක්‍රියා.

b. ස ච බාලකඃ, ඒ ළදරුතෙමේද; වණිජා, වෙළඳහු විසින්; සදයම්, දයා සහිතව; එවං, මෙසේ; අභිහිතඃ, කියනලද්දේ; ප්‍රත්‍යුවාච, පිළිතුරු කී. ප්‍රත්‍යුවාච-ලිට් ක්‍රියා; බාලකඃ-උක්තකර්තෘ; සඃ-කර්තෘ විශෙෂණම්; අභිහිතඃ-කර්තෘ විශෙෂණම්; වණිජා-අභිධාන ක්‍රියායාඃ අනුක්ත කර්තෘ; සදයම්-ක්‍රියා විශෙෂණම්; එවං-

**ඍ. (i) භද්‍රමුඛ! අහමස්මි වෛශ්‍යසුතඃ, (ii) පිතා මෙ චිරං මෘතඃ, (iii) මාතා'පි න ස්මෘතිපථමායාති, (iv) එවං ප්‍රනෂ්ට බන්ධුරහං කාෂ්ඨ වික්‍රයෙණ ජීවාමි, (v) අද්‍ය කාෂ්ඨ සඞ්ග්‍රහාර්ථං ගච්ඡන් පථි වෙග චාලිතෙන කෙනචිත් ශකටෙන බලවද් හතඃ, (vi) කරචරණෞ ච මෙ චක්‍රපෙෂණෙන භග්නෞ, (vii) නාස්ති මෙ ශක්තිරුත්ථාතුමිති.**

---

නිදර්ශනාර්ථෙව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගා 'බාලක' ශබ්දඃ; ජකාරාන්ත පුංලිඞ්ගා 'වණිජ්' ශබ්දඃ; සහෘදයා යාචතීත ඉති 'සදයම්'-සහ පූර්වපද බහුව්‍රීහිඃ; අකාරාන්ත පුංලිඞ්ගඃ 'සහෘදය' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'අභිහිත' ශබ්දඃ; ප්‍රත්‍යුවාච, ප්‍රත්‍යූවාචතුඃ, ප්‍රත්‍යූචුඃ; 'ප්‍රති' පූර්වඃ 'වච'-ව්‍යක්තායාම් වාචි, අදාදි ද්විකර්මකඃ පරස්මෛපදී.

ඍ. භද්‍රමුඛ, යහපත් මුහුනක් ඇත්තව; අහං, මම; වෛශ්‍ය සුතඃ අස්මි, ගොවිදරුවෙක් වෙමි. මෙ, මාගේ; පිතා, පියතෙම; චිරං, අතීතයෙහි හෙවත් බොහෝ කලකින් පෙර; මෘතඃ, මළේය. මාතාපි, මවුතොමෝත්; ස්මෘති පථම්, සිහියට; න ආයාති, නොපැමිණෙයි, හෙවත් මතක් නොවෙයි. එවං, මෙසේ; ප්‍රනෂ්ට බන්ධුඃ, නටුවාවූ බන්ධූන් ඇති; අහං, මම; කාෂ්ඨ වික්‍රයෙණ, දර විකිණීමෙන්; ජීවාමි, ජීවත් වෙමි. අද්‍ය, අද; කාෂ්ඨ සඞ්ග්‍රහාර්ථං, දර රැස්කරනු පිණිස; ගච්ඡන්, යන්නෙම්; පථි, මාර්ගයෙහි; වෙගචාලිතෙන, යුහුව දිවන්නාවූ; කෙනචිත් ශකටෙන, කිසියම් ගැලකින්; බලවත්, අතිශයින්; ආහතඃ, පහරණ ලද්දෙමි. මේ මාගේ; කරචරණෞච, අත්පා දෙකද; චක්‍රපෙෂණෙන, චක්‍රයෙන් සුණුවීමෙන්; භග්නෞ, බිඳුනාහුය. මෙ, මට; උත්ථාතුම්, නැගිසිටින්ට; ශක්තිඃ, ශක්තියක්; නාස්ති ඉති, නැත යනුයි.

(i) අස්මි-ලට් කර්තෘකාරක උත්තම පුරුෂෛක වචන ක්‍රියා; අහං-උක්ත කර්තා; වෛශ්‍යසුතඃ-කර්තෘ විශෙෂණම්; භද්‍රමුඛ!-සම්බොධනම්; භද්‍රං මුඛං යස්‍යාසෞ 'භද්‍රමුඛං'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; වෛශ්‍යස්‍ය සුතඃ 'වෛශ්‍ය සුතඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගා 'වෛශ්‍ය සුත' ශබ්දඃ; 'අස'-භුවි, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

(ii) මෘතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; පිතා-උක්ත කර්තා; මෙ-අනුක්ත සම්බන්ධඃ; චිරං-කාලාර්ථෙ අව්‍යයම්; 'මෘඞ්'-ප්‍රාණත්‍යාගෙ, අකර්මකඃ පරස්මෛපදී.

(iii) ආයාති-ලට්ක්‍රියා; මාතා-උක්ත කර්ත්‍රී; ස්මෘතිපථම්-අනුක්තකර්ම; අපි-සමුච්චයාර්ථෙ අව්‍යයම්; න-නිෂෙධෙ අව්‍යයම්;

**ඍ. අථාසෞ මණිකාරඃ කෘපයා තං හස්තෙ ගෘහීත්වා කස්‍යාශ්චිත් පරිචිතායා වෘද්ධායා ගෘහං නිනාය.**

---

සමෘතෙඃ පන්ථාඃ 'සමෘති පථඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ආයාති, ආයාතඃ, ආයාන්ති; 'ආඞ්' පූර්වඃ 'යා'-ප්‍රාපණෙ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

(iv) ජීවාමි-ලට්ක්‍රියා; අහං-උක්ත කර්තා; ප්‍රනෂ්ට බන්ධුඃ-කර්තෘ විශෙෂණම්; කාෂ්ඨවික්‍රයෙණ-අනුක්තකරණම්; එවං-නිදර්ශනෙ අව්‍යයම්; ප්‍රනෂ්ටාඃ බන්ධවඃ යස්‍යාසෞ 'ප්‍රනෂ්ට බන්ධවඃ'-ෂෂ්ඨී බහු ව්‍රීහිඃ; උකාරාන්ත පුංලිඞ්ගො 'ප්‍රනෂ්ටබන්ධු' ශබ්දඃ; කාෂ්ඨානාං වික්‍රයඃ 'කාෂ්ඨ වික්‍රයඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කාෂ්ඨ වික්‍රය' ශබ්දඃ; ජීවති, ජීවතඃ, ජීවන්ති; 'ජීව'-ප්‍රාණධාරණෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

(v) ආහතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; [අහං] අධ්‍යාහෘත උක්තකර්තා; ශකටෙන-අනුක්ත කර්තා; වෙගචාලිතෙන-කර්තෘ විශෙෂණම්; කෙනචිත්-කර්තෘ විශෙෂණම්; ගච්ඡත්-කර්තෘවිශෙෂණම්; කාෂ්ඨ සඞ්ග්‍රහාර්ථං-අනුක්තකර්ම; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; පථි-අනුක්තාධාරඃ; බලවත්-අතිශයාර්ථෙ අව්‍යයම්; කාෂ්ඨානාං සඞ්ග්‍රහඃ 'කාෂ්ඨසඞ්ග්‍රහඃ', කාෂ්ඨසඞ්ග්‍රහඃ එව අර්ථඃ 'කාෂ්ඨසඞ්ග්‍රහාර්ථඃ'-තත්පුරුෂගර්භ තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කාෂ්ඨ සඞ්ග්‍රහාර්ථ' ශබ්දඃ; තකාරාන්ත පුංලිඞ්ගො 'ගච්ඡත්' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගඃ 'පථින්' ශබ්දඃ; වෙගෙන චාලිතඃ 'වෙග චාලිතඃ'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'වෙගචාලිත' ශබ්දඃ; අතිශයෙන ආහතඃ 'බලවදාහතඃ';

(vi) [ආස්තාම්]-ආධ්‍යාහාර ලුඞ් ද්විවචන ක්‍රියා; කරචරණෞ-උක්ත ප්‍රකෘති කර්තාරෞ; භග්නෞ-උක්ත විකෘති කර්තාරෞ; චක්‍රපෙෂණෙන-අනුක්ත කරණම්; මෙ-අනුක්ත සම්බන්ධඃ; ච-අව්‍යයම්; කරෞච චරණෞච 'කරචරණෞ'-ද්වන්ද්ව සමාසඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'කරචරණ' ශබ්දඃ; චක්‍රෙණ පෙෂණම් 'චක්‍රපෙෂණම්'-තෘතීයා තත්පුරුෂඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'චක්‍රපෙෂණ' ශබ්දඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'භග්න' ශබ්දඃ;

(vii) අස්මි-ලට්ක්‍රියා; ශක්තඃ-උක්ත කර්තා; මෙ-අනුක්ත සම්බන්ධඃ; උත්ථාතුං-තුමන්තමව්‍යයම්; 'උත්' පූර්වාත් 'ෂ්ඨා'-ගති නිවෘත්තෞ, ඉත්‍යස්මාත් තුමුං;

ඍ. අථ, ඉක්බිත්තෙන්; අසෞ මණිකාරඃ, මේ මණිකාර තෙම; කෘපයා, කරුණාවෙන්; තං, ඔහු; හස්තෙ ගෘහීත්වා-අත ගෙන; කස්‍යාශ්චිත්, කිසියම්; පරිචිතායාඃ, පුරුදු වූ; වෘද්ධායාඃ, මැහැලියකගේ; ගෘහං, ගෙට; නිනාය, පැමිණවී. නිනාය-ලිට් ක්‍රියා;

**a. උවාචච තාං වර්ෂීයසීමාහූය රක්‍ෂ බාලමෙනම නාථං භවිෂ්‍යති තෙ භූයාන් ධර්ම සඤ්චය ඉති.**

**b. අනන්තරං දීනාරද්වයං තස්‍ය සුශ්‍රූෂාර්ථං වෘද්ධායෛ ප්‍රදාය ස ගන්තව්‍යං දේශං ජගාම.**

---

මණිකාරඃ-උක්ත කර්තා; අසෞ-කර්තෘ විශෙෂණම්; තං-අනුක්ත මුඛ්‍ය කර්ම; ගෘහං-අනුක්ත ගෞණ කර්ම; වෘද්ධායාඃ-අනුක්ත සම්බන්ධඃ; පරිචිතායාඃ- සම්බන්ධ විශෙෂණම්; කස්‍යාශ්චිත්-සම්බන්ධ විශෙෂණම්; ගෘහීත්වා-පූර්ව ක්‍රියා; ගෙහෙ-අනුක්ත කර්මණි සප්තමි; කෘපයා-අනුක්ත කරණම්; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; අකාරාන්ත පුංලිඞ්ගො 'මණිකාර' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ 'කෘපා' ශබ්දඃ; ගෘහීත්වෙති 'ග්‍රහ'-උපාදානෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'පරිචිතා' ශබ්දඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'වෘද්ධා' ශබ්දඃ; නිනාය, නින්‍යතුඃ, නින්‍යුඃ; 'ණීඤ්'-ප්‍රාපණෙ, භ්වාදි ද්විකර්මක උභයපදී.

a. තාං වර්ෂීයසීම්, ඒ මැහැල්ල; ආහූය, කැඳවා; උවාචච, මෙසේත් කී. අනාථං, අසරණවූ; ඒනම් බාලම්, මේ බාලයා; රක්‍ෂ, රකුව; තෙ, තිට; භූයාන්, බොහෝවූ; ධර්මසඤ්චයඃ, පින් රැසක්; භවිෂ්‍යති ඉති, වන්නේය යනුයි. උවාච-ලිට් ක්‍රියා; [සඃ]-ආධ්‍යාහෘත උක්තකර්තා; වර්ෂීයසීම්-අනුක්ත ගෞණකර්ම; තාම්-ගෞණ කර්මවිශෙෂණම්; ආහූය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; රක්‍ෂෙත්‍යාදි වාක්‍යාර්ථෞ-අනුක්ත මුඛ්‍යකර්ම; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'වර්ෂීයසී' ශබ්දඃ; ආහූය-'ආඞ්' පූර්වාත් 'හ්වෙඤ්'-ස්පර්ධායාම් ශබ්දෙච ඉත්‍යස්මාත් ල්‍යප්; රක්‍ෂ-ලොට් කර්තෘකාරක ක්‍රියා; බාලම්-අනුක්ත කර්ම; එනම්-කර්මවිශෙෂණම්; අනාථම්-කර්ම විශෙෂණම්; රක්‍ෂතු, රක්‍ෂතාම්, රක්‍ෂන්තු; 'රක්‍ෂ'-පාලනෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී. අකාරාන්ත පුංලිඞ්ගො 'අනාථ' ශබ්දඃ; භවිෂ්‍යති-ලෘට් ක්‍රියා; ධර්මසඤ්චයඃ-උක්ත ප්‍රකෘති කර්තා; භූයාන්-කර්තෘ විශෙෂණම්; තෙ-උක්ත විකෘති කර්තා; භවිෂ්‍යති, භවිෂ්‍යතඃ, භවිෂ්‍යන්ති; 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී; ධර්මානාං සඤ්චයඃ 'ධර්මසඤ්චයඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; අකාරාන්ත පුංලිඞ්ගො 'ධර්ම සඤ්චය' ශබ්දඃ; නාස්ති නාථො යස්‍ය සෞ 'අනාථඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ.

b. අනන්තරං, ඉක්බිති; දීනාරද්වයං, සුවණ්කර්ෂයද්වයක් ප්‍රමාණවූ 'දීනාර' නම් මිලදෙකක්; තස්‍ය, ඕහට; සුශ්‍රූෂාර්ථං, වතාවත් පිණිස; වෘද්ධායෛ, මැහැල්ලට; ප්‍රදාය, දී; සඃ, හෙතෙම;

**a. වෛශ්‍යපුත්‍රස්තු වෘද්ධායාඃ ප්‍රයත්නෙනාල්පෙන එව කාලෙන ස්වස්ථො භූත්වා ස්වකර්මනිරතො බභූව.**

**b. අථ ගතෙ බහුකාලෙ කදාචිත් අශ්වෙන ගච්ඡන් වණිග් වරඃ කම්'පිසෙතුබන්ධ මවාප.**

---

ගන්තව්‍යං දෙශං, යායුතු ප්‍රදෙශයට; ජගාම, ගියේය. ජගාම-ලිට් ක්‍රියා; සඃ-උක්ත කර්තා; දෙශං-අනුක්ත කර්ම; ගන්තව්‍යං-කර්ම විශෙෂණම්; ප්‍රදාය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; දීනාරද්වයං-ල්‍යබන්ත ක්‍රියායාඃ අනුක්තකර්ම; වෘද්ධායෛ-අනුක්ත සම්ප්‍රදානම්; සුශ්‍රූෂාර්ථං-කර්ම විශෙෂණම්; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; අනන්තරං-ක්‍රියා විශෙෂණම්; නාස්ති අන්තරං යස්‍ය තත් 'අනන්තරං'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; දීනාරාණාම් ද්වයඃ 'දීනාරද්වයඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; සුශ්‍රූෂායෛ අර්ථඃ 'සුශ්‍රූෂාර්ථඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ, ප්‍රදාය-'ප්‍ර' පූර්වාත් 'දා'-දානෙ ඉත්‍යස්මාත් ල්‍යප්; ජගාම, ජගමතුඃ, ජග්මුඃ; ජගාම-ගම්ලෘ-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. වෛශ්‍යපුත්‍රස්තු, වෛශ්‍ය දරුතෙම වනාහි; වෘද්ධායාඃ, මැහැල්ලගේ; ප්‍රයත්නෙන, උත්සාහයෙන්; අල්පෙන කාලෙන එව, මඳකලකින්ම; ස්වස්ථඃ භූත්වා, සුවපත්ව; ස්වකර්ම නිරතඃ බභූව, ස්වකීය ක්‍රියායෙහි ඇලුනේවී හෙවත් නියුක්තවී. බභූව-ලිට් ක්‍රියා; වෛශ්‍යපුත්‍රඃ-උක්තකර්තා; ස්වකර්ම නිරතඃ-කර්තෘ විශෙෂණම්; භූත්වා-පූර්වක්‍රියා; ප්‍රයත්නෙන-අනුක්තකරණම්; වෘද්ධායාඃ-අනුක්ත සම්බන්ධඃ; කාලෙන-අනුක්ත කරණම්; අල්පෙන-කරණ විශෙෂණම්; එව-අව්‍යයම්; වෛශ්‍යස්‍යපුත්‍රඃ 'වෛශ්‍ය පුත්‍රඃ'-ෂෂ්ඨී තත් පුරුෂඃ; ස්වංච තත් කර්මංචෙති 'ස්වකර්මං' අථවා, ස්වස්‍යකර්ම 'ස්වකර්ම', ස්වකර්මස්‍ය නිරතඃ, 'ස්වකර්ම නිරතඃ'-කර්මධාර යගර්භ තත්පුරුෂඃ, තත්පුරුෂගර්භ තත් පුරුෂොවා; භූතෙවති 'භූ'-සත්තායාම්, ඉත්‍යස්මාත් ක්ත්වාච්; බභූව, බභූවතුඃ, බභූවුඃ; 'භූ'-සත්තායාම්, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

b. අථ, ඉක්බිති; බහුකාලෙගතෙ, බොහෝ කලක් ගිය කල්හි; කදාචිත්, කිසිකලෙක්හි; අශ්වෙනගච්ඡන්, අසුපිටින් යන්නාවූ; වණිග්වරඃ, උතුම් වෙළඳතෙම; කම්සෙතුබන්ධං අපි; කිසියම් ගේ බැම්මකට; අවාප, පැමිණියේය. අවාප-ලිට් ක්‍රියා, වණිග්වරඃ-උක්ත කර්තා; ගච්ඡන්-කර්තෘ විශෙෂණම්; අශ්වෙන-අනුක්තකරණම්; සෙතුබන්ධං-අනුක්තකර්ම; කම්-කර්මවිශෙෂණම්; අපි-අව්‍යයම්; අථ-අනන්තරාර්ථෛව්‍යයම්; ගතෙ-භාවසප්තමී; බහු

**a. තදශ්වස්තු සෙතුමතික්‍රාමන් කුතශ්චිත් ශබ්දාත් භීත උත්ප්ලුත්‍ය වණිජා සහ සලිලෙ නිපපාත.**

**b. එවං සලිල ගතඃ සත්‍ය සන්ධඃ සන්තරණානභිඥතයා ක්‍ෂණාත් නිමග්නප්‍රාය ආසීත්.**

---

කාලෙ-භාවසප්තමී විශෙෂණම්; බහුශ්චාසෞ කාලශ්චෙති 'බහු කාලඃ'-කර්මධාරයඃ; වණිග්චාසෞ වරශ්චෙති 'වණිග්වරඃ'-කර්මධාරයඃ; වණිජාං වණික්ෂු වා වරඃ 'වණිග්වරඃ'-සප්තමී තත් පුරුෂො වා; සෙතොර්බන්ධඃ 'සෙතුබන්ධඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'අව' පූර්වඃ 'ආප'-ප්‍රාප්තෞ, භවාදි සකර්මකඃ පරස්මෛපදී.

a. තදශ්වස්තු, ඔහුගේ අශ්වතෙම වනාහි; සෙතුං, හෙය, අතික්‍රාමන්, ඉක්මවන්නේ; කුතශ්චිත් ශබ්දාත්, කිසියම් ශබ්දය කින්; භීතඃ, භයවූයේ; උත්ප්ලුත්‍ය, උඩුකුරුව පැන; වණිජා සහ; වෙළඳා හා සමග; සලිලෙ, ජලයෙහි; නිපපාත, වැටුනේය. නිප පාත-ලිට් ක්‍රියා; තදශ්වඃ-උක්ත කර්තෘ; අතික්‍රාමන්-කර්තෘ විශෙෂ ණම්; සෙතුම්-අතික්‍රමන ක්‍රියායාඃ අනුක්තකර්ම; භීතඃ- කර්තෘ විශෙෂණම්; ශබ්දාත්-අනුක්තාපාදානම්; කුතශ්චිත්-අපාදාන විශෙ ෂණම්; උත්ප්ලුත්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; සලිලෙ-අනුක්තාධාරඃ; වණිජ-සහයොගෙ තෘතීයා; සහ-අව්‍යයම්; තස්‍ය අශ්වඃ 'තදශ්වඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; උත්ප්ලුත්‍ය-'උත්' පූර්වාත් 'ප්ලුත්'-ප්ලවනෙ-ඉත්‍යස්මාත් ල්‍යප්; නිපපාත, නිපපාතතුඃ, නිපපාතුඃ; නිපපාත 'නි' පූර්වඃ 'පතෟ'-ගතෞ, අකර්මකඃ පරස්මෛපදී.

b. එවං, මෙසේ; සලිලගතඃ, ජලයට පැමිණියාවූ; සත්‍ය සන්ධඃ, සත්‍ය සන්ධතෙම; සන්තරණානභිඥතයා, පිහිනීමෙහි අදක්‍ෂ බැවින්; ක්‍ෂණාත්, ඇසිල්ලකින්; නිමග්නප්‍රාය ආසීත්, ගැලුනාක් වැනිවි. ආසීත්-ලුඞ් ක්‍රියා; සත්‍ය සන්ධඃ-උක්ත ප්‍රකෘති කර්තෘ; සලිලගතඃ-කර්තෘ විශෙෂණම්; නිමග්නප්‍රායඃ-උක්ත විකෘති කර්තෘ; සන්තරණානභිඥතයාඃ-අනුක්තකරණම්; ක්‍ෂණාත්-අනුක්තාපා දානම්; එවං-ප්‍රකාරාර්ථෙව්‍යයම්; සලිලං ගතඃ 'සලිලගතඃ'-විතීයා තත්පුරුෂඃ; සත්‍යා සන්ධා යස්‍යාසෞ 'සත්‍ය සන්ධඃ' (සත්‍යා, සත්‍යවූ; සන්ධා, ගැලපීම; යස්‍ය, යමක්හුගේද; අසෞ මේතෙම 'සත්‍යසන්ධ' නම් )-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; න අභිඥයඃ 'අනභිඥයඃ'-නඤ් තත් පුරුෂඃ; අනභිඥස්‍ය භාවඃ 'අනභිඥතා', සන්තරණෙ අනභිඥතා 'සන්තරණ අනභිඥතා'-සප්තමී තත්පුරුෂඃ; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

**a. පථිකාශ්චමග්නො'යං මග්නො'යමිති කථයන්තො'තිෂ්ඨන්.**

**b. එතස්මින්නන්තරෙ ස තු කාෂ්ඨවික්‍රෙතා දෛවාත් තත්‍රාගත්‍ය නිමජ්ජන්තං තමපශ්‍යත්.**

**c. දෘෂ්ට්වා තු තං ජාතප්‍රත්‍යභිඥඃ ස සපදි උත්පත්‍ය නදීං ප්‍රවිවෙශ.**

---

a. පථිකාශ්ච, මගීහුද; අයං, මේතෙම; මග්නඃ, ගිලුනේය; අයං, මේතෙම; මග්නඃ ඉති, ගිලුනේයයි; කථයන්තඃ, කියමින්; අතිෂ්ඨන්, සිටියාහුය. අතිෂ්ඨන්-ලඞ්ක්‍රියා; පථිකාඃ-උක්තකර්තාරඃ; කථයන්තඃ-කර්තෘවිශෙෂණම්; මග්නො'යං මග්නො'යමි'ති වාක්‍යාර්ථඃ කථන ක්‍රියායාඃ අනුක්තකර්ම; (මග්නඃ) ආසීත්-අධ්‍යාහාර ලුඞ්ක්‍රියා; අයං-උක්ත ප්‍රකෘති කර්තෘ; මග්නඃ-උක්ත විකෘති කර්තෘ; අතිෂ්ඨත්, අතිෂ්ඨතාම්, අතිෂ්ඨන්; 'ෂ්ඨා'-ගතිනිවෘත්තෞ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

b. එතස්මින්නන්තරෙ, මේ අතරෙහි; සතුකාෂ්ඨ වික්‍රෙතා, ඒ දරවෙළඳතෙම වනාහි; දෛවාත්, භාග්‍යයකින්; තත්‍ර, එහි; ආගත්‍ය, අවුත්; නිමජ්ජන්තං, ගැලෙන්නාවූ; තං, ඔහු; අපශ්‍යත්, දිටී. අපශ්‍යත්-ලඞ් ක්‍රියා; කාෂ්ඨ වික්‍රෙතා-උක්ත කර්තෘ; සඃ-කර්තෘ විශෙෂණම්; තං-අනුක්ත කර්ම; නිමජ්ජන්තං-කර්ම විශෙෂණම්; ආගත්‍ය-පූර්වක්‍රියාවාචි ල්‍යප්; තත්‍ර-අනුක්තාධාරඃ; අනන්තරෙ-අනුක්තාධාරඃ; එතස්මින්-ආධාරවිශෙෂණම්; තු-අව්‍යයම්; දෛවාත්-අනුක්තාපාදනම්; කාෂ්ඨානාම් වික්‍රෙතා 'කාෂ්ඨ වික්‍රෙතා'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ආගත්‍ය-'ආ' පූර්වාත් 'ගමෞ'-ගතෞ, ඉත්‍යස්මාත් ල්‍යප්; අපශ්‍යත්, අපශ්‍යතාම්, අපශ්‍යන්; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

c. තං, ඔහු; දෘෂ්ට්වාතු, දැකද; ජාතප්‍රත්‍යභිඥඃ, හටගත් හැඳුනුම් ඇති; සඃ, හෙතෙම; සපදි, එකෙනෙහි; උත්පත්‍ය, පැන; නදීං, ගඟට; ප්‍රවිවෙශ, වනී. ප්‍රවිවෙශ-ලිට්ක්‍රියා; සඃ-උක්ත කර්තෘ; ජාතප්‍රත්‍යභිඥඃ-කර්තෘවිශෙෂණම්; නදීං-අනුක්තකර්ම; උත්පත්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; සපදි-අව්‍යයම්; දෘෂ්ට්වා-පූර්ව ක්‍රියා; ජාතඃ ප්‍රත්‍යභිඥායස්‍යාසෞ 'ජාතප්‍රත්‍යභිඥඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; ප්‍රවිවෙශ, ප්‍රවිවෙශතුඃ, ප්‍රවෙශුඃ; 'ප්‍ර' පූර්වඃ 'විශ'-ප්‍රවෙශනෙ, තුදාදි අකර්මකඃ පරස්මෛපදී.

**a. අථාසෞ ස්වජීවන නිරපෙක්ෂස්තං ප්‍රවාහෙණ නීය මානං කෙශෙෂු ගෘහීත්වා තීරමනයත්.**

**b. නීත්වාච තං තීරභූමිමුවාච.**

**c. මහාභාග! අහමස්මි ත්වයා පරිත්‍රාතඃ.**

**d. ඉදානී මනෘණො'ස්මි භවතඃ.**

---

a. අථ, ඉක්බිත්තෙන්; අසෞ, මේතෙම; ස්වජීවන නිර පෙක්ෂඃ, ස්වකීය ජීවනයෙහි අපෙක්ෂා නැත්තේ; ප්‍රවාහෙණ, ප්‍රවාහයෙන්; නීයමානං, ගෙනයනු ලබන්නාවූ; තං, ඔහු; කෙශෙෂුගෘහීත්වා, හිසකේ ගෙන; තීරම් තීරයට; අනයත්, පැමිණෙවී. අනයත්-ලඞ්ක්‍රියා; අසෞ-උක්ත කර්තෘ; ස්වජීවන නිරපෙක්ෂඃ-කර්තෘ විශෙෂණම්; තං-අනුක්තමුඛ්‍යකර්ම; නීයමා නම්-මුඛ්‍යකර්ම විශෙෂණම්; ප්‍රවාහෙණ-අනුක්ත කරණම්; තීරම්-අනුක්ත ගෞනකර්ම; ගෘහීත්වා-පූර්වක්‍රියා; කෙශෙෂු-පූර්වක්‍රියායාඃ අනුක්තකර්මනි සප්තමී; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; ස්වස්‍ය ජීවනං 'ස්වජීවනං', ස්වජීවනෙ නිරපෙක්ෂා යස්‍යාසෞ 'ස්වජීවන නිරපෙක්ෂඃ'-තත්පුරුෂගර්භ බහුව්‍රීහිඃ; ගෘහීත්වා-'ග්‍රහ'-උපාදානෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; අනයත්, අනයතාම්, අනයන්; 'නීඤ්'-ප්‍රාපනෙ, භවාදි විකර්මකඃ උභයපදී.

b. තං, ඔහු; තීරභූමිං, ඉවුරුබිමට; නීත්වාච, පමුණුවාද; උවාච, මෙසේ කී. උවාච-ලිට් ක්‍රියා; [සඃ]-උක්ත කර්තෘ; තං-අනුක්ත මුඛ්‍ය කර්ම; තීරභූමිං-අනුක්ත ගෞනකර්ම; නීත්වා-පූර්ව ක්‍රියා; තීරභූමිං-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; තීරෙභූමිඃ 'තීරභූමිඃ'-සප්තමී තත්පුරුෂඃ; 'වච'-ව්‍යක්තායාම්වාචි, අදාදි විකර්මකඃ උභයපදී.

c. මහාභාග, මහපින්ඇත්තව; අහං, මම; ත්වයා, තාවිසින්; පරිත්‍රාතඃ අස්මි, රක්නාලද්දෙමි. අස්මි-ලට්ක්‍රියා; අහං-උක්ත කර්තෘ; පරිත්‍රාතඃ-කර්තෘවිශෙෂණම්, කෘදන්ත කර්මකාරක ක්‍රියා; අහං-උක්තකර්ම; ත්වයා-අනුක්තකර්තෘ; මහාභාග සම්බොධනෙ ප්‍රථමා; මහාභාගඃ යස්‍යාසෞ 'මහාභාගඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; 'අස'-භුවි, විකර්මකඃ පරස්මෛපදී.

d. ඉදානීම්, දැන්; භවතඃ, පින්වත්හට; අනෘණඃ අස්මි, ණය නැත්තෙමි. අස්මි-ලට්ක්‍රියා; [අහං]-ආධ්‍යාහාර උක්ත කර්තෘ; අනෘණඃ-විකෘති කර්තෘ; භවතඃ-අනුක්ත සම්බන්ධඃ; නාස්ති ඍණං,

a. ස්වස්ති තුභ්‍යම්.
b. ආපෘෂ්ටො'සි.
c. ගච්ඡාම්‍යහමිත්‍යුක්ත්වා ගෘහාභිමුඛං ප්‍රායාත්.
d. උපකාරො හි සාධුෂු න විඵලතාං යාති කදාචිත්.

---

## 13. ත්‍රයොදශඃ පාඨඃ.

e. අපි ජානාති භවාන් අබොධමිශ්‍රම්?
f. කථං තං න ජානාමි.

---

යස්‍යාසෞ 'අභ්‍රාණං'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ.

a. තුභ්‍යම්, තට; ස්වස්ති, සැපවේවා. [භූයාත්]-ආශිර්ලිඞ් ක්‍රියා; ස්වස්ති-උක්ත කර්තෘ; තුභ්‍යං-අනුක්ත සම්ප්‍රදානම්; 'භූ'-සත්තායාම්, අකර්මකඃ පරස්මෛපදී.

b. ආපෘෂ්ටඃ අසි, විචාරණ ලද්දෙහි; අසි-ලිඞ්ක්‍රිය; [ත්වං]-උක්ත කර්තෘ; ආපෘෂ්ටඃ-කර්තෘ විශෙෂණම්.

c. අහං, මම; ගච්ඡාමි ඉති, යෙමැයි; උක්ත්වා-කියා; ගෘහාභිමුඛං, ගෙට අභිමුඛව; ප්‍රායාත්, ගියේය. ප්‍රායාත්-ලඞ් ක්‍රියා; [සඃ]-උක්ත කර්තෘ; ගෘහාභිමුඛං-ක්‍රියාවිශෙෂණම්; ගච්ඡාමි-ලට්ක්‍රියා; අහං-උක්ත කර්තෘ; 'ගෘහස්‍ය අභිමුඛං'-ෂෂ්ඨී තත් පුරුෂඃ; ප්‍රායාත්, ප්‍රායාතාම්, ප්‍රායන්; 'ප්‍ර' පූර්වඃ 'යා'-ප්‍රාපනෙ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

d. සාධුෂු, සත්පුරුෂයන් කෙරෙහි; උපකාරඃ හි, උපකාරය වනාහි; කදාචිත්, කිසිකලෙකත්; විඵලතාම්, නිෂ්ඵලබවට; න යාති, නොයේ. යාති-ලට් ක්‍රියා; උපකාරඃ-උක්තකර්තෘ; විඵලතාම්-අනුක්ත කර්ම; සාධුෂු-අනුක්තාධාරඃ; හි-අවධාරණෙ අව්‍යයම්; කදාචිත්-කාලාර්ථෙ අව්‍යයම්; විඵලස්‍යභාවඃ 'විඵලතා'-භාවතද්ධිතාන්තඃ; යාති, යාතඃ, යාන්ති; 'යා'-ප්‍රාපනෙ, අදාදි සකර්මකඃ පරස්මෛපදී.

e. භවාන්, පින්වත්තෙම; අබොධමිශ්‍රම්, අබොධ මිශ්‍රයා; අපි ජානාති, දන්නේද? ජානාති-ලට් ක්‍රියා; භවාන්-උක්ත කර්තෘ; අබොධමිශ්‍රම්-අනුක්ත කර්ම; අපි-ප්‍රශ්නාර්ථෙ අව්‍යයම්; ජානාති, ජානීතඃ, ජානන්ති; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී.

f. තං, ඔහු; කථං, කෙසේ; නජානාමි, නොදනිම්ද? ජානාමි-ලට් ක්‍රියා; [අහං]-උක්තකර්තෘ; තං, අනුක්තකර්ම; කථං-ප්‍රශ්නාර්ථෙ අව්‍යයම්; න-ප්‍රතිෂෙධ අව්‍යයම්;

**a. ස හි මෙ සංවත්සරං සතීර්ථ ආසීත්.**

**b. කිං තස්‍ය?**

**c. න ශ්‍රුතං භවතා තස්‍ය කිං ජාතම්?**

**d. ජානාසි ත්වං යථා තෙන ක්‍රීඩයා කලහෙනච බාල්‍ය මතිවාහිතම්.**

**e. තෙන ච ස චිරමූර්ඛඃ කාර්‍ය්‍යාකාර්‍ය්‍යානභිඥ ආසීත්.**

---

a. සඃ හි, හෙතෙම වනාහි; මෙ, මා හා සමග; සංවත්සරං, අවුරුද්දක් මුලුල්ලෙහි; සතීර්ථඃ ආසීත්, එක්ව හදරන්නෙක් වී. (සමාන ආචාර්‍ය්‍යයන් ඇත්තෙක්වි.) ආසීත්-ලුඞ්ක්‍රියා; සඃ-උක්ත ප්‍රකෘති කර්තෘ; සතීර්ථඃ-උක්ත විකෘති කර්තෘ; හි-කාරණාර්ථෙඅව්‍ය යම්; මෙ-සහාර්ථෙ තෘතීයා, (අනුක්ත සම්බන්ධොවා), සංවත්සරං-අත්‍යන්ත සංයොගෙ ද්විතීයා; සමානං තීර්ථං යස්‍යාසෞ 'සතීර්ථඃ'-ෂෂ්ඨිබහුව්‍රීහිඃ; ආසීත්, ආසන්‍යාම්, ආසන්; 'අස' භුවි, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

b. තස්‍ය, ඔහු සම්බන්ධව; කිං, කුමක්විද? [ස්‍යාත්]-විධි ලිඞ්ක්‍රියා; කිං-උක්ත කර්තෘ; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ.

c. භවතා, පින්වත්හු විසින්; තස්‍ය, ඔහට; කිං ජාතම්, කුමක්විදූයි; න ශ්‍රුතම්, නොඅසනලද්ද? ශ්‍රුතම්-කෘදන්ත කර්ම කාරක ක්‍රියා; 'තස්‍ය කිං ජාතම්' ඉති වාක්‍යාර්ථඃ උක්ත කර්ම; භවතා-අනුක්තකර්තෘ; න-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; ජාතම්-කෘදන්ත කර්තෘ කාරකක්‍රියා; කිං-උක්ත කර්තෘ; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; 'ජනි'-ප්‍රාදුර්භාවෙ, අකර්මකඃ ආත්මනෙ පදී.

d. යථා, යම් පරිද්දෙකින්; තෙන, ඔහු විසින්; ක්‍රීඩයා, ක්‍රීඩාවෙන්ද; කලහෙනච, ඩබරයෙන්ද; බාල්‍යම්, බාල අවස්ථාව; අතිවාහිතම්, ඉක්මවනලදූයි යනු; ත්වං, තෝ; ජානාසි, දන්නෙහිද? ජානාසි-ලට් ක්‍රියා; ත්වං-උක්ත කර්තෘ; 'යථාතෙන ක්‍රීඩයා කලහෙන ච බාල්‍යමතිවාහිතම්' ඉතිවාක්‍යාර්ථඃ අනුක්ත කර්ම; ජානාසි, ජානීතඃ, ජානන්ති; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී. අතිවාහිතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; බාල්‍යම්-උක්තකර්ම; තෙන-අනුක්තකර්තෘ; - ක්‍රීඩයා-අනුක්ත කරණම්; කලහෙන-අනුක්තකරණම්; ච-සමුච්චයෙ අව්‍යයම්; යථා- ප්‍රකාරාර්ථෙ අව්‍යයම්.

e. තෙන, ඒ කරණකොටගෙන; සඃ, හෙතෙම; චිරමූර්ඛඃ, බොහෝකලක් මූර්ඛවූයේ; කාර්‍ය්‍ය, කටයුතුද්ද; අකාර්‍ය්‍ය, නොකටයුතුද්ද; අනභිඥඃ ආසීත්, නොදන්නෙක් වී. ආසීත්-

**a. අථ පිතරි ලෝකාන්තරං ගතේ ප්‍රභූතං පෛතෘකං විත්තං තස්‍ය හස්තගතං අභූත්.**

**b. සතු දුර්බුද්ධිඃ පිතුඃ සම්පදමාසාද්‍ය කේවලං නිද්‍රයා භෝජනේන ච කාලං නිනාය,**

**c. න කිමපි කාර්‍ය්‍යං තේන ස්වයමවලෝකිතම්.**

---

ලුඞ්ක්‍රියා; සඃ-උක්ත ප්‍රකෘති කර්තෘ; චිරමූර්ඛඃ-කර්තෘ විශේෂණම්; කාර්‍ය්‍යාකාර්‍ය්‍යානභිඥඃ-උක්ත විකෘති කර්තෘ; තේන- අනුක්ත කරණම්; චිරං මූර්ඛඃ 'චිර මූර්ඛඃ'-විතීයා තත්පුරුෂඃ; කාර්‍ය්‍යං ච අකාර්‍ය්‍යං ච 'කාර්‍ය්‍යාකාර්‍ය්‍යේ'- ඉතරේතර යෝග ද්වන්ද්ව සමාසඃ; න අභිඥඃ 'අනභිඥඃ'-නඤ් තත්පුරුෂඃ; කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෝඃ අනභිඥඃ 'කාර්‍ය්‍යාකාර්‍ය්‍යානභිඥඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ.

a. අථ, ඉක්බිත්තෙන්; පිතරි, පියහු; ලෝකාන්තරං ගතේ, පරලොවට ගියකල්හි; ප්‍රභූතං, බොහෝවූ; පෛතෘකං, පිය සතුවූ; විත්තං, ධනයතෙම; තස්‍ය, ඔහුගේ; හස්තගතං අභූත්, හස්ත ප්‍රාප්තවී. අභූත්-ලුඞ්ක්‍රියා; විත්තං-උක්ත ප්‍රකෘති කර්තෘ; හස්තගතං-උක්ත විකෘති කර්තෘ; ප්‍රභූතං, පෛතෘකම්-ප්‍රකෘති කර්තෘ විශේෂණාති; ගතේ, පිතරි-භාවසප්තමී විශේෂණාති; ලෝකාන්තරං-ගමන ක්‍රියායාඃ අනුක්තකර්ම; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; අන්‍යඃ ලෝකඃ 'ලෝකාන්තරඃ'-කර්මධාරයඃ; පිතු රිදම් 'පෛතෘකම්'-තද්ධිතාන්තඃ; හස්තං ගතං 'හස්තගතං'-විතීයා තත්පුරුෂඃ; අභූත්, අභූතාම්, අභූවන්; 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

b. සතු දුර්බුද්ධිඃ, ඒ අඥානතෙම වනාහි; පිතුඃ සම්පදං, පිය හුගේ සම්පත්තියට; ආසාද්‍ය, පැමිණ; කේවලං, හුදක්; නිද්‍රයා, නිද්‍රාවෙන්ද; භෝජනේනච වැළඳීමෙන්ද; කාලං, කාලය; නිනාය, යැවී. නිනාය-ලිට් ක්‍රියා; දුර්බුද්ධිඃ-උක්ත කර්තෘ; සඃ-කර්තෘ විශේෂණම්; කාලම්-අනුක්ත කර්ම; නිද්‍රයා-අනුක්ත කරණම්; භෝජනේන-අනුක්තකරණම්; කේවලම්-ක්‍රියා විශේෂණම්; ආසාද්‍ය-පූර්ව ක්‍රියා; පිතුඃ සම්පදම්-පූර්වක්‍රියායාඃ අනුක්ත කර්ම; තු-අව්‍යයම්; දුෂ්ටාබුද්ධිර්‍ය්‍යස්‍ය සෝ 'දුර්බුද්ධිඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; පිතුඃ සම්පදම් 'පිතෘසම්පදඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ආසාද්‍ය-'ආ' පූර්වඃ 'සද්'-විසරණ ගත්‍යව සාදනේෂු ඉත්‍යස්මාත් ල්‍යප්; නිනාය 'නීඤ්'-ප්‍රාපණේ, භ්වාදි විකර්මකඃ උභයපදී.

c. තේන, ඔහු විසින්; කිං අපිකාර්‍ය්‍යම්, කිසිකටයුත්තකුදු; ස්වයම්, තමා විසින්; න අවලෝකිතම්, නොබලනලදී. අව

**a. සමස්ත එව කායස්ථ භාරෙ ධනලොභාකෘෂ්ටෙෂු ධූර්තේෂු නික්ෂිප්තඃ.**

**b. විටහස්තගතන්තු විපුලං තද්ධනමචිරෙණ ප්‍රනෂ්ටමාසීත්.**

**c. ස්වයඤ්ච අතිභොග ජනිතෙන විවිධෙන රොගෙණාක්‍රාන්තො මෘතකල්පො බභූව.**

---

ලොකිතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; කායස්ථම්-උක්ත කර්ම; තෙන-අනුක්තකර්තෘ; ස්වයම්-කර්තෘ විශෙෂණෙ අව්‍යයම්; කිං-කර්මවිශෙෂණම්; න-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; 'අව' පූර්වඃ 'ලොක'-දර්ශනෙ, සකර්මකඃ ආත්මනෙපදී

a. සමස්තඃ එව, සියලුම; කායස්ථභාරඃ, කෘත්‍ය භාරය තෙම; ධනලොභාකෘෂ්ටෙෂු, ධනලොභයෙන් අදනාලද සිත් ඇති; ධූර්තේෂු, ධූර්තයන් කෙරෙහි; නික්ෂිප්තඃ, තබනලදී. නික්ෂිප්තඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; කායස්ථභාරඃ-උක්තකර්ම; සමස්තඃ-කර්මවිශෙෂණම්; එව-අවධාරණෙ අව්‍යයම්; ධූර්තේෂු-අනුක්තාධාරඃ; ධනලොභාකෘෂ්ටෙෂු-ආධාර විශෙෂණම්; 'කායස්ථස්‍ය භාරඃ' 'කායස්ථ භාරඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ධනෙ ලොභඃ 'ධනලොභඃ', ධන ලොභෙන ආකෘෂ්ටඃ 'ධනලොභාකෘෂ්ටඃ', තෙෂු, ධනලොභාකෘෂ්ටෙෂු-සප්තමී තත්පුරුෂගර්භ තෘතීයා තත්පුරුෂඃ; 'නි' පූර්වඃ 'ක්ෂිප'-ප්‍රේරණෙ, සකර්මකඃ උභයපදී.

b. විටහස්ත ගතං, ධූර්තයන් අතටපත්වූ; විපුලම්, මහත්වූ; තද්ධනන්තු, එබඳු ධනය වනාහි; අචිරෙණ, නොබෝ කලකින්; ප්‍රනෂ්ටං ආසීත්, නටුයේවී. ආසීත්-ලුඞ් ක්‍රියා; [ධනං]-උක්ත ප්‍රකෘති කර්තෘ; තද්ධනම්, විටහස්තගතං, විපුලමිත්‍යාදි වාක්‍යාර්ථ කර්තෘ විශෙෂණානි; තු-අව්‍යයම්; ප්‍රනෂ්ටම්-විකෘති කර්තෘ; අචිරෙණ-අව්‍යයම්; විටානාං හස්තඃ 'විටහස්තඃ', විටහස්තංගතම් 'විටහස්ත ගතම්'-ෂෂ්ඨී තත්පුරුෂගර්භ ද්විතීයාතත්පුරුෂඃ; න චිරෙණ 'අචිරෙණ'-නඤ් තත්පුරුෂඃ;

c. ස්වයංච, තෙමේද; අතිභොගජනිතෙන, අධිකභොජනයෙන් හටගත්තාවූ; විවිධෙන, නානාවිධවූ; රොගෙන, රොගයෙන්; ආක්‍රාන්තඃ, මඩනාලද්දේ; මෘතකල්පඃ බභූව, මළාක් වැනි වී. බභූව-ලිට් ක්‍රියා; [සඃ]-උක්තප්‍රකෘති කර්තෘ; ආක්‍රාන්තඃ-කර්තෘවිශෙෂණම්; රොගෙන-අනුක්තකරණම්; විවිධෙන-කරණ විශෙෂණම්; අතිභොග ජනිතෙන-කරණ විශෙෂණම්; ස්වයඤ්ච-

a. අථ කථඤ්චිත් රෝගමුක්ත ඉදානීං කෘච්ඡ්‍රං ජීවති.

• ආලස්‍යං බහුදෝෂමූලමතිදුඃඛකරඤ්ච.

---

## 14. චතුර්දශඃ පාඨඃ.

c. අස්ති මගධේෂු පුෂ්පපුරං නාම නගරම්.

d. තත්‍ර පශ්‍යතෝහරෝනාම කශ්චිත් කායස්ථඃ ප්‍රතිවසතිස්ම.

e. සච ස්වභාවදෝෂේණ බාල්‍යඑව චෞර්‍යෙමතිමකරෝත්.

---

අව්‍යයම්, මෘතකල්පඃ-උක්ත විකෘති කර්තෘ; අතිශයෝ භෝගඃ 'අතිභෝගඃ', අතිභෝගේන ජනිතඃ 'අතිභෝගජනිතඃ'-කර්ම ධාරය ගර්භ තෘතීයා තත්පුරුෂඃ;

a. අථ, නැවත; කථඤ්චිත්, කිසිකලෙකින්; රෝග මුක්තඃ, රෝගයෙන් මිදුනේ; ඉදානීම්, දැන්; කෘච්ඡ්‍රං, දුකසේ; ජීවති, ජීවත්වෙයි. ජීවති-ලට්ක්‍රියා; [සඃ]-උක්ත කර්තෘ; රෝගමුක්තඃ, කර්තෘ විශේෂණම්; අථ, කථඤ්චිත්, ඉදානීම්-අව්‍යයානි; කෘච්ඡ්‍රං-ක්‍රියා විශේෂණම්; රෝගාත්මුක්තඃ 'රෝගමුක්තඃ'-පඤ්චමී තත් පුරුෂඃ; 'ජීව'-ප්‍රාණධාරණේ, අකර්මකඃ පරස්මෛපදී.

b. ආලස්‍යං, අලසබව; බහුදෝෂමූලම්, බොහෝ දෝෂයට මුල්වේ; අතිදුඃඛකරඤ්ච, ඉතා දුක්ද කරන්නේවේ. [ස්‍යාත්]-ලිඞ් ක්‍රියා; ආලස්‍යං-උක්තකර්තෘ; බහුදෝෂමූලම්-කර්තෘ විශේෂණම්; අතිදුඃඛ කරං-කර්තෘ විශේෂණම්; ච-අව්‍යයම්.

c. මගධේෂු, මගධ ජනපදයෙහි; පුෂ්පපුරං නාම, පුෂ්පපුරයයි ප්‍රසිද්ධවූ; නගරම්, නුවරෙක්; අස්ති, ඇත්තේය; අස්ති-ලට් ක්‍රියා, අථවා, ක්‍රියා ප්‍රතිරූපමව්‍යයම්; නගරම්-උක්තකර්තෘ; පුෂ්ප පුරං-කර්තෘවිශේෂණම්; මගධේෂු-අනුක්තාධාරඃ; නාම-අව්‍යයම්; පුෂ්පෛර යුක්තපුරං 'පුෂ්පපුරං'-තෘතීයා තත්පුරුෂඃ;

d. තත්‍ර, එහි; පශ්‍යතෝහරෝනාම, පශ්‍යතෝහර නම්; කශ්චිත්කායස්ථඃ, කිසියම් ශිල්පියෙක්තෙම; ප්‍රතිවසතිස්ම, වාසයකෙළේය. ප්‍රතිවසති- ලට්ක්‍රියා; කායස්ථඃ- උක්තකර්තෘ; කශ්චිත්-කර්තෘ විශේෂණම්; පශ්‍යතෝහර-කර්තෘවිශේෂණම්; පශ්‍යතඃ හරතීති 'පශ්‍යතෝහරඃ'-ෂෂ්ඨ්‍යන්තෝපපදඃ; නාම-අව්‍ය යම්; තත්‍ර-අනුක්තාධාරඃ, ත්‍රල් ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; කශ්චිත්-චිත් ප්‍රත්‍යයාන්ත මව්‍යයම්; 'ප්‍රති' පූර්වඃ 'වස'-නිවාසෙ, භවාදි අකර්මකඃ පරස්මෛපදී.

e. සච, හෙතෙමේද; ස්වභාව දෝෂේණ, ප්‍රකෘතිදෝෂයෙන්; බාල්‍යඑව, බාලඅවස්ථාවෙහිම; චෞර්‍යෙ, සොරකම්හි; මතිම්,

**a. එවං ස ගුරුකුලවාසිනාං සවයසාං සහාධ්‍යායිනාං කස්‍යචිත් පුස්තකං කස්‍යචිත් ලෙඛනිං කස්‍ය වා මසිධානිමප හර්තුමාරෙභෙ.**

**b. අථ කදාචිදසෞ පුස්තකමෙකං මනොඥදර්ශනං චොරයිත්වා මාතරමදර්ශයත්.**

---

බුඩිය; අකරෙත්, කෙළේය. අකරෙත්-ලඞ්ක්‍රියා; සඃ-උක්ත කර්තා; මතිම්-අනුක්ත කර්ම; චෞර්‍ය්‍යෙ-අනුක්තාධාරඃ; එව-අව්‍යයම්; බාල්‍යෙ-අනුක්තාධාරඃ; ස්වභාවදොෂෙණ-අනුක්ත කරණම්; ස්වස්‍ය භාවඃ 'ස්වභාවඃ', ස්වභාව එව දොෂඃ 'ස්වභාවදොෂඃ'-තත් පුරුෂගර්භ කර්මධාරයඃ; බාලස්‍ය භාවඃ 'බාල්‍යම්' තස්මිං බාල්‍යෙ, භාවතද්ධිතාන්තඃ; 'ඩුකෘඤ්'-කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

a. එවං, මෙසේ; සඃ, හෙතෙම; ගුරුකුලවාසිනාම්, ගුරුහුගේ ගෙයිවසන්නාවූ; සවයසාං, සමානවයස් ඇති; සහාධ්‍යායිනාම්, සමග හදරන්නවුන් අතුරෙන්; කස්‍යචිත්, කිසිවක්හුගේ; පුස්තකම්, පොතක්ද; කස්‍යචිත්, කිසිවක්හුගේ ලෙඛනීං, ලෙඛනියක්ද; කස්‍යවා, කිසිවක්හුගේ; මසිධානිං, දූලිබඳනෙක්ද; අපහර්තුම්, පැහැරගන්ට; ආරෙභෙ, පටන්ගති. ආරෙභෙ-ලිට් ක්‍රියා; සඃ-උක්තකර්තා; පුස්තකම්; -අනුක්තකර්ම; මසිධානීම්-අනුක්තකර්ම; වා-අව්‍යයම්; අපහර්තුම්-ක්‍රියා වාචි තුමන්තමව්‍යයම්; 'අප' පූර්වාත් 'හෘඤ්'-හරණෙ, ඉත්‍යස්මාත් තුමුං; කස්‍යචිත්-අනුක්තසම්බන්ධඃ; කස්‍ය-අනුක්තසම්බන්ධඃ; සහාධ්‍යායිනාම්-නිර්ධාරණෙ ෂෂ්ඨී; ගුරුකුලවාසිනාම්-තත්විශෙෂණම්; සවයසාං-තත්විශෙෂණම්; එවං-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; ගුරොඃ කුලම් 'ගුරුකුලම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ගුරුකුලෙ වසන්තීති 'ගුරුකුලවාසිනඃ'-සප්තම්‍යන්තොපපදඃ; සමානං වයඃ යස්‍යාසෞ 'සවයසඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; 'රභ'-ආරම්භෙ, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

b. අථ, ඉක්බිත්තෙන්; අසෞ, මේතෙම; කදාචිත්, කිසි කලෙක්හි; මනොඥදර්ශනම්, මනා දැකුම්ඇති; එකං පුස්තකං, එක් පොතක්; චොරයිත්වා, සොරාගෙන; මාතරං, මවට; අදර්ශයත්, දැක්වී. අදර්ශයත්-ලඞ්ක්‍රියා; අසෞ-උක්ත කර්තා; පුස්තකම්-අනුක්ත මුඛ්‍යකර්ම; මාතරම්-අනුක්ත ගෞණකර්ම; එකං-මුඛ්‍යකර්ම විශෙෂණම්; මනොඥදර්ශනම්-මුඛ්‍යකර්ම විශෙෂණම්; චොරයිත්වා-පූර්වක්‍රියා; පුස්තකම්-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; මනොඥං දර්ශනම් යස්‍යාසෞ 'මනොඥ දර්ශනම්'-ෂෂ්ඨී බහු ව්‍රීහිඃ; අදර්ශයත් 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

**a. තනමාතා තු ගර්හිත කාරිණං පුත්‍රමනිවාරයන්ති සාදර මාහ.**

**b. වත්ස! ප්‍රවජනමිදං රක්‍ෂ, යථා කස්‍යචිත් නයනපථං නයාතීති.**

**c. මාත්‍රා දත්තොත්සාහස්තු ස නිත්‍ය මෙව චෞර්‍ය්‍යවෘත්තිමා චරන්, කදචිත් කස්‍යචිද් බාලස්‍ය සෞවර්ණහාරමහරත්.**

---

a. තනමාතා තු, ඔහුගේ මව්තොමෝ වනාහි; ගර්හිත කාරිණං, නින්දිත දෑ කරන්නාවූ; පුත්‍රං, පුත්‍රයා; අනිවාරයන්ති, නොවළක්වන්නී; සාදරං, ආදර සහිතව; ආහ, මෙසේ කිවාය. ආහ-ලිට් ක්‍රියා; තනමාතා-උක්ත කර්ත්‍රි; අනිවාරයන්ති-කර්තෘ විශෙෂණම්; පුත්‍රම්-අනිවාරණ ක්‍රියායාඃ අනුක්ත කර්‍මී; ගර්හිත කාරිණම්-කර්‍මවිශෙෂණම්; සාදරං-ක්‍රියා විශෙෂණම්; තු-විශෙෂාර්‍ථෙ අව්‍යයම්; තස්‍ය මාතා 'තනමාතා'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ගර්හිතං කරොතීති 'ගර්හිත කාරී'-කෘදන්ත උපපද සමාසඃ; න නිවාරයන්ති 'අනිවාරයන්ති'-නඤ් තත්පුරුෂඃ; සහ ආදරෙණ යද්වර්තතෙ 'තත්සාදරං'-සහ පූර්‍වපද බහුව්‍රීහිඃ; ආහ, ආහතුඃ, ආහුඃ; 'බෘඤ්'-ව්‍යක්තායාම්වාචි, දිවාදි ද්විකර්‍මකඃ උභයපදී (ආහාදෙශඃ)

d. වත්ස, දරුව; ඉදම්, මෙය; යථා, යම්සේ; කස්‍යචිත්, කිසිවක්හුගේත්; නයනපථං, නෙත්‍රපථයට; නයාති, නොපැමිණේද? [තථා]-එපරිද්දෙන්; ප්‍රවජනනං, සඟවා; රක්‍ෂ ඉති, රකු වයි; [ආහ]-කීව. රක්‍ෂ-ලොට් ක්‍රියා; [ත්වං]-අධ්‍යාහෘත උක්ත කර්තෘ; ඉදං-අනුක්ත කර්‍මී; ප්‍රවජනනං-ක්‍රියාවිශෙෂණම්; වත්ස-සම්බොධනම්; යාති-ලට් ක්‍රියා; න-අව්‍යයම්; [ඉදම්]-අධ්‍යාහෘත උක්ත කර්තෘ; නයනපථං- අනුක්ත කර්‍මී; කස්‍යචිත්- අනුක්ත සම්බන්ධඃ; යථා-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; ඉති-සමාප්තෞ අව්‍යයම්; නයනස්‍ය පථඃ 'නයන පථඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; රක්‍ෂතු, රක්‍ෂතාම්, රක්‍ෂන්තු; 'රක්‍ෂ'-පාලනෙ, භවාදි සකර්‍මකඃ පරස්මෛපදී; යාති, යාතඃ, යාන්ති; 'යා'-ගතෞ, අදාදි සකර්‍මකඃ පරස්මෛපදී.

c. මාත්‍රා, මව විසින්; දත්තොත්සාහඃ, දෙනලද උත්සාහ ඇති; සඃ තු, හෙතෙම වනාහි; නිත්‍යං එව, නිතරම; චෞර්‍ය්‍යවෘත්තිම් ආචරන්, සොරකම් කරන්නේ; කදාචිත්, කිසිකලෙක්හි; කස්‍යචිත් බාලස්‍ය කිසියම් ළදරුවෙකුගේ; සෞවර්ණහාරම්, රන්මුතු හරක්; අහරත්, පැහැරගති. අහරත්-ලඞ්ක්‍රියා; සඃ-උක්ත කර්තෘ; දත්තොත්සාහඃ-කර්තෘ විශෙෂණම්; මාත්‍රා-අනුක්තකර්ත්‍රි; නිත්‍යං-ක්‍රියා විශෙෂණම්; සෞවර්ණහාරං-හරණ ක්‍රියායාඃ අනුක්තකර්‍මී; බාලස්‍ය-අනුක්ත සම්බන්ධඃ; කස්‍යචිත්-සම්බන්ධ විශෙෂණම්; කදා

**a. අථ ගුරුණා සශිෂ්‍යෙණ ඉතස්තතො විචින්වතා තස්‍ය පුස්තකාභ්‍යන්තරෙ ස භාරො දෘෂ්ටඃ.**

**b. තෙන චාතිරුෂ්ටා ස චෞරඃ සනිකාරං ගෘහාත් නිඃසාරිතඃ.**

**c. ස තු දුර්බුද්ධිර්බහුශො නිවාරිතො'පි ස්වජනෛඃ ස්වභාව චාපල්‍යාත් කතිපයෛර්දස්‍යුභිර් මිලිත්වා ප්‍රතිවෙශිනාං ප්‍රබලාං පිඩාමුදපාදයත්.**

---

චිත්-කාලාථෙ අව්‍යයම්; ආචරන්-කර්තෘ විශෙෂණම්; චෞර්‍ය්‍යම්-ආචරණ ක්‍රියායාඃ අනුක්තකර්ම; එව-අවධාරණෙ අව්‍යයම්; තු-අව්‍යයම්; දන්තඃ උත්සාහඃ යස්‍යසො ස'දන්තොත්සාහඃ'-චතුර්පි බහුව්‍රීහිඃ; චෞරස්‍ය කර්ම 'චෞර කර්ම'-භාවතද්ධිතාන්තඃ; ස්වර්ණශ්ච සො භාරශ්චෙති 'සෞවර්ණභාරඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ, අහරත්, අහරතාම්; අහරන්; 'හෘඤ්'-හරණෙ, භ්වාදි ද්විකර්මකඃ උභයපදී.

a. අථ, ඉක්බිත්තෙන්; ඉතස්තතඃ, ඔබමොබ; විචින්වතාඃ, සොයන්නාවූ; සශිෂ්‍යෙණ, ශිෂ්‍යයන් සහිතවූ; ගුරුණා, ගුරුහු විසින්; තස්‍ය, ඔහුගේ; පුස්තකාභ්‍යන්තරෙ, පොත් ඇතුළෙහි; සඃ භාරඃ, ඒ මුතුහරය; දෘෂ්ටඃ, දක්නාලදී. දෘෂ්ටඃ-කෘදන්ත කර්ම කාරක ක්‍රියා; භාරඃ-උක්තකර්ම; ගුරුණා-අනුක්ත කර්තෘ; සඃ-කර්ම විශෙෂණම්; සශිෂ්‍යෙණ-කර්තෘ විශෙෂණම්; විචින්වතා-කර්තෘ විශෙෂණම්; ඉතස්තතඃ-අව්‍යයෙ; අථ-අනන්තරාථෙ අව්‍යයම්; පුස්තකාභ්‍යන්තරෙ-අනුක්තාධාරඃ; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; සහ ශිෂ්‍යෛර්වර්තතෙ 'සශිෂ්‍යඃ'-සහ පූර්වපද බහුව්‍රීහිඃ; ඉතස්තතඃ-තසිල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; පුස්තකානාම් අභ්‍යන්තරඃ 'පුස්තකාභ්‍යන්තරඃ'- ෂෂ්ඨීතත්පුරුෂඃ; 'දෘශිර්'- ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී.

b. අතිරුෂ්ටා-ඉතා කිපියාවූ; තෙන ච, ඒ ගුරුහු විසින්ද; සඃ චෞරඃ, ඒ සොර තෙම; සනිකාරං, නින්දාසහිතව; ගෘහාත්, ගෙයින්; නිඃසාරිතඃ, නෙරපනලදී. නිඃසාරිතඃ-කෘදන්ත කර්ම කාරක ක්‍රියා; චෞරඃ-උක්තකර්ම; සඃ-කර්ම විශෙෂණම්; ගෘහාත්-අනුක්තාපාදනම්; තෙන-අනුක්ත කර්තෘ; අතිරුෂ්ටා-කර්තෘ විශෙෂණම්; ච-අව්‍යයම්; සනිකාරං-ක්‍රියාවිශෙෂණම්; සහනිකාරෙණ යද්වර්තතෙ 'සනිකාරඃ'-සහපූර්වපද බහුව්‍රීහිඃ; 'නි' පූර්වඃ 'සෘ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

c. සතු දුර්බුද්ධිඃ, ඒ අඥානතෙම වනාහි; බහුශඃ, බොහෝ වර; ස්වජනෛඃ, බන්ධූන් විසින්; නිවාරිතඃ අපි, වළක්වනලද්දේ නමුදු; ස්වභාව චාපල්‍යාත්, ස්වභාව චපලත්වය හේතුකොටගෙන;

**𑇧. ඉති ගච්ඡති කාලෙ කදාචිත් ස රාත්‍රෞ කම්පි ගෘහස්වාමිනං හත්වා භාණ්ඩමාදාය පලායමානො රක්ෂිපුරුෂෛඃ චෞරිතකෙන ධෘතො බද්ධශ්ච.**

---

කතිපයෛඃ දස්‍යුභිඃ, සොරුන් කීප දෙනෙකුන් හා; මිලිත්වා, එක්ව; ප්‍රතිවෙශිනාම්, අසල්වැස්සන්ට; ප්‍රබලාං, ඉතා බලවත්වූ; පීඩාම්, පීඩාවක්; උදපාදයත්, ඉපදවී. උදපාදයත්-ලඞ්ක්‍රියා; දුර්බුද්ධිඃ-උක්තකර්තා; සඃ-කර්තෘවිශෙෂණම්; තු-අව්‍යයම්; නිවාරිතඃ-කර්තෘවිශෙෂණම්; ස්වජනෛඃ-නිවාරණක්‍රියායාඃ අනුක්තකර්තා; බහුශඃ-‘ශස්’ප්‍රත්‍යයාන්තමව්‍යයම්; අපි-අව්‍යයම්; පීඩාම්-අනුක්තකර්ම; ප්‍රබලාම්-කර්මවිශෙෂණම්; ප්‍රතිවෙශිනාං-අනුක්තසම්බන්ධඃ; ස්වභාවචාපල්‍යාත්-අනුක්තාපාදානම්; මිලිත්වා-පූර්වක්‍රියා; දස්‍යුභිඃ-සහාර්ථෙ තෘතීයා; කතිපයෛඃ-තද්විශෙෂණම්; දුෂ්ටා බුද්ධිඃ යස්‍යාසෞ ‘දුර්බුද්ධිඃ’-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; ස්වෙචතෙ ජනාශ්චෙති ‘ස්වජනාඃ’-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; ස්වස්‍යභාවඃ ‘ස්වභාවඃ’-ෂෂ්ඨීතත්පුරුෂඃ; චපලස්‍ය භාවඃ ‘චාපල්‍යම්’-භාවතද්ධිතාන්තඃ; ස්වභාවෙන චාපල්‍යම් ‘ස්වාභාව චාපල්‍යම්’-තෘතීයා තත්පුරුෂඃ; ප්‍රකෘෂ්ටං බලං යස්‍යා සෞ ‘ප්‍රබලං’-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; උදපාදයත්, උදපාදයතාම්,උදපාදයන්;‘උත්’පූර්ව‘පද’-ගතෞ,චුරාදි සකර්මකඃ ආත්මනෙපදී.

𑇧. ඉති, මෙසේ; කාලෙගච්ඡති, කල් යන කල්හි; ·කදාචිත් කිසිකලෙක්හි; සඃ, හෙතෙම; රාත්‍රෞ, රාත්‍රියෙහි; කම්අපි, කිසියම්; ගෘහස්වාමිනං, ගෙහිමියෙකු; හත්වා, නසා; භාණ්ඩං ආදාය, බඩුගෙන; පලායමානඃ, පලායන්නේ; රක්ෂිපුරුෂෛඃ, ආරක්ෂක පුරුෂයන් විසින්; චෞරිතකෙන, සොරකමින්; ධෘතඃ, අල්වන ලද්දේ; බද්ධශ්ච, බඳනාලද්දේද වී. [ආසීත්]-ලුඞ් ආඛ්‍යාතක්‍රියා; සඃ-උක්තකර්තා; පලායමානඃ, ධෘතඃ-කර්තෘවිශෙෂණානි; අථවා, ධෘතඃ, බද්ධඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියානි; සඃ-උක්තකර්ම; රක්ෂිපුරුෂෛඃ-අනුක්තකර්තා; චෞරිතකෙන-අනුක්තකරණම්; පලායමානඃ-කර්මවිශෙෂණම්; ආදාය-ල්‍යබන්ත පූර්වක්‍රියා; භාණ්ඩම්-අනුක්තකර්ම; හත්වා-ක්ත්වාප්‍රත්‍යයාන්තපූර්වක්‍රියා; ගෘහස්වාමිනම්-අනුක්තකර්ම; කාලෙ-කාලසප්තමී; ගච්ඡති-කාලසප්තමී විශෙෂණම්; රාත්‍රෞ-කාලසප්තමී; කදාචිත්-කාලාර්ථෙ අව්‍යයම්; ඉති-නිදර්ශනෙ අව්‍යයම්; ගෘහස්‍යස්වාමි ‘ගෘහස්වාමි’-ෂෂ්ඨීතත්පුරුෂඃ;

**a. ස රුදන්ත්‍යා මාත්‍රා අනුගම්‍යමාන ආහ.**

**b. මාතඃ! අලං රුදිතෙන, ගච්ඡ ගෘහං, යදි භවත්‍යා ප්‍රථම මෙව නිවාරිතො'භවිෂ්‍යං තදා එතාදෘශො දශා විපර්‍ය්‍යාසො මෙ න ස්‍යාදිති.**

---

රක්ෂිණශ්චාසෞ පුරුෂශ්චෙති 'රක්ෂිපුරුෂඃ'-කර්මධාරයඃ; 'හන'-හිංසාගත්‍යොඃ, ඉත්‍යස්මාත් ධාතොඃ ක්තවාච්, 'ආ' පූර්වාත් 'දා'-දානෙ, ඉත්‍යස්මාත් ධාතොර්ල්‍යප්; 'ධෘඤ්'-ධාරණෙ; 'බධ'-බන්ධනෙ.

a. සඃ, හෙතෙම; රුදන්ත්‍යා, හඬන්නාවූ; මාත්‍රා, මව විසින්; අනුගම්‍යමානඃ, අනුගමනය කරනු බලන්නේ හෙවත් පසුපස් සෙහි යනු ලබන්නේ; ආහ, මෙසේ කී. ආහ-ලිට්කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂෛකවචනක්‍රියා; සඃ-උක්තකර්තා; මාත්‍රා-අනුක්තකර්ත්‍රි; රුදන්ත්‍යා-අනුක්තකර්තෘ විශෙෂණම්; ආහ, ආහතුඃ, ආහුඃ; 'බෘඤ්'-ව්‍යක්තායාම්වාචි, දිවාදි ද්විකර්මකඃ උභයපදී.

b. මාතඃ!, මෑණියෙනි; රුදිතෙන, ඇඬීමෙන්; අලම්, කම් නැත; ගෘහම්, ගෙට; ගච්ඡ, යව; යදි, ඉදින්; භවත්‍යා, නුඹ විසින්; ප්‍රථමං එව, පළමුකොටම; නිවාරිතඃ අභවිෂ්‍යම්, වළක්වනලද්දේ වී නම්; තදා, එකල්හි; මෙ, මට; එතාදෘශඃ, මෙබඳුවූ; දශා විපර්‍ය්‍යාසඃ, දශාවිපර්‍ය්‍යාසයෙක්තෙම; න ස්‍යාත් ඉති, නොවේය යනුයි. මාතඃ-සම්බොධනෙ ප්‍රථමා; අලං-නිෂෙධෙ අව්‍යයම්; රුදිතෙන-අලංයොගෙ තෘතීයා; ගච්ඡ-ලොට් මධ්‍යමපුරුෂෛක ක්‍රියා; ත්වං-උක්තකර්තා; ගෘහම්-අනුක්තකර්ම; අභවිෂ්‍යම්-ලෘඞ් ක්‍රියා; [අහං]-අධ්‍යාහාරඋක්තකර්තා; නිවාරිතඃ-කර්තෘවිශෙෂණම්; භවත්‍යා-නිවාරණක්‍රියායාඃ අනුක්තකර්තා; යදි-අනියමෙ අව්‍යයම්; ප්‍රථමං-ක්‍රියාවිශෙෂණම්; එව-අව්‍යයම්; [ස්‍යාත්]-විධිලිඞ් ක්‍රියා; දශාවිපර්‍ය්‍යාසඃ-උක්තකර්තා; එතාදෘශඃ-කර්තෘවිශෙෂණම්; මෙ-අනුක්ත සම්බන්ධඃ; තදා-කාලාර්ථෙ අව්‍යයම්; න-නිෂෙධෙ අව්‍යයම්; දශායාඃ විපර්‍ය්‍යාසඃ 'දශාවිපර්‍ය්‍යාසඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; ගච්ඡ, 'ගම්ලෘ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී; අභවිෂ්‍යම්, 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී; ස්‍යාත්, 'අස'-භුවි, අදාදිඅකර්මකඃ පරස්මෛපදී.

a. අසත්ප්‍රවෘත්තිරුද්ගම එව නිවාරණීයා, නො චෙත් ජීව නාන්තිකා භවති.

## 15 පඤ්ච දශඃ පාඨඃ.

b. අස්ත්‍යුජ්ජයින්‍යාං මාධවො නාම බ්‍රාහ්මණඃ.

c. තස්‍ය බ්‍රාහ්මණී බාලාපත්‍යස්‍ය රක්‍ෂාර්ථං බ්‍රාහ්මණ මවස්ථාප්‍ය ස්නාතුං ගතා.

---

a. අසත් ප්‍රවෘත්තිඃ, අයහපත් පැවැත්ම; උද්ගම එව, හටගත් කල්හිම; නිවාරණීයා; වැළැක්විය යුත්තීය; නොචෙත්, නැත හොත්; ජීවනාන්තිකා භවති; ජීවනය කෙළවර කොට ඇත්තී වේ. නිවාරණීයා–කෘදන්ත කර්මකාරක ක්‍රියා; අසත් ප්‍රවෘත්තිඃ–උක්ත කර්ම; උද්ගමඃ–අනුක්තාධාරඃ; එව–අවධාරණෙ අව්‍යයම්; ආකා රාන්ත ස්ත්‍රීලිඞ්ගො'නිවාරණීයා' ශබ්දඃ; භවති–ලට්ක්‍රියා; සා–උක්ත කර්ත්‍රී; ජීවනාන්තිකා–කර්තෘවිශෙෂණම්; නො–නිෂෙධෙ අව්‍යයම්; චෙත්–අනියමෙ අව්‍යයම්; සතාම් ප්‍රවෘත්තිඃ 'සත්ප්‍රවෘත්තිඃ', න සත් ප්‍රවෘත්තිඃ 'අසත් ප්‍රවෘත්තිඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ජීවනාන්තෙනභවා 'ජීවනාන්තිකා'–තද්ධිතාන්තඃ; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'ජීව නාන්තිකා' ශබ්දඃ.

b. උජ්ජයින්‍යාං, උජ්ජයිනී පුරයෙහි; මාධවඃනාම, මාධවයයි ප්‍රසිද්ධවූ; බ්‍රාහ්මණඃ, බ්‍රාහ්මණයෙක්තෙම; අස්ති, ඇති අස්ති-ලට් ක්‍රියා, අථවා, ක්‍රියාප්‍රතිරූපමව්‍යයම්; බ්‍රාහ්මණඃ – උක්තකර්තෘ; මාධවඃ–කර්තෘවිශෙෂණම්; නාම–ප්‍රකාශෙ අව්‍යයම්; උජ්ජයින්‍යාං– අනුක්තාධාරඃ; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො 'උජ්ජයිනී'ශබ්දඃ.

c. තස්‍ය, ඔහුගේ; බ්‍රාහ්මණී, බැමිණීතොමෝ; බාලාපත්‍යස්‍ය, බාලදරුවාගේ; රක්‍ෂාර්ථං, රැකීම පිණිස; බ්‍රාහ්මණං, බ්‍රාහ්මණයා; අවස්ථාප්‍ය, තබා; ස්නාතුං, නහන පිණිස; ගතා, ගියාය. ගතා– කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; බ්‍රාහ්මණී–උක්තකර්ත්‍රී; අවස්ථාප්‍ය– ල්‍යබන්තපූර්වක්‍රියා; බ්‍රාහ්මණං–අනුක්තකර්ම; රක්‍ෂාර්ථං–තාදර්ථ්‍ය විභක්ති; බාලාපත්‍යස්‍ය–අනුක්තසම්බන්ධඃ, ස්නාතුම්–ක්‍රියාවාචි තුමන්තඅව්‍යයම්; තස්‍ය–අනුක්තසම්බන්ධඃ; බාලශ්චා සෞ අපත්‍ය ශ්චෙති, 'බාලාපත්‍යඃ'–විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; රක්‍ෂායාඅර්ථඃ 'රක්‍ෂාර්ථඃ'–ෂෂ්ඨීතත්පුරුෂඃ; 'අව'පූර්වාත් 'ෂ්ඨා'–ගතිනිවෘත්තෞ, ඉත්‍යස්මාත් නිජන්තාත් ල්‍යප්; 'ගමු'–ගතෞ, සකර්මකඃ පරස්මෛ පදී.

**a. අථ බ්‍රාහ්මණස්‍ය කෘතෙ රාඥඃ පාර්වණ ශ්‍රාද්ධං දාතුමාහ්වා නමාගතම්.**

**b. තච්ඡ්‍රුත්වා බ්‍රාහ්මණඃ සහජ දාරිද්‍ර්‍යාදචින්තයත්.**

**c. යදි සත්වරං න ගච්ඡාමි, තදා'න්‍යඃ කශ්චිත් ශ්‍රාද්ධං ග්‍රහීෂ්‍යති.**

---

a. අථ, ඉක්බිත්තෙන්; බ්‍රාහ්මණස්‍ය කෘතෙ, බමුණු පිණිස; රාඥඃ, රජහුගේ; පාර්වණ ශ්‍රාද්ධං, පොහෝදිනෙහිවූ ශ්‍රද්ධ දානය; දාතුම්, දෙන පිණිස; ආහ්වානම්, කැඳවීම; ආගතම්, පැමිණියේය. ආගතම්-කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; ආහ්වානම්-උක්ත කර්තෘ; දාතුම්-ක්‍රියාවාචී තුමන්ත අව්‍යයම්; පාර්වණශ්‍රාද්ධං-දානක්‍රියායාඃ අනුක්තකර්ම; කෘතෙ-තාදර්ථ්‍යෙ අව්‍යයම්; බ්‍රාහ්මණස්‍ය-අනුක්ත සම්බන්ධඃ; රාඥඃ-අනුක්තසම්බන්ධඃ; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; පර්වණිභවං 'පාර්වණං'-තද්ධිතාන්තඃ; ශ්‍රද්ධා අස්ත්‍ය ස්‍යෙති 'ශ්‍රාද්ධං'-තද්ධිතාන්තඃ; පාර්වණංච තත් ශ්‍රාද්ධංචෙති 'පාර්වණ ශ්‍රාද්ධම්'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; අකාරාන්තක්ලීවලිඞ්ගො 'පාර්වණශ්‍රාද්ධ'ශබ්දඃ; 'ආ'පූර්වඃ 'ගමෞ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

b. බ්‍රාහ්මණඃ, බ්‍රාහ්මණතෙම; තච්ඡ්‍රුත්වා, ඒ අසා; සහජදාරිද්‍ර්‍යාත්, ස්වභාවයෙන් දිළිඳු බැවින්; අචින්තයත්, මෙසේ සිතී. අචින්තයත්-ලඞ්ක්‍රියා; බ්‍රාහ්මණඃ උක්තකර්තෘ; සහජදාරිද්‍ර්‍යාත්-අනුක්තාපාදානම්; ශ්‍රුත්වා-පූර්වක්‍රියා; තත්-පූර්වක්‍රියායාඃ අනුක්ත කර්ම; දරිද්‍රස්‍යභාවඃ 'දාරිද්‍ර්‍යං'-භාවතද්ධිතාන්තඃ; සහජඤ්ච තත් දාරිද්‍ර්‍යංචෙති 'සහජදාරිද්‍ර්‍යං'-කර්මධාරයඃ; අකාරාන්තක්ලීවලිඞ්ගඃ 'සහජදාරිද්‍ර්‍ය'ශබ්දඃ; අචින්තයත්, අචින්තයතාම්, අචින්තයන්; 'චිති'-චින්තායාම්, භ්වාදිසකර්මකඃ පරස්මෛපදී.

c. යදි, ඉදින්; සත්වරං, වහා; න ගච්ඡාමි, නොයෙම්නම්; තදා, එකල්හි; අන්‍යඃ කශ්චිත්, අන් කිසිවෙක්තෙම; ශ්‍රාද්ධම්; එනම් දානය (මතකදානය); ග්‍රහීෂ්‍යති, ගන්නේය. ග්‍රහීෂ්‍යති-ලට්ක්‍රියා; කශ්චිත්-උක්තකර්තෘ; අන්‍යඃ-කර්තෘවිශෙෂණම්; ශ්‍රාද්ධං-අනුක්ත කර්ම; තදා-කාලාර්ථෙඅව්‍යයම්; ගච්ඡාමි-ලට්ක්‍රියා;[අහං]-අධ්‍යාහාර උක්තකර්තෘ; සත්වරං-ක්‍රියාවිශෙෂණම්; න-නිෂෙධෙ අව්‍යයම්; යදි-අනියමාර්ථෙ අව්‍යයම්; ග්‍රහීෂ්‍යති, ග්‍රහීෂ්‍යතඃ, ග්‍රහීෂ්‍යන්ති; 'ග්‍රහ'-උපාදානෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ උභයපදී.

**a. කිනතු ශිශෝරත්‍ර රක්‍ෂකඃ කොʼපි නාස්ති තත් කිං කරෙමි.**

**b. යාතු! චිරකාලපාලිත මිමං පුත්‍රනිර්විශෙෂං නකුලං බාලරක්‍ෂාර්ථං ව්‍යවස්ථාප්‍ය ගච්ඡාමි.**

**c. තථා කෘත්වා ගතඃ.**

**d. තතස්තත්‍ර නකුලෙන බාල සමීපං තූෂ්ණීමාගච්ඡන් කෘෂ්ණ සර්පොව්‍යාපාදිතඃ ඛණ්ඩිතශ්ච.**

---

a. කිනතු, එකොක් ඇති; අත්‍ර, මෙහි; ශිශෝඃ, ළදරුවාගේ; රක්‍ෂකඃ, ආරක්‍ෂකවූ; කඃ අපි, කවරෙකුත්; නාස්ති, නැති; තත්, එහෙයින්; කිං කරෙමි, කුමක් කෙරෙම්ද? නාස්ති-අව්‍යයම්, අථවා, න-අව්‍යයම්, අස්ති-ලට් ක්‍රියා; කඃ-උක්තකර්තෘ; රක්‍ෂකඃ-කර්තෘවිශෙෂණම්; ශිශෝඃ-අනුක්තසම්බන්ධඃ; අත්‍ර-අනුක්තාධාරඃ; අපි-සමුච්චයෙඅව්‍යයම්; කිනතු-විතර්කේ අව්‍යයම්; කරෙමි-ලට් උත්තම පුරුෂක්‍රියා; [අහං]-උක්තකර්තෘ; කිං-අනුක්තකර්ම; තත්-හෙත්වර්ථෙ අව්‍යයම්; 'ඩුකෘඤ්'-කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

b. යාතු, එසේවේවා; චිරකාල පාලිතම්; බොහෝ කලෙක්හි රක්නාලද; පුත්‍රනිර්විශෙෂම්, පුතකු හා වෙනසක් නැති හෙවත් පුතකු බඳුවූ; ඉමංනකුලම්, මේ මුගටියා; බාලරක්‍ෂාර්ථම්, ළදරුව, රක්නා පිණිස; ව්‍යවස්ථාප්‍ය, තබා; ගච්ඡාමි, යෙමි. යාතු-ලොට් ක්‍රියා; [තත්]-අධ්‍යාහෘත උක්තකර්තෘ; යාතු, යාතාම්, යාන්තු; 'යා'-ප්‍රාපනෙ, අදාදිසකර්මකඃ පරස්මෛපදී. ගච්ඡාමි-ලට්ක්‍රියා; අහං-අනුක්තකර්තෘ; ව්‍යවස්ථාප්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; නකුලං-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; චිරකාලපාලිතම්-කර්මවිශෙෂණම්; පුත්‍ර නිර්විශෙෂම් කර්මවිශෙෂණම්;චිරකාලෙපාලිතඃ 'චිරකාලපාලිතඃ' -සප්තමීතත්පුරුෂඃ; පුත්‍රෙණ නිර්විශෙෂඃ 'පුත්‍රනිර්විශෙෂඃ'-තෘතීයාතත්පුරුෂඃ; බාලස්‍යරක්‍ෂා 'බාලරක්‍ෂා', බාලරක්‍ෂා එව අර්ථඃ යස්‍ය සෝ'බාලරක්‍ෂාර්ථඃ'-තත්පුරුෂ ගර්භ බහුව්‍රීහිඃ; 'ගමෙෲ'-ගතෞ, භවාදි සකර්මකඃ පරස්මෛපදී.

c. තථාකෘත්වා, එසේ කොට; ගතඃ, ගියේය. ගතඃ-කෘදන්ත කර්තෘකාරකක්‍රියා; [සඃ]-අධ්‍යාහෘත උක්තකර්තෘ; තථා-අව්‍යයම්; කෘත්වා-පූර්වක්‍රියා.

d. තතඃ, ඉක්බිති; තත්‍ර, එහි; නකුලෙන, මුගටියා විසින්; බාලසමීපං, ළදරුවා සමීපයට; තූෂ්ණීම් ආගච්ඡන්, තුෂ්ණීම් භූතව එන්නාවූ; කෘෂ්ණසර්පඃ, කෘෂ්ණසර්පයෙක් තෙම; ව්‍යාපාදිතඃ, නසනලද්දේ; ඛණ්ඩිතශ්ච, කඩකරනලද්දේත් විය. ඛණ්ඩිතඃ-

**a. තතො'සෞ නකුලො බ්‍රාහ්මණමායාන්තමාලොක්‍ය රක්තවිලිප්තමුඛපාදඃ සත්වරමුපගම්‍ය බ්‍රාහ්මණස්‍ය චරණයොර්ලුලොඨ.**

**b. තතො'සෞ බ්‍රාහ්මණස්තං තථාවිධං දෘෂ්ට්වා මම පුත්‍රො' නෙන භක්ෂිත ඉත්‍යවිචාර්‍ය්‍ය ව්‍යාපාදිතවාන්.**

---

කෘදන්තකර්තෘකාරකක්‍රියා; කෘෂ්ණසර්පඃ-උක්තකර්ම; ආගච්ඡන්-කර්ම විශෙෂණම්; තූෂ්ණීම්-අව්‍යයම්; බාලසමීපං-අනුක්තකර්ම; නකුලෙන-අනුක්තකර්තෘ; තත්‍ර-ආධාරෙ අව්‍යයම්; තතඃ-තසිල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; බාලස්‍යසමීපං'බාලසමීපං'-ෂෂ්ඨීතත්පුරුෂඃ; කෘෂ්ණශ්චාසෞ සර්පශ්චෙති 'කෘෂ්ණසර්පඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; ව්‍යාපාදිතඃ, 'වි' පූර්වඃ 'පද'-ගතෞ, සකර්මකඃ ආත්මනෙ පදී; ඛණ්ඩිතඃ, 'ඛණ්ඩ'-භෙදෙ, සකර්මකඃ ආත්මනෙපදී.

a. තතඃ, ඉක්බිති; අසෞ නකුලඃ, මේ මුගටිතෙම; ආයාන්තම්; එන්නාවූ; බ්‍රාහ්මණම්, බ්‍රාහ්මණයා; ආලොක්‍ය, බලා; රක්ත විලිප්ත, ලේවැකුණු; මුඛපාදඃ, මුඛය හා පාද ඇත්තේ; සත්වරං, වහා; උපගම්‍ය, එළඹ; බ්‍රාහ්මණස්‍ය, බ්‍රාහ්මණයාගේ; චරණයොඃ, දෙපතුල්හි; ලුලොඨ, පැකුලුනේය. ලුලොඨ-ලිට්ක්‍රියා; නකුලඃ-උක්තකර්තෘ; අසෞ-කර්තෘවිශෙෂණම්; රක්තවිලිප්ත මුඛපාදඃ-කර්තෘවිශෙෂණම්; චරණයොඃ-අනුක්තාධාරඃ; බ්‍රාහ්මණස්‍ය-අනුක්තසම්බන්ධඃ; උපගම්‍ය-ල්‍යබන්ත පූර්ව ක්‍රියා; සත්වරං-ක්‍රියා විශෙෂණම්; ආලොක්‍ය-ල්‍යබන්ත පූර්වක්‍රියා; බ්‍රාහ්මණම්-අනුක්ත කර්ම; ආයාන්තම්-කර්මවිශෙෂණම්; තතඃ-තසිල් ප්‍රත්‍යයාන්තමව්‍ය යම්; නාස්තිකුලමස්‍යෙති 'නකුලඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; මුඛංච පාදංච 'මුඛපාදඃ', රක්තෙනවිලිප්තඃ 'රක්තවිලිප්තඃ', රක්තවිලිප්ත මුඛ පාදං යස්‍යාසෞ 'රක්තවිලිප්තමුඛපාදඃ'-ද්වන්ද්ව තත්පුරුෂ ගර්භ ෂෂ්ඨීබහුව්‍රීහිඃ; ආලොක්‍ය, 'ආ' පූර්වාත් 'ලොක'-දර්ශනෙ, ඉත්‍ය ස්මාත් ල්‍යප්; උපගම්‍ය, 'උප' පූර්වාත් 'ගම්ලෘ'-ගතෞ, ඉත්‍යස්මාත් ල්‍යප්; ලුලොඨ, ලුලොඨතුඃ, ලුලුඨුඃ; 'ලුඨ'-ප්‍රතිඝාතෙ, තුදාදි අකර්ම කඃ පරස්මෛපදී.

b. තතඃ, ඉක්බිති; අසෞ බ්‍රාහ්මණඃ, මේ බමුණුතෙම; තථා විධං, එබඳුවූ; තං, ඔහු; දෘෂ්ට්වා, දැක; අනෙන, මොහු විසින්; මම පුත්‍රඃ, මාගේ පුත්‍රතෙම; භක්ෂිතඃ ඉති, කනලද්දේයයි; අවිචාර්‍ය්‍ය, නොවිමසා; ව්‍යාපාදිතවාන්, මැරී. ව්‍යාපාදිතවාන්-කෘදන්තකර්තෘ කාරකක්‍රියා; බ්‍රාහ්මණඃ-උක්තකර්තෘ; අසෞ-කර්තෘවිශෙෂණම්; **තතඃ-අනන්තරාර්ථෙ අව්‍යයම්; දෘෂ්ට්වා-පූර්වක්‍රියා; තං-අනුක්තකර්ම;**

**a. අනන්තරං යාවද සාවුපසෘත්‍ය පශ්‍යති තාවත් බාලකඃ සුසුප්තඃ ස්වපිති.**

**b. සර්පස්තු ව්‍යාපාදිතස්තිෂ්ඨති.**

**c. තත උපකාරකරං නිරූප්‍ය සන්තප්තචෙතාඃ ස පරං විෂාදමුපගතඃ.**

---

තථාවිධං-කර්මවිශෙෂණම්; අවිචාර්‍ය-පූර්වක්‍රියා; 'මම පුත්‍රො'නෙන භක්ෂිත' ඉති වාක්‍යාර්ථඃ අනුක්තකර්ම; ඉති-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; භක්ෂිතඃ-කෘදන්ත කර්තෘකාරකක්‍රියා; පුත්‍රඃ-උක්තකර්ම; මම-අනුක්ත සම්බන්ධඃ; අනෙන-අනුක්තකර්තෘ; තාදෘශොවිධඃ ප්‍රකාරඃ යස්‍යා සෞ 'තථාවිධඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; දෘෂ්ට්වා, 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; අවිචාර්‍ය, නඤ් 'වි' පූර්වාත් 'චර'-ගති, භක්ෂණයොඃ, ඉත්‍යස්මාත් ල්‍යප්; ව්‍යාපාදිතවාන්, 'වි' 'ආ' පූර්වඃ 'පද'-ගතෞ, සකර්මකඃ ආත්මනෙපදී.

a. අනන්තරන්තං, ඉක්බිති; යාවත්, යම්තාක්; අසෞ, මේ බමුණුතෙම; උපසෘත්‍ය, එළඹ; පශ්‍යති, දකීද; තාවත්, ඒ තාක්; බාලකඃ, ළදරුතෙම; සුසුප්තඃ, සුවපත්වූයේ; ස්වපිති, නිදයි. පශ්‍යති-ලට්ක්‍රියා; අසෞ-උක්තකර්තෘ; උපසෘත්‍ය-ල්‍යබන්තපූර්ව ක්‍රියා; යාවත්-අව්‍යයම්; අනන්තරං-ක්‍රියාවිශෙෂණම්; ස්වපිති-ලට්ක්‍රියා; බාලකඃ-උක්තකර්තෘ; සුසුප්තඃ-කර්තෘවිශෙෂණම්: යාවත්-අව්‍යයම්; උපසෘත්‍ය, 'උප'පූර්වාත් 'සෘ'-ගතෞ, ඉත්‍යස්මාත් ල්‍යප්; පශ්‍යති, 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, භ්වාදිසකර්මකඃ පරස්මෛපදී; ස්වපිති, ස්වපතඃ, ස්වපන්ති; 'ඤි'-ස්ව පසයෙ, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

b. සර්පස්තු, සර්පතෙම වනාහි; ව්‍යාපාදිතඃ, නසනලදුව; තිෂ්ඨති, සිටී; තිෂ්ඨති-ලට්ක්‍රියා; සර්පඃ-උක්තකර්තෘ; ව්‍යාපාදිතඃ-කර්තෘවිශෙෂණම්; තු-අව්‍යයම්; තිෂ්ඨති, 'ෂ්ඨා'-ගතිනිවෘත්තෞ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

c. තතඃ, ඉක්බිති; උපකාරකරං, උපකාරකළාහු; නිරූප්‍ය, බලා; සන්තප්තචෙතාඃ, තැවුනාවූ සිත් ඇති; සඃ, හෙතෙම; පරං, අත්‍යර්ථයෙන්; විෂාදම්, ඛෙදයට; උපගතඃ, පැමිණියේය. උපගතඃ-කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; සඃ-උක්තකර්තෘ; සන්තප්ත චෙතාඃ-කර්තෘවිශෙෂණම්; විෂාදම්-අනුක්තකර්ම; පරං-කර්මවිශෙෂණම්; නිරූප්‍ය-ල්‍යබන්තපූර්ව ක්‍රියා; උපකාරකරං-අනුක්තකර්ම; තතඃ-තසිල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; නිරූප්‍ය-'නි' පූර්වාත් 'රූප'-රූපාන්විතකරණෙ, ඉත්‍යස්මාත් ධාතොල්‍යප්; සන්තප්තඃ චෙතඃ යස්‍යාසෞ 'සන්තප්ත චෙතාඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; උපගතඃ, 'උප'පූර්වඃ 'ගමෞ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

a. **අවිමෘශ්‍යකාරිතා පරිණාමවිරසා භවති.**

---

පඤ්චමධ්‍යායඃ.

## 1. ප්‍රථමඃ පාඨඃ.

**b. සංලාපඃ.**

**c. ශාන්තශීලඃ—කිං කරොති භවාන්?**

**d. සත්‍යව්‍රතඃ—පඨාමි.**

**e. ශාන්ත—කිං පඨසි?**

**f. සත්‍ය—ව්‍යාකරණම්.**

**g. ශාන්ත—කතමං ව්‍යාකරණම් පඨසි?**

---

a. අවිමෘශ්‍යකාරිතා, නොවිමසා කරනබව; පරිණාම, විපාක යෙහි; විරසාභවති, රසනැති වේ. භවති-ලට්ක්‍රියා; අවිමෘශ්‍ය කාරිතා-උක්තකර්තෘ; පරිණාමවිරසා-කර්තෘවිශෙෂණම්; අවිමෘශ්‍ය කරොතීති 'අවිමෘශ්‍යකාරී', අවිමෘශ්‍යකාරිනඃ භාවඃ, 'අවිමෘශ්‍ය කාරිතා';පරිණාමෙවිරසඃ යස්‍යා සා'පරිණාමවිරසා'–ෂෂ්ඨීබහුව්‍රීහිඃ;

b. සංලාපඃ, සතුටුකථාවෝ කියනු ලැබෙත්.

c. ශාන්තශීලඃ, ශාන්තශීලතෙම; [කථයති], කියයි; භවාන්, පින්වත්තෙම; කිං කරොති, කුමක්කෙරේද; [කථයති]-ලට්ක්‍රියා; ශාන්තශීලඃ-උක්තකර්තෘ; 'කිං කරොතිභවාන්' ඉති වාක්‍යාර්ථඃ අනුක්තකර්ම; ශාන්තශීලඃ යස්‍ය සඃ 'ශාන්තශීලඃ'–ෂෂ්ඨීබහුව්‍රීහිඃ; කථයති, 'කථ'-වාක්‍යප්‍රබන්ධෙ, සකර්මකඃ, උභයපදී; කරොති-ලට් ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; කිං-අනුක්තකර්ම;

d සත්‍යව්‍රතඃ, සත්‍යව්‍රතතෙම; [කථයති], කියයි; [අහං], මම; පඨාමි, හදාරමි [කථයති]-ලට්ක්‍රියා; සත්‍යව්‍රතඃ-උක්තකර්තෘ; '(අහං)පඨාමි'ඉති වාක්‍යාර්ථඃ අනුක්තකර්ම; සත්‍යං ව්‍රතං යස්‍ය සඃ 'සත්‍යව්‍රතඃ'–ෂෂ්ඨීබහුව්‍රීහිඃ; අකාරාන්තපුංලිඞ්ගො 'සත්‍යව්‍රත' ශබ්දඃ; පඨාමි-ලට්ක්‍රියා; [අහං]-උක්තකර්තෘ; 'පඨ'-ව්‍යක්තායාම් වාචි, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

e. කිං, කුමක්; පඨසි? හදාරයිද? පඨසි-ලට්ක්‍රියා; [ත්වං]-උක්තකර්තෘ; කිං-අනුක්තකර්ම;

f. ව්‍යාකරණම්, ව්‍යාකරණය; [පඨාමි], හදාරමි; [පඨාමි]-ලට්ක්‍රියා; [අහං]-උක්තකර්තෘ; ව්‍යාකරණං-අනුක්තකර්ම;

g. කතමං ව්‍යාකරණං, කවරව්‍යාකරණයක්; පඨසි, හදාරයිද? පඨසි-ලට්ක්‍රියා;ත්වං-උක්තකර්තෘ;ව්‍යාකරණං-අනුක්තකර්ම;කතමං-කර්මවිශෙෂණම්.

**a. සත්‍ය-ආශුබොධම්.**

**b. ශාන්ත-කෙනෙදං ප්‍රණීතම්?**

**c. සත්‍ය-න ජානාසි ත්වං කෙනෙදං ප්‍රණීතම්.**

**d. ශාන්ත-ප්‍රසිද්ධ වෛයාකරණෙන ශ්‍රීමතා තාරානාථ තර්කවාචස්පතිනා සාම්ප්‍රතමෙව ප්‍රණීත මෙතත්.**

**e. සත්‍ය-කිං තෙන සමස්තානි සූත්‍රාණි ස්වයමුපනිබද්ධානි.**

---

a. ආශුබොධම්, ආශුබොධ ව්‍යාකරණය; (පඨාමි), හදරමි. පඨාමි-ලට් ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; ආශුබොධම්-අනුක්තකර්ම; ආශු ශීඝ්‍රං බොධයෙන තත් 'ආශුබොධම්'(ව්‍යාකරණය)-තෘතීයා බහුව්‍රීහිඃ.

b. ඉදං, මේ ව්‍යාකරණය; කෙන, කවරක්හු විසින්; ප්‍රණීතම්, කරනලදද? ප්‍රණීතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; ඉදං-උක්තකර්ම; කෙන-අනුක්ත කර්තෘ; 'ප්‍ර' පූර්වඃ 'නීඤ්'-ප්‍රාපනෙ, ද්විකර්මකඃ උභයපදී.

c. ත්වං, තෝ; ඉදං, මෙය; කෙන, කවරක්හු විසින්; ප්‍රණීතම්, කරනලද්දෙහිදැයි; න ජානාසි, නොදන්නෙහිද? ජානාසි-ලට් ක්‍රියා; ත්වම්-උක්ත කර්තෘ; 'කෙනෙදං ප්‍රණීතම්' ඉතිවාක්‍යාර්ථඃ අනුක්තකර්ම; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී. ප්‍රණීතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; ඉදං-උක්තකර්ම; කෙන-අනුක්තකර්තෘ;

d ප්‍රසිද්ධ වෛයාකරණෙන, ප්‍රසිද්ධ ව්‍යාකරණ ශාස්ත්‍රඥවූ; ශ්‍රීමතා, ශ්‍රීමත්වූ; තාරානාථ තර්කවාචස්පතිනා, තාරානාථ තර්කවාචස්පති නම් ආචාර්‍ය්‍යයා විසින්; සාම්ප්‍රතම් එව, මෙකල්හිම; එතත්, මෙය; ප්‍රණීතම්, කරනලදී. ප්‍රණීතම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; එතත්-උක්තකර්ම; තාරානාථ තර්කවාචස්පතිනා-අනුක්ත කර්තෘ; ශ්‍රීමතා-කර්තෘවිශෙෂණම්; ප්‍රසිද්ධවෛයාකරණෙන-කර්තෘවිශෙෂණම්; සාම්ප්‍රතම්-කාලාර්ථෙ අව්‍යයම්; එව-අවධාරණෙ අව්‍යයම්; ව්‍යාකරණං වෙත්ති ඉති, 'වෛයාකරණම්'-තද්ධිතාන්තඃ; ප්‍රසිද්ධශ්චාසෞ වෛයාකරණශ්චෙති 'ප්‍රසිද්ධවෛයාකරණඃ'-විශෙෂණොභයපද කර්මධාරයඃ; ශ්‍රීරස්‍යාස්තීති 'ශ්‍රීමාන්', තාරානාම් නාථඃ 'තාරානාථඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; වාචාම්පතිඃ 'වාචස්පතිඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; තර්කෙ වාචස්පතිරිව 'තර්කවාචස්පතිඃ'-සප්තමී තත්පුරුෂඃ; තාරානාථශ්චාසෞ තර්කවාචස්පතිශ්චෙති 'තාරානාථ තර්කවාචස්පතිඃ'-කර්මධාරයඃ.

e. කිම්, කිම; තෙන, ඔහු විසින්; සමස්තානි සූත්‍රාණි, සියලු සූත්‍රයෝ; ස්වයම්, තමාවිසින්; උපනිබද්ධානි, රචනාකරනලද්දාහුද? උපනිබද්ධානි-කෘදන්තකර්මකාරක ක්‍රියා; සූත්‍රාණි-උක්තකර්ම;

**a. ශාස්ත්‍රී-නහි නහි, අත්‍රබහූනි පාණිනීය සූත්‍රාණ්‍යපි සමුද්ධෘතානි.**

**b. සත්‍ය-භවාන් කි මධීතෙ?**

**c. ශාස්ත්‍රී-න කිඤ්චිත්.**

**d. සත්‍ය-කථම්?**

**e. ශාස්ත්‍රී-නාද්‍යාපි වර්ණපරිචයොස්ති.**

**f. සත්‍ය-අස්ති තෙ වයඃ සංවිඥනම්.**

---

සමස්තානි-කර්මවිශෙෂණම්; ස්වයම්;-අව්‍යයම්; තෙන-අනුක්ත කර්තෘ; කිම්-ප්‍රශ්නාර්ථ අව්‍යයම්; 'උප' 'නි' පූර්වඃ 'බධ'-බන්ධනෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. නහි නහි, නැත නැත; අත්‍ර, මේ ව්‍යාකරණයෙහි; බහූනි පාණිනීය සූත්‍රාණි අපි, බොහෝ පාණිනීය සූත්‍රයෝද; සමුද්ධෘතානි, උපුටාගන්නාලදහ. සමුද්ධෘතානි-කෘදන්ත කර්මකාරක ක්‍රියා; පාණිනීය සූත්‍රාණි-උක්තකර්ම; බහූනි-කර්ම විශෙෂණම්; අත්‍ර-ත්‍රල් ප්‍රත්‍යයාන්තමව්‍යයම්; අපි-අව්‍යයම්; නහි නහි-ප්‍රතිෂෙධ අව්‍යයෙ; පාණිනෙඃ ඉදම් 'පාණිනීයම්'-තද්ධිතාන්තඃ; පාණිනීයානිච තානිසූත්‍රාණිචෙති 'පාණිනීය සූත්‍රාණි'-කර්මධාරයඃ; සමුද්ධෘතානි, 'සම්', 'උත්' පූර්වඃ 'ධෘඤ්'-ධාරණෙ, අකර්මකඃ ආත්මනෙපදී.

b හවාන්, පින්වත්තෙම; කිම්, කුමක්; අධීතෙ, හදුරයිද? අධීතෙ-ලට්ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; කිම්-අනුක්තකර්ම; අධීතෙ, අධි' පූර්වඃ 'ඉඞ්'-අධ්‍යයනෙ, අදාදි සකර්මකඃ ආත්මනෙපදී.

c. කිඤ්චිත්, කිසිවකුත්; න, නොහදුරමි; (අධීතෙ)-ලට් කර්තෘ කාරක ආත්මනෙපද උත්තම පුරුෂෛක වචන ක්‍රියා; [අහං]-උක්තකර්තෘ; කිඤ්චිත්-අනුක්තකර්මනි අව්‍යයම්;

d. කථම්, කෙසේද? නොහොත් කුමක් හෙයින්ද? කථම්-ප්‍රශ්නාර්ථ අව්‍යයම්.

e. අද්‍ය අපි, අද දක්වාත්; වර්ණපරිචයඃ, අකුරුපුහුණුවෙක්; න අස්ති, නැත. අස්ති-ක්‍රියා; වර්ණපරිචයඃ-උක්තකර්තෘ; අද්‍ය-කාලාර්ථ අව්‍යයම්; අපි-අව්‍යයම්; වර්ණානාම් පරිචයඃ 'වර්ණපරිචයඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ;

f. තෙ, තාගේ; වයඃ සංවිඥනාම්, වයස දැනීමෙක්; අස්ති, ඇද්ද? අස්ති-ක්‍රියා; වයඃ සංවිඥනම්-උක්තකර්තෘ; තෙ-අනුක්ත සම්බන්ධඃ; වයසඃ සංවිඥනාම් 'වයඃ සංවිඥනාම්'-ෂෂ්ඨීතත්පුරුෂඃ;

**a. ගානන-කථං නාස්ති, මාතුලගෘහෙ නිවසතො මෙ සප්තමං වර්ෂමතීතම්.**

**b. සත්‍ය- සප්තමං වර්ෂමතීතම්, නාද්‍යාපි වර්ණපරිචයඃ? අධුනා සර්වථා භවතා පාඨෙ යත්නඃ කරණීයඃ.**

**c. ගානන-අද්‍ය ප්‍රභෘති තථා කරිෂ්‍යාමි, බහූපකෘතො'ස්මි ත්වයානෙන සදුපදෙශෙන.**

---

a. කථං; කෙසේ; නාස්ති, නැද්ද? මාතුල ගෘහෙ, මයිල නුවන්ගේ ගෙහි; නිවසතඃ, වාසය කරන්නාවූ; මෙ, මාගේ; සප්තමං වර්ෂම්, සත්වන අවුරුද්ද; අතීතම්, ඉක්මුනේය. කථම්-ප්‍රශ්නාර්ථේ අව්‍යයම් අතීතම්; කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; වර්ෂම්-උක්තකර්තෘ; සප්තමම්-කර්තෘ විශෙෂණම්; මෙ-අනුක්ත සම්බන්ධඃ; නිවසතඃ-සම්බන්ධවිශෙෂණම්; මාතුලගෘහෙ-අනුක්තාධාරඃ; මාතුලස්‍ය ගෘහම් 'මාතුලගෘහම්'-ෂෂ්ඨිතත්පුරුෂඃ; 'අති' පූර්ව 'ඉ' -ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

b. සප්තමං වර්ෂම්, සත්වන වර්ෂය; අතීතම්, ඉක්මුනේය; අද්‍යාපි, අද දක්වාත්; වර්ණපරිචයඃ, අකුරු පුහුණුවෙක්; න, නැත; අධුනා, දැන්; සර්වථා, සර්වප්‍රකාරයෙන්; භවතා, භවත්හු විසින්; පාඨෙ, හැදෑරිමෙහි; යත්නඃ, උත්සාහය තෙම; කරණීයඃ, කටයුතුයි. අතීතම්- කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; වර්ෂම්-උක්ත කර්තෘ; සප්තමම්-කර්තෘ විශෙෂණම් [අස්ති]-ලට්ක්‍රියා; වර්ණපරිචයඃ-උක්තකර්තෘ; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; අපි-සම්භාවනෙ අව්‍යයම්; වර්ණනාම් පරිචයඃ 'වර්ණපරිචයඃ'-ෂෂ්ඨිතත්පුරුෂඃ; කරණීයඃ-කෘදන්ත කර්මකාරකක්‍රියා; යත්නඃ-උක්තකර්ම; භවතා-අනුක්ත කර්තෘ; අධුනා-කාලාර්ථෙ අව්‍යයම්; පාඨෙ-අනුක්තාධාරඃ; සර්වථා-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; සර්වෙන ප්‍රකාරෙන 'සර්වථා'; කරණීයඃ, 'ඩු'කෘඤ් කරණෙ, සකර්මකඃ උභයපදී.

c. අද්‍ය ප්‍රභෘති, අද පටන්; තථා කරිෂ්‍යාමි, එසේ කරන්නෙමි; ත්වයා, තා විසින්; අනෙන සදුපදෙශෙන, මේ යහපත් උපදෙශයෙන්; බහූපකෘතඃ අස්මි, බොහෝසෙයින් උපකාර කරනලද්දෙමි. කරිෂ්‍යාමි-ලෘට්ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; තථා-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; ප්‍රභෘති-ක්‍රියා විශෙෂණම්; අස්මි-ලට්ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; බහූපකෘතඃ-කර්තෘවිශෙෂණම්; ත්වයා-උපකාර ක්‍රියායාඃ අනුක්ත කර්තෘ; සදුපදෙශෙන-අනුක්තකරණම්; අනෙන-කරණ විශෙෂණම්; බහු උපකෘතඃ 'බහූපකෘතඃ'-තෘතීයා තත්පුරුෂඃ; සංශ්චාසෞ උපදෙශශ්චෙති 'සදුපදෙශඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ;

## 1. ද්විතීයඃ පාඨඃ.

a. ශාන්ත-භ්‍රාතඃ! චිරාද්දෘෂ්ටො'සි.

b. සත්‍ය අස්ත්වෙතත් අහමත්‍රනාසම්, බාරාණසිං ගතො'සම්.

c. ශාන්ත-කස්‍යහෙතොඃ?

d. සත්‍ය-වෙදමධ්‍යෙතුම්.

e. ශාන්ත-කියච්චිරං භවතා තත්‍ර ස්ථිතම්.

f. සත්‍ය-පඤ්ච වර්ෂාන්.

---

a. භ්‍රාතඃ!, සහෝදරය; චිරාත්, කලකින්; දෘෂ්ටඃ අසි, දක්නා ලද්දෙහි; අසි-ලට්ක්‍රියා; [ත්වම්]-උක්ත කර්තෘ; දෘෂ්ටඃ-කර්තෘවිශෙෂණම්; චිරාත්-කාලාර්ථ අව්‍යයම්; භ්‍රාතඃ-සම්බොධනම්;

b. එතත්, මෙය; අස්තු, එසේ වේවා; අහම්, මම; අත්‍ර, මෙහි; න ආසම්; නොවීමි; බාරාණසිං, බරණැසට; ගතඃ අස්මි, ගියෙමි. අස්තු-ලොට්ක්‍රියා; එතත්-උක්තකර්තෘ; ආසම්-ලුඞ් උත්තම පුරුෂෛක වචන ක්‍රියා; අහම්-උක්තකර්තෘ; අත්‍ර-ආධාරෙ අව්‍යයම්; ආසම්, 'අස' භුවි, ඉත්‍යාදි අකර්මකඃ පරස්මෛපදී. අස්මි-ලට්ක්‍රියා; [අහම්] උක්තකර්තෘ; ගතඃ- කර්තෘ විශෙෂණම්; බාරාණසීම්- අනුක්තකර්ම;

c. කස්‍ය හෙතොඃ, කුමක්හෙයින්ද? හෙතොඃ-හෙත්වර්ථෙ ෂෂ්ඨී; කස්‍ය-අනුක්ත සම්බන්ධඃ;

d. වෙදම් අධ්‍යෙතුම්, වෙදය හදාරනු පිණිසයි. අධ්‍යෙතුම්-ක්‍රියා වාචි තුමන්තමව්‍යයම්; වෙදම්-අනුක්තකර්ම; 'අධි' පූර්වාත් 'ඉඞ්'-අධ්‍යයනෙ, ඉත්‍යස්මාත් තුමුං.

e. භවතා, භවත්හු විසින්; කියච්චිරං, කොතෙක්කල්; තත්‍ර, එහි; ස්ථිතම්, සිටීමද? ස්ථිතම්-කෘදන්ත භාවකාරකක්‍රියා; භවතා-අනුක්ත කර්තෘ; චිරං-කාලාර්ථ අව්‍යයම්, අථවා, අත්‍යන්ත සංයොගෙ ද්විතියා; කියත්-අත්‍යන්ත සංයොග විශෙෂණම්; තත්‍ර-ආධාරෙ අව්‍යයම්; තකාරාන්ත කලිවලිඞ්ගඃ 'කියත්' ශබ්දඃ; අකාරාන්ත කලිවලිඞ්ගඃ 'චිර' ශබ්දඃ; ස්ථිතම්, 'ෂ්ඨා'-ගති නිවෘත්තෞ, අකර්මකඃ පරස්මෛපදී.

f. පඤ්චවර්ෂාන්, පස් අවුරුද්දක් මුලුල්ලෙහිය; වර්ෂාන්-අත්‍යන්තසංයොගෙ ද්විතීයා; පඤ්ච-තත්විශෙෂණම්;

**a. තත්‍ර-අතිදීර්ඝකාලස්ත්වයා නීතඃ, අපි දෘෂ්ටං ත්වයා භගවතො දේවාදි දේවස්‍ය මන්දිරම්?**

**b. සත්‍ය-බහුශඃ; තත්‍රමෙ ප්‍රියසඛඃ ප්‍රියංවදො නිවසති; සහි භූතෙෂු නිත්‍යදයාවාන් ප්‍රතිදිනං ක්ෂුධාතුරාන් අන්න හෙතොරුපස්ථිතාන් දරිද්‍රාන් විවිධෙන භොජනෙන තොෂ යති; න කමපි පීඩයති අතික්ෂුද්‍ර කීටො'පි තස්‍ය කාරුණ්‍ය රස මනුභවති.**

---

b. තත්‍ර, එහි; ත්වයා, තා විසින්; අතිදීර්ඝකාලඃ, ඉතාදීර්ඝ කාලයක්; නීතඃ, යවනලදී; ත්වයා, තා විසින්; භගවතඃ, පින් වත්වූ; දෙවාදිදෙවස්‍ය, මහදෙවියාගේ; මන්දිරම්, මන්දිරය; දෘෂ්ටම් අපි, දක්නාලදද? නීතඃ-කෘදන්ත කර්මකාරක ක්‍රියා; අතිදීර්ඝකාලඃ-උක්තකර්ම; ත්වයා-අනුක්තකර්තෘ; තත්‍ර-ආධාරෙ අව්‍ය යම්; අතිශයෙන දීර්ඝ 'අතිදීර්ඝඃ', අතිදීර්ඝශ්චා සෞ කාලශ්චෙති 'අතිදීර්ඝකාලඃ'-කර්මධාරයඃ; 'නීඤ්'-ප්‍රාපණෙ, ද්විකර්මකඃ උභයපදී. දෘෂ්ටම්-කෘදන්ත කර්මකාරක ක්‍රියා; මන්දිරම්-උක්තකර්ම; ත්වයා-අනුක්ත කර්තෘ; දෙවාදි දෙවස්‍ය-අනුක්තසම්බන්ධඃ; භගවතඃ-සම්බන්ධවිශෙෂණම්; අපි-ප්‍රශ්නාර්ථෙ අව්‍යයම්; ආදෞ දෙවඃ 'ආදි දෙවඃ'-සප්තමී තත්පුරුෂඃ; දෙවානාම් ආදිදෙවඃ 'දෙවාදිදෙවඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; 'දෘශිර්'-ප්‍රෙක්ෂණෙ, සකර්මකඃ පරස්මෛපදී;

a. බහුශඃ, බොහෝවර; (දක්නාලදී); තත්‍ර, එහි; ප්‍රියංවදඃ, ප්‍රිය තෙපුල් කියන්නාවූ; මෙ, මාගේ; ප්‍රිය සඛඃ, ප්‍රිය මිත්‍රයෙක් තෙම; නිවසති, වෙසෙයි; සඃ හි, හෙතෙම වනාහි; භූතෙෂු, සත්වයන් කෙරෙහි; නිත්‍යදයාවාන්, නිතරකරුණාවෙන්; ප්‍රති දිනං, දිනක්පාසා; අන්නහෙතොඃ උපස්ථිතාන්, ආහාර හෙතු කොට එළඹියාවූ; ක්ෂුධාතුරාන්, සයින් පෙළෙනාවූ; දරිද්‍රාන්, දිළින්දන්; විවිධෙන භොජනෙන, නානාවිධ භොජනයෙන්; තොෂයති, සතුටුකෙරෙයි. කම් අපි, කිසිවෙකුත්; නපීඩයති, නොපෙළයි; අතික්ෂුද්‍ර කීටඃ අපි, ඉතා කුඩාවූ පනුවෙක් තමුදු; තස්‍ය, ඕහුගේ; කාරුණ්‍යරසම්, කාරුණ්‍යරසය; අනුභවති, අනුභව කෙරෙයි හෙවත් විඳී.

බහුශඃ-'ශස්' ප්‍රත්‍යයාන්තමව්‍යයම්.

නිවසති-ලට්ක්‍රියා; ප්‍රියසඛඃ-උක්තකර්තෘ; ප්‍රියංවදඃ-කර්තෘවිශෙෂණම්; මෙ-අනුක්ත සම්බන්ධඃ; තත්‍ර-අනුක්තාධාරඃ; ප්‍රියශ්චා සෞ සඛශ්චෙති 'ප්‍රියසඛඃ'-කර්මධාරයඃ; ප්‍රියංවදතීති 'ප්‍රියංවදඃ'-(කෘදන්ත) උපපදසමාසඃ; 'නි' පූර්වඃ 'වස'-නිවාසෙ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

**a. ශාසන-සඃ කඃ?**

**b. සත්‍ය-සති කශ්චිත් බ්‍රාහ්මණපුත්‍රඃ කුතශ්චිත් කාරණාත්‍යක්ත ස්වජන සංසර්ගස්තත්‍ර නිවසති, තෙන සහ මෛත්‍රීමවාප්තවතො මම අධ්‍යයන කාලඃ සුඛංයාතඃ.**

---

තොෂයති-ලට්ක්‍රියා; සඃ-උක්ත කර්තෘ; දරිද්‍රාන්-අනුක්ත කර්ම; භොජනෙන-අනුක්තකරණම්; විවිධෙන-අනුක්තකරණ විශෙෂණම්; ක්ෂුධාතුරාන්- කර්මවිශෙෂණම්; උපස්ථිතාන්- කර්මවිශෙෂණම්; අන්නහෙතොඃ-හෙත්වර්ථෙ පඤ්චමී; නිත්‍යදයාවාන්, කර්තෘ විශෙෂණම්; ප්‍රතිදිනං-ක්‍රියාවිශෙෂණ අව්‍යයී භාවඃ; භූතෙෂු-අනුක්තාධාරඃ; හි-අව්‍යයම්; දයා අස්‍යාස්තීති 'දයාවාන්'-අස්ත්‍යර්ථෙ වතුප්, නිත්‍යං දයාවාන් 'නිත්‍ය දයාවාන්'-ද්විතීයා තත්පුරුෂඃ; දිනෙ දිනෙ 'ප්‍රතිදිනං'-වීප්සාර්ථෙ අව්‍යයී භාවඃ; ක්ෂුධා ආතුරාඃ 'ක්ෂුධාතුරාඃ'- තෘතීයාතත්පුරුෂඃ; අන්නස්‍ය හෙතොඃ 'අන්න හෙතුඃ'- ෂෂ්ඨීතත්පුරුෂඃ; 'තුෂ'- තුෂ්ටෞ, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

පීඩයති-ලට්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; කම්-අනුක්තකර්ම; අපි-සම්භාවනෙ අව්‍යයම්; 'පීඩ'-බාධෙ, චුරාදි සකර්මකඃ උභයපදී.

අනුභවති-ලට්ක්‍රියා; අතික්ෂුද්‍රකීටඃ-උක්තකර්තෘ; කාරුණ්‍ය රසම්-අනුක්තකර්ම; තස්‍ය-අනුක්තසම්බන්ධඃ; අපි-අව්‍යයම්; අතිශයෙන ක්ෂුද්‍රඃ 'අතික්ෂුද්‍රඃ'-තෘතීයා තත්පුරුෂඃ; අතික්ෂුද්‍රශ්චාසෞ කීටශ්චෙති 'අතික්ෂුද්‍රකීටඃ'- විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; කාරුණ්‍යමෙවරසඃ 'කාරුණ්‍යරසඃ'-අවධාරණ පූර්වපද කර්මධාරයඃ; අනුභවති, 'අනු' පූර්වඃ 'භූ'-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී, අනුපූර්වත්වෙ සකර්මකඃ,

a. සඃ, හෙතෙම; කඃ, කවරෙක්ද? (ස්‍යාත්)-විධිලිඞ්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; කඃ-කර්තෘවිශෙෂණම්;

b. සඃ හි, හෙතෙම වනාහි; කශ්චිත් බ්‍රාහ්මණපුත්‍රඃ, කිසියම් බමුණු දරුවෙක්; කුතශ්චිත් කාරණාත්, කිසියම් කරුණකින්; ත්‍යක්ත, හරණලද; ස්වජන සංසර්ගඃ, ස්වකීය ජනයාගේ සංසර්ග ඇත්තේ; තත්‍ර, එහි; නිවසති, වාසය කෙරෙයි; තෙන සහ, ඔහු හා සමග; මෛත්‍රීම්, මිතුරුබවට; අවාප්තවතඃ, පැමිණියාවූ; මම, මාගේ; අධ්‍යයනකාලඃ, හදාරණ කාලයතෙම; සුඛං, සැපසේ; යාතඃ, ඉක්මගියේය.

නිවසති-ලට්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; කශ්චිත් බ්‍රාහ්මණ පුත්‍රඃ, ත්‍යක්ත ස්වජන සංසර්ගඃ, ඉත්‍යාදි කර්තෘවිශෙෂණානි; කාරණාත්-

## 3. තෘතීයඃ පාඨඃ.

---

a. **ශාන්ත-සත්‍යවෘත! කුත්‍ර වර්තතෙ භවාන්?**

b. **සත්‍ය-අයමස්මි.**

c. **ශාන්ත-නිර්ගච්ඡ, පාඨමන්දිරං ගච්ඡාවඃ.**

---

හෙත්වර්ථෙපඤ්චමී; කුතශ්චිත්-පඤ්චමී විශෙෂණෙ අව්‍යයම්; බ්‍රාහ්මණස්‍ය පුත්‍රඃ 'බ්‍රාහ්මණ පුත්‍රඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ස්වශ්චාසෞ ජනශ්චෙති 'ස්වජනඃ'-කර්මධාරයඃ; ස්වජනස්‍ය සංසර්ගඃ 'ස්වජන සංසර්ගඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; ත්‍යක්තඃ ස්වජන සංසර්ගඃ යෙනාසෞ 'ත්‍යක්ත ස්වජන සංසර්ගඃ'-තෘතීයා බහු ව්‍රීහිඃ; 'වස'-නිවාසෙ, භවාදි අකර්මකඃ පරස්මෛපදී.

යාතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; අධ්‍යයනකාලඃ-උක්ත කර්තෘ; සුඛං-ක්‍රියාවිශෙෂණම්; මම-අනුක්ත සම්බන්ධඃ; අවාප්ත වතඃ- සම්බන්ධ විශෙෂණම්; මෛත්‍රීම්-අවාප්ත ක්‍රියායාඃ අනුක්ත කර්ම; සහ-අව්‍යයම්; තෙන-සහයොගෙ තෘතීයා; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා 'මෛත්‍රී' ශබ්දඃ; නකාරාන්ත පුංලිඞ්ගඃ 'අවාප්තවාන්' ශබ්දඃ; අධ්‍යයනස්‍ය කාලඃ 'අධ්‍යයනකාලඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; 'යා'-ප්‍රාපනෙ, සකර්මකඃ පරස්මෛපදී.

a. සත්‍යවෘත, සත්‍යවෘතය; භවාන්, පින්වත්තෙම; කුත්‍ර වර්තතෙ, කොහි පවත්නේද? වර්තතෙ-ලට්කර්තෘකාරක ආත්මනෙපද ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; කුත්‍ර-අනුක්තාධාරඃ; සත්‍ය වෘත-සම්බොධනම්; සත්‍යංවෘතං යස්‍යාසෞ 'සත්‍යවෘතඃ'-ෂෂ්ඨී බහු ව්‍රීහිඃ; 'වෘතු'-වර්තතෙ, භවාදි අකර්මකඃ ආත්මනෙපදී.

b. අයං, මේ; අස්මි, වෙමි. අස්මි-ලට් කර්තෘකාරක උත්තම පුරුෂෛක වචනක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; අයං-කර්තෘවිශෙෂණම්;

c. නිර්ගච්ඡ, නික්මෙව; පාඨමන්දිරම්, පාඨශාලාවට; ගච්ඡාවඃ, යෙමු. නිර්ගච්ඡ-ලොට්ක්‍රියා; [ත්වං]-උක්තකර්තෘ; 'නිර්' පූර්වඃ 'ගම්ලෘ'-ගතෞ, භවාදි සකර්මකඃ පරස්මෛපදී. ගච්ඡාවඃ-ලට් කර්තෘකාරක උත්තම පුරුෂ බහු වචන ක්‍රියා; [ආවාම්]-උක්ත කර්තාරෞ; පාඨමන්දිරම්-අනුක්ත කර්ම; පාඨස්‍යමන්දිරම් 'පාඨමන්දිරම්'- ෂෂ්ඨීතත්පුරුෂඃ; 'ගම්ලෘ'- ගතෞ, භවාදිසකර්මකඃ පරස්මෛපදී.

**a. සත්‍ය-නාහමද්‍ය ගන්තා'ස්මි පාඨමන්දිරංගන්තුම්; තද් භවානෙව ගච්ඡතු.**

**b. ශාන්ත-කුතඃ?**

**c. සත්‍ය-ශිරෝවෙදනා මාං බලවද් බාධතෙ.**

**d. ශාන්ත-කියච්චිරං බාධතෙ භවන්ත මෙෂා?**

**e. සත්‍ය-කල්‍යප්‍රභෘති එවමාක්‍රාන්තො'ස්මි, නාද්‍යාපියං වෙදනා ප්‍රශාම්‍යති, නජානෙ කදා ස්වස්ථො භවාමි.**

---

a. අහං, මම; අද්‍ය, අද; පාඨමන්දිරම්, පාඨමන්දිරයට; ගන්තුම්, යන්ට; නගන්තා අස්මි, නොහැක්කෙමි; තද්, එහෙයින්; භවාන් එව, පින්වත් තෙමේම; ගච්ඡතු, යේවා. අස්මි-ලට්ක්‍රියා; අහම්- උක්තකර්තෘ; ගන්තා- කර්තෘවිශෙෂණම්; න- අව්‍යයම්; ගන්තුම්-ක්‍රියාවාචි තුමන්තමව්‍යයම්; පාඨමන්දිරම්- තුමන්තස්‍ය අනුක්තකර්ම; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; ගන්තුම්-'ගමෙෘ'-ගතෞ, ඉත්‍යස්මාත් ධාතොඃ තුමුං;

ගච්ඡතු-ලොට්කර්තෘකාරක ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; පාඨමන්දිරම්-අනුක්තකර්ම; එව-අවධාරණෙ අව්‍යයම්; තද්-හෙත්වර්ථෙ අව්‍යයම්;

b. කුතඃ, කුමක් හෙයින්ද? කුතඃ-ප්‍රශ්නාර්ථෙ 'තසිල්' ප්‍රත්‍යයාන්ත මව්‍යයම්.

c. ශිරො වෙදනා, හිසරුජාවක් තොමෝ; මාං, මා; බලවත්, අතිශයින්; බාධතෙ, පෙළයි. බාධතෙ-ලට්ක්‍රියා; ශිරොවෙදනා-උක්තකර්තෘ; මාං-අනුක්තකර්ම; බලවත්-ක්‍රියා විශෙෂණම්; ශිරසි වෙදනා 'ශිරොවෙදනා'-සප්තමී තත්පුරුෂඃ;බලවත්-අතිශයාර්ථෙ අව්‍යයම්; අථවා, තකාරාන්ත කලීවලිඞ්ගා 'බලවත්' ශබ්දඃ; 'බාධ'-පීඩායාම්, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

d. එෂා, මේ වෙදනාතොමෝ; කියච්චිරං, කොපමණ කලක් මුලුල්ලෙහි; භවන්තං, පින්වත්හු; බාධතෙ, පෙළාද? බාධතෙ-ලට්ක්‍රියා; එෂා-උක්තකර්ත්‍රී; භවන්තං-අනුක්ත කර්ම; චිරං-අත්‍යන්තසංයොගෙද්විතීයා; කියත්-තද්විශෙෂණම්; අථවා, චිරමිති අතීතාර්ථෙ අව්‍යයම්; 'බාධ'-පීඩායාම්, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

e. කල්‍යප්‍රභෘති, උදැසන පටන්; එවං, මෙසේ; ආක්‍රාන්තඃ අස්මි, පීඩිතයෙමි; අද්‍ය අපි, අදදක්වාත්; ඉයංවෙදනා, මේ වෙදනා තොමෝ; නප්‍රශාම්‍යති, නොසංසිඳේ; කදා, කවර කලෙක්හි; ස්වස්ථඃ භවාමි, සුවපත්වෙම්ද යනු; නජානෙ නොදනිමි.

a. ශාසන-අසති කශ්චිත් වෛද්‍ය ආහූතඃ?

b. සන්ඃ-තහිතහි, කෙවලං නිරන්තරං ශිරසි, සලිලං සිඤ්චාමි, තෙන කිඤ්චිත් සහ්‍යතා ජාතා.

c. ශාසන-අද්‍ය කිමසි භුක්තවාන්?

---

(i) අස්මි-ලට් කර්තෘකාරක උත්තම පුරුෂෛකවචන ක්‍රියා; අහම්-උක්තකර්තෘ; ආක්‍රාන්තඃ-කර්තෘවිශෙෂණම්; එවං-නිදර්ශනාර්ථෙ අව්‍යයම්; කල්‍යප්‍රභෘති-ක්‍රියාවිශෙෂණෙ විතීයා; කල්‍යං ප්‍රභෘති යස්‍ය තත් 'කල්‍යප්‍රභෘති'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ.

(ii) ප්‍රශාම්‍යති-ලට්ක්‍රියා; වෙදනා-උක්තකර්ත්‍රී; ඉයං-කර්ත්‍රී විශෙෂණම්; අද්‍ය, අපි-අව්‍යයෙ; 'ප්‍ර'පූර්වඃ 'ශම'-උපශමෙ, දිවාදි අකර්මකඃ පරස්මෛපදී.

(iii) ජානෙ-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; කදාස්වස්ථො භවාමි ඉති වාක්‍යාර්ථඃ අනුක්තකර්ම; න-අව්‍යයම්; ජානෙ 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදිසකර්මකඃ පරස්මෛපදී; භවාමි-ලට්ක්‍රියා; අහම්-උක්ත ප්‍රකෘතිකර්තෘ; ස්වස්ථඃ-උක්ත විකෘති කර්තෘ; කදා-කාලාර්ථෙ අව්‍යයම්; කශ්චිත් කාලෙ 'කදා'

a. ආහූතඃ, කැඳවනලද; කශ්චිත් වෛද්‍යඃ, කිසියම් වෙදෙක්; අසති, ඇද්ද? අසති-ලට්ක්‍රියා, අථවා, ක්‍රියා ප්‍රතිරූපමව්‍යයම්; වෛද්‍යඃ-උක්තකර්තෘ; කශ්චිත්-කර්තෘවිශෙෂණම්; ආහූතඃ-කර්තෘ විශෙෂණම්.

b. තහි තහි, තැන තැන; කෙවලං, හුදක්; නිරන්තරං-නිරන්තරුව; ශිරසි, හිසෙහි; සලිලං, දිය; සිඤ්චාමි, වත්කරමි; තෙන, ඒ කාරණකොට ගෙන; කිඤ්චිත්, මඳක්; සහ්‍යතා, ඉවසිය හැකි බව; ජාතා, වූවාය. සිඤ්චාමි-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; සලිලං-අනුක්ත කර්ම; ශිරසි-අනුක්තාධාරඃ; නිරන්තරං-ක්‍රියාවිශෙෂණම්; කෙවලං-ක්‍රියාවිශෙෂණම්; සිඤ්චති, 'සිඤ්ච'-ශෙචනෙ, තුදාදි සකර්මකඃ උභයපදී. ජාතා-කෘදන්ත කර්තෘ කාරක ක්‍රියා; සහ්‍යතා-උක්තකර්තෘ; තෙන-අනුක්තකරණම්; කිඤ්චිත්-කර්තෘවිශෙෂණෙ අව්‍යයම්; සහ්‍යස්‍ය භාවඃ 'සහ්‍යතා'-භාවතද්ධිතාන්තඃ; ජාතා,'ජනී'-ප්‍රාදුර්භාවෙ, අකර්මකඃ ආත්මනෙපදී.

c. අද්‍ය, අද; කිම්භුක්තවාන් අසි, කුමක් වැළඳුයෙහිද? අසි-ලට්ක්‍රියා; [ත්වම්]-උක්තකර්තෘ; භුක්තවාන්-කර්තෘවිශෙෂණම්; කිම්-භොජන ක්‍රියායාඃ අනුක්තකර්ම; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; අස්මින් කාලෙ 'අද්‍ය.'

**a. සත්‍ය-න කිඤ්චිත්? නාපි කථමපිද් භොජ්‍යාය රුචිරස්ති.**

**b. ශාන්ත-තද් ගෘහ එව තිෂ්ඨතු භවාන්, අහමෙව ගත්වා ගුරවෙ නිවෙදයිෂ්‍යාමි භවතො රොගවෘත්තාන්තම්.**

---

## 4. චතුර්ථඃ පාඨඃ.

---

**c. සත්‍ය-ශාන්ත ශීල! කථං රොදිෂි?**

**d. ශාන්ත-අහමස්මි බලීයසා ජ්‍යෙෂ්ඨෙන භ්‍රාත්‍රා භෘශං තාඩිතඃ.**

---

a. කිඤ්චිත්, කිසිවක්; න, නොවැළඳිමි; කථමපිත් භොජ්‍යාය, කිසියම් ආහාරයක් පිණිස; රුචිඃ, රුචියක්; න අපි අස්ති, නොම ඇති. අස්මි-ලට් ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; [භුක්තවාන්]-කර්තෘවිශෙෂණම්; කිඤ්චිත්-භොජන ක්‍රියායාඃ අනුක්තකර්ම; න-අව්‍යයම්; අස්ති-ලට්ක්‍රියා; රුචිඃ-උක්තකර්තෘ; භොජ්‍යාය-අනුක්තසම්ප්‍රදානම්.

b. තද්, එහෙයින්; භවාන්, පින්වත්තෙම; ගෘහෙඑව, ගෘහයෙහිම; තිෂ්ඨතු, සිටීවා; අහං එව, මම ම; ගත්වා, ගොස්; ගුරවෙ, ආචාර්‍ය්‍යයා හට; භවතඃ, තාගේ; රොගවෘත්තාන්තම්, රොගප්‍රවෘත්තිය; නිවෙදයිෂ්‍යාමි, දක්වන්නෙමි; තිෂ්ඨතු-ලොට් ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; ගෘහෙ-අනුක්තාධාරඃ; තද්-හෙත්වර්ථෙ අව්‍යයම්; තිෂ්ඨතු,'ෂ්ඨා'-ගති නිවෘත්තෞ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී; නිවෙදයිෂ්‍යාමි-ළට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; රොගවෘත්තාන්තම්-අනුක්තකර්ම; ගුරවෙ-අනුක්ත සම්ප්‍රදානම්; භවතඃ-අනුක්ත සම්බන්ධඃ; ගත්වා-පූර්වක්‍රියා; නිවෙදයිෂ්‍යාමි, 'නි' පූර්වඃ 'විද'-ඥානෙ අදාදි සකර්මකඃ පරස්මෛපදී.

c. ශාන්ත ශීල, ශාන්තශීලය; කථං, කුමක් හෙයින්; රොදිෂි, හඬනෙහිද? රොදිෂි-ලට් ක්‍රියා; [ත්වම්]-උක්තකර්තෘ; කථං-ප්‍රශ්නාර්ථෙ අව්‍යයම්; ශාන්තශීල-සම්බොධනෙ අව්‍යයම්; ශාන්තං ශීලං යස්‍ය සඃ 'ශාන්තශීලඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; 'රුදිර්'-අශ්‍රු විමොචනෙ, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

d. අහං, මම; බලීයසා, ඉතා ශක්තිමත්වූ; ජ්‍යෙෂ්ඨෙන භ්‍රාත්‍රා, දෙටු බෑයා විසින්; භෘශං, අත්‍යර්ථයෙන්; තාඩිතඃ අස්මි, තළනු ලද්දෙමි; අස්මි-ලට් ක්‍රියා; අහම්-උක්තකර්තෘ; තාඩිතඃ-කර්තෘවිශෙෂ

**a. සත්‍ය-හාස්‍ය හෙතොඃ?**

**b. ශාන්ත-(i) ස හි මෙ භ්‍රාතා කෛශ්චිත් සහචරෛඃ ක්‍රීඩමානො මයා යාචිතඃ, 'භ්‍රාතඃ! අනුමන්‍යස්ව මාං යුෂ්මාභිඃ සහ ක්‍රීඩිතුම්ති' (ii) ස එව මුක්තො මාං නිර්භර්ත්සයන්නාහ, ගච්ඡ ගෘහඃ, නාස්ති වො ලඝුතරාණාං ස්තන්‍ය ගන්ධිනාම ත්‍රාවකාශ ඉති, (iii) අථනිර්බන්ධ ප්‍රාර්ථිතෙන තෙන කොපාවිෂ්ටෙන ගලෙ ගෘහීත්වා මෙ පඤ්චමුෂ්ටයඃ ප්‍රදත්තාඃ (iv) එව මතිමාත්‍ර ක්ලේශිතො රෝදිමි.**

---

ණම්; භ්‍රාතා-තාඩිත ක්‍රියායාඃ අනුක්තකර්තෘ; භෘශම්-තාඩන ක්‍රියායාඃ විශෙෂණම්; ජ්‍යෙෂ්ඨ-අනුක්ත කර්තෘවිශෙෂණම්; බලීයසා-අනුක්ත කර්තෘවිශෙෂණම්; 'අස'-භුවි, අකර්මකඃ පරස්මෛපදී.

a. හාස්‍ය හෙතොඃ, කුමක් හෙයින්ද? හෙතොඃ-හෙත්වර්ථෙ ෂෂ්ඨී; හාස්‍ය-ෂෂ්ඨීවිශෙෂණම්.

b. (i) මෙ, මාගේ; සඃ භ්‍රාතා හි, ඒ භ්‍රාතෘතෙම වනාහි; සහචරෛඃ, සමග හැසිරෙන්නාවූ; කෛශ්චිත්, කිසිවකුන් හා; ක්‍රීඩමානඃ, ක්‍රීඩාකරන්නේ; මයා, මා විසින්; භ්‍රාතඃ, සහෝදරය; යුෂ්මාභිඃ සහ, තොප හා සමග; ක්‍රීඩිතුම්, ක්‍රීඩාකරන්ට; මාං, මට; අනුමන්‍යස්වඉති, අනුදනුවයි හෙවත් අවසර දෙවයි; යාචිතඃ, අයදනා ලද්දේය; (ii) සඃ, හෙතෙම; එවං උක්තඃ, මෙසේ කියන ලද්දාවූ; මාං, මට; නිර්භර්ත්සයන්, තැතිගන්වමින්; ආහ, මෙසේ කී; ගෘහඃ, ගෙට; ගච්ඡ, යව; ලඝුතරාණාම්, ඉතා ලඝුවූ; ස්තන්‍යගන්ධිනාම්, කිරිසුවඳ ඇති; වඃ, තොපට; අත්‍ර, මෙහි; අවකාශඃ නාස්ති ඉති, අවකාශයක් නැතයනුයි. (iii) අථ, ඉක්බිත්තෙන්; නිර්බන්ධප්‍රාර්ථිතෙන, නැවත නැවත අයදනාලදද; කොපාවිෂ්ටෙන, කොපයෙන් ආවිෂ්ටවූ; තෙන, ඔහු විසින්; මෙ, මාගේ; ගලෙගෘහීත්වා, ගෙල අල්වා ගෙන; පඤ්චමුෂ්ටයඃ, මුෂ්ටිපසක්; ප්‍රදත්තාඃ, දෙනලදහ. (iv) එවං, මෙසේ; අතිමාත්‍රක්ලේශිතඃ, අතිශයින් දුක්වූ මම; රෝදිමි, හඬමි.

(i) යාචිතඃ-කෘදන්ත කර්ම කාරක ක්‍රියා; භ්‍රාතා-උක්තකර්ම; සඃ-කර්මවිශෙෂණම්; ක්‍රීඩමානඃ-කර්මවිශෙෂණම්; සහචරෛඃ-සහයොගෙතෘතීයා; කෛශ්චිත්-තෘතීයාවිශෙෂණම්; හි-අව්‍යයම්; මෙ-අනුක්තසම්බන්ධඃ; මයා-අනුක්තකර්තෘ; 'අනුමන්‍යස්වමාං යුෂ්මාභිඃ සහ ක්‍රීඩිතුම්'ති වාක්‍යාර්ථඃ අනුක්තකර්මති; අනුමන්‍යස්ව-ලොට් කර්තෘකාරක ආත්මනෙපද මධ්‍යමපුරුෂෛක වචන ක්‍රියා; ත්වම්-උක්තකර්තෘ; මාං-අනුක්තකර්ම; ක්‍රීඩිතුම්-තුමන්තක්‍රියා; සහ-අව්‍යයම්; යුෂ්මාභිඃ-සහයොගෙ තෘතීයා; ඉති-නිදර්ශනෙ අව්‍යයම්; භ්‍රාතඃ-සම්බොධනම්; 'අනු'පූර්වඃ 'මන'-ඥානෙ, දිවාදි සකර්මකඃ ආත්මනෙපදී.

**ඍ. සත්‍ය-(i) භ්‍රාතඃ! අලංරුදිතෙන, (ii) ජානාමි ස වයොතරුණාන් බාලකානෙව මුත්පීඩයති, (iii) ආගච්ඡ වයමන්‍යෛඃ සවයොභිඃ සහ ක්‍රීඩනෙන මොදාමහෙ, (iv) නාස්ති මෙ තෛඃ ප්‍රාවිණ්‍යගර්විතෛරස්මාකං ප්‍රයොජනම්.**

---

(ii) ආහ-ලිට්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; එවමුක්තඃ-කර්තෘවිශෙෂණම්; නිර්භත්සයන්-කර්තෘවිශෙෂණම්; මාං-අනුක්තගෞණකර්ම; (නිර්භත්සන ක්‍රියායාශ්ච අනුක්තකර්ම); 'ගච්ඡ ගෘහං, නාස්ති වො ලඝුතරාණාම් ස්තන්‍ය ගන්ධිනාමත්‍රාවකාශ' ඉති වාක්‍ය අනුක්තකර්ම; නාස්ති-අව්‍යයම්; අථවා, අස්ති-ලට්ක්‍රියා; අවකාශඃ-උක්තකර්තෘ; වඃ-අනුක්තසම්බන්ධඃ; ලඝුතරාණාම්-සම්බන්ධිවිශෙෂණම්; ස්තන්‍ය ගන්ධිනාම්-සම්බන්ධිවිශෙෂණම්; අත්‍ර-ආධාරෙ අව්‍යයම්; ඉති-අව්‍යයම්; අය මෙ තෙෂාමතිශයෙන ලඝුරිති 'ලඝුතරඃ'-තද්ධිතාන්තඃ; ස්තන්‍යස්‍ය ගන්ධඃ 'ස්තන්‍යගන්ධඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; එවං උක්තඃ 'එවමුක්තඃ'-ද්විතියාතත්පුරුෂඃ; ආහ, 'හෲඤ්'-ව්‍යක්තායාම් වාචි, දිවාදි ද්විකර්මකඃ උභයපදී.

(iii) ප්‍රදත්තාඃ-කෘදන්ත කර්මකාරකක්‍රියා; මුෂ්ටයඃ-උක්තකර්ම; පඤ්ච-කර්මවිශෙෂණම්; තෙන-අනුක්තකර්තෘ; කොපාවිෂ්ටෙන-කර්තෘවිශෙෂණම්; නිර්බන්ධ ප්‍රාර්ථිතෙන-කර්තෘවිශෙෂණම්; අථ-අනන්තරාර්ථෙ අව්‍යයම්; ගෘහිත්වා-පූර්වක්‍රියා; ගලෙ-පූර්වක්‍රියායාඃ අනුක්තකර්මණි සප්තමී; මෙ-අනුක්තසම්බන්ධඃ; නිර්බන්ධඃ ප්‍රාර්ථිතඃ 'නිර්බන්ධප්‍රාර්ථිතඃ'-ද්විතියා තත්පුරුෂඃ; කොපෙන ආවිෂ්ටඃ 'කොපාවිෂ්ටඃ'-තෘතියා තත්පුරුෂඃ; අථවා, කොපං ආවිෂ්ටඃ 'කොපාවිෂ්ටඃ'-ද්විතියාතත්පුරුෂඃ; ගෘහිත්වා, 'ග්‍රහ'-උපාදානෙ; ප්‍රදත්තාඃ, 'ප්‍ර'පූර්වඃ 'දා'-දානෙ, සකර්මකඃ පරස්මෛපදී.

(iv) රොදිමි-ලට්ක්‍රියා; [අහං]-උක්තකර්තෘ; අතිමාත්‍ර ක්ලෙශිතඃ-කර්තෘවිශෙෂණම්; එවං-ප්‍රකාරෙ අව්‍යයම්; අති මාත්‍රං ක්ලෙශිතඃ 'අතිමාත්‍ර ක්ලෙශිතඃ'-ද්විතියා තත්පුරුෂඃ; 'රුදිර්'-අශ්‍රු විමොචනෙ, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

a. (i) භ්‍රාතඃ!, සහෝදරය; රුදිතෙන, හැඬීමෙන්; අලම්, කම්නැත; (ii) සඃ, හෙතෙම; වයොතරුණාන්, වයසින් අඩුවූ; බාලකාන්, ළදරුවන්ට; එවං, මෙසේ; උත්පීඩයති, පෙළන්නේ යයි; ජානාමි, දනිමි. (iii) ආගච්ඡ, එව; වයම්, අපි; අන්‍යෛඃ, අන්‍යවූ; සවයොභිඃසහ, සම වයස් ඇත්තවුන් හා සමග; ක්‍රීඩනෙන, ක්‍රීඩාකිරීමෙන්; මොදාමහෙ, සතුටුවෙමු. (iv) ප්‍රාවිණ්‍ය ගර්විතෛඃ, දක්ෂභාවයෙන් ගර්වඇත්තාවූ; තෛඃ, ඔවුන් කරණකොට ගෙන; අස්මාකං-අපට; ප්‍රයොජනං නාස්ති, ප්‍රයොජනයෙක් නැත.

# 5. පඤ්චමඃ පාඨඃ.

**a. සත්‍ය-කිමත්‍ර ශඨ මතිරස්ති ?**

**b. ශාන්ත-නහි, සාම්ප්‍රත මෙව ස ඉත ආසීත්, නජානෙ, අධුනා කුත්‍ර ගතො'ස්ති, කච්චිදස්ති තෙන ප්‍රයොජනම් ?**

---

(i) අලං-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; රුදිතෙන-අලං යොගෙ තෘතීයා; භ්‍රාතඃ-සම්බොධනම්; අකාරාන්ත ක්ලීව ලිඞ්ගා 'රුදිත' ශබ්දඃ.

(ii) ජානාමි-ලට්ක්‍රියා; [අහං]-උක්තකර්තා; 'වයොන්‍යූනාන් බාලකානෙව මුත්පීඩයති' ඉතිවාක්‍යාංශඃ අනුක්තකර්ම; ජානාමි-ලට් ක්‍රියා; සඃ-උක්තකර්තා; බාලකාන්-අනුක්තකර්ම; වයොන්‍යූනාන්-කර්මවිශෙෂණම්; එවං-නිදර්ශනාර්ථෙ අව්‍යයම්; වයසා න්‍යූනාඃ'වයොන්‍යූනාඃ-තෘතීයා තත්පුරුෂඃ; උත්පීඩයති, 'උත්' පූර්වඃ 'පීඩ'-බාධෙ, චුරාදි සකර්මකඃ උභයපදී.

(iii) ආගච්ඡ-ලොට් ක්‍රියා; [ත්වං]-උක්තකර්තා; ආගච්ඡතු, 'ආ' පූර්වඃ 'ගම්ලෘ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී; මොදාමහෙ-ලට්කර්තෘකාරක උත්තමපුරුෂ බහුවචන ක්‍රියා; වයං-උක්ත කර්තාරඃ; ක්‍රීඩනෙන-අනුක්තකරණම්; සහ-අව්‍යයම්; සවයොභිඃ-සහයොගෙ තෘතීයා; අන්‍යෛඃ-තෘතීයාවිශෙෂණම්; සමානං වයඃ යෙෂාං තෙ 'සවයසඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; මොදාමහෙ, 'මුද'-හර්ෂෙ, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

(iv) අස්ති-ලට්ක්‍රියා; ප්‍රයොජනං-උක්තකර්තා; තෛඃ-අනුක්ත කරණම්; ප්‍රාවිණ්‍යගර්විතෛඃ-කරණවිශෙෂණම්; අස්මාකං-අනුක්තසම්බන්ධඃ; ප්‍රාවිණ්‍යස්‍ය භාවඃ'ප්‍රාවිණ්‍යම්'-භාව තද්ධිතාන්තඃ; ප්‍රාවිණ්‍යෙන ගර්විතාඃ 'ප්‍රාවිණ්‍යගර්විතාඃ'-තෘතීයා තත්පුරුෂඃ; 'අස'-භුවි, අදාදි අකර්මකඃ පරස්මෛපදී.

a. කිම්, කිම; අත්‍ර, මෙහි; ශඨමතිඃ, ශඨමතිතෙම; අස්ති, ඇත්තේද ? අස්ති-ලට්ක්‍රියා; ශඨමතිඃ-උක්තකර්තා; අත්‍ර-අනුක්තාධාරඃ; කිම්-ප්‍රශ්න අව්‍යයම්; ශඨා මතිඃ යස්‍ය සඃ 'ශඨමතිඃ'-ෂෂ්ඨී බහුව්‍රීහිඃ; ඉකාරාන්තපුංලිඞ්ගා 'ශඨමති'ශබ්දඃ.

b. නහි, නැත; සාම්ප්‍රතම් එව, දැන්ම; සඃ, හෙතෙම; ඉතඃ, මෙහි; ආසීත්, වී. අධුනා, දැන්; කුත්‍රගතඃ අස්ති, කොහිගියේ වේදැයි; නජානෙ, නොදනිමි; කච්චිත්, කිම; තෙන, ඔහුගෙන්;

**ආ. සනා-(i) අථ කිම් ? (ii) තෙන සිද්ධාන්ත කෞමුදී චිරං ගෘහීතා; (iii) නාද්‍යාපි සා තාං ප්‍රත්‍යර්පයති; (iv) අතස්තාමන් විෂ්‍යාමි.**

---

ප්‍රයෝජනම් අස්ති, ප්‍රයෝජනයෙක් ඇද්ද? ආසීත්-ලුඞ්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; ඉතඃ-අනුක්තාධාරඃ; සාම්ප්‍රතම්-වර්තමානාර්ථ අව්‍යයම්; එව-අවධාරණෙ අව්‍යයම්; නහි-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; එව-අවධාරණෙ අව්‍යයම්; නහි-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; ජානෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද උත්තම පුරුෂෛක වචනක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; 'කුත්‍ර ගතො ස්ති' ඉතිවාක්‍යාර්ථඃ අනුක්තකර්ම; ජානෙ, 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී, ප්‍රතිඥාර්ථ හෙදෙ ආත්මනෙපදී; අස්ති-ලට්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; ගතඃ-කර්තෘවිශෙෂණම්; කුත්‍ර-අනුක්තාධාරඃ; අධුනා-වර්තමානාර්ථ අව්‍යයම්; [අස්ති]-ලට්ක්‍රියා; ප්‍රයොජනම්-උක්තකර්තෘ; තෙන-අනුක්තකරණම්; කච්චිද්-ප්‍රශ්නාර්ථ අව්‍යයම්.

a. (i) අථ, ඉක්බිති; කිම්; කිමෙක්ද? (ii) තෙන, ඔහු විසින්; සිද්ධාන්තකෞමුදි, සිද්ධාන්ත කෞමුදීතොමෝ; චිරං, අතීතයෙහි; ගෘහිතා, ගන්නා ලද්දීය. (iii) සඃ, හෙතෙම; තාම්, එය; අද්‍යඅපි, අදදක්වාත්; න ප්‍රත්‍යර්පයති, පාවානොදෙයි. (iv) අතඃ, එහෙයින්; තං, ඔහු; අන්විෂ්‍යාමි, සොයන්නෙමි.

(i) අථ-අනන්තරාර්ථ අව්‍යයම්; කිම්-ප්‍රශ්න අව්‍යයම්.

(ii) ගෘහිතා-කෘදන්ත කර්මකාරකක්‍රියා; සිද්ධාන්ත කෞමුදී-උක්තකර්ම; තෙන-අනුක්තකර්තෘ; චිරං-අතීතාර්ථ අව්‍යයම්; ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'ගෘහීතා' ශබ්දඃ; සිද්ධාන්තානාම් කෞමුදී 'සිද්ධාන්ත කෞමුදී'-ෂෂ්ඨී තත්පුරුෂඃ.

(iii) ප්‍රත්‍යර්පයති-ලට්ක්‍රියා; සඃ-උක්තකර්තෘ; තාම්-අනුක්තකර්ම; අද්‍ය, අපි-අව්‍යයෙ; අස්මින්කාලෙ 'අද්‍ය'; 'ප්‍රති'පූර්වඃ 'ඍ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

(iv) අන්විෂ්‍යාමි-ලට්ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; තම්-අනුක්තකර්ම; අතඃ-අනුක්තාපාදනම්; 'අනු' පූර්වඃ 'ඉෂු'-ගතෞ, දිවාදි සකර්මකඃ පරස්මෛපදී.

**a. ගානන-(i) ශ්‍රුතමසති වො න කිං, (ii) සඃ පරෙෂාං පුස්තකානි ගෘහීත්වා න කෙවලං චිරාත් ප්‍රත්‍යර්පයති, (iii) අපිතු මසිලිප්තානි මලදිග්ධානි ච කෘත්වා ප්‍රත්‍යර්පයති, (iv) ක්වචිත් ක්වචිත් ශශ්වත් නාර්පයති.**

**b. සත්‍ය-(i) නචෛතදස්මාකං ශ්‍රවණං ගතම්, (ii) එවං පරිඥාතෙ කස්තස්‍ය දුර්ජනස්‍ය පුස්තකං දද්‍යාත්, (iii) තස්‍ය පුස්තකං දදතා මයා නොචිතං කෘතම්, (iv) නහිනෙ, කද මෙ කෞමුදී කෞමුදීව නෂ්ට ගොචරා භවිෂ්‍යති.**

---

a. (ii) යථා, යම් පරිද්දකින්; සඃ, හෙතෙම; පරෙෂාම්, අන්‍යයන්ගේ; පුස්තකානි, පොත්; ගෘහිත්වා, ගෙන; කෙවලං, හුදක්; චිරාත්, කලකින්; ප්‍රත්‍යර්පයති න, පාවාදෙන්නේ හෝ නොවේ; (iii) අපිතු, යලිත්; මසිලිප්තානි, දූලි ආලිප්තවූවන්ද; මලදිග්ධානිච, මලබැඳුනාවූන්ද; කෘත්වා, කොට; ප්‍රත්‍යර්පයති, පාවාදෙයි; (iv) ක්වචිත් ක්වචිත්, සමහර තැනෙක්හි; ශශ්වත්, සියලු කල්හි; නාර්පයති, පාවානොදෙයි යනු; (i) වඃ, තොප විසින්; කිම්, කිම; නශ්‍රුතම් අසති, නොඅසනලද්දේ වේද?

(i) අසති-ලට්ක්‍රියා; ශ්‍රුතම්-උක්තකර්මා; වඃ-අනුක්තසම්ප්‍රදානම්; න-අව්‍යයම්; කිම්-ප්‍රශ්න අව්‍යයම්.

(ii) ප්‍රත්‍යර්පයති-ලට්ක්‍රියා; සඃ-උක්තකර්තා; ගෘහීත්වා-පූර්වක්‍රියා; පුස්තකානි-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; පරෙෂාම්-අනුක්තසම්බන්ධඃ; කෙවලම්-ක්‍රියාවිශෙෂණම්; න-නිෂෙධ අව්‍යයම්; ගෘහීත්වා, 'ග්‍රහ'-උපාදනෙ, ඉත්‍යස්මාත් ධාතොඃ ක්ත්වාච්; ප්‍රත්‍යර්පයති, 'ප්‍රති' පූර්වඃ 'ඍ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

(iii) ප්‍රත්‍යර්පයති-ලට්ක්‍රියා; [පුස්තකානි]-අධ්‍යාහාර අනුක්තකර්ම; මසිලිප්තානි-කර්මවිශෙෂණම්; මලදිග්ධානි-කර්මවිශෙෂණම්; මස්‍යාලිප්තම් 'මසිලිප්තම්'-තෘතීයා තත්පුරුෂඃ; මලෙන දිග්ධං 'මලදිග්ධං'-තෘතීයා තත්පුරුෂඃ; ච-අව්‍යයම්; කෘත්වා-පූර්වක්‍රියා; අපි, තු-අව්‍යයෙ; කෘත්වා,-කෘඤ්, කරණෙ, ඉත්‍යස්මාත් ධාතොඃ ක්ත්වාච්.

(iv) අර්පයති-ලට්ක්‍රියා; [සඃ]-උක්තකර්තා; [පුස්තකානි]-අධ්‍යාහෘත අනුක්තකර්ම; ශශ්වත්-කාලාර්ථෙ අව්‍යයම්; ක්වචිත්, ක්වචිත්-චිත්ප්‍රත්‍යයාන්තමව්‍යයෙ; කශ්චිත් කස්මින් 'ක්වචිත් ක්වචිත්'; අර්පයති,'ඍ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

b. (i) එතද්, මෙය; අස්මාකම්, අපගේ; ශ්‍රවණම්, ශ්‍රවණයට; නගතම්, නොපැමිණියේය. (ii) එවං පරිඥාතෙ, මෙසේ දන්නා ලද කල්හි; තස්‍යදුර්ජනස්‍ය, ඒ දුර්ජනයාහට; කඃ, කවරෙක් තෙම; පුස්තකම්, පොතක්; දද්‍යාත්, දේද? (iii) තස්‍ය, ඔහට;

**a ගාථා-(i) එව මෙව, කඃ සන්දෙහඃ, (ii) තස්‍ය පුස්තකං දත්වා ත්වයා න සාධු කෘතම්, iii) න ජානෙ, පුනඃ ප්‍රාප්ස්‍යසි නවා.**

---

පුස්තකං දදතා, පොතක් දෙන්නාවූ; මයා, මා විසින්; උචිතං, සුදුස්සක්; නකෘතම්, නොකරනලදී (iv) මෙ, මාගේ; කෞමුදී, කෞමුදීනොමෝ හෙවත් කෞමුදීපුස්තකය; කෞමුදීඉව, චන්ද්‍ර රශ්මියක්මෙන්; කදා, කවරකලෙක්හි; නයන ගොචරා භවිෂ්‍යති, ඇසට ගොචර වන්නේදැයි; නජානෙ, නොදනිමි.

(i) ගතම්-කෘදන්ත කර්තෘකාරකක්‍රියා; එතද්-උක්තකර්තා; ශ්‍රවණම්-අනුක්තකර්ම; අස්මාකං-අනුක්තසම්බන්ධඃ; න, හි-අව්‍යයය; ‘ගම්ඛ’-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

(ii) දදති-ලට්ක්‍රියා; කඃ-උක්තකර්තා; පුස්තකම්-අනුක්තකර්ම; දුරාත්මනඃ-අනුක්තසම්බන්ධඃ; තස්‍ය-සම්බන්ධවිශෙෂණම්; පරිඥානෙ-භාව සප්තමී; එවං-නිදර්ශනෙ අව්‍යයම්; ‘දා’-දානෙ, ජුහොත්‍යාදි සකර්මකඃ උභයපදී.

(iii) කෘතම්-කෘදන්ත කර්මකාරකක්‍රියා; උචිත-උක්තකර්ම; න-අව්‍යයම්; මයා-අනුක්තකර්තා; දදතා-කර්තෘ විශෙෂණම්; පුස්තකං-දානක්‍රියායාඃ අනුක්තකර්ම; තස්‍ය-අනුක්තසම්බන්ධඃ; ‘ඩු’-කෘඤ් කරණෙ, සකර්මකඃ උභයපදී.

(iv) ජානෙ-ලට් කර්තෘකාරක ආත්මනෙපද උත්තමපුරුෂෛක වචනක්‍රියා; [අහං]-උක්තකර්තා; ‘කදාමෙ කෞමුදී කෞමුදීව නයන ගොචරා භවිෂ්‍යති’ ඉති වාක්‍යාර්ථඃ අනුක්තකර්ම; න-ප්‍රතිෂෙධ අව්‍යයම්; ‘ඥා’-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ පරස්මෛපදී, ප්‍රතිඥාදෞ හෙදෙ ආත්මනෙපදී; භවිෂ්‍යති-ලෘට් ක්‍රියා; කෞමුදී-උක්තකර්තා; කෞමුදී-උපමා කර්තෘවිශෙෂණම්; ඉව-උපමාර්ථෙ අව්‍යයම්; කදා-කාලාර්ථෙ අව්‍යයම්; මෙ-අනුක්ත සම්බන්ධඃ; කස්මින්කාලෙ ‘කදා’; ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගා ‘කෞමුදී’ ශබ්දඃ; නයනයොගෝචරා ‘නයනගොචරා’; ‘භූ’-සත්තායාම්, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

a. (i) එවං එව, එසේමැයි; කඃ සන්දෙහඃ, කවර සැකයෙක්ද? (ii) තස්‍ය, ඔහට; පුස්තකම් දත්වා, පොතක් දී; ත්වයා, තා විසින්; සාධු, යහපතක්; න කෘතම්, නොකරනලදී. (iii) පුනඃ, නැවත; ප්‍රාප්ස්‍යසි, ලබන්නෙහිද? නවා, නොලබන්නෙහිදැයි; න ජානෙ, නොදන්නාලැබේ.

# 6. ෂෂ්ඨඃ පාඨඃ.

**a. ශාන්ත-සත්‍යව්‍රත! ගම්‍යතෙ.**

**b. සත්‍ය-කෙනෙයං ත්වරා?**

**c. ශාන්ත-(i)ක්ෂුධිතො'ස්මි, (ii) අද්‍ය ප්‍රත්‍යූෂෙ ග්‍රාමාන්තරං ගත්වා ප්‍රති නිවෘත්තස්‍ය මම ප්‍රාතරශො නොපජාතඃ.**

---

(i) එවං-උක්තපරාමර්ශ්‍යව්‍යයම්; එව- අවධාරණෙව්‍යයම්; අස්ති-ලට්ක්‍රියා; සන්දෙහඃ-උක්තකර්තා; කඃ-කර්තෘවිශෙෂණම්; අකාරාන්ත පුංලිඞ්ගො 'සන්දෙහ' ශබ්දඃ.

(ii) කෘතම්-කෘදන්ත කර්මකාරකක්‍රියා; සාධු-උක්තකර්ම; ත්වයා-අනුක්තකර්තා; දත්වා-පූර්වක්‍රියා; පුස්තකම්-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; තස්‍ය-අනුක්ත සම්බන්ධඃ; දත්වා, 'දා'-දානෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; කෘතම්, 'ඩු'-කෘඤ්, කරණෙ, සකර්මකඃ පරස්මෛපදී.

(iii) ඥායතෙ-ලට් කර්මකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන ක්‍රියා; 'පුනඃප්‍රාප්නොෂි ත්වා' ඉති වාක්‍යාර්ථඃ උක්තකර්ම; [මයා]-අධ්‍යාහෘත අනුක්තකර්තා; 'ඥා'-අවබොධනෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ ආත්මනෙපදී. ප්‍රාප්නොෂි-ලට් කර්තෘකාරක මධ්‍යම පුරුෂක්‍රියා; [තත්]-අධ්‍යාහාර අනුක්තකර්ම; [ත්වම්]-අනුක්තකර්තා; න-නිෂෙධෙ අව්‍යයම්; වා-විකල්පෙ අව්‍යයම්; පුනඃ-අප්‍රථමාර්ථෙ අව්‍යයම් ප්‍රාප්නොති, ප්‍රාප්නුතඃ, ප්‍රාප්නුවන්ති; ප්‍රාප්නොෂි, ප්‍රාප්නුථඃ; ප්‍රාප්නුථ; ප්‍රාප්නොමි, ප්‍රාප්නුවඃ, ප්‍රාප්නුමඃ; 'ප්‍ර' පූර්වඃ 'අප'-, ප්‍රාප්තෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

a. සත්‍යව්‍රත, සත්‍යව්‍රතය; ගම්‍යතෙ, ගනු ලැබේ. ගම්‍යතෙ-ලට් කර්මකාරක ආත්මනෙපදක්‍රියා; [මයා]-අධ්‍යාහෘත අනුක්තකර්තා; සත්‍යව්‍රත-සම්බොධනම්; සත්‍යංව්‍රතං යස්‍යාසෞ 'සත්‍යව්‍රතඃ' ෂෂ්ඨීබහුව්‍රීහිඃ; 'ගම්ලෘ'-ගතෞ, භ්වාදි සකර්මකඃ පරස්මෛපදී.

b. ඉයම්, මේ; ත්වරා, ඉක්මන; කෙන, කුමකින්ද? [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; ත්වරා-උක්තකර්තා; ඉයම්-කර්තෘවිශෙෂණම්; කෙන-හෙත්වර්ථෙ තෘතීයා.

c. (i) ක්ෂුධිතඃ අස්මි, ක්ෂුධාඇත්තෙක්මි; (ii) අද්‍ය, අද; ප්‍රත්‍යූෂෙ, උදෑසන්හි; ග්‍රාමාන්තරං, අනික්ගමකට; ගත්වා, ගොස්; ප්‍රතිනිවෘත්තස්‍ය, ආපසු එන්නාවූ; මම, මට; ප්‍රාතරශඃ, පෙරබත; න උපජාතඃ, නොවී.

(i) අස්මි-ලට්ක්‍රියා; [අහම්]-උක්තකර්තා; ක්ෂුධිතඃ-කර්තෘවිශෙෂණම්.

**a. සත්‍ය-තර්හි අත්‍රෛව කිඤ්චිත් ගෘහාණ, යදි රොචතෙ.**

**b. ශාන්ත-කා බාධා? දීයතාම්.**

**c. සත්‍ය-ඉදං දුග්ධම්, ඉදංච මිෂ්ටාන්නං, යථා සුඛං ගෘහ්‍යතාම්.**

**d. ශාන්ත-(i) අහො! මධුර මිදං පයඃ, (ii) සුමිෂ්ටඤ්චෙද මන්නම්.**

---

(ii) උපජාතඃ-කෘදන්ත කර්තෘකාරක ක්‍රියා; ප්‍රාතරශඃ-උක්ත කර්තා; න-අව්‍යයම්; මම-අනුක්ත සම්බන්ධඃ; ප්‍රතිනිවෘත්තස්‍ය-සම්බන්ධ විශෙෂණම්; ගත්වා-පූර්වක්‍රියා; ග්‍රාමාන්තරම්-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; ප්‍රත්‍යූෂෙ-කාලසප්තමී; අද්‍ය-කාලාර්ථෙ අව්‍යයම්; අන්‍යත් ග්‍රාමඃ 'ග්‍රාමාන්තරඃ'-විශෙෂ්‍ය පූර්වපද කර්මධාරයඃ; උපජාතඃ, 'උප' පූර්වඃ 'ජනි'-ප්‍රාදුර්භාවෙ.

a. යදිරොචතෙ, ඉදින් රුචිකෙරේ නම්; තර්හි, එසේකල; අත්‍රඑව, මෙහිදීම; කිඤ්චිත්, මදක්; ගෘහාණ, ගනුව හෙවත් වළඳව. ගෘහාණ-ලොට් කර්තෘකාරක පරස්මෛපද මධ්‍යම පුරුෂෛක වචන ක්‍රියා; [ත්වං]-උක්තකර්තා; කිඤ්චිත්-අනුක්ත කර්ම; එව-අවධාරණෙ අව්‍යයම්; අත්‍ර-අනුක්තාධාරඃ; තර්හි-කාලාර්ථෙ අව්‍යයම්; ගෘහ්ණාතු, ගෘහාණතම්, ගෘහ්ණන්තු; 'ග්‍රහ'-උපාදානෙ, ක්‍ර්‍යාදි සකර්මකඃ උභයපදී. රොචතෙ-ලට් ක්‍රියා; යදි-අනියමෙ අව්‍යයම්; රොචතෙ, රොචෙතෙ, රොචන්තෙ; 'රුචි'-ප්‍රීතෞ, භ්වාදි අකර්මකඃ ආත්මනෙපදී.

b. කාබාධා, කවර බාධාවක්ද? දීයතාම්, දෙනුලැබේවා. [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; බාධා-උක්තකර්ත්‍රී; කා-තද්විශෙෂණම්; දීයතාම්-ලොට් කර්මකාරක ආත්මනෙපදක්‍රියා; [භොජනම්]-උක්තකර්ම; [ත්වයා]-අනුක්තකර්තා; 'දා'-දානෙ, ජුහොත්‍යාදි, සකර්මකඃ උභයපදී.

c. ඉදං දුග්ධම්, මේ කිරිද; ඉදඤ්චමිෂ්ටාන්නං, මේ මධුරාහාරයද; යථාසුඛං, සැපවූ පරිද්දෙන්; ගෘහ්‍යතාම්, ගනුලැබේවා. ගෘහ්‍යතාම්-ලොට්කර්මකාරක ආත්මනෙපදක්‍රියා; දුග්ධං-උක්තකර්ම; මිෂ්ටාන්නං-උක්තකර්ම; ච-කර්මසමුච්චයෙ අව්‍යයම්; ඉදම්, ඉදම්-කර්මවිශෙෂණම්; යථා සුඛං-ක්‍රියාවිශෙෂණම්; මිෂ්ටංච තත් අන්නංචෙති 'මිෂ්ටාන්නං'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; සුඛමනතික්‍රම්‍යෙත්‍යයථා සුඛං'-අව්‍යයී භාවඃ.

d. (i) අහො, ආශ්චර්‍ය්‍යයි; ඉදම්පයඃ, මේ ක්ෂීරයතෙම; මධුරම්, මිහිරියි. (ii) ඉදම් අන්නංච,මේ බතද;සුමිෂ්ටං,ඉතා මධුර වේ.

(i) [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; පයඃ-උක්තකර්තා; මධුරම්-කර්තෘ විශෙෂණම්; ඉදම්-කර්තෘවිශෙෂණම්; අහො-විස්මයෙ අව්‍යයම්.

a. සත්‍ය-(i) අතෘප්ත ඉව ලක්ෂ්‍යසෙ භවාන්, (ii) අපි දදති කිංචිදන්‍යත්? (iii) නහි නහි, ඉදමෙවාලම්.

---

## 7. සප්තමඃ පාඨඃ.

---

b. මිත්‍රයොඃ පරස්පරාලාපඃ.

c. මහාශය, ආගම්‍යතාම්.

---

(ii) [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; අන්නං-උක්තකර්තෘ; සුමිෂ්ටං-කර්තෘ විශෙෂණම්; ච-අව්‍යයම්; සුෂ්ඨුමිෂ්ටං 'සුමිෂ්ටං'-ප්‍රාදිකර්මධාරයඃ; අකාරාන්ත ක්ලීව ලිඞ්ගො 'සුමිෂ්ට' ශබ්දඃ.

a. (i) භවාන්, පින්වත්තෙම; අතෘප්තඃ ඉව, තෘප්තිනැත් තෙකුසේ; ලක්ෂ්‍යතෙ, දක්නාලැබේ හෙවත් පැනේ. (ii) අපි, කිම; අන්‍යත් කිංචිත්, අන්කිසිවක්; දදති, දෙම්ද? (iii) නහි නහි, නැත නැත; ඉදම්එව, මෙයම; අලම්, පමණි.

(i) ලක්ෂ්‍යතෙ-ලට් කර්මකාරක ආත්මනෙපද ප්‍රථමපුරුෂෛක වචනක්‍රියා; භවාන්-උක්තකර්ම; අතෘප්තඃ-උපමා කර්තෘවිශෙෂණම්; ඉව-උපමාර්ථෙ අව්‍යයම්; න තෘප්තඃ 'අතෘප්තඃ'-නඤ් තත්පුරුෂඃ; ලක්ෂ්‍යතෙ, 'ලක්ෂ'-දර්ශනාඞ්කයොඃ, චුරාදි සකර්මකඃ උභයපදී.

(ii) දදති-ලොට් ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; කිංචිත්-අනුක්ත කර්ම; අන්‍යත්-කර්මවිශෙෂණම්; අපි-ප්‍රශ්නෙ අව්‍යයම්.

(iii) [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; ඉදම්-උක්තකර්තෘ; අලං, කර්තෘ විශෙෂණෙ අව්‍යයම්; එව-අවධාරණෙ අව්‍යයම්; නහි නහි-ප්‍රතිෂෙධෙ අව්‍යයෙ.

b. මිත්‍රයොඃ, මිතුරන් දෙදෙනෙකුගේ; පරස්පරාලාපඃ, අන්‍යොන්‍ය සම්භාෂණයක් කියනුලැබේ. [උච්‍යතෙ]-ලට් කර්මකාරක ආත්මනෙපදක්‍රියා; පරස්පරාලාපඃ-උක්තකර්ම; මිත්‍රයොඃ-අනුක්තසම්බන්ධඃ; පරස්පරං ආලාපඃ 'පරස්පරාලාපඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ.

c. මහාශය, මහාත්මය; ආගම්‍යතාම්, එනුලැබේවා. ආගම්‍යතාම්-ලොට් කර්මකාරක ආත්මනෙපදක්‍රියා; [ත්වයා]-අනුක්ත කර්තෘ; මහාශය-ආමන්ත්‍රණම්; මහාං ආශයඃ යස්‍ය සො 'මහාශයඃ'-ෂෂ්ඨීබහුව්‍රීහිඃ; 'ආ' පූර්වඃ 'ගම්ලෘ'-ගතෞ, භ්වාදිසකර්මකඃ පරස්මෛපදී.

a. බහු දිනාන්තෙන සාක්ෂාල්ලබ්ධම්.
b. කථං වර්තතෙ.
c. භවාදීයානුග්‍රහෙණ කුශලෙනාසම්.
d. භවත් පුත්‍රඃ කිං කරොති?
e. ලෙඛනං පඨනං කරොති.
f. භද්‍රං, සතු විද්‍යාභ්‍යාසෙ ආවිෂ්ටො නවා?

---

a. බහුදිනාන්තෙන, බොහෝ දවසක්හුගේ අවසානයෙහි; සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂභාවය; ලබ්ධම්, ලබනලදී. ලබ්ධම්-කෘදන්ත කර්මකාරකක්‍රියා; සාක්ෂාත්-උක්තකර්ම; බහුදිනාන්තෙන-අනුක්තාධාරඃ; බහූනිචතානි දිනානි චෙති 'බහුදිනානි'; බහුදිනානාං අන්තඃ 'බහුදිනාන්තඃ'-කර්මධාරය ගර්භ තත්පුරුෂඃ; සාක්ෂාත්-ප්‍රත්‍යක්ෂෙව්‍යයම්; 'ලභ'-ප්‍රාප්තෞ, සකර්මකඃ ආත්මනෙපදී.

b. කථම්, කෙසේ; වර්තතෙ, පවතීද? වර්තතෙ-ලට්ක්‍රියා; [සුඛදුඃඛං]-උක්තකර්තා; කථම්-ප්‍රකාරාර්ථෙ 'ථමු'ප්‍රත්‍යයාන්තමව්‍යයම්; 'වෘතු'-වර්තනෙ, භ්වාදි සකර්මකඃ ආත්මනෙපදී.

c. භවාදීයානුග්‍රහෙණ, භවත්හුගේ අනුග්‍රහයෙන්; කුශලෙන, නිරෝගීබවයෙන්; ආසම්-යුක්තයෙමි. ආසම්-ලුඞ්ක්‍රියා; [අහම්]-උක්තකර්තා; කුශලෙන-උපලක්ෂණෙ තෘතීයා; භවාදීයානුග්‍රහෙණ-අනුක්ත කරණම්; භවතඃ 'අයං භවදීයං'-තද්ධිතාන්තඃ; භවදීයශ්චාසෞ අනුග්‍රහශ්චෙති 'භවාදීයානුග්‍රහඃ'-විශෙෂණ පූර්වපද කර්මධාරයඃ; ආසම්, 'අස'-භුවි, අදාදිඅකර්මකඃ පරස්මෛපදී.

d. භවත්පුත්‍රඃ, තොපගේ පුත්‍රතෙම; කිංකරොති, කුමක් කෙරේද? කරොති-ලට්ක්‍රියා; භවත්පුත්‍රඃ-උක්තකර්තා; කිම්-අනුක්තකර්ම; භවතඃ පුත්‍රඃ'භවත්පුත්‍රඃ'-ෂෂ්ඨීතත්පුරුෂඃ; කරොති, 'ඩු'-කෘඤ්, කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

e. ලෙඛනම්, ලිවීමද; පඨනම්, හැදෑරීමද; කරොති, කෙරෙයි. කරොති-ලට්ක්‍රියා; [සඃ]-උක්තකර්තා; ලෙඛනම්-අනුක්තකර්ම; පඨනම්-අනුක්තකර්ම.

f. භද්‍රං, මැනවි සඃ තු, හෙතෙම වනාහි; විද්‍යාභ්‍යාසෙ, විද්‍යාභ්‍යාසයෙහි; ආවිෂ්ටඃ, යුක්තවූයේද? නවා, යුක්තනුවූයේද? [භවති]-ලට්ක්‍රියා; භද්‍රං-උක්තකර්තා. [භවති]-ලට්ක්‍රියා; සඃ-උක්ත ප්‍රකෘතිකර්තා; ආවිෂ්ටඃ-උක්තවිකෘතිකර්තා; විද්‍යාභ්‍යාසෙ-අනුක්තාධාරඃ; වා, තු-අව්‍යයෙ; විද්‍යායාඅභ්‍යාසඃ 'විද්‍යාභ්‍යාසඃ'-ෂෂ්ඨීතත් පුරුෂඃ.

**a. (i) පරන්තු (ii) බාලකඃ (iii) තථාපි තත්‍රානු රාගො වර්තතෙ.**

**b. (i) භද්‍රං, (ii) යත්නෙන පාර්ථිතව්‍යං, (iii) භවාන් අධුනා කිං කරොති? (iv) කෙනවා භවතඃ පරිවාර පොෂණං භවති.**

**c. අහමිදානීං රාජසන්නිධෞ තිෂ්ඨාමි, (ii) තෙන ච කස්මිංශ්චිත් කර්මණි මාං නියොජයිත්වා කිඤ්චිද්ධනං දීයතෙ, (iii) ලබ්ධෙන තෙන පරිවාරං පොෂයාමි.**

---

a. (i) පරන්තු, එකෙක් ඇති; (ii) බාලකඃ, ළදරුවෙකි; (iii) තථා අපි, එතකුදු උවත්; තත්‍ර, එහි; අනුරාගඃ, ඇල්ම; වර්තතෙ, පවතී.

(i) [අස්ති]-ලට්ක්‍රියා; පරං-උක්තකර්තෘ; තු-අව්‍යයම්.

(ii) [ස්‍යාත්] විධිලිඞ්ක්‍රියා; බාලකඃ-උක්තකර්තෘ.

(iii) වර්තතෙ-ලට්ක්‍රියා; අනුරාගඃ-උක්තකර්තෘ; තත්‍ර-අනුක්තාධාරඃ; තස්මින් ඉති 'තත්‍ර'; 'වෘතු'-වර්තතෙ.

b. (i) භද්‍රං, මැනවි. (ii) යත්නෙන, උත්සාහයෙන්; පාර්ථිතව්‍යං, හැදූරවිය යුතුයි. (iii) භවාන්, පින්වත්තෙම; අධුනා, දැන්; කිංකරොති, කුමක් කෙරේද? (iv) භවතඃ, පින්වත්හුගේ; පරිවාරපොෂණම්, පිරිවර පොෂණය; කෙනවා භවති, කුමකින් වේද?

(i) [භවති]-ලට්ක්‍රියා; භද්‍රං-උක්තකර්තෘ.

(ii) පාර්ථිතව්‍යං-කෘදන්ත කර්මකාරකක්‍රියා; [සඃ]-උක්තකර්ම; [ත්වයා]-අනුක්තකර්තෘ; යත්නෙන-අනුක්තකරණම්; 'පාර්ථ'-ව්‍යක්තායාම්වාචී, සකර්මකඃ පරස්මෛපදී.

(iii) කරොති-ලට්ක්‍රියා; භවාන්-උක්තකර්තෘ; කිම්-අනුක්ත කර්ම; අධුනා-අව්‍යයම්; 'ඩු'-කෘඤ්, කරණෙ, තනාදි සකර්මකඃ උභයපදී.

(iv) භවති-ලට්ක්‍රියා; පරිවාර පොෂණම්-උක්තකර්තෘ; කෙන-අනුක්තකරණම්; භවතඃ-අනුක්තසම්බන්ධඃ; වා-අව්‍යයම්; පරිවාරස්‍ය පොෂණම් 'පරිවාර පොෂණම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ.

c. (i) අහම්, මම; ඉදානීම්, දැන්; රාජසන්නිධෞ, රජු සමීප යෙහි; තිෂ්ඨාමි, සිටිමි. (ii) තෙනච, ඔහු විසින් ද; කස්මිංශ්චිත් කර්මණි, කිසියම් ක්‍රියාවෙක්හි; මාං, මා; නියොජයිත්වා, යොදා; කිංචිධනං, කිසි ධනයෙක්; දීයතෙ, දෙනුලැබේ. (iii) ලබ්ධෙන, ලබනලද; තෙන, ඒ ධනයෙන්; පරිවාරං, පිරිවර; පොෂයාමි, පොෂණය කරමි.

**a. (i) (ii) භද්‍රමවකාශ වශෙනා'ත්‍ර යදා කදාප්‍යා ගමනීයං ත්වයා.**

**b. (i) ආමෙවං, (ii) සදෛව භවත් සන්නිධානෙ ආගච්ඡා මි'ති මමෙච්ඡා.**

---

(i) තිෂ්ඨාමි-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; ඉදානීම්-කාලාර්ථෙ අව්‍යයම්; රාජසන්නිධෞ-අනුක්තාධාරඃ; රාඥඃ සන්නිධිඃ 'රාජසන්නිධිඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'ෂ්ඨා'-ගතිනිවෘත්තෞ, භ්වාදි අකර්මකඃ පරස්මෛපදී.

(ii) දීයතෙ-ලට්කර්මකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනක්‍රියා; ධනම්-උක්තකර්ම; තෙන-අනුක්තකර්තෘ; කිඤ්චිත්-කර්මවිශෙෂණම්; නියොජයිත්වා-පූර්වක්‍රියා; මාං-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; කර්මණි-අනුක්තාධාරඃ; කස්මිංශ්චිත්-ආධාරවිශෙෂණම්; නියොජයිත්වා-'නි'පූර්වඃ 'යුජිර්'-යොගෙ, ඉත්‍යස්මාත් ක්ත්වාච්; දීයතෙ, 'දා'-දානෙ, ජුහොත්‍යාදි සකර්මකඃ උභයපදී.

(iii) පොෂයාමි-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; පරිවාරං-අනුක්තකර්ම; තෙන-අනුක්තකරණම්; ලබ්ධෙන-කරණවිශෙෂණම්; 'පුෂ'-පුෂ්ටෞ, දිවාදි සකර්මකඃ පරස්මෛපදී.

a. (ii) භද්‍රම්, මැනවි; (ii) අවකාශවශෙන, අවකාශ පරිද්දෙන්; ත්වයා, තා විසින්; යදාකදාපි, යම්කිසිවිටෙක; අත්‍ර, මෙහි; ආගමනීයම්, පැමිණිය යුතුයි.

(i) [අසතු]-ලොට්ක්‍රියා; භද්‍රං-උක්තකර්තෘ.

(ii) ආගමනීයම්-කෘදන්ත භාවකාරකක්‍රියා; ත්වයා-අනුක්තකර්තෘ; අත්‍ර-අනුක්තාධාරඃ; යදා, කදා-කාලාර්ථෙ අව්‍යයෙ; අපි-සම්භාවනෙ අව්‍යයම්; අවකාශවශෙන-අනුක්තකරණම්; අවකාශස්‍ය වශඃ 'අවකාශවශඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; යස්මින් කාලෙ 'යදා'; කස්මින් කාලෙ 'කදා'; 'ආ' පූර්වඃ 'ගම්ලෘ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

b. (i) ආම් එවම්, එසේ පිළිගනිමි; (ii) සදාඑව, හැමකල්හිම; භවත්සන්නිධානෙ, තොප සමීපයෙහි; ආගච්ඡාමි ඉති, පැමිණෙමැයි; මම ඉච්ඡා, මාගේ කැමැත්ත වේ.

(i) ආම්-අංගීකාරෙ අව්‍යයම්; එවං-නිදර්ශනෙ අව්‍යයම්.

(ii) ආගච්ඡාමි-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ; භවත්සන්නිධානෙ-අනුක්තාධාරඃ; සදා-කාලාර්ථෙ අව්‍යයම්; අවධාරණෙ අව්‍යයම්; ඉති-පරිසමාප්තෙ අව්‍යයම්; [අස්ති]-ලට්ක්‍රියා; ඉච්ඡා-උක්තකර්තෘ; මම-අනුක්තසම්බන්ධඃ; සර්වස්මින් කාලෙ 'සදා'; භවතඃ සන්නිධානම් 'භවත්සන්නිධානම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ.

**a. (i) නහ්‍යෙවං කාලසීමාහානිං කෘත්වා ආගමනීයං, (ii) කින්තු සාවකාශෙන ත්වයා ආගන්තව්‍යම්, (iii) භවද්දර්ශනෙන නාහං සුඛී භවාමීත්‍යස්මා දෙවං කථයාමි.**

**b. මමාප්‍යෙතාදෘශී මනොවෘත්තිස්‍යාදිත්‍යුච්‍යතෙ භවතා.**

**c. ආලයං ගච්ඡාමි.**

---

a. (i) එවං, මෙසේ; කාලසීමාහානිඃ කෘත්වා, කාලසීමාහානිය කොට; නහිආගමනීයම්, නොආයුතුයි. (ii) කින්තු, එකෙක් ඇති; සාවකාශෙන, අවකාශ සහිතවූ; ත්වයා, තා විසින්; ආගන්තව්‍යම්; ඉයයුතුයි. (iii) භවද්දර්ශනෙන, තොපගේ දැකීමෙන්; අහම්; මම; සුඛිභවාමිඉති, සුවපත්වෙමැයි; අස්මාත්, එහෙයින්; එවං කථයාමි, මෙසේ කියමි.

(i) ආගමනීයම්-කෘදන්ත භාවකාරකක්‍රියා; [ත්වයා]-අනුක්ත කර්තෘ; කෘත්වා-පූර්වක්‍රියා; කාලසීමාහානිඃ-පූර්වක්‍රියායාඃ අනුක්තකර්ම; නහි-ප්‍රතිෂෙධෙ අව්‍යයම්; එවං ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; කාලසීමස්‍ය හානිඃ 'කාලසීමාහානිඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; 'ආ' පූර්වඃ 'ගම්ඍ'-ගතෞ, සකර්මකඃ පරස්මෛපදී.

(iii) ආගන්තව්‍යම්-කෘදන්ත භාවකාරකක්‍රියා; ත්වයා-අනුක්ත කර්තෘ; සාවකාශෙන-කර්තෘවිශෙෂණම්; කිං, තු-අව්‍යයෙ; සහ අවකාශෙන යො වර්තතෙ අසෞ 'සාවකාශඃ'-සහ පූර්වපද තෘතීයා බහුව්‍රීහිඃ.

(iii) කථයාමි-ලට්ක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; එවම්-ක්‍රියා විශෙෂණෙ අව්‍යයම්; අස්මාත්-අනුක්තාපාදානම්; ඉති-හෙත්වර්ථෙ අව්‍යයම්; භවාමි-ලට්ක්‍රියා; අහම්-උක්තප්‍රකෘතිකර්තෘ; සුඛී-උක්ත විකෘතිකර්තෘ; භවද්දර්ශනෙන-අනුක්තකරණම්; භවතොදර්ශනම් 'භවද්දර්ශනම්'-ෂෂ්ඨී තත්පුරුෂඃ; කථයාමි, 'කථ'-වාක්‍යප්‍රබන්ධෙ, චුරාදි සකර්මකඃ උභයපදී.

b. භවතා, භවත්හු විසින්; යථාඋච්‍යතෙ, යම්සේ කියනු ලැබේද; මම අපි, මාගේද; එතාදෘශී, මෙබඳුවූ; මනොවෘත්තිඃ, සිතපැවැත්ම වේ. [ස්‍යාත්]-විධිලිඞ්ක්‍රියා; මනොවෘත්තිඃ-උක්ත කර්තෘ; එතාදෘශී-කර්තෘවිශෙෂණම්; මම-අනුක්තසම්බන්ධඃ; අපි-අව්‍යයම්; උච්‍යතෙ-ලට්කර්මකාරක ආත්මනෙපදක්‍රියා; භවතා-අනුක්තකර්තෘ; යථා-ප්‍රකාරාර්ථෙ අව්‍යයම්; මනසොවෘත්තිඃ 'මනොවෘත්තිඃ'-ෂෂ්ඨී තත්පුරුෂඃ; උච්‍යතෙ, 'වච'-ව්‍යක්තායාම්වාචි, අදාදි ද්විකර්මකඃ පරස්මෛපදී.

c. ආලයං, ගෙට; ගච්ඡාමි, යෙමි. ගච්ඡාමි-ලට් කර්තෘකාරක පරස්මෛපද උත්තමපුරුෂෛකවචනක්‍රියා; [අහම්]-උක්තකර්තෘ; ආලයම්-අනුක්තකර්ම.

**a. ඉදනීම් ගමිෂ්‍යසි ?**

**b. (i) ආං වෙලාභූදුපවිශ, (ii) ගච්ඡාම්‍යහම්.**

**c. නමස්කාරෝ'ස්තු.**

**d. මමාපි නමස්කාරෝ'ස්තු.**

---

## ෂෂ්ඨා ධ්‍යායඃ.

---

### e. අව්‍යය නිරූපණම්.

**f. ලිඞ්ගවිභක්ති වචන ශූන්‍යාන්‍ය ව්‍යයානි, තානි ද්වෙධා ප්‍රතිපදෝක්තානි ලාක්ෂණිකානි චේති, තත්‍ර සූත්‍රකෘතා ස්වරාදි චාදි ප්‍රාද්‍යුරර්‍යාදි සාක්ෂාත් ප්‍රභෘත්‍යාදි රූපේණ ස්වතො නිපාති තානි ප්‍රතිපදෝක්තානි, තෙතු ප්‍රසිද්ධානි තානි විනානිරූප්‍යන්තෙ.**

---

a. ඉදනීම්, දැන්; ගමිෂ්‍යසි, යන්නෙහිද? ගමිෂ්‍යසි-ලෘට් මධ්‍යමපුරුෂෛකක්‍රියා; [ත්වම්]-උක්තකර්තෘ; ඉදනීම්-කාලාර්ථෙ අව්‍යයම්.

b. (i) ආම්, එසේය; වෙලාභූත්, කාලයවිය; උපවිශ, හිඳුව; (ii) අහම්, මම; ගච්ඡාමි, යෙමි.

(i) අභූත්-ලුඞ් කර්තෘකාරකක්‍රියා; වෙලා-උක්තකර්තෘ; උපවිශ, 'උප'පූර්වඃ 'විශ'-උපවෙශෙ, තුදාදි අකර්මකඃ පරස්මෛපදී.

(ii) ගච්ඡාමි-ලට්ක්‍රියා; අහම්-උක්තකර්තෘ.

c. නමස්කාරඃ, නමස්කාරය; අස්තු, වේවා. අස්තු-ලොට්ක්‍රියා; නමස්කාරඃ-උක්තකර්තෘ.

d. මම අපි, මාගේද; නමස්කාරඃ, නමස්කාරය; අස්තු, වේවා. අස්තු-ලොට්ක්‍රියා; නමස්කාරඃ-උක්තකර්තෘ; මම-අනුක්තසම්බන්ධඃ; අපි-අව්‍යයම්.

e. අව්‍යයනිරූපණම්, අව්‍යයන්ගේ අර්ථප්‍රකාශය කියනු ලැබේ.

f. ලිඞ්ග, පුංස්ත්‍රී නපුංසක යන තුන්ලිඟුය; විභක්ති, ප්‍රථමාදි විභක්තිය; වචන, එකවචනාදි වචනය යන මෙයින්; ශූන්‍යානි, තොරවූවාහු; අව්‍යයානි, අව්‍යය නම් වෙත්. තානි, ඒ අව්‍යයෝ; ප්‍රතිපදෝක්තානි, ප්‍රාතිපදිකයෝය; ලාක්ෂණිකානිච ඉති, ලාක්ෂණිකයෝදයි; ද්වේධා, දෙවැදෑරුම් වෙත්. තත්‍ර, එහි; සූත්‍රකෘතා, සූත්‍රකර්තෘහු විසින්; ස්වරාදි, 'ස්වර්'ශබ්දය ආදිවූද; උරර්‍යාදි, උරී ආදිවූද; සාක්ෂාත් ප්‍රභෘත්‍යාදි, සාක්ෂාත් යනාදිවූද; රූපේණ,

a. අ, සම්බොධනෙ'ධික්ෂෙපෙ නිෂෙධෙච.

b. අහොස්, සම්බොධනෙ.

c. අඞ්ග, සම්බොධනෙ පුනරර්ථෙච.

d. අජස්‍රම්, සාතත්‍යෙ.

e. අඤ්ජසා, තත්ත්වශෛඝ්‍ර්‍යයොඃ.

f. අති, ප්‍රකර්ෂලඞ්ඝන පූජාසු.

g. අතීව, භෘශාර්ථෙ.

h. අථ, මඞ්ගලානන්තරාරම්භ ප්‍රශ්න කාර්ත්ස්න්‍යාධිකාර ප්‍රතිඥා සමුච්චයෙෂු.

i. අථකිම්, ස්වීකාරෙ.

---

රූපයෙන්; ස්වතඃ, ස්වරූපයෙන්; නිපාතිතානි, හෙළනලද්දහු; ප්‍රතිපදෛකතානි, ප්‍රාතිපදික නම් වෙත්; තෙෂු, ඔවුන් අතුරෙහි; ප්‍රසිද්ධානි, ප්‍රසිද්ධවූ; කානිචිත්, කිසියම් අව්‍යය කෙනෙක්; නිරූප්‍යන්තෙ, දක්වනුලැබෙත්.

a. අ, 'අ' ශබ්දය; සම්බොධනෙ, ආමන්ත්‍රණයෙහිද; අධික්ෂෙපෙ, නින්දායෙහිද; නිෂෙධෙච, ප්‍රතිෂෙධයෙහිද වැටේ.

b. අසොස්, 'අසොස්' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

c. අඞ්ග, 'අඞ්ග' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහිද; පුනරර්ථෙච, නැවත යන අර්ථයෙහිද වැටේ.

d. අජස්‍රම්, 'අජස්‍රම්' ශබ්දය; සාතත්‍යෙ, නිරන්තරාර්ථයෙහි වැටේ.

e. අඤ්ජසා, 'අඤ්ජසා' ශබ්දය; තත්ත්වශෛඝ්‍ර්‍යයොඃ, තත්ත්වය ශීඝ්‍රාර්ථය යන දෙක්හි වැටේ.

f. අති, 'අති' ශබ්දය; ප්‍රකර්ෂ, උත්කර්ෂය; ලඞ්ඝන, ඉක්මීමය; පූජාසු, පූජාය යන මෙහි වැටේ.

g. අතීව, 'අතීව' ශබ්දය; භෘශාර්ථෙ, අතිශයාර්ථයෙහි වැටේ.

h. අථ, 'අථ' ශබ්දය; මඞ්ගල, මඞ්ගලය; අනන්තර, ඉක්බිතිය; ආරම්භ, ආරම්භය; ප්‍රශ්න, ප්‍රශ්නය; කාර්ත්ස්න්‍ය, සාකල්‍යය; අධිකාර, අධිකාරය; ප්‍රතිඥ, ප්‍රතිඥය; සමුච්චයෙෂු, රැස්කිරීමය යන මෙහි වැටේ.

i. අථකිම්, 'අථකිම්' ශබ්දය; ස්වීකාරෙ, පිළිගැන්මෙහි වැටේ.

**a. අථො, අථශබ්දාර්ථෙ.**
**b. අද්ධා, තත්ත්වාවධාරණයොඃ, ස්ඵුටාතිශයයොරිත්‍යෙකෙ.**
**c. අද්‍යත්වෙ, ඉදානීමර්ථෙ.**
**d. අනු, පශ්චාත් සාදෘශ්‍යයොඃ.**
**e. අනිශම්, සාතත්‍යෙ.**
**f අන්තර්, මධ්‍යෙ.**
**g. අන්තරා, අන්තරෙණ [2], මධ්‍යෙ විනාර්ථෙච.**
**h. අපි, ගර්හාසමුච්චය ප්‍රශ්න ශඞ්කා සම්භාවනාසු.**
**i. අභිතස්, සමීපොභයතස්සාකල්‍යාර්ථෙෂු.**
**j. අභීක්ෂ්ණම්, අනාරතෙ පෞනඃපුන්‍යෙච.**
**k. අමා, සහාර්ථෙ නිකටෙච,**

---

a අථො, 'අථො' ශබ්දය; අථශබ්දාර්ථෙ, අථ ශබ්දයාගේ අර්ථයෙහි වැටේ.

b. අද්ධා, 'අද්ධා' ශබ්දය; තත්ත්වාවධාරණයොඃ, තත්ත්වය නියමය යන දෙක්හි වැටේ; එකෙ, ඇතැම් කෙනෙක්; ස්ඵුටාතිශයයොඃ, ව්‍යක්තය අතිශය යන දෙක්හි වැටේයයි කියත්.

c. අද්‍යත්වෙ,'අද්‍යත්වෙ'ශබ්දය; ඉදානීමර්ථෙ, දැන් යන අර්ථයෙහි වැටේ.

d. අනු,'අනු'ශබ්දය; පශ්චාත් සාදෘශ්‍යයොඃ, පසුවය සදෘශත්වය යන දෙක්හි වැටේ.

e. අනිශම්,'අනිශම්'ශබ්දය;සාතත්‍යෙ,නිරන්තරයෙහි වැටේ.

f. අන්තර්, 'අන්තර්' ශබ්දය; මධ්‍යෙ, මධ්‍යයෙහි වැටේ.

g. අන්තරා, අන්තරෙණ, [2] 'අන්තරා', 'අන්තරෙණ'යන ශබ්ද දෙක;මධ්‍යෙ, මධ්‍යයෙහිද;විනාර්ථෙච, විනා ශබ්දාර්ථයෙහිද වැටෙත්.

h. අපි, 'අපි'ශබ්දය; ගර්හා, ගැරහීමය; සමුච්චය, රැස්කිරීමය; ප්‍රශ්න, විචාරීමය; ශඞ්කා, සැකය; සම්භාවනාසු, සැලකීමය යන මෙහි වැටේ.

i. අභිතස්, 'අභිතස්' ශබ්දය; සමීප, සමීපය; උභයතඃ, දෙපසය; සාකල්‍ය, සියල්ලය යන; අර්ථෙෂු, අර්ථයන්හි වැටේ.

j. අභීක්ෂ්ණම්, 'අභීක්ෂ්ණම්' ශබ්දය; අනාරතෙ, නිරන්තරාර්ථයෙහිද; පෞනඃපුන්‍යෙච, නැවත නැවත යන අර්ථයෙහිද වැටේ.

k. අමා, 'අමා' ශබ්දය; සහාර්ථෙ, සමග යන අර්ථයෙහිද; නිකටෙච, සමීපයෙහිද වැටේ.

a. අයි, අනුනයෙ කොමලාමන්තණෙ ච.

b. අයෙ, සමරණෙ කොමලාමන්තණෙ ච.

c. අරෙ, නීචාමන්තණෙ.

d. අරෙරෙ, නීචසම්බොධනාදෙසු,

e. අජ්ජාචි, අපර කාලාදෙසු මජ්ඣෙ ච.

f. අලම්, භූසණ පරියත්ති සත්තිවාරණ නිසෙධෙසු.

g. අවස්සම්, නිච්ඡයෙ.

h. අසතම්, විනාසෙ.

i. අසති, සතතායාම්.

j. අසතු, අසූයොපගමෙ.

k. අස්මි, අහමත්ථෙ.

---

a. අයි, 'අයි' ශබ්දය; අනුනයෙ, නැළවීමෙහිද; කොමලාමන්ත්‍රණෙච, මොලොක් ආමන්ත්‍රණයෙහිද වැටේ.

b. අයෙ, 'අයෙ' ශබ්දය; සමරණෙ, සිහිකිරීමෙහිද; කොමලාමන්ත්‍රණෙච, මෘදු ආමන්ත්‍රණයෙහිද වැටේ.

c. අරෙ, 'අරෙ' ශබ්දය; නීචාමන්ත්‍රණෙ, නිචයන්හට ආමන්ත්‍රණයෙහි වැටේ.

d. අරෙරෙ, 'අරෙර' ශබ්දය; නීචසම්බොධනාදෙසු, නීචාමන්ත්‍රණාදියෙහි වැටේ.

e. අජීංචි, 'අජීංචි' ශබ්දය; අවරකාලාදෙසු, පශ්චිම-කාලාදී යෙහිද; මධ්‍යෙච, මධ්‍යයෙහිද වැටේ.

f. අලම්, 'අලම්' ශබ්දය; භූෂණ, සැරසීමය; පර්‍ය්‍යාප්ති, සම්පූර්ණත්වය; ශක්ති, ශක්තිය; වාරණ, වැලැක්වීමය; නිෂෙධෙෂු, ප්‍රතිෂෙධය යන මෙහි වැටේ.

g. අවශ්‍යම්, 'අවශ්‍යම්'ශබ්දය; නිශ්චයෙ, නිශ්[illegible] වැටේ.

h. අසතම්, 'අසතම්' ශබ්දය; විනාශෙ, නැසීමෙහි වැටේ.

i. අසති, 'අසතිශබ්දය; සතතායාම්, [illegible] වැටේ.

j. අසතු, 'අසතු' ශබ්දය; අසූයොපගමෙ, දෙ[illegible]ට පැමිණීමෙහි වැටේ.

k. අසම්, 'අසම්' ශබ්දය; අහමථෙ, මම යන අර්ථයෙහි වැටේ

a. අහ. පූජයාම්.
b. අහහ, අද්භූතෙ ඛෙදෙච.
c. අහෙ, සම්බොධනෙ.
d. අහො, ආශ්චය්‍යෙ.
e. අහාය, ශෛඝ්‍රෙ.
f. ආ, වාක්‍යසමරණයොඃ,
g. ආඞ්, ඊෂදර්ථෙ'භි ව්‍යාපනෙ සීමාර්ථෙච.
h. ආම්, අඞ්ගීකාරෙ.
i. ආඃ, කොපපීඩයොඃ.
j. ආරාත්, දූරසමීපයොඃ.
k. ආවිස්, ප්‍රකාශෙ.
l. ආශු, ශෛඝ්‍රෙ.
m. ආස, බහුවෙත්‍යර්ථෙ.

---

a. අහ, 'අහ' ශබ්දය; පූජයාම්, පූජයෙහි වැටේ.

b. අහහ, 'අහහ' ශබ්දය; අද්භූතෙ, ආශ්චය්‍යීයෙහිද; ඛෙදෙච, ඛෙදයෙහිද වැටේ.

c. අහෙ, 'අහෙ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

d. අහො, 'අහො' ශබ්දය; ආශ්චය්‍යෙ, ආශ්චය්‍යීයෙහි වැටේ.

e. අහාය, 'අහාය' ශබ්දය; ශෛඝ්‍ය, ශීඝ්‍රාර්ථයෙහි වැටේ.

f. ආ, 'ආ' ශබ්දය; වාක්‍යසමරණයොඃ, වාක්‍යසමරණ දෙක්හි වැටේ.

g. ආඞ්,'ආඞ්' ශබ්දය;ඊෂදර්ථෙ, අල්පාර්ථයෙහිද; අභිව්‍යාපනෙ, පැතිරීමෙහිද; සීමාර්ථෙච, සීමාර්ථයෙහිද වැටේ.

h. ආම්, 'ආම්' ශබ්දය; අඞ්ගීකාරෙ, පිළිගැන්මෙහි වැටේ.

i. ආඃ, 'ආඃ' ශබ්දය; කොපපීඩයොඃ, කොප පීඩා දෙක්හි වැටේ.

j. ආරාත්, 'ආරාත්' ශබ්දය; දූරසමීපයොඃ, දූරය සමීපය යන දෙක්හි වැටේ.

k. ආවිස්, 'ආවිස්' ශබ්දය; ප්‍රකාශෙ, ප්‍රකාශයෙහි වැටේ.

l. ආශු, 'ආශු' ශබ්දය; ශෛඝ්‍ය, ශීඝ්‍රත්වයෙහි වැටේ.

m. ආස, 'ආස' ශබ්දය; බහුවද්භූතිඅර්ථෙ, වූයේය යන අර්ථයෙහි වැටේ.

a. ආහ, උවාචෙත්‍යර්ථෙ.
b. ආහො, ආහොස්විත් [2], විකල්පෙ.
c. ඉ, සම්බොධන ජුගුප්සා විස්මයෙෂු.
d. ඉති, හෙතු ප්‍රකරණ ප්‍රකාරාදි සමාප්තිෂු.
e. ඉතිහ, උපදෙශ පරම්පරායාම්.
f. ඉද්ධා, ප්‍රාකාශ්‍යෙ.
g. ඉව, සාදෘශ්‍යෙ.
h. ඊ, සම්බොධනෙ භර්ත්සනෙච.
i. ඊෂත්, අල්පෙ.
j. උ, සම්බොධනෙ දුඃඛවිතර්කයොශ්ච.
k. උච්චෛස්, මහති.

---

a. ආහ, 'ආහ'ශබ්දය; උවාචඉතිඅර්ථෙ, කීයේය යන අර්ථයෙහි වැටේ.

b. ආහො, ආහොස්විත්[2], 'ආහො', 'ආහොස්විත්'යන ශබ්ද දෙක; විකල්පෙ, විකල්පයෙහි වැටේ.

c. ඉ, 'ඉ' ශබ්දය; සම්බොධන, ආමන්ත්‍රණය; ජුගුප්සා, පිළිකුලය; විස්මයෙෂු, විස්මය යන මෙහි වැටේ.

d. ඉති, 'ඉති' ශබ්දය; -හෙතු, හෙතුය; ප්‍රකරණ, ප්‍රකරණය; ප්‍රකාර, ප්‍රකාරය; ආදි, ආරම්භය; සමාප්තිෂු, සමාප්තිය යන මෙහි වැටේ.

e. ඉතිහ, 'ඉතිහ' ශබ්දය; උපදෙශපරම්පරායාම්, උපදෙශ පරම්පරයෙහි වැටේ

f. ඉද්ධා, 'ඉද්ධා' ශබ්දය; ප්‍රාකාශ්‍යෙ, ප්‍රකාශ බැව්හි වැටේ.

g. ඉව, 'ඉව' ශබ්දය; සාදෘශ්‍යෙ, සමාන බැව්හි වැටේ.

h. ඊ, 'ඊ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහිද; භර්ත්සනෙච, තැතිගැන්විමෙහිද වැටේ.

i. ඊෂත්, 'ඊෂත්' ශබ්දය; අල්පෙ, ස්වල්පයෙහි වැටේ.

j. උ, 'උ' ශබ්දය; සම්බොධනේ, සම්බොධනයෙහිද; දුඃඛ විතර්කයොශ්ච, දුඃඛය විතර්කය යන මෙහි වැටේ.

k. උච්චෛස්, 'උච්චෛස්' ශබ්දය; මහති, මහත් දෙයෙහි වැටේ.

a. උත, උතාහො [2], විකල්පෙ ප්‍රශ්නවිචාරෙච.
b. උපාංශු, අප්‍රකාශොච්චාරණරහස්‍යයොඃ.
c. උරරී, උරී [2], අඞ්ගීකාරෙ.
d. උෂා, ප්‍රභාතෙ.
e. ඌ, සම්බොධනෙ දුඃඛවිතර්කයොශ්ච.
f. ඌරරී, ඌරී [2], අංගීකාරෙ.
g. ඍතෙ, වර්ජිතෙ.
h. එ, සම්බොධනෙ.
i. එව, අවධාරණෙ නවක්ලෘප්ත්‍යෞපම්‍යෙච.
j. එවම්, උක්තපරාමර්ශෙ.
k. ඓ, සම්බොධනෙ ආශ්චර්‍ය්‍යෙච.

---

a. උත, උතාහො, [2]'උත','උතාහො'යන දෙදෙන; විකල්පෙ, විකල්පයෙහිද; ප්‍රශ්නෙ, ප්‍රශ්නයෙහිද; විචාරෙච, විමසීමෙහිද වැටේ.

b. උපාංශු, 'උපාංශු' ශබ්දය; අප්‍රකාශොච්චාරණ, අප්‍රකාශ කථනය; රහස්‍යයොඃ, රහස්‍ය යන දෙක්හි වැටේ.

c. උරරී උරී,[2]'උරරී','උරී'යන දෙක; අඞ්ගීකාරෙ, පිළිගැනීමෙහි වැටේ.

d. උෂා, 'උෂා' ශබ්දය; ප්‍රභාතෙ, අලුයම්හි වැටේ

e. ඌ, 'ඌ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහිද; දුඃඛ විතර්කයොශ්ච, දුඃඛය විතර්කය යන දෙක්හි වැටේ.

f. ඌරරී, ඌරී [2]'උරරී','ඌරී'යන දෙක; අඞ්ගීකාරෙ, පිළි ගැනීමෙහි වැටේ.

g. ඍතෙ, 'ඍතෙ'ශබ්දය; වර්ජිතෙ, හැරීමෙහි වැටේ.

h. එ, 'එ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

i. එව, 'එව' ශබ්දය; අවධාරණෙ, නිශ්චයෙහිද; අනවක්ලෘප්ත්‍යෞපම්‍යෙච, පරිභවයෙහිද වැටේ.

j. එවම්, 'එවම්' ශබ්දය; උක්තපරාමර්ශෙ, කියනලද්දහුගේ පරාමර්ශණයෙහි වැටේ.

k. ඓ, 'ඓ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහිද; ආශ්චර්‍ය්‍යෙච, ආශ්චර්‍ය්‍යයෙහිද වැටේ.

a. ඔ, සම්බොධනෙ.
b. ඔම්, අඞ්ගීකාරෙ බ්‍රහ්මණීච.
c. ඖ, සම්බොධනෙ අඞ්ගීකාරෙච.
d. කච්චිත්, ඉෂ්ට ප්‍රශ්නෙ.
e. කම්, වාරි මූර්ධ නින්දා සුඛෙෂු.
f. කාමම්, ස්වාච්ඡන්ද්‍යෙ.
g. කිඤ්ච, ආරම්භ සමුච්චය සාකල්‍ය සම්භාවනාසු.
h. කිඤ්චන, අසාකල්‍යෙ අල්පෙච,
i. කිඤ්චිත්, අල්පෙ.
j. කිනනු, සංශයෙ.
k. කිම්, පෘච්ඡා ජුගුප්සා නිෂෙධ විතර්කෙෂු.

---

a. ඔ, 'ඔ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

b. ඔම්, 'ඔම්' ශබ්දය; අඞ්ගීකාරෙ, පිළිගැන්මෙහිද; බ්‍රහ්මණීච, පරමාත්මයා කෙරෙහිද වැටේ.

c. ඖ, 'ඖ' ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහිද; අඞ්ගීකාරෙච, අඞ්ගීකාරයෙහිද වැටේ.

d. කච්චිත්, 'කච්චිත්' ශබ්දය; ඉෂ්ටප්‍රශ්නෙ, කැමති දෑ විචාරීමෙහි වැටේ.

e. කම්, 'කම්' ශබ්දය; වාරි, ජලය; මූර්ධ, හිසය; නින්දා, නින්දාය; සුඛෙෂු, සැපය යන මෙහි වැටේ.

f. කාමම්, 'කාමම්' ශබ්දය; ස්වාච්ඡන්ද්‍යෙ, තමා කැමැත්තෙහි වැටේ.

g. කිඤ්ච, 'කිඤ්ච' ශබ්දය; ආරම්භ, ආරම්භය; සමුච්චය, රැස්කිරීමය; සාකල්‍ය, මුලුල්ලය; සම්භාවනාසු, සම්භාවනාය යන මෙහි වැටේ.

h. කිඤ්චන, 'කිඤ්චන' ශබ්දය; අසාකල්‍යෙ, අසාකල්‍යයෙහි හෙවත් සකලත්වය නැත්තෙහිද; අල්පෙච, ස්වල්පයෙහිද වැටේ.

i. කිඤ්චිත්, 'කිඤ්චිත්' ශබ්දය; අල්පෙ, ස්වල්පයෙහි වැටේ.

j. කිනනු, 'කිනනු' ශබ්දය; සංශයෙ, සැකයෙහි වැටේ.

k. කිම්, 'කිම්' ශබ්දය; පෘච්ඡා, ඇසීමය; ජුගුප්සා, නින්දාවය; නිෂෙධ, ප්‍රතිෂෙධය; විතර්කේෂු, විතර්කය යන මෙහි වැටේ.

**a. කිමු, විකල්පෙ.**

**b. කිමුත, අතිසය විකල්පයොඃ.**

**c. කිල, වාත්තාසම්භාව්‍යෙසොරලිකෙව.**

**d. කු. පාප කුච්ඡිතෙසදප්පෙ නිවාරණෙසු.**

**e. වලු, නිසෙධවාක්‍යාලඞ්කාර ජිඥාසානුනය නිශ්චයෙසු.**

**f. ච. සමුච්චයාන්වාචයෙ තරෙතර යොග සමාහාර පාද පූරණෙසු.**

**g. චටු, චාටු [2], ප්‍රියවාක්‍යෙ.**

**h. චිරම්, චිරරාත්‍රාය, චිරස්‍ය, චිරාත්, චිරාය, චිරෙණ [6], බහුකාලෙ.**

**i. චෙත්, යද්‍යර්ථෙ.**

---

a. කිමු, 'කිම්' ශබ්දය; විකල්පෙ, විකල්පයෙහි වැටේ.

b. කිමුත, 'කිමුත' ශබ්දය; අතිශය විකල්පයොඃ, අතිශය විකල්පය යන දෙක්හි වැටේ.

c. කිල, 'කිල' ශබ්දය; වාත්‍රා, ප්‍රවෘත්තිය; සම්භාව්‍යයොඃ, සැලකියයුත්තේය යන දෙක්හිද; අලිකෙව, මුසායෙහිද වැටේ.

d. කු, 'කු' ශබ්දය; පාප, පාපය; කුත්‍ස, නින්දාය; ඊෂදර්ථ, අල්පාර්ථය; නිවාරණෙසු, වැළැක්මය යන මෙහි වැටේ.

e. බලු, 'බලු' ශබ්දය; නිශෙධ, ප්‍රතිශෙධය; වාක්‍යාලඞ්කාර, වාක්‍යාලඞ්කාරය; ජිඥාසා, දැනගනු කැමැත්තය; අනුනය, නැලවීමය; නිශ්චයෙෂු, නිශ්චය යන මෙහි වැටේ.

f. ච, 'ච' ශබ්දය; සමුච්චය, රැස්කිරීමය; අන්වාචය, ක්‍රියාවන්ගේ රැස්කිරීමය; ඉතරෙතරයොග, ඔවුනොවුන් වෙනවෙනම; යෙදීමය; සමාහාර, එක්කොට යෙදීමය; පාදපූරණෙෂු, ශ්ලොකපාද පූරණය යන මෙහි වැටේ.

g. චටු, චාටු[2]'චටු'ය, 'චාටුය'ය යන ශබ්දයෝ; ප්‍රියවාක්‍ය ප්‍රියතෙපුලෙහි වැටෙත්.

h චිරම්, චිරරාත්‍රාය, චිරස්‍ය, චිරාත්, චිරාය, චිරෙණ, (6) 'චිරම්'ය, 'චිරරාත්‍රාය'ය, 'චිරස්‍ය'ය, 'චිරාත්'ය, 'චිරෙණ'ය, යන මේ ශබ්ද සය; බහුකාලෙ, බොහෝකල් යන අර්ථයෙහි වැටේ.

i. චෙත්, 'චෙත්' ශබ්දය; යද්‍යර්ථෙ, 'යදි' ශබ්දයාගේ අර්ථයෙහි හෙවත් ඉදින් යන අර්ථයෙහි වැටේ.

a. ජාතු, කදාචිදර්ථෙ.
b. ජෝෂම්, සුඛෙ මෞනෙව.
c. ජ්‍යොක්, කාලභූයසෙව ප්‍රශ්නෙ ශීඝ්‍රාර්ථෙ සම්ප්‍රත්‍යර්ථෙව.
d. ඛචිති, ශෛඝ්‍ර්‍ය.
e. තත්, හෙතෞ.
f. තරසා, ශෛඝ්‍ර්‍ය.
g. තථාහි, නිදර්ශනෙ.
h. තාවත්, සාකල්‍යාවධි මානාවධාරණෙෂු.
i. තිරස්, අන්තර්ධෞ තිර්‍ය්‍යගර්ථෙ පරිභවෙව.
j. තිර්‍ය්‍යක්, වක්‍රෙ නිරුඪෙව.
k. තු, භෙදාව ධාරණෙ පාදපූරණාදිෂු.

---

a. ජාතු, 'ජාතු' ශබ්දය; කදාචිත්අර්ථෙ, 'කදාචිත්' ශබ්දයාගේ අර්ථයෙහි හෙවත් කිසිකලෙක යන අර්ථයෙහි වැටේ.

b. ජෝෂම්, 'ජෝෂම්' ශබ්දය; සුඛෙ, සැපයෙහිද; මෞනෙව, තුෂ්ණීම්භාවයෙහිද වැටේ.

c. ජ්‍යොක්, 'ජ්‍යොක්' ශබ්දය; කාලභූයසෙව, බොහෝ කාලෙක්හිද; ප්‍රශ්නෙ, ප්‍රශ්නයෙහිද; ශීඝ්‍රාර්ථෙ, ශීඝ්‍රයෙහිද; සම්ප්‍රත්‍යර්ථෙව, වර්තමාන යන අර්ථයෙහිද වැටේ.

d. ඛචිති, 'ඛචිති' ශබ්දය; ශෛඝ්‍ර්‍ය, ශීඝ්‍රයෙහි වැටේ.

e. තත්, 'තත්' ශබ්දය; හෙතෞ, හෙතුයෙහි හෙවත් එහෙයින් යන අර්ථයෙහි වැටේ.

f. තරසා, 'තරසා' ශබ්දය; ශෛඝ්‍ර්‍ය, ශීඝ්‍රාර්ථයෙහි වැටේ.

g. තථාහි, 'තථාහි' ශබ්දය; නිදර්ශනෙ, උදාහරණයෙහි වැටේ.

h. තාවත්, 'තාවත්' ශබ්දය; සාකල්‍ය, මුලුල්ලය; අවධි, සීමාය; මාන, ප්‍රමාණය; අවධාරණෙෂු, නිශ්චය යන මෙහි වැටේ.

i තිරස්, 'තිරස්' ශබ්ද ; අන්තර්ධෞ, අතුරුදහන්වීමෙහිද; තිර්‍ය්‍යක්අර්ථෙ, සරස යන අර්ථයෙහිද; පරිභවෙව, පරිභවයෙහිද වැටේ.

j. තිර්‍ය්‍යක්, 'තිර්‍ය්‍යක්' ශබ්දය; වක්‍රෙ, වක්‍රයෙහිද; නිරුඪෙව, නිරුඪවීමෙහිද වැටේ.

k. තු, 'තු' ශබ්දය; භෙද, වෙනසය; අවධාරණ, නිශ්චය; පාදපූරණාදිෂු, පාදපූරණය යනාදියෙහි වැටේ.

a. තූෂ්ණීම්, මෞනෙ.

b. දිවා, දිවසෙ.

c. දිෂ්ට්‍යා, ආනන්දෙ.

d. දුෂ්ඨු, නින්ද්‍යායාම්.

e. දොෂා, රාත්‍රෞ.

f. ද්‍රාක්, ශෛඝ්‍ර්‍යෙ.

g. ධික්, නින්ද්‍යභර්ත්සනයොඃ.

h. න, අභාවෙ.

i. නක්තම්, රාත්‍රෞ.

j. නඤ්, නිෂෙධෙෂදර්ථතදන්‍ය තද්විරුද්ධ තදභාව තත් සාදෘශ්‍ය ප්‍රාශස්ත්‍යෙෂු.

k. නනු, ප්‍රශ්නාවධාරණානුඥානුනයාමන්ත්‍රණෙෂු වාක්‍යාරම්භාදෞච.

---

a. තූෂ්ණීම්, 'තූෂ්ණීම්'ශබ්දය; මෞනෙ, නොබිනීමෙහි වැටේ

b. දිවා, 'දිවා' ශබ්දය; දිවසෙ, දවල්හි වැටේ.

c. දිෂ්ට්‍යා, 'දිෂ්ට්‍යා'ශබ්දය; ආනන්දෙ, සතුටෙහි වැටේ.

d. දුෂ්ඨු, 'දුෂ්ඨු' ශබ්දය; නින්ද්‍යායාම්, නින්ද්‍යයෙහි වැටේ.

e. දොෂා, 'දොෂා' ශබ්දය; රාත්‍රෞ, රාත්‍රියෙහි වැටේ.

f. ද්‍රාක්, 'ද්‍රාක්' ශබ්දය; ශෛඝ්‍ර්‍යෙ, ශීඝ්‍රාපියෙහි වැටේ.

g. ධික්, 'ධික්' ශබ්දය; නින්ද්‍යභර්ත්සනයොඃ, නින්ද තැතිගැනුම් දෙක්හි වැටේ.

h. න, 'න' ශබ්දය; අභාවෙ, නොවීමෙහි වැටේ.

i. නක්තම්, 'නක්තම්' ශබ්දය; රාත්‍රෞ, රාත්‍රියෙහි වැටේ.

j. නඤ්, 'නඤ්' ශබ්දය; නිෂෙධෙ, ප්‍රතිෂෙධය; ඊෂදර්ථ, අල්පාර්ථය; තදන්‍ය, එයින් අන්‍යය; තද්විරුද්ධ, එයට විරුද්ධය; තත්අභාව, එය නැතිබවය; තද්සාදෘශ්‍ය, ඒ හා සමාන බවය; අප්‍රාශස්ත්‍යෙෂු, අප්‍රශස්තබවය යන මෙහි වැටේ.

k. නනු, 'නනු'ශබ්දය; ප්‍රශ්න, විචාරීමය; අවධාරණ, නිශ්චය; අනුඥා, අනුදැන්මය; අනුනය, නැලවීමය; ආමන්ත්‍රණෙෂු, ආමන්ත්‍රණය යන මෙහිද; වාක්‍යාරම්භාදෞච, වාක්‍යාරම්භාදියෙහිද වැටේ.

a. නමස්, ප්‍රණාමෙ.

b. නහි, අභාවෙ.

c. නානා, අනෙකවිනාර්ථයොඃ.

d. නාම, ප්‍රාකාශ්‍ය සම්භාව්‍ය ක්‍රොධොපගම කුත්සනෙෂු.

e. නාසති, අවිද්‍යමානතායාම්.

f. නිකෂා, සාමීප්‍යෙ.

g. නිචෛකොස්, නිචෛවෙස්[2], නීචෙ අල්පෙ ක්ෂුද්‍රෙච.

h. නු, ප්‍රශ්නානුනයාතීත විකල්ප විතර්කෙෂු.

i. නූනම්, නිශ්චයෙ විතර්කෙච.

j. නො, අභාවෙ.

---

a. නමස්, 'නමස්' ශබ්දය; ප්‍රණාමෙ, වැඳීමෙහි වැටේ.

b. නහි, 'නහි' ශබ්දය; අභාවෙ, අභාවයෙහි වැටේ.

c. නානා, 'නානා' ශබ්දය; අනෙක, නොයෙක් යන අර්ථය; විනාර්ථයොඃ, විනාශබ්දයාගේ අර්ථය යන දෙතන්හි වැටේ.

d. නාම, 'නාම' ශබ්දය; ප්‍රාකාශ්‍ය, ප්‍රකාශබවය; සම්භාව්‍ය, සැලකියයුතු බවය; ක්‍රොධ, කිපීමය; උපගම, කොපයට එළඹීමය; කුත්සනෙෂු, නින්දය යන මෙහි වැටේ.

e. නාසති, 'නාසති' ශබ්දය; අවිද්‍යමානතායාම්, අවිද්‍යමාන බැව්හි වැටේ.

f. නිකෂා, 'නිකෂා' ශබ්දය; සාමීප්‍ය, සමීපාපීයෙහි වැටේ.

g. නීචෛකොස්, නීචෛවෙස්[2], 'නීචෛකොස්', 'නීචෛවෙස්'යන දෙක; නීචෙ, නීචාර්ථයෙහි හෙවත් පහත්වූවහු කෙරෙහිද; අල්පෙ, ස්වල්පයා කෙරෙහිද; ක්ෂුද්‍රෙච, ක්ෂුද්‍රයා කෙරෙහිද වැටේ.

h. නු, 'නු' ශබ්දය; ප්‍රශ්න, විචාරීමය; අනුනය, නැලවීමය; අතීත, අතිතාර්ථය; විකල්ප, විකල්පය; විතර්කෙෂු, විතර්කය යන මෙහි වැටේ.

i. නූනම්, 'නූනම්' ශබ්දය; නිශ්චයෙ, නිශ්චයෙහිද; විතර්කෙච, විතර්කයෙහිද වැටේ.

j. නො, 'නො' ශබ්දය; අභාවෙ, නැතිබැව්හි වැටේ.

a. පරම්, කින්ත්වර්ථෙ.
. පාට්, සම්බොධනෙ.
c. පුනඃ, පුනර්[2], පෞනඃ පුන්‍යෙ
. පුනර්, අප්‍රථමෙ, විශෙෂෙච.
e. පුරා, අවිරතෙ චිරාතීතෙ භවිෂ්‍යදාසන්නෙච.
f. පෘථක්, භින්නෙ වර්ජනෙච.
g. ප්‍යාට්, සම්බොධනෙ.
h. ප්‍රකාමම්, අතිශයෙ.
i. ප්‍රගෙ, ප්‍රත්‍යූෂෙ.
j. ප්‍රසහ්‍ය, බලාත්කාරෙ.
k. ප්‍රාතර්, ප්‍රත්‍යූෂෙ.

---

a. පරම්, ‘පරම්’ ශබ්දය; කින්ත්වර්ථෙ, කින්තුශබ්දයාගේ අර්ථ යෙහි වැටේ.

b. පාට්, ‘පාට්’ ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

c. පුනඃ, පුනර්[2], ‘පුනඃ’, ‘පුනර්’ යන දෙක; පෞනඃ පුන්‍යෙ, නැවත නැවත යන අර්ථයෙහි වැටේ.

d පුනර්, ‘පුනර්’ ශබ්දය; අප්‍රථමෙ, පළමුනුවූ යන අර්ථ යෙහිද; විශෙෂෙච, විශෙෂයෙහිද වැටේ.

e. පුරා, ‘පුරා’ ශබ්දය; අවිරතෙ, නිරන්තරයෙහිද; චිරාතීතෙ, බොහෝ අතීතයෙහිද; භවිෂ්‍යදාසන්නෙච, සමීපවූ අනාගත යෙහිද වැටේ.

f. පෘථක්, ‘පෘථක්’ ශබ්දය; භින්නෙ, වෙන්වූ යන අර්ථයෙහිද; වර්ජනෙච, තොරකිරිමය යන අර්ථයෙහිද වැටේ.

g. ප්‍යාට්, ‘ප්‍යාට්’ ශබ්දය; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

h. ප්‍රකාමම්, ‘ප්‍රකාමම්’ ශබ්දය; අතිශයෙ, අතිශයාර්ථයෙහි වැටේ.

i. ප්‍රගෙ, ‘ප්‍රගෙ’ ශබ්දය; ප්‍රත්‍යූෂෙ, උදෑසනාර්ථයෙහි වැටේ.

j. ප්‍රසහ්‍ය, ‘ප්‍රසහ්‍ය’ ශබ්දය; බලාත්කාරෙ, බලාත්කාරයෙහි වැටේ.

k. ප්‍රාතර්, ‘ප්‍රාතර්’ ශබ්දය; ප්‍රත්‍යූෂෙ, අලුයමෙහි වැටේ.

. ප්‍රාදුස්, ප්‍රාකාශ්‍යෙ.
b. ප්‍රාධ්වම්, ආනුකූල්‍යෙ බන්ධනෙ නම්‍රතායාඤ්ච.
c. ප්‍රායස්, බාහුල්‍යෙ.
d. ප්‍රාහෙණ, පූර්වාහෙණ.
. ප්‍රෙත්‍ය, භවාන්තරෙ.
f. එව්, යොගෙ මන්ත්‍රාංශ විශෙෂෙච.
g. භගොස්, සම්බොධනෙ.
h. භූයස්, පුනරර්ථෙ ආධික්‍යෙච.
i. හො, හොස්[2], සම්බොධනෙ,
j. මඩ්ක්‍ෂු, ශෛඝ්‍රෙය.
k. මනාක්, අල්පෙ.
l. මන්‍යෙ, තර්කෙ විචාරණෙච.

---

a. ප්‍රාදුස්, 'ප්‍රාදුස්' ශබ්දය; ප්‍රාකාශ්‍යෙ, ප්‍රකාශබැව්හි වැටේ.

b. ප්‍රාධ්වම්, 'ප්‍රාධ්වම්' ශබ්දය; ආනුකූල්‍යෙ, අනුකූල බැව්හිද; බන්ධනෙ, බන්ධනයෙහිද; නම්‍රතායාඤ්ච, අවනත බැව්හිද වැටේ.

c. ප්‍රායස්, 'ප්‍රායස්' ශබ්දය; බාහුල්‍යෙ, බහුලත්වයෙහි වැටේ.

d. ප්‍රාහෙණ, 'ප්‍රාහෙණ' ශබ්දය; පූර්වාහෙණ, පෙරවරුයෙහි වැටේ.

. ප්‍රෙත්‍ය, 'ප්‍රෙත්‍ය' ශබ්දය; භවාන්තරෙ, අන්‍යභවයෙහි වැටේ.

f. එව්, 'එව්' ශබ්දය; යොගෙ, යොගයෙහිද; මන්ත්‍රාංශ විශෙෂෙච, මන්ත්‍රයන්ගේ කොටස් වෙසෙසෙක්හිද වැටේ.

g. භගොස්, 'භගොස්'ශබ්දය; සම්බොධනෙ, ආමන්ත්‍රණයෙහි වැටේ.

h. භූයස්, 'භූයස්'ශබ්දය; පුනඃඅර්ථෙ, නැවත යන අර්ථයෙහිද; ආධික්‍යෙච, අධිකබැව්හිද වැටේ.

i. හො, හොස්[2], 'හො', 'හොස්' යන දෙක; සම්බොධනෙ, සම්බොධනයෙහි වැටේ.

j. මඩ්ක්‍ෂු, 'මඩ්ක්‍ෂු' ශබ්දය; ශෛඝ්‍රෙය, ශීඝ්‍රත්වයෙහි වැටේ.

k. මනාක්, 'මනාක්' ශබ්දය; අල්පෙ, ස්වල්පයෙහි වැටේ.

l. මන්‍යෙ, 'මන්‍යෙ'ශබ්දය; තර්කෙ, තර්කයෙහිද; විචාරණෙච, විමසීමෙහිද වැටේ.

**a. මා, මාඞ්[2], නිෂෙධාශඞ්කයොඃ.**
**b. මාස්ම, වාරණෙ.**
**c. මිථස්, මිථො[2], අන්‍යොන්‍ය රහස්‍යයොඃ.**
**d. මිථ්‍යා, විතථෙ.**
**e. මුදි, ශුක්ලපක්ෂෙ.**
**f. මුධා, වෘථෙ.**
**g. මුහුස්, පුනරර්ථෙ.**
**h. මෘෂා, විතථෙ.**
**i. යත්, හෙතෞ.**
**j. යථාතථම්, යාථාර්ථ්‍යෙ.**
**k. යදි, පක්ෂාන්තරෙ.**
**l. යාවත්, සාකල්‍යාවධි මානාවධාරණෙෂු.**

---

a. මා, මාඞ්[2], 'මා', 'මාඞ්'යන දෙක; නිෂෙධාශඞ්කයොඃ, වැලැක්මය සැකය යන දෙඅර්ථයෙහි වැටේ.

d. මාස්ම, 'මාස්ම' ශබ්දය; වාරණෙ, වැලැක්වීමෙහි වැටේ.

c. මිථස්, මිථො[2], 'මිථස්', 'මිථො'යන දෙක; අන්‍යොන්‍ය, ඔවුනොවුන් යන අර්ථයෙහිද; රහස්‍යයොඃ, රහස්‌ය යන අර්ථ, යෙහිද වැටේ.

d. මිථ්‍යා, 'මිථ්‍යා' ශබ්දය; විතථෙ, අසත්‍යයෙහි වැටේ.

e. මුදි, 'මුදි' ශබ්දය; ශුක්ලපක්ෂෙ, පෙරපසෙහි වැටේ.

f. මුධා, 'මුධා' ශබ්දය; ව්‍යථෙ, නිරයෙහි වැටේ.

g. මුහුස්, 'මුහුස්' ශබ්දය; පුනඃඅර්ථෙ, නැවත යන අර්ථයෙහි වැටේ.

h. මෘෂා, 'මෘෂා' ශබ්දය; විතථෙ, අසත්‍යයෙහි වැටේ.

i. යත්, 'යත්' ශබ්දය; හෙතෞ, හෙතුයෙහි වැටේ.

j. යථාතථම්, 'යථාතථම්' ශබ්දය; යාථාර්ථ්‍ය, යථා ශබ්දයාගේ අර්ථයෙහි වැටේ.

k. යදි, 'යදි'ශබ්දය;පක්ෂාන්තරෙ, පක්ෂාන්තරයෙහි වැටේ.

l. යාවත්, 'යාවත්' ශබ්දය; සාකල්‍ය, සාකල්‍යාර්ථය; අවධි, සීමාය; මාන, මානය; අවධාරණෙෂු, නිශ්චය යන අර්ථයෙහි වැටේ.

a. යුගපද්, එකකාලෙ.
b. රහස්, නිර්ජනෙ.
c. රහසි, එකාන්තෙ.
d. රාත්‍රෞ, නිශි.
e. රෙ, හීනසම්බොධනෙ.
f. වදි, කෘෂ්ණපක්ෂෙ.
g. වත, ඛෙදානුකම්පා සන්තොෂවිස්මයා මන්ත්‍රණෙෂු.
h. වරම්, ඊෂදධිකෙ.
i. වෂට්, වෞෂට්[2], හවිර්දානෙ.
j. වහිස්, බාහ්‍යෙ.
k. වා, විකල්පසාදෘශ්‍යාවධාරණ සමුච්චය විතර්ක පාදපූරණෙෂු.

---

a. යුගපද්, 'යුගපද්' ශබ්දය; එකකාලෙ, එකවිට යන අර්ථයෙහි වැටේ.

b. රහස්, 'රහස්' ශබ්දය; නිර්ජනෙ, ජනශූන්‍ය අර්ථයෙහි වැටේ.

c. රහසි, 'රහසි' ශබ්දය; එකාන්තෙ, එකාන්තයෙහි වැටේ.

d. රාත්‍රෞ, 'රාත්‍රෞ' ශබ්දය; නිශි, රාත්‍රියෙහි වැටේ.

e. රෙ, 'රෙ' ශබ්දය; හීනසම්බොධනෙ, හීනයන්ට ආමන්ත්‍රණයෙහි වැටේ.

f. වදි, 'වදි' ශබ්දය; කෘෂ්ණපක්ෂෙ, කරුවල පක්ෂයෙහි වැටේ.

g. වත, 'වත' ශබ්දය; ඛෙද, ඛෙදය; අනුකම්පා, අනුකම්පාය; සන්තොෂ, සන්තොෂය; විස්මය, ආශ්චර්යය; ආමන්ත්‍රණෙෂු, ආමන්ත්‍රණය යන මෙතෙක් අර්ථයන්හි වැටේ.

h. වරම්, 'වරම්' ශබ්දය; ඊෂදධිකෙ, මඳක් අධිමත දෙයෙහි වැටේ.

i. වෂට්, වෞෂට්[2], 'වෂට්', 'වෞෂට්' යන දෙක; හවිර්දානෙ, යාගද්‍රව්‍යපිදීමෙහි වැටේ.

j. වහිස්, 'වහිස්' ශබ්දය; බාහ්‍යෙ, පිටත්හි වැටේ.

k. වා, 'වා' ශබ්දය; විකල්ප, විකල්පය; සාදෘශ්‍ය, සමානත්වය; අවධාරණ, නිශ්චය; සමුච්චය, රැස්කිරීමය; විතර්ක, විතර්කය; පාදපූරණෙෂු, ශ්ලොකපාදයන් පිරීමය යන මෙතෙක් අර්ථයන්හි වැටේ.

**a. විනා, වර්ජනෙ, අභාවෙච.**
**b. විශ්වච්, සර්වත ඉත්‍යර්ථෙ.**
**c. වෛ, පාදපූරණානුනය සම්බොධනෙෂු.**
**d. ශනෛස්, ක්‍රියාමාන්ද්‍යෙ.**
**e. ශශ්වත්, පෞනඃ පුන්‍යෙ නිත්‍යෙ සහාර්ථෙච.**
**f. ශම්, සුඛෙ.**
**g. ශ්‍රත්, ශ්‍රද්ධායාම්.**
**h. ශ්වස්, අනාගතෙ'හනි.**
**i. සංවත්, වර්ෂෙ.**
**j. සත්‍යම්, ප්‍රශ්න ප්‍රතිෂෙධ සත්‍යෙෂු.**
**k. සත්‍රා, සහාර්ථෙ.**

---

a. විනා, 'විනා' ශබ්දය; වර්ජනෙ, හැරීමෙහිද; අභාවෙච, අභාවයෙහිද වැටේ.

b. විශ්වච්, 'විශ්වච්' ශබ්දය; සර්වතඃ ඉති අර්ථෙ, හාත්පසින් යන අර්ථයෙහි වැටේ.

c. වෛ, 'වෛ' ශබ්දය; පාදපූරණ, පාදපූරණය; අනුනය; නැළවීමය; සම්බොධනෙෂු, සම්බොධනය යන මෙහි වැටේ.

d. ශනෛස්, 'ශනෛස්' ශබ්දය; ක්‍රියාමාන්ද්‍ය, ක්‍රියාවන්ගේ මඳබැව්හි වැටේ.

e. ශශ්වත්, 'ශශ්වත්' ශබ්දය; පෞනඃ පුන්‍ය, නැවත නැවත යන අර්ථයෙහිද; නිත්‍යෙ, නිත්‍යයෙහිද; සහාර්ථෙච, සහාර්ථයෙහිද වැටේ.

f. ශම්, 'ශම්' ශබ්දය; සුඛෙ, සැපයෙහි වැටේ.

g. ශ්‍රත්, 'ශ්‍රත්' ශබ්දය; ශ්‍රද්ධායාම්, ශ්‍රද්ධායෙහි වැටේ.

h. ශ්වස්, 'ශ්වස්' ශබ්දය; අනාගතෙ අහනි, අනාගතදිනයෙහි වැටේ.

i. සංවත්, 'සංවත්' ශබ්දය; වර්ෂෙ, වර්ෂයෙහි වැටේ.

j. සත්‍යම්, 'සත්‍යම්' ශබ්දය; ප්‍රශ්න, ප්‍රශ්නය; ප්‍රතිෂෙධ, ප්‍රතිෂෙධය; සත්‍යෙෂු, සත්‍යය යන මෙහි වැටේ.

k. සත්‍රා, 'සත්‍රා' ශබ්දය; සහාර්ථෙ, සමග යන අර්ථයෙහි වැටේ.

a. **සතත්, සතා, සනාතන්[3], නිත්‍යෙ.**
b. **සපදි, තත්ක්ෂණෙ.**
c. **සමම්, සහාර්ථෙ.**
d. **සමයා, සමීපෙ මධ්‍යෙච.**
e. **සමුපජෝෂම්, ආනන්දෙ.**
f. **සම්‍යක්, ශොභනෙ.**
g. **සහ, සාහිත්‍යෙ.**
h. **සහසා, ආකස්මිකා විමර්ශයොඃ.**
i. **සාකම්, සහාර්ථෙ.**
j. **සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂතුල්‍යයොඃ.**
k. **සාචි, තිර්‍ය්‍යගර්ථෙ.**
l. **සාමි, අර්ධජුගුප්සිතයොඃ.**

---

a. සතත්, සතා, සනාතන් [3], ‘සතත්’, ‘සතා’, ‘සනාතන්’යන තිදෙන; නිත්‍යෙ, නිත්‍යයෙහි වැටේ.

b. සපදි, ‘සපදි’ ශබ්දය; තත්ක්ෂණෙ, එකෙනෙහි යන අර්ථයෙහි වැටේ.

c. සමම්, ‘සමම්’ශබ්දය; සහාර්ථෙ, සමඟ යන අර්ථයෙහි වැටේ.

d. සමයා, ‘සමයා’ ශබ්දය; සමීපෙමධ්‍යෙච, සමීපයෙහි හා මධ්‍යයෙහි වැටේ.

e. සමුපජෝෂම්, ‘සමුපජෝෂම්’ ශබ්දය; ආනන්දෙ, සතුටෙහි වැටේ.

f. සම්‍යක්,‘සම්‍යක්’ශබ්දය; ශොභනෙ, ශොභනයෙහි වැටේ.

g. සහ, ‘සහ’ ශබ්දය; සාහිත්‍යෙ, සහිත බැවිහි වැටේ.

h. සහසා,‘සහසා’ශබ්දය; ආකස්මික, නිකරුණය; විමර්ශයොඃ, පරාමර්ශය යන දෙක්හි වැටේ.

i. සාකම්,‘සාකම්’ශබ්දය; සහාර්ථෙ, සහ ශබ්දයාගේ අර්ථයෙහි වැටේ.

j. සාක්ෂාත්,‘සාක්ෂාත්’ශබ්දය; ප්‍රත්‍යක්ෂතුල්‍යයොඃ, ප්‍රත්‍යක්ෂය, සමානය යන දෙක්හි වැටේ.

k. සාචි,‘සාචි’ශබ්දය; තිර්‍ය්‍යගර්ථෙ, සරසය යන අර්ථයෙහි වැටේ.

l. සාමි, ‘සාමි’ ශබ්දය; අර්ධජුගුප්සිතයොඃ, අර්ධය නින්දිතය යන දෙඅර්ථයෙහි වැටේ.

a. සාම්ප්‍රතම්, න්‍යාය්‍යෙ ඉදානිමපිච.
b. සායම්, නිශාමුඛෙ.
c. සාකම්, සහාර්ථෙ.
d. සුෂ්ඨු, අතිශය ප්‍රශංසයොඃ.
e. ස්ථානෙ, යොග්‍යත්වෙ.
f. ස්ම, අතීතෙ පාදපූරණෙච.
g. ස්වධා, පිතෘහව්‍යදානෙ.
h. ස්වයම්, ආත්මනෙත්‍යපි.
i. ස්වර්, ස්වර්ගෙ පරලොකෙච.
j. ස්වස්ති, පුණ්‍යාශීඃ ක්ෂෙමමඞ්ගල ප්‍රත්‍යභිවාදෙෂු.
k. ස්වාහා, දෙවතාහව්‍යදානෙ.

---

a. සාම්ප්‍රතම්, 'සාම්ප්‍රතම්' ශබ්දය; න්‍යාය්‍යෙ, සුදුස්සෙහිද; ඉදානීම්අපිච, දැන් යන අර්ථයෙහිද වැටේ.

b. සායම්, 'සායම්' ශබ්දය; නිශාමුඛෙ, රාත්‍රිමුඛයෙහි වැටේ.

c. සාකම්, 'සාකම්' ශබ්දය; සහාර්ථෙ, සහ ශබ්දයාගේ අර්ථයෙහි වැටේ.

d. සුෂ්ඨු, 'සුෂ්ඨු' ශබ්දය; අතිශය ප්‍රශංසයොඃ, අතිශය, ප්‍රශංසය, යන දෙක්හි වැටේ.

e. ස්ථානෙ, 'ස්ථානෙ' ශබ්දය; යොග්‍යත්වෙ, සුදුසුබැව්හි වැටේ.

f. ස්ම, 'ස්ම' ශබ්දය; අතීතෙ, අතීතයෙහිද; පාදපූරණෙච, පාදපූරණයද යන දෙඅර්ථයෙහි වැටේ

g. ස්වධා, 'ස්වධා' ශබ්දය; පිතෘහව්‍යදානෙ, පිතෘදෙවියන්ට දීමෙහි වැටේ.

h. ස්වයම්, 'ස්වයම්' ශබ්දය; ආත්මනා ඉති අපි, තමා විසින් යන අර්ථයෙහි වැටේ.

i. ස්වර්, 'ස්වර්' ශබ්දය; ස්වර්ගේ, ස්වර්ගයෙහිද; පරලොකෙච, පරලොකයෙහිද වැටේ.

j. ස්වස්ති, 'ස්වස්ති' ශබ්දය; පුණ්‍යෙ, පවිත්‍රය; ආශීඃ, ඉෂ්ට ප්‍රාර්ථනාවය; ක්ෂෙම, නිර්භීයය; මඞ්ගල, මඞ්ගලය; ප්‍රත්‍යභිවාදෙෂු, වැඳීමට සුදුසු ආශිර්වචනය යන මේ අර්ථයන්හි වැටේ.

k. ස්වාහා, 'ස්වාහා' ශබ්දය; දෙවතාහව්‍යදානෙ, දෙවියන්ට පුදකිරීමෙහි වැටේ.

**a. ස්විත්, ප්‍රශ්න විතර්කයොඃ.**
**b. හ, ප්‍රතිෂෙධෙ පාදපූරණෙච.**
**c. හංහො, විචාරෙ.**
**d. හන්ත, හර්ෂානුකම්පා වාක්‍යාරම්භ විෂාදෙෂු.**
**e. හලා, (නාට්‍යොක්තෞ) සඛී සම්බොධනෙ.**
**f. හා, විෂාදශුගර්තිෂු.**
**g. හිරුක්, වර්ජනෙ.**
**h. හි, හෙත්වවධාරණ විස්මය පාදපූරණෙෂු.**
**i. හිහි, හී, හිහී [3], ආහ්ලාදහාස්‍යවිස්මයාදීෂු.**
**j. හුම්, විතර්ක පරිප්‍රශ්නභර්ත්සන නිවාරණෙෂු.**
**k. හෙ, හෛ, හො [3], සම්බොධනෙ.**

---

a. ස්විත්, 'ස්විත්' ශබ්දය; ප්‍රශ්නවිතර්කයොඃ, ප්‍රශ්නය විතර්කය යන දෙක්හි වැටේ.

b. හ, 'හ' ශබ්දය; ප්‍රතිෂෙධෙ, ප්‍රතිෂෙධයෙහිද; පාදපූරණෙච, පාදපූරණයෙහිද වැටේ.

c. හංහො, 'හංහො' ශබ්දය; විචාරෙ, විමසීමෙහි වැටේ.

d. හන්ත, 'හන්ත' ශබ්දය; හර්ෂ, සතුටය; අනුකම්පා, අනුකම්පාවය; වාක්‍යාරම්භ, වාක්‍යාරම්භය; විෂාදෙෂු, ඛෙදය යන මේ අර්ථයන්හි වැටේ.

e. හලා, 'හලා' ශබ්දය; නාට්‍යොක්තෞ, නාට්‍යව්‍යවහාරයෙහිද; සඛීසම්බොධනෙ, යහළුවන්ට ආමන්ත්‍රණයෙහි ද වැටේ.

f. හා, 'හා' ශබ්දය; විෂාදේ, ඛෙදය; ශුග්, ශොකය; අර්තීෂු, පීඩාය යන මේ අර්ථයන්හි වැටේ.

g. හිරුක්, 'හිරුක්' ශබ්දය; වර්ජනෙ, දුරුකිරීමෙහි වැටේ.

h. හි, 'හි' ශබ්දය; හෙතු, හෙතුය; අවධාරණ, අවධාරණය; විස්මය, ආශ්චර්යය; පාදපූරණෙෂු, පාදපූරණය යන මේ අර්ථයන්හි වැටේ.

i. හිහි, හී, හිහී[3], 'හිහී', 'හී', 'හිහී' යන මේ තිදෙන; ආහ්ලාද, සතුටය; හාස්‍ය, සිනාවය; විස්මයාදීෂු, ආශ්චර්යය යන මේ අර්ථයන්හි වැටේ.

j. හුම්, 'හුම්' ශබ්දය; විතර්ක, විතර්කය; පරිප්‍රශ්න, පිළිවිසීමය; භර්ත්සන, තැතිගැන්වීමය; නිවාරණෙෂු, වැළැක්මය යන මේ අර්ථයන්හි වැටේ.

a. හ්‍යස්, අතීතෙ'හනි.

b. කෝ'ප්‍යේෂාං ද්‍යෝතකාඃ කෝ'පි-
වාචකාඃ කෝ'ප්‍යනර්ථකාඃ,
ආගමා ඉව කෝ'පි ස්‍යුඃ–
සම්භූයාර්ථස්‍ය සාධකාඃ.

c. ලාක්ෂණිකාන්‍යව්‍යයානි.

d. ශාස්ත්‍ර සිද්ධානි ලාක්ෂණිකානි, තානි ත්‍රේධා අව්‍යයී'භාව කෘදන්ත තද්ධිතාන්ත භෙදතඃ.

e. අව්‍යයීභාවො යථා–(i)උපකුම්භම්, (ii)අපදිශම්, (iii)මධ්‍ය සමුද්‍රම්, (iv)ශාකප්‍රති, (v)ප්‍රතිපුරුෂම්, (vi)ආබාලම්, ඉත්‍යාදයඃ.

---

k. හෙ, හෛ, හො [3], 'හෙ', 'හෛ', 'හො' යන තිදෙන; සම්බොධනෙ, ආමන්ත්‍රණයෙහි වැටේ.

a. හ්‍යස්, 'හ්‍යස්' ශබ්දය; අතීතෙඅහනි, ඉකුත්දිනයෙහි හෙවත් ඊයේ දිනයෙහි වැටේ.

b. එෂාම්, මෙහි අව්‍යයන් අතුරෙහි; කෝ'පි, කිසිවෙක්; ද්‍යෝතකාඃ, ක්‍රියාපදයාගේ අර්ථය බබුලුවන්නාහු වෙත්; කෝ'පි, ඇතම්හු; වාචකාඃ, තුමූම අර්ථය ප්‍රකාශකරන්නාහු වෙත්; කෝ'පි, සමහරහු; අනර්ථකාඃ, නිරර්ථක වෙත්; කෝ'පි, සමහරහු; ආගමාඃ ඉව, ආගමයන් මෙන්; සම්භූය, එක්ව; අර්ථස්‍ය සාධකාඃස්‍යුඃ, අර්ථය සිද්ධකරන්නාහු වෙත්.

c. ලාක්ෂණිකානි, සූත්‍රයෙන් සිද්ධවූ; අව්‍යයානි, අව්‍යයෝ කියනු ලැබෙත්.

d. ශාස්ත්‍ර සිද්ධානි, සූත්‍රයෙන් සිද්ධවූවාහු; ලාක්ෂණිකානි, ලාක්ෂණික නම් වෙත්; තානි, ඔව්හු; අව්‍යයීභාව, අව්‍යයීභාව සමාසය; කෘදන්ත, කෘදන්ත අව්‍යය; තද්ධිතාන්ත, තද්ධිතාන්ත අව්‍යය යන; භෙදතඃ, භෙදයෙන්; ත්‍රෙධා, තුන්වැදෑරුම් වෙත්.

e. අව්‍යයීභාවඃ, අව්‍යයීභාවයතෙම; යථා, මෙසේයි; උපකුම්භම්, උපකුම්භය; අපදිශම්, අපදිශය; මධ්‍යසමුද්‍රම්, මධ්‍ය සමුද්‍රම්ය; ශාකප්‍රති, ශාකප්‍රතිය; ප්‍රතිපුරුෂම්, ප්‍රතිපුරුෂම්ය; ආබාලම්, ආබාලම්ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(i) කුම්භස්‍යසමීපෙවර්තත ඉති, 'උපකුම්භම්'; (කුඹුසමීපයෙහි පවතීනුයි 'උපකුම්භ'නමි.)

## a. අව්‍යයත්වා පාදක කෘත්ප්‍රත්‍යයාඃ.

**(i) ක්ත්වාච්, (ii) ල්‍යප්, (iii) තුමුන් (iv) ණමුල්;**

## b. කෘදන්තාත්‍යව්‍යයානි.

**(i) ක්ත්වාච් ප්‍රත්‍යයාන්තා යථා-කෘත්වා, ගත්වා, දත්වා, දෘෂ්ටවා, භඞක්ත්වා, බුද්ධ්වා, බද්ධ්වා, ත්‍යක්ත්වා, ඉත්‍යාදයඃ.**

**(ii) ල්‍යබන්තා යථා-ප්‍රණම්‍ය, ප්‍රණිපත්‍ය, සන්තප්‍ය, අධිගත්‍ය, විහස්‍ය, විහාය, විධාය, ප්‍රජස්‍ය, පරිත්‍යජ්‍ය, විසෘජ්‍ය, ඉත්‍යාදයාඃ;**

---

(ii) දිශම් අපහායෙත්‍යපදිශම් 'අපදිශම්'; (දිශාව හැර යන අර්ථයෙහි 'අපදිශම්'යනු වේ.)

(iii) මධ්‍යෙ සමුද්‍රස්‍ය 'මධ්‍යසමුද්‍රම්'; (සමුද්‍රයාගේ මධ්‍යයෙහි යන අර්ථයෙහි 'මධ්‍ය සමුද්‍රම්'යනු වේ.)

(iv) ශාකස්‍යලෙශඃ 'ශාකප්‍රති'; (පලාවගේ සවල්පය 'ශාක ප්‍රති'නම් වේ.)

(v) පුරුෂෙ පුරුෂෙ ප්‍රති 'ප්‍රතිපුරුෂම්', (පුරුෂයෙකු පුරුෂයෙකු පාසා 'ප්‍රති පුරුෂ'නම් වේ.)

(vi) බාලානභිව්‍යාපාබාලම්, (බාලයා දක්වා යන අර්ථයෙහි 'ආබාලම්'යනු වේ.)

a. අව්‍යයත්වාපාදක, අව්‍යය බවට පමුණුවන්නාවූ; කෘත් ප්‍රත්‍යයාඃ, කෘත්ප්‍රත්‍යයෝ කියනු ලැබෙත්. ක්ත්වාච්, ල්‍යප්, තුමුන්, ණමුල්, (i) 'ක්ත්වාච්'ය, (ii) 'ල්‍යප්'ය, (iii) 'තුමුන්'ය, (iv)'ණමුල්'ය යන මොහු වෙත්.

b. කෘදන්තාත්‍යව්‍යයානි, කෘදන්ත අව්‍යයෝ කියනු ලැබෙත්.

(i) ක්ත්වාච් ප්‍රත්‍යයාන්තාඃ, 'ක්ත්වාච්'ප්‍රත්‍යයාන්තයෝ; යථා, මෙසේයි. කෘත්වා, කොට යන අර්ථ ඇති 'කෘත්වා'ය; ගත්වා, ගොස් යන අර්ථ ඇති 'ගත්වා'ය; දත්වා, දී යන අර්ථ ඇති 'දත්වා'ය; දෘෂ්ටවා, දුක යන අර්ථ ඇති; 'දෘෂ්ටවා'ය; භඞක්ත්වා, බිඳ යන අර්ථ ඇති 'භඞක්ත්වා'ය; බුද්ධ්වා, දැන යන අර්ථ ඇති 'බුද්ධ්වා'ය; බද්ධ්වා, බැඳ යන අර්ථ ඇති 'බද්ධ්වා'ය; ත්‍යක්ත්වා, හැර යන අර්ථ ඇති 'ත්‍යක්ත්වා'ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(ii) ල්‍යබන්තාඃ, 'ල්‍යප්' ප්‍රත්‍යයාන්තයෝ; යථා, මෙසේයි. ප්‍රණම්‍ය, වැඳ යන අර්ථ ඇති 'ප්‍රණම්‍ය'ය; ප්‍රණිපත්‍ය, වැඳ යන අර්ථ ඇති 'ප්‍රණිපත්‍ය'ය; සන්තප්‍ය, සතපා යන අර්ථ ඇති 'සන්තප්‍ය'ය;

**(iii) තුමුන්නන්තානාං යථා-භවිතුම්, යාතුම්, ගන්තුම්, කර්තුම්, භොක්තුම්, ද්‍රෂ්ටුම්, ඉත්‍යාදයඃ.**

**(iv) ණමුලන්තානාං යථා-සමාරං සමාරම්, පායම් පායං, චෞරඞ්කාරම්, ස්වාදුඞ්කාරම්, ඉත්ථඞ්කාරම්, කථඞ්කාරම්, උදරපූරම් ඉත්‍යාදයඃ.**

## ඞ. අව්‍යයත්වාපාදක තද්ධිත ප්‍රත්‍යයාඃ.

(i) **ආම්**, (ii) **වතිඃ**, (iii) **තසිල්**, (iv) **ත්‍රල්**, (v) **හ**, (vi) **අත්**. (vii) **දා**, (viii) **ර්හිල්**, (ix) **අධුනා**, (x) **දානිම්**, (xi) **ද්‍යස්**, (xii) **උත්**, (xiii) **ආරි**, (xiv) **සමසණ්**, (xv) **එද්‍යවි**, (xvi) **ද්‍ය**, (xvii) **එද්‍යුස්**, (xviii) **ද්‍යුස්**, (xix) **ථාල්**, (xx) **ථමුඃ**, (xxi) **අස්තාතිඃ**, (xxii) **අසිඃ**, (xxiii) **අතසුච්**, (xxiv) **අස්තාතිලුක්**, (xxv) **රිල්**, (xxvi) **රිෂ්ටාතිල්**,

---

අධිගත්‍ය, පැමිණ යන අර්ථ ඇති 'අධිගත්‍ය'ය; විහස්‍ය, සිනාසී යන අර්ථ ඇති 'විහස්‍ය'ය; විහාය, හැර යන අර්ථ ඇති විහාය'ය; විධාය, 'කොට'යන අර්ථ ඇති 'විධාය'ය; ප්‍රජස්‍ය, 'දිනා'යන අර්ථ ඇති 'ප්‍රජස්‍ය'ය; පරිත්‍යජ්‍ය විසෘජ්‍ය ඉත්‍යාදයඃ, 'පරිත්‍යජ්‍ය'ය, 'විසෘජ්‍ය'ය යනාදීහුය.

(iii) තුමුන්නන්තාඃ, 'තුමුන්'ප්‍රත්‍යයාන්තයෝ; යථා, මෙසේයි; භවිතුම්, 'වන්ට'යන අර්ථ ඇති 'භවිතුම්'ය; යාතුම්, 'යන්ට'යන අර්ථ ඇති 'යාතුම්'ය; ගන්තුම්, 'ගන්ට'යන අර්ථ ඇති 'ගන්තුම්'ය; කර්තුම්, 'කරන්ට' යන අර්ථ ඇති 'කර්තුම්' ය; භොක්තුම්, 'වළඳන්ට'යන අර්ථ ඇති 'භොක්තුම්'ය; ද්‍රෂ්ටුම්, 'දක්නට'යන අර්ථ ඇති 'ද්‍රෂ්ටුම්'ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(iv) ණමුලන්තාඃ, 'ණමුල්' ප්‍රත්‍යයාන්තයෝ; යථා, මෙසේයි. සමාරම්සමාරං, සිහිකොටකොට' යන අර්ථ ඇති 'සමාරං සමාරම්'ය; පායං පායම්, 'බිබී'යන අර්ථ ඇති 'පායං පායම්'ය; චෞරඞ්කාරම්, 'සොරකම් කොට' යන යන අර්ථ ඇති 'චෞරඞ්කාරම්'ය; ස්වාදුඞ්කාරම්, මධුර කොට' යන අර්ථ ඇති 'ස්වාදුඞ්කාරම්'ය; ඉත්ථඞ්කාරම්, 'මෙබඳු කොට' යන අර්ථ ඇති 'ඉත්ථඞ්කාරම්'ය; කථඞ්කාරම්, 'කෙබඳු කොට'යන අර්ථ ඇති 'කථඞ්කාරම්'ය; උදර පූරම්,'බඩපුරා'යන අර්ථ ඇති'උදරපූරම්'ය; ඉත්‍යාදයඃ, යනාදීහුය

ඞ. අව්‍යයත්වාපාදක, අව්‍යයත්වය කරන්නාවූ; තද්ධිතප්‍රත්‍යයාඃ, තද්ධිත ප්‍රත්‍යයෝ කියනුලැබෙත්; (i) ආම්, 'ආම්'ප්‍රත්‍යය; (ii)වතිඃ, 'වතිඃ' ප්‍රත්‍යය; (iii)තසිල්, 'තසිල්' ප්‍රත්‍යය; (iv)ත්‍රල්, 'ත්‍රල්' ප්‍රත්‍යය; (v) හ, 'හ' ප්‍රත්‍යය; (vi) අත්, 'අත්' ප්‍රත්‍යය; (vii) දා, 'දා' ප්‍රත්‍යය;

(xxvii) ආතිඃ, (xxviii) එනජ්, (xxix) ආචි, (xxx) ආහි, (xxxi) ධා, (xxxii) ධ්‍යමුඤ්, (xxxiii) ධමුඤ්, (xxxiv) එධාචි, (xxxv) කෘත්වසුච්, (xxxvi) සුච්, (xxxvii) සුප්ලුක්, (xxxviii) ශස්, (xxxix) තසිඃ, (xl) ව්චිඃ, (xli) සාතිඃ, (xlii) ත්‍රා, (xliii) ඩාච්.

අ. තද්ධිතාන්තා න්‍යව්‍යයානි.

(i) ආම්, යථා-නිතරාම්, නිතමාම්, සුතරාම්, සුතමාම්, පචතිතරාම්, පචතිතමාම්, ඉත්‍යාදයඃ.

---

(viii) ඊකිල්, 'ඊකිල්' ප්‍රත්‍යය; (ix) අධුනා, 'අධුනා' ප්‍රත්‍යය; (x) දානීම්, 'දානීම්' ප්‍රත්‍යය; (xi) ද්‍යුස්, 'ද්‍යුස්' ප්‍රත්‍යය; (xii) උත්, 'උත්' ප්‍රත්‍යය; (xiii) ආරි, 'ආරි' ප්‍රත්‍යය; (xiv) සමසණ්, 'සමසණ්' ප්‍රත්‍යය; (xv) එද්‍යුචි, 'එද්‍යුචි' ප්‍රත්‍යය; (xvi) ද්‍යු, 'ද්‍යු' ප්‍රත්‍යය; (xvii) එද්‍යුස්, 'එද්‍යුස්' ප්‍රත්‍යය; (xviii) ද්‍යුස්, 'ද්‍යුස්' ප්‍රත්‍යය; (xix) ථාල්, 'ථාල්' ප්‍රත්‍යය; (xx) ථමුඃ, 'ථමුඃ' ප්‍රත්‍යය; (xxi) අස්තාතිඃ, 'අස්තාතිඃ' ප්‍රත්‍යය; (xxii) අසිඃ, 'අසිඃ' ප්‍රත්‍යය; (xxiii) අතසුච්, 'අතසුච්' ප්‍රත්‍යය; (xxiv) අස්තාතිලුක්, 'අස්තාතිලුක්' ප්‍රත්‍යය; (xxv) රිල්, 'රිල්' ප්‍රත්‍යය; (xxvi) රිෂ්ටාතිල්, 'රිෂ්ටාතිල්' ප්‍රත්‍යය; (xxvii) ආතිඃ, 'ආතිඃ' ප්‍රත්‍යය; (xxviii) එනප්, 'එනප්' ප්‍රත්‍යය; (xxix) ආචි, 'ආචි' ප්‍රත්‍යය; (xxx) ආහි, 'ආහි' ප්‍රත්‍යය; (xxxi) ධා, 'ධා' ප්‍රත්‍යය; (xxxii) ධ්‍යමුඤ්, 'ධ්‍යමුඤ්' ප්‍රත්‍යය; (xxxiii) ධමුඤ්, 'ධමුඤ්' ප්‍රත්‍යය; (xxxiv) එධාචි, 'එධාචි' ප්‍රත්‍යය; (xxxv) කෘත්වසුච්, 'කෘත්වසුච්' ප්‍රත්‍යය; (xxxvi) සුච්, 'සුච්' ප්‍රත්‍යය; (xxxvii) සුප්ලුක්, (ප්‍රත්‍යය; (xxxviii) ශස්, 'ශස්' ප්‍රත්‍යය; (xxxix) තසිඃ, 'තසිඃ' ප්‍රත්‍යය; (xl) ව්චිඃ, 'ව්චිඃ' ප්‍රත්‍යය; (xli) සාතිඃ, 'සාතිඃ' ප්‍රත්‍යය; (xlii) ත්‍රා, 'ත්‍රා' ප්‍රත්‍යය; (xliii) ඩාච්, 'ඩාච්' ප්‍රත්‍යය කියා වෙත්.

a. තද්ධිතාන්තානි, තද්ධිතාන්තවූ; අව්‍යයානි, අව්‍යයෝ කියනු ලැබෙත්.

(i) ආම්, 'ආම්' ප්‍රත්‍යය; යථා, මෙසේයි. නිතරාම්, නිතමාම්; සුතරාම්, සුතමාම්, අතිශය යන අර්ථයෙහි 'නිතරාම්' 'නිතමාම්' සුතරාම්, සුතමාම් යනු වේ. පචතිතරාම්, පචතිතමාම්, අතිශයයින් පිසේය යන අර්ථයෙහි 'පචතිතරාම්' සහ 'පචතිතමාම්' යනු වේ. ඉත්‍යාදයඃ, යනාදීහුය.

**(ii) වතියත්ථා-බ්‍රාහ්මණවත්, ක්ෂත්‍රියවත්, වෛත්‍රවත්, චන්ද්‍රවත්, ඉත්‍යාදයඃ.**

**(iii) තසිල්යථා-සර්වතඃ, පූර්වතඃ, කුතඃ, ග්‍රාමතඃ, ලොකතඃ, ඉත්‍යාදයඃ.**

**(iv) ත්‍රල්යථා-සර්වත්‍ර, කුත්‍ර, යත්‍ර, තත්‍ර, අන්‍යත්‍රාදයඃ.**

**(v) හාතෙනෟ යථා-ඉහ, කුහ.**

**(vi) අදන්තො යථා-ක්ව.**

**(vii) දාන්තා යථා සර්වදා, එකදා, අන්‍යදා, කදා, යදා, තදා.**

---

(ii) වතියත්ථා, 'වතිඃ' ප්‍රත්‍යය මෙසේයි. බ්‍රාහ්මණවත්, (බ්‍රාහ්මණෙනතුල්‍යං) බමුණකු බඳු වූයේය යන අර්ථයෙහි බ්‍රාහ්මණවත්'යනු වේ ක්ෂත්‍රියවත්,(ක්ෂත්‍රියෙනතුල්‍යං) ක්ෂත්‍රියකු බඳුවූයේ යන අර්ථයෙහි 'ක්ෂත්‍රියවත්'යනු වේ. වෛත්‍රවත්, (වෛත්‍රෙනතුල්‍යං) බක්මස හා බඳුවූයේ යන අර්ථයෙහි 'වෛත්‍රවත්'යනු වේ. චන්ද්‍රවත්, (චන්ද්‍රෙනතුල්‍යං) චන්ද්‍රයා හා සමානවූයේ යන අර්ථයෙහි 'චන්ද්‍රවත්'යනු වේ.

(iii) තසිල් යථා,'තසිල්'ප්‍රත්‍යය මෙසේයි. සර්වතඃ,හාත්පසින් යන අර්ථයෙහි 'සර්වතඃ'ය; පූර්වතඃ, පූර්වයෙන් යන අර්ථයෙහි 'පූර්වතඃ'ය; කුතඃ, කොයින් යන අර්ථයෙහි 'කුතඃ'ය; ග්‍රාමතඃ, ගමින් යන අර්ථයෙහි 'ග්‍රාමතඃ'ය; ලොකතඃ, ලොකයෙන් යන අර්ථයෙහි 'ලොකතඃ'ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(iv) ත්‍රල් යථා, 'ත්‍රල්' ප්‍රත්‍යය මෙසේයි. සර්වත්‍ර, හැමතන්හි යන අර්ථයෙහි 'සර්වත්‍ර'ය; කුත්‍ර, කොහි යන අර්ථයෙහි 'කුත්‍ර'ය; යත්‍ර, යමෙක්හි යන අර්ථයෙහි; 'යත්‍ර'ය; තත්‍ර, එහි යන අර්ථයෙහි 'තත්‍ර'ය; අන්‍යත්‍ර, අන්තැනෙක්හි යන අර්ථයෙහි 'අන්‍යත්‍ර'ය; ආදයඃ, යනාදීහුය.

(v) හාතෙනෟ යථා, 'හ' ප්‍රත්‍යයාන්තයෝ දෙදෙන මෙසේයි. ඉහ, මෙහි යන අර්ථයෙහි 'ඉහ'ය; කුහ, කොහි යන අර්ථයෙහි 'කුහ'ය; (යනාදීහුය.)

(vi) අදන්තඃ, 'අත්'ප්‍රත්‍යයතෙම; යථා, මෙසේයි; ක්ව, කොහි යන අර්ථයෙහි 'ක්ව'ය (යනාදීහුය.)

(vii) දාන්තා යථා, 'දා' ප්‍රත්‍යයාන්තයෝ මෙසේයි. සර්වදා, හැමකල්හි යන අර්ථයෙහි 'අන්‍යදා'ය; කදා, කවර කාලෙක්හි යන අර්ථයෙහි 'කදා'ය; යදා, යම් කාලෙක්හි යන අර්ථයෙහි 'යදා'ය; තදා, එකල්හි යන අර්ථයෙහි'තදා'ය; (යනාදීහුය.)

**(viii) ර්හිලන්තා යථා-එතර්හි, කර්හි, යර්හි, තර්හි.**

**(ix) අධුනාන්තා යථා-අධුනා.**

**(x) දානිං යථා-ඉදානිං, තදානිං.**

**(xi) ජ්ජු යථා-සජ්ජුඃ (සමානෙ'හනි.)**

**(xii) උත්ථා-පරුත් (පුබ්බවච්ඡරෙ.)**

**(xiii) ආරිසීථා-පරාරි (පුබ්බතර වච්ඡරෙ.)**

**(xiv) සමසණි යථා-ඓෂමඃ (අස්මිං වච්ඡරෙ.)**

**(xv) එජ්ජවි යථා-පරෙජ්ජවි (පරස්මිංනහනි.)**

---

(viii) ර්හිලන්තා, 'ර්හිල්' ප්‍රත්‍යයාන්තයෝ; යථා, මෙසේයි. එතර්හි, දැන් යන අර්ථයෙහි 'එතර්හි'ය; කර්හි, කවර කලෙක්හි යන අර්ථයෙහි 'කර්හි'ය; යර්හි, යම් කලෙක්හි යන අර්ථයෙහි 'යර්හි'ය; තර්හි, එකල්හි යන අර්ථයෙහි 'තර්හි' ය (යනාදීහුය )

(ix) අධුනාන්තඃ, 'අධුනා' ප්‍රත්‍යයාන්තය; යථා, මෙසේයි; අධුනා, දැන් යන අර්ථයෙහි 'අධුනා' යනාදිය වේ.

(x) දානිං යථා, 'දානිං' ප්‍රත්‍යයාන්තය මෙසේයි; ඉදානිං, දැන් යන අර්ථයෙහි 'ඉදානිං'ය; තදානිං, එකල්හි යන අර්ථයෙහි 'තදානිං'ය (යනාදීහුය.)

(xi) ජ්ජු යථා, 'ජ්ජු' ප්‍රත්‍යයාන්තය මෙසේයි; සජ්ජුඃ, එක නෙහි යන අර්ථයෙහි 'සජ්ජුඃ'ය. (සමානෙහනි, සමාන දිනයෙහි යන අර්ථයි.)

(xii) උත්ථා, 'උත්' ප්‍රත්‍යය මෙසේයි. පරුත්, ගිය තුන්වෙනි අවුරුද්දෙහි යන අර්ථයෙහි 'පරුත්'ය;(පුබ්බවච්ඡරෙ, පෙර අවුරුද් දෙන් පළමු අවුරුද්දෙහි යන අර්ථය.)

(xiii) ආරිසීථා, 'ආරි' ප්‍රත්‍යය මෙසේයි. පරාරි, 'පරාරි' යනු; පුබ්බතරවච්ඡරෙ, පූර්වවර්ෂයෙන් පූර්වවර්ෂයෙහි යන අර්ථයි.

(xiv) සමසණි යථා, 'සමසණි' ප්‍රත්‍යය මෙසේයි; ඓෂමඃ, 'ඓෂමඃ' යනු; අස්මිං වච්ඡරෙ, මේ වර්ෂයෙහි යන අර්ථයි.

(xv) එජ්ජවි යථා, 'එජ්ජවි' ප්‍රත්‍යය මෙසේයි; පරෙජ්ජවි, 'පරෙජ්ජවි'යනු; පරස්මිංනහනි, අනිද්දා යන අර්ථයි.

(xvi) ජ්ජ යථා, 'ජ්ජ' ප්‍රත්‍යය මෙසේයි; අජ්ජ, 'අජ්ජ'යනු; අස්මිං අහනි, මෙදිනෙහි යන අර්ථයි.

**(xvii) එද්‍යුස් යථා-පූර්වේද්‍යුඃ, අන්‍යේද්‍යුඃ, අන්‍යතරේද්‍යුඃ, ඉතරේද්‍යුඃ, අධරේද්‍යුඃ, අපරේද්‍යුඃ, උභයේද්‍යුඃ, උත්තරේද්‍යුඃ.**

**(xviii) ද්‍යුස් යථා-උභයද්‍යුඃ.**

**(xix) ථාල් යථා සර්වථා, යථා, තථා, අන්‍යථාදයඃ.**

**(xx) ථමුසීථා-ඉත්ථම්, කථම්.**

**(xxi) අස්තා තිසීථා-පුරස්තාත්, පරස්තාත්, අධස්තාත්, අවස්තාත්, අවරස්තාත්.**

---

(xvii එද්‍යුස් යථා, 'එද්‍යුස්' ප්‍රත්‍යය මෙසේයි; පූර්වේද්‍යුඃ, පෙරදින යන අර්ථයෙහි 'පූර්වේද්‍යුඃ'ය; අන්‍යේද්‍යුඃ, අතික් දින යන අර්ථයෙහි 'අන්‍යේද්‍යුඃ'ය; අන්‍යතරේද්‍යුඃ, එක්තරු දිනෙක්හි යන අර්ථයෙහි 'අන්‍යතරේද්‍යුඃ'ය; ඉතරේද්‍යුඃ, අතික් දිනයෙහි යන අර්ථයෙහි 'ඉතරේද්‍යුඃ'ය; අධරේද්‍යුඃ, පසුගිය දිනෙහි යන අර්ථයෙහි 'අධරේද්‍යුඃ'ය; අපරේද්‍යුඃ, අතික් දිනෙහි යන අර්ථයෙහි 'අපරේද්‍යුඃ'ය; උභයේද්‍යුඃ, දෙදිනෙහි යන අර්ථයෙහි 'උභයේද්‍යුඃ'ය; උත්තරේද්‍යුඃ, මතුදිනෙහි යන අර්ථයෙහි 'උත්තරේද්‍යුඃ' ය (යනාදීහුය )

(xviii) ද්‍යුස් යථා, 'ද්‍යුස්' ප්‍රත්‍යය මෙසේයි. උභයද්‍යුඃ, දෙදිනෙහි යන අර්ථයෙහි 'උභයද්‍යුඃ'ය.

(xix) ථාල් යථා, 'ථාල්' ප්‍රත්‍යය මෙසේයි. සර්වථා, හැම පරිද්දෙන් යන අර්ථයෙහි 'සර්වථා'ය; යථා, යම් පරිද්දෙන් යන අර්ථයෙහි 'යථා'ය; තථා, එපරිද්දෙන් යන අර්ථයෙහි 'තථා'ය; අන්‍යථා, අන්පරිද්දෙන් යන අර්ථයෙහි 'අන්‍යථා'ය; ආදයඃ, යනාදීහුය.

(xx) ථමුසීථා, 'ථමු' ප්‍රත්‍යය මෙසේයි; ඉත්ථම්, මෙසේ යන අර්ථයෙහි 'ඉත්ථම්'ය; කථම්, කෙසේ යන අර්ථයෙහි 'කථම්' ය (යනාදීහුය.)

(xxi) අස්තාතිසීථා, 'අස්තාති' ප්‍රත්‍යය මෙසේයි; පුරස්තාත්, ඉදිරියෙහි යන අර්ථයෙහි 'පුරස්තාත්'ය; පරස්තාත්, පස්සෙහි යන අර්ථයෙහි 'පරස්තාත්'ය; අධස්තාත්, යට යන අර්ථයෙහි 'අධස්තාත්'ය; අවස්තාත්, යට යන අර්ථයෙහි 'අවස්තාත්' ය; අවරස්තාත්, පස්සෙහි යන අර්ථයෙහි 'අවරස්තාත්'ය (යනාදීහුය.)

(xxii) **අසිසීථා-පුරඃ, අධඃ, අවඃ.**

(xxiii) **අතසුජ්‍යථා-දක්‍ෂිණතඃ, උත්තරතඃ, පරතඃ, අවරතඃ.**

(xxiv) **අස්තාති ලුග්‍යථා-ප්‍රාක්, ප්‍රත්‍යක්, උදක්.**

(xxv, xxvi) **රිල්රිෂ්ටාති ලෞයථා-උපරි, උපරිෂ්ටාත්.**

(xxvii) **ආතිසීථා-පශ්චාත්, උත්තරාත්, අධරාත්, දක්‍ෂිණාත්.**

(xxviii) **එනබ්‍යථා-උත්තරේණ, අධරේණ, දක්‍ෂිණේන.**

(xxix) **ආජ්‍යථා-දක්‍ෂිණා, උත්තරා.**

(xxx) **ආහිසීථා-දක්‍ෂිණාහි, උත්තරාහි.**

---

(xxii) අසිසීථා, 'අසි' ප්‍රත්‍යය මෙසේයි; පුරඃ, ඉදිරියෙහි යන අර්ථයෙහි 'පුරඃ'ය; අධඃ, යට යන අර්ථයෙහි 'අධඃ'ය; අවඃ, යට යන අර්ථයෙහි 'අවඃ'ය (යනාදීහුය.)

(xxiii) අතසුජ්‍යථා, 'අතසුච්' ප්‍රත්‍යය මෙසේයි; දක්‍ෂිණතඃ, දකුණෙහිය; උත්තරතඃ, උතුරෙහිය; පරතඃ, පරභාගයෙහිය; අවරතඃ, පස්සෙහිය (යනාදීහුය.)

(xxiv) අස්තාතිලුග්‍යථා, 'අස්තාති' ප්‍රත්‍යයාගේ ලොප්විම මෙසේයි. ප්‍රාක්, පලමුය; ප්‍රත්‍යක්, පසුය; උදක්, උතුරෙහිය (යනාදීහුය.)

(xxv, xxvi) රිල් රිෂ්ටාති ලෞයථා, 'රිල්' ප්‍රත්‍යය, 'රිෂ්ටාතිල්' ප්‍රත්‍යය මෙසේයි. උපරි, උපරිෂ්ටාත්, මත්තෙහි යන අර්ථයි.

(xxvii) ආතිසීථා, 'ආති' ප්‍රත්‍යය මෙසේයි. පශ්චාත්, පසුවය; උත්තරාත්, උතුරෙහිය; අධරාත්, යටය; දක්‍ෂිණාත්, දකුණෙහිය (යනාදීහුය )

(xxviii) එනබ්‍යථා, 'එන' ප්‍රත්‍යය මෙසේයි. උත්තරේණ, උතුරෙහිය; අධරේණ, යටය; දක්‍ෂිණේන, දකුණෙහිය (යනාදීහුය )

(xxix) ආජ්‍යථා, 'ආජ්' ප්‍රත්‍යය මෙසේයි. දක්‍ෂිණා, දකුණෙහිය; උත්තරා, උතුරෙහිය (යනාදීහුය.)

(xxx) ආහිසීථා, 'ආහි' ප්‍රත්‍යය මෙසේයි. දක්‍ෂිණාහි, දකුණෙහිය; උත්තරාහි, උතුරෙහිය (යනාදීහුය.)

**(xxxi) ධා යථා-ඒකධා, ද්විධා, ත්‍රිධා, චතුර්ධා, පඤ්චධා, ෂෝඪා, සප්තධා, බහුධා ඉත්‍යාදයඃ.**

**(xxxii) ධ්‍යමුඤ් යථා-ඓකධ්‍යම්.**

**(xxxiii) ධමුඤ් යථා-ද්වෛධම්, ත්‍රෛධම්.**

**(xxxiv) එධාච්‍යථා-ද්වේධා, ත්‍රේධා.**

**(xxxv) කෘත්වසුච්‍යථා-පඤ්චකෘත්වඃ, ෂට්කෘත්වඃ, බහුකෘත්වඃ, ඉත්‍යාදයඃ.**

**(xxxvi) සුච් යථා-ද්විඃ, ත්‍රිඃ, චතුඃ.**

**(xxxvii) සුච්ලුග්‍යථා-සකෘත්.**

**(xxxviii) ශස යථා-බහුශඃ, අල්පශඃ, ද්විශඃ, ත්‍රිශඃ, මාෂශඃ, ප්‍රස්ථශඃ, ඉත්‍යාදයඃ.**

---

(xxxi) ධා යථා, 'ධා' ප්‍රත්‍යය මෙසේයි. ඒකධා, එක් පරිද්දෙකින්ය; ද්විධා, දෙපරිද්දෙකින්ය; ත්‍රිධා, තුන්පරිද්දෙකින්ය; චතුර්ධා, සතරපරිද්දෙකින්ය; පඤ්චධා, පස්පරිද්දෙකින්ය; ෂෝඪා, සපරිද්දෙකින්ය; සප්තධා, සත්පරිද්දෙකින්ය; බහුධා, බොහෝ ප්‍රකාරයෙන්ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xxxii) ධ්‍යමුඤ් යථා, 'ධ්‍යමුඤ්' ප්‍රත්‍යය මෙසේයි; ඓකධ්‍යම් (එකටය යනාදීහුය.)

(xxxiii) ධමුඤ් යථා, 'ධමුඤ්' ප්‍රත්‍යය මෙසේයි; ද්වෛධම් දෙපරිද්දකින්ය; ත්‍රෛධම්, තුන්පරිද්දකින්ය (යනාදීහුය.)

(xxxiv) එධාච්‍යථා, 'එධාච්' ප්‍රත්‍යය මෙසේයි. ද්වේධා, දෙපරිද්දෙකින්ය; ත්‍රේධා, තුන්පරිද්දකින්ය (යනාදීහුය.)

(xxxv) කෘත්වසුච්‍යථා, 'කෘත්වසුච්' ප්‍රත්‍යය මෙසේයි. පඤ්චකෘත්වඃ, පස්වරක්ය; ෂට්කෘත්වඃ, සවරක්ය; බහුකෘත්වඃ, බොහෝ වරක්ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xxxvi) සුච් යථා, 'සුච්' ප්‍රත්‍යය මෙසේයි. ද්විඃ, දෙවරක්ය; ත්‍රිඃ, තුන්වරක්ය; චතුඃ, සතරවරක්ය (යනාදීහුය.)

(xxxvii) සුච්ලුග්‍යථා, 'සුච්' ප්‍රත්‍යය ලොපය මෙසේයි. සකෘත්, එක්වරක්ය යනාදීහුය.

(xxxviii) ශස් යථා-'ශස්' ප්‍රත්‍යය මෙසේයි. බහුශඃ, බොහෝ සෙයින්ය; අල්පශඃ, මදසෙයින්ය; ද්විශඃ, දෙකක් බැගින්ය; ත්‍රිශඃ, තුනක් බැගින්ය; මාෂශඃ, මාෂයක් බැගින්ය; ප්‍රස්ථශඃ, නැළියක් බැගින්ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

**(xxxix) තසිර්ථා-කෘෂ්ණතඃ, අර්ජුනතඃ, ආදිතඃ, මධ්‍යතඃ, අනන්තතඃ, පෘෂ්ඨතඃ, පාර්ශ්වතඃ, ස්වරතඃ වර්ණතඃ, ග්‍රාමතඃ, වෘත්තතඃ, ප්‍රවාහිකාතඃ, ඉත්‍යාදයඃ.**

**(xl) ච්විර්ථා-කෘෂ්ණී (කරෝති), ගඞ්ගී (ස්‍යාත්), ඉත්‍යාදයඃ.**

**(xli) සාතිර්ථා-අග්නිසාද් (භවති), විප්‍රසාත් (කරෝති), ඉත්‍යාදයඃ.**

**(xlii) ත්‍රාචර්ථා-විප්‍රත්‍රා (කරෝති), දෙවත්‍රා (වන්දෙ), මනුෂ්‍යත්‍රා (රමෙ), ඉත්‍යාදයඃ.**

**(xliii) ඩාජ්‍යර්ථා-පට පටා (කරෝති), භද්‍රා (කරෝති), ප්‍රියා (කරෝති), සුඛා (කරෝති), ඉත්‍යාදයඃ.**

---

(xxxix) තසිර්ථා,'තසි'ප්‍රත්‍යය මෙසේයි. කෘෂ්ණතඃ, කෘෂ්ණයා කෙරෙන්ය; අර්ජුනතඃ, අර්ජුනයා කෙරෙන්ය; ආදිතඃ, ආදියෙන්ය; මධ්‍යතඃ, මධ්‍යයෙන්ය; අනන්තතඃ, අනන්තයෙන්ය; පෘෂ්ඨතඃ, පිටින්ය; පාර්ශ්වතඃ, ඇලයෙන්ය; ස්වරතඃ, ස්වරයෙන්ය; වර්ණතඃ, වර්ණයෙන්ය; ග්‍රාමතඃ, ගමින්ය; වෘත්තතඃ, වටින්ය; ප්‍රවාහිකාතඃ, ප්‍රවාහිකායෙන්ය; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xl) ච්විර්ථා-'ච්වි' ප්‍රත්‍යය මෙසේයි. කෘෂ්ණී (කරෝති), [කෘෂ්ණං කරෝතීති'කෘෂ්ණී කරෝති'යනු වාක්‍යයි.] කළුකෙරෙයි; ගඞ්ගී (ස්‍යාත්), [අගඞ්ගා ගඞ්ගාස්‍යාත් 'ගඞ්ගීස්‍යාත්'යනු වාක්‍යයි.] පෙර ගඟක් නොවූවක් ගඟක් වැනි වේ; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xli) සාතිර්ථා-'සාති' ප්‍රත්‍යය මෙසේයි. අග්නිසාද් (භවති), ගින්නට අයිති වේ; විප්‍රසාත් (කරෝති), බමුණන් අයිති කෙරෙයි; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xlii) ත්‍රා යර්ථා, 'ත්‍රා' ප්‍රත්‍යය මෙසේයි. විප්‍රත්‍රා (කරෝති); බමුණන් අයත් කෙරෙයි; දෙවත්‍රා (වන්දෙ), දෙවියන් වදිමි, මනුෂ්‍යත්‍රා (රමෙ), මිනිසුන් කෙරෙහි සිත්අලවයි; ඉත්‍යාදයඃ, යනාදීහුය.

(xliii) ඩාජ්‍යර්ථා, 'ඩාච්' ප්‍රත්‍යය මෙසේයි; පට පටා (කරෝති), පට පට යන ශබ්දකෙරෙයි; භද්‍රා (කරෝති), යහපත් කෙරෙයි; ප්‍රියා (කරෝති), ප්‍රියකෙරෙයි; සුඛා (කරෝති), සැපකෙරෙයි; ඉත්‍යාදයඃ, යනාදීහුය.

## a. උපසර්ග නිරූපණම්.

**b. ප්‍රාදයඃ උපසර්ගාඃ ක්‍රියායොගෙ.**

**c. (i) ප්‍ර, (ii) පරා, (iii) අප; (iv) සම්, (v) අනු, (vi) අව, (vii) නිස්, නිර්, (viii) දුස්, දුර්, (ix) වි, (x) ආඞ්, (xi) නි, (xii) අධි, (xiii) අපි, (xiv) අති, (xv) සු, (xvi) උත්, (xvii) අභි, (xviii) ප්‍රති, (xix) පරි, (xx) උප, එතෙ උපසර්ගාඃ.**

**d. උපසර්ගාහි අර්ථවිශෙෂස්‍ය ද්‍යොතකා නතු වාචකාඃ**

**(i) ප්‍රාදිකර්මණි දීර්ඝෛශ-භෘශ සම්භව තෘප්තිෂු,**
**වියොග ශුද්ධි ශක්තීච්ඡා-ශාන්ති පූජාග්‍ර දර්ශනෙ.**

**(i) a. යථා-ප්‍රකෘතම්, ප්‍රලම්බඃ, ප්‍රභුඃ, ප්‍රතපති, ප්‍රභවති, ප්‍රභුක්තමන්නම්, ප්‍රොෂිතඃ, ප්‍රසන්නමුදකම්. ප්‍රශක්තඃ, ප්‍රාර්ථයතෙ, ප්‍රශාන්තඃ, ප්‍රාඤ්ජලිඃ, ප්‍රවාලම්, ප්‍රලොකයති.**

---

a. උපසර්ග නිරූපණම්, උපසර්ගයන්ගේ දැක්වීමයි.

b. ක්‍රියායොගෙ, ක්‍රියාවක් හා යොගයෙහි; ප්‍රාදයඃ, 'ප්‍ර' ශබ්ද දීහු; උපසර්ගාඃ, උපසර්ග නම් වෙත්.

c. (i) ප්‍ර, 'ප්‍ර' ශබ්දය; (ii) පරා, 'පරා' ශබ්දය; (iii) අප, 'අප' ශබ්දය; (iv) සම්, 'සම්' ශබ්දය; (v) අනු, 'අනු' ශබ්දය; (vi) අව, 'අව' ශබ්දය; (vii) නිස්, නිර්, 'නිස්' හෙවත් 'නිර්' ශබ්දය; (viii) දුස්, දුර්, 'දුස්' හෙවත් 'දුර්' ශබ්දය; (ix) වි, 'වි' ශබ්දය; (x) ආඞ්, 'ආඞ්' ශබ්දය; (xi) නි, 'නි' ශබ්දය; (xii) අධි, 'අධි' ශබ්දය; (xiii) අපි, 'අපි' ශබ්දය; (xiv) අති, 'අති' ශබ්දය; (xv) සු, 'සු' ශබ්දය; (xvi) උත්, 'උත්' ශබ්දය; (xvii) අභි, 'අභි' ශබ්දය; (xviii) ප්‍රති, 'ප්‍රති' ශබ්දය; (xix) පරි, 'පරි' ශබ්දය; (xx) උප, 'උප' ශබ්දය යන; එතෙ, මොහු; උපසර්ගාඃ, උපසර්ග නම් වෙත්.

d. උපසර්ගාහි, උපසර්ගයෝ වනාහි; අර්ථවිශෙෂස්‍ය, අර්ථ විශෙෂය; ද්‍යොතකාඃ, බබුළුවන්නාහුය; නතුවාචකාඃ, කියන්නාහු නොවෙත්.

(i) ප්‍ර, 'ප්‍ර' ශබ්දයතෙම; ආදිකර්මණි, පටන්ගැන්මෙහිද; දීර්ඝ, දිර්ඝය; ඊශ, සමර්ථය; භෘශ, අතිශය; සම්භව, ලැබීමය; තෘප්තිෂු, තෘප්තිය යන මෙහිද; වියොග, වියොගය; ශුද්ධි, ශුද්ධිය; ශක්ති, ඇලීමය; ඉච්ඡා, කැමැත්තය; ශාන්ති, සංහිඳීමය; පූජා, පිදීමය; අග්‍ර, අග්‍රය; දර්ශනෙ, දර්ශනය යන මෙතෙක් අර්ථයන්හිද වැටේ.

(i) a. යථා උදාහරණ මෙසේයි; ප්‍රකෘතම්, (ආදිකර්මයෙහි 'ප්‍රකෘතම්' යනු වේ)-පටන්ගන්නාලද යන අර්ථයි; ප්‍රලම්බඃ, දීර්ඝයෙහි 'ප්‍රලම්බඃ' යනු වේ.)-දික්ව එලීමය යන අර්ථයි; ප්‍රභුඃ (ඊශ්වරාර්ථ

**(ii) වධෙ ගතෞ දර්ශනෙච-වික්‍රමෙ'භි මුඛෙ භෘශෙ,**
**අධීන මොක්ෂණප්‍රාති-ලොම්‍යකෙෂු පරාමතඃ.**

**(ii)a. යථා-පරාහතඃ, පරාගතඃ, පරාදෘෂ්ටඃ, පරාක්‍රාන්තඃ, පරාවෘත්තඃ, පරාජිතඃ, පරාධීනඃ, පරාභෘතඃ, පරාඞ්මුඛඃ.**

---

යෙහි 'ප්‍රභුඃ' යනු වේ.)-ඊශ්වරය යන අර්ථයි; ප්‍රතපති (භෘෂාර්ථයෙහි 'ප්‍රතපති'යනු වේ.)-අතිශයින් තාප කෙරෙයි යන අර්ථයි; ප්‍රභවති (සම්භාවාර්ථයෙහි 'ප්‍රභවති' යනු වේ.)-පහළවේ යන අර්ථයි; ප්‍රභුක්තමන්නම් (තෘප්තියෙහි 'ප්‍රභුක්තම්' යනු වේ.)-ආහාරය තෘප්තවනසේ වළඳයි යන .අර්ථයි; ප්‍රොෂිතඃ, (වියොගයෙහි 'ප්‍රොෂිතඃ' යනු වේ.)-වෙන්ව වසන්නේය යන අර්ථයි; ප්‍රසන්න මුදකම් (අනනං ශුඞියෙහි 'ප්‍රසන්නං'යනු වේ.) ජලය පිරිසිදුය යන අර්ථයි; ප්‍රශක්තඃ (ශක්තියෙහි 'ප්‍රශක්තඃ' යනු වේ.)-ඇලුනේය යන අර්ථයි; ප්‍රාර්ථයතෙ, (ඉච්ඡායෙහි 'ප්‍රාර්ථයතෙ' යනු වේ.)-කැමති වෙයි යන අර්ථයි; ප්‍රශාන්තඃ (ශාන්තියෙහි 'ප්‍රශාන්තඃ' යනු වේ.) සංසිඳුනේය යන අර්ථයි; ප්‍රාජ්ලිඃ (පූජායෙහි 'ප්‍රාජ්ලිඃ' යනු වේ.) බඳදිලි ඇත්තේය යන අර්ථයි; ප්‍රවාලම් (අග්‍රාර්ථයෙහි 'ප්‍රවාලම්' යනු වේ.) අග්‍රයෙහිවූ අංකුරය යන අර්ථයි; ප්‍රලොකයති (දර්ශනයෙහි 'ප්‍රලොකයති'යනු වේ.)-බලයි යන අර්ථයි.

(ii) පරා, 'පරා' ශබ්දයතෙම; ගතෞ, ගමනෙහිද; දර්ශනෙච, දර්ශනයෙහිද; වික්‍රමෙ, වික්‍රමයෙහිද; අභිමුඛෙ, අභිමුඛයෙහිද; භෘශෙ, අතිශයෙහිද; අධීන, අයිතිය; මොක්ෂණ, මිදීමය; ප්‍රාතිලොම්‍යකෙෂු, පිළිලොම් බවය හෙවත් පිටිපස බවය යන මෙහි; මතඃ, දන්නාලදී.

(ii) a. යථා, උදාහරණ මෙසේයි පරාහතඃ (වධයෙහි 'පරාහතඃ' යනු වේ.)-නසනලදී යන අර්ථයි; පරාගතඃ (ගතියෙහි 'පරාගතඃ' යනු වේ.)-පලාගියේය යන අර්ථයි; පරාදෘෂ්ටඃ (දැක්මෙහි 'පරාදෘෂ්ටඃ' යනු වේ.)-දක්නාලද්දේය යන අර්ථයි; පරාක්‍රාන්තඃ (වික්‍රමයෙහි 'පරාක්‍රාන්තඃ' යනු වේ.)-වික්‍රම ඇත්තේය යන අර්ථයි; පරාවෘත්තඃ (අභිමුඛයෙහි 'පරාවෘත්තඃ' යනු වේ.) පෙරලා ඉදිරියට ආයේය යන අර්ථයි; පරාධීනඃ (අයිතියෙහි 'පරාධීනඃ' යනු වේ.)-අයිතිවූයේය යන අර්ථයි; පරාකෘතඃ (මිදීමෙහි 'පරාකෘතඃ' යනු වේ.)-මුදනලද්දේය හෙවත් හැරදමන ලද්දේය යන අර්ථයි; පරාඞ්මුඛඃ (ප්‍රතිලොමයෙහි 'පරාඞ්මුඛඃ යනු වේ.)-පිටිපෑයේය යන අර්ථයි.

(iii) අපො වියොගෙ විකෘතෞ-විපරීතෙ නිදර්ශනෙ,
ආනන්‍දෙ වර්ජනෙ චෞර්‍ය්‍යෙ-වාරණෙ සමුදාහෘතඃ.

(iii) a. යථා-අපනයති, අපකෘතවාන්, අපශබ්දඃ, අපදිශති, අපහසති, අපවනාත් දෘෂ්ටොදෙවඃ, අපහරති, අපසරති.

(iv) සංයොගෙ චෛක්‍යවප්‍රභවෙ-සත්‍ය ප්‍රත්‍යක්ෂ සිද්ධිෂු,
භූෂාශ්ලෙෂ ස්වී කරණ-ක්‍රොධාභිමුඛ වාචි සම්.

(iv)a. යථා-සංගතඃ, සංවදන්ති, සංභවති, සංජානාති, සම්පශ්‍යතෙ, සංසිද්ධිඃ, සංස්කෘතානාසනාපා, සඞ්ඛ්‍යෙනක, සඞ්ගෘහ්ණාති, සඞ්ක්‍රුද්ධඃ, සංයාති.

---

(iii) අපඃ, 'අප'යන උපසර්ගයතෙම; වියොගෙ, වෙන්වීමෙහිද; විකෘතෞ, විකාරයෙහි හෙවත් වෙනසෙහිද; විපරීතෙ, විපර්‍ය්‍යාසයෙහිද; නිදර්ශනෙ, නිදසුනෙහිද; ආනන්‍දෙ, සතුටෙහිද; වර්ජනෙ, දුරලීමෙහිද; චෞර්‍ය්‍යෙ, සොරකම්හිද; වාරණෙ, හැසිරීමෙහිද; සමුදාහෘතඃ, කියනලදී.

(iii a. යථා-උදාහරණ මෙසේයි; අපනයති (වියොගයෙහි 'අපනයති' යනු වේ.)-වෙන්කෙරෙයි යන අර්ථයි; අපකෘතවාන් (විකෘතියෙහි 'අපකෘතවාන්' යනු වේ.)-වෙනස් කෙළේය යන අර්ථයි; අපශබ්දඃ (විපරීතයෙහි 'අපශබ්දඃ'යනු වේ.)-අප ශබ්ද යන අර්ථයි; අප දිශති (නිදර්ශනයෙහි 'අපදිශති' යනු වේ.)-දක්වයි යන අර්ථයි; අපහසති (ආනන්‍දයෙහි 'අපහසති' යනු වේ.)-අපහාස කෙරෙයි හෙවත් සිනාසීමෙන් සතුටුවෙයි යන අර්ථයි; දෙවඃ, මෙඝයතෙම; අපවනාත් (වර්ජනයෙහි 'අපවනාත්' යනු වේ.) වනයහැර යන අර්ථයි; දෘෂ්ටඃ, දක්නාලදී; අපහරති (චෞර්‍ය්‍යයෙහි 'අපහරති' යනු වේ )-පැහැරගනී යන අර්ථයි; අපසරති (වාරණ යෙහි 'අපසරති'යනු වේ)-පහවයේ යන අර්ථයි.

(iv) සම්, 'සම්' යන උපසර්ගයතෙම; සංයොගෙ, සංයොග යෙහිද; ඓක්‍යෙව ඒකත්වයෙහිද; ප්‍රභවෙ, පහලවීමෙහිද; සත්‍ය, සත්‍යයෙහිද; ප්‍රත්‍යක්ෂ ප්‍රත්‍යක්ෂයෙහිද; සිද්ධිෂු, සිද්ධියෙහිද; භූෂා, සැරසීමෙහිද; අශ්ලෙෂ, වැලඳගැනීමෙහිද; ස්වීකරණෙ, පිළිගැන්මෙහිද; ක්‍රොධ, ක්‍රොධයෙහිද; අභිමුඛ, අභිමුඛය යන මෙතෙක් අර්ථයෝ; වාචි, ප්‍රකාශකෙරෙත්.

(iv) a. යථා, උදාහරණ මෙසේයි; සඞ්ගතඃ, යුක්තය යන අර්ථයි; සංවදන්ති, එක්ව කියත් යන අර්ථයි; සම්භවති, හටගනී යන අර්ථයි; සංජානාති, සත්‍යය දනී යන අර්ථයි; සම්පශ්‍යතෙ, ප්‍රත්‍යක්ෂව

**(v) වෙදාධිෂ්ඨාන සාමීප්‍ය-පශ්චාද්භාවානු බන්ධනෙ,**
**සාම්‍යාභිමුඛ හීනෙෂු-විසර්ගලක්ෂණෙ'ෂ්වනු.**

**(v) a. යථා-අනුවාකමධීතෙ, අනුෂ්ඨානං දෙශඃ, අනුමෙඝං වර්ෂති, අනුරථම්, අනුශයඃ, අනුකෘතිඃ, අනුවත්සා මාතරං ධාවති, අන්වර්ජුනං යොද්ධාරඃ, අනුද්‍යූතඃ, අනුවත මසතාං ගතිඃ.**

**(vi) ඥනාවලම්බ ශුද්ධීෂ-දර්පෙව්‍යාප්තිපරාභවෙ,**
**අවාඥෙයො වියොගෙච-ලොකයොගානුසාරතඃ.**

**(vi) a. යථා-අවගතො'ර්ථඃ, අවලම්බ්‍යයෂ්ටිං ගච්ඡති, අවදාතඃ, අවලම්බ්‍යතෙ, අව ක්ෂිණෝමි, අවසනනති, අවසාතඃ.**

---

දකී යන අර්ථයි; සංසිද්ධිඃ, සිද්ධි යන අර්ථයි; කන්‍යා, කන්‍යාතොමෝ; සංස්කෘතා, සරසනලද්දීය යන අර්ථයි; සන්ධත්ත, ගලපයි යන අර්ථයි; සංගෘහ්ණාති, පිළිගනී යන අර්ථයි; සංක්‍රුද්ධඃ, කිපියේය යන අර්ථයි; සංයාති, අභිමුඛව යේ යන අර්ථයි.

(v) අනුතු, 'අනු' ශබ්දය වනාහි; වෙද, වෙදය; අධිෂ්ඨාන, අධිෂ්ඨානය; සාමීප්‍ය සමීපබවය; පශ්චාද්භාව, පසුබවය; අනුබන්ධනෙ, අනුබැඳීමය; සාම්‍ය, සමබවය; අභිමුඛ, අභිමුඛය; හීනෙෂු, හීනය යන මෙහිද; විසර්ගේ, හැරීමෙහිද; ලක්ෂණෙ, ලක්ෂණයෙහිද වැටේ.

(v) a. යථා, උදාහරණ මෙසේයි; අනුවාකම්, එනම් වෙද භාගය; අධීතෙ, හදාරයි යන තන්හිද; අනුෂ්ඨානං, පිහිටියාවූ; දෙශඃ, දෙශයෙහි යන තන්හිද; අනුමෙඝඃ, මෙඝයට සමීපව; වර්ෂති, වසී යන තන්හිද; අනුශයඃ, බැඳුනේ යන තන්හිද; අනුකෘතිඃ, සමාන කිරීමය යන තන්හිද; වත්සඃ, වසුතෙම; මාතරංඅනු, මවට අභිමුඛව; ධාවති, දිවේ යන තන්හිද; යොද්ධාරඃ, යුද්ධකරන්නාහු; අර්ජුනංඅනු, අර්ජුනයාට හීන වෙත් යන තන්හිද; අනුද්‍යූතඃ, දත්තාලදී යන තන්හිද; අසතාම්, අසත්පුරුෂයන්ගේ; ගතිඃ, ගතිතොමෝ; අනුවතම්, වතයෙහි වේ යන තන්හිද 'අනු' උපසර්ගය වේ.

(vi) අවඃ, 'අව' යන උපසර්ගයතෙම; ඥන, දැනීමය; අවලම්බ, එල්බීමය; ශුද්ධි, පිරිසිදුබවය; ඊෂද්දර්පෙ, අල්පාර්ථය යන මෙහිද; ව්‍යාප්ති, ව්‍යාප්තිය; පරාභවෙ, පිරිහීමය යන මෙහිද; වියොගෙච, වියොගයෙහිද; ලොකයොගානුසාරතඃ, වෘද්ධලොකයාගේ ප්‍රයොගානුසාරයෙන්; ඥෙයඃ, දතයුතුයි.

(vii) නිර්වියොගාත්‍යයාදෙශා-තික්‍රමෙ ලාභනිශ්චයෙ
(viii) දුර්නින්දල්පෙ කෘච්ඡ්‍රෙ-කෘශාසම්පත්ති සඞ්කටෙ.

(vii) a. යථා-නිඃ සඞ්ගාබ්‍රවීති, නිර්මේෂම්, නිර්දිෂ්ටම්, නිෂ්ක්‍රාන්තඃ, නිර්දිෂ්ටඃ, නිශ්චිතම්;

(viii) a. දුර්ගතිඃ, දුර්ජීවඃ, දුර්බලඃ, දුර්ගතඃ, දුර්දිනම්.

(ix) නානා වියොගාතිශයෙ-භෘශමොහෙ ශ වාඞ්මෘධෙ
පෛශුන්‍යාස්මරණෙ භූෂෙ-ශද්වා නයිමුඛ්‍යකෙ,
අනවස්ථා මුඛ්‍ය ගෞණත්ව-දර්ශනෙ විරුද්ධ භාවනඃ.

---

(vi) a. යථා, උදාහරණ මෙසේයි; අවිඃ, අවියතෙම; අවගතඃ, දන්නාලදී යන තන්හිද; යෂ්ටි, සැරයටිය; අවලම්බ්‍ය, එල්බ ගෙන; ගච්ඡති, යෙයි යන තන්හිද; අවදාතඃ, පිරිසිදුය යන තන්හිද; අවලම්බ්‍යතෙ, මදක් එල්බෙයි යන තන්හිද; අවකීර්ණම්, ගැවසිගත්තේය යන තන්හිද; අවසන්නානි, පිරිහෙලත් යන තන්හිද; අවයාතඃ, පහව ගියේය යන තන්හිද 'අව' උපසර්ගය වේ.

(vii) නිර්, 'නිර්' යන උපසර්ගයතෙම; වියොග, වෙන්වීමය; අත්‍යය, ඉකුත්වීමය; ආදෙශ, ආඥවය; අතික්‍රමෙ, අතික්‍රමය; ලාභ, ලැබීමය; නිශ්චිතෙ, නිශ්චය යන මෙහි වැටේ.

(viii) දුර්, 'දුර්' යන උපසර්ගයතෙම; ඊෂදර්ථෙ, අල්පාර්ථ යෙහිද; කෘච්ඡ්‍රෙ, දුක්වූ යන අර්ථයෙහිද; කෘශ, කෘශය; අසම්පත්ති, අසමෘද්ධිය; සඞ්කටෙ, සම්බාධය යන මෙහි ද වැටේ.

(vii) a. යථා, උදාහරණ මෙසේයි; නිඃසඞ්ගඃ, ඇලුම් නැතිව; බ්‍රවීති, කියයි යන තන්හිද; නිර්මෙෂම්, මෙසවැලැක්ම යන තන්හිද; නිර්දිෂ්ටම්, නියොගකරනලදී; යන තන්හිද නිෂ්ක්‍රාන්තඃ, නික්මුනේය යන තන්හිද; නිර්දිෂ්ටඃ, දක්වනලදී යන තන්හිද; නිශ්චිතම්, නිශ්චය කරනලදී යන තන්හිද 'නිර්' උපසර්ගය වේ.

(viii) a. දුර්ගතිඃ, දුර්ගතිය යන තන්හිද; දුර්ජීවඃ, දුකසේ ජීවත්වීමය යන තන්හිද; දුර්බලඃ, දුර්බලය යන තන්හිද; දුර්ගතඃ, දුගීතැනැත්තේ යන තන්හිද; දුර්දිනම්, වැලලි දිනය යන තන්හිද 'දුර්' උපසර්ගය වේ.

(ix) වි, 'වි' යන උපසර්ගයතෙම; නානා, නානාර්ථය; වියොග, වෙන්වීමය; අතිශයෙ, අතිශයය; භෘශ, බාහුල්‍යය; මොහ, මූලාබවය; ඊශ, ඊශ්වරය; වාඞ්මෘධෙ, වාක් කලහය යන මෙහිද; පෛශුන්‍ය, පිසුනුවචනය; අස්මරණෙ, සිහිනොකිරීමය; භූෂ,

**(ix) ඍ. යථා-විමුක්තඃ, විකීර්ණඃ, විතටා නද්‍යඃ (මහත්‍ය ඉත්‍යර්ථඃ), විමනස්කඃ, විභුඃ, විවදනෙන, විගායති, විස්මෘතඃ, විභූෂිතඃ, විලොපිතඃ, විමුඛඃ, විභ්‍රාන්තඃ, විශිෂ්ටඃ, වික්‍රාන්තඃ, විලොකයති.**

**(x) ආඞිච්ඡාභය වාක්‍යෙෂ-දර්ථ ශ්ලෙෂාදි කර්මණි**
**බන්ධනෙ'භි විධෞ ශාඨ්‍ය-කෘච්ඡ්‍ර සාමීප්‍ය සංශ්‍රයෙ**
**අභිමන්ත්‍ර නිවෘත්ත්‍යාශා-දානානුභවවිස්මයෙ**
**ප්‍රතිෂ්ඨාදෙශ මර්‍යාද-ස්පර්ධා මුඛ්‍යෝර්ධ්ව කර්මණි.**

---

සැරසීමය; ඊෂදර්ථ, අල්පාර්ථය; අනභිමුඛ්‍යතෙ, අභිමුඛ නොවන බවය; අනවස්ථා, මනාපිහිටීමය; මුඛ්‍ය, ප්‍රධානය; ශෞර්‍ය, ශූර බවය; දර්ශනෙ, දැක්මය යන මෙහි උදාහෘතඃ, කියන ලදී.

(xi) ඍ. යථා, උදාහරණ මෙසේයි. විමුක්තඃ, මිදුනේය යන තන්හිද; විකීර්ණඃ, විසුරුණේය යන තන්හිද; විතටා නද්‍යඃ, නදීහු පැතුරුණාහුය (මහත්‍ය ඉති අර්ථඃ, මහත්ය යන අර්ථයි) යන තන්හිද; විමනස්කඃ, මුලා සිත් ඇත්තේය යන තන්හිද; විභුඃ, ඊශ්වරය යන තන්හිද; විවදනෙන, විරුඩවාදකෙරෙත් යන තන්හිද; විගායති, පිසුනු කියයි යන තන්හිද; විස්මෘතඃ, අමතකවී යන තන්හිද; විභූෂිතඃ, සැරසුනේය යන තන්හිද; විලොපිතඃ, මදක් නසන ලදී යන තන්හිද; විමුඛඃ, පිටුපෑයේය යන තන්හිද; විභ්‍රාන්තඃ, චංචලවිය යන තන්හිද; විශිෂ්ටඃ, උතුම්ය යන තන්හිද; වික්‍රාන්තඃ, ශෞර්‍ය ඇත්තේ යන තන්හිද; විලොකයති, බලයි යන තන්හිද 'වි' උපසර්ගය වේ.

(x) ආඞ්, 'ආඞ්' යන උපසර්ගයතෙම; ඉච්ඡා, කැමැත්තය; භය, බියය; වාක්‍ය, වාක්‍යසමරණය; ඊෂදර්ථ, අල්පාර්ථය; අශ්ලෙෂ, වැළඳගැන්මය; ආදිකර්මණි, පටන්ගැන්මය යන මෙහිද; බන්ධනෙ, බන්ධනයෙහිද; අභිවිධෞ, අභිවිධියෙහිද හෙවත් ගනු ලබන සීමාවෙහිද; ශාඨ්‍ය, ශඨබවය; කෘච්ඡ්‍ර, දුකය; සාමීප්‍ය, සමීපබවය; සංශ්‍රයෙ ආශ්‍රය යන මෙහිද; අභිමන්ත්‍ර, අභිමන්ත්‍රණය; නිවෘත්ති, නැවැත්මය; ආශා, ආශාවය; ආදාන, ගැන්මය; අනුභව, වැළඳීමය; විස්මයෙ, ආශ්චර්‍යය යන මෙහිද; ප්‍රතිෂ්ඨා, පිහිටය; ආදෙශ, නියොගය; මර්‍යාද, හැරදමනසීමාවය; ස්පර්ධා, වහසි බිනීමය; ආමුඛ්‍ය, අභිමුඛබවය; ඌර්ධ්වකර්මණි, උස් කිරීමය යන මෙකී අර්ථයන්හි වැටේ.

(x) ෂ. යථා-ආකාඞ්ක්ෂති, ආබිභෙති, ආජානාති, ආතාම්‍රනඛඃ, ආලිඞ්ගති, ආරභතෙ, කවචමාබන්ධති, ආකුමාරං යශඃ, ආචරති කපටෙන, ආහතඃ, ආසන්නාවයම්, ආවසථඃ, ආමන්ත්‍රණම්, ආධාවති, ආශාසෙත. ආදත්තෙ, ආශිතම්, ආ එවං කිල තත්, ආසපදම්, ආදිෂ්ටඃ, ආමුක්තෙර්දුඃඛම්, ආහ්වයතෙ මල්ලං මල්ලඃ, ආගච්ඡති, ආරොහති පර්වතම්.

(xi) නිරාශ්‍යධො භාශාදෙශ-නිත්‍යකෞශලබන්ධනෙ
අන්තර්භාවෙ සමීපෙ නිර්-දර්ශනොපරමාශ්‍රයෙ.
(xii) අධිරධ්‍යයනෛශ්වර්ය-වශිත්ව ස්මරණාධිකෙ.

(xi) ෂ. යථා-නිකරෙති මණීනාම්, නිපතති, නිශායිතඃ,

---

(x) ෂ යථා, උදාහරණ මෙසේයි; ආකාඞ්ක්ෂති, කැමතිවේ; ආබිභෙති, බියවේ; ආජානාති, දැනගනී; ආතාම්‍රනඛඃ, මදක් තඹවන් නිය ඇත්තේය; ආලිඞ්ගති, වැළඳගනී; ආරභතෙ, පටන් ගනී; කවචම් ආබන්ධති, සන්නාහය බිඳී; ආකුමාරං යශඃ, ළදරු කල දක්වා යසසයි; කපටෙන ආචරති, ශඨ බැවින් ක්‍රියා කෙරෙයි; ආහතඃ, අතිශයින් වෙහෙසනලදී; වයං, අපි, ආසන්නාඃ, ළංවූයෙමු; ආවසථඃ, ලගිනා ගෙයයි; ආමන්ත්‍රණම්, ඇමතීමය; ආධාවති, ආපසුදිවේ; තෙ ආශාඃ, තාගේ ආශාවෝය; ආදත්තෙ, ගනී; ආශිතම්, වළඳනලදී; ආමුක්තිඃ දුඃඛම්, මුක්තිය දක්වා දුකයි; මල්ලඃ, මල්ලතෙම; මල්ලම්, මල්ලවයාහට; ආහූයතෙ, සපර්ධාකෙරෙයි; ආගච්ඡති, ඉදිරියටයෙයි; පර්වතම්, පර්වතයට, ආරොහති, නගී යන මේ ආදි තන්හි 'ආඞ්' උපසර්ගය වේ.

(xi) නි, 'නි' යන උපසර්ගයතෙම; රාශි, රැස්කිරීමය; අධො, අධොභාගය; අභාශ, අබාහුල්‍යය, ආදෙශ, දැක්වීමය; නිත්‍ය, නිත්‍යය; කෞශල, නිපුණබවය; බන්ධනෙ, බැඳීමය යන මෙහිද; අන්තර්භාවෙ, ඇතුළත්බැව්හිද; සමීපෙ, සමීපයෙහිද; දර්ශනෙ, දැකීම හා; උපරම, වෙන්වීමය; ආශ්‍රයෙ, ආශ්‍රය යන මෙහිද වැටේ.

(xii) අධිඃ, 'අධි' උපසර්ගයතෙම; අධ්‍යයන, හැදෑරීමය; ඓශ්වර්‍ය්‍ය, ඉසුරුබවය; වශිත්ව, වශීබවය; ස්මරණ, සිහිකිරීමය; අධිකෙ, අධිකය යන මෙහි වැටේ.

**නිදර්ශිතම්, නිවිශතෙ, නිපුණඃ, නිබන්ධඃ, නිපීතමුදකඃ සිකතාභිඃ, නිකෘෂ්ටඃ, නිදර්ශනම්, නිවෘත්තඃ පණ්ඩිතඃ, නිලයඃ.**

(xii) a. **උපාධ්‍යායාදධීතෙ, අධිපතිඃ, අධීනඃ, මාතුරධ්‍යෙති, අධිකෘතම්.**

(xiii) **අපිඃ සම්භව ගර්හාශීර්-මෘතිභූෂා සමුච්චයෙ**
(xiv) **වික්‍රමාතික්‍රමා බුධ-භෘශාර්ථාතිශයෙෂ්වති.**

(xiii) **ෂ. යථා-අපි ප්‍රයොජනමස්ති, අපි පාපිනඃ, භද්‍රමපි, මරණමපි, අපිනහ්‍යති හරම්, තදපි වික්‍රාමති.**

(xiv) **ෂ. අතිරථඃ, අතික්‍රාමති, අතිගහනම්, අතිතප්තම්, අතිමනුතෙ.**

---

(xi) ෂ. යථා, උදාහරණ මෙසේයි; මණිතාම්, මාණික්‍යයන්; නිකරෙති, රැස්කෙරෙයි; නිපතති, වැටෙයි; නිගෘහිතඃ, නිග්‍රහ කරනලදී; නිදර්ශිතම්, දක්වනලදී; නිවිශතෙ, ප්‍රවෙශවෙයි; නිපුණඃ, සමර්ථයි; නිබන්ධඃ, බඳනාලදී; සිකතාභිඃ, වැලි විසින්; උදකං, ජලය; නිපීතම්, බොනලදී; නිකෘෂ්ටඃ, සමීපය; නිදර්ශනම්, උදාහරණය; පණ්ඩිතඃ, දූතෙලියෙන්; නිවෘත්තඃ, වැළැක්කේය; නිලයඃ, ලගිනතැනයි යන මේ ආදී තන්හි 'නි' උපසර්ගය වේ.

(xii) ෂ. උපාධ්‍යායාත්, උපාධ්‍යායයා කෙරෙන්; අධිතෙ, හදාරයි; අධිපතිඃ, ඊශ්වරයි; අධීනඃ, අයිතියි; මාතුරධ්‍යෙති, මව සිහිකෙරෙයි; අධිකෘතම්, අධික කිරීමය යන මේ ආදී තන්හි 'අධි' උපසර්ගය වේ.

(xiii) අපි, 'අපි' උපසර්ගයතෙම; සම්භව, සම්භාවනය; ගර්හා, ගැරහීමය; ආශිඃ, ආශීර්වාදය; මෘති, මරණය; භූෂා, සැරසීමය; සමුච්චයෙ, රැස්කිරීමය යන මෙහි වැටේ.

(xiv) වික්‍රම වික්‍රමය; අතික්‍රම, ඉක්මීමය; අබුධ, නොදන්නා ලද්දය; භෘශාර්ථ, බාහුල්‍යාර්ථය; අතිශයෙෂු, අතිශයාර්ථය යන මෙහි; අති, 'අති' උපසර්ගය වැටේ.

(xiii) ෂ. යථා, උදාහරණ මෙසේයි; අපි ප්‍රයොජනම් අස්ති, ඉදින් ප්‍රයොජන ඇතහොත්; අපි පාපිනඃ, අහෝ පාපීහුය; භද්‍රම් අපි, යහපතක් වේවා; මරණම් අපි, මරණයයි; හරම්, ඊශ්වරයා; අපිනහ්‍යති, සරසයි; තදපි, හෙද; වික්‍රමති, ආක්‍රමණය කෙරෙයි යන ආදී තන්හි; 'අපි' උපසර්ගය වේ.

(xiv) ෂ. අතිරථඃ, වික්‍රමරථයයි; අතික්‍රාමති, ඉක්මවයි; අතිගහනම්, ඉතා ආකූලයි; අතිතප්තම්, බොහෝ තැවුනේය; අතිමනුතෙ, ඉතා දනී යන ආදී තන්හි 'අති' උපසර්ගය වේ

**(xv) ප්‍රශංසානුමතෙ පූජා-භෘශකෘච්ඡ්‍රශුභෙෂු සුඃ**
**(xvi) උත්ප්‍රාබල්‍ය වියොගොර්ධ්ව-කර්මලාභ ප්‍රකාශනෙ**
**ආශ්චර්‍ය්‍යෙ මොක්ෂණෙ'භාවෙ-චලප්‍රාධාන්‍ය ශක්තිෂු.**

**(xv) උ. යථා-සුරූපඃ, සුකෘතම්, සුසාධුඃ, සුතප්තඃ, සුදුෂ්කරම්, සුගන්ධඃ.**

**(xvii) උ. උද්බලඃ, උද්ගච්ඡති, උත්තිෂ්ඨති, උත්පතනම්, උච්චරති, උත්සුකඃ, උද්ගතො'ශ්වඃ, උත්පථඃ, උත්කඃ, උද්දිෂ්ටඃ, උත්සාහඃ.**

**(xvii) අභිපූජා භෘශෙච්ඡා-ව්‍යාධිසාම්‍යාභි මුඛ්‍යතො**
**සාරූප්‍ය වචනාහාර-ස්වාධ්‍යායෙෂු නිරූපිතඃ.**

---

(xv) සුඃ, 'සුඃ' උපසර්ගයතෙම; ප්‍රශංසා, ප්‍රශංසාය; අනුමතෙ අනුමතය යන මෙහිද; පූජා, පූජාය; භෘශ, අතිශයය; කෘච්ඡ්‍ර දුක්ඛය; ශුභෙෂු, ශුභය යන මෙහිද වැටේ.

(xvi) උත්, 'උත්' උපසර්ගයතෙම; ප්‍රාබල්‍ය, ප්‍රබලබවය; වියොග, වෙන්වීමය; ඌර්ධ්වකර්ම, උඩුකුරු ක්‍රියාය; ලාභ, ලාභය; ප්‍රකාශනෙ, ප්‍රකාශකිරීමය; ආශ්චර්‍ය්‍යෙ, ආශ්චර්‍ය්‍යයෙහිය; මොක්ෂණෙ, මිදීමය; අභාවෙ, අභාවය; චල, චංචලය; ප්‍රාධාන්‍ය, ප්‍රධානබවය; ශක්තිෂු, ශක්තිය යන මෙහි වැටේ.

(xv) උ යථා, ඊට උදාහරණ මෙසේයි; සුරූපඃ, මනා රූ ඇත්තේය; සුකෘතම්, මැනවි; සුසාධුඃ, අතිශයින් යහපති; සුතප්තඃ, ඉතා තැවුනේය; සුදුෂ්කරම්, ඉතා දුෂ්කරය; සුගන්ධඃ, ශොභන ගන්ධය යන ආදී තන්හි 'සුඃ' උපසර්ගය වේ.

(xvi) උ. උද්බලඃ, මහත්බල ඇත්තේය; උද්ගච්ඡති, උස්වයේ; උත්තිෂ්ඨති, නැගිසිටී; උත්පතනම්, උපති; උච්චරති, කියයි; උත්සුකඃ, උකටලිය; අශ්වතඃ උත්ගතඃ, අශ්වතෙම මිදුනේය උත්පථඃ, නොමගය; උත්කඃ චංචල සිත් ඇත්තේය; උද්දිෂ්ටඃ ප්‍රමාණකොට කියනලදී; උත්සාහඃ, උත්සාහයයි මේ ආදී තන්හි 'උත්' උපසර්ගය වේ.

(xvii) අභි, 'අභි' උපසර්ගයතෙම; පූජා, පූජාය; භෘශාර්ථ; අතිශයාර්ථය; ඉච්ඡා, කැමැත්තය; ව්‍යාධි, රොගය; සාම්‍ය සමානත්වය; අභිමුඛ්‍යතො, අභිමුඛාර්ථය යන මෙහිද; සාරූප්‍ය සරූපබවය; වචන, වචනය; ආහාර, ආහාරය; ස්වාධ්‍යායෙෂු හැදෑරීමය යන මෙහිද; නිරූපිතඃ, දක්වනලදී.

(xvii) a. යථා-අභිවන්දතෙ, අභියුක්තඃ, අභිලිප්සතෙ, අභිෂ්‍යන්දො ව්‍යාධිඃ, අභිජාතඃ, අභිමුඛම්, අභිරූපඃ, අභිධානම්, අභ්‍යවහරති, අභ්‍යස්‍යති.

(xviii) සාදෘශ්‍යාදාන හිංසාඛ්‍යා-තෘතෞප්‍රති නිෂෙධෙ ක්වචිත්
ව්‍යාධ්‍යාභිමුඛ්‍යයොර්ව්‍යාප්තෞ-වාරණෙ ප්‍රතිරුච්‍යතෙ.

(xviii) a. යථා-දෙවදත්තස්‍ය ප්‍රති, ප්‍රතිගෘහ්ණාති, ප්‍රතිහන්ති, ප්‍රතිශ්‍රුතම්, අභිමන්‍යුරර්ජුනතඃ ප්‍රති, ප්‍රතිශ්‍යායඃ, ප්‍රතිසූර්‍ය්‍යං ගච්ඡති, ප්‍රතිකිරණං පාංශුභිඃ, ප්‍රතිෂිද්ධඃ.

(xix) පරිඃ සමන්තතොභාව-ව්‍යාධිදෙශකථාසුච
භූෂාශ්ලෙෂෙ පූජනෙච-වර්ජනෙවසනෙ'ශුභෙ.

(xix) a. යථා-පරිභ්‍රමති, පරිශ්‍රමඃ, පරිවාදඃ, පරිෂ්කරොති, පරිෂ්වජතෙ, පරිචරති ගුරූම්, පරිවර්ජනමෙෂ්‍යා වාමෂ්ටා දෙවඃ, පරිධත්ත වාසඃ, පරිදෙවනම්.

---

(xvii) a. යථා, ඊට උදාහරණ මෙසේයි; අභිවන්දතෙ, වඳී; අභියුක්තඃ, අතිශයින් යෙදුනේය; අභිලිප්සතෙ, කැමැති වේ; අභිෂ්‍යන්දො ව්‍යාධිඃ, අභිෂ්‍යන්ද නම් නෙත්‍රරොගයයි; අභිජාතඃ, සමානව උපන්නේය; අභිමුඛම්, අභිමුඛය; අභිරූපඃ, මනා රූ ඇත්තේය; අභිධානම්; කථනයයි; අභ්‍යවහරති, හදරයි; අභ්‍යස්‍යති, හදරයි යන ආදී තන්හි 'අභි' උපසර්ගය වේ.

(xviii) ප්‍රතිඃ, 'ප්‍රති' උපසර්ගයතෙම; සාදෘශ්‍ය, සමානත්වය; ආදාන, ගැනීමය; හිංසා, නැසීමය; අඛ්‍යාතෘතෞ, පිළිගැන්මය යන මෙහිද; ක්වචිත්, කිසිතැනෙක්හි; ප්‍රතිනිෂෙධෙ, සමානත්ව යෙහිද; ව්‍යාධි, රොගය; ආභිමුඛ්‍යයොඃ, අභිමුඛත්වය යන දෙක්හිද; ව්‍යාප්තෞ, ව්‍යාප්තියෙහිද; වාරණෙ, වැළැක්මෙහිද; උච්‍යතෙ, කියනුලැබේ.

(xviii) a. යථා, ඊට උදාහරණ මෙසේයි; දෙවදත්තස්‍යප්‍රති, දෙවදත්තයාහට සමානයි; ප්‍රතිගෘහ්ණාති, පිළිගනී; ප්‍රතිහන්ති, නසයි; ප්‍රතිශ්‍රුතම්, ගිවිස්නාලදී; අභිමන්‍යුඃ අර්ජුනතඃප්‍රති, අභිමන්‍යුරජතෙම අර්ජුනයා පිණිසය; ප්‍රතිශ්‍යායඃ, එනම් රොගය; ප්‍රතිසූර්‍ය්‍යං ගච්ඡති, සූර්‍ය්‍යයාට අභිමුඛවයෙයි; පාංශුභිඃ ප්‍රතිකිරණං, පසින් ගැවසුනේය; ප්‍රතිෂිද්ධඃ, වලක්වනලදී.

(xix) පරිඃ,'පරි' උපසර්ගයතෙම; සමන්තතොභාවී, හාත්පසය; ව්‍යාධි, රොගය; දෙශකථාසුච, දෙශකථනය යන මෙහිද; භූෂා, සැරසීමය; ආශ්ලෙෂෙ, වැළඳගැන්මය යන මෙහිද; පූජනෙච, පිදීමෙහිද; වර්ජනෙ, දුරලීමෙහිද; වසනෙ, ඇඳීමෙහිද; අශුභෙ, අශුභයෙහිද වැටේ.

(xix) a. යථා, ඊට උදාහරණ මෙසේයි; පරිභ්‍රමති, සිසාරයි; පරිශ්‍රමඃ, විඩාවයි; පරිවාදඃ, නුගුණකිමයි; පරිෂ්කරොති, සකස් කෙරෙයි; පරිෂ්වජතෙ, වැළඳගනී; ගුරුම්පරිචරති, ගුරුනු

(xx) උපසාමීප්‍යසාමර්ථ්‍ය-ව්‍යාප්ත්‍යාධිකෘත්‍යෞමෘත්‍යෞ
දෙෂදානක්‍රියාවීප්සා-රම්භාධ්‍යයන පූජනෙ.

a. කෘෂ්ණාචාර්‍ය්‍යෛඃ කෘතාඃ ශ්ලොකා උපසර්ගාර්ථ
සංග්‍රහෙ.

(xx) b. යථා-උපකුම්භම්, උපකරොති මිත්‍රෙභ්‍යඃ, උපකීර්ණඃ පාංශුභිරාචාර්‍ය්‍යම්, උපදිශති ශිෂ්‍යෙභ්‍යඃ, උපරතඃ, උපශාන්තඃ, උපහරත්‍යර්ථං දෙවදත්තාය, උපචාරඃ, දෙවං දෙවමුපචරති, උපක්‍රමතෙ හොතාතුම්, උපාධ්‍යායා දධීතෙ, උපචරිතඃ පිතා පුත්‍රෙණ.

c. අස්මිංස්තු මාවිංශති විධානාමුපසර්ගාණාමර්ථ නිරූපණෙ නිර්දුරොරභෙදරූපෙණ විංශතිධා කථනමවගන්තව්‍යම්.

---

මෙහෙ කෙරේයි; දෙවඃ, මෙඝයතෙම; පරිවනෙභ්‍යඃ, වනයන් හැර; වෘෂ්ටඃ, වැස්සේය; වාසඃ පරිධත්තෙ, වස්ත්‍රයහඳී; පරිදෙවනම්; වැලපිමයි යන ආදී තන්හි 'පරි' උපසර්ගය වැටේ.

(xx.) උප, 'උප' සර්ගයතෙම; සාමීප්‍ය, සමීපබවය; සාමර්ථ්‍ය; සමර්ථබවය; ව්‍යාප්ති, පැතිරීමය; අධිකෘත්‍යෙ, අධික ක්‍රියාය; මෘත්‍යෞ, මරණය; දෙෂ, දෙෂය; දාන, දීමය; ක්‍රියා, ක්‍රියාය; වීප්සා, වීප්සාය; ආරම්භ, ආරම්භය; අධ්‍යයන, හැදෑරීමය; පූජනෙ, පිදීමය යන මෙහි වැටේ.

a. කෘෂ්ණාචාර්‍ය්‍යෛඃ, කෘෂ්ණාචාර්‍ය්‍යයන් විසින්; උපසර්ගාර්ථ සඞ්ග්‍රහෙ, උපසර්ගයන්ගේ අර්ථසඞ්ග්‍රහයෙහි; ශ්ලොකාඃ, ශ්ලොකයෝ; කෘතාඃ, කරනලද්දාහ.

(xx) b. යථා, ඊට උදාහරණ මෙසේයි; උපකුම්භම්, කුම්බසමීපයෙහි; මිත්‍රෙභ්‍යඃ, මිතුරන්ට; උපකරොති, උපකාරකෙරෙයි; පාංශුභිඃ, පසින්; ආචාර්‍ය්‍යම්, ආචාර්‍ය්‍යයා; උපකීර්ණඃ, ව්‍යාප්ත කෙළේය; ශිෂ්‍යෙභ්‍යඃ උපදිශති, ශිෂ්‍යයන්ට උපදෙස් දෙයි; උපරතඃ, මළේය; උපශාන්තඃ, නැසීමය; දෙවදත්තාය, දෙව්දත්හට; අර්ථම් උපහරති, ධනයදෙයි; උපචාරඃ, යොග්‍යක්‍රියායි; දෙවං දෙවං උපචරති, දෙවියෙකු දෙවියෙකු පාසා පුදයි; හොතාතුම්, වළඳන්ට උපක්‍රමතෙ, පටන්ගනී; උපාධ්‍යායාත් අධීතෙ, උපාධ්‍යායයා කෙරෙන් හදාරයි; පුත්‍රෙණ, පුත්‍රයා විසින්; පිතා, පියතෙම; උපචරිතඃ, පුදනලදී යන ආදී තන්හි 'උප' උපසර්ගය වේ.

c. අස්මිං සතු, මෙහි වනාහි; මාවිංශතිවිධානාම්, දෙවිසි වැදෑරුම්; උපසර්ගාණාම්, උපසර්ගයන්ගේ; අර්ථනිරූපණෙ, අර්ථ දැක්වීමෙහි; නිර්දුරොඃ, 'නිර්' 'දුර්' දෙදෙනාගේ; අභෙදරූපෙණ, නොවෙනස් කොට ගැන්මෙන්; විංශතිධා, විසිපරිද්දෙකින්; කථනම්, කීම; අවගන්තව්‍යම්, දතයුතුයි.

සංස්කෘත

# ක්‍රියාමාලාපී ව්‍යාඛ්‍යානය.

a. නමස්සර්වඥාය.

b. ලඩ් වර්ත්මානෙ නිත්‍යං ස්‍යාද්භූතෙ ලඞ් ලුඞ් ලිට්ස්තථා।
විධ්‍යාශිෂොස්තු ලිඞ් ලොටෞ-ලුඞ් ලෘඞ් ලෘට්ච භවිෂ්‍යති.

c. ලට්, විධිලිඞ්, ලොට්, ලඞ්, ලුඞ්, ලිට්, ලුට්, ආශිර්, ලිඞ්, ලෘට්, ලෘඞ් ඉති දශ ලකාරාඃ ක්‍රමාත් ප්‍රදර්ශ්‍යන්තෙ.

d. භූ-සත්තායාම්, ශබ්විකරණඃ අකර්මකඃ පරස්මෛපදී, ප්‍රාපත්‍යර්ථෙ තු සකර්මක උභයපදී.

e වර්තමානෙලට්-3. 2. 123.

---

a. සර්වඥාය, සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේට; නමඃ, නමස්කාර වේවා.

b. ලඩ්, 'ලඩ්' විභක්තිතොමෝ; නිත්‍යං, අවිකල්පයෙන්; වර්තමානෙ, වර්තමානකාලයෙහි; ස්‍යාත්, වෙයි; තථා, එසේම; ලඞ් ලුඞ් ලිටඃ, 'ලඞ්', 'ලුඞ්', 'ලිට්' යන විභක්තීහු; භූතෙ, අතීත කාලයෙහි වෙත්; ලිඞ් ලොටෞ, 'ලිඞ්' 'ලොට්' දෙදෙන; විධ්‍යාශිෂොස්තු, විධ්‍යර්ථ ආශිස් අර්ථ දෙක්හි වෙත්; ලුඩ්, 'ලුඩ්' විභක්තිද; ලෘඞ්, 'ලෘඞ්' විභක්තිද; ලෘට්ච, 'ලෘට්' විභක්තිද; භවිෂ්‍යති, අනාගතයෙහි වෙත්.

c. ලට්, ලට්'ය; විධිලිඞ්, 'විධිලිඞ්'ය; ලොට්, 'ලොට්'ය; ලඞ්, 'ලඞ්'ය; ලුඞ්, 'ලුඞ්'ය; ලිට්, 'ලිට්'ය; ලුට්, 'ලුට්'ය; ආශිර්, 'ආශිර්'ය; ලිඞ්, 'ලිඞ්'ය; ලෘට්, 'ලෘට්'ය; ලෘඞ් ඉති, ලෘඞ්'ය යන; දශලකාරාඃ, දශලකාරයෝ; ක්‍රමාත්, ක්‍රමයෙන්; ප්‍රදර්ශ්‍යන්තෙ, දක්වනු ලැබෙත්.

d. භූ, 'භූ' යන ධාතු; සත්තායාම්, විද්‍යමානබැව්හි වැටේ හෙවත් වීමෙහි වැටේ. ශබ් විකරණඃ, 'ශ' ප්‍රත්‍යය විකරණ කොට ඇත්තේය; අකර්මකඃ, කර්මනැත්තේය; පරස්මෛපදී, පරස්මෛපද රූප ඇත්තේය; ප්‍රාපත්‍යර්ථෙතු, පැමිණීම් අර්ථයෙහිවූ 'භූ' ධාතුව වනාහි හෙවත් 'භූ'-ප්‍රාප්තෞ, යන ධාතුව වනාහි; සකර්මකඃ, කර්මඇත්තේය; උභයපදී, පරස්මෛපද ආත්මනෙපද යන රූපවයම ඇත්තේය.

e. 'වර්තමානෙලට්' යනු 'ලට්'විභක්ති විධාන සූත්‍රයි; වර්තමානෙ යන පදය ලට් යනු පදයි. වර්තමානෙ, වර්තමාන කාලයෙහි; ලට්, ලට් විභක්ති වේ.

a. තිප්, තස්, අන්ති, සිප්, ථස්, ථ, මිප්, වස්, මස්, තෙ, ආතෙ, අන්තෙ, සෙ, ආථෙ, ධ්වෙ, ඒ, වහෙ, මහෙ.

b. කර්තරි පරස්මෛපදෙ–

| | | |
|---|---|---|
| සඃ භවති | තෞ භවතඃ | තෙ භවන්ති |
| ත්වම් භවසි | යුවාම් භවතඃ | යූයම් භවථ |
| අහම් භවාමි | ආවාම් භවාවඃ | වයම් භවාමඃ. |

---

a. තිප්, තස්, අන්ති, සිප්, ථස්, ථ, මිප්, වස්, මස්, තෙ, ආතෙ, අන්තෙ, සෙ, ආථෙ, ධ්වෙ එ, වහෙ, මහෙ, යනු ලට් විභක්ති ප්‍රත්‍යය සංඥ සූත්‍රයි; තිප්, තස්, අන්ති, සිප්, ථස්, ථ, මිප්, වස්, මස්, ‘තිප්’ය, ‘තස්’ය, ‘අන්ති’ය, ‘සිප්’ය ‘ථස්’ය, ‘ථ’ය‘, මිප්’ය, ‘වස්’ය, ‘මස්’ය යන ප්‍රත්‍යයනවදෙන පරස්මෛපදනම් වෙත්; තෙ, ආතෙ, අන්තෙ, සෙ, ආථෙ, ධ්වෙ, එ, වහෙ, මහෙ, ‘තෙ’ය, ‘ආතෙ’ය, ‘අන්තෙ’ය, ‘සෙ’ය, ‘ආථෙ’ය, ‘ධ්වෙ’ය, ‘එ’ය, ‘වහෙ’ය, ‘මහෙ’ය යන ප්‍රත්‍යය නවදෙන ආත්මනෙපදනම් වෙත්; ‘තිප්, තස්, අන්ති’ යනු ප්‍රථම පුරුෂයි; ‘සිප්, ථස්, ථ’ යනු මධ්‍යම පුරුෂයි; ‘මිප්, වස්, මස්’ යනු උත්තම පුරුෂයි; ‘තෙ, ආතෙ, අන්තෙ’ යනු ප්‍රථම පුරුෂයි; ‘සෙ, ආථෙ, ධ්වෙ’ යනු මධ්‍යම පුරුෂයි; ‘එ, වහෙ, මහෙ’ යනු උත්තම පුරුෂයි.

b. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] භවති, සුවපත්වෙයි; තෞ, ඔහුදෙදෙන, [සුඛිනෞ] භවතඃ, සුවපත් වෙත්; තෙ, ඔහුතුමූ; [සුඛිනඃ] භවන්ති, සුවපත් වෙත්. ත්වම්, තෝ; [සුඛී] භවසි, සුවපත් වෙහි; යුවාම්, තොපි දෙදෙන; [සුඛිනෞ] භවථඃ, සුවපත්වහු; යූයම්, තෙපි; [සුඛිනඃ] භවථ, සුවපත්වහු; අහම්, මම; [සුඛී] භවාමි, සුවපත් වෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භවාවඃ, සුවපත්වෙමූ; වයම්, අපි; [සුඛිනඃ] භවාමඃ, සුවපත් වෙමූ. (මේ ‘භූ’-සත්තායාම්, යන අකර්මකධාතුවයි.)

[‘භූ’-ප්‍රාප්තෞ, යන සකර්මක ධාතුවෙහි මෙසේ පදයොජනා කළයුතුයි.]

[සඃ සුඛං භවති, හෙතෙම සැපයට පැමිණේ; තෞ සුඛං භවතඃ, ඔහුදෙදෙන සැපයට පැමිණෙත්; තෙ සුඛං භවන්ති, ඔහු තුමූ සැපයට පැමිණෙත්; ත්වම් සුඛං භවසි, තෝ සැපයට පැමිණෙහි; යුවාම් සුඛං භවථඃ, තෙපි දෙදෙන සැපයට පැමිණෙවු; යූයාම් සුඛං භවථ, තෙපි සැපයට පැමිණෙවු; අහම්

a. කත්තරි ආත්මනෙ පදං-

| | | |
|---|---|---|
| සඃ භවතෙ | තෞ භවෙතෙ | තෙ භවන්තෙ |
| ත්වම් භවසෙ | යුවාම් භවෙථෙ | යූයම් භවධ්වෙ |
| අහම් භවෙ | ආවාම් භවාවහෙ | වයම් භවාමහෙ. |

b. කර්මණි-

තෙන, තාභ්‍යාම්, තෛඃ; ත්වයා, යුවාභ්‍යාම්, යුෂ්මාභිඃ, මයා, ආවාභ්‍යාම්, අස්මාභිඃ.

| | | |
|---|---|---|
| c. සඃ අනුභූයතෙ | තෞ අනුභූයෙතෙ | තෙ අනුභූයන්තෙ |
| ත්වම් අනුභූයසෙ | යුවාම් අනුභූයෙථෙ | යූයම් අනුභූයධ්වෙ |
| අහම් අනුභූයෙ | ආවාම් අනුභූයාවහෙ | වයම් අනුභූයාමහෙ. |

---

සුඛං භවාමි, මම සැපයට පැමිණෙමි; ආවාම් සුඛං භවාවඃ, අපි දෙදෙන සැපයට පැමිණෙමු; වයම් සුඛං භවාමඃ, අපි සැපයට පැමිණෙමු; 'භූ'-සත්තායාම්, යන අකර්මකධාතුවට කර්තෲකාරක පරස්මෛපදය මිස ආත්මනෙපදය වරනැගීමක් නොමැතියි.]

a. කර්තරි ආත්මනෙපදෙ, කර්තෲකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛං] භවතෙ, සැපයට පැමිණේ; තෞ, ඔහු දෙදෙන; [සුඛං] භවෙතෙ, සැපයට පැමිණෙත්; තෙ, ඔහුතුමූ; [සුඛං]භවන්තෙ, සැපයට පැමිණෙත්; ත්වම්, තෝ; [සුඛං] භවසෙ, සැපයට පැමිණෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං] භවෙථෙ සැපයට පැමිණෙවු; යූයම්, තෙපි; [සුඛං] භවධ්වෙ, සැපයට, පැමිණෙවු; අහම්, මම; [සුඛං] භවෙ, සැපයට පැමිණෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛං] භවාවහෙ, සැපයට පැමිණෙමු; වයම්, අපි; [සුඛං] භවාමහෙ, සැපයට පැමිණෙමු.

b. කර්මණි, කර්මකාරකයෙහි; තෙන, ඔහු විසින් හෝ; තාභ්‍යාම්, ඔහු දෙදෙන විසින් හෝ; තෛඃ, ඔවුන් විසින් හෝ; ත්වයා, තා විසින් හෝ; යුවාභ්‍යාම්, තොප දෙදෙන විසින් හෝ; යුෂ්මාභිඃ, තොප විසින් හෝ; මයා, මා විසින් හෝ; ආවාභ්‍යාම්, අප දෙදෙන විසින් හෝ; අස්මාභිඃවා, අප විසින් හෝ ක්‍රියා තෘතීයා කර්තෲපදයෙක් වේ.

c. [තෙන], ඔහු විසින්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුභූයතෙ, අනුභව කරනුලැබේ; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුභූයෙතෙ, අනුභව කරනු ලැබෙත්; [තෙන], ඔහු විසින්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහුතුමූ; අනුභූයන්තෙ, අනුභව කරනු ලැබෙත්; [තෙන], ඔහු විසින්;

a. භාවෙ-භූයතෙ.

b. ඉති ලට්.

## විධිනිමන්ත්‍රණාමන්ත්‍රණාධීෂ්ට සම්ප්‍රශ්න ප්‍රාර්ථනේෂු ලිඞ්-3.3.161.

d. යාත්, යාතාම්, යුස්, යාස්, යාතම්, යාත, යාම්, යාව, යාම, ඊත, ඊයාතාම්, ඊරන්, ඊථාස්, ඊයාථාම්, ඊධ්වම්, ඊය, ඊවහි, ඊමහි.

e. කර්තරි පරස්මෛ පදෙ-

| | | |
|---|---|---|
| සඃ භවෙත් | තෞ භවෙතාම් | තෙ භවෙයුඃ |
| ත්වම් භවෙඃ | යුවාම් භවෙතම් | යූයම් භවෙත |
| අහම් භවෙයම් | ආවාම් භවෙව | වයම් භවෙම. |

---

ත්වං [ඔදනඃ], ආහාරවූ තෝ; අනුභූයසෙ, අනුභව කරනු ලැබෙහි; [තෙන], ඔහු විසින්; යුවාම් [ඔදනෞ], ආහාරවූ තෙපි දෙදෙන; අනුභූයෙථෙ, අනුභව කරනු ලබහු; [තෙන], ඔහු විසින්; යූයම් [ඔදනාඃ], ආහාරවූ තෙපි; අනුභූයධ්වෙ, අනුභව කරනු ලබහු; [තෙන], ඔහු විසින්; අහම් [ඔදනඃ] ආහාරවූ මම; අනුභූයෙ, අනුභවකරනු ලබමි; [තෙන], ඔහු විසින්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපිදෙදෙන; අනුභූයාවහෙ, අනුභව කරනු ලබමූ; [තෙන], ඔහු විසින්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අනුභූයාමහෙ, අනුභවකරනු ලබමූ.

a. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; භූයතෙ, වර්තමාන කාලයෙහි වීමයි.

b. ඉතිලට්, සප්තාපි 'භූ'-ධාතුව පිළිබඳ 'ලට්' විභක්ති නිමි.

c. 'විධිනිමන්ත්‍රණාමන්ත්‍රණාධීෂ්ට සම්ප්‍රශ්න ප්‍රාර්ථනේෂු ලිඞ්'යනු 'විධිලිඞ්' විභක්ති විධාන සූත්‍රයි; විධි, ප්‍රේරණය හෙවත් දාසාදීන් මෙහෙයීමය; නිමන්ත්‍රණ, නියොගකිරීමය; ආමන්ත්‍රණ, කැමතිසේ අනුදැනීමය; අධීෂ්ට, සත්කාර පුරස්සර ආරාධනාවය; සම්ප්‍රශ්න, සුවදුක් ආදිය විචාරීමය; ප්‍රාර්ථනේෂු, පැතීමය යන මෙකී අර්ථයන් කියවමනා කල්හි; ලිඞ්, විකල්පයෙන් 'ලිඞ්' විභක්ති වේ.

d. යාත්, යාතාම්, යුස්, යාස්, යාතම්, යාත, යාම්, යාව, යාම; ඊත, ඊයාතාම්, ඊරන්, ඊථාස්, ඊයාථාම්, ඊධ්වම්, ඊය, ඊවහි, ඊමහි යන අටලොස 'විධිලිඞ්' විභක්ති ප්‍රත්‍යයෝයි

e කර්තරිපරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] භවෙත්, සුවපත්වේ; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] භවෙතාම්, සුවපත් වෙත්; තෙ, ඔහුතුමූ; [සුඛිනඃ]

a. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ භවෙත | තෞ භවෙයාතාම් | තෙ භවෙරන් |
| ත්වම් භවෙථාඃ | යුවාම් භවෙයාථාම් | යූයම් භවෙධ්වම් |
| අහම් භවෙය | ආවාම් භවෙවහි | වයම් භවෙමහි. |

b. කර්මණි-

| | | |
|---|---|---|
| සඃ අනුභූයෙත, | තෞ අනුභූයෙයාතාම්, | තෙ අනුභූයෙරන් |
| ත්වම් අනුභූයෙථාඃ, | යුවාම් අනුභූයෙයාථාම්, | යූයම් අනුභූයෙධ්වම් |
| අහම් අනුභූයෙය, | ආවාම් අනුභූයාවහි, | වයම් අනුභූයාමහි. |

---

භවෙයුඃ, සුවපත් වෙත්; ත්වම්, තෝ; [සුඛී] භවෙඃ, සුවපත්වෙහි; යුවාම්, තොපි දෙදෙන; [සුඛිනෞ] භවෙතම්, සුවපත්වහු; යූයම්, තොපි; [සුඛිනඃ] භවෙත, සුවපත්වහු; අහම්, මම; [සුඛී] භවෙයම්, සුවපත් වෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භවෙව; සුවපත් වෙමු; වයම්, අපි; [සුඛිනඃ] භවෙම; සුවපත් වෙමු; (මේ අකර්මක ධාතුවයි.)

a. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛම්], සැපයට; භවෙත, පැමිණේ; තෞ, ඔහු දෙදෙන; [සුඛම්], සැපයට; භවෙයාතාම්, පැමිණෙත්; තෙ, ඔහු තුමූ; [සුඛම්], සැපයට; භවෙරන්, පැමිණෙත්; ත්වම්, තෝ; [සුඛම්], සැපයට; භවෙථාඃ, පැමිණෙහි; යුවාම්, තොපි දෙදෙන; [සුඛම්], සැපයට; භවෙයාථාම්, පැමිණහු; යූයම්, තොපි; [සුඛම්], සැපයට; භවෙධ්වම්, පැමිණහු; අහම්, මම; [සුඛම්], සැපයට; භවෙය, පැමිණෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛම්], සැපයට; භවෙවහි, පැමිණෙමු; වයම්, අපි; [සුඛම්], සැපයට; භවෙමහි, පැමිණෙමු.

b. කර්මණි, කර්මකාරකයෙහි; [තෙන] ඔහු විසින්; සඃ [ඕදනඃ] ආහාරවූ හෙතෙම; අනුභූයෙත, අනුභව කරනු ලැබේ; [තෙන], ඔහු විසින්; තෞ [ඕදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුභූයෙයාතාම්, අනුභව කරනු ලැබෙත්; [තෙන], ඔහු විසින්; තෙ [ඕදනාඃ], ආහාරවූ ඔහු තුමූ; අනුභූයෙරන්, අනුභව කරනු ලැබෙත්; [තෙන] ඔහු විසින්; ත්වම් [ඕදනඃ], ආහාරවූ තෝ; අනුභූයෙථාඃ, අනුභව කරනු ලැබෙහි; [තෙන], ඔහු විසින්; යුවාම් [ඕදනෞ], ආහාරවූ තොපි දෙදෙන; අනුභූයෙයාථාම්, අනුභව කරනු ලබහු; [තෙන], ඔහු විසින්; යූයම් [ඕදනාඃ], ආහාරවූ තෙපි තුමූ; අනුභූයෙධ්වම්, අනුභව කරනු ලබවු; [තෙන],

a. භාවෙ-භූයෙත.

b. ඉති විධිලිඞ්.

c. ලොට් ච. 3. 3. 162;
(ආශිෂි ලිඞ්ලොටෞ 3. 3. 173 )

d. තුප්, තාම්, අන්තු, හි, තම්, ත, ආනිප්, ආවප්, ආමප්; තාම්, ආතාම්, අන්තාම්, ස්ව, ආථාම්, ධ්වම්, ඓප්, ආවහෛප්, ආමහෛප්.

e. කර්තරි පරස්මෛපදෙ–

| | | |
|---|---|---|
| සඃ භවතු, භවතාත් | තෞ භවතාම් | තෙ භවන්තු |
| ත්වම් භව, භවතාත් | යුවාම් භවතම් | යූයම් භවත |
| අහම් භවානි | ආවාම් භවාව | වයම් භවාම. |

---

ඔහු විසින්; අහම් [ඔදනඃ], ආහාරවූ මම; අනුභූයෙය, අනුභව කරනුලබම්; [තෙන], ඔහු විසින්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපි දෙදෙන; අනුභූයාවහි, අනුභව කරනු ලබමු; [තෙන], ඔහු විසින්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අනුභූයාමහි, අනුභව කරනු ලබමු.

a. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; භූයෙත, විධ්‍යාදි අර්ථයෙහි වීමයි.

b. ඉති විධිලිඞ්, 'විධිලිඞ්' විභක්තිය නිමි.

c. 'ලොට් ච (ආශිෂිලිඞ් ලොටෞ)' යනු 'ලිඞ් ලොට්' විභක්ති විධාන සූත්‍රයි. ලොට්ච, 'ලොට්' විභක්තියද විධ්‍යාදි අර්ථයෙහි වේ; ආශිෂි, ආශිෂ් යන අර්ථයෙහි; ලිඞ්ලොටෞ, 'ලිඞ්', 'ලොට්' විභක්ති දෙක වෙත්.

d. තුප්, තාම්, අන්තු, හි, තම්, ත, ආනිප්, ආවප්, ආමප්; තාම්, ආතාම්, අන්තාම්, ස්ව, ආථාම්, ධ්වම්, ඓප්, ආවහෛප්, ආමහෛප්, යනු ලොට් විභක්ති අටළොසයි.

e. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී], භවතු, සුවපත් වේවා; [සුඛී] භවතාත් කියාද වේ; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] භවතාම්, සුවපත් වෙත්වා; තෙ, ඔහු තුමූ; [සුඛිනඃ] භවන්තු, සුවපත් වෙත්වා; ත්වම්, තෝ; [සුඛී] භව, සුවපත්වෙහිවා; [සුඛී] භවතාත් කියාද වේ; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] භවතම්, සුවපත්වහුවා; යූයම්, තෙපි; [සුඛිනඃ] භවත, සුවපත්වහුවා; අහම්, මම; [සුඛී] භවානි, සුවපත්වෙම්වා; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භවාව, සුවපත්වෙමුවා; වයම්, අපි; [සුඛිනඃ] භවාම, සුවපත්වෙමුවා. (මේ අකර්මක ධාතුවයි.)

a. කර්තරි ආත්මනෙපදෙ–

| | | |
|---|---|---|
| සඃ හවතාම් | තෞ හවේතාම් | තෙ හවන්තාම් |
| ත්වම් හවස්ව | යුවාම් හවේථාම් | යූයම් හවධ්වම් |
| අහම් හවෛ | ආවාම් හවාවහෛ | වයම් හවාමහෛ. |

b. කර්මණි–

| | | |
|---|---|---|
| සඃ අනුහූයතාම් | තෞ අනුහූයේතාම් | තෙ අනුහූයන්තාම් |
| ත්වම් අනුහූයස්ව | යුවාම් අනුහූයේථාම් | යූයම් අනුහූයධ්වම් |
| අහම් අනුහූයෛ | ආවාම් අනුහූයාවහෛ | වයම් අනුහූයාමහෛ |

c. හාවෙ හූයතාම්.

d. ඉති ලොට්.

---

a. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛම්] හවතාම්, සැපයට පැමිණේවා; තෞ, ඔහු දෙදෙන; [සුඛං] හවේතාම්, සැපට පැමිණෙත්වා; තෙ, ඔහු තුමූ; [සුඛං] හවන්තාම්, සැපට පැමිණෙත්වා; ත්වම්, තෝ; [සුඛං] හවස්ව, සැපට පැමිණෙහිවා; යුවාම්, තෙපිදෙදෙන; [සුඛං] හවේථාම්, සැපට පැමිණෙහුවා; යූයම්, තෙපි; [සුඛං] හවධ්වම්, සැපට පැමිණෙහුවා; අහම්, මම; [සුඛං] හවෛ, සැපට පැමිණෙම්වා; ආවාම්, අපි දෙදෙන; [සුඛං] හවාවහෛ, සැපට පැමිණෙමුවා; වයම්, අපි; [සුඛං] හවාමහෛ, සැපට පැමිණෙමුවා.

b කර්මණි, කර්මකාරකයෙහි; [තෙන], ඔහු විසින්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුහූයතාම, අනුභව කරනු ලැබේවා; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුහූයේතාම්, අනුභව කරනු ලැබෙත්වා; [තෙන], ඔහු විසින්; තෙ[ඔදනාඃ], ආහාරවූ ඔව්හුතුමූ; අනුහූයන්තාම්, අනුභව කරනු ලැබෙත්වා; [තෙන], ඔහු විසින්; ත්වම් [ඔදනඃ], ආහාරවූ තෝ; අනුහූයස්ව, අනුභව කරනු ලැබෙහිවා; [තෙන], ඔහු විසින්; යුවාම් [ඔදනෞ], ආහාරවූ තෙපි දෙදෙන; අනුහූයේථාම්, අනුභව කරනු ලබහුවා; [තෙන], ඔහු විසින්; යූයම් [ඔදනාඃ], ආහාරවූ තෙපි; අනුහූයධ්වම්, අනුභව කරනු ලබහුවා; [තෙන], ඔහු විසින්; අහම් [ඔදනඃ] ආහාරවූ මම; අනුහූයෛ, අනුභව කරනු ලබම්වා; [තෙන], ඔහු විසින්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපි දෙදෙන; අනුහූයාවහෛ, අනුභව කරනුලබමුවා; [තෙන], ඔහු විසින්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අනුහූයාමහෛ, අනුභව කරනු ලබමුවා.

c. හාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; හූයතාම්, ආශිෂ් අර්ථයෙහි වීමයි.

d. ඉතිලොට්, ලොට් විභක්ති නිමි.

## a. අනද්‍යතනෙ ලඞ්-3. 2. 111

**b. තිප්, තාම්, අන්, සිප්, තම්, ත, අම්ප්, ව, ම, ත, ආතාම්, අන්ත, ථාස්, ආථාම්, ධ්වම්, ඉ, වහි, මහි.**

c. කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| සඃ අභවත් | තෞ අභවතාම් | තෙ අභවන් |
| ත්වම් අභවඃ | යුවාම් අභවතම් | යූයම් අභවත |
| අහම් අභවම් | ආවාම් අභවාව | වයම් අභවාම. |

d. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ අභවත | තෞ අභවෙතාම් | තෙ අභවන්ත |
| ත්වම් අභවථාඃ | යුවාම් අභවෙථාම් | යූයම් අභවධ්වම් |
| අහම් අභවෙ | ආවාම් අභවාවහි | වයම් අභවාමහි |

---

a. 'අනද්‍යතනෙ ලඞ්' යනු 'ලඞ්' විභක්ති විධාන සූත්‍රයි. අනද්‍යතනෙ, අදින් පිටත් අතීතයෙහි හෙවත් ඊයේ පටන් අතීතයෙහි; ලඞ්, 'ලඞ්' විභක්ති වේ.

b. තිප්, තාම්, අන්, සිප්, තම්, ත, අම්ප්, ව, ම; ත, ආතාම් අන්ත, ථාස්, ආථාම්, ධ්වම්, ඉ, වහි, මහි, යනු 'ලඞ්' විභක්ති අටළොසයි

c. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] අභවත්, අනද්‍යතන අතීතයෙහි සුවපත්වී; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] අභවතාම්, අනද්‍යතන අතීතයෙහි සුවපත්වූහු; තෙ, ඔහුතුමූ; [සුඛිනඃ] අභවන්, සුවපත්වූහු; ත්වම්, තෝ; [සුඛී] අභවඃ, සුවපත් වූයෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] අභවතම්, සුවපත්වූවහු; යූයම්, තෙපි, [සුඛිනඃ] අභවත; සුවපත්වූවහු; අහම්, මම; [සුඛී] අභවම්, සුවපත්වූයෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] අභවාව, සුවපත්වූයෙමු; වයම්, අපි; [සුඛිනඃ] අභවාම, සුවපත්වීමු.

d. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛං] අභවත, සැපට පැමිණියේය; තෞ, ඔහු දෙදෙන; [සුඛං] අභවෙතාම්, සැපට පැමිණියාහුය; තෙ, ඔහු තුමූ; [සුඛං] අභවන්ත, සැපට පැමිණියාහුය; ත්වම්, තෝ; [සුඛං] අභවථාඃ, සැපට පැමිණියෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං] අභවෙථාම්, සැපට පැමිණියහු; යූයම්, තෙපි; [සුඛං] අභවධ්වම්,

**a. කම්මණි-**

| | | |
|---|---|---|
| **සඃ අන්වභූයත,** | **තෞ අන්වභූයේතාම්,** | **තෙ අන්වභූයන්ත.** |
| **ත්වම් අන්වභූයථාඃ,** | **යුවාම් අන්වභූයේථාම්,** | **යූයම් අන්වභූයධ්වම්** |
| **අහම් අන්වභූයෙ,** | **ආවාම් අන්වභූයාවහි,** | **වයම් අන්වභූයාමහි.** |

**b. භාවෙ-අභූයත.**

**c. ඉති ලඞ්.**

**d. භූතෙ ලුඞ්-3 2. 110**

**e. දි, තාම්, අන්, සි, තම්, ත, අම්, ව, ම; තන්, ආතාම්, අන්ත, ථාස්, ආථාම්, ධ්වම්, ඉ, වහි, මහි.**

---

සැපට පැමිණියහු; අහම්, මම; [සුඛං] අභවෙ, සැපට පැමිණියෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛං] අභවාවහි, සැපට පැමිණියෙමු; වයම්, අපි; [සුඛං] අභවාමහි, සැපට පැමිණියෙමු.

a. කම්මණි, කම්කාරකයෙහි;[තෙන] ඔහු විසින්;සඃ[ඔදනඃ], ආහාරවූ හෙතෙම; අන්වභූයත, අනුභවකරනුලැබී; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අන්වභූයේතාම්, අනුභව කරනුලැබූහු; [තෙන], ඔහු විසින්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහුතුමූ; අන්වභූයන්ත, අනුභව කරනුලැබූහු; [තෙන], ඔහු විසින්; ත්වම් [ඔදනඃ], ආහාරවූ තෝ; අන්වභූයථාඃ, අනුභව කරනු ලැබූයෙහි;[තෙන], ඔහු විසින්; යුවාම් [ඔදනෞ], ආහාරවූ තෙපි දෙදෙන; අන්වභූයේථාම්, අනුභව කරනු ලැබූහු; [තෙන], ඔහු විසින්; යූයම් [ඔදනාඃ], ආහාරවූ තෙපි; අන්වභූයධ්වම්, අනුභවකරනු ලැබූහු; [තෙන], ඔහු විසින්; අහම් [ඔදනඃ], ආහාරවූ මම; අන්වභූයෙ, අනුභව කරනු ලැබූයෙමි; [තෙන], ඔහු විසින්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපි දෙදෙන; අන්වභූයාවහි, අනුභව කරනු ලැබූයෙමු; [තෙන], ඔහු විසින්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අන්වභූයාමහි, අනුභව කරනු ලැබූ යෙමු.

b. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; අභූයත, අනද්‍යතන අතීතයෙහි වීමයි.

c. ඉති ලඞ්, 'ලඞ්' විභක්තිය නිමි.

d. 'භූතෙ ලුඞ්'යනු 'ලුඞ්' විභක්ති විධාන සූත්‍රයි; භූතෙ, සාමාන්‍ය අතීතයෙහි; ලුඞ්, 'ලුඞ්' විභක්ති වේ.

e. දි, තාම්, අන්, සි, තම්, ත, අම්, ව, ම; තන්, ආතාම්, අන්ත, ථාස්, ආථාම්, ධ්වම්, ඉ, වහි, මහි, යනු 'ලුඞ්' ප්‍රත්‍යය අටළොසයි.

a. කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| සඃ අභූත් | තෞ අභූතාම් | තෙ අභූවන් |
| ත්වම් අභූඃ | යුවාම් අභූතම් | යූයම් අභූත |
| අහම් අභූවම් | ආවාම් අභූව | වයම් අභූම. |

b. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ අභවිෂ්ට | තෞ අභවිෂාතාම් | තෙ අභවිෂත |
| ත්වම් අභවිෂ්ඨාඃ | යුවාම් අභවිෂාථාම් | යූයම් අභවිඪ්වම්, අභවිධ්වම් |
| අහම් අභවිෂි | ආවාම් අභවිෂ්වහි | වයම් අභවිෂ්මහි |

---

a. කර්තරිපරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] අභූත්, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වී; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] අභූතාම්, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූහු; තෙ, ඔහු තුමූ; [සුඛිනඃ] අභූවන්, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූහු; ත්වම්, තෝ; සුඛී [අභූඃ], සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූයෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] අභූතම්, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූහු; යූයම්, තෙපි; [සුඛිනඃ] අභූත, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූහු; අහම්, මම; [සුඛී] අභූවම් සාමාන්‍ය අතීතයෙහි සුවපත්වූයෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] අභූව, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වීමු; වයම්, අපි; [සුඛිනඃ] අභූම, සාමාන්‍ය අතීතයෙහි සුවපත්වීමු. [මේ අකර්මක ධාතුවකි.]

b. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛං], සැපට; අභවිෂ්ට, පැමිණියේය; තෞ, ඔහු දෙදෙන; [සුඛං], සැපට; අභවිෂාතාම්, පැමිණියාහුය; තෙ, ඔහු තුමූ; [සුඛං], සැපට; අභවිෂත, පැමිණියාහුය; ත්වම්, තෝ; [සුඛං], සැපට; අභවිෂ්ඨාඃ, පැමිණියෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං], සැපට; අභවිෂාථාම්, පැමිණියහු; යූයම්, තෙපි; [සුඛං], සැපට; අභවිඪ්වම්, අභවිධ්වම්, පැමිණියහු; අහම්, මම; [සුඛං], සැපට; අභවිෂි, පැමිණියෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛං], සැපට; අභවිෂ්වහි, පැමිණියෙමු; වයම්, අපි; [සුඛං], සැපට; අභවිෂ්මහි, පැමිණියෙමු.

a. කර්මණි-

සඃ අන්වභාවි.

තෞ අන්වභාවිෂාතාම්, අන්වභවිෂාතාම්.

තෙ අන්වභාවිෂත, අන්වභවිෂත.

ත්වම් අන්වභාවිෂ්ඨාඃ, අන්වභවිෂ්ඨාඃ.

යුවාම් අන්වභාවිෂාථාම්, අන්වභවිෂාථාම්.

යූයම් අන්වභාවිඪ්වම්, අන්වභවිඪ්වම්, අන්වභාවිධ්වම්, අන්වභවිධ්වම්.

අහම් අන්වභාවිෂි, අන්වභවිෂි.

ආවාම් අන්වභාවිෂ්වහි, අන්වභවිෂ්වහි.

වයම් අන්වභාවිෂ්මහි, අන්වභවිෂ්මහි.

b. භාවෙ, අභාවි.

c. ඉති ලුඞ්.

## d පරොක්ෂෙ ලිට්. 3. 2. 115.

---

a. කර්මණි, කර්මකාරකයෙහි; [තෙන], ඔහු විසින්; සඃ[ඔදනඃ], ආහාරවූ හෙතෙම; අන්වභාවි, සාමාන්‍ය අතීතයෙහි අනුභව කරනුලැබී; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අන්වභාවිෂාතාම්, අන්වභවිෂාතාම්, අනුභවකරනු ලැබූහු; [තෙන],ඔහු විසින්;තෙ[ඔදනාඃ], ආහාරවූ ඔහු තුමූ; අන්වභාවිෂත, අනුභව කරනු ලැබූහු; [තෙන], ඔහු විසින්; ත්වම්[ඔදනඃ], ආහාරවූ තෝ; අන්වභාවිෂ්ඨාඃ, අන්වභවිෂ්ඨාඃ, අනුභව කරනු ලැබූයෙහි; [තෙන], ඔහු විසින්; යුවාම් [ඔදනෞ], ආහාරවූ තෙපි දෙදෙන; අන්වභාවිෂාථාම්, අන්වභවිෂාථාම්, අනුභව කරනු ලැබූවහු;[තෙන], ඔහු විසින්; යූයම් [ඔදනාඃ], ආහාරවූ තෙපි; අන්වභාවිඪ්වම්, අන්වභවිඪ්වම්, අන්වභාවිධ්වම්, අන්වභවිධ්වම්, අනුභව කරනු ලැබූවහු; [තෙන],ඔහු විසින්; අහම්[ඔදනඃ], ආහාරවූ මම; අන්වභාවිෂි, අන්වභවිෂි, අනුභව කරනු ලැබූයෙමි; [තෙන] ඔහු විසින්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපි දෙදෙන; අන්වභාවිෂ්වහි, අන්වභවිෂ්වහි, අනුභව කරනු ලැබූයෙමු; [තෙන], ඔහු විසින්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අන්වභාවිෂ්මහි, අන්වභවිෂ්මහි, අනුභවකරනුලැබූයෙමු.

b. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; අභාවි, සාමාන්‍ය අතීතයෙහි වීමයි.

c ඉති ලුඞ්, 'ලුඞ්' විභක්ති නිමි.

d. 'පරොක්ෂෙ ලිට්' යනු 'ලිට්' විභක්ති විධාන සූත්‍රයි. පරොක්ෂෙ, භූතානද්‍යතන පරොක්ෂාර්ථයෙහි හෙවත් අප්‍රත්‍යක්ෂ අතීතවූ නොහමුඅර්ථයෙහි; ලිට්, 'ලිට්' විභක්ති වේ.

**a. ණප්, අතුස්, උස්, ථප්, අථුස්, අ, ණප්, ව, ම; ඒ, ආතෙ, ඉරෙ, සෙ, ආථෙ, ධ්වෙ, ඒ, වහෙ, මහෙ.**

**b. කර්තරි පරස්මෛපදෙ–**

| | | |
|---|---|---|
| සඃ බභූව | තෞ බභූවතුඃ | තෙ බභූවුඃ |
| ත්වම් බභූවිථ | යුවාම් බභූවථුඃ | යූයම් බභූව |
| අහම් බභූව | ආවාම් බභූවිව | වයම් බභූවිම. |

**c. කර්තරි ආත්මනෙපදෙ–**

| | | |
|---|---|---|
| සඃ බභූවෙ | තෞ බභූවාතෙ | තෙ බභූවිරෙ |
| ත්වම් බභූවිෂෙ | යුවාම් බභූවාථෙ | යූයම් බභූවිඪ්වෙ, බභූවිධ්වෙ |
| අහම් බභූවෙ | ආවාම් බභූවිවහෙ | වයම් බභූවිමහෙ. |

---

a. 'ණප්, අතුස්, උස්, ථප්, අථුස්, අ, ණප්, ව, ම; ඒ, ආතෙ, ඉරෙ, සෙ, ආථෙ, ධ්වෙ, ඒ, වහෙ, මහෙ,' යනු ලිට් විභක්ති ප්‍රත්‍යය අටළොසයි.

b. කර්තරිපරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුබි] බභූව, අප්‍රත්‍යක්ෂ අතීතයෙහි සුවපත්වීලු; තෞ, ඔහු දෙදෙන; [සුබිතෞ] බභූවතුඃ, සුවපත්වූවාහුලු; තෙ, ඔහුතුමූ; [සුබිතඃ] බභූවුඃ, සුවපත්වූවාහුලු; ත්වම්, තෝ; [සුඛී] බභූවිථ, සුවපත්වූයෙහිලු; යුවාම්, තෙපි දෙදෙන; [සුබිතෞ] බභූවථුඃ, සුවපත්වූවාහුලු; යූයම්, තෙපි; [සුබිතඃ] බභූව, සුවපත් වූවහුලු; අහම්, මම; [සුබී] බභූව, සුවපත්වූයෙම්ලු; ආවාම්, අපි දෙදෙන; [සුබිතෞ] බභූවිව, සුවපත්වූයෙමුලු; වයම්, අපි; [සුබිතඃ] බභූවිම, සුවපත්වූයෙමුලු; (මේ අකර්මක ධාතුවයි )

c. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛං] බභූවෙ, සැපයට පැමිණියේලු; තෞ, ඔහු දෙදෙන; [සුඛං] බභූවාතෙ, සැපයට පැමිණියාහුලු; තෙ, ඔහුතුමූ; [සුඛං] බභූවිරෙ, සැපයට පැමිණියාහුලු; ත්වම්, තෝ; [සුඛං] බභූවිෂෙ, සැපයට පැමිණියෙහිලු; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං] බභූවාථෙ, සැපයට පැමිණියහුලු; යූයම්, තෙපි; [සුඛං], සැපයට; බභූවිඪ්වෙ, බභූවිධ්වෙ, පැමිණියහුලු; අහම්, මම; [සුඛං] බභූවෙ, සැපයට පැමිණියෙමුලු; ආවාම්, අපි දෙදෙන; [සුඛං] බභූවිවහෙ, සැපයට පැමිණියෙමුලු; වයම්, අපි; [සුඛං] බභූවිමහෙ, සැපයට පැමිණියෙමුලු.

a. කර්මණි-

සඃ අනුබභූවෙ, තෞ අනුබභූවාතෙ, තෙ අනුබභූවිරෙ
ත්වම් අනුබභූවිෂෙ, යුවාම් අනුබභූවාථෙ, යූයම් {අනුබභූවිඪ්වෙ / අනුබභූවිධ්වෙ}
අහම් අනුබභූවෙ, ආවාම් අනුබභූවිවහෙ, වයම් අනුබභූවිමහෙ.

b. භාවෙ-බභූවෙ.

c. ඉති ලිට්.

## d. අනද්‍යතනෙ ලුට්. 3. 3. 5.

e. තා, තාරෞ, තාරස්, තාසි, තාස්ථස්, තාස්ථ, තාස්මි, තාස්වස්, තාස්මස්; තා, තාරෞ, තාරස්, තාසෙ, තාසාථෙ, තාධ්වෙ, තාහෙ, තාස්වහෙ, තාස්මහෙ.

---

a. කර්මණි, කර්මකාරකයෙහි; [තෙන] ඔහු විසින්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුබභූවෙ, අනුභවකරනු ලැබීය; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුබභූවාතෙ, අනුභව කරනු ලැබූහ; [තෙන], ඔහු විසින්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහු තුමූ; අනුබභූවිරෙ, අනුභව කරනු ලැබූහ; [තෙන], ඔහු විසින්; ත්වම්, තෝ; අනුබභූවිෂෙ, අනුභව කරනු ලැබූයෙහිය; [තෙන], ඔහු විසින්; යුවාම්, තෙපි දෙදෙන; අනුබභූවාථෙ, අනුභව කරනු ලැබූවහුය; [තෙන], ඔහු විසින්; යූයම්, තෙපි; අනුබභූවිඪ්වෙ, අනුබභූවිධ්වෙ, අනුභවකරනු ලැබූවහුය; [තෙන], ඔහු විසින්; අහම්, මම; අනුබභූවෙ, අනුභව කරනු ලැබූයෙමිය; [තෙන], ඔහු විසින්; ආවාම්, අපි දෙදෙන; අනුබභූවිවහෙ, අනුභව කරනු ලැබූයෙමුය; [තෙන], ඔහු විසින්; වයම්, අපි; අනුබභූවිමහෙ, අනුභව කරනු ලැබූයෙමුය.

b. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; බභූවෙ, භූතානද්‍යතන පරොක්ෂාර්ථයෙහි වීමයි.

c. ඉති ලිට්, 'ලිට්' විභක්තිය නිමි.

d. 'අනද්‍යතනෙ ලුට්' යනු 'ලුට්' ප්‍රත්‍යය විධාන සූත්‍රයි. අනද්‍යතනෙ, අදින් පිටත් අනාගතයෙහි; ලුට්, 'ලුට්' ප්‍රත්‍යය වේ.

e. තා, තාරෞ, තාරස්, තාසි, තාස්ථස්, තාස්ථ, තාස්මි, තාස්වස්, තාස්මස්; තා, තාරෞ, තාරස්, තාසෙ, තාසාථෙ, තාධ්වෙ, තාහෙ, තාස්වහෙ, තාස්මහෙ,' යනු ලුට් ප්‍රත්‍යය අවලොකයි.

a. කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| සඃ භවිතා | තෞ භවිතාරෞ | තෙ භවිතාරඃ |
| ත්වම් භවිතාසි | යුවාම් භවිතාස්ථඃ | යූයම් භවිතාස්ථ |
| අහම් භවිතාස්මි | ආවාම් භවිතාස්වඃ | වයම් භවිතාස්මඃ. |

b. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ භවිතා | තෞ භවිතාරෞ | තෙ භවිතාරඃ |
| ත්වම් භවිතාසෙ | යුවාම් භවිතාසාථෙ | යූයම් භවිතාධ්වෙ |
| අහම් භවිතාහෙ | ආවාම් භවිතාස්වහෙ | වයම් භවිතාස්මහෙ. |

---

a කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [ස්වඃ], සෙට; [සුඛී] භවිතා, සුවපත් වන්නේය; තෞ, ඔහු දෙදෙන; [ස්වඃ], සෙට; [සුඛිනෞ] භවිතාරෞ, සුවපත් වන්නාහුය; තෙ, ඔහුතුමූ; [ස්වඃ], සෙට; [සුඛිනඃ] භවිතාරඃ, සුවපත් වන්නාහුය; ත්වම්, තෝ; [සුඛී] භවිතාසි, සුවපත් වන්නෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] භවිතාස්ථඃ, සුවපත් වන්නහු; යූයම්, තොපි; [සුඛිනඃ] භවිතාස්ථ, සුවපත් වන්නහු; අහම්, මම; [සුඛී] භවිතාස්මි, සුවපත් වන්නෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භවිතාස්වඃ, සුවපත් වන්නෙමු; වයම්, අපි; [සුඛිනඃ] භවිතාස්මඃ, සුවපත් වන්නෙමු.

b, කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [ස්වඃ], සෙට; [සුඛං] භවිතා, සැපයට පැමිණෙන් නේය; තෞ, ඔහු දෙදෙන; [ස්වඃ]. සෙට; [සුඛං] භවිතාරෞ, සැපයට පැමිණෙන්නාහුය; තෙ, ඔහු තුමූ; [ස්වඃ], සෙට; [සුඛං] භවිතාරඃ, සැපයට පැමිණෙන්න හුය; ත්වම්, තෝ; [සුඛං] භවිතාසෙ, සැපයට පැමිණෙන්නෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං] භවිතාසාථෙ, සැපයට පැමිණෙන්නහු; යූයම්, තෙපි; [සුඛං] භවිතාධ්වෙ, සැපයට පැමිණෙන්නහු; අහම්, මම; [සුඛං] භවිතාහෙ, සැපයට; පැමිණෙන්නෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛං] භවිතාස්වහෙ, සැපයට පැමිණෙන්නෙමු; වයම්, අපි; [සුඛං] භවිතාස්මහෙ, සැපයට පැමිණෙන්නෙමු.

a. කම්මණි-

සඃ අනුභාවිතා, අනුභවිතා.
තෞ අනුභාවිතාරෞ, අනුභවිතාරෞ.
තෙ අනුභාවිතාරඃ, අනුභවිතාරඃ.
ත්වම් අනුභාවිතාසෙ, අනුභවිතාසෙ.
යුවාම් අනුභාවිතාසාථෙ, අනුභවිතාසාථෙ.
යූයම් අනුභාවිතාධ්වෙ, අනුභවිතාධ්වෙ.
අහම් අනුභාවිතාහෙ, අනුභවිතාහෙ.
වයම් අනුභාවිතාස්මහෙ, අනුභවිතාස්මහෙ.
ආවාම් අනුභාවිතාස්වහෙ, අනුභවිතාස්වහෙ.

b. භාවෙ-භාවිතා, භවිතා.

c. ඉති ලොට්.

## d. ආශිෂි ලිඞ් ලොටෞ. 3. 3. 173.

---

a කම්මණි, කම්කාරකයෙහි; [තෙන], ඔහු විසින්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; [සවඃ], සෙට; අනුභාවිතා, අනුභවිතා, අනුභව කරනු ලබන්නේය; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; [සවඃ], සෙට; අනුභාවිතාරෞ, අනුභවිතාරෞ, අනුභව කරනු ලබන්නාහුය; [තෙන], ඔහු විසින්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහුතුමූ; [සවඃ], සෙට; අනුභාවිතාරඃ, අනුභවිතාරඃ, අනුභව කරනු ලබන්නාහුය; [තෙන]. ඔහු විසින්; [ත්වම්], තෝ; අනුභාවිතාසෙ, අනුභවිතාසෙ, අනුභව කරනු ලබන්නෙහිය; [තෙන], ඔහු විසින්; යුවාම්, තෙපි දෙදෙන; අනුභාවිතාසාථෙ, අනුභවිතාසාථෙ, අනුභව කරනු ලබන්නාහුය; [තෙන], ඔහු විසින්; යූයම්, තෙපි; අනුභාවිතාධ්වෙ, අනුභවිතාධ්වෙ, අනුභව කරනු ලබන්නාහුය; [තෙන], ඔහු විසින්; අහම්, මම; අනුභාවිතාහෙ, අනුභවිතාහෙ, අනුභව කරනු ලබන්නෙමි; [තෙන], ඔහු විසින්; ආවාම්, අපි දෙදෙන; අනුභාවිතාස්වහෙ, අනුභවිතාස්වහෙ, අනුභව කරනු ලබන්නෙමු; [තෙන], ඔහු විසින්; වයම්, අපි; අනුභාවිතාස්මහෙ, අනුභවිතාස්මහෙ, අනුභවකරනු ලබන්නෙමු.

b. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; භාවිතා, භවිතා, අනද්‍යතන අනාගතයෙහි වීමයි.

c. ඉති ලුට්, 'ලුට්' විභක්ති නිමි.

d. ආශිෂි ලිඞ් ලොටෞ, යනු 'ලිඞ්' 'ලොට්' විභක්ති විධාන සූත්‍රයි; ආශිෂි, නොලත් ඉෂ්ටාර්ථයක් ලබනු කැමැත්තෙහි නොහොත් ඉෂ්ටප්‍රාර්ථනායෙහි; ලිඞ්ලොටෞ, 'ලිඞ්' ප්‍රත්‍යය 'ලොට්' ප්‍රත්‍යය දෙදෙනා වෙත්.

**a. යාත්, යාස්තාම්, යාසුස්, යාස්, යාස්තම්, යාස්ත, යාසම්, යාස්ව, යාස්ම; සීෂ්ට, සීයාස්තාම්, සීරන්, සීෂ්ඨාස්, සීයාස්ථාම්, සීධ්වම්, සීය, සීවහි, සීමහි.**

**b. කර්තරි පරස්මෛපදෙ-**

| | | |
|---|---|---|
| සඃ භූයාත් | තෞ භූයාස්තාම් | තෙ භූයාසුඃ |
| ත්වම් භූයාඃ | යුවාම් භූයාස්තම් | යූයම් භූයාස්ත |
| අහම් භූයාසම් | ආවාම් භූයාස්ව | වයම් භූයාස්ම |

**c. කර්තරි ආත්මනෙපදෙ-**

| | | |
|---|---|---|
| සඃ භවිෂීෂ්ට | තෞ භවිෂීයාස්තාම් | තෙ භවිෂීරන් |
| ත්වම් භවිෂීෂ්ඨාඃ | යුවාම් භවිෂීයාස්ථාම් | යූයම් භවිෂීඪ්වම්, භවිෂීධ්වම් |
| අහම් භවිෂීය | ආවාම් භවිෂීවහි | වයම් භවිෂීමහි. |

---

a යාත්, යාස්තාම්; යාසුස්, යාස්, යාස්තම්, යාස්ත, යාසම්, යාස්ව යාස්ම; සීෂ්ට, සීයාස්තාම්, සීරන්, සීෂ්ඨාස්, සීයාස්ථාම්, සීධ්වම්, සීය, සීවහි, සීවහි, යන මොහු ආශිර් 'ලිඞ්' ප්‍රත්‍යය අටළොසයි.

b. කර්තරි පරස්මෛපදෙ. කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] භූයාත්, සුවපත් වේවා; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] භූයාස්තාම්, සුවපත් වෙත්වා; තෙ, ඔහු තුමූ; [සුඛිනඃ] භූයාසුඃ, සුවපත් වෙත්වා; ත්වම්, තෝ; [සුඛී] භූයාඃ, සුවපත් වෙහිවා; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] භූයාස්තම්, සුවපත් වහුවා; යූයම්, තෙපි; [සුඛිනඃ] භූයාස්ත, සුවපත්වහුවා; අහම්, මම; [සුඛී] භූයාසම්, සුවපත් වෙම්වා; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භූයාස්ව, සුවපත් වෙමුවා; වයම්, අපි; [සුඛිනඃ] භූයාස්ම, සුවපත් වෙමුවා.

c. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛම්] භවිෂීෂ්ට, සැපයට පැමිණේවා; තෞ, ඔහු දෙදෙන; [සුඛම්] භවිෂීයාස්තාම්, සැපයට පැමිණෙත්වා; තෙ, ඔහු තුමූ; [සුඛම්] භවිෂීරන්, සැපයට පැමිණෙත්වා; ත්වම්; තෝ; [සුඛම්] භවිෂීෂ්ඨාඃ, සැපයට පැමිණෙහිවා; යුවාම්, තෙපි දෙදෙන; [සුඛම්] භවිෂීස්වම්, භවිෂීඪ්වම්, සැපයට පැමිණෙහුවා; අහම්; මම; [සුඛම්] භවිෂීය, සැපයට පැමිණෙම්වා; ආවාම්, අපි දෙදෙන; [සුඛම්] භවිෂීවහි, සැපයට පැමිණෙමුවා; වයම්, අපි; [සුඛම්] භවිෂීමහි, සැපයට පැමිණෙමුවා.

a. කර්මණි–

සඃ අනුභාවිෂීෂ්ට, අනුභවිෂීෂ්ට.

තෞ අනුභාවිෂීයාස්තාම්, අනුභවිෂීයාස්තාම්.

තෙ අනුභාවිෂීරන්, අනුභවිෂීරන්.

ත්වම් අනුභාවිෂීෂ්ඨාඃ, අනුභවිෂීෂ්ඨාඃ.

යුවාම් අනුභාවිෂීයාස්ථාම්, අනුභවිෂීයාස්ථාම්.

යූයම් අනුභාවිෂීඪ්වම්, අනුභවිෂීඪ්වම්, අනුභාවිෂීධ්වම්, අනුභවිෂීධ්වම්.

අහම් අනුභාවිෂීය, අනුභවිෂීය.

ආවාම් අනුභාවිෂීවහි, අනුභවිෂීවහි.

වයම් අනුභාවිෂීමහි, අනුභවිෂීමහි.

b. භාවෙ, භාවිෂීෂ්ට, භවිෂීෂ්ට.

c. ඉත්‍යාශිර් ලිඞ්.

## d. ලෘට් ශෙෂෙ ච–3. 3. 13.

(භවිෂ්‍යත් සාමාන්‍ය ඉත්‍යර්ථඃ.)

---

a. කර්මණි, කර්මකාරකයෙහි; [තෙන], ඔහු විසින්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුභාවිෂීෂ්ට, අනුභවිෂීෂ්ට, අනුභව කරනු ලැබේවා; [තෙන], ඔහු විසින්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුභාවිෂීයාස්තාම්, අනුභවිෂීයාස්තාම්, අනුභව කරනු ලැබෙත්වා; [තෙන], ඔහු විසින්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහු තුමූ; අනුභාවිෂීරන්, අනුභවිෂීරන්, අනුභව කරනු ලැබෙත්වා; ත්වම්, තෝ; අනුභාවිෂීෂ්ඨාඃ, අනුභවිෂීෂ්ඨාඃ, අනුභව කරනු ලැබෙහිවා, යුවාම්, තෙපි දෙදෙන; අනුභාවිෂීයාස්ථාම්, අනුභවිෂීයාස්ථාම්, අනුභව කරනු ලබහුවා; යූයම්, තෙපි; අනුභාවිෂීඪ්වම්, අනුභවිෂීඪ්වම්, අනුභාවිෂීධ්වම්, අනුභවිෂීධ්වම්, අනුභව කරනු ලබහුවා; අහම්, මම; අනුභාවිෂීය, අනුභවිෂීය, අනුභව කරනු ලබම්වා; ආවාම්, අප දෙදෙන; අනුභාවිෂීවහි, අනුභවිෂීවහි, අනුභවකරනු ලබමුවා; වයම්, අපි; අනුභාවිෂීමහි, අනුභවිෂීමහි, අනුභව කරනු ලබමුවා.

b. භාවෙ, භාවකාරකයෙහි; [තෙන], ඔහු විසින්; භාවිෂීෂ්ට, භවිෂීෂ්ට, ආශීෂ් අර්ථයෙහි වීමයි.

c. ඉත්‍යාශිර්ලිඞ්, ආශිර් අර්ථයෙහි 'ලිඞ්', 'ලොට්' විභක්තිය නිමි.

d. 'ලෘට්ශෙෂෙච' යනු ලෘට් විභක්ති විධාන සූත්‍රයි. (භවිෂ්‍යත් සාමාන්‍යඃ ඉති, සාමාන්‍ය අනාගතයෙහි යන; අර්ථඃ, අර්ථයි.)

a. ස්‍යති, ස්‍යතස්, ස්‍යන්ති, ස්‍යසි, ස්‍යථස්, ස්‍යථ, ස්‍යාමි, ස්‍යාවස්, ස්‍යාමස්; ස්‍යතෙ, ස්‍යෙතෙ, ස්‍යන්තෙ, ස්‍යසෙ, ස්‍යෙථෙ, ස්‍යධ්වෙ, ස්‍යෙ, ස්‍යාවහෙ, ස්‍යාමහෙ.

b. කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| සඃ භවිෂ්‍යති | තෞ භවිෂ්‍යතඃ | තෙ භවිෂ්‍යන්ති |
| ත්වම් භවිෂ්‍යසි | යුවාම් භවිෂ්‍යථඃ | යූයම් භවිෂ්‍යථ |
| අහම් භවිෂ්‍යාමි | ආවාම් භවිෂ්‍යාවඃ | වයම් භවිෂ්‍යාමඃ. |

c. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ භවිෂ්‍යතෙ | තෞ භවිෂ්‍යෙතෙ | තෙ භවිෂ්‍යන්තෙ |
| ත්වම් භවිෂ්‍යසෙ | යුවාම් භවිෂ්‍යෙථෙ | යූයම් භවිෂ්‍යධ්වෙ |
| අහම් භවිෂ්‍යෙ | ආවාම් භවිෂ්‍යාවහෙ | වයම් භවිෂ්‍යාමහෙ. |

---

a. ස්‍යති, ස්‍යතස්, ස්‍යන්ති, ස්‍යසි, ස්‍යථස්, ස්‍යථ, ස්‍යාමි, ස්‍යාවස්, ස්‍යාමස්, ස්‍යතෙ, ස්‍යෙතෙ, ස්‍යන්තෙ, ස්‍යසෙ, ස්‍යෙථෙ, ස්‍යධ්වෙ, ස්‍යෙ, ස්‍යාවහෙ, ස්‍යාමහෙ, යන මේ අටළොස ලෘට් විභක්ති ප්‍රත්‍යයෝයි.

b. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [සුඛී] භවිෂ්‍යති, සුවපත්වන්නේය; තෞ, ඔහු දෙදෙන; [සුඛිනෞ] භවිෂ්‍යතඃ, සුවපත් වන්නාහුය; තෙ, ඔහු තුමූ; [සුඛිනඃ] භවිෂ්‍යන්ති, සුවපත්වන්නාහුය; ත්වම්, තෝ; [සුඛී] භවිෂ්‍යසි සුවපත් වන්නෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛිනෞ] භවිෂ්‍යථඃ, සුවපත්වන්නාහු; යූයම්, තෙපි; [සුඛිනඃ] භවිෂ්‍යථ, සුවපත්වන්නහු; අහම්, මම; [සුඛී] භවිෂ්‍යාමි, සුවපත්වන්නෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛිනෞ] භවිෂ්‍යාව, සුවපත්වන්නෙමු; වයම්, අපි; [සුඛිනඃ] භවිෂ්‍යාමඃ, සුවපත් වන්නෙමු.

c. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; [සුඛම්], සැපයට; භවිෂ්‍යතෙ, පැමිණෙන්නේය; තෞ, ඔහු දෙදෙන; [සුඛම්], සැපයට; භවිෂ්‍යතඃ, පැමිණෙන්නාහුය; තෙ, ඔහු තුමූ; [සුඛම්], සැපයට; භවිෂ්‍යන්ති, පැමිණෙන්නාහුය; ත්වම්, තෝ; [සුඛං], සැපයට; භවිෂ්‍යසෙ, පැමිණෙන්නෙහි; යුවාම්, තෙපි දෙදෙන; [සුඛං], සැපයට; භවිෂ්‍යෙථෙ, පැමිණෙන්නහු; යූයම්, තෙපි; [සුඛම්], සැපයට; භවිෂ්‍යධ්වෙ, පැමිණෙන්නහු; අහම්, මම; [සුඛං], සැපයට; භවිෂ්‍යෙ, පැමිණෙන්නෙමි; ආවාම්, අපි දෙදෙන; [සුඛං], සැපයට; භවිෂ්‍යාවහෙ, පැමිණෙන්නමු; වයම්, අපි; [සුඛං], සැපයට; භවිෂ්‍යාමහෙ; පැමිණෙන්නෙමු.

a. කර්මණි-

සඃ අනුභාවිෂ්‍යත, අනුභවිෂ්‍යත.
තෞ අනුභාවිෂ්‍යෙතෙ, අනුභවිෂ්‍යෙතෙ
තෙ අනුභාවිෂ්‍යන්ත, අනුභවිෂ්‍යන්ත.
ත්වම් අනුභාවිෂ්‍යසෙ, අනුභවිෂ්‍යසෙ.
යුවාම් අනුභාවිෂ්‍යේථෙ, අනුභවිෂ්‍යේථෙ.
යූයම් අනුභාවිෂ්‍යධ්වෙ, අනුභවිෂ්‍යධ්වෙ.
අහම් අනුභාවිෂ්‍යෙ, අනු භ විෂ්‍යෙ.
ආවාම් අනුභාවිෂ්‍යාවහෙ, අනුභවිෂ්‍යාවහෙ.
වයම් අනුභාවිෂ්‍යාමහෙ, අනුභවිෂ්‍යාමහෙ.

b. භාවෙ-භාවිෂ්‍යත, භවිෂ්‍යත.

c. ඉති ලෘට්.

## d. ලිඞ්නිමිත්තෙ ලෘඞ් ක්‍රියාතිපත්තෞ–3.3.139.

---

a. කර්මණි, කර්මකාරකයෙහි;[තෙන], ඔහු විසින්; සඃ[ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුභාවිෂ්‍යත, අනුභවිෂ්‍යත, අනුභව, කරනු ලබන්නේය; [තෙන], ඔහු විසින්; තෞ[ඔදනෞ] ආහාරවූ ඔහු දෙදෙන; අනුභාවිෂ්‍යෙතෙ, අනුභවිෂ්‍යෙතෙ, අනුභව කරනු ලැබෙත්; තෙ, ඔහුහුමූ; අනුභාවිෂ්‍යන්ත, අනුභවිෂ්‍යන්ත, අනුභව කරනු ලබන්නාහුය; ත්වම්, තෝ; අනුභාවිෂ්‍යසෙ, අනුභවිෂ්‍යසෙ, අනුභව කරනු ලබන්නෙහි; යුවාම්, තෙපි දෙදෙන; අනුභාවිෂ්‍යේථෙ, අනුභවිෂ්‍යේථෙ, අනුභව කරනු ලබන්නහු; යූයම්, තෙපි;අනුභාවිෂ්‍යධ්වෙ, අනුභවිෂ්‍යධ්වෙ, අනුභවකරනුලබන්නහු; අහම්, මම;අනුභාවිෂ්‍යෙ, අනුභවිෂ්‍යෙ, අනුභවකරනු ලබන්නෙමි; ආවාම්, අපි දෙදෙන;අනුභාවිෂ්‍යාවහෙ, අනුභවිෂ්‍යාවහෙ, අනුභව කරනු ලබන්නෙමු; වයම්, අපි; අනුභාවිෂ්‍යාමහෙ, අනුභවිෂ්‍යාමහෙ, අනුභව කරනු ලබන්නෙමු.

b. භාවෙ, භාවකාරකයෙහි;[තෙන], ඔහු විසින්; භාවිෂ්‍යත, භවිෂ්‍යත, අනාගතයෙහි වීමයි.

c. ඉති ලෘට්, ලෘට් විභක්ති නිමි.

d. 'ලිඞ් නිමිත්තෙ ලෘඞ් ක්‍රියාතිපත්තෞ' යනු ලෘඞ් විභක්ති විධාන සූත්‍රයි. ලිඞ්නිමිත්තෙ, 'ලිඞ්' විභක්තිය නිමිත්ත කොට ඇති හෙවත් කාරණයද ඵලයද නිමිත්ත කොට ඇති (භවිෂ්‍යති-අනාගත කාලයෙහි); ක්‍රියාතිපත්තෞ, ක්‍රියාවගේ අසිද්ධියක් ඇති කල්හි; ලෘඞ්, ලෘඞ් විභක්ති වේ.

## a. භූතෙච–3. 3. 140.

**b. ස්‍යත්, ස්‍යතාම්, ස්‍යන්, ස්‍යස්, ස්‍යතම්, ස්‍යත, ස්‍යාම්, ස්‍යාව, ස්‍යාම; ස්‍යත, ස්‍යෙතාම්, ස්‍යන්ත, ස්‍යථාස්, ස්‍යෙථාම්, ස්‍යධ්වම්, ස්‍යෙ, ස්‍යාවහි, ස්‍යාමහි.**

**c. කර්තරි පරස්මෛපදෙ–**

| | | |
|---|---|---|
| සඃ අභවිෂ්‍යත් | තෞ අභවිෂ්‍යතාම් | තේ අභවිෂ්‍යන් |
| ත්වම් අභවිෂ්‍යඃ | යුවාම් අභවිෂ්‍යතම් | යූයම් අභවිෂ්‍යත |
| අහම් අභවිෂ්‍යම් | ආවාම් අභවිෂ්‍යාව | වයම් අභවිෂ්‍යාම. |

---

a. 'භූතෙච' යනු ලෘඞ් විභක්ති විධාන සූත්‍රයි. භූතෙච, කාරණයද ඵලයද නිමිත්තකොට ඇති අතීතකාලයෙහි ක්‍රියාවගේ සිද්ධියක් හැඟෙන කල්හි; ලෘඞ්, ලෘඞ් ප්‍රත්‍යය වේ.

b ස්‍යත්, ස්‍යතාම්, ස්‍යන්, ස්‍යස්, ස්‍යතම්, ස්‍යත, ස්‍යාම්, ස්‍යාව, ස්‍යාම; ස්‍යත, ස්‍යෙතාම්, ස්‍යන්ත, ස්‍යථාස්, ස්‍යෙථාම්, ස්‍යධ්වම්, ස්‍යෙ, ස්‍යාවහි, ස්‍යාමහි, යනු ලෘඞ් විභක්ති අටළොසයි.

c. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; සඃ, හෙතෙම; [චෙත්], ඉදින්; [රාජා] අභවිෂ්‍යත්, රජවන්නේ නම්; [සුඛී] අභවිෂ්‍යත්, සුවපත් වන්නේය නොහොත් රාජාචෙත් අභවිෂ්‍යත්, රජවී නම්; සුඛී අභවිෂ්‍යත්, සුවපත් වී; තෞ, ඔහු දෙදෙන; රාජානෞචෙදභවිෂ්‍යතාම්, රජවන්නාහු නම්; සුඛිනෞ අභවිෂ්‍යතාම්, සුවපත් වන්නාහුය නොහොත් රාජානෞ චෙද භවිෂ්‍යතාම්, රජවූහු නම්; සුඛිනෞ අභවිෂ්‍යතාම්, සුවපත් වන්නාහුය නොහොත් රාජානෞ චෙදභවිෂ්‍යතාම් රජවූහු නම්; සුඛිනෞ අභවිෂ්‍යතාම්, සුවපත්වූහු; තෙ, ඔහුතුමූ; රාජානශ්චෙද භවිෂ්‍යන්, රජවන්නාහු නම් නොහොත් රජවූහු නම්; සුඛිනඃ අභවිෂ්‍යන්, සුවපත් වන්නාහුය නොහොත් සුවපත්වූවාහුය; ත්වම්, තෝ; රාජාචෙදභවිෂ්‍යඃ, රජවන්නෙහි නම් නොහොත් රජවූයෙහි නම්; සුඛී අභවිෂ්‍යත්, සුවපත් වන්නෙහි නොහොත් සුවපත්වූයෙහි; යුවාම්, තොපි දෙදෙන; රාජානෞචෙදභවිෂ්‍යතම්, රජවන්නාහු නම් නොහොත් රජවූහුනම්; සුඛිනෞ අභවිෂ්‍යතම්, සුවපත් වන්නහු නොහොත් සුවපත්වූවහු; යූයම්, තෙපි; රාජානශ්චෙදභවිෂ්‍යත, රජවන්නහු නම් නොහොත් රජවූවහු නම්; සුඛිනඃ අභවිෂ්‍යත, සුවපත්වන්නහු නොහොත් සුවපත්වූවහු; අහම්, මම; රාජාචෙදභවිෂ්‍යම්, රජවන්නෙම් නම් නොහොත් රජවූයෙම් නම්; සුඛී අභවිෂ්‍යම්, සුවපත්වන්නෙමි

ඏ. කර්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| සඃ අභවිෂ්‍යත | තෞ අභවිෂ්‍යෙතාම් | තෙ අභවිෂ්‍යන්තාම් |
| ත්වම් අභවිෂ්‍යථාඃ | යුවාම් අභවිෂ්‍යෙථාම් | යූයම් අභවිෂ්‍යධ්වම් |
| අහම් අභවිෂ්‍යෙ | ආවාම් අභවිෂ්‍යාවහි | වයම් අභවිෂ්‍යාමහි. |

---

නොහොත් සුවපත්වූයෙමි; ආවාම්, අපි දෙදෙන; රාජ්‍යනෞ වෙදහවිෂ්‍යාව, රජවන්නෙමු නම් නොහොත් රජවූයෙමු නම් සුඛිනෞ අභවිෂ්‍යාව, සුවපත් වන්නෙමු නොහොත් සුවපත් වූයෙමු; වයම්, අපි; රාජ්‍යානශෙවදහවිෂ්‍යාව, රජවන්නෙමු නම් නොහොත් රජවූයෙමු නම්;සුඛිනඃ අභවිෂ්‍යාම, සුවපත්වන්නෙමු නොහොත් සුවපත්වූයෙමු. (අකර්මක භූධාතුවයි.)

(ප්‍රාප්‍ත්‍යර්ථයෙහි වනාහි–සඃ, හෙතෙම;රාජ්‍යං වෙදහවිෂ්‍යත්, රාජ්‍යයට පැමිණෙන්නේ වී නම් නොහොත් පැමිණියේ වී නම්; සුඛං අභවිෂ්‍යත්, සැපයට පැමිණෙන්නේය නොහොත් සැපයට පැමිණියේය; තෞ, ඔහු දෙදෙන; රාජ්‍යංවෙදහවිෂ්‍යතාම්, රාජ්‍යයට පැමිණෙන්නාහු නම් නොහොත් පැමිණියාහු නම්; සුඛම් අභවිෂ්‍යතාම්, සැපයට පැමිණෙන්නාහුය නොහොත් පැමිණියාහුය; තෙ, ඔහුතුමූ; රාජ්‍යංවෙදහවිෂ්‍යන්, රාජ්‍යයට පැමිණෙන්නාහු නම් නොහොත් රාජ්‍යයට පැමිණියාහු නම්;සුඛං අභවිෂ්‍යන්, සැපයට පැමිණෙන්නාහුය නොහොත් පැමිණියාහුය; (සෙස්සද මෙසේ වේ )

ඏ. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; සඃ, හෙතෙම; රාජ්‍යංවෙදහවිෂ්‍යත, රාජ්‍යයට පැමිණෙන්නේ වී නම්; නොහොත් රාජ්‍යයට පැමිණියේ වී නම්; සුඛං අභවිෂ්‍යත, සැපයට පැමිණෙන්නේය නොහොත් සැපයට පැමිණියේය; තෞ, ඔහු දෙදෙන; රාජ්‍යං වෙදහවිෂ්‍යෙතාම්, රාජ්‍යයට පැමිණෙන්නාහු වී නම් නොහොත් රාජ්‍යයට පැමිණියාහු වී නම්; සුඛංඅභවිෂ්‍යෙතාම්, සැපයට පැමිණෙන්නාහුය නොහොත් සැපයට පැමිණියාහුය; තෙ, ඔහුතුමූ; රාජ්‍යංවෙදහවිෂ්‍යන්තාම්, රාජ්‍යයට පැමිණෙන්නාහු වී නම් නොහොත් රාජ්‍යයට පැමිණියාහු වී නම්; සුඛං අභවිෂ්‍යන්තාම්, සැපයට පැමිණෙන්නාහුය නොහොත් සැපයට පැමිණියාහුය; ත්වම්, තෝ; රාජ්‍යං වෙදහවිෂ්‍යථාඃ, රාජ්‍යයට; පැමිණෙන්නෙහි වී නම් නොහොත් පැමිණියෙහි වී නම්; සුඛං අභවිෂ්‍යථාඃ, සැපයට පැමිණෙන්නෙහිය නොහොත් පැමිණියෙහිය; යුවාම්, තෙපි දෙදෙන; රාජ්‍යං වෙදහවිෂ්‍යෙථාම්, රාජ්‍යයට පැමිණෙන්නහු වී නම්

ඛ. කර්මණි-

සඃ අනුභාවිෂ්‍යත, අනුභවිෂ්‍යත.
තෞ අනුභාවිෂ්‍යේතාම්, අනුභවිෂ්‍යේතාම්.
තෙ අනුභාවිෂ්‍යන්ත, අනුභවිෂ්‍යන්ත.
ත්වම් අනුභාවිෂ්‍යථාඃ, අනුභවිෂ්‍යථාඃ.
යුවාම් අනුභාවිෂ්‍යේථාම්, අනුභවිෂ්‍යේථාම්.
යූයම් අනුභාවිෂ්‍යධ්වම්, අනුභවිෂ්‍යධ්වම්.
අහම් අනුභාවිෂ්‍යම්, අනුභවිෂ්‍යම්.
ආවාම් අනුභාවිෂ්‍යාවහි, අනුභවිෂ්‍යාවහි,
වයම් අනුභාවිෂ්‍යාමහි, අනුභවිෂ්‍යාමහි.

---

නොහොත් පැමිණියාහු වී නම්; සුඛං අභවිෂ්‍යේථාම්, සැපයට පැමිණෙන්නාහුය නොහොත් පැමිණියාහුය; යූයම්, තෙපි; රාජ්‍යං වෙදභවිෂ්‍යධ්වම්, රාජ්‍යයට පැමිණෙන්නහු වී නම් නොහොත් පැමිණියහු වී නම්; සුඛං අභවිෂ්‍යධ්වම්, සැපයට පැමිණෙන්නහුය නොහොත් පැමිණියාහුය; අහම්, මම; රාජ්‍යං වෙදභවිෂ්‍යෙ, රාජ්‍යයට පැමිණෙන්නෙම් වී නම් නොහොත් පැමිණියෙම් වී නම්; සුඛං අභවිෂ්‍යෙ, සැපයට පැමිණෙන්නෙමි නොහොත් සැපයට පැමිණියෙමි; ආවාම්, අපි දෙදෙන; රාජ්‍යං වෙදභවිෂ්‍යාවහි, රාජ්‍යයට පැමිණෙන්නෙමු වී නම් නොහොත් පැමිණියෙමු වී නම්; සුඛං අභවිෂ්‍යාවහි, සැපයට පැමිණෙන්නෙමු නොහොත් පැමිණියෙමු; වයම්, අපි; රාජ්‍යං වෙදභවිෂ්‍යාමහි, රාජ්‍යයට පැමිණෙන්නෙමු වී නම් නොහොත් පැමිණියෙමු වී නම්; සුඛං අභවිෂ්‍යාමහි, සැපයට පැමිණෙන්නෙමු නොහොත් පැමිණියෙමු.

ඛ කර්මණි, කර්මකාරකයෙහි–[තෙන], ඔහු විසින්; [සුඛං] වෙදනුභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; සඃ [ඔදනඃ], ආහාරවූ හෙතෙම; අනුභාවිෂ්‍යත, අනුභවිෂ්‍යත, අනුභවකරනු ලබන්නේය නොහොත් අනුභවකරනු ලැබුයේය; [තෙන], ඔහු විසින්; [සුඛං] වෙදනුභාවිෂ්‍යත සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභවකරනු ලැබුයේ නම්; තෞ [ඔදනෞ], ආහාරවූ ඔහු දෙදෙන; අනුභාවිෂ්‍යේතාම්, අනුභවිෂ්‍යේතාම්, අනුභව කරනු ලබන්නාහුය නොහොත් අනුභව කරනු ලැබුවාහුය; [තෙන] ඔහු විසින්; [සුඛං] වෙදනුභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; තෙ [ඔදනාඃ], ආහාරවූ ඔහු තුමූ; අනුභාවිෂ්‍යන්ත අනුභවිෂ්‍යන්ත:

a. භාවෙ-අභාවිෂ්‍යත, අභවිෂ්‍යත·

b. ඉති ලෘඞ්.

c. ඉති භූධාතොර්දශ ලකාරාඃ.

---

අනුභව කරනු ලබන්නහුය නොහොත් අනුභව කරනුලැබූවාහුය; [තෙන], ඔහු විසින්; [සුඛං] වෙදන්වභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් සැප අනුභව කරනු ලැබුයේ නම්; ත්වං [ඔදනඃ], ආහාරවූ තෝ; අන්වභාවිෂ්‍යථාඃ, අන්වභවිෂ්‍යථාඃ, අනුභව කරනු ලබන්නෙහි නොහොත් අනුභව කරනු ලැබූයෙහි; [තෙන] ඔහු විසින්; [සුඛං] වෙදන්වභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; යුවාම් [ඔදනෞ], ආහාරවූ තෙපි දෙදෙන; අන්වභාවිෂ්‍යෙථාම්, අන්වභවිෂ්‍යෙථාම්, අනුභව කරනු ලබන්නහුය නොහොත් අනුභව කරනු ලැබූවහුය; [තෙන], ඔහු විසින් [සුඛං], වෙදන්වභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; යූයම් [ඔදනාඃ], ආහාරවූතෙපි; අන්වභාවිෂ්‍යධ්වම්, අන්වභවිෂ්‍යධ්වම්, අනුභව කරනු ලබන්නහුය නොහොත් අනුභව කරනු ලැබූවහුය; [තෙන], ඔහු විසින්; [සුඛං] වෙදන්වභාවිෂ්‍යත, සැප අනුභවකරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; අහම් [ඔදනඃ], ආහාරවූ මම; අන්වභාවිෂ්‍යේ, අන්වභවිෂ්‍යේ, අනුභව කරනු ලබන්නෙමි නොහොත් අනුභව කරනු ලැබූයෙමි; [තෙන], ඔහු විසින්; [සුඛං] වෙදන්වභාවිෂ්‍යත, සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; ආවාම් [ඔදනෞ], ආහාරවූ අපි දෙදෙන; අන්වභාවිෂ්‍යාවහි, අන්වභවිෂ්‍යාවහි, අනුභව කරනුලබන්නමූ නොහොත් අනුභව කරනු ලැබුයෙමූ; [තෙන], ඔහු විසින්;[සුඛං]වෙදන්වභාවිෂ්‍යත,සැප අනුභව කරනු ලබන්නේ නම් නොහොත් අනුභව කරනු ලැබුයේ නම්; වයම් [ඔදනාඃ], ආහාරවූ අපි; අන්වභාවිෂ්‍යාමහි, අන්වභවිෂ්‍යාමහි, අනුභව කරනු ලබන්නමූ නොහොත් අනුභව කරනු ලැබුයෙමූ

a. භාවෙ, භාවකාරකයෙහි;[තෙන], ඔහු විසින්; අභාවිෂ්‍යත, [අභවිෂ්‍යත], ක්‍රියාතිපත්ති අනාගතයෙහි හෝ අතීතයෙහි වීමයි.

b. ඉති ලෘඞ්, ලෘඞ් විභක්ති නිමි.

c. භූධාතොඃ, භූධාතුහුසම්බන්ධිවූ;දශලකාරාඃ, දශලකාරයෝ; ඉති, මෙසේයි.

a. අථ පච්ධාතෝර් දශලකාරාඃ ප්‍රදශ්‍ය්‍යන්තෙ.

b. 'ඩු'-පචෂ්, පාකෙ; ශබ්විකරණඃ සකර්මක උභයපදී.

c. ලට්–කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| පචති | පචතඃ | පචන්ති |
| පචසි | පචථඃ | පචථ |
| පචාමි | පචාවඃ | පචාමඃ |

d. කර්තරි ආත්මනෙ පදෙ-

| | | |
|---|---|---|
| පචතෙ | පචෙතෙ | පචන්තෙ |
| පචසෙ | පචෙථෙ | පචධ්වෙ |
| පචෙ | පචාවහෙ | පචාමහෙ |

e. කර්මණි-

| | | |
|---|---|---|
| පච්‍යතෙ | පච්‍යෙතෙ | පච්‍යන්තෙ |
| පච්‍යසෙ | පච්‍යෙථෙ | පච්‍යධ්වෙ |
| පච්‍යෙ | පච්‍යාවහෙ | පච්‍යාමහෙ. |

---

a. අථ, ඉක්බිති; පච්ධාතෝඃ, පච්-ධාතුහුගේ; දශලකාරාඃ, දශලකාරයෝ; ප්‍රදශ්‍ය්‍යන්තෙ, දක්වනු ලැබෙත්.

b. 'ඩු'–පචෂ්,ඩුකාරෂකාර ඉත් කොට ඇති'පච්'–ධාතුව;පාකෙ, පිසීමෙහි වැටේ; ශබ්විකරණඃ,'ශබ්' ප්‍රත්‍යය විකරණ කොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; උභයපදී, පරස්මෛපද ආත්මනෙ පද යන උභයපද ඇත්තේය.

c. ලට්, ලට් විභක්තියයි; කර්තරිපරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; පචති, පිසෙයි; පචතඃ, (ද්විවචනයෙහි) පිසෙත්; පචන්ති, (බහුවචනයෙහි) පිසෙත්. පචසි, පිසෙහි; පචථඃ, (ද්විවචනයෙහි) පිසහු; පචථ, (බහුවචනයෙහි) පිසහු; පචාමි, පිසමි; පචාවඃ, (ද්විවචනයෙහි) පිසමු; පචාමඃ, (බහුවචන යෙහි) පිසමු.

d. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; පචතෙ, පිසේ; පචෙතෙ, පිසෙත්; පචන්තෙ, පිසෙත්; (සෙස්ස පරස්මෛපදයෙහි මෙනි.)

e. කර්මණි, කර්මකාරකයෙහි; පච්‍යතෙ, පිසනු ලැබේ; පච්‍යෙතෙ, පිසනුලැබෙත්; පච්‍යන්තෙ, පිසනුලැබෙත්; පච්‍යසෙ, පිසනු ලැබෙහි; පච්‍යෙථෙ; පිසනුලබහු; පච්‍යධ්වෙ, පිසනුලබහු; පච්‍යෙ, පිසනුලබමි; පච්‍යාවහෙ, පිසනුලබමු; පච්‍යාමහෙ, පිසනු ලබමු.

## a. විධිලිඞ්–කර්‍තෘ පරස්සෙ පදෙ–

| | | |
|---|---|---|
| පචෙත් | පචෙතාම් | පචෙයුඃ |
| පචෙඃ | පචෙතම් | පචෙත |
| පචෙයම් | පචෙව | පචෙම |

## b. කර්‍තෘ ආත්මනෙ පදෙ–

| | | |
|---|---|---|
| පචෙත | පචෙයාතාම් | පචෙරන් |
| පචෙථාඃ | පචෙයාථාම් | පචෙධ්වම් |
| පචෙය | පචෙවහි | පචෙමහි |

## c. කර්‍මණි.

| | | |
|---|---|---|
| පච්‍යෙත | පච්‍යෙයාතාම් | පච්‍යෙරන් |
| පච්‍යෙථාඃ | පච්‍යෙයාථාම් | පච්‍යෙධ්වම් |
| පච්‍යෙය | පච්‍යෙවහි | පච්‍යෙමහි |

## d. ලොට්–කර්‍තෘ පරස්සෙ පදෙ–

| | | |
|---|---|---|
| පචතු, පචතාත් | පචතාම් | පචන්තු |
| පච, පචතාත් | පචතම් | පචත |
| පචානි, | පචාව | පචාම |

---

a. විධිලිඞ්, 'විධිලිඞ්' විභක්තියයි; කර්‍තෘ පරස්සෙ පදෙ, කර්‍තෘකාරක පරස්සෙ පදයෙහි; පචෙත්, පිසන්නේය; පචෙතාම්, පිසන්නහුය; පචෙයුඃ, පිසන්නහුය; පචෙඃ, පිසන්නෙහි; පචෙතම්, පිසන්නහු; පචෙත, පිසන්නහු; පචෙයම්, පිසන්නෙම්; පචෙව, පිසන්නමු; පචෙම, පිසන්නමු.

b. කර්‍තෘ ආත්මනෙපදෙ, කර්‍තෘකාරක ආත්මනෙපදයෙහි; පචෙත, පිසන්නේය; පචෙයාතාම්, පිසන්නහුය; පචෙරන්, පිසන්නහුය; (අවශෙෂ පදයන්හි අර්‍ථද මේනයින් සැලකියයුතු).

c. කර්‍මණි, කර්‍මකාරකයෙහි; පචෙත, පිසනුලබන්නේය; පච්‍යෙයාතාම්, පිසනුලබන්නහුය; පචෙරන්, පිසනුලබන්නහුය; පච්‍යෙථාඃ, පිසනුලබන්නෙහි; පච්‍යෙයාථාම්, පිසනු ලබන්නහු; පච්‍යෙධ්වම්, පිසනුලබන්නහු; පච්‍යෙය, පිසනුලබන්නෙම්; පච්‍යෙවහි, පිසනුලබන්නමු; පච්‍යෙමහි, පිසනුලබන්නමු.

d. ලොට්, 'ලොට්' විභක්තියයි; කර්‍තෘපරස්සෙපදෙ, කර්‍තෘකාරක පරස්සෙපදයෙහි; පචතු, පචතාත්, පිසේවා; පචතාම්, පිසෙත්වා; පචන්තු, පිසෙත්වා; පච, පචතාත්, පිසෙහිවා; පචතම්, පිසහුවා; පචත, පිසහුවා; පචානි, පිසෙම්වා; පචාව, පිසෙමුවා, පචාම, පිසෙමුවා.

a. කත්තරි ආත්මනෙ පදෙ-

| | | |
|---|---|---|
| පචතාම් | පචෙතාම් | පචන්තාම් |
| පචස්ස | පචෙථාම් | පචධවම් |
| පචෙ | පචාවහෙ | පචාමහෙ |

b. කම්මණි-

| | | |
|---|---|---|
| පච්‍යතාම් | පචෙ‍්‍යතාම් | පච්‍යන්තාම් |
| පච්‍යස්ස | පචෙ‍්‍යථාම් | පච්‍යධවම් |
| පචෙ‍්‍ය | පච්‍යාවහෙ | පච්‍යාමහෙ |

c. ලඞ්-කත්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| අපචත් | අපචතාම් | අපචන් |
| අපචඃ | අපචතම් | අපචත |
| අපචම් | අපචාව | අපචාම |

d. කත්තරි ආත්මනෙපදෙ-

| | | |
|---|---|---|
| අපචත | අපචෙතාම් | අපචන්ත |
| අපචථාඃ | අපචෙථාම් | අපචධවම් |
| අපචෙ | අපචාවහි | අපචාමහි |

e. කම්මණි-

| | | |
|---|---|---|
| අපච්‍යත | අපචෙ‍්‍යතාම් | අපච්‍යන්ත |
| අපච්‍යථාඃ | අපචෙ‍්‍යථාම් | අපච්‍යධවම් |
| අපචෙ‍්‍ය | අපච්‍යාවහි | අපච්‍යාමහි |

---

a. කත්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙ පදයෙහි; පචතාම්, පිසේවා; පචෙතාම්, පිසෙත්වා, පචන්තාම්, පිසෙත්වා, (අවශෙෂ පදයන්හි අර්ථ මේතායින් සැලකියයුතු).

b කම්මණි, කර්මකාරකයෙහි; පච්‍යතාම්, පිසනුලැබේවා; පචෙ‍්‍යතාම්, පිසනුලැබෙත්වා; පච්‍යන්තාම්, පිසනුලැබෙත්වා; පච්‍යස්ව, පිසනුලැබෙහිවා; පචෙ‍්‍යථාම්, පිසනුලබහුවා; පච්‍යධවම්, පිසනුලබහුවා; පචෛ‍්‍ය, පිසනුලබම්වා; පච්‍යාවහෛ, පිසනුලබමුවා; පච්‍යාමහෛ, පිසනුලබමුවා.

c. ලඞ්, 'ලඞ්' විභක්තියයි; කත්තරි පරසෛමපදෙ, කර්තෘකාරක පරසෛමපදයෙහි; අපචත්, (අනද්‍යතන අතීතයෙහි) පිසුයේය; අපචතාම්, පිසුවාහුය; අපචන්, පිසුවාහුය; අපචඃ, පිසුයෙහිය; අපචතම්, පිසුවහුය; අපචත, පිසුවහුය; අපචම්, පිසුයෙමි; අපචාව, පිසුයෙමු; අපචාම, පිසුයෙමු..

d. කත්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහි; අපචත, (අනද්‍යතන අතීතයෙහි) පිසුයේය; අපචෙතාම්, පිසුවහුය; අපචන්ත, පිසුවහුය. (අවශෙෂ පදයන්හි අර්ථ මේතායින් සැලකියයුතු).

e. කම්මණි, කර්මකාරකයෙහි; අපච්‍යත, (අනද්‍යතන අතීතයෙහි) පිසනුලැබුයේය; අපචෙ‍්‍යතාම්, පිසනු ලැබුවාහුය; අපච්‍යන්ත, පිසනුලැබුවාහුය; අපච්‍යථාඃ, පිසනුලැබුයෙහිය;

a. ලුඞ්— කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| අපාක්ෂීත් | අපාක්තාම් | අපාක්ෂුඃ |
| අපාක්ෂීඃ | අපාක්තම් | අපාක්ත |
| අපාක්ෂම් | අපාක්ෂ්ව | අපාක්ෂ්ම |

b. කර්තරි ආත්මනෙ පදෙ-

| | | |
|---|---|---|
| අපක්ත | අපක්ෂාතාම් | අපක්ෂත |
| අපක්ථාඃ | අපක්ෂාථාම් | අපග්ධ්වම් |
| අපක්ෂි | අපක්ෂ්වහි | අපක්ෂ්මහි |

c. කර්මණි-

| | | |
|---|---|---|
| අපාචි | අපක්ෂාතාම් | අපක්ෂත |
| අපක්ථාඃ | අපක්ෂාථාම් | අපග්ධ්වම් |
| අපක්ෂි | අපක්ෂ්වහි | අපක්ෂ්මහි |

.d ලිට්— කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| පපාච | පෙචතුඃ | පෙචුඃ |
| පෙචිථ, පපක්ථ, | පෙචථුඃ | පෙච |
| පපාච, පපච | පෙචිව | පෙචිම |

---

අපචේ‍යථාම්, පිසනුලැබුවහුය; අපච්‍යධ්වම්, පිසනුලැබුවහුය; අපචේ‍ය, පිසනුලැබුයෙමි; අපච්‍යාවහි, පිසනුලැබුයෙමි; අපච්‍යාමහි, පිසනුලැබුයෙමු.

a. ලුඞ්, 'ලුඞ්' විභක්තියයි;. කර්තරි පරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි; අපාක්ෂීත්, (සාමාන්‍ය අතීතයෙහි) පිසුයේය; අපාක්තාම්, පිසුවාහුය; අපාක්ෂුඃ, පිසුවාහුය; අපාක්ෂීඃ, පිසුයෙහිය; අපාක්තම්, පිසුවහුය; අපාක්ත, පිසුවහුය; අපාක්ෂම්, පිසුයෙමි; අපාක්ෂ්ව, පිසුයෙමු; අපාක්ෂ්ම, පිසුයෙමු.

b. කර්තරි ආත්මනෙ පදෙ, කර්තෘකාරක ආත්මනෙ පදයෙහි; අපක්ත, (සාමාන්‍ය අතීතයෙහි) පිසුයේය; අපාක්ෂාතාම්, පිසුවාහුය; අපක්ෂත, පිසුවාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු)

c. කර්මණි, කර්මකාරකයෙහි; අපාචි, (සාමාන්‍ය අතීතයෙහි) පිසනුලැබුයේය; අපක්ෂාතාම්, පිසනුලැබුවාහුය; අපක්ෂත, පිසනුලැබුවාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු).

d. ලිට්, 'ලිට්' විභක්තියයි; කර්තරි පරස්මෛ පදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි; පපාච, (අප්‍රත්‍යක්ෂ අතීතයෙහි) පිසුයේය; පෙචතුඃ, පිසුවාහුය; පෙචුඃ, පිසුවාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු)

a. කර්ත්‍රි ආත්මනෙ පදෙ, කර්මණිච–

| | | |
|---|---|---|
| පෙචෙ | පෙචාතෙ | පෙචිරෙ |
| පෙචිෂෙ | පෙචාථෙ | පෙචිධ්වෙ |
| පෙචෙ | පෙචිවහෙ | පෙචිමහෙ |

b. ලුට්– කර්ත්‍රි පරස්මෛපදෙ–

| | | |
|---|---|---|
| පක්තා | පක්තාරෞ | පක්තාරඃ |
| පක්තාසි | පක්තාස්ථඃ | පක්තාස්ථ |
| පක්තාස්මි | පක්තාස්වඃ | පක්තාස්මඃ |

c. කර්ත්‍රි ආත්මනෙ පදෙ, කර්මණිච–

| | | |
|---|---|---|
| පක්තා | පක්තාරෞ | පක්තාරඃ |
| පක්තාසෙ | පක්තාසාථෙ | පක්තාධ්වෙ |
| පක්තාහෙ | පක්තාස්වහෙ | පක්තාස්මහෙ. |

d. ආශීර්ලිඞ්– කර්ත්‍රි පරස්මෛපදෙ–

| | | |
|---|---|---|
| පච්‍යාත් | පච්‍යාස්තාම් | පච්‍යාසුඃ |
| පච්‍යාඃ | පච්‍යාස්තම් | පච්‍යාස්ත |
| පච්‍යාසම් | පච්‍යාස්ව | පච්‍යාස්ම. |

---

a. කර්ත්‍රි ආත්මනෙ පදෙ, කර්තෘකාරක ආත්මනෙ පදයෙහිද; කර්මණිච, කර්මකාරකයෙහිද (එකලෙසවෙයි) පෙචෙ, (අප්‍රත්‍යක්ෂ අතීතයෙහි) පිසුයේය, නොහොත්, (කර්මකාරක අප්‍රත්‍යක්ෂ අතීතයෙහි) පිසනුලැබුයේය; පෙචාතෙ, පිසුවාහුය නොහොත් පිසනුලැබුවාහුය; පෙචිරෙ, පිසුවාහුය නොහොත් පිසනුලැබුවාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකිය යුතු)

b. ලුඨ්, 'ලුට්' විභක්තියයි; කර්ත්‍රි පරස්මෛ පදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි; පක්තා, (අනද්‍යතන අනාගතයෙහි), පිසන්නේය; පක්තාරෞ, පිසන්නාහුය; පක්තාරඃ, පිසන්නාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු).

c. කර්ත්‍රි ආත්මනෙ පදෙ, කර්තෘකාරක ආත්මනෙ පදයෙහිද; කර්මණිච, කර්මකාරකයෙහිද; (එකලෙසවෙයි). පක්තා, (අනද්‍යතන අනාගතයෙහි) පිසන්නේය නොහොත් (කර්මකාරක අනද්‍යතන අනාගතයෙහි) පිසනුලබන්නේය; පක්තාරෞ, පිසන්නාහුය නොහොත් පිසනුලබන්නාහුය; පක්තාරඃ, පිසන්නාහුය නොහොත් පිසනුලබන්නාහුය; (අවශෙෂපදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු).

d. ආශීර්ලිඞ, 'ආශීර්ලිඞ්' විභක්තියයි; කර්ත්‍රි පරස්මෛ පදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; පච්‍යාත්, පිසේවා; පච්‍යාස්තාම්, පිසෙත්වා; පච්‍යාසුඃ, පිසෙත්වා; පච්‍යාඃ, පිසෙහිවා; පච්‍යාස්තම්, පිසහුවා; පච්‍යාස්ත, පිසහුවා; පච්‍යාසම්, පිසෙම්වා, පච්‍යාස්ව, පිසමූවා; පච්‍යාස්ම, පිසමූවා.

a. කර්තරි ආත්මනෙ පදෙ, කර්මණි ච-

| | | |
|---|---|---|
| පක්ෂීෂ්ට | පක්ෂීයාස්තාම් | පක්ෂීරන් |
| පක්ෂීෂ්ඨාඃ | පක්ෂීයාස්ථාම් | පක්ෂීධ්වම් |
| පක්ෂීය | පක්ෂීවහි | පක්ෂීමහි. |

b. ලෘට්- කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| පක්ෂ්‍යති, | පක්ෂ්‍යතඃ | පක්ෂ්‍යන්ති |
| පක්ෂ්‍යසි | පක්ෂ්‍යථඃ | පක්ෂ්‍යථ |
| පක්ෂ්‍යාමි, | පක්ෂ්‍යාවඃ | පක්ෂ්‍යාමඃ |

c. කර්තරි ආත්මනෙපදෙ, කර්මණිච-

| | | |
|---|---|---|
| පක්ෂ්‍යතෙ | පක්ෂ්‍යෙතෙ | පක්ෂ්‍යන්තෙ |
| පක්ෂ්‍යසෙ | පක්ෂ්‍යෙථෙ | පක්ෂ්‍යධ්වෙ |
| පක්ෂ්‍යෙ | පක්ෂ්‍යාවහෙ | පක්ෂ්‍යාමහෙ. |

d. ලෘඞ්- කර්තරි පරස්මෛපදෙ-

| | | |
|---|---|---|
| අපක්ෂ්‍යත් | අපක්ෂ්‍යතාම් | අපක්ෂ්‍යන් |
| අපක්ෂ්‍යඃ | අපක්ෂ්‍යතම් | අපක්ෂ්‍යත |
| අපක්ෂ්‍යම් | අපක්ෂ්‍යාව | අපක්ෂ්‍යාම |

---

a. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහිද; කර්මණිච, කර්මකාරකයෙහිද (එකලෙස වෙයි.), පක්ෂීෂ්ට, පිසේවා නොහොත් පිසනුලැබේවා; පක්ෂීයාස්තාම්, පිසෙත්වා නොහොත් පිසනුලැබෙත්වා; පක්ෂීරන්, පිසෙත්වා නොහොත් පිසනු ලැබෙත්වා, (අවශෙෂපදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු.)

b. ලෘට්, 'ලෘට්' විභක්තියයි; කර්තරි පරස්මෛ පදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; පක්ෂ්‍යති, (සාමාන්‍ය අනාගතයෙහි) පිසන්නේය; පක්ෂ්‍යතඃ, පිසන්නාහුය; පක්ෂ්‍යන්ති, පිසන්නාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේ නයින් සැලකියයුතු).

c. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහිද; කර්මණිච, කර්මකාරකයෙහිද (එකලෙසවෙයි.) පක්ෂ්‍යතෙ, (සාමාන්‍ය අනාගතයෙහි) පිසන්නේය නොහොත් (කර්මකාරක-සාමාන්‍ය අනාගතයෙහි) පිසනුලබන්නේය; පක්ෂ්‍යෙතෙ, පිසන්නාහුය නොයොත් පිසනුලබන්නාහුය; පක්ෂ්‍යන්තෙ, පිසන්නාහුය නොහොත් පිසනුලබන්නාහුය; (අවශෙෂ පදයන්හි අර්ථද මේනයින් සැලකියයුතු.)

d. ලෘඞ්, 'ලෘඞ්' විභක්තියයි; කර්තරිපරස්මෛපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; අපක්ෂ්‍යත්; (ඉදින්දර ලැබුයෙහිනම් බත) පිසන්නේය; අපක්ෂ්‍යතාම්, පිසන්නාහුය; අපක්ෂ්‍යන්, පිසන්නාහුය; (අවශෙෂ පදයන්හිද අර්ථ මේ නයින් සැලකියයුතු)

a. කර්තරි ආත්මනෙපදෙ, කර්මණිච-

| | | |
|---|---|---|
| අපක්ෂ්‍යත | අපක්ෂ්‍යෙතාම් | අපක්ෂ්‍යන්ත |
| අපක්ෂ්‍යථාඃ | අපක්ෂ්‍යෙථාම් | අපක්ෂ්‍යධ්වම් |
| අපක්ෂ්‍යෙ, | අපක්ෂ්‍යාවහි | අපක්ෂ්‍යාමහි |

b. ඉති පච්ධාතෝර්දශලකාරඃ.

c. භ්වාදිඃ.

---

## d. ගණභේදඃ.

e. අද- භක්ෂණෙ;- ලුක් විකරණඃ, සකර්මකඃ, පරස්මෛපදී; අත්ති, අත්තඃ, අදන්තීත්‍යාදි-අදාදිඃ.

f. හු- දානාදනයොඃ; ශ්ලුවිකරණඃ, සකර්මකඃ, පරස්මෛපදී; ජුහොති, ජුහුතඃ, ජුහ්වතීත්‍යාදි- ජුහොත්‍යාදිඃ.

---

a. කර්තරි ආත්මනෙපදෙ, කර්තෘකාරක ආත්මනෙපදයෙහිද; කර්මණිච, කර්මකාරකයෙහිද (එකලෙසමෙයි) අපක්ෂ්‍යත, (ඉදින් දර ලැබුයෙහිනම් බත) පිසන්නේය නොහෙත් (කර්මකාරක යෙහි) පිසනුලබන්නේය; අපක්ෂ්‍යෙතාම්, පිසන්නාහුය නොහොත් පිසනුලබන්නාහුය; අපක්ෂ්‍යන්ත, පිසන්නාහුය නොහොත් පිසනුලබන්නාහුය; (අවශෙෂ පදයන්හි අර්ථ ද මේ නයින් සැලකියයුතු).

b පච්ධාතොඃ, පච්-ධාතුව පිළිබඳ, දශලකාරාඃ, දශලකාරයෝ; ඉති, මෙසේයි.

c. භ්වාදිඃ, භ්වාදි ධාතු ගණයයි.

d. ගණභෙදඃ, ධාතුගණභෙදය දක්වනු ලැබේ.

e අද, 'අද' යන ධාතු; භක්ෂණෙ, කෑමෙහි වැටේ; ලුක් විකරණඃ, විකරණ ප්‍රත්‍යය ලොප්වනහෙයින් ලුක්විකරණ නම්; සකර්මකඃ, කර්මසහිතය; පරස්මෛපදී, පරස්මෛපද රූප ඇත්තේය; (සඃ ඕදනං) අත්ති, (හෙතෙම බත) වළඳයි; (තෞ ඕදනං) අත්තඃ, (ඔහුදෙදෙන බත) වළඳත්; (තෙ ඕදනං) අදන්ති, (ඔහු තුමූ බත) වළඳත්; ඉත්‍යාදි, යනාදිය වේ. අදාදිඃ, අදාදිධාතුගණ යයි.

f. හු, 'හු' යන ධාතු; දානාදනයොඃ, දීම හා අනුභව කිරීමෙහි වැටේ; ශ්ලුවිකරණඃ, 'ශ්ලු'ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; පරස්මෛපදී, පරස්මෛපද රූප ඇත්තේය; (සඃ අග්නිං) ජුහොති, (හෙතෙම ගිනිදෙවියා) පුදයි;

a. දිවු- ක්‍රීඩා විජිගීෂා ව්‍යවහාරද්‍යුතිස්තුති මෝදමද
ස්වප්න කාන්තිගතිෂු-ශ්‍යන්විකරණඃ, අකර්මකඃ,
පරස්මෛපදී; දීව්‍යති, දිව්‍යතඃ, දීව්‍යන්ති-
ත්‍යාදි-දිවාදිඃ.

b. ෂුඤ්- අභිෂවෙ; ශ්නු විකරණඃ, සකර්මක උභයපදී,
සනාතෙ'කර්මකඃ සුනොති, සුනුතඃ,
සුන්වන්තිත්‍යාදි-ස්වාදිඃ.

c. තුද- ව්‍යථනෙ; ශවිකරණඃ, සකර්මක උභයපදී;
තුදති, තුදතඃ, තුදන්තිත්‍යාදි- තුදාදිඃ.

d. රුධිර්-ආවරණෙ; ශ්නම්විකරණඃ, සකර්මක උභයපදී,
රුණද්ධි, රුන්ධඃ, රුන්ධන්තිත්‍යාදි- රුධාදිඃ.

---

(තෞ අග්නිං) ජුහුතඃ, (ඔහුදෙදෙන ගිනිදෙවියා) පුදත්; (තෙ අග්නිං) ජුහ්වති, (ඔහුතුමූ ගිනිදෙවියා) පුදත්; ඉත්‍යාදි, යනාදියවේ; ජුහොත්‍යාදිඃ, ජුහොත්‍යාදි ගණයයි.

a. දිවු, 'දිවු' යන ධාතු; ක්‍රීඩා, ක්‍රීඩාවය; විජිගීෂා, දිනනු කැමැත්තය; ව්‍යවහාර, ව්‍යවහාරය; ද්‍යුති, ශොභාවය; ස්තුති, ස්තුතිය; මොද, සතුටය; මද, මතය; ස්වප්න, නිදීමය; කාන්ති, කාන්තිය; ගතිෂු, ගමනය යන මෙහි වැටේ; ශ්‍යන්විකරණඃ, 'ශ්‍යන්'විකරණවේ; අකර්මකඃ, කර්මරහිතය; පරස්මෛපදී, පරස්මෛපද රූප ඇත්තේය; (සඃ) දීව්‍යති, (හෙතෙම) ක්‍රීඩා කෙරේ; (තෞ) දීව්‍යතඃ, (ඔහුදෙදෙන) ක්‍රීඩාකෙරෙත්; (තෙ) දීව්‍යන්ති, (ඔහුතුමූ) ක්‍රීඩාකෙරෙත්. ඉත්‍යාදි, යනාදියවේ; දිවාදිඃ, දිවාදි ධාතුගණයයි.

b. ෂුඤ්, 'ෂුඤ්' යන ධාතු; අභිෂවෙ, ප්‍රශවයෙහි හෙවත් රැස්කිරීමෙහි වැටේ; ශ්නුවිකරණඃ, 'ශ්නු' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; උභයපදී, උභය පද ඇත්තේය; සනාතෙ, නෑමෙහි; අකර්මකඃ, කර්මනැත්තේය; (සඃ) සුනොති, (හෙතෙම) ප්‍රශවකෙරෙයි; (තෞ) සුනුතඃ, (ඔහු දෙදෙන) ප්‍රශව කෙරෙති; (තෙ) සුන්වන්ති, (ඔහුතුමූ) ප්‍රශව කෙරෙත්; ඉත්‍යාදි, යනාදියවේ; ස්වාදිඃ, ස්වාදිධාතු ගණයයි.

c. තුද, 'තුද' යන ධාතු; ව්‍යථනෙ, පෙළීමෙහි වැටේ; ශවිකරණඃ, 'ශවි' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ. කර්මසහිතය; උභයපදී, උභයපද ඇත්තේය; (සඃ පරං) තුදති, (හෙතෙම අන්‍යයා පෙළයි; (තෞ පරං) තුදතඃ, (ඔහු දෙදෙන අන්‍යයා පෙළති; (තෙ පරං; තුදන්ති, (ඔහුතුමූ අන්‍යයා) පෙළති; ඉත්‍යාදි, යනාදියවේ; තුදාදිඃ, තුදාදි ධාතුගණයයි.

d. රුධිර්, 'ඉර්' අනුබන්ධකොටඇති 'රුධි' යන ධාතු; ආවරණෙ, ආවරණයෙහි වැටේ; ශ්නම් විකරණඃ,'ශ්නම්' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; උභයපදී,

a. තනු- විස්තාරේ; උ විකරණඃ, සකර්මක උභයපදී;
තනෝති, තනුතඃ, තන්වන්තීත්‍යාදි- තනාදිඃ.

b. ඩුක්‍රීඤ්-ද්‍රව්‍යවිනිමයෙ, ශ්නාවිකරණඃ, සකර්මකඋභයපදී;
ක්‍රීණාති, ක්‍රීණීතඃ, ක්‍රීණන්තීත්‍යාදි-ක්‍ර්‍යාදිඃ.

c. චුර- ස්තෙයෙ; ණිච්විකරණඃ, සකර්මක උභය පදී;
චෝරයති, චෝරයතඃ, චෝරයන්තීත්‍යාදි-චුරාදිඃ

## d, ක්‍රියාමාලා සමාප්තා.

---

උභයපද ඇත්තේය; (ගොපඃ ගාං) රුණද්ධි, (ගොපලුතෙම ගෙරිහු) අවුරයි; (ගොපෞ ගාං) රුන්ධඃ, (ගොපල්ලෝ දෙදෙන ගෙරිහු) අවුරත්; (ගොපාඃ ගාං) රුන්ධන්ති, (ගොපල්ලෝ තුමූ ගෙරිහු) අවුරත්; ඉත්‍යාදි, යනාදිය වේ; රුධාදිඃ, රුධාදි ධාතුගණයි.

a. තනු, 'තනු' යන ධාතු; විස්තාරෙ, පැතිරවීමෙහි වැටේ; උවිකරණඃ, 'උ' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; උභයපදී, උභයපද ඇත්තේය; (සඃ ග්‍රන්ථං) තනෝති, (හෙතෙම ග්‍රන්ථයක්) කෙරෙයි; (තෞ ග්‍රන්ථං) තනුතඃ, (ඔහුදෙදෙන ග්‍රන්ථයක් කෙරෙත්; (තෙ ග්‍රන්ථං) තන්වන්ති, (ඔහු තුමූ ග්‍රන්ථයක්) කෙරෙත්; ඉත්‍යාදි, යනාදියවේ; තනාදිඃ, තනාදි ධාතු ගණයයි.

b. ඩුක්‍රීඤ්, ඩුකාර ඤකාර ඉත්කොට ඇති 'ක්‍රී' ධාතුව; ද්‍රව්‍ය විනිමයෙ, ද්‍රව්‍ය ගනුදෙනුයෙහි වැටේ; ශ්නාවිකරණඃ, 'ශ්නා' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්මසහිතය; උභය පදී, උභය පද ඇත්තේය; (සඃ සුවර්ණං) ක්‍රීණාති, (හෙතෙම සුවර්ණය මිලදීගණී; (තෞ සුවර්ණං) ක්‍රීණීතඃ, (ඔහුදෙදෙන සුවර්ණය) මිලදී ගනිත්; (තෙ සුවර්ණං) ක්‍රීණන්ති, (ඔහුතුමූ සුවර්ණය) මිලදී ගනිත්; ඉත්‍යාදි, යනාදියවේ; ක්‍ර්‍යාදිඃ, ක්‍ර්‍යාදි ධාතුගණයයි.

c. චුර, 'චුර' යන ධාතු; ස්තෙයෙ, සොරාගැන්මෙහි වැටේ; ණිච්විකරණඃ, 'ණිච්' ප්‍රත්‍යය විකරණකොට ඇත්තේය; සකර්මකඃ, කර්ම සහිතය; උභයපදී, උභයපද ඇත්තේය; (සඃ පරධනං) චෝරයති, (හෙතෙම අන්සතුධනය) සොරා ගනී; (තෞ පරධනං) චෝරයතඃ, (ඔහුදෙදෙන අන්සතු ධනය) සොරාගනිත්; (තෙ පරධනං) චෝරයන්ති, (ඔහුතුමූ අන්සතු ධනය) සොරා ගනිත්; ඉත්‍යාදි, යනාදිය වේ; චුරාදිඃ, චුරාදි ධාතුගණයයි.

d. ක්‍රියාමාලා, ක්‍රියාමාලාතොමෝ; සමාප්තා, නිමවන ලද්දීය.

# ශුද්ධි පත්‍රය.

| පිට, | පෙල | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 10 | සමාසඃ | සමාසාඃ |
| 2 | 2 | එකරදිනි | එකාරදීනි |
| ,, | 5 | ගශඥ | ගශඩ |
| 3 | 1 | විසර්ජනීයාන්තං | විසර්ජනීයාන්තාං |
| ,, | 3 | ඤුම්බණන්තාන්තාං | ඤුම්බණන්තන්තාං |
| 4 | 4 | අදන්තානා | ආදන්තානා |
| 7 | 29 | අනෙකාන්තත්ම් | අනෙකාන්තාන්තත්ම් |
| 8 | 11 | සෙවලෝ පශවාපදන්තන | සෙවාලෝපශවා පදන්තන |
| 9 | 11 | තසෙම+එතත් | තසෙසම+එතත් |
| 11 | 5 | වාගන්තා | වාගන්ථා |
| 15 | 2 | රජංශවිත්‍රම් | රජංශවිත්‍රම් |
| 16 | 30 | ×කාශනපදය, ඟපෙඟ ශන පදය | ×කාඟපෙඟශන පදය |
| 17 | 23 | විසගිලොප | විසගිලොප |
| ,, | 27 | ලොප්නම් | ලොපග්සංඥ ලොපයනම්. |
| ,, | 30 | දෙවඃ+අත්‍ර | දෙවාඃ+අත්‍ර |
| ,, | 33 | භගොස් | භගාස් |
| 18 | 5 | ගිලපතිඃ | ගිලපතිඃ |
| 19 | 3 | විතීයාධ්‍යාඃ | විතීයාධ්‍යායඃ |
| ,, | 5 | ප්‍රථමාප්‍රයොගායඃ | ප්‍රථමාප්‍රයොගාඃ |
| ,, | 7 | චක්‍ෂුඃ උදෙති | චක්‍ෂු උදෙති |
| ,, | 11 | ස, එ, ෂ, | ස, එෂ |
| ,, | 19 | පරසෙම්පදී | පරස්මෛපදී |
| ,, | 23 | 'ඉ'-ගනනෘ | 'ඉණ්'+ගනනෘ |
| 20 | 14 | ජ්වලතිඃ | ජවලති |
| ,, | 17 | පරස්මෛපද | ආත්මනෙපද |
| ,, | 18 | අකාරාන්ත | ආකාරාන්ත |
| ,, | 26 | රොදති, | රොදිති, |
| ,, | 12 | ප්‍රකාශතඃ | ප්‍රකාශන |
| 22 | 11 | ගෙරිතෙමඃ | ගෙරීතෙම |
| ,, | 13 | ඔෘකාරාන්ත, | ඔකාරාන්ත |
| ,, | 13 | 'ගෞ' ශබ්දඃ | 'ගො' ශබ්දඃ |
| 22 | 19 | අනුකම්පානම් | අනුකම්පා කෙරෙති. |
| ,, | 21 | තකාරාන්ත, | තකාරාන්ත |
| ,, | 21 | 'මහත්' ශබ්දඃ | 'මහන්' ශබ්දඃ |
| ,, | 29 | පුංලිඞ්ගා | ස්ත්‍රීලිඞ්ගා |
| 23 | 4 | ප්‍රයොගාඃ | ප්‍රයොගාඃ |
| ,, | 8 | යසතම | යශස්තම |
| ,, | 10 | 'යසශ්' ශබ්දඃ | 'යශස්' ශබ්දඃ |
| ,, | 20 | ගතමෘ | ගමෘ |
| ,, | 29 | පුරුකෙවචන, | පුරුෂෙකවචන |
| 24 | 6 | ශාස්ත්‍රාභ්‍යාස තෙම | උත්සාහවත් තෙම |
| 25 | 16 | පරිභොග කෙරේ | පාලනය කෙරේ |
| ,, | 20 | අභ්‍යවහරණ, | පාලනාභ්‍යවහරණයොඃ |
| ,, | 26 | යාවෙතනත | යාචනත |
| 26 | 10 | දුග්ධං | දුග්ධඃ |
| 27 | 21 | උචිතා | භානිඃ |
| ,, | 22 | උවියොග | ප්‍රතියොග |
| 28 | 20 | ජිඥතඃ | ජිනතඃ |
| ,, | 20 | 'ජි'-ධීර්,වෙධී කාරණ, | 'ජිද්රි'-තෙදවධී කාරණ |
| 29 | 29 | ලව්කතීකාරක | ලිව්කතීකාරක |
| 31 | 22 | 'තාඃජ්ලවන'- තරණයොඃ | 'තාඃ-'ජ්ලවන තරණයොඃ |
| 32 | 6 | අසතාම්,ආසම්, | ආසතාම්,ආසන් |
| ,, | 19 | දුහිසති | දුහිසතුනි |
| 35 | 13 | ක්‍රුධ්‍යති | ද්‍රුහ්‍යති |
| 33 | 16 | අනුකතසම්ප්‍රදානම් | අනුකතසම්බන්ධඃ |
| 44 | 24 | තකාරාන්ත | දකාරාන්ත |
| ,, | 24 | 'අස්මත්'ශබ්දඃ | 'අස්මද්' ශබ්දඃ |
| 45 | 14 | පැලලුම්නුවර | පැලලුප් නුවර |
| 47 | 27 | රජඹු විසින් | රජුන් විසින් |
| ,, | 31 | සාධවඃ, සත් පුරුෂයෝ | සාධවඃ එව, සත්පුරුෂයෝම, |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 43 | 15 | පිසිටි | වැතලදී |
| ,, | 15 | භාවකාරක | සම්කාරක |
| 49 | 7 | පක්ෂිණා: | පක්ෂිණ: |
| 51 | 25 | ශෘතතම | නීවතම |
| 55 | 14 | තැලපදිඝනාමි: | තැලපදිශාමී: |
| 56 | 3 | පුසවජති | ප්‍රාවජ |
| ,, | 18 | ලවිනුසා | ලොවිත්‍රිසා |
| ,, | 29 | අනුනනසම්ප්‍ර දනම් | අනුකනාපාදනම් |
| 58 | 2 | නාසිවනදනී | නාගිනනදනී |
| ,, | 25 | සාත`• | කනමින් |
| 59 | 12 | දෙයම්, දින සුතුවූ | අනදෙම්, නො දියසුතුවූ |
| 61 | 4 | නිර්විසාඃ: | නිර්විඝං |
| ,, | 33 | විනිදා | විඛතාන් |
| 62 | 28 | හිමවැල්ලක්ම | හිමවැලැක්ම |
| 64 | 9 | මුනිසිමනසිහාදි | මුනිහිංමසිහාදි |
| ,, | 11 | අතිවනාපෙය නත'ශෘනාදය | ශෘනොදය අති වනාපය - නා'ශෘ පොාදයම්' |
| 66 | 23 | ලති-අවශ්‍යුං සංනා | ලබ්-අවසුං සහන |
| 69 | 26 | පානවානත | ආශ්‍රානත |
| 70 | 19 | දුබර්ලසය | දෞර්බලස්‍ය |
| ,, | 22 | ද්‍රාලිඩොහා | ක්ලීවලිඩොහා |
| ,, | 32 | මේතනම්නුයි | මේ තෙං මීනුයි ජනවුනයන් මෙ තනමීනුයි. |
| 71 | 5 | ජිනති | ජිනනති |
| 72 | 22 | භූතනභසබලි: | භූතනභනාබලි: |
| ,, | 30 | 'ප්‍ර' පූඵං | 'ප්‍ර' පූඵ: |
| 73 | 20 | මධ්‍යාහනවෙලා | භෝජනවෙලා |
| 80 | 17 | භොජක | භොජය |
| ,, | 21 | පලං | ඵලම් |
| 84 | 20 | ශෘනිසවානසෛ | ශෘතිවානසෛ |
| ,, | 29 | බහුංවනත් | බහුව නත් |
| ,, | 32 | පරංනොගසං | පරාණභොගයම් |
| 85 | 30 | ජරතසවනඃ | ජරතසවනත |
| 86 | 3 | රඛනත | රඛනනත |
| ,, | 21 | පාවිකානසෛ | පාවිකාවසා |
| 88 | 14 | සාරවව | සාරුව |
| ,, | 21 | රාජ | රාජා |
| 91 | 23 | සිහිදුකෙරෙයි | සිහිදුකරවයි. |
| 91 | 30 | සුෂටු | සුෂ්ඨු |
| ,, | 31 | දෘෂටමාත්‍රම් | දෘෂ්ටිමාත්‍රම් |
| 92 | 9 | සම්ධානර | සම්ධාරණය |
| ,, | 15 | හිමාලය: | හිමාලයාත් |
| ,, | 19 | අනු පූර්ව: | අනු, ප්‍ර, පූර්ව: |
| ,, | 23 | ලව්සාඨ්‍යකාරක | ලබ්ධසාධ්‍යකාරක |
| 93 | 6 | ලව් | ලබ් |
| ,, | 11 | තල | තුල් |
| ,, | 21 | සඤ්චරති | සඤ්චරන්ති |
| ,, | 25 | චරනතා | චරණ |
| 94 | 16 | සනපත්වා | සනපවිත්වා |
| ,, | 21 | ශ්‍රමුනසිනව දෙව | 'ශ්‍රමු' - නපසිනබ දෙව |
| ,, | 30 | කෙවස්-සප සිංහාම් | හෙවස්-සපඛා සාම් |
| 95 | 15 | ආශ්‍රතාම් | ආශ්‍රතම් |
| ,, | 23 | සාතිවිශෙෂ ණම් | සාම්විශෙෂණම් |
| ,, | 24 | බනවාලොකඃ | බහවෙ ලොකා |
| ,, | 33 | කුවිනි | කුවිත්තු |
| ,, | 34 | කාලාම් | කාරවාම |
| 96 | 5 | අපුනතා | අපුත්‍රා |
| ,, | 9 | සම්සවානසෛ | සම්සංසයෙයා ගෙනෛ |
| ,, | 29 | ලබ්ධශෘනං | ලබධංශෘනං |
| 97 | 22 | පුෂණතඃ | පුෂණීනඃ |
| 98 | 21 | අනිම් | අණිව |
| ,, | 23 | මෙත්‍රඃ, මෙ ත්‍රතම | මෙවත්‍රඃ, මෙවත්‍ර තෙම |
| 100 | 13 | කාලම් කාලය | කාලම් සම්පති කාලයගෙවයි |
| ,, | 20 | බනහවාජාසා | බංහවනාජාසා |
| ,, | 33 | දම්පතය | දම්පතය |
| 101 | 13 | නදීමාතාකඃ | නදීමාතෘක |
| ,, | 28 | ද්විවචනානනා ශබ්දඃ, | ශබ්දඃ, ද්විව චනානනාඃ |
| 102 | 3 | පදනං | පාදනං |
| ,, | 9 | ශෙවස් | හෙවස් |
| ,, | 13 | නෙනුශව | නෙනුංව |
| 104 | 1 | ප්‍රවජිතෙ | ප්‍රවජිත |
| ,, | 28 | සුයසීවනු මානෙෂ | සුයසීවනු මනෙෂ |
| 105 | 3 | චතුර්විධ්‍යායඃ | විතුර්විධ්‍යායඃ |

| පිට, පේළි. | | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 103 | 16 | ප්‍රත්‍යාන්ත | ප්‍රත්‍යයාන්ත |
| ,, | 16 | මුඛක්‍ෂාලනාදිකං | මුඛක්‍ෂාලනා දීසං |
| 107 | 4 | ප්‍රයෝජ්‍යමිසති | ප්‍රයෝජනමිසති |
| ,, | 23 | ෂඨා | සඨා |
| ,, | 27 | ගනුලැබේවා | ජනුලැබේවා |
| 108 | 20 | අශ-අභිසජිත | දිශ-අභිසජිත |
| ,, | 24 | ප්‍රවරත්‍යසථා නානං | ප්‍රවාරසත්‍යසථා නං |
| 109 | 6 | චිත්‍රකාකුලා | චිත්‍රාකුලා |
| ,, | 12 | තායාදයෙඹා වතුථ | තාදයේවයවතු ර්ථි |
| ,, | 23 | අත | තත |
| 110 | 8 | කාමිණ.ව්‍යසම් | කාමිණීව්‍යසම් |
| 111 | 15 | දෘෂ්ටෙ: | දෘෂ්ටා: |
| 112 | 4 | ප්‍රත්‍යාන්ත | ප්‍රත්‍යයාන්ත |
| 1ɩ4 | 16 | ඉකාරාන්ත | ඊකාරාන්ත |
| ,, | 22 | සම්ලොකඃ | සම්ලොකාඃ |
| ,, | 28 | (සම්) | (අසම්) |
| 1.5 | 16 | කස්මාත් ඨ නාත් | කස්මාත්සථා නාත් |
| ,, | 18 | අනුකතාපාද නම් | අපාදන විභ ක්‍ෂණම් |
| 116 | 30 | (භවති) | (භවථ) |
| 119 | 3 | ක්‍රියන්ති | ක්‍රිධති |
| ,, | 9 | ප්‍රපූර්‍ව: 'ඤි' | ද්‍රවජ-'ඤි' |
| ,, | 26 | මඤ්ඤභාගයං | මඤ්ඤංභාගයං |
| ,, | 33 | ධුකෘඤ්'-කාර ණ | 'ක්‍රිඩ'- ක්‍රිඩාකාමි |
| 120 | 2 | කෙවලත් | කෙවලම් |
| ,, | 10 | (සඃ) උක්ත ප්‍රකෘති | (අපිඃ) උක්ත කති |
| 121 | 5 | ක්‍රියත | ක්‍රියතෙ |
| ,, | 9 | 'තවා'ප්‍රත්‍ය යාන්ත | 'කාඛා.ච' ප්‍රත්‍ය යාන්ත |
| ,, | 30 | ලුඞ්ක්‍රියා | ලඞ්ක්‍රියා |
| 122 | 25 | විප්‍රකාරඃතු | විප්‍රදරකඃතු |
| ,, | 27 | ලට්ක්‍රියා | ලිට්ක්‍රියා |
| 123 | 11 | ලට්ක්‍රියා | ලිට්ක්‍රියා |
| ,, | 21 | ළිඞ්ක්‍රියා | ලඞ්ක්‍රියා |
| 124 | 7 | කෘධාඃ | කෘධායා |
| ,, | 18 | සවසය | සවංච |
| ,, | 19 | සදා | ෂදෘ |

| පිට, පේළි. | | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 125 | 11 | අවිනතානි | අවිනයෙ |
| 12; | 8 | පුත්‍රනපෙතත | දුත්‍රනපෙතත |
| ,, | 15 | සව | ශවු |
| ,, | 20 | සඤ්ඤම් | සඤ්ඤාම් |
| 127 | 15 | කම්කාර | කති කාරක |
| ,, | 20 | මුද්‍රා | මුද්‍රාම් |
| ,, | 29 | ස්ඨා | සථා |
| ,, | 32 | දයා | දසාං |
| 123 | 11 | ජිණවාවෙ | ජිණවසාවෙ |
| ,, | 30 | කාශ්වින් | කාශ්මිංශ්චින් |
| 12) | 5 | මෛත්‍රව්‍යසම් | මව්‍යසම් |
| ,, | 17 | ලුඞ්ක්‍රියා | ලඞ්ක්‍රියා |
| ,, | 19 | කාපයා | කාපා |
| ,, | 29 | මෛත්‍රව්‍යසම් | මව්‍යසම් |
| 130 | 1 | එකාරකබ | එකාරකබ |
| ,, | 9 | කාවකබ | කාවච |
| 131 | 7 | කර්ත්‍රි | කති |
| ,, | 29 | 'අජ'-ව්‍යපෙතශ | 'ආජ්' ප්‍රාපෙතශ |
| 132 | 7 | ප්‍රවිවෙශනඃ | ප්‍රවිවිශනඃ |
| ,, | 20 | බුබුධිෂෙ | බුබුධිෂර |
| 133 | 2 | කාර්තර වෙරණ | කාතිරයවණ |
| ,, | 29 | අහෙතරනු | අපෙරනු |
| 134 | 18 | දද්‍රුශ | දදශි |
| 1.5 | 29 | කම්විභශ ෂණම් | කති විභාෂ ණම් |
| 136 | 29 | ශඤතං | ශක්‍යාතම් |
| 138 | 8 | සහදයා යාවතීත | සන්දයයාතයා විතීන |
| ,, | 10 | ප්‍රත්‍යුවාවතුඃ ප්‍රත්‍යුවාවුඃ | ප්‍රත්‍යුවතුඃප්‍ර ත්‍යුවුඃ |
| 139 | 31 | සෂඨා | සථා |
| 140 | 28 | උකතවිකානි කතී | අනුකත සම්බන්ධඃ |
| ,, | 33 | කත්‍රිය | කර්ති |
| 141 | 12 | දතො | දතෙ |
| ,, | 24 | සවකම්සය | සවකර්මණි |
| 142 | 31 | තඅභිඥඃ 'අකාභිඥයඃ' | තඅභිඥඃ 'අකාභිඥඃ' |
| 143 | 20 | අනාපාකර | අපාකර |
| 146 | 13 | ආසන්නාම් | ආසනාම් |
| 147 | 30 | බුභූෂියසන්‍යා | බුභූෂීසන්‍යා |
| 152 | 11 | සවර්ණියවසෙග | සෙගවර්ණියවා සෙග |

| පිට, | පේළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 152 | 14 | විවිත්තතාඃ | විවිත්තතා |
| 154 | 5 | රක්‍ෂිපුරුෂෛඃ, | රක්‍ෂිපුරුෂාඃ |
| 155 | 1 | උදගම | උද්ගම |
| 156 | 11 | තාදර්ථ | තාදර්ථ්‍ය |
| " | 27 | ලවික්‍රියා | ලාවික්‍රියා |
| 157 | 15 | එසේවච්චා | සේවා |
| " | 21 | අනුක්තකතෘ | උක්තකතෘ |
| 158 | 28 | ලුලොඨතුඃ | ලුලුඨතුඃ |
| 159 | 8 | කතෘකාරක ක්‍රියා, | කර්මකාරක ක්‍රියා. |
| " | 14 | අනන්තරතං | අනන්තරං |
| " | 22 | 'ණ'-සවපනසෙ | 'ඤිශවජ්'-ශසෙ |
| 160 | 2 | පඤ්චමවධ්‍යායඃ | පඤ්චමෝධ්‍යායඃ |
| 161 | 9 | ශිෂ්‍යංබොධසෙන | ශිෂ්‍යංසබොධසෙන |
| 162 | 23 | (අතීනත) | (අතීනය) |
| 164 | 15 | ඉනකාදි | අදදි |
| 165 | 34 | සබනඝවති | සබාවෙනි |
| 167 | 15 | තකාරාන්ත | තකාරාන්ත |
| " | 15 | අවාපනවාත් | අවාපතවත් |
| 169 | 16 | කශවිත්කාල | කසම්ංශවිත් කාල |
| 171 | 5 | ගාහඃ | ගාහම් |
| 171 | 20 | නිනිතසසත් | නිනිතීසයත් |
| 172 | 14 | භාසේ | බ්‍රෑසේ |
| 173 | 9 | ජනාම් | උත්පිඩයති |
| " | 19 | යඝනාශසෘ | යෙෂාංශත |
| 174 | 29 | 'ඉසු' | 'ඉණ' |
| 175 | 17 | අනුඝතසම්ප්‍රදානම් | අනුක්ත සම්බන්ධඃ |
| " | 32 | කශ්චිත් | කසම්ත් |
| 177 | 14 | ප්‍රපෙතාෂිනවා | ප්‍රාපෙතාෂිතවා |
| " | 17 | අනුකතකතෘ | උකතකතෘ |
| 1 | 11 | අ ... ත්‍ග්‍රාමඃ | අනොක්‍ෂාග්‍රාමඃ |
| " | 20 | 'රුචි' | 'රුච' |
| 179 | 1 | දදති | දදහි |
| " | 16 | දක්‍ෂිණාඛනයොඃ | දක්‍ෂිනාඛනයොඃ |
| 180 | 14 | 'ථුමු' | 'ථමුඃ' |
| " | 16 | භවාදීයානුග්‍රහණ | භවදීයානුග්‍රහෙණ |
| 181 | 21 | 'පාඨ' | 'පඨ' |
| 182 | 33 | අවධාරණ අව්‍යයම් | එව-අවධාරණ අව්‍යයම් |
| 183 | 4 | වෘත්තියඝියපථා | වෘත්තියඝීපථා |
| 1?8 | 21 | නිරයෙහි | නිරෑපයෙහි |
| 203 | 21 | විෂාද් | විෂාද |
| " | 22 | අශුග් | ශුක් |
| 209 | 21 | ගියතුන්වෙනි අවුරුද්දෙහි | ගියඅවුරුද්දෙහි |
| " | 22 | පෙර අවුරුද් දෙන් පළමු අවුරුද්දෙහි | පෙරඅවුරුද් දෙහි |
| 213 | 7 | විප්‍රතා | විප්‍රත්‍රා |
| 214 | 8 | කම්ාණි | කම්ණි |

තවද "පුංලිඞ්ගො'නපි ශබ්දඃ" යනාදි වශයෙන් සන්ධිකොට කිය යුතු බොහෝ තන්හි ශිෂ්‍යයන්ගේ සුඛාවබොධය පිණිස "පුංලිඞ්ගඃ අනපි ශබ්දඃ" යනාදීන් විසන්ධිකොට කී බව සැලකිය යුතු.



